# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත ධම්මපදය

### පළමුවන පරිච්ඡේදය

## යමක වග්ග




ගරු වේරගොඩ සාරද නාහිමිපාණන් වහන්සේ
සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක

"සබ්බදානං ධම්මදානං ජිනාති"

(ධර්ම දානය, සෙසු දාන සියල්ලටම වඩා අගනේය.)



"ධර්ම භාණ්ඩාගාරය" නැමැති

මෙම වටිනා ධර්ම පුස්තකය

**සාමවිනිසුරු බී.ධර්මදාස මැතිතුමාට**

**නිවන් සුව පිණිස**

පූර්ණ අනුග්‍රහකත්වය

**වේරගොඩ සුනන්දා භික්ෂුණිය විසිනි.**

# ධර්ම භාණ්ඩාගාරය

සිතුවම් සහිත

## ධම්මපදය

කතෘ:

**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**

ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව

විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය**

නො: 1, ජලන් මස් පුටේ, සිංගප්පූරුව 128607

ටෙලි: 65 67783330 65 94656570

94 770589498 / 94 755218421

වේරගොඩ ජයන්ති විහාරය, වේරගොඩ, මීටියාගොඩ

විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

**කර්තෘ**
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**චිත්‍ර ශිල්පී**
පී. වික්‍රමනායක

**සැකසුම**
පියරත්න හේවාබට්ටගේ

**පරිගණක රූපාවලි සහ පූර්ව ප්‍රකාශන මෙහෙය**
පූජ්‍ය වේරගොඩ සුනන්දා භික්ඛුණී
බී. දයා සමරසිංහ
බී. රෝහණ ජයතිස්ස

**පරිගණක සහාය**
ශ්‍යාමනී ප්‍රියලක්‍ෂණා ලේකම්වසම්
ඩබ්ලිව්. මාලා කාන්ති
ප්‍රියංකා බෝධිපක්‍ෂ

**සහාය**
බී. පුෂ්පානී ධම්ලතා
බී. ජේ. ධම්ලතා
ඊ. එම්. ලයනල් මොහොට්ටි
ඊ. එම්. යුගාන් සසංක
ශ්‍රියාලතා කග්ගොඩ ආරච්චි

**පරිගණක ප්‍රකාශන**
සමනල ප්‍රින්ටර්ස්, බටපොල
ටෙලි: +94 777557127

**පිටකවරයේ පින්තූරය**
බර්ට් ගුණසේකර

**මුද්‍රණය**
2013 නොවැම්බර් මස 27 දින, සිංගප්පූරුව

**පිටකවරයේ චිත්‍රය**
*පිටකවරයේ බුදු පිළිමය වේරගොඩ ජයන්ති විහාරයේ බුදුමැදුරෙනි.*
*වර්ෂ 1953 ජුනි 3 වෙනිදා අඹන ලද මෙම බුදු පිළිමය දැනට ශ්‍රී ලංකාවේ තිබෙන*
*දර්ශණීයතම බුදු පිළිමය වශයෙන් සැලකේ. මෙම බුදු පිළිමය ඉදිකිරීමේ පුරෝගාමී වූ අපවත් වී වදාළ*
*ගෞරවාභී පණ්ඩිත යටලමත්තේ වජිරඤාණ නායක මාහිමිපාණන් වහන්සේට නිවන්සුව අත්වේවායි අපි ප්‍රාර්ථනා කරමු.*

මේ ග්‍රන්ථයෙහි ආගත කරුණු පිළිබඳ පූර්ණ හා සදාකාලික අයිතිය හිමි වන්නේ බුදුරජාණන් වහන්සේටයි.
බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් පහළ වූ සනාතනික සත්‍යයෝ පුහුදුන් මිනිසුන් විසින් පනවන ලද
තාවකාලික වූත්, අසත්‍ය වූත්, අයිතිවාසිකම් පිළිබඳ නීති රීති පිළිගනු නොලබති.

**පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ටෙලි: 65 67783330 65 94656570
+94 770589498 +94 755218421
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

ISBN: 981-00-4938-2

# යමක වග්ග





*අකුසල දහමන්ට සිත මුල් ය. කිලිටි වූ සිතින් අකුසල් කළ තැනැත්තා පසුපස්සේ දුක ලුහුබඳී.*

1. මනො පුබ්බඞ්ගමා ධම්මා
මනො සෙට්ඨා මනොමයා
මනසා චෙ පදුට්ඨෙන
භාසති වා කරොති වා
තතෝ නං දුක්ඛමන්වෙති
චක්කං'ව වහතො පදං (1:1)

සිත පෙරටු කොට - සිත ම මුල් කොට
සිතෙන් උපදිති - දහම හැම විට
කතාවට හෝ ක්‍රියාවට යම්
නපුරු සිතුවිලි පෙරටු වේ නම්
ලෙසට රිය සක ගොනු අනුව එන
ලැබෙයි දුක් වේදනා සතහට

# හලොත් යෙහෙකි පවුකම් නොතබා ම සිත

## 1 (1) චක්ඛුපාල හිමියන්ගේ කථාව (1 ගාථාව)

මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ විසූ සමයෙහි **චක්ඛුපාල** නම් දෙනෙත් අඳ තෙර නමක් ඇරබ වදාරන ලද්දකි.

චක්ඛුපාල හිමියෝ බුදුරජාණන් වහන්සේ වැඳ පුදා ගනු වස් වරක් ජේතවනාරාමයට පැමිණියහ. එදින රැයෙහි සක්මන් භාවනාවෙහි යෙදුණු උන්වහන්සේට පෑගී කෘමි සත්තු රැසක් මළහ. දෙනෙත් නො පෙනෙන හෙයින් මෙය නොදැනුවත් කමින් සිදුවුවකි. උදෑසන පිබිදුණු හිමිවරු කීපනමක් මියගිය කෘමීන් දැක ඒ ගැන බුදුරජාණන් වහන්සේට පැමිණිලි කළහ. "චක්ඛුපාල හිමියන් ඒ සතුන් මරණවා ඔබ දැක්කාද?" යි උන්වහන්සේ ප්‍රශ්න කළහ. "නැත ස්වාමීනි." භික්ෂූහු පිළිතුරු දුන්හ. "ඔබ නොදැක්කා මෙන් ම චක්ඛුපාල හිමියන් දැක්කේත් නැහැ. උන්වහන්සේ රහත් නමක් නිසා ප්‍රාණඝාත චේතනාවක් ඇතිවන්නේත් නැහැ. සිතා මතා කළ වරදක් නො වන නිසා උන්වහන්සේ නිර්දෝෂයි" භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කළහ.

චක්ඛුපාල හිමියන් රහත්බව ලබන්නට තරම් පින් ඇතිව ඉපදීත් අන්ධ වන්නට හේතුව කුමක්දැයි දැන ගන්නට භික්ෂූන් වහන්සේලා කැමැත්ත පළ කළ හෙයින් භාග්‍යවතුන් වහන්සේ එම කර්මය හෙළිකරමින් පහත දැක්වෙන කතා පුවත වදාළහ.

පෙර ජන්මයක චක්ඛුපාල හිමියෝ වෛද්‍යවරයකුව උපන්හ. ඇස් රෝගයකින් පෙළුණු එක් කාන්තාවක් ඔහු වෙත පැමිණ "මගේ ඇස් දෙක සනීප කළොත් මම දූ දරුවන් එක්ක ඔබතුමා ගේ දාසියක් වෙනවා" යි කියා සිටියාය. වෛද්‍යවරයා ද ඊට එකඟව අනර්ඝ ඖෂධ භාවිතා කොට ඇය සුවපත් කළේය. එහෙත් දෙනෙත් සුව වූ පසු තම ප්‍රතිඥාව ඉටු කරන්නට මැලි ව ඕ "තවමත් දෙනෙත් හරියට පේන්නේ නැහැ" යි කියමින් මඟ හරින්නට වෑයම් කළාය. ඇය කරන්නේ බොරුවක් බව දත් වෛද්‍යවරයා පලි ගන්නට සිතා "තව එක බෙහෙතක් කර බලමු" යි විස බෙහෙතක් යොදා ඇය සදහට ම අන්ධ කළේ ය. ආත්ම ගණනාවක් අන්ධව උපන් හෙතෙම රහත් බව ලබන අවසන් ජන්මයෙහි ද කම් විපාක වශයෙන් අන්ධව උපන්නේය.

**විවරණාත්මක අනුවාදය (1 ගාථාව)**

**ධම්මා මනොපුබ්බඞ්ගමා මනොසෙට්ඨා මනොමයා වෙ පදුට්ඨෙන මනසා භාසති වා කරොති වා තතො දුක්ඛං නං අන්වෙති වහතො පදං චක්කං ඉව.**

**ධම්මා**: කුසල සහ අකුසල ක්‍රියා; **මනොපුබ්බඞ්ගමා**: සිත පෙරටු කර පවතිති; **මනොසෙට්ඨා**: සිත ප්‍රධාන කොට පවතිති; **මනොමයා**: මනසින් හට ගනිති; **වෙ**: ඉදින්; **පදුට්ඨෙන මනසා**: ද්වේෂ සහගත සිතින් **භාසති වා**: කතා කරයි නම් හෝ **කරොති වා**: ක්‍රියා කරයි නම් හෝ; **තතො**: ඒ හේතුවෙන්; **දුක්ඛං**: දුක; **නං**: ඔහු; **අන්වෙති**: පසුපස එයි; **වහතො පදං**: ගොනා ගේ පියවර; **චක්කං ඉව**: කරත්ත රෝදය (අනුව යන්නාක්) මෙනි.

අප කරන හැම යහපත් හෝ අයහපත් ක්‍රියාවක් පසුපස ම ඇත්තේ චේතනාවකි. හැම වචනයක් ම කතා කරන්නේත් හැම ක්‍රියාවක් ම කරන්නේත් සිතා මතාය. එහෙයින් නරක සිතුවිල්ලක් පෙරදැරි කරගෙන ක්‍රියා කිරීමෙන් නරක දෙයක් වූ අකුශල කර්මයක් (අකුසලා ධම්මා) ජනිත වෙයි. එහෙයින් ඒවා 'මනෝමය' (සිතින් නිර්මිත) ලෙස හැඳින්වෙයි. එවැනි අකුසල කර්ම කරන්නවුන් පසු පස දුක් විපාක හඹා එන්නේ ගවයා පිය තබන තබන වරට ඉදිරියට ඇදී එන කරත්ත රෝදයක් මෙනි.

**විවරණය**

ධම්මපදයෙහි මුල් ගාථා දෙක බෞද්ධ දර්ශනයෙහි කේන්ද්‍රිය සංකල්ප පැහැදිලි කිරීමෙහි ලා වැදගත් වෙයි. වෙනත් ආගම් වල මෙන් මිනිසා මැවුම්කරුවකු විසින් නිර්මාණය කරන ලදුව දේව කැමැත්තට අනුව ජීවත්වන පුද්ගලයකු ලෙස නො හඳුන්වන බුදු දහම ඒ පිළිබඳව කරන යථාර්ථවාදී හා තර්කානුකූල විවරණ මේ ගාථා අනුසාරයෙන් හඳුනා ගත හැකි ය..

මිනිසා පිළිබඳ බෞද්ධ විග්‍රහය මනෝවිද්‍යාත්මක හා ආචාරවිද්‍යාත්මක වූවකි. මිනිසා කුඩා ලෝකයක් (ක්‍ෂුද්‍ර විශ්වයක්) වශයෙන් හඳුන්වන බුදුරජාණන් වහන්සේ ලෝක සම්භවය හා ලෝක විනාශය මිනිස් සිරුර තුළම දක්වති. බටහිර චින්තකයන් මෙන් කය හා සිත එකිනෙකට මුළුමනින් පටහැනි නිරපේක්‍ෂ පදාර්ථ දෙකක් ලෙස නො දක්වා පරස්පරාපේක්‍ෂ ලෙස විග්‍රහ කරන බුදුසමය ඉන්ද්‍රියය හයෙන් (චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මනෝ) අප ලබන අත්දැකීම් විවරණය කිරීම සමස්ත ලෝකයම විවරණය කිරීමක් බවට පත් වෙයි.

මෙම ගාථාවන් ගෙන් දක්වන්නේ සත්ත්වයා ගේ පැවැත්මෙහි ගුණාත්මක අංශය නිර්ණය කරන කුසලා-අකුසල කර්ම සිත පෙරදැරි කරගෙන ඇතිවන ආකාරයයි. 'චේතනාහං භික්ඛවේ කම්මං වදාමි' යි වදාරා ඇති පරිදි අප ක්‍රියා කරන්නේ සිතා මතා හෙයින් කතා කිරීම (භාසති) හා ක්‍රියා කිරීම (කරෝති) නරක සිතින් (පදුට්ඨෙන) හෝ හොඳ සිතින් (පසන්නේන) හෝ කරනු ලැබේ. එබඳු කුසල හා අකුසල ධර්ම (ධම්මා) සිත පෙරදැරි කර ගත්, සිත ම නායක කරගත් (සෙට්ඨා) සිතින් ම නිර්මාණය වූ (මනෝමය) දේ බව මේ ගාථා වලින් කියැවේ. අපි අපේ ක්‍රියා කලාපයෙන් ජනිත වූයෙමු. අපේ නරක ක්‍රියා හෙවත් අකුසල කර්ම ගොනු පසුපස පියවරෙන් පියවර ඉදිරියට ඇදෙන ගැලෙහි සක සේ අප පසුපස එයි.

මේ ගාථාවෙහි අර්ථය වරදවා ගනිමින් මනෝ පුබ්බඞගමා ධම්මා යන්නෙන් භෞතික ලෝකය සිතින් මවන ලද්දකි යන වැරදි අර්ථ කථනයක් ඉදිරිපත් කරන සමහරු බුදු දහම 'විඥානවාදයකි' යි ගැරහුම් කරති. එහෙත් බුදුදහම විඥානවාදයක් හෝ භෞතිකවාදයක් නොව ඇත්ත ඇති හැටියෙන් දක්වමින් විශ්වයෙහි ක්‍රියාත්මක වන නියාම ධර්ම පැහැදිලි කිරීමක් බව තේරුම් ගත යුතුය. මේ ගාථා යුග්මයෙන් විවරණය කරන්නේ කම්ම නියාමයයි. භෞතික ලෝකයේ ඇති වීම ගැන අදහසක් මෙහි ගම්‍යමාන නොවන බව අවධාරණය කළ යුතුය. මනෝ විද්‍යාත්මක හා ආචාර ධාර්මිය ප්‍රකාශයක්, භෞතික හෝ ජීව විද්‍යාත්මක ප්‍රකාශයක් සේ වරදවා නො ගත යුතුය.



*කුසල් දහමන්ට සිත මුල් ය. පහන් වූ සිතින් පින් කළ තැනැත්තා පසුපස්සේ සැප ලුහුබඳී.*

2. මනොපුබ්බඞ්ගමා ධම්මා
මනොසෙට්ඨා මනොමයා
මනසා චෙ පසන්නෙන
භාසති වා කරොති වා
තතො නං සුඛමන්වෙති
ඡායා'ව අනපායිනී. (1:2)

සිත පෙරටු කොට - සිත ම මුල්කොට
සිතෙන් උපදිති දහම් හැම විට
කතාවට හෝ ක්‍රියාවට යම්
පහන් සිතුවිලි පෙරටු වේ නම්
සෙවනැල්ල සේ අත නොහැර එන
ලැබෙයි සුව සෙත එයින් සතහට.

# කළ පින් එනවා පසුපස - හෙවනැල්ලක් සේ

## 1 (2) මට්ටකුණ්ඩලී ගේ කතාව (2 ගාථාව)

**මට්ටකුණ්ඩලී** නම් බමුණු දරුවෙකුට අත් වූ ඉරණම අරබයා භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි දී මේ ගාථාව වදාළ සේක.

මට්ටකුණ්ඩලී ගේ පියා මසුරෙක් විය. කිසිවකුට කිසිවක් නො දෙන හෙතෙම නො කා නො බී ඉතිරි කළේය. එහෙයින් අසල්වැසියෝ ඔහුට අදින්න පුබ්බක යැයි නමක් දුන්හ. තම එකම පුතාට පංචායුධයක් වැනි ස්වර්ණාභරණයක් කරට දැමිය යුතු අවස්ථාවේ ද රන්කරුවනට මුදල් ගෙවන්නට අදි මදි කළ හේ තමා ම රන් කැබැල්ලක් තලා මට්ටම් කර එය කරෙහි පැළඳුවේ ය. එම ආභරණයෙහි විසිතුරු කැටයම් කිසිවක් නැති නිසා එය'මට්ට කුණ්ඩලයක්' ලෙස හැඳින් වූ අසල්වැසියෝ දරුවට 'මට්ටකුණ්ඩලී' යි විහිළු නමක් ද පටබැන්දහ. මට්ටකුණ්ඩලී වරක් බලවත් ලෙස අසනීප විය. එහෙත් වෛද්‍යවරුන්ට මුදල් ගෙවන්නට සිදුවෙතැයි බියෙන් ඔහු පිළියම් සඳහා ගෙන යාමක් නො කෙරිණි. දරුවා මරණාසන්න වූ විට පමණක් කලබල වූ බමුණා, "මෙබඳු ලෙඩකට දෙන ඖෂධ මොනවාදැ"යි විමසා ඒවා සම්පාදනය කර දුන්නේය. එහෙත් එයින් ප්‍රයෝජනයක් නො විණි. හදිසියේ දරුවා මිය ගිය හොත් අවමඟුලට එන ජනයා නිවස තුළ රැස් කර ඇති ධන සම්පත් දකිතියි සිතූ අදින්න පුබ්බක ගෙපිළෙහි ඇඳක් තබා පුතු එහි තැබී ය.

අළුයම මහා කරුණා සමාපත්තියෙන් ලොව බලන බුදු සමිඳුන් ගේ දිව නෙතට මට්ටකුණ්ඩලී ලක් විණි. එදින අදින්න පුබ්බක ගේ නිවස අසලින් පිඩු සිඟා වඩිනා අතර එහි මඳක් නැවතී මට්ටකුණ්ඩලී ගේ දෙනෙත් තමන් වහන්සේ වෙත ඇද ගනු වස් රැස් දහරක් ඔහු වෙත නිකුත් කළ හ. ඒ වෙත හැරී බැලූ හෙතෙම බුදුරදුන් දැක සිත පහන් කර ගෙන දෑත ඔසවා වඳින්නට අසමත් හෙයින් සිතින් බුදුන් වැඳ ගත්තේ ය. එදිනම රෑ පහන් සිතින් මිය පරලොව ගිය මට්ටකුණ්ඩලී දෙව් ලොව උපන්නේ ය. එක ම පුත්‍රයා මිය ගිය ශෝකය අදින්න පුබ්බකට දරා ගත නො හැකි තරම් විය. පුතා මිහිදන් කළ පසුත් සුසාන භූමියේ ම රැඳී වැලපෙමින් සිටි අදින්න පුබ්බක මට්ටකුණ්ඩලී දිව්‍යපුත්‍රයාට ද පෙනිණි. පියාගේ බොළඳ කම් දුරු කරන්නට සිතූ දිව්‍ය පුත්‍ර තෙම කුඩා දරුවකුගේ වෙස් ගෙන හඬමින් සුසාන භූමියට පැමිණියේ ය. පුතා ගේ මරණයෙන් බලගතු කම්පාවට පත්ව සිටි බමුණා ගේ සිත හඬන දරුවා දැකීමෙන් දයාවෙන් තෙත් විය. "ඇයි පුතා අඬන්නේ, ඕන දෙයක් මට කියන්න. ඕන ම දෙයක් මම අරන් දෙන්නම්." යි හේ ඔහු සනසන්නට වෑයම් කළේ ය. "මට ඕන ඉරයි හඳයි! මට ඒවා අරන් දෙන්න. මගේ සෙල්ලම් කරත්තෙට රෝද වලට හයි කරන්න." "පුතා බැරි දේට අඬලා වැඩක් නෑ. රෝද ඕන නම් මම රත්තරනෙන් හදලා දෙන්නම්. කොච්චර ඇඬුවත් ඉරයි හඳයි ගන්න බැහැ නේ. ඉර හඳ ඉල්ලලා අඬන එක මහ මෝඩ වැඩක්". "ඉරයි හඳයි මට පේන්න තියෙනවා. මම පේන දේට අඬනවා. ඔබ අඬන්නේ නො පෙනෙන පුතා ගැන. ඒ ඇඬිල්ල මෝඩ නැත් ද? පුතාට ලෙඩ වුණු වෙලාවේ යමක් නො කර දැන් අඬන එක මෝඩයි." "ඔය කවුද මට කතා කරන්නේ?" මට්ටකුණ්ඩලී තමා කවුදැයි හඳුන්වා දී දෙව්ලොව උපදින්නට තමා කළ එක ම පින්කම බුදුරදුන් දැක සිත පහදවා ගැනීම බවත් විස්තර කර පින් දහම් කර ගෙන යහපත් ජීවිතයක් ගෙවන සේ අවවාද කළේ ය. අදින්න පුබ්බක බුදු පාමොක් මහ සඟනට දන් පිරිනමා වැඳ එකත් පස්ව සිටි විට භාග්‍යවතුන් වහන්සේ පිරිස හමුවට මට්ටකුණ්ඩලී දිව්‍යපුත්‍රයා ගෙන්වා තම පුණ්‍ය මහිමය පවසන්නට මං පෑදූ බව කියැවෙයි. මේ ගාථාව ඒ මොහොතේ භාග්‍යවතුන් වහන්සේ පිරිසට දේශනා කළ ධර්මයයි.

### විවරණාත්මක අනුවාදය (2 ගාථාව)

**ධම්මා මනො පුබ්බඞ්ගමා මනො සෙට්ඨා මනොමයා චෙ පසන්නෙන මනසා භාසති වා කරොති වා තතො සුඛං නං අන්වෙති අනපායිනී ඡායා ඉව**

**ධම්මා**: කුශලා'කුශල ධර්මයෝ; **මනොපුබ්බඞ්ගමා**: මනස පෙරදැරි කර ගෙන පවතිති; **මනො සෙට්ඨා**: මනස ශ්‍රේෂ්ඨ කොට පවතිති; **මනොමයා**: මනසින් නිර්මාණය වෙති; **චෙ**: ඉදින්; **පසන්නෙන මනසා**: පහන් සිතින්; **භාසති**: කතා කරයි නම්; **වා**: හෝ; **කරොති වා**: ක්‍රියා කරයි නම් හෝ; **තතො**: ඒ හේතුවෙන්; **සුඛං**: සැපත; **නං**: ඔහු; **අන්වෙති**: පසු පස එයි; **අනපායිනී**: අත නොහැර එන; **ඡායා ඉව**: සෙවනැල්ල මෙනි.

සියළු කුසල හා අකුසල ධර්‍ම ඉදිරියෙන් ඇත්තේ සිතය. ඒවාට සිත ප්‍රධානය. සිතෙන් ම නිර්මිතය. ප්‍රසන්න සිතුවිලි මුල් කර ගෙන කතා කිරීම හා ක්‍රියා කිරීම නිසා ඇතිවන කුසල ධර්ම හේතුවෙන් හෙවනැල්ල අප අත නො හැර එන්නා සේ විපාක ලැබෙයි.

### විවරණය

මිනිසා සැප සම්පත් ලබන්නේ ඔහුගේ සිතුවිලි අනුව බව මේ ගාථාවෙන් පැහැදිලි කරනු ලැබේ. ප්‍රසන්න සිතුවිලි නිසා ප්‍රසන්න කතා බහ ඇතිවේ. එයින් සිදුවන සම්භාෂණය තමන්ගේ මෙන් ම අනුන්ගේ ද ප්‍රමෝදයට හේතු වෙයි. එමෙන් ම පහන් සිතුවිලි මුල් කරගෙන කරන ක්‍රියා ද ප්‍රසන්න ය. ඒවා නිසා ජනිත වන්නේ කුසල කර්ම ය. මනුෂ්‍ය චර්‍යාව මගින් නිරූපණය වන්නේ මනසෙහි පහන් බව හෝ නො පහන් බව ය. එහෙයින් යහපත් චර්‍යාවන් ඇති කර ගෙන සැපවත් ජීවිතයක් ගත කිරීම සඳහා සිත පහන් කර ගැනීම කෙතරම් වැදගත් ද යනු මෙයින් පැහැදිලි වෙයි.

අපගේ භාග්‍ය හෝ අභාග්‍ය නිර්මාණය කර ගන්නේ අප විසින් ම ය. එය බාහිර බලවේගයක බලපෑමෙන් නොව අප ගේ ම චර්‍යාවෙහි ප්‍රතිඵල වශයෙන් වන බව දැන ගැනීම මිනිසා ගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳව අවබෝධ කර ගැනීමයි. එබඳු ස්වාධීනත්වයක් උගන්වන එක ම ආගම බුදු සමය බව නැවත නැවතත් කීම වරදක් නොවේ. අනුභූතියෙන් බාහිර වූ, විද්‍යාවෙන් හෝ තර්කයෙන් තහවුරු කළ නොහැකි ඊශ්වරයකු උපකල්පනය කරගෙන සිය ස්වාධීනත්වය පාවා දෙන්නට නො පෙළඹී මනුෂ්‍යත්වයේ ශ්‍රේෂ්ඨත්වය තේරුම් ගැනීම අර්ථවත් ය. සචේතනික කර්‍මය එම ස්වාධීනත්වය ප්‍රයෝජනයට ගන්නා ප්‍රායෝගික ක්‍රියා පිළිවෙල ය. මේ ගාථා යුග්මයෙන් එම දර්ශනය පැහැදිලි ලෙස ප්‍රකාශයට පත්කර ඇත.



*බැණීම්, පහරදීම්, දිනීම්, පැහැරගැනීම් යන වරද (සිත්හි) බැඳීමෙන් වෛරය නො සන්සිඳේ.*

3. අක්කොච්ඡි මං අවධි මං
අජිනි මං අහාසි මෙ
යෙ තං උපනය්හන්ති
වෙරං තෙසං න සම්මති (1:3)

"මට බැන්නා - මට ගැහුවා
වද දුන්නා - පාඩු කළා
සිතමින් සිටියොත් මෙලෙසින්
වෛරය දුරු නොවෙයි සිතින."

# දුරු නො කළ වෛරය කරයි සම්පත් හානිය.
## 1 (3) තිස්ස තෙරුන් ගේ වස්තුව. (3 හා 4 ගාථා)

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි **තිස්ස තෙරුන්** ඇරබ මේ ගාථා දෙක වදාරන ලදි.

බුදුරජාණන් වහන්සේ ගේ නැන්දා කෙනෙකු ගේ පුතකු වූ තිස්ස හිමියන් පැවිදි වූයේ වැඩි වයසට පත් වීමෙන් පසුය. පැවිදි බිමේ දී ජ්‍යෙෂ්ඨත්වය මනින්නේ වයසින් වැඩිමහල් කම අනුව නොව පැවිදි උපසම්පදාවෙන් වැඩිමහල් කම අනුව හෙයින් උන්වහන්සේ කණිටු භික්ෂුවක ලෙස සැලකිණි. එහෙත් තමන් බුදුරදුන්ගේ ලගම ඥාතිවරයකු හෙයින් මානයක් සිත ඇති ව සිටි තිස්ස හිමියෝ ජ්‍යෙෂ්ඨ හිමිනමක මෙන් සුවපහසු අසුනක වැඩ හිඳිමින් තමන්ට වඩා ජ්‍යෙෂ්ඨයන්ගෙන් පවා ගෞරව ලැබූහ. ජ්‍යෙෂ්ඨ හිමිවරුන්ට ගරු සරු නො දක්වා මානාධිකව හැසිරෙන විලාසය ගැන කවුරුන් හෝ දොස් දැක්වුව හොත් හඬාගෙන ගොස් බුදුරජාණන් වහන්සේට පැමිණිලි කිරීම තිස්ස හිමියන්ගේ සිරිතයි.

එක් දිනක් මෙසේ හඬා ගෙන ගොස් බුදුරදුන් හමුවට තිස්ස හිමියන් ගිය විටෙක "මුන් වහන්සේ තනිව ම ගොස් මොන බොරු කේලමක් කියත්දැයි කවුරු දනිත් ද? අපත් යා යුතුයැ"යි කියමින් තවත් හිමිවරු ඒ හා ම ගියහ. "තිස්ස, ඇයි මේ කඳුළු සලාගෙන මා හමුවට ආවේ?" යි විමසූ විට "ස්වාමීනි,මේ භික්ෂූන් මට ගරහනවා" යි පැමිණිලි කළහ. "ඉතින් ඔබ කොහේද සිටියේ? යි භාග්‍යවතුන් වහන්සේ විමසූහ.

"මම ආවාස ගෙයි ශාලාව මැද වාඩි වී සිටියා." "මුන් වහන්සේලා එනවා ඔබ දැක්කා ද?" "එහෙමයි මම දැක්කා." "ඔබ නැගිටලා ගරු බුහුමන් දැක්වූවා ද?" "නැහැ ස්වාමීනි" "උන්වහන්සේලා ගේ පාත්‍රා-සිවුරු ගත්තා ද?" "නැහැ ස්වාමීනි" "ඔබ එහෙම නො කළ එක වැරදි යි. වැරැද්ද ඔබ අතේ. උන්වහන්සේලා ගෙන් සමාව ගන්න." "බෑ ස්වාමීනි. මම සමාව ඉල්ලන්නේ නෑ."

එවිට අනිකුත් හිමිවරු "ස්වාමීනි, තිස්ස මහ අකීකරු, නො නැමෙන කෙනෙක්" යි පැවසූ හ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "තිස්ස අකීකරු, නො නැමෙන ගති ඇතිව ඉන්නේ දැන් පමණක් නො වෙයි. පෙර සසරේදීත් එහෙමමයි" යි පැවසූහ.

"ස්වාමීනි, මොහුගේ වර්තමාන අකීකරු ගතිය අපටත් පෙනෙනවා. පෙර භවයක ඔහු එසේ පැවති ආකාරය භාග්‍යවතුන් වහන්සේ ම අපට පැහැදිලි කර දෙනු මැනවි" යි එම භික්ෂූන් වහන්සේලා ඉල්ලා සිටිය හ. එවිට භාග්‍යවතුන් වහන්සේ පහත දැක්වෙන කතා පුවත දේශනා කළ හ.

හිමාල අඩවියේ මාස අටක් පුරා තවුස් දම් පිරූ දේවල නම් තාපසයෙක් වැසි සාර මස ලුණු ඇඹුල් සහිත ආහාර අනුභව කරමින් වාසය කරන්නට සිතා බරණැස් නුවරට පැමිණියේ ය. නගරයට පිවිස "මේ නගරයට එන තාපසයන් නවාතැන් ගන්නේ කොහේ ද?" යි මහ මග ගමන් කළ ළමයින් දෙදෙනකුගෙන් විමසී ය. "කුඹල් හලේ"යි ඔවුහු පිළිතුරු දුන් හ. ඒ අනුව කුඹල් හල සොයා ගිය තවුස් තෙම "භාර්ගව, ඔබට කරදරයක් නො වෙයි නම්, මම කැමතියි අද රෑ මෙහේ නවාතැන් ගන්න" යි පැවසීය. "ස්වාමීනි, ශාලාවේ මම රෑට වැඩක් කරන්නේ නෑ. ශාලාව ඉඩ තියෙනවා. ඔබ වහන්සේ කැමති පරිදි මෙහි වැඩ හිඳින්න." යි පැවසූ කුඹල්කරු තවුස් තුමා ශාලාවට කැඳවා ගත්තේ ය.

දේවල තවුස් තුමා එහි පිවිස වැඩි වේලාවක් ගතවන්නට පෙර හිමවත සිට ආ තවත් නාරද නම් තවුස් තුමෙක් එහි පැමිණ රැය නවතින්නට අවසර ඉල්ලා සිටියේ ය.

"මුලින් ආ තාපසතුමා කැමති වෙයි ද නැත්ද මම දන්නේ නැහැ. කොයිකටත් මගේ ගැලවිල්ලට අහලා ම ඉන්න එක හොඳයි." යි සිතූ කුඹල් හල හිමියා "ස්වාමීනි, දැන් ටිකකට කලින් තවුස් කෙනෙක් ඇවිත් නවාතැන් ගත්තා. එතුමා කැමති ද අහලා, කැමති නම් ඔබ වහන්සේත් නවත්වා ගන්නම්" යි පැවසීය.

දේවල තවුසා වෙත ගිය නාරද තවුස් තෙම "ආචාර්ය තුමනි, ඔබ ගේ විරුද්ධත්වයක් නැත්නම්, මමත් අද මෙහි නවාතැන් ගන්නම්" යි විමසා සිටියේ ය. "ශාලාව බොහොම ඉඩ තියෙනවා. එන්න. ඇවිත් නවාතැන් ගන්න." යි දේවල තවුසා කියා සිටියේ ය. ඇරයුම සතුටින් පිළිගත් නාරද තවුසා එහි පිවිස සතුටු සාමීචි කතා බහ නිම කොට ගිමන් නිවන්නට හාන්සි විය.

#### විවරණාත්මක අනුවාදය (3 ගාථාව)

**මං අක්කොච්ඡි මං අවධි මං අජිනි මෙ අහාසි යෙ තං උපනය්හන්ති තෙසං වෙරං න සම්මති**

**මං**: මට; **අක්කොච්ඡි**: බැණ වැදුණේ ය; **මං**: මට; **අවධි**: වධ හිංසා කළේ ය; **මං**: මා; **අජිනි**: පැරදවී ය; **මෙ**: මට; **අහාසි**: පාඩු කළේ ය; (මා සතු දේ පැහැර ගත්තේ ය.) **යෙ**: යමෙක්; **තං**: එබඳු දේ; **උපනය්හන්ති**: යළි යළිත් මතක් කරමින් සිටින්නේ නම්; **තෙසං**: ඒ අය ගේ; **වෙරං**: වෛරය; **න සම්මති**: නිමාවකට නො යයි.

යම් කිසිවෙක් "මට අසවලා බැණ වැදුණේ ය. පහර දුන්නේ ය. වධ හිරිහැර කළේ ය. මා පරාජය කළේ ය. මා සතු දේ පැහැර ගෙන මට අලාභ කළේ ය." යි නිතර නිතර ම මතක් කරමින් වෛරය දිගට පවත්වන්නේ නම් ඔවුන් ගේ වෛරය සංසිඳෙන්නේ නැත.



*බැණීම්, පහරදීම්, දිනීම්, පැහැරගැනීම් පිළිබඳ කෝපය (සිත්හි) නොබැඳි කල සන්සිඳේ.*

4. අක්කොච්ඡි මං අවධි මං
අජිනි මං අහාසි මෙ
යෙ තං න උපනය්හන්ති
වෙරං තෙසූපසම්මති (1:4)

මට බැන්නා - මට ගැහුවා
වද දුන්නා - පාඩු කළා"
නො සිතන්නේ නම් මෙලෙසින්
වෛරය දුරු වෙයි විගසින්.

# දුර ලමු වෛරය.

## 1 (3) (4) තිස්ස තෙරුන් ගේ වස්තුව. (3-4 ගාථා) (පෙර පිටුවට සම්බන්ධයි.)

නින්දට යා යුතු වේලාව එළැඹියෙන් නාරද තවුසා දේවල තවුසා නිදන තැන, නිදන දිශාව හා දොර තිබෙන තැන ද හොඳින් මතක තබාගෙන නින්දට ගියේ ය. එහෙත් දේවල තවුසා එතැන වෙනස් කොට කෙළින් ම දොර ඇති දිශාවෙහි හරහට නිදා ගත්තේ ය.

ඒ බව නො දත් නාරද තවුසා මහ රැයෙහි නැගිට බැහැරට යනු කැමතිව දොර දෙසට ගමන් කළේ ය. අවාසනාවට මෙන් ඔහුට දේවල තවුසා ගේ ජටාමඬුල්ලෙහි වූ කෙස් පෑගිණි. "කවු ද මගේ කොණ්ඩය පෑගුවේ" දේවල තවුසා කෑ ගැසී ය. "ආචාර්යන් වහන්ස, ඒ මම." යි නාරද තවුසා පැවසී ය. "හොර තාපසයා, කැලේ ඉඳලා ඇවිත් මගේ ජටා මඬුල්ලත් පෑගුවා" යි දේවල තවුසාට බැණ වැදුණේ ය.

"ආචාර්යන් වහන්ස, මම දැන ගෙන හිටියේ නෑ ඔබ මෙතන නිදි කියලා. වැරදීමක්. සමාවෙන්න" යි පැවසූ නාරද තවුස් තෙම මිදුලට බැස්සේ ය. "නාරද ආපසු එන කොට මාව පාගන්න තියන්න හොඳ නෑ" යි සිතූ දේවල තවුසා හිස තිබූ අතට පා දමා නිදා ගත්තේ ය. "ආ පැත්තෙන් ම ගියොත් ආයෙත් දේවල ගේ ජටාව පෑගෙන්න පුළුවනි" යි සිතූ නාරද තවුස් තෙම මෙවර අනිත් පැත්තෙන් යන්නට ගොස් දේවල තවුසා ගේ ගෙල මත පා තැබී ය. "ඒ කවුද?" දේවල විමසී ය. " ඒ මම ආචාර්යෙනි" යි නාරද පිළිතුරු දුන්නේ ය. "හොර තාපසයා. මුලින් මගේ ජටා මඬුල්ල පෑගුවා. දැන් බෙල්ල ම පෑගුවා. මම තමාට සාප කරනවා." හෙතෙම මහ හඬින් පැවසී ය. "ආචාර්ය තුමනි , කෝප නො ගන්න.

මුල් වතාවේ ජටාමඬුල්ල පෑගුණු නිසා මේ සැරේ ඒවගේ දෙයක් නොවෙන්න පය පැත්තෙන් ආවා. මම දැනගෙන හිටියේ නෑ ඔබ දිශාව මාරු කල බව. මට සමාවෙන්න." යි නාරද තවුසා කීවත් "මම නුඹට සාප කරනවා" යි දේවල තවුසා හඬ ගා කී ය. "එපා එපා. ඒක කරන්න එපා"යි නාරද නැවතත් අයැද සිටියේ ය. "නෑ. සාප කරනවාමයි." පැවසූ දේවල තවුසා, "හෙට හිරු නැගෙන විට ඔබේ හිස හත්කඩකට පැලේවා"යි සාප කළේ ය.

මේ සාපය නිවැරදි කරුවකුට කළ එකක් බැවින් කළවුන් වෙත ම ආපසු කැරකෙන එකක් බව නාරද තවුසා නුවණින් දැක ගත්තේ ය. එහෙයින් තම ධ්‍යාන බලයෙන් හිරු නො නැගෙන පරිදි අධිෂ්ඨානයක් කළේ ය. එදින හිරු උදා නො වන්නේ කවර හෙයින්දැයි සොයා බැලූ රජ තෙම කරුණු දැන නාරද තවුසා ගෙන් සමාව ගන්නැයි දේවල තවුසාට බල කර සිටි නමුත් හෙතෙම එයට අකැමැත්ත පළ කළේ ය. ඔහු ඇමතූ නාරද තවුසා මෙසේ පැවසී ය. "ආචාර්යතුමනි, මම මගේ ඍද්ධි බලයෙන් හිරු නැගෙන්නට සලස්වන්නෙමි.

ඔබේ හිස මත මැටි බෝලයක් තබා ගෙන දියේ ගිලී වෙන තැනකින් මතුවනු මැනවි."හිරු උදාවන විට ම දියෙහි සිටි දේවල ගේ හිස මත වූ මැටි ගුලිය සත් කඩකට පිපිරී ගියේ ය. දියේ ගිලී ගොස් වෙන තැනකින් මතු වූ දේවල අසලකවත් නො රැඳී පලා ගියේ ය.

"මහණෙනි, එකල රජව සිටියෝ ආනන්ද ස්ථවිරයෝ ය. එදා හිතුවක්කාර වූ දේවල තවුසා නම් අදත් අකීකරු මේ තිස්ස භික්ෂුව ය. නාරද තවුසා නම් මම ම වූයෙමි." යි භාග්‍යවතුන් වහන්සේ කතාව නිමවූ හ.

### විවරණාත්මක අනුවාදය (4 ගාථාව)

**මං අක්කොච්ඡි, මං අවධි, මං අජිනි, මෙ අහාසි, යෙ තං න උපනය්හන්ති තෙසං වෙරං සම්මති.**

**මං**: මට; **අක්කොච්ඡි**: නින්දා පරිභව කළේ ය; **මං**: මට; **අවධි**: වධ හිංසා කළේ ය; **මං**: මා; **අජිනි**: පැරදවී ය; **මං**: මට; **අහාසි**: පාඩු කළේ ය; (මා සතු දේ පැහැර ගත්තේ ය.) **යෙ**: යමෙක්; **තං**: මෙබඳු දේ; **න උපනය්හන්ති**: නිතර නිතර මතක් කරමින් නො සිටියි නම්; **තෙසං**: ඔවුන් ගේ; **වෙරං**: වෛරය; **සම්මති**: සංසිඳෙයි.

මට අසවලා නින්දා පරිභව කළේ ය. මට වධ හිරිහැර කළේ ය. මා පැරදවී ය. මට පාඩු කළේ ය. යම් කිසි කෙනෙක් නිතර නිතර මතක් කරමින් නො සිටින්නේ නම් ඔහු ගේ සිතේ ඇති වෛරය ඉක්මනින් සංසිඳී යයි.

### විවරණය

මේ ගාථා දෙකින් ආවේග සංසුන් කර ගැනීම සඳහා වැදගත් මනෝවිද්‍යාත්මක සංකල්පයක් පැහැදිලි කර ඇත. චිත්තවේග හට ගන්නේ කිසියම් සිතිවිල්ලක් නිසා ය. සිතිවිල්ලක් පදනම් කර ගෙන අප මවා ගන්නා මනෝරූපන චිත්ත වේගයක් ජනිත කරලයි. මනෝ චිත්‍රය නො තකා හැරීමට හැකි නම්, චිත්ත වේගය පාලනය කර ගත හැකි වෙයි.

වෛරය අහිතකර ආවේගයකි. අපට විවිධ පුද්ගලයන් විසින් කරනු ලබන හිරිහැර අවමාන, අලාභ ආදිය නිතර සිහියට නඟා ගනිමින් වෛරය පෝෂණය කිරීමෙන් අනර්ථයක් මිස යහපතක් සිදු නො වේ. වෛර කිරීම හා පලිගැනීම වෙනුවට ඉවසීම, සමාව දීම හා මෛත්‍රිය ප්‍රගුණ කරන්නේ නම්, එය මානසික සුවයට මෙන් ම කායික සුවයට ද අදාළ වෙයි.

ඉවසීම, සමාව දීම හා මෛත්‍රිය දුර්වලයන් ගේ ලක්ෂණ යැයි සිතීම අමනකමකි. ඒවා ප්‍රබල පෞරුෂයක ලක්ෂණ බව අවධාරණයෙන් ම කියමු. අපේ අරමුණ නීරෝගී ප්‍රසන්න මනසක් ඇතිව සිටීම නම්, දූෂිත සිත ඊට ඉඩ නො තබයි. ආවේග පාලනය කර ගන්නට හැකි වීම දක්ෂ කමකි. ආවේග වලට යටත්ව ක්‍රියා කර මහත් විනාශයක් වූවාට පසු කණගාටු වීමට වඩා ඒවා පාලනය කරගෙන අපේ ජීවිතය වාසනාවන්ත කර ගැනීමට සමත්වීම ඥානවන්ත කමකි.

බෝසත් අවදියේ (නිදසුන්: ක්ෂාන්තිවාදී ජාතකය) මෙන් ම බුද්ධත්වය ලද පසුව ද වෛර උපදවා නො ගෙන ඉවසීම හා මෛත්‍රිය ප්‍රගුණ කරන අයුරු භාග්‍යවතුන් වහන්සේ චරිතාදර්ශයෙන් ම නිරූපණය කළහ.



*වෙරට වෙර නො කිරීමෙන් වෙර සන්සිඳේ. මෙය හැමදා පවත්නා දහමකි.*

5. න හි වෙරෙන වෙරානි
සම්මන්තීධ කුදාචනං
අවෙරෙන ච සම්මන්ති
එස ධම්මො සනන්තනො (1:5)

වෛරයෙන් වෛරය
නිම නොවෙයි කිසි කාලෙක
නිම වෙයි වෛර නො කළොත්
එයයි හැමකල ලොව ස්වභාවය.

# පරදතොත් වෛරය - වෛර නො කිරීමෙන් ම පමණය.

## 1 (4) කාලි යක්ෂණිය ගේ කථාව (5 ගාථාව)

සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන අතර භාග්‍යවතුන් වහන්සේ **දරු පල ඇති කතක්** හා **දරු පල නැති කතක්** ඇරබ මේ ගාථාව වදාළ හ.

එක් ගෘහපතියෙක් තම බිරිඳට දරුවන් නැතිකම පිළිබඳව තැවෙන විට ඔහු ගේ බිරිඳ මෙසේ සිතුවා ය. "මේ විදියට දරුවකු නැතිව කලක් ගත වුණොත් නැන්දම්මත් ස්වාමීපුරුෂයත් දෙන්නම එකතු වෙලා මට වෙනස් කම් කරයි. තවත් ගැහැණු කෙනෙක් මේ මනුස්සයට ගෙනාවොත්, එයා ගෙන් ළමයි ලැබෙනවා නම්, මටත් සහනයක්. එතකොට ප්‍රශ්නයක් නැති වෙයි." මෙසේ සිතූ ඕ තම පුරුෂයාට තවත් කාන්තාවක් ආවාහ කර ගන්නට සැලසුවා ය. එහෙත් දෙවන බිරිඳ ගැබ් ගන්නා විට ඇයගේ සිතෙහි ඊර්ෂ්‍යාවක් ජනිත වී ඔසුවක් රහසේ පොවා ගැබ් නැසුවා ය. එය තේරුම් ගත් දෙවන බිරිඳ ඊළඟ වර ගැබ් ගත් විට එය රහසක්ව තබා ගත්තා ය. එහෙත් ඇය දෙස බැලීමෙන් ඇය ගැබ්ගෙන ඇති බව දැන ගත් පළමු බිරිඳ නැවත ද ආහාර සමග මිශ්‍ර කොට බෙහෙත යොදා ගැබ් නැසුවා ය. අන්තිමේ දරු ප්‍රසූතියක දී ම මිය ගිය දෙවන බිරිඳ දැඩි ක්‍රෝධයෙන් පුපුරමින් මෙසේ ප්‍රාර්ථනා කළා ය. "මම උප උපන් ජාති නුඹෙනුත් නුඹේ දරුවන්ගෙනුත් පළි ගන්නෙමි." දිග වෛරයක ආරම්භය මෙසේ සටහන් විය.

ඊළඟ ජන්ම වලදී මේ දෙදෙනා බැළලියක් හා කිකිළියක්, මුවදෙනක් හා කොටියෙක් ආදී වශයෙන් ඉපිදෙමින් වෛරයෙන් වෛරය පෝෂණය කරමින් සසර සැරිසරා අවසන බුදුන් දවස සැවැත්නුවර ධනවත් සිටුවරයකු ගේ දියණියක හා යක්ෂණියක වශයෙන් උපන් හ. දිනක් මේ යකින්න සිටු දියණියගේ බිළිදා බිලි ගන්නට ආවාය. බුදුරදුන් දෙව්රම් වෙහෙර වැඩ වෙසෙන බව දැනසිටි සිටු දියණිය දරුවාත් රැගෙන එහි දිව ගොස් බිළිදා බුදු පාමුල තැබුවේ බුදුරදුන් ගේ රැකවරණය ඔහුට ලැබේවායි සිතමිනි. විහාර භූමියට ඇතුල් වනු නො හැකිව යක්ෂණිය ඒ වටා රැඳෙමින් සිටිනු දුටු තථාගතයන් වහන්සේ ඇය ද ඇතුළට කැඳවූවා ය. ඔවුන්ගේ අතීත පුවත් සිහිපත් කර දුන් උන්වහන්සේ වෛරය නිසා දෙදෙනාට ම වී ඇති අනර්ථය පැහැදිලි කර දී වෛරය නැති කර ගත හැක්කේ මෛත්‍රිය, අවබෝධය සහ කාරුණිකත්වය මගින් පමණක් බව පැහැදිලි කළ හ. කරුණු තේරුම් ගත් ඔවුහු බුදු සමිඳුන් ගේ අවවාදය පිළිගෙන එකිනෙකා සමග සාමය ඇති කර ගත්හ.

අනතුරුව දරුවා යක්ෂණිය ගේ අතට දෙන ලෙස භාග්‍යවතුන් වහන්සේ සිටු දියණියට පැවසූහ. මුලදී දරුවා ගේ ආරක්ෂාව ගැන සිතා ඇය අදි මදි කළ ද බුද්ධ ගෞරවය නිසා ඕ දරුවා යකින්න ගේ අතට දුන්නා ය. දරුවා වඩා ගත් යක්ෂණිය ඔහු ආදරයෙන් සිඹ සුරතල් කර ආපසු දුන්නා ය. මෙහි ප්‍රතිඵලය වූයේ ආත්ම ගණනාවක් ලියලමින් ආ දරුණු වෛරය සහමුලින් ම දිය වී යාමයි.

### විවරණාත්මක අනුවාදය (5 ගාථාව)

**ඉධ වෙරෙන වෙරානි කුදාචනං න හි සම්මන්ති අවෙරෙන ච සම්මන්ති එස සනන්තනො ධම්මො.**

**ඉධ**: මේ ලෝකයෙහි; **වෙරෙන**: වෛරයෙන්; **වෙරානි**: වෛරයෝ (සතුරු කම්); **කුදාචනං**: කිසි කලෙක; **න හි සම්මන්ති**: නො සංසිඳෙති; **අවෙරෙන ච**: අවෛරයෙන් ම; **සම්මන්ති**: සංසිඳෙති; **එස**: මෙය; **සනන්තනො**: සදාකාලික; **ධම්මො**: ස්වභාවයකි.

වෛර කිරීමෙන් කිසි කලෙක වෛරය සංසිඳෙන්නේ නැත. එය සංසිඳෙන්නේ වෛර නො කිරීම මගින් ම ය. මෙය ලොව පවත්නා සදාකාලික ධර්මතාවකි.

### විවරණය

වෛරය වෛරයෙන් ජය ගන්නට සිතීම යුද්ධ කර යුද්ධය නිම කරන්නට වෑයම් කිරීම වැනි ක්‍රියාවකි. වෛරය පෙරළා වෛර කිරීමෙන් වර්ධනය වනු මිස අඩු වන්නේ නැත. යමකු අපට වෛර කරන විට අප ඊට අකැමැති වන්නේ වෛරය නරක දෙයක් යැයි අප පිළිගන්නා හෙයිනි. එසේ නම්, ඒ නරක දෙය ම කිරීමෙන් අප කරන්නේ ඔහු ගේ දෘෂ්ටිය පිළිගෙන ඔහු ගේ කඳවුරට එකතු වී නරක පුද්ගලයන් ම වීම නො වේ ද? අප කළ යුත්තේ අප නිවරද යැයි සිතන ස්ථාවරයේ ම සිට වෛර කිරීමෙන් වැළකීම ය.





*මැරෙන බව නො දන්නෝ කලහ කරති. මැරෙන බව දන්නවුන්ගේ කලහ සන්සිඳේ.*

6. පරෙ ච න විජානන්ති<br>
මයමෙත්ථ යමාමසෙ<br>
යෙ ච තත්ථ විජානන්ති<br>
තතො සම්මන්ති මෙධගා (1:6)

බැහැරියෝ නො දනිති<br>
යම් දිනෙක අප මැරෙතැයි<br>
දනිත් නම් ඒ බව<br>
කිසිවෙක් කලහ නො කරත්.

# මරණසතියෙන් සාමය ඇති වෙයි.

## 1 (5) කොසඹෑ නුවර හිමිවරුන් ගේ කතාව (6 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසමින් **කොසඹෑ නුවර භික්ෂූන් වහන්සේලා** අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

කොසඹෑ (කෞශාම්බි, කොසම්බි) නුවර වාසය කළ භික්ෂූන් වහන්සේලා අතර විනය ප්‍රශ්නයක් නිසා හටගත් විවාදයක් දුර දිග ගොස් ධම්වාදී හා විනයවාදී යැයි කණ්ඩායම් දෙකකට බෙදී යන්නට හේතු විය. මේ භේදය දුරු කර සඟ පිරිස සමගි කරවන්නට බුදුරජාණන් වහන්සේ පවා සමත් නො වූ හ. දායක දායිකාවෝ ද දෙපක්ෂයකට බෙදුණ හ. අන්තිමේ භාග්‍යවතුන් වහන්සේ පාරිලෙය්‍යක වනයට වැඩම කොට වස් කාලය එහි ම ගත කරන්නට තීරණය කළ හ.

පාරිලෙය්‍යක වනයෙහි රක්ඛිත නම් උයනට තනිව ම වැඩම කළ භාග්‍යවතුන් වහන්සේ එහි වස් සමාදන් වූ හ. වනයෙහි විසූ පාරිලෙය්‍ය නමින් ම හැඳින්වුණු හස්තියෙක් භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කළ හ.

බුදුරදුන් වනගත වූයේ සඟ පිරිස සමගි කරවන්නට ගත් ප්‍රයත්නය අසාර්ථක වීමෙනැයි දැනගත් දායක දායිකාවෝ අසමගිව සිටින භික්ෂූන්ට සිවුපසය සැපයීම නතර කළ හ. තම විවාදය කෙතරම් හානිකර වී ඇත්දැයි ඔවුන්ට වැටහුණේ එවිට ය. වාද විවාද අතහැර ඔවුන් සමගි වුව ද භාග්‍යවතුන් වහන්සේ සමා කරවා ගෙන නැවත නගරයට වැඩම කරවන තුරු දායකයෝ කලහකාරී භික්ෂූන් වෙත නැවත සමීප නො වූ හ. එහෙත් එය වස් කාලය වූ හෙයින් භාග්‍යවතුන් වහන්සේ යළි වැඩම කරවීම ද අපහසු විය. වස් තෙමස භික්ෂූන් ගත කළේ මහත් අපහසුවෙනි.

වස් කාලය අවසන ආනන්ද මහා ස්ථවිරයන් වහන්සේ පෙරටු කර ගත් භික්ෂූන් වහන්සේලා වනයට ගොස් අනාථපිණ්ඩික සිටුතුමා ඇතුළු දායක පිරිස බුදුරජාණන් වහන්සේගේ සම්ප්‍රාප්තිය ගෞරවාදරයෙන් අපේක්ෂා කරන බව දන්වමින් යළි නගරයට වැඩම කරන්නට ඇරයුම් කළ හ. භාග්‍යවතුන් වහන්සේ ද සුදුසු කල් දැන ජේතවනාරාමයට ආපසු වැඩම කළ හ. එහි දී කලහකාරී භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රසිද්ධියේ සමාව අයැද සිටිය හ.

ඔවුන් ගේ අකීකරු හිතුවක්කාර ගති පිළිබඳව නිග්‍රහ කළ භාග්‍යවතුන් වහන්සේ තමන් සදාකල් ජීවත් නොවන්නවුන් බව තේරුම් ගන්නා ලෙසත් එසේ තේරුම් ගන්නේ නම් සියලු කලහ එවිට නතර වන බවත් වදාළ හ.

**විවරණාත්මක අනුවාදය (6 ගාථාව)**

**එත්ථ පරෙ මයං යමාමසෙ න ච විජානන්ති තත්ථ යෙ ච විජානන්ති තතො මෙධගා සම්මන්ති**

**එත්ථ**: මේ කරුණෙහි ලා; **පරෙ**: බාහිරයෝ (දහම් මඟින් බැහැර වූවෝ); **මයං**: අපි; **යමාමසෙ**: මැරෙන්නෙමු(යි); **න ච විජානන්ති**: (නො දනිති); **තත්ථ**: එහි දී; **යෙ ච**: යම් කිසිවෙක්; **විජානන්ති**:(එය) දනිත් ද; **තතො**: ඒ හේතුවෙන්; **මෙධගා**: කලි කලහ; **සම්මන්ති**: නිමාවට යයි.

භාග්‍යවතුන් වහන්සේ උගන්වන ධර්ම මාර්ගයට පරිබාහිර පුද්ගලයෝ තමන් මැරෙන බව නො දැන කලි කලහ කරති. යමෙක් තමන් මැරෙන බව දනිත් ද, ඔවුහු කලහ නිම කර සංසුන් වෙති.

**විවරණය**

මරණය සහ ජීවිතයේ අනිත්‍යතාව තේරුම් ගැනීම යථාර්ථාවබෝධය සඳහා අත්‍යවශ්‍ය ය. මිනිසුන් මෙය තේරුම් නො ගැනීම බොහෝ ගැටළුවලට හේතු වී පවතියි.

බොහෝ ගිහි - පැවිද්දෝ තමන් අමරණීයයැයි සිතමින් මෙන් ක්‍රියා කරති. චිත්ත වේගයන්ට වසඟව බුද්ධියට නිවාඩු දී ක්‍රියා කරන එවැන්නෝ ප්‍රමාදීව, සීලා දී ගුණධර්ම වර්ධනය ගැන නො සිතමින් ලෞකික සැප සම්පත් ගැනම සිතති. ඔවුන් ගේ ලෝභය මෙන් ම ද්වේෂය ද වැඩෙයි.  අද කළ යුතු දේ හෙටට කල් දැමීම ද මෙම මිථ්‍යා දෘෂ්ටියෙහි ප්‍රතිඵලයක් වෙයි. තම මුලාවෙහි තරම අවබෝධ වන්නේ අනපේක්ෂිත ලෙස මරණය තමා අබිමුවට පැමිණි විට ය.

මරණය යන වචනය අසන්නට හෝ එම විෂය ගැන කතා බහ කරන්නට පවා රුචි නොවන පුද්ගලයෝ වෙති. දීර්ඝායුෂ, නීරෝගිකම හා යෞවනය නිසා මත්ව ප්‍රමාදී ව පස්කම් රසයෙහි ගිජුව වසන්නෝ එම වචනය පවා අසුබ සේ සිතති. අනිත්‍ය දේ නිත්‍ය ලෙස ද දුක් සහගත දේ සුවදායක සේ ද අනාත්ම දේ ආත්ම ලෙස ද අසුභ දේ සුභ ලෙස ද ගැනීම විපයර්‍යාස (විපල්ලාස) චින්තනයේ ලක්ෂණ බව බුදුසමයෙහි ඉගැන්වෙයි.

මරණය ගැන අවබෝධය හා නිරතුරු ඒ පිළිබඳ මෙනෙහි කිරීම හේතුවෙන් යථාවබෝධය ලැබීම අපගේ ප්‍රායෝගික ජීවිතය කෙරේ මහත් බලපෑමක් ඇති කරයි. ගත කරන කෙටි ජීවිතය කලකෝලාහල හා මත භේද වලින් පුරවා ගැනීමෙන් වන්නේ අලාභයක් පමණි. ඒ වෙනුවට සියළුදෙනා සාමයෙන් සතුටෙන් වාසය කිරීමෙන් ලබන ආධ්‍යාත්මික ආශීර්වාද මෙලොවට පමණක් නොව පරලොවට ද ආශීර්වාදයක් වනු ඇත. කෝලාහල කර ගන්නවුන් 'මගේ අය නොව පිට අය' වශයෙන් හඳුන්වන්නට බුදුරදුන් සිතුවේ මෙමෙ යථාර්ථය තහවුරු කොට දක්වනු පිණිස ය.





*ඉන්ද්‍රිය සංවරයක් නැතිව වෙසෙන්නා මරු වසඟයට යන්නේ දුබල ගසක් වාතයෙන් ඇද වැටෙන්නාක් මෙනි.*

| | |
|---|---|
| 7. සුභානුපස්සිං විහරන්තං | ජීවිතයේ සුභ පක්‍ෂය |
| ඉන්ද්‍රියෙසු අසංවුතං | බලමින් නො-දමා ඉඳුරන් |
| භොජනම්හි අමත්තඤ්ඤුං | පමණ නො දැන හෝජනයෙහි |
| කුසීතං හීනවීරියං | කුසීත වී බෙල හීනව |
| තං වෙ පසහති මාරො | විසුවොත් වනසයි මරුවා |
| වාතො රුක්ඛං’ව දුබ්බලං (1:7) | සැඩ පවනින් මහ තුරු මෙන් |

# අලසකම විනාශයේ මුලයි.

## 1 (6) මහාකාල තෙරුන් ගේ වස්තුව (7 හා 8 ගාථා)

සේතව්‍යා නුවර අසල වසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා යුග්මය **මහා කාල සහ චූල කාල** යන සහෝදරයන් දෙදෙනා අරබයා දේශනා කළහ.

සේතව්‍යා නුවර චූල කාල,මජ්ඣිම කාල හාමහා කාල නමැති සහෝදරයෝ තුන් දෙනෙක් විසූ හ. වැඩිමලා හා බාලයා වූ මහා කාල හා චූල කාල ගැල් රැගෙන ඈත දුර ප්‍රදේශ වලට ගොස් කරත්ත පන්සියයක් පුරාම විවිධ වෙළඳ භාණ්ඩ රැගෙන එති. මජ්ඣිම කාල මේවා නිවසේ තබා ගෙන වෙළදාම් කරයි.

මෙසේ ගිය එක් වතාවක ගැල් පුරා විවිධ වාණිජ භාණ්ඩ පුරවා ගෙන සැවත් නුවර බලා එන අතර සැවත් නුවරත් ජේතවනාරාමයත් අතර කරත්ත මුදා විවේක ගත් හ. එදින සන්ධ්‍යා භාගයෙහි සැවැත් නුවර වැසියන් මල් දම් හා සුවඳ ද්‍රව්‍ය අතැතිව දහම් ඇසීම පිණිස යනු දුටු මහා කාල 'ඔබ මේ කොහි ද යන්නේ?' යි ඔවුන් ගෙන් විමසා බණ අසන්නට යන බව දැන "මමත් යන්නෙමි" යි ඉටා ගත්තේ ය. තම මලණුවන් ඇමතූ හේ "මල්ලී කරත්ත ටික බලා ගන්න. මම බණ අහන්නට යනවා." යි පවසා විහාරස්ථානයට ගොස් බුදුන් වැඳ ධර්‍ම ශ්‍රවණය පිණිස හිඳ ගත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ එදින දුක්ඛ සත්‍යය විවරණය කරමින් කාමාස්වාදයෙහි ආදීනව පැහැදිලි කරමින් කළ ධර්ම දේශනාව ඇසූ මහා කාල සසර කලකිරී පැවිදි විය.

මහා කාල පැවිදි වූ පුවත ඇසූ චූල කාල ද පැවිදි විය. එහෙත් ඔහු පැවිදි වූයේ කෙසේ හෝ සිය සොහොයුරා ද සමග ආපසු ගිහිගෙට එන අරමුණිනි.

සුළු කලකින් ම මූලික ශික්ෂණය නිමැවූ මහා කාල තෙරහු සිය ආචාර්‍යයන් බැහැදැක "හිමියනි, මේ සසුනෙහි ධූර කීයක් ඇත්දැයි විමසූහ. විදර්ශනා ධූරය හා ග්‍රන්ථ ධූරය ගැන ඇදුරු හිමියන් කළ විවරණය ඇසූ මහා කාල හිමියෝ "මම ස්වාමීනි, වැඩිවිය පත්ව පැවිදි වූ හෙයින් ග්‍රන්ථ ධූරයෙහි දියුණුවක් ලබන්නට අසමත් මි. එහෙයින් මම විදර්ශනා ධූරය පුරමි." යි පවසා භාවනා කර්මස්ථාන ලබා ගෙන සුසාන භූමියට ගොස් භාවනා වැඩූ හ.

දිනපතා රැයෙහි ප්‍රථම යාමයෙහි සියල්ලන් නින්දට යත්දී සුසාන භූමියට ගොස් භාවනා ආරම්භ කරන උන්වහන්සේ අළුයම කිසිවකු පිබිදෙන්නට පෙර ආරාමයට වැඩම කරති.

මෙසමයෙහි එක් තරුණ කාන්තාවක් හදිසියේ ගිලන්ව මිය ගියා ය. මිය ගිය ද ඇයගේ රූසිරිය එසේ ම පියකරුව දිස්විණි. හවස් වරුවේ ඇයගේ ඥාතීහු සිරුර දැවීමට අවශ්‍ය දර,තෙල් ආදී අවශ්‍යදේ ද රැගෙන ගොස් සිරුර ද සමග දවනු වස් සුසාන භූමි පාලිකාවට භාර දුන් හ. සිරුර දවන්නට සැරසුණු පාලිකාව ඇයගේ ඇඳුම් පැළඳුම් ඉවත් කරන විට සිරුරේ ප්‍රියංකරත්වය දැක මෙය භාවනා කරන හිමියන්ට සුදුසු අරමුණක් වෙතියි සිතා උන්වහන්සේ වෙත ගොස් "ස්වාමීනි, භාවනාවට සුදුසු අරමුණක් දක්වන්නෙමි" යි උන්වහන්සේ කැඳවා එය දැක්වී ය. උන්වහන්සේ ද ගොස් හිස සිට පාදාන්තය දක්වා සිරුරේ රූ සිරි මැනවින් නරඹා "මේ රන්වන් සිරුර ආදාහන කරන විට සිරුරට ගිනිදැල් වැටෙන විට ම මට කථා කරන්නැයි පැවසූ හ.

දරසෑය සකස් කර සිරුර ඒ මත තබා තෙල් වත් කොට ගිනි තැබූ පාලිකාව සිරුරට ගිනිදැල් වැදෙත් ම භාවනායෝගී මහා කාල හිමියන් එහි කැඳවූ හ. සිරුර ගිනිදැල් වලින් වැසෙත් ම රන්වන් හම හම ගැසූ එළදෙනකු ගේ මෙන් වී අත පය ඇඹරී කැරකී යන හැටි උන්වහන්සේ බලා සිටිය හ. මස් පිළිස්සෙමින් ඇට කටු පෑදෙන හැටි නැරඹූ හ. "බලන අයට බණ අමතක වන සුරූපී සිරුරක්ව පැවති මෙය දැන් දැවී වැනසී යයි." යි සිතූ තෙරණුවෝ ඒ අරමුණ ම භාවනාවට නගා රහත්ඵලය අධිගමනය කළහ.

මේ දිනවල භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් පිරිවරා සේතව්‍යා නුවරට වැඩම කළ හ. චූල කාල ගේ පුරාණ භාර්‍යාවෝ දැන් අපි අපේ ස්වාමිපුරුෂයා නැවත ලබා ගනිමු යි සිතා බුදු පාමොක් මහ සඟනට දානයට ආරාධනා කළ හ. දානයට පෙර සංවිධාන කටයුතු සඳහා උපදෙස් දීමට එක් හිමිනමක් නිවසට යාමේ සිරිතක් තිබිණි. ඒ සඳහා චූල කාල හිමියෝ පිටත් ව ගියහ. උන්වහන්සේ නිවසට පැමිණි විට පැරණි භාර්‍යාවෝ බලහත්කාරයෙන් සිවුරු ගලවා ගිහිවත් අන්දවා ගෙදර රඳවා ගත්හ.

**විවරණාත්මක අනුවාදය (7 ගාථාව)**

**සුභානුපස්සිං විහරන්තං ඉන්ද්‍රියෙසු අසංවුතං**
**භොජනම්හි ච අමත්තඤ්ඤුං කුසීතං හීනවීරියං තං වෙ**
**පසහති මාරො වාතො රුක්ඛං ඉව**

**සුභානුපස්සිං**: කාම වස්තුන්ගේ ශුභ පක්ෂය ගැන පමණක් සිතමින්; **විහරන්තං**: වාසය කරන; **ඉන්ද්‍රියෙසු** ඉන්ද්‍රියයන් **අසංවුතං**: සංවරයක් නැති; **භොජනම්හි**: ආහාරයෙහි; **අමත්තඤ්ඤුං**: පමණ නොදන්නා; **කුසීතං**: කම්මැලි; **හීනවීරියං**: වීර්‍යය නොවඩන; **තං**: එම පුද්ගලයා; **පසහති**:අබිබවා සිටියි ; **මාරො**: මාරයා; **වාතො**: වාතය; **දුබ්බලං**: දුර්වල; **රුක්ඛං ඉව**: වෘක්ෂයක් (කඩා හෙළන්නාක්) මෙන්.

කම් සැපෙහි ආස්වාද ජනක ස්වභාවය ගැන පමණක් සිතමින් ඉන්ද්‍රිය සංවරයෙන් තොරව ආහාරයෙහි පමණ නො දැන කම්මැලි ව වීර්‍යය නො වඩමින් වසන තැනැත්තා මරුට පරදින්නේ කුණාටු සුළඟින් කඩා වැටෙන ගසක් මෙනි.



*ඉන්ද්‍රිය සංවරයක් ඇති තැනැත්තා මරු වසඟට නො යන්නේ වාතයෙන් පර්වතයක් නො සැලෙන්නාක් මෙනි.*

8. අසුභානුපස්සිං විහරන්තං
ඉන්ද්‍රියෙසු සුසංවුතං
භොජනම්හි ච මත්තඤ්ඤුං
සද්ධං ආරද්ධ වීරියං
තං වෙ නප්පසහති මාරො
වාතො සෙලං'ව පබ්බතං (1:8)

වසමින් අසුබ බැවුමෙන්
දමනය කළොත් ඉඳුරන්
පමණ දැන බොජුනෙහි
සැදැහැතිව විරිය වඩමින්
වසතොත් නො විදියි මරු පහර
නො සැලෙන ගලක් මෙන්
සැඩ කුණාටුවකින්.

# ආධ්‍යාත්මික ශක්තිය අපරාජිතය

## 1 (6) මහාකාල තෙරුන්ගේ වස්තුව (7 හා 8 ගාථා) ඉතිරිකොටස

**චූල කාල** පැවිදි වූයේ පැවිද්දට ඇල්මක් තිබුණු නිසා නොව මහා කාල හිමි උපැවිදිකරවා ගැනීමේ අදහසින් හෙයින් හෙතෙම සිය කැමැත්තෙන්ම ඒ තත්ත්වය භාර ගත්තේ ය.

චූල කාල රඳවා ගැනීමට ඔහුගේ බිරින්දෑන් සමත්වූ බව දුටු මහා කාල ගේ භාර්යාවෝ අට දෙනා ද 'අපිත් එසේ කරමු'යි භාග්‍යවතුන් වහන්සේ ප්‍රමුඛ සංඝයාට දන් පිණිස ඇරයුම් කළ හ.  එදින දන් වළඳා අවසන "මහාකාල ඔබ මේ අයට අනුමෝදනා බණ කියන්නැ"යි උන්වහන්සේ නවතා ශ්‍රාවක පිරිස සමග විහාරස්ථානයට වැඩම කළ හ.

භාග්‍යවතුන් වහන්සේ ගම් දොරට වැඩම කරන අතර තුර භික්ෂූහු බුදුරදුන් මහාකාල තෙරුන් නවතා පැමිණීම ගැන අමනාපයෙන් කතා කළ හ. "එදා දානයේ උපදෙස් කටයුතු වලට චූල කාල තෙරුන් යාමෙන් සිදු වුණේ පරණ බිරින්දෑන් එක්ව උන්වහන්සේගේ සිවුරු ගලවා ගිහිගෙට ගැනීමයි. අද යන්තම් වෙන හිමි නමක් ගිය නිසා ඒ වගේ විපත්තියක් වුණේ නැහැ. දැන් මේ බුදුහාමුදුරුවෝ උන්වහන්සේව බණ කියන්න නවත්තලා ආවා. මොනවා වෙයි ද දන්නේනෑ. බුදුහාමුදුරුවෝ හිතාමතා කළා ද මේ වැඩේ?" වැනි අදහස් හුවමාරු විණි.

මේ අතරතුර මහාකාල තෙරුන් ගේ භාර්යාවෝ එතුමන් ගේ සිවුරු බලෙන් ගලවන්නට තැත් දැරූහ. සිය ඍද්ධි බලයෙන් ඔවුන් ගෙන් මිදුණු මහාකාල හිමියෝ බුදුරජාණන් වහන්සේ හමුවෙහි පෙනී සිටිය හ. එවිට මෙහි දැක්වෙන ගාථා දෙක වදාළ භාග්‍යවතුන් වහන්සේ මහාකාල හිමියන් චූල කාල ගේ මට්ටමෙන් මැනීම ගැන භික්ෂූන් වහන්සේට දොස් පැවරූ හ.

**විවරණාත්මක අනුවාදය (8 ගාථාව)**

**අසුභානුපස්සිං විහරන්තං ඉන්ද්‍රියෙසු සුසංවුතං**
**භොජනම්හි ච මත්තඤ්ඤුං සද්ධං ආරද්ධවීරියං මාරො**
**තං වෙ නප්පසහති වාතො සෙලං පබ්බතං ඉව**

**අසුභානුපස්සිං**: කාමයෙහි අසුභ පක්ෂය දකිමින්; **විහරන්තං**: වාසය කරන, **ඉන්ද්‍රියෙසු**: ඉන්ද්‍රියන්, **සුසංවුතං**: මනාව සංවර කර ගත්; **භොජනම්හි ච**: ආහාරයෙහි ද; **මත්තඤ්ඤුං**: පමණ දත්; **සද්ධං**: ශ්‍රද්ධා සම්පන්න; **ආරද්ධ වීරියං**: ඇරඹූ වීර්යය ඇති; **මාරො**: මාර තෙම; **තං**: එම පුද්ගලයා; **වෙ**: ඒකාන්තයෙන් ම; **නප්පසහති**: අබිබවා නොසිටියි; **වාතො**: වාතය; **සෙලං පබ්බතං**: ගල් පර්වතයක්; **ඉව**: මෙනි. (නොපෙරළෙන මෙනි)

කම් සුවයෙහි අසුභ පක්ෂය තේරුම් ගෙන ඉඳුරන් හික්මවා ගෙන, ආහාරයෙහි පමණ දැන, ශ්‍රද්ධා සම්පන්නව වීර්යය වඩමින් වසන්නා පරාජය කිරීමට මරුවාට හැකි නොවෙයි. වාත වේගයෙන් ගල් පර්වතයක් නො සැලෙන්නාක් මෙනි.

**විවරණය**

සුභවාදී දෘෂ්ටියෙන් ලොව බලන්නෝ "ජීවිතය රෝස මල් යහනකි" යි සිතා මුළා වෙති. රෝස මලේ වුව ද 'නටුවෙ කටු' අමතක කළ යුතු නැත. කාමයෙහි ආස්වාදය පමණක් දකින්නෝ ආදීනව නො දැක ඒ කෙරේ තෘෂ්ණාව වර්ධනය කර ගනිති. මම ය, මාගේ යැයි ගනිති. එසේ මමායනයෙන් ග්‍රහණය කළ දේ වැනසී යන විට මගේ දේ වැනසෙති යි සංවේගයට පත් වෙති. එහෙත් කාම වස්තූන්ගේ ආදීනවය ද මෙනෙහි කරන්නෝ එහි අසුභ පැත්ත ද දක්නා හෙයින් ඒවායේ නො ඇලෙති. එහෙයින් ඒවායේ විනාශය ඔවුන් ගේ සිත් තුළ දුකක් ජනිත නො කරයි.

අසුභානුපස්සී යන්නෙන් වේදනාත්මක බව පමණක් මෙනෙහි කර වෛරය හෝ පිළිකුල උපදවා ගත යුතු යැයි වරදවා නො ගත යුතු ය.

එසේ කළ හොත් එය '**පටිඝසඤ්ඤා**' වැඩීමක් වෙයි. එය දුරු කළ යුත්තක් මිස වැඩිය යුත්තක් නොවේ. මෙයින් අදහස් කළේ බොහෝ දෙනා විසින් නො තකා හරිනු ලබන කාමයන් හි ආදීනව ගැන මෙනෙහි කරවීමය. කාමයෙහි ආදීනව නො දන්නා හේතුවෙන් බොහෝ දෙනා ඒකාංගි ක දෘෂ්ටි ඇති කර ගෙන දුකෙහිම නිමග්න වෙති. නියම සුභවාදය නම් සුභ මෙන් ම අසුභය ද දකිමින් ඒක පාක්ෂික නො වී ජීවිතයේ ගැටළු දෙස ගැඹුරින් බලන්නට පුරුදුවීමයි.

මේ ගාථා යුග්මයෙන් ඉදිරිපත් කරන්නේ ආධ්‍යාත්මික සාර්ථකත්වයෙන් ප්‍රීතිමත් වන බෞද්ධ සදාචාර මාර්ගයයි. යථාර්ථය දැකීම ප්‍රථම පියවරයි. ඉන්ද්‍රිය සංවරයෙන් ප්‍රිය දේ කෙරෙහි ඇල්ම හා අප්‍රිය දේ කෙරේ ද්වේෂය ඇති කර ගැනීම පාලනය කෙරෙයි. අධික ආහාර සේවනය හා කුසීත  බව ජීවිතයකට ලෞකික වශයෙන් පවා අභාග්‍යය උදා කරන සිරිත් ය. ඒවා දුරු කර ධෛර්යය වීර්යය වර්ධනය කර ගන්නේ නම් පර්වතයක් සුළඟින් නොසැලී පවතින්නාක් මෙන් ජීවිතයට ජයග්‍රාහීව මුහුණ දිය හැකි වෙයි.





*කෙලෙස් කසට දුරු නො කළ ඉඳුරන් නොදැමූ, සැබෑ වචන නොමැත්තා සිවුරු දැරීමට නු සුදුසු ය.*

9. අනික්කසාවො කාසාවං
යො වත්ථං පරිදහෙස්සති
අපෙතො දමසච්චෙන
න සො කාසාවමරහති (1:9)

දුරු කර නැති කෙනෙක් කසල
පොරවන මුත් කසාවතක්
සත්‍යය, දමනය නැති ඔහු
නො ගැලපේ ය, කසාවතට

# කසාවතට නො ගැලපෙන්නෝ

## 1 (7) දෙව්දත් තෙරුන් ගේ කතාව (9 හා 10 ගාථා)

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් **දෙව්දත් තෙරුන්** ඇරබ මේ ගාථා යුග්මය දේශනා කළ හ.

වරක් අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා දෙ නම පන්සියයක් බැගින් පිරිවර භික්ෂූන් වහන්සේලා ද කැටිව බුදුරජාණන් වහන්සේ ගෙන් අවසර ගෙන ජේතවන විහාරයේ සිට රජගහ නුවර බලා පිටත් වූ හ. උන් වහන්සේලා ගේ සම්ප්‍රාප්තියෙන් ප්‍රීතියට පත් රජගහ නුවර පුරවැසියෝ ආගන්තුකව පැමිණෙන උතුමන්ට දන් දීමේ පෙර සිරිත පරිදි තනි තනිව හෝ දෙතුන් දෙනා හෝ කිහිප දෙනා එක්ව දානමානාදියෙන් උපස්ථාන කළ හ.

එක් දිනක් දන් වළඳා අවසන භුක්තානුමෝදනාව කරන සැරියුත් මහ රහතන් වහන්සේ "පින්වතුනි, යම්කිසි පුද්ගලයෙක් තමන් දන් දෙයි. එහෙත් අන් අය දීමෙහි ලා උනන්දු නො කරයි. හෙතෙම දන් දුන් පිනින් බොහෝ සැප සම්පත් ලබයි. එතකුදු වුවත් පරිවාර සම්පත්තිය නො ලබයි. තවත් කිසියම් පුද්ගලයෙක් තම ඥාති-මිත්‍ර අසල්වාසී ජනයා දන් දීමෙහි ලා පොළඹවයි. එහෙත් තෙමේ දන් නො දෙයි. හෙතෙම මතු භවයෙහි පරිවාර සම්පත්තිය ලබයි. වෙනත් පුද්ගලයෙක් තමාත් නො දෙයි. අන්‍යයන් ද දීමට යොමු නො කරයි. හෙතෙම පින් මඳ හෙයින් මතු භවයන්හිදී කුස පුරා අහරක් නො ලබයි. දුගී දුප්පත් අසරණ වෙයි. එමෙන් ම පිරිවර සම්පත්තියක් ද නො ලබා තනිවෙයි. තවත් තැනැත්තෙක් තෙමේත් දන් දෙයි. අන්‍යයන් ද දීමට පොළඹවයි. හෙතෙම මතු සසර සිය ගණන් ආත්ම භාවයන්හි යස ඉසුරෙන් ද ආඪ්‍යව පිරිවර සම්පත්තිය ද ලබා සතුටු වෙයි." යනුවෙන් ධර්මය දේශනා කළ සේක. දේශනාව අවසානයේ එක් උපාසකයෙක් "ස්වාමීනි, හෙට මගේ දානය පිළිගත මැනවි" යි ආරාධනා කළේ ය. තවත් සැදැහැතියෙක් ඉදිරිපත් ව ලක්ෂයක් වටිනා රෙද්දක් පරිත්‍යාග කරමින් "හෙට දානයට මොන යම් දෙයක් වුවමනා වුනොත් මෙය විකුණා මුදල් ගෙන එය පිරිමහන්න. එසේ අවශ්‍ය නුවුවහොත් වස්ත්‍රය කවර හෝ හිමි නමකට පූජා කරන්න" යි පැවසී ය. කෙසේ වුවද දානය සඳහා කිසි ම අඩුපාඩුවක් නො වූයෙන්, වස්ත්‍රය කාට පූජා කළ යුතුදැයි ප්‍රශ්නයක් ඇති විය.

"සැරියුත්-මුගලන් දෙනම සිටියා වුව ද උන් වහන්සේලා මෙහි පැමිණෙන්නේ කලාතුරකිනි. දේවදත්ත ස්ථවිරයෝ රජගහ නුවර නිත්‍යවාසීහු ය. වස්ත්‍රය උන් වහන්සේට පිළිගන්වමු"යි එය දෙව්දත් තෙරුන්ට පූජා කළහ. ඇත්තම කිවහොත් දායකයන් අතර මේ ගැන දිග කතාවක් ඇති විය. සැරියුත් හිමියන්ට පිරිනමන්නට බොහෝ අය කැමති වුව ද කලාතුරකින් වඩිනා සැරියුත් හිමියන් මෙන් නොව අපේ දනට, බණට, උත්සව දවසට මෙන් ම උත්සව නැති දවසට ද අප සමගම සිටින්නේ දේවදත්ත ස්ථවිරයෝ ය. උන් වහන්සේ හරියට පිංතාලියක් මෙන් ප්‍රයෝජනවත්ය" කියන්නන් බහුල වූයෙන් ඡන්දය විමසා බලන විට දේවදත්ත ස්ථවිරයන්ට පක්ෂ පිරිස හතර දෙනෙකුන් ගෙන් වැඩි වූ හෙයින් මෙය මෙසේ සිදු විය. දේවදත්ත හිමියෝ එම රෙද්ද කප්පවා, මස්සවා, පඬු පොවා සිවුරක් හා අඳනයක් සකස් කරවා ගෙන ගමන් බිමන් යන විට මහත් අභිමානයෙන් හැඳ පොරවා ගිය හ. ඒ දුටු සමහර භික්ෂූහු "මේ සිවුර දේවදත්ත හිමියන්ට තරම් නොවේ. මෙය ගැලපෙන්නේ සාරිපුත්ත හිමියන්ට ය. මේ තෙරුන් තමන්ට ගැලපෙන්නේ නැති සිවුරක් හැඳ ගෙන ඔබ මොබ ගමන් කිරීම නොහොබී"යි කතිකා කළහ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, දේවදත්ත තමන්ට නො ගැලපෙන වස්ත්‍රයක් පරිහරණය කළේ දැන් පමණක් නොව අතීතයේ ද එසේ කළහ" යි වදාළහ. අනතුරුව උන් වහන්සේ අතීත කතාව මෙසේ විස්තර කළහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි බරණැස එක්තරා පුද්ගලයෙක් ඇතුන් මැරීමෙන් ජීවිකාව කළේ ය. එක්තරා වනාන්තරයක ඇත්තු දහස් ගණනක් සුවසේ වාසය කළහ. දිනක් වනයේ සංචාරය කරද්දී ඔවුහු පසේ බුදු නමක් දුට හ. උන් වහන්සේ දැක සිත් පහන් වූ ඔවුහු උන් වහන්සේට නමස්කාර කළ හ. එදා පටන් එතැනින් යන එන හැම විට ම පසේ බුදුරජාණන් වහන්සේට නමස්කාර කර යාමට ඔවුහු පුරුදුවූ හ.

### විවරණාත්මක අනුවාදය (9 ගාථාව)

**අනික්කසාවො දමසච්චෙන අපෙතො යො කාසාවං**
**වත්‍ථං පරිදහෙස්සති සො කාසාවං න අරහති**

**අනික්කසාවො**: කෙළෙස් කහට දුරු නො කළ; **දමසච්චෙන**: ඉන්ද්‍රිය දමනයෙන් හා සත්‍යවාදිත්වයෙන්; **අපෙතො**: තොරවූ; **යො**: යම් පුද්ගලයෙක්; **කාසාවං වත්‍ථං**: කහවත්; **පරිදහෙස්සති**: හඳින්නේ නම්; **සො**: හෙතෙම; **කාසාවං**: කහවතට; **න අරහති**: නුසුදුසු වෙයි.

කහ සිවුරක් හැඳ සිටිය ද, කෙළෙස් කසළ දුරු නො කළ ඉන්ද්‍රිය දමනයෙන් හා සත්‍යවාදිත්වයෙන් තොර තැනැත්තා කහවත් දරන්නට සුදුසු අයෙක් නොවේ.





*කෙලෙස් කසට පහ කළ, මනා සිල් ඇති, ඉඳුරන් දැමූ තැනැත්තා කසාවත දැරීමට සුදුසු ය.*

10. යො ච වන්ත කසාවස්ස
සීලෙසු සුසමාහිතො
උපෙතො දමසච්චෙන
ස වෙ කාසාවමරහති (1:10)

කෙළෙස් කහට දුරු කෙරුවෝ
මැනවින් සිල් ගුණ පිරුවෝ
සත්‍යය දමනය වැඩුවෝ
කසාවතට නිසි වූවෝ

# සිල් ගුණයෙන් සරු වූවෝ කසාවතට නිසි වූවෝ
## 1 (7) දෙව්දත් තෙරුන් ගේ කතාව (9-10 ගාථා) (ඉතිරි කොටස)

දිනක් මේ අසිරිමත් චාරිත්‍රය හස්ති ඝාතකයා ගේ නෙත ගැටිනි. "මා දැන්ම ම කහ සිවුරක් හොයා ගත යුතු"යි සිතූ හෙතෙම එක්තරා පසේ බුදු නමක් දිය නෑමට විලට බස්නා තුරු රැක හිඳ උන් වහන්සේගේ සිවුර සොරකම් කර ගත්තේ ය. එය පොරවා ගෙන ඇතුන් ගමන් කරන මග එක් තැනක පළක් බැඳ හිඳ ගත් හේ හිස පටන් සිවුර පොරවා තෝමරය ද සඟවා ගෙන රැක සිටියේ ය. එසේ සිට අන්තිමට ම එන ඇතා තෝමරයෙන් ඇන මරා ගන්නා හේ දළ හා වෙනත් ප්‍රයෝජනයට ගත හැකි අංග උපුටා ගෙන ඉතිරිය වළලා දමා ගියේ ය. මේ සිරිත කලක් කර ගෙන යන අතර අප මහ බෝසත්හු මේ ඇත් රැළෙහි නායකත්වයට පත්වූ හ. ඉන්පසුව ද ඇත් මරුවා තම සුපුරුදු උපක්‍රමය අනුගමනය කරයි. තම රැළෙහි ඇතුන් ක්‍රමයෙන් අඩුවෙනු තේරුම් ගත් බෝසත් තෙම "අපේ රැළ කුඩා වන්නේ මේ ඇතුන් කොහි යන නිසාදැ"යි විමසූහ. තමන් නොදන්නා බවඅ නිකුත් හස්තීහු කියා සිටිය හ.

"මොවුන් කොහි ගියත් මට කියා මිස නො යති. එහෙයින් කිසියම් අනතුරක් ම විය යුතු ය" යි සිතූ බෝසත්හු "හිස පටන් කසාවත් පොරවා ගෙන සිටින තැනැත්තා සැක කටයුතු ය. ඔහු ගැන විමසිලිමත් වුව මනායැ"යි සිතා ගත්තේ ය.

ඇත් මුලෙ හි නායක වූ අප බෝසත්හු මෙසේ සිත උපන් සැකය මුල් කර ගෙන "විමසා බලමි" යි සිතා සියළු ඇතුන් පෙරටුව යවා සෙමින් සෙමින් අන්තිමයා ව පැමිණියේ ය. ඇත්තු ද සිවුරු පෙරෑ වූ ඇත් මරුවාට වඳිමින් එකිනෙකා පෙළට ගමන් කළහ. ඇත් මරුවා ද බෝසතුන් අන්තිමට එනු දැක සිවුර මෑත් කර තෝමරය අතට ගත්තේ ය. බෝසත්හු ද "මේ මාගේ පිරිවර වනසන මරුවා බව නියත යැ"යි සිතමින් ප්‍රහාරයකට මුහුණ දෙන්නට සැරසුණ හ.

ඇත් මරුවා තෝමරය දමා ගසත් ම ඉවතට පැන දිවි ගලවා ගත් බෝසත්හු ඔහු අල්ලා ගන්නට ඉදිරියට දිව ආහ. එහෙත් ඇත් මරුවා දිව ගොස් ගසකට මුවා විය. "මම මේ ගසත් මිනිසාත් එකට හිර කර ගනිම්"යි බෝසත්හු දෙදෙනාම හොඬවැලෙන් අල්ලා සිර කර ගන්නට සිතූ හ. එවිට දිවි ගලවා ගැනීම පිණිස ඇත්මරුවා සිවුර ගලවා ඉදිරියට පෑවේ ය. "දැන් මේ සිවුර ඇද දමා මොහු අල්ලා මරා දැමුව හොත් බුදු-පසේබුදු - මහරහතුන් පොරෝන චීවරයට නිග්‍රහ කළා නම් වන්නේ ය. එසේ කරන්නට අකැමැත්තෙමි"යි සිතූ බෝසත්හු ඉවසා දරා ගනිමින් ඔහුගෙන් මෙසේ විමසූ හ.

"මගේ වගීයා නැසුවේ තොප නොවේ ද?"
"එසේමැයි උතුමාණනි"

"එවැනි කුරුරු කමක් කළේ කවර හෙයින් ද? නුඹ පොරවා ගෙන සිටින්නේ කෙළෙස් නැසූ උතුමන් පොරවන චීවරයකි. එය නුඹට කිසිසේත් නො ගැළපෙයි. මෙවැනි පහත් ක්‍රියාවක් කිරීමෙන් තොප කර ඇත්තේ බලවත් අකුශල කර්මයකි." එසේ පැවසූ බෝසත්හු "නුඹ කළේ ඉතාමත් අශික්ෂිත අසෝබන ක්‍රියාවකැ"යි නිග්‍රහ කළහ.

**විවරණාත්මක අනුවාදය (10 ගාථාව)**

**යො ච වන්තකසාවස්ස සීලෙසු සුසමාහිතො දමසච්චෙන ස උපෙතො ස වෙ කාසාවං අරහති**

**යො ච**: යම් කිසි පුද්ගලයෙක්; **වන්ත කසාවස්ස**: කෙළෙස් කසලින් දුරු වූයේ; **සීලෙසු**: සීලයන්හි; **සුසමාහිතො**: මනාව හික්මුණෝ; **දමසච්චෙන**: දමනයෙන් හා සත්‍යයෙන්; **උපෙතො**: සමන්විත වූයේ ද; **ස**: හේ; **කාසාවං**: කහවත් (දරන්නට); **අරහති**: සුදුසු වේ.

යම් කිසි පුද්ගලයෙක් කෙලෙස් කහට දුරු කර මනාව ශීලය ආරක්ෂා කර ගෙන ඉන්ද්‍රියයන් දමනය කර ගනිමින් සත්‍යවාදීව වාසය කරන්නේ නම් හේ සිවුරු දරන්නට සුදුසු වෙයි.

**විවරණය**

**කාෂාය වස්ත්‍රය**: කාෂාය වස්ත්‍රය හෙවත් සිවුර චරිත ශුද්ධියේ සංකේතයක් වැනි ය. බුදු-පසේබුදු-මහ රහතන් වහන්සේලා ගේ 'ඇඳුම' වන මෙය හැඳගත් මාත්‍රයෙන් ම බොහෝ දෙනා ගේ වන්දනාමානාදිය ලැබෙයි. එහෙයින් මෙය දරන්නට පෙර තමා ඊට නිස්සකු බවට පත් විය යුතුව පවතියි.

සිවුරක් දැරූ වහා ම තමා ගෘහස්ථයන් ගෙන් වෙනස් බවට පත්ව ඇත යන හැඟීම (වේවණ්ණියම්හි අජ්ඣුපගතො ති) පැවිද්දෙකුට ඇති විය යුතු ය. ඒ හැඟුම හා ගෘහස්ථයන් පසග පිහිටුවා වැදීම ද හේතුවෙන් නව ජීවිතයක්, නව පිළිවෙතක් තමා සඳහා වෙන්ව ඇති බව තේරුම් ගෙන ආදර්ශවත් චර්යාවකට යොමු වෙයි. භාග්‍යවතුන් වහන්සේ දේවදත්ත චීවරධාරීත්වයට නුසුදුස්සෙකැයි වදාළේ මේ අනුව ය.





*නිසරුදෙය සරුය, සරුදෙය නිසරුය යන වැරදි අදහස් ගොදුරු කොට ඇත්තාහු සරුවූ නිවන්සුව නොලබත්.*

11. අසාරෙ සාරමතිනො
සාරෙ චා සාරදස්සිනො
තෙ සාරං නාධිගච්ඡන්ති
මිච්ඡා සඞ්කප්පගොචරා (1:11)

නිසරු දේ සරු සේ
සරු දේ සාර නැති සේ
වරදවා ගත හොත්
නො ලැබෙයි සාර කිසිවක්.

# මිසදිටු ගත හොත් - යහ මං ඇවිරෙත්.

## 1 (8) සැරියුත් මුගලන් දෙනම ගේ කතාව (11-12 ගාථා)

රජගහ නුවර වේළුවන විහාරයෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ සැරියුත් මුගලන් දෙනම ගේ ගුරුවරයා ව සිටි **සංජය** ඇරබ මේ ගාථා යුග්මය වදාළ හ.

රජගහ නුවරට නුදුරෙහි උපතිස්ස ගම සහ කෝලිත ගම නම් වූ බමුණු ගම් දෙකක් තිබිණ. උපතිස්ස ගමෙහි විසූ රූපසාරී නම් බ්‍රාහ්මණ කාන්තාව ගැබ් ගත් දිනයේ ම කෝලිත ගමෙහි විසූ මොග්ගලී නම් බ්‍රාහ්මණ කාන්තාව ද ගැබ් ගත්තා ය. මේ පවුල් දෙක පරම්පරා හතක පටන් ම දැඩි මිත්‍රත්වයෙන් වෙලී සමීපව සිටි බව කියනු ලැබේ. මේ පවුල් දෙක ම එක ම දිනෙක ගැබ් පෙළහර නම් වූ ගැබිණි මවුවරුන් ගේ ආරක්ෂාව සඳහා වන විශේෂ ආගමික කාර්‍ය්‍ය ද කළ හ. දස මස් ඇවෑමෙන් දෙදෙනාම පිරිමි දරුවෝ දෙදෙනෙකු ප්‍රසූත කළ හ.

සාරී බැමිණියගේ දරුවා ගමෙහි ගම්පති පවුලෙහි උපන් හෙයින් ගමේ නමින් ම 'උපතිස්ස' ලෙස නම් කරන ලදි. ඒ අනුව ම මොග්ගලී ගේ දරුවාට ද 'කෝලිත' යන නම ඔවුන් ගේ පවුල ද ගම්පති පවුල වූ හෙයින් යොදන්නට පියවර ගැනිණි. දරුවෝ දෙදෙන ම වැඩි වයසට පත්වන අතර උසස් අධ්‍යාපනයකට හිමිකම් ලබා විවිධ ශිල්ප ශාස්ත්‍රයන් හි නිපුණ වූ හ. නිතර නිතර හමු වන ඔවුනට 500 බැගින් පිරිවර තරුණයෝ ද වූ හ.

හැම වසරක ම රජගහ නුවර පැවැත්වෙන 'ගිරග්ග සමජ්ජ' නම් උත්සවයක් විය. එය පැවැත්වුණේ කඳු ශිඛරයක ය. නැටුම් ගැයුම් වැයුම් ප්‍රාසාංගික අංගයන් ගෙන් සපිරුණු සැණකෙලිය නරඹන්නට මේ ප්‍රභූ යෞවනයන් දෙපළට විශේෂ අසුන් දෙකක් පණවා තිබිණි. එක ලග වූ අසුන් දෙකෙහි හිඳ සංදර්ශනය නැරඹූ ඔවුහු දින ගණනක් එහි වූ ප්‍රහසන නරඹමින් සිනාසුණ හ. ශෝකාන්ත නරඹා ශෝක වූ හ. පරිත්‍යාග කරන්නට අවස්ථා උදා වූ විට නිර්ලෝභීව පරිත්‍යාග කළ හ.

දින ගණනක් මෙසේ විනෝද වූ පසු එක් දිනක් ඔවුහු ඒ ගැන ගැඹුරට සිතන්නට වන් හ. මේ නැටුම් ගැයුම් වැයුම් සියල්ල මවා ගත් විනෝදයන් නො වේ ද? මොවුන් කරන්නේ අප යථාර්ථයෙන් මුවා කර ව්‍යාජ චමත්කාරයක් මවා දීමක් නො වේ ද? මේ සියලු නැටුම් ගැයුම් වැයුම් පවත්නේ සුළු කලකි. මේ සියළු නළු නිළියන්ගේ රූ සොබා වසර කිහිපයකින් වැනසී මහලුව ජරපත්ව අප්‍රසන්න වනු ඇත.

එදා උපතිස්ස සිනා විය යුතු තැන සිනාසුනේ නැත. හැඬිය යුතු තැන ඔහු ගේ දෙනෙතෙහි කඳුලක් නො නැගිණ. හේ කෝලිත දෙස බැලී ය.

ඔහු ද එසේම ය. කෝලිත උපතිස්ස ඇමතී ය. "අද ඔබ අමුතුයි. ඊයේ පෙරේදා වගේ විනෝදාස්වාදයක් ලබන බවක් පෙනෙන්ට නැහැ. ඇයි අමුත්ත?" උපතිස්ස ගේ පිළිතුර වූයේ "මම මේ කල්පනා කළේ මේ දර්ශන මොන තරම් බොරුවක් ද කියලයි. මේවායින් ලබන්නෙ බොරු තාවකාලික සතුටක් නේ ද? මේවායේ කිසිම අර්ථයක් නැහැ. ප්‍රයෝජනයක් නැහැ. මොනවද අපි මේ බලා ඉන්න විකාර. මම කල්පනා කළේ ඇයි අපි මේ තාවකාලික දේ පස්සේ දුවන එක නවත්වලා සදහට පවතින විමුක්තියක් ගැන හිතන්නේ නැත්තේ කියලයි. යාළුවා, ඔයාටත් මොකක් හරි ප්‍රශ්නයක් තිබෙන බව පේනවා. ඔබ වැඩි සතුටක් නැතිව කල්පනා බරව හිටියේ ඇයි?" යන්නයි.

"මමත් ඔය ගැනමයි හිත හිතා හිටියේ. මටත් හිතුණා මේ මායාවෙන් මිදිලා සරු සාර දෙයක් හොයන්න ඕන කියලා." යි කෝලිත ද පිළිතුරු දුන්නේ ය.

"ඉතින් අපි දෙන්නම එකතු වෙලා විසඳුමක් හොයමු. අද ඉඳලා ලෝකයේ සැබෑ තතු ගැනත් සැබෑ ප්‍රශ්න වලට නියම විසඳුමක් ගැනත් අපි දෙන්නා ම හොයමු"යි ඔවුහු කතිකා කර ගත් හ. "මුලින් ම මොකද කරන්නේ?" එවකට රජගහ නුවර විසූ සංජය නම් පරිබ්‍රාජකයා ලග පැවිදි වන්නට ඔවුහු තීරණය කර ගත් හ. පිරිවර ජනයා අඩක් සතුන් බැඳි වාහන සමග නිවෙස් බලා යැවූ ඔවුහු පන්සියයක් සමග සංජය වෙත ගොස් පැවිදි වූ හ. ඔවුන් දෙදෙනා 500 ක් සගයන් ද සමග පැවිදි වීමෙන් සංජය ගේ කීර්තිය ද පැතිර ගියේ ය.

දෙදෙනා ම එක්ව ඉතා උනන්දුවෙන් සංජය ගේ දර්ශනය මැනවින් ඉගෙන ගත් හ. ඉතා ටික දිනකින් ම සංජය ගේ ඉගැන්වීම් නිම වූ වගක් ඔවුන්ට හැඟිණි. එහෙයින් ඔවුහු "ගුරුතුමනි, ඔබතුමන් ගේ සියලුම ඉගැන්වීම් මෙ පමණ ද? තවත් අපට නො ඉගැන්වූ දෙයක් තිබෙනවා දැ"යි ඔවුහු විමසූ හ.

"එපමණයි. ඔබ දැන් සේරම ඉගෙන ගෙන ඉවරයි" හේ පිළිවදන් දුන්නේ ය.

**විවරණාත්මක අනුවාදය (11 ගාථාව)**

**අසාරෙ සාරමතිනො සාරෙ ච අසාරදස්සිනො**
**මිච්ඡාසඞ්කප්පගොචරා තෙ සාරං න අධිගච්ඡන්ති**

**අසාරෙ**: හරවත් නොවන දේ; **සාරමතිනො**: හරවත් යැයි සිතන; **සාරෙ ච**: හරවත් දේ විෂයෙහි; **අසාරදස්සිනො**: නිසරු දේ යැයි සිතන; **මිච්ඡාසඞ්කප්පගොචරා**: මිථ්‍යා සංකල්පනාවන්ට ගොදුරුවූ; **තෙ**: ඔවුහු; **සාරං**: අනර්ඝ දේ; **න අධිගච්ඡන්ති**: සාධනය කර නො ගනිති.

නිසරු දේ සරු යැයි සිතමින් සාරවත් දේ නිසරු දේ යැයි පටලවා ගෙන මිථ්‍යා සංකල්පනා වලට ගොදුරු වන පුද්ගලයෝ කිසි කලෙක ජීවිතයේ උසස් අධිගම සාධනය කර නො ගනිති.



*සරුදෙය සරු ලෙසත්, නිසරුදෙය නිසරු ලෙසත් නිවැරදිව දක්නාහු සාරවු නිවන් සුව ලබත්.*

12. සාරඤ්ච සාරතො ඤත්වා
අසාරඤ්ච අසාරතො
තෙ සාරං අධිගච්ඡන්ති
සම්මා සඞ්කප්ප ගොචරා

සරුදේ සරු ලෙස පිළිගෙන
නිසරු-නිසරු ලෙස දැන ගෙන
නිවැරදි සිතුවිලි වඩමින
ලබති'සාර'නුවණැති දන.

# සරු දේ හඳුනත් නුවනින් පිබිදෙත්.

## 1 (8) සැරියුත් මුගලන් දෙනම ගේ කතාව (11-12 ගාථා) (ඉතිරි කොටස)

එහෙත් **උපතිස්ස** ගේ හා කෝලිත ගේ මූලික ගැටලු තවමත් එසේ මය. ඒවාට පිළිතුරු සොයා ගත යුතුය. "තව දුරටත් සංජය ගෙන් උගන්නට දෙයක් නැති හෙයින් අපි දඹදිව පුරා ඇවිද කෙසේ හෝ මේවාට පිළිතුරු දිය හැකි ගුරුවරයෙක් සොයා ගනිමු. මුලින් ම සත්‍යය සොයා ගන්නා තැනැත්තා අනිකාට එය පවසන අදහසින් වෙන් ව සැරිසරමු" යි ඔවුහු ගිවිස ගත් හ. ඔවුහු වෙන් වෙන් ව විවිධ ගුරුවරුන් හමු ව සාකච්ඡා කරමින් ප්‍රශ්න නඟමින් අමරණීයත්වය සොයන්නට පටන් ගත් හ.

උපතිස්ස හා කෝලිත නඟන ප්‍රශ්න වලට සතුටුදායක පිළිතුරු දෙන අයෙක් නො වූ හ. ඔවුන් විමසන හැම ප්‍රශ්නයකට ම ඒ දෙදෙනා පිළිතුරු දුන් හ. එක් දිනක් උපතිස්ස ගේ ජීවිතයේ සුන්දර තම සිද්ධිය සිදු විය. ඔහුට අස්සජි හිමියන් දැකීමේ භාග්‍යය උදා විය. මෙතෙක් සෙවූ අමාව ඔහු ලද්දේ එදා ය.

අස්සජි හිමියන් ගේ ප්‍රසන්න, ශාන්ත හා ප්‍රබුද්ධ විලාසය දුටු පමණින් ම උපතිස්ස නව ජීවයක් ලද්දේ ය. "එක විදියකින් කී විට මම සියක් විදියකින් හෝ දහසක් විදියකින් තේරුම් ගන්නම්" උපතිස්ස පැවසී ය. අස්සජි හිමියෝ එවිට "යම් කිසි දෙයක් හේතු-ප්‍රත්‍ය නිසා හට ගනී නම්, ඒ හේතු-ප්‍රත්‍ය භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කළහ. ඒවා නිරුද්ධ කිරීම පිළිබඳව ද උන් වහන්සේ හෙළි කළහ" යන අරුත් ඇති

**"යේ ධම්මා හේතුප්පභවා-තේසං හේතුං තථාගතො ආහ**
**තේසං ච යෝ නිරෝධො-එවං වාදී මහාසමණො"**

යන ගාථාව වදාළ හ. මුල් පද දෙක ඇසෙන විට ම බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාද ධර්මය දේශනා කරන බව වැටහුණු උපතිස්ස සෝවාන් ඵලය ලැබී ය. වහා ම සිය මිතුරු කෝලිත සොයා ගිය හෙතෙම සුබ පුවත පවසමින් එම ගාථාව ඔහුට කීවේ ය. ගාථාව පවසා අවසන්වත් ම කෝලිත ද සෝවාන් විය.

තමන් ලද සම්පත ගුරුවරයා සමග ද බෙදා හදා ගත යුතු යැයි සිතූ ඔවුහු බුදුන් හමුවට යන්නට සංජයට ද ආරාධනා කළ හ. "මම දිගට ම ගුරුවරයෙක් වශයෙන් ප්‍රකට ව සිටියෙමි. දැන් මේ හිටි හැටියේ ශ්‍රාවකයකු වීමට මට පිළිවන්ද?"යි පැවසූ සංජය "ඔබ කැමති නම් යන්න"යි කියා සිටියේ ය. "ගුරුතුමනි, එසේ නො කරන්න. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ වහාම දහස් ගණන් ජනයා උන්වහන්සේ වටා රොක් වෙති. අපිත් ඒ ගොඩට එක් වෙමු." යි බුද්ධිමත් ශිෂ්‍යයන් දෙදෙනා නැවත අයැද සිටි විට සංජය ඔවුන් ගෙන් මෙසේ ප්‍රශ්න කළේ ය.

"ඇවැත්නි, ලෝකයේ වැඩිපුර සිටින්නේ ඥානවන්තයෝ ද මෝඩයෝ ද?"

"ස්වාමීනි, මෝඩයෝ වැඩිපුර වෙසෙති. ඥානවන්තයෝ ඉතා ස්වල්ප වෙති." "එසේ නම්, දරුවනි, ඥානවන්තයෝ ගෝතම බුදුන් වෙත යෙත්වා! මෝඩයෝ මා වෙත එති."

එසේ කී පසු තවත් ඒ ගැන කතා කිරීම නිෂ්ඵල බව තේරුම් ගත් කෝලිත සහ උපතිස්ස භාග්‍යවතුන් වහන්සේ හමුවට යාම පිණිස පිටත් වූ හ. සංජයගේ ශ්‍රාවක පිරිසෙන් 250 දෙනෙක් ද ඒ දෙදෙනාට එක්වූ හ.

කෝලිත හා උපතිස්ස භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් පැවිදි වූ හ. සංජය පැමිණෙන්නට කැමති නො වූ බව දැනුම් දුන් විට භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා යුග්මය වදාළ හ.

### විවරණාත්මක අනුවාදය (12 ගාථාව)

**සාරං සාරතො ච අසාරං අසාරතො ච ඤත්වා**
**සම්මාසඞ්කප්ප ගොචරා තෙ සාරං අධිගච්ඡන්ති**

**සාරං**: අර්ථවත් දේ; **සාරතො ච**: අර්ථවත් වශයෙන් ද; **අසාරං**: අර්ථ ශූන්‍ය දේ; **අසාරතො ච**: අර්ථ ශූන්‍ය සේ ද; **ඤත්වා**: දැන; **සම්මා සඞ්කප්ප ගොචරා**: සම්‍යක් සංකල්පයනට ගෝචර වන; **තෙ**: (නුවණැත්තෝ) ඔවුහු; **සාරං**: හරවත් දේ; **අධිගච්ඡන්ති**: සාධනය කර ගනිති.

හරවත් දේ හරවත් දේ ලෙස පිළිගෙන නිසරු දේ නිසරු දේ බව දැන නිවැරදි සිතුවිලි වලින් සමන්විත වන පුද්ගලයෝ ජීවිතයේ අනගිතම දේ සාධනය කර ගනිති.

### විවරණය

මෙම ගාථා යුග්මය සාර ධර්ම පිළිබඳ විචක්ෂණයෙහි වැදගත්කම අවධාරණය කරයි. සාරධර්ම පටලවා ගැනීම ලෝකෝත්තර සාධන සියල්ල වරදවා ගැනීමට හේතු වෙයි. අපගේ ක්‍රියා කලාපයන්හි නිරවද්‍යතාව රඳා පවතින්නේ අපගේ සාරධර්ම විචක්ෂණය මත ය. හොඳ හා නරක, දුක හා සැප ආදිය පිළිබඳ විනිශ්චයට අපගේ සාරධර්ම විචක්ෂණය බලපායි.

බොහෝ අය දුසිරිතට යොමු වන්නේ සාරධර්ම පද්ධතිය වරදවා ගැනීම හේතුවෙනි. ඔවුහු කිසි කලෙක උතුම් අධිගම නො ලබති.





*භාවනාවෙහි නො වැඩුණු නුපුරුදු සිත තුළ රාගය විනිවිද යයි.*

13. යථා'ගාරං දුච්ඡන්නං
වුට්ඨී සමතිවිජ්ඣති
එවං අභාවිතං චිත්තං
රාගො සමතිවිජ්ඣති (1:13)

තෙමෙයි ගෙය වැස්සට
සෙවිලි නො කළොත් මැනවින්
සිත රාගයෙන් කෙළෙසෙයි
නො වැඩුව භාවනාවෙන්

# පුහුණු නො කළ සිත - රාගයෙන් වෙයි තෙත්
## 1 (9) නන්ද හිමියන්ගේ කථා වස්තුව (13 සහ 14 ගාථා)

භාග්‍යවතුන් වහන්සේ සැවත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සිය ඥාති සොහොයුරු **නන්ද තෙරණුවන්** ඇරබ මේ ගාථා යුග්මය වදාළ සේක.

කපිලවස්තු නුවරට ගොස් සිය පියාණන් දැක ගන්නට දැන් බුදුරදුනට සුදුසු කල් යැයි සිතූ කාළුදායී තෙරණුවෝ ගමන් මගෙහි විසිතුරු කවි වලින් පවසමින් බුදු සමිඳුන් සපිරිවරින් කපිල වස්තු නුවරට වැඩම වූ හ. නුවර පිඬුසිගා වඩිමින් සිටියදී සිය පියාණන්ට '**උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය**' යන ගාථාවෙන් ධර්ම දේශනා කර සෝවාන් ඵලයෙහි පිහිටවූ භාග්‍යවතුන් වහන්සේ '**ධම්මං චරෙ සුචරිතං**' ආදී ගාථාවෙන් ධර්ම දේශනා කර මහා ප්‍රජාපතී ගෝතමිය සෝවාන් ඵලයෙහි ද පියාණන් සකදාගාමී ඵලයෙහි ද පිහිටවූ හ.

පසු දින නන්ද කුමරුන් ගේ මංගල්‍යය තුනක් ම එකට යෙදී තිබිණ. අභිෂේකය, නව නිවසට පිවිසීම හා විවාහය ඒ තුනයි. එදින භාග්‍යවතුන් වහන්සේට දානය පිරිනමන ලද අතර මාළිගය විවෘත කිරීමේදී අභිනව මාළිගාවට පිවිසුනු උන් වහන්සේ නන්ද කුමරුට ආශීර්වාද කරමින් පාත්‍රය ඔහු අතට දුන් හ. ආපසු ගමනේදී පාත්‍රය ඔහු අතින් ආපසු නො ගෙනම පිටත් වූ හ.

"සමිඳුනි, ඔබේ පාත්‍රය ගන්නැ"යි කීම නිග්‍රහයක් සේ සිතූ නන්ද පියගැට පෙළ බසින්නට පෙර එය ගනිතැයි සිතා පසුපසින් ගියේ ය. එහෙත් එය නොවූ හෙයින් පිය ගැටපෙළ පාමුලදී ගනිතැයි සිතීය. එයත් ඉටු නො විනි. රජ වාසල මිදුලේ දී එසේ කරතැයි සිතුව ද එසේත් නොවීය. පාත්‍රය බුදුරදුන් අතට දී ඉක්මනින් සිය මනාලිය වෙත යන්නට අවශ්‍යතාව තිබුණ ද එය කියා ගන්නට අසමත්ව මෙතැන දී ගනු ඇත, මෙතැන දී ගනු ඇත යි සිතමින් දිගටම ගියේ ය.

මේ අතරතුර බුදුරදුන් නන්ද කුමරුන් විහාරස්ථානයට කැඳවා ගෙන යන බවත් එය ජනපද කල්‍යාණියට හොඳකට හිටින්නට බැරි වෙන බවත් ඇයට සැළ විය. එහෙයින් ඕ බාගෙට පීරූ කෙස් වැටිය ද ඇතිව දෑසේ කඳුළු පුරවා ගෙන දිව ගොස් "නන්ද කුමරුනි, වහා ආපසු එන්න" යි කීවා ය. ඒ වදනින් නන්ද ගේ හද කිති කැවී ගිය ද ඒ වගක් නොදන්නා මෙන් බුදුරජාණන් වහන්සේ ඔහු ජේතවනාරාමයට ම කැඳවා ගෙන ගිය හ. ජේතවනාරාමයට ගිය පසු පාත්‍රය අතට ගත් භාග්‍යවතුන් වහන්සේ "නන්ද, ඔබ මහණ වන්නට කැමතිදැ"යි ඇසූ හ. තමන් ඊට අකැමති වුව ද බුද්ධ ගෞරවය නිසා එසේ කියා ගන්නට අසමත් වූ නන්ද කුමරු "කැමතියි" යනුවෙන් පිළිවදන් දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහු එවෙලේ ම පැවිදි කරවූ හ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ සමග ජේතවනාරාමයට ගිය නන්ද තෙරණුවෝ ටික දිනකින් ම පැවිද්දෙහි උකටලී ව සිය සබ්‍රහ්මචාරීන්ට මෙය දැන්වූ හ. "ඇවැත්නි, මම අසන්තෝෂයෙන් සිටිමි. මා පැවිදි ව සිටින නමුත් දිගින් දිගටම පැවිදි දම් පුරන්නට අසමර්ථයෙමි. එහෙයින් පැවිද්ද හැර දමා ගිහි ගෙට ආපසු යාමට කැමැත්තෙමි." ඒ ඇසූ සබ්‍රහ්මචාරී භික්ෂූහු "ඇවැත් නන්ද හිමියනි, ඔබ පැවිද්දෙහි උකටලී වන්නට හේතු කවරේ ද?" යිවිචාළ හ. "මා පැවිද්දට එන දා මගේ බිරිඳ ජනපද කල්‍යාණිය අඩක් පීරූ කෙස් ඇතිව කඳුළු වැකුණු මුහුණින් යුතුව "හිමියනි, වහා ආපසු එනු මැනැවැ"යි කීවා ය. ඒ වදන් තවමත් මා සවණෙහි රැව් පිළිරැව් දෙයි. එහෙයින් මම පැවිදි ජීවිතය කෙරේ උකටලීව සිටිමි. තවදුරටත් පැවිදිව සිටින්නට නොහැක."

නන්ද හිමියන් ගේ මේ වචන භාග්‍යවතුන් වහන්සේට දැනුම් දෙන ලදි. උන් වහන්සේ නන්ද හිමි කැඳවා ඒ සැබෑදැයි විමසා තහවුරු කර, අනතුරුව නන්ද හිමි සිය සෘද්ධි බලයෙන් තව්තිසා දෙව්ලොවට කැඳවා ගෙන ගිය හ. එසේ යන අතරමඟදී දැවී ගිය හේනක දැවුණු ගසක් මත ගින්නෙන් දෙකන්, නාසා හා වලිගය ද පිළිස්සී විකෘත වූ වැඳිරියක දක්නට සැලැස්සූ හ.

**විවරණාත්මක අනුවාදය (13 ගාථාව)**

**දුච්ඡන්නං අගාරං වුට්ඨී යථා සමතිවිජ්ඣති එවං අභාවිතං චිත්තං රාගො සමති විජ්ඣති**

**දුච්ඡන්නං**: මනා ව සෙවිලි නො කළ; **අගාරං**: ගෙයකට; **වුට්ඨී**: වැස්ස; **යථා**: යම් සේ; **සමති විජ්ඣති**: කාන්දු වන්නේ (තෙමෙන්නේ) ද; **එවං**: ඒ ලෙසින් ම; **අභාවිතං**: භාවනා නො කළ; **චිත්තං**: සිත; **රාගො**: රාගය; **සමති විජ්ඣති**: විනිවිද යයි.

වහල මනාව සෙවිලි නො කළ ගෙයක් වැස්සට තෙමෙයි. එසේ ම භාවනාවෙන් හික්මවා නො ගත් සිත රාගයෙන් ආතුර වෙයි.





*මොනවට පුරුදු කළ භාවනාවෙහි වැඩුණු සිතතුළ රාගය විනිවිද නොයේ.*

14. යථා'ගාරං සුච්ඡන්නං
වුට්ඨී න සමතිවිජ්ඣති
එවං සුභාවිතං චිත්තං
රාගො න සමතිවිජ්ඣති(1:14)

නො තෙමෙයි නිවස වැස්සට
සෙවිලි කළහොත් මැනවින්
රාගයෙන් සිත නො සැලෙයි
වැඩුවොත් භාවනාවෙන්

# සිත හුරු පුහුණු කර - තබනු රාගය දුරු කර

## 1 (9) නන්ද හිමියන් ගේ කථා වස්තුව (13-14 ගාථා) ඉතිරි කොටස

තව්තිසා දෙව්ලොවට ගිය පසු සක් දෙවිඳුන් ගේ සේවාවට පැමිණි රෝස පැහැති දෙපා ඇති දිව්‍ය අප්සරාවන් පන්සියයක් පෙන් වූ භාග්‍යවතුන් වහන්සේ "නන්ද, ඔබේ අදහසේ හැටියට වඩාත් සුරූපි යැයි ඔබට සිතෙන්නේ ජනපද කල්‍යාණිය ද නැත්නම්, මේ අප්සරාවෝ දැ"යි විමසූ හ. "ස්වාමීනී, මේ අප්සරාවන් සමග සසඳන විට ජනපද කල්‍යාණිය දෙකන්, නාසා හා වලිගය දැවී ගිය වැඳිරිය වැනි යැයි හැඟේ" යි නන්ද හිමියෝ පිළිතුරු දුන් හ.

"නන්ද, දුක් නොවන්න. ඔබ කැමති නම්, මම මේ අප්සරාවන් ගෙන් කෙනෙක් ඔබට ලබා දෙන්නම්." යි භාග්‍යවතුන් වහන්සේ පැවසූ හ. ප්‍රීතියට පත් නන්ද හිමියෝ "ඉතින් භාග්‍යවතුන් වහන්සේ මට ඒ ගැන සහතික වෙනවා නම් මම ඉතා කැමැත්තෙන් පැවිදි දම් පුරන්නෙමි"යි පැවසූ හ.

එදා පටන් නන්ද හිමියෝ ඉතා කැමැත්තෙන්, මහත් අභිරුචියෙන් වීර්‍ය්‍ය වඩමින්, භාවනානුයෝගී බවින් පැවිදි දම් පිරූ හ. අනෙකුත් භික්ෂූන් වහන්සේ නන්ද තෙර දෙවඟනුන් පතා මහණදම් පුරතියි විහිළු තහළු කළ ද නන්ද හිමියෝ දිගට ම වීර්‍ය්‍ය වැඩූ හ. මේ විධිමත් පැවිදි දම් පිරීමේ ප්‍රතිඵලය වූයේ නන්ද හිමියන් නොබෝ කලකින් ම රහත් ඵලය ලැබීමයි.රහත්ඵලය ලත් දින රැයෙහි බුදු සමිඳුන් දක්නට ගිය නන්ද රහතන් වහන්සේ "ස්වාමීනී, මට රෝස පැහැති පා ඇති අප්සරාවන් ලබා දෙන්නට වූ පොරොන්දුවෙන් ඔබ වහන්සේ මුදවන්නට ආමි"යි පැවසූ හ. "නන්ද මම ඔබේ සිත විනිවිද දැක එය පසක් කළෙමි" යි වදාළ හ. නන්ද ඔබ ඒ දිනවල කීවේ "මම අසන්තෝෂයෙන් සිටිමි, මම ගිහිගෙට ආපසු යමි" කියා ය. දැන් ඔබ එසේ නො කියන්නේ ඇයි දැයි විමසූ භික්ෂූහු උන් වහන්සේ රහත් වූ බව ගැන සාකච්ඡා කළ හ. බුදුරජාණන් වහන්සේ උන් වහන්සේලා ගේ කතා බහ දැන ගෙන ඒ නිමිත්තෙන් මේ ගාථා දෙක දේශනා කළ හ.

### විවරණාත්මක අනුවාදය (14 ගාථාව)

**සුච්ඡන්නං අගාරං වුට්ඨී යථා න සමති විජ්ඣති එවං**
**සුභාවිතං චිත්තං රාගො න සමති විජ්ඣති**

**සුච්ඡන්නං**: මනාව සෙවිලි කළ; **අගාරං**: ගෙයකට; **වුට්ඨී**: වැස්ස; **යථා**: යම් සේ; **න සමති විජ්ඣති**: කාන්දු නො වන්නේ ද; **එවං**: ඒ ලෙසින් ම; **සුභාවිතං**: භාවනාවෙන් සංවර්ධිත; **චිත්තං**: සිත; **රාගො**: රාගය; **න සමති විජ්ඣති**: විනිවිද නො යයි.

ගෙයක් මැනවින් සෙවිලි කර ඇත්නම් එය වැස්සට නො තෙමෙයි. එමෙන්ම සිත මනාව භාවනාවෙන් වර්ධනය කළ විට රාගය එයට නො පිවිසෙයි.

### විවරණය

මේ ගාථා යුග්මය චිත්ත සංවර්ධනය හා සම්බන්ධය. බුදු දහමෙහි 'චිත්ත' හෙවත් මනස පැරණි බටහිර මනෝ විද්‍යාඥයන් මෙන් කය සමග නිරපේක්ෂ පදාර්ථයක් ලෙස දක්වා නො මැත.

'භාවනා' නම් බුදු සමයෙහි එන මානසික ශික්ෂණය හෙවත් මානසික හැදියාවයි. රාගයෙන් පරිජිත වන්නේ එසේ ශික්ෂණය නො කළ අදාන්ත සිතය.





*පව් කළ තැනැත්තා මෙ ලොව හා පරලොව සෝකවෙයි. තමන් කළ පව් කම් දැක දුක්වෙයි.*

15. ඉධ සොචති පෙච්ච සොචති
පාපකාරි උභයත්ථ සොචති
සො සොචති සො විහඤ්ඤති
දිස්වා කම්මකිලිට්ඨම'ත්තනො (1:15)

තැවෙයි එලොවත්-තැවෙයි මෙලොවත්
පවුකාරයා තැවෙයි දෙලොව ම
දුක් වේ ය වැලපේ ය පවුකරු
මෙනෙහි කර කළ පාප කර්මය

# අම්හිරිය පවු පල

## 1 (10) චුන්ද සූකරිකයා ගේ කථාව (15 ගාථාව)

බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් **චුන්ද සූකරිකයා** අරමුණු කොට මේ ගාථාද්වය වදාළ හ.

භාග්‍යතුන් වහන්සේ වැඩ විසූ ආරාමයට යාබදව වාසය කළ ද චුන්ද කිසි දිනෙක විහාරස්ථානයට නො පැමිනියේ ය. භාග්‍යවතුන් වහන්සේට ගරු සත්කාර නො කළේ ය. එක් බත් හැන්දක් වත් පිණ්ඩපාතයකට නො බෙදී ය. සැකෙවින් කිවහොත් පිනක් යැයි කිවහැකි කිසි ම දෙයක් නො කළේ ය.

මුළු ජීවිත කාලය ම චුන්ද කළේ ඌරන් මැරීම ය. පණපිටින් සිටිය දී ම ඌරන්ට පොලුවලින් තළයි. ඒ මස් ඉදිමීම සඳහා ය. ඉන්පසු කට ඇර නටන උණු වතුර වත් කරයි. ඒ කුස පිරිසිදු කිරීමට ය. අනතුරුව ගිනි හුලකින් ඇඟෙහි රෝම සියල්ල පුළුස්සයි. මේ සියල්ල කරන විට ඌරා අමුතුවෙන් මරන්නට දෙයක් නැත. මර හඬ දෙමින් වේදනාවෙන් දුක් විඳින සතා ඉබේ ම මැරෙයි.

දිගින් දිගට ම මෙම කුරිරු ප්‍රාණවධය කළ චුන්ද මරණාසන්න සමයෙහි වියරු වැටුණේ ය. ඌරකු මෙන් ගොරවමින් හතර ගාතෙන් දුවමින් මළ පහ කර අනුහව කරමින් දැගලූ ඔහු හික්මවන්නට කිසිවෙක් සමත් නො වූ හ. ගෙයින් පිට යන්නට බැරි වන සේ දොරගුළු දැමීම හැර වෙන කිසිවක් කළ නො හැකි විය. තම කර්මානුරූපව දැඩි දුක් විඳි හෙතෙම සත් දිනක් "අවීචි මහ නරකාදි දුක" මෙලොව ම විඳින්නාක් සේ දුක් විඳ මිය ගියේ ය. සත් දිනම දොර වසා තිබුණ ද චුන්ද ඌරකු සේ මරහඬ දුන් හෙයින් බොහෝ අය සිතුවේ ඔහු දින හතක් ම දිවා රෑ ඌරන් මැරූ බව ය.

භාග්‍යවතුන් වහන්සේ හමුවට ගිය භික්ෂූන් වහන්සේ කීප නමක් "ස්වාමීනි, චුන්ද ගෙයි දොර වසා ගෙන දිගින් දිගට ම ඌරන් මරයි. නියතයෙන් ම ඔහු ලොකු සාදයකට සූදානම් වෙනවා විය හැක. මේ තරම් කුරිරු මස් වැද්දෙක් නම් මීට පෙර ඉන්නට නැතිව ඇත"යි පැවසූ හ. "මහණෙනි, මේ සත් දින පුරා ඔහු ඌරන් මරනවා නො වෙයි. ඔහු ගේ අකුසල විපාකය විඳිනවා. පණ පිටින් ම නිරා දුක් විඳිනවා. ඌරකු සේ මරහඬ තළමින් ගේ පුරා එහි මෙහි දුවන නිසා ගෙයි දොර වහන්නට සිදු වුණා. අද ඔහු මිය ගොස් නරකයෙහි උපන්නා"යි බුදුරජාණන් වහන්සේ පැහැදිලි කළ හ. "ස්වාමීනි, ඔහු මෙලොවත් දුක් විඳ පරලොවත් දුකට ම පත් වුණා"යි භික්ෂූන් වහන්සේලා පැවසූ විට තථාගතයන් වහන්සේ මේ ගාථාව වදාළ හ.

### විවරණාත්මක අනුවාදය (15 ගාථාව)

**පාපකාරී ඉධ සොචති පෙච්ච සොචති උභයත්ථ සොචති සො අත්තනො කිලිට්ඨං කම්මං දිස්වා සොචති සො විහඤ්ඤති**

**පාපකාරී**: පවු කාරයා; **ඉධ**: මෙලොව දී; **සොචති**: ශෝක කරයි; **පෙච්ච**: පරලොව ද; **සොචති**: ශෝක කරයි; **උභයත්ථ**: දෙලොවදී ම; **සොචති**: ශෝක කරයි; **සො**: හෙතෙම; **අත්තනො**: තමා ගේ; **කිලිට්ඨං කම්මං**: පාප කර්මය; **දිස්වා**: දැක; **සොචති**: ශෝක කරයි; **සො**: හෙතෙම; **විහඤ්ඤති**: ඛේදයට පත් වෙයි.

පවු කරන තැනැත්තා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවදී ම ශෝක කරයි. තමා කළ පාප කර්මයන් දැක ශෝක කරයි, පසුතැවෙයි.

### විවරණය

අකුසල් කරන පුද්ගලයෝ එම කර්ම කරන අවස්ථාවේ දී එයින් තමන්ට විඳින්නට වෙන විපාක පිළිබඳව නො සිතති. එහෙත් මෙලොව දී ම විපාක විඳින විට ශෝක කරන්නට සිදු වේ. මෙලොව දී මෙන් ම පරලොව දී ද අකුසලයෙහි විපාක විඳින්නට සිදු වේ.

මෙයින් අදහස් වන්නේ සියළුම කර්ම අනිවාර්යයෙන් ම විපාක විඳිය යුතු බව නො වේ. ආගමික විවරණය අර්ථවත් වන්නට නම් කර්මය පරාජය කරන ක්‍රමයක් තිබිය යුතු ය. එහෙයින් බෞද්ධ ශික්ෂණය තුළ කම්මනිරෝධගාමිනී ප්‍රතිපදාවක් ද ඇතුළත් වෙයි. කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හුදෙක් 'එකට-එක' මෙන් සරල වූවක් නොව කර්මයන්හි ගුණාත්මක විචිත්‍රත්වය, පුද්ගල විවිධත්වය හේතු-ප්‍රත්‍ය ධර්මයෙහි ස්වභාවය ආදී හැම දේ සැලකිල්ලට ගෙන තේරුම් ගත යුතු සංකීර්ණ විෂයකි.

බුදුසමය ජීවිතය පුළුල් දෘෂ්ටියකින් විවරණය කරන දහමකි. එය එක් භවයකින් සියල්ල නිම වෙතියි නො පිළිගනියි. සත්ත්වයා දීර්ඝ වූ සංසාරයේ සිය කර්මානුරූපව උසස්-පහත් වෙමින් සැප හා දුක විඳිමින් සැරිසරති. එතකුදු වුවත් ඒ සියල්ල සිදුවන්නේ නිත්‍ය වූ අවිනශ්වර වූ ආත්මයකින් තොරව ය. එහෙයින් අනන්‍යතාවකින් තොර අවිච්ඡේදතාවක් තහවුරු කරමින් 'න ච සො න ච අඤ්ඤො' යන ප්‍රකාශය අර්ථකථාචාර්යවරු දක්වති.





*කුසල් කළ තැනැත්තා මෙලොව හා පරලොව බොහෝ සේ සතුටු වෙයි.*

16. ඉධ මොදති පෙච්ච මොදති
කත පුඤ්ඤො උභයත්ථ මොදති
සො මොදති සෝ පමොදති
දිස්වා කම්ම විසුද්ධි මත්තනො (1.16)

මෙලොවත් තුටුවෙති එලොවත් තුටුවෙති
පින් කළ උදවිය දෙලොව ම තුටුවෙති
වැඩියෙන් තුටුවෙති සතුටින් ඉපිලෙති
කළ පිරිසිදු පින් දැක දැක සැනසෙති

# කළ හොඳ දේ සැප ගෙන දේ

## 1 (11) ධම්මික උපාසකයා ගේ කතා පුවත (16 වන ගාථාව)

සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව **ධම්මික උපාසක** තැන නිමිති කොට දේශනා කළ සේක.

සැවැත් නුවර ධම්මික නැමැති ගෘහස්ථ ශ්‍රාවකයෙක් වාසය කළේ ය. නමට ම ගැලපෙන ධාර්මික ජීවිතයක් ගත කළ හෙතෙම දන් දීමෙහි මහත් රුචියක් දැක්වී ය. බුද්ධ ප්‍රමුඛ සංඝයා වහන්සේට නිතර නිතර දන් දුන් අතර විශේෂ දිනවල මහ දන් පැවැත්වී ය. බුදුරජාණන් වහන්සේ ගේ මහා දායකයන් පන්සියයෙන් එක් අයෙක් වූ හෙතෙම පුතුන් හත් දෙනෙකු ගේ සහ දූවරුන් හත් දෙනෙකු ගේ පියෙක් වූයේ ය. දරුවෝ ද පියා මෙන් ම දහම් මඟ ගමන් කළ සැදැහැතියෝ වූ හ.

වරක් හොඳටම ගිලන් වූ ධම්මික මහ සඟ රුවන වැඩමවා පිරිත් සජ්ඣායනා කරවන සේ ඉල්ලා සිටියේ ය. භික්ෂූන් වහන්සේ වැඩම කොට, ඇඳෙහි වැතිර සිටි ඔහු අබිමුව වැඩ හිඳුවා, මහා සතිපට්ඨාන සූත්‍රය සජ්ඣායනා කරන අතරතුර දෙව් ලෝ හයෙන් සැරසූ දිව්‍ය වාහන හයක් ඔහු තම තම දෙව් ලෝ වලට කැඳවා ගෙන යනු පිණිස පැමිණිය හ. ඔවුන් දුටු ධම්මික පිරිත් නිම වන තුරු මඳක් නවතින්නැයි සංඥා කළේ ය. එහෙත් ඒ සංඥාව පිරිත නවත්වන්නැයි කළ සංඥාවක් සේ තේරුම් ගත් භික්ෂූන් වහන්සේ පිරිත නවතා පිටත් ව ගිය හ.

අනතුරුව තමන් කැඳවා ගෙන යාමට සදෙව් ලොවින් රිය හයක් පැමිණ ඇති බව ධම්මික උපාසක තෙම තම දරුවන්ට පැවසී ය. තුසිත දෙව්ලොවින් පැමිණි රථය තෝරා ගත් හෙතෙම මල් දමක් එය තිබෙන තැන අහසට දමන්නැයි දරුවන්ට උපදෙස් දුන්නේ ය. ඒ අනුව දරුවෝ මල් දමක් ගුවනට වීසි කළ හ. එය ගුවනෙහි වූ දිව්‍ය රථයෙහි රැඳිණි. මල් දම ගුවනෙහි රැඳී තිබෙනු එහි රැස්ව සිටි හැම දෙනාටම පෙනිණි. එහෙත් රථය නො පෙනිණි. "ඔබට මල් දම පෙනෙනවා නො වේ ද"යි විමසූ ධම්මික තම දරුවන් අමතා එය රැඳී ඇත්තේ තුසිත දෙව් ලොවින් පැමිණි රථයේ බවත් තමන් තුසිත දිව්‍ය ලෝකයේ උපදනා බවත් පවසා, ඔබ මා සමඟ උපදින්නට කැමති නම් මා කළාක් මෙන් පින් දහම් කරන්නැ"යි අවවාද කළේ ය. අනතුරුව දෙනෙත් පියා ගත් හෙතෙම මිය ගොස් තුසිත දෙව් ලොව උපන්නේ ය.

භික්ෂූන් වහන්සේ නැවත විහාරස්ථානයට පැමිණි විට "මහණෙනි, ධම්මික පිරිත් සජ්ඣායනයට සවන් දුන්නා දැ"යි භාග්‍යවතුන් වහන්සේ විමසූ හ. "එසේ ය. ස්වාමීනි, එහෙත් සජ්ඣායනය මැද දී හෙතෙම 'නවතින්න, නවතින්න' යි කියා සංඥා කර අප නවතා ලිය.

එවිට දූ දරුවන් වැලපෙන්නට වූ හෙයින් අපි සජ්ඣායනය නවතා ආපසු ආවෙමු"යි ඔවුහු පිළිවදන් දුන් හ. "මහණෙනි, ධම්මික කතා කළේ ඔබ සමග නොවේ. දෙව් ලොව හයේ දෙව්වරු දිව්‍ය රථ හයක් සරසා ගෙන ඔහු කැඳවා ගෙන යාම සඳහා පැමිණ සිටිය හ. ඔහු නවතින්නට යැයි කීවේ ඔවුන්ට ය. ධර්ම ශ්‍රවණය නිමවන තුරු සිටින්නැයි ඔවුන්ට කළ සංඥාව ය." "සැබෑ ද ස්වාමීනි?" "එසේ ය මහණෙනි, ඒ සැබෑ ය." "දැන් ඔහු උපන්නේ කොහිද, ස්වාමීනි?" "මහණෙනි, ධම්මික තුසිත දිව්‍ය ලෝකයෙහි උපන්නේ ය."

"ස්වාමීනි, ධම්මික මේ ඊයේ පෙරේදා වන තුරුම මහත් ප්‍රීතියෙන් මෙහි සිටියේ ය. දැන් හෙතෙම මිය ගොස් දෙව්ලොව මහත් සතුටින් සිටින බව ඔබ වහන්සේ ගෙන් දැන ගතිමු." භික්ෂූන් වහන්සේලා එසේ පැවසූ විට "එසේ ය මහණෙනි. අප්‍රමාදී, කුසල් කරන පුද්ගලයෝ මෙලොවත් ප්‍රීතියෙන් සිටිති. පරලොවත් ප්‍රීතියෙන් සිටිති." යි වදාළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව ද දේශනා කළ හ.

### විවරණාත්මක අනුවාදය (16 ගාථාව)

**කත පුඤ්ඤො ඉධ මොදති, පෙච්ච මොදති, උභයත්ථ මොදති, සො අත්තනෝ කම්ම විසුද්ධිං දිස්වා මොදති සො පමොදති**

**කත පුඤ්ඤො**: පින් කළ තැනැත්තා; **ඉධ**: මෙලොවත්; **මොදති**: සතුටු වෙයි; **පෙච්ච**: පරලොව ද; **මොදති**: සතුටු වෙයි; **උභයත්ථ මොදති**: දෙලොව ම සතුටු වෙයි; **සො**: හෙතෙම; **අත්තනො**: තමා ගේ; **කම්ම විසුද්ධිං**: චර්‍යාවෙහි පිරිසිදුකම; **දිස්වා**: දැක; **මොදති**: සතුටු වෙයි; **සො**: හෙතෙම; **පමොදති**: අතිශයින් සතුටු වෙයි.

පින් කළ තැනැත්තා මෙලොවත් සතුටු වෙයි. පරලොවත් සතුටු වෙයි. දෙලොවම සතුටු වෙයි. තමා ගේ චර්‍යාවෙහි පවිත්‍රත්වය (කර්ම විශුද්ධිය) ගැන සිතා සතුටු වෙයි. අතිශයින් ම සතුටට පත් වෙයි.

### විවරණය

**කත පුඤ්ඤො**: නම් පින් කර ගත් තැනැත්තා ය. ජීවිත කාලය පුරා යහපත් චර්‍යාවන් හේතු කොට ගෙන කුසල් රැස් වේ. යමකු පරලොව යනවිට ගෙන යන එකම දේ කුසල් හා අකුසල් හෙයින් කුසල් කර ගෙන ඇතහොත් ඒ ගැන සිතා ප්‍රීති විය හැකිය. තම මතු ජන්මය අනිවාර්‍යයෙන්ම ප්‍රසන්න වන බව ඔහුට සිතා ගත හැකි වේ. යහපත් චුති චිත්තයකින් මිය ගිය විට ඊළඟ ජන්මය නියත වශයෙන් ම යහපත් වෙයි.





*පව් කළ තැනැත්තා මෙලොවත් තැවී පරලොවත් දුක් විඳ බොහෝ සේ තැවෙයි.*

17. ඉධ තප්පති පෙච්ච තප්පති
පාපකාරි උභයත්ථ තප්පති
පාපං මෙ කතං'ති තප්පති
භියෙ‍‍යා තප්පති දුග්ගතිං ගතො (1.17)

මෙලොවත් -පරලොවත් තැවෙයි
පවුකරු දෙලොව දී ම තැවෙයි
පවු කළෙමැයි සිතා තැවෙයි
අපාගතව තවත් තැවෙයි

# කළෝතින් පාපය - සිදුවෙයි පසුව තාපය

## 1 (12) දෙව්දත් තෙරුන්ගේ කතා පුවතක් (17 වන ගාථාව)

බුදුරජාණන් වහන්සේ සැවත් නුවර ජේතවන විහාරයෙහි වැඩ වසන සේක් **දේවදත්ත ස්ථවිරයන්** වහන්සේ අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

බුදුරජාණන් වහන්සේ සමග ම කොසඹෑ නුවර එකට වාසය කළ සමයෙහි උන් වහන්සේට සැදැහැවතුන් ගේ වැඩි ගෞරවාදර හා පුද සත්කාර ලැබෙන ආකාරය දුටු දෙව්දත් තෙරණුවන් ගේ සිත් තුල ඊර්ෂ්‍යාවක් හට ගත්තේ ය. තමන් සංඝ නායකත්වය ලද හොත් මේ ගරු සැලකිලි තමන් වෙත හරවා ගත හැකි බව සිතූ තෙරණුවෝ දිනක් බුදුරදුන් වේළුවනාරාමයෙහි දම් දෙසමින් සිටිය දී උන් වහන්සේ කරා එළඹ "ඔබ වහන්සේ දැන් මහලුයි. ඒ නිසා සංඝයා ගේ පාලනය මට පවරා නිවාඩු ගන්න"යි ආරාධනය කළ හ. එහෙත් දේවදත්ත ස්ථවිරයන් ගේ සැබෑ තතු දන්නා හෙයින් එයට එකඟ නො වූ බුදුරජාණන් වහන්සේ "දෙව්දත් ඔබ එවැනි පදවියකට කිසි සේත් ම සුදුසු නැතැ"යි පවසමින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ.

එදා පටන් දෙව්දත් බුදුරදුන් කෙරෙහි වෛර බැඳ ගත්තේ ය. තුන් වතාවක් ම උන් වහන්සේ ඝාතනයට අසාර්ථක උත්සාහයන් දැරී ය. වරක් දුනුවායන් යෙදැවී ය. අනතුරුව ගිජුකුළු පව්ව මත සිට ගල් පෙරළී ය. තුන්වන වතාවේ නාලාගිරි ඇතා මෙහෙයැවී ය. එහෙත් මේ තුන්වර ම ඔහු ගේ අදහස ඉටු නො වීය. දුනුවායෝ බුදුන් නසනු වෙනුවට ශ්‍රාවකත්වයට පත් වූ හ. පෙරැළු ගල වළකනු පිණිස ගලක් ඉදිරිපත් විය. එයින් ගැළවුණු කුඩා පතුරක් බුදුරදුන් ගේ පයෙහි කුඩා තුවාලයක් කළ ද බරපතල හානියක් නො වී ය. නාලාගිරි ඇතා ද බුදුරදුන්ට දමනය විය. මේ සියල්ලෙනුදු දුර්මුඛ නො වූ දේවදත්ත සංඝ භේදයක් කරන්නට ඉටා ගත්තේ ය. අලුත පැවිදි වූ භික්ෂු පිරිසක් රවටා බුදුරදුන් ගෙන් වෙන් කර ගෙන ගයා ශීර්ෂයට ගිය හෙතෙම ප්‍රතිපක්ෂයක් ගොඩ නඟා ගත්තේ ය. එහෙත් එහි ගිය සැරියුත් මුගලන් දෙනම විසින් එයින් වැඩි පිරිස ආපසු කැඳවා ගෙන එන ලදි.

අන්තිමේ දෙව්දත් බලවත් ලෙස රෝගාතුර විය. නවමසක් ම රෝගයෙන් දුක් විඳ දුර්වල වූ හෙතෙම භාග්‍යවතුන් වහන්සේ දකින්නට කැමැත්ත පළ කළේ ය. එහෙත් ඔහු ගේ ශ්‍රාවකයෝ මෙසේ කී හ. " ඔබ හොඳ සුවයෙන් පසු වෙත් දී බුදුරදුන්ට එරෙහිව ක්‍රියා කළෙහි ය. දැන් අපි ඔබ උන්වහන්සේ වෙත රැගෙන නො යමු." එහෙත් බුදුරදුන් දකින්නට රිසි වූ දෙව්දත් "මා විනාස නො කරන්න. මා බුදුන්ට වෛර කළ බව සැබවි. එහෙත් උන් වහන්සේ ගේ සිත් තුළ මා කෙරේ කෙස් ගසක තරම් වත් වෛර මාත්‍රයක් නො මැත." යි ප්‍රකාශ කළේ ය. එය සැබවි. බුදුරදුන් ගේ සිත් තුළ කිසි ද සතුරකුට වෛර මාත්‍රයක් නො වී ය. ඔවුහු දෙව්දත් රැගෙන භාග්‍යවතුන් වහන්සේ දකින්නට පැමිණිය හ. එහෙත් අවාසනාවට දෙව්දත් තමන් රැගෙන ආ දෝලාවෙන් බසින්නට බිමට පා තබත් ම පොළොවෙහි ගිලී ගියේ ය. ඔහු කෙළින්ම අවීචි මහා නරකාදියෙහි උපන් බව කියැවෙයි.

**විවරණාත්මක අනුවාදය (17 ගාථාව)**

**පාපකාරී ඉධ තප්පති පෙච්ච තප්පති උභයත්ථ තප්පති**
**මෙ පාපං කතං ඉති තප්පති දුග්ගතිං ගතො භියෝ‍යා තප්පති**

**පාපකාරී**: පවු කරන තැනැත්තා; **ඉධ**: මෙලොව දී; **තප්පති**: තැවෙයි; **පෙච්ච**: පරලොවත්; **තප්පති**: තැවෙයි; **උභයත්ථ**: දෙලොව ම; **තප්පති**: තැවෙයි; **මෙ**: මා විසින්; **පාපං**: පාප කර්මයක්; **කතං ඉති**: කරන ලදැයි; **තප්පති**: තැවෙයි; **දුග්ගතිං**: නිරයට; **ගතො**: ගියේ; **භියෝ‍යා**: වැඩියෙන්; **තප්පති**: තැවෙයි.

පවු කරන තැනැත්තා මෙලොවත් තැවෙයි. පරලොවත් තැවෙයි. මම පාපයක් කළෙමියි සිතමින් තැවෙයි. අපායට ගිය පසු වඩාත් තැවෙයි.

**විවරණය**

මෙහි දී තැවීම යන්නෙන් වැරදි වැඩ කරන පුද්ගලයන් තුළ ඇතිවන පසු තැවීම අදහස් වෙයි. තප්පති යන පාලි වචනයෙහි දැවෙයි, පිළිස්සෙයි යන අරුත තිබේ. වරදක් කරන අවස්ථායෙහි හරි වැරදි ගැන කල්පනා නො කළ ද පසුව තම ක්‍රියාවෙහි බරපතල කම වැටහෙන විට, තමාට තමා ම චෝදනා කරන විට, ඇතිවන හැඟීම තමාට ම දැවිල්ලක් වැනි ය. දෙව්දත් තම පවුකම් මෙනෙහි කොට දැවුණේ ඒ අනුව ය. සමහර කර්මවල විපාක දිට්ඨධම්ම වශයෙන් පැමිණීම ද මීට ම ඇතුළත් ය.

පරලොව තැවෙන්නේ කර්ම විපාක විඳින විට ය. අන්ත දුක්ඛිත ස්ථාන වූ දුගති වල උපන් විට අනේක විධ වේදනා කම් කටොළු වලට පාත්‍ර වන්නට සිදු වෙයි. එහෙයින් තම පවු නිසා මෙසේ දුක් විඳිතැයි තැවෙන්නට පවුකරුට සිදු වෙයි.

දෙව්දත් ගේ මතු අනාගතය ගැන බොහෝ අය ප්‍රශ්න නගති. ථෙරවාද අටුවාවල සඳහන් වන්නේ ඔහු අනාගතයෙහි යම් දිනක අට්ඨිස්සර නමින් පසේ බුදු කෙනෙකුන් වී නිවන් දක්නා බව ය. ගිහි ව සිටියා නම් දෙව්දත් වැනසෙන බව දුටු හෙයින් භාග්‍යවතුන් වහන්සේ ඔහු පැවිදි කළ බවත්, කෙතරම් පවු කළත් පැවිදි ව විසූ හෙයින් අනාගත අපේක්ෂාවක් තැබිය හැකි තත්ත්වයක් ඇති වූ බවත් කියා ඇත. මහායානික ග්‍රන්ථ වල සඳහන් වන්නේ ඔහු බුදුරජාණන් වහන්සේ ගේ ඉවසීමේ හා සමාව දීමේ ගුණය ලෝකයාට ප්‍රකට කිරීමට උපකාරයක් වූ බව ය. අනාගතයේ යම් දිනෙක දෙව්දත් දේවරාජ නමින් බුදු වන බව ද එහි දැක්වෙයි.





*පින්කළ තැනැත්තා මෙලොවත් සතුටු ව, පරලොව සුගතියට පැමිණ, බොහෝ සේ සතුටු වෙයි.*

18. ඉධ නන්දති පෙච්ච නන්දති
කතපුඤ්ඤො උභයත්ථ නන්දති
පුඤ්ඤං මෙ කතං ති නන්දති
භියෙ‍යා නන්දති සුග්ගතිං ගතො (1.18)

මෙලොවත් තුටුවෙයි-එලොවත් තුටු වෙයි
දෙලොව ම තුටු වෙයි-කළ පින් ඇති අය
සිහි කොට තුටු වෙයි-පිනක් කළෙමි යයි
වැඩියත් තුටු වෙයි-ඉපදී දෙව් ලොව

# කළ කළ පින - පිනවයි මන

## 1 (13) සුමනා දේවිය ගේ කතාව (18 වන ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් අනේපිඬු සිටාණන් ගේ බාල ම දියණිය වූ **සුමනා දේවිය** ඇරබ මේ ගාථාව වදාළ සේක.

සැවැත් නුවර අනාථපිණ්ඩික සිටුවරයාණන් ගේ නිවසෙහි දිනපතා පන්සියයක් නමකට දන් පිරිනැමෙයි. විසාඛා උපාසිකාව ගේ නිවසෙහි ද පන්සියයක් නමකට දන් පිරිනැමෙයි. අනේපිඬු සිටුතුමා විසින් මේ දෛනික මහා දානමය පුණ්‍ය කර්‍මයෙහි කාර්‍ය්‍ය සංවිධානය සිය වැඩිමහල් දියණිය වූ මහා සුභද්‍රාවනට පවරා තිබිණ. ඇය විවාහ වී ස්වාමියා ගේ නිවසෙහි වාසයට ගිය පසු ඒ කටයුතු චූල සුභද්‍රාවනට පවරණ ලදි. ඕ ද පසු කලෙක විවාහ ව ස්වාමියා ගේ නිවසෙහි වාසයට ගියා ය. ඒ දෙදෙනා ම විවාහ වන විට සෝවාන් ව සිටිය හ.

වැඩිමහල් දියණියන් විවාහ වී ගිය පසු මේ කාර්‍ය්‍යභාරය බාල ම දියණිය වූ සුමනා දේවියට පැවරිණි. ඕ ද බණ අසා සෝවාන් වූවා ය. විවාහය ප්‍රිය නො වූ ඕ අවිවාහකව ම සංඝෝපස්ථාන කටයුතු කරමින් පියාණන් ගේ නිවසෙහි ම වාසය කළා ය. පින්කම් සංවිධානයෙහි ම නිරතව විසූ හෙයින් ඕ ඉතා සතුටින් සියල්ලන් හා ප්‍රිය වාදී ව ප්‍රීතියෙන් හා සැහැල්ලු සිතින් කල්ගත කළා ය.

මේ අතරතුර සුමනා දේවී හදිස්සියේ ම බරපතල ලෙස ගිලන් වූවා ය. ඇය සුව වන බවක් නො පෙනිණ. එක් දිනක් හදිසියේ ම ඕ පියාණන් තමන් වෙත කැඳවූවා ය. අනාථ පිණ්ඩික සිටුතුමා ද දියණිය බරපතල සේ රෝගාතුර හෙයින් වහා ඇය වෙත දිව අවුත් "ඇයි දියණියෙනි, මා හදිසියේ ම කැඳවූයේ?" යි ප්‍රශ්න කළේ ය. "මලණුවෙනි, ඔබ කුමක් ද විමසුයේ?" යි සුමනා දේවී ප්‍රශ්න කළා ය. තමන්ට තම දියණිය 'මලණුවෙනි' යි ඇමතීම ගැන විමතියට පත් සිටු තෙම "දියණියෙනි, ඔබේ කතාව අමුතු ය. ඔබ ගේ සිහිය අවුල් වූ බවක් පෙනේ." යි පැවසී ය. "නැත බාල සොහොයුරාණනි, මම සිහි ඇතිව කතා කරමියි සුමනා දේවී පිළිතුරු දුන්නා ය. " දියණියෙනි, ඔබට බයක් දැනෙනවා ද?" යි සිටුතුමා යළි විමසූ විට "නැත මලණුවනි, මට බයක් නො දැනේ" යි පවසා සඳහටම දෙනෙත් පියා ගත්තා ය.

සෝවාන් ඵලයට පත් ව සිටියා වුව ද සිටුතුමා ට ඉන් ඇති වූ ශෝකය විඳ දරා ගත නො හැකි තරම් විය. අවමංගල චාරිත්‍ර නිම වූ වහා ම හැඬූ කඳුලෙන් බුදුරදුන් දකින්නට ගිය හෙතෙම "ස්වාමීනි, මගේ දියණිය සුමනා දේවී මියගියා"යි වැලපෙන්නට පටන් ගත්තේ ය. ඔහු අස්වසමින් භාග්‍යවතුන් වහන්සේ "සිටුතුමනි, මරණය සියල්ලන්ට ම උරුම බව ඔබ නො දන්නේදැ"යි විමසූ හ. එහෙත් මට විඳ දරා ගත නො හැක්කේ මෙ තරම් නුවණැතිව සංවරව සිටි මගේ දියණිය අවසන් මොහොතේ උමතුවෙන් දොඩවා මිය යාම ය" යි හෙතෙම සැල කර සිටියේ ය. "මොනවා ද, ඔබේ බාල දියණිය දෙඩවූයේ?" යි භාග්‍යවතුන් වහන්සේ විමසූ හ. "ස්වාමීනි, මා ඇයට දියණියනි යි ඇමතූ විට ඕ මට 'බාල මලණුවෙනි' යි කතා කළා." යි පැවසූ සිටුතෙම තමන් හා දියණිය අතර වූ සංවාදය මුළුමනින් ම බුදුරදුන්ට සැලකර සිටියේ ය. "සිටුවරය, ඔබේ දියණිය මිය ගියේ සිහි විකල්ව නො වේ. ඇය සිහි විකල්ලෙන් දෙඩැවූයේ නැත." "එසේ නම් ඇය මට මලණුවෙනි යි ඇමතුවේ කවර හෙයින් ද ස්වාමීනි?" "ඇත්තට ම සිටුතුමනි, ඔබ ඇය ගේ මලණු කෙනෙකි. ඔබ ලබා ඇත්තේ සෝවාන් ඵලය පමණි. සුමනා දේවී සකෘදාගාමීව සිටියා ය." "එය ද ස්වාමීනි හේතුව?" "එසේ ය සිටුවරය, ඇය ඔබට බාල සොහොයුරායැයි ඇමතුවේ ඒ නිසා ය."

අනතුරුව තම දියණිය ගේ නව ජන්මය ගැන දැන ගන්නට සිටුතුමාට අවශ්‍ය විය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස මගේ දියණිය මරණින් පසු උපන්නේ කොහි ද?" "ඔබේ දියණිය දැන් තුසිත දෙව්ලොව ඉපිද සිටින්නී ය." "ස්වාමීනි මගේ දුව මනුලොව සිටිය දී කාගේත් සිත් ගනිමින් ප්‍රසන්න පැවතුම් ඇතිව මහත් ප්‍රීතියෙන් සිටියා ය. දැන් ඕ මිය ගිය පසු පරලොව ද මහත් සොම්නසින් සිටින බව දැන ගතිමි." යි සිටුතුමා උදම් වූ විට බුදුරජාණන් වහන්සේ "සිටුතුමනි, එය සැබෑවක් ම යැ" යි වදාරා මේ ගාථාව ද වදාළ සේක.

**විවරණාත්මක අනුවාදය (18 ගාථාව)**

**කතපුඤ්ඤො ඉධ නන්දති පෙච්ච නන්දති උභයත්ථ**
**නන්දති මේ පුඤ්ඤං කතං ඉති නන්දති සුග්ගතිං**
**ගතො භිය්‍යො නන්දති**

**කතපුඤ්ඤො**: පින් දහම් කළ තැනැත්තා; **ඉධ**: මෙලොවදී; **නන්දති**: සතුටු වෙයි; **පෙච්ච**: පරලොව දී; **නන්දති**: සතුටු වෙයි; **උභයත්ථ**: දෙලොව ම; **නන්දති**: සතුටු වෙයි; **මෙ**: මවිසින්; **පුඤ්ඤං කතං**: පිනක් කරනා ලදැයි; **ඉති**: මෙසේ; **නන්දති**: සතුටු වෙයි; **සුග්ගතිං**: දෙව්ලොව; **ගතො**:ගියේ; **භිය්‍යො**: වැඩියත්; **නන්දති**: සතුටු වෙයි.

පුණ්‍ය කර්ම කර ඇති තැනැත්තා ඒ හේතුවෙන් මේ ජන්මයේ දී මෙන් ම මතු ජන්මයේදී ද ප්‍රීතියට පත් වෙයි. හෙතෙම දෙලොව ම සතුටු වෙයි. කළ පින්කම ගැන සිතමින් 'මම පින්කමක් කළෙමි' යි සිතමින් ප්‍රීති වෙයි. සුගතියෙහි උපන් විට වඩාත් ම සන්තෝෂයට පත් වෙයි.

**විවරණය**

තුසිත දෙව් ලොව නම් සතුට අධිපති ලක්‍ෂණය කරගත් දෙව් ලොව යි. සාමාන්‍යයෙන් පශ්චිම භවික බෝසත්වරුන් උපදින්නේ ද තුසිත දෙව්ලොව ය. කුශල කර්ම කරන අය මනුලොව දී සතුටින් සිටින බව සැබෑ වුව ද වඩාත් ම සතුටු වන්නේ දෙව් සැප විඳින විට බව මෙහි 'භිය්‍යො නන්දති' යන්නෙන් කියැවිණි.



*තෙවළා දහම් දැන උගෙණ, කියමින් ඒ නොපිළිපැදීම ශ්‍රමණ ගුණයේ පල හිමි නො වීමට හේතු වෙයි.*

19. බහුම්පි චෙ සහිතං භාසමානො
න තක්කරො හොති නරො පමත්තො
ගොපො'ව ගාවො ගණයං පරෙසං
න භාගවා සාමඤ්ඤස්ස හොති (1:19)

දෙසුවත් බණ වැඩි වැඩියෙන්
නො පිළිපදිති-ප්‍රමාදයෙන්
බලනා අන්සතු ගවයන්
නො ලබති එල ලෙස ගොපළුන්

# දහමෙහි ප්‍රතිඵල ලබන්න - මැනවින් එය පිළිපදින්න

## 1 (14) මිතුරු දෙනමක ගේ පුවතක් (19-20 ගාථා)

භාග්‍යවතුන් වහන්සේ සැවත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසමින් මිතුරු දමින් වෙළී සිටි භික්ෂු දෙනමක් ඇරඹ මේ ගාථා දෙක දේශනා කළ සේක.

සැවැත් නුවර ප්‍රභූ පවුල් දෙකක තරුණයෝ දෙදෙනෙක් දැඩි මිත්‍රත්වයෙන් වෙළී සිටිය හ. වරක් ඒ දෙදෙන විහාරස්ථානයට ගොස් බුදුරජාණන් වහන්සේ ගේ ධර්ම දේශනාවක් අසා දහමෙහි පැහැදී කම්සුව අත්හැර පැවිදි බිමට පත් වූ හ. වසර පහක් පමණ ආචාර්ය උපාධ්‍යායයන් යටතේ මූලික ශික්ෂණය ලැබ ග්‍රන්ථධුරය හා විදර්ශනා ධුරය පිළිබඳව අසන්නට ලැබී බුදුරජාණන් වහන්සේ වෙතින් ඒ පිළිබඳ සියලු විස්තර අසා දැනගත් හ.

ඒ දෙනමගෙන් වැඩිමහලු හිමි නම "මම වැඩි මහලුව පැවිදි වූ හෙයින් ග්‍රන්ථ ධුරයෙහි කටයුතු කරගන්නට අසමත් මි. එහෙත් මට විදර්ශනා ධුරයෙහි කටයුතු කර ගත හැකි ය."යි පවසා රහත් ඵලය ලබන තුරු අදාළ වන කර්මස්ථාන ලබා ගත්තේ ය. අනෙක් නම "මම ග්‍රන්ථ ධුරය පුරන්නට සමර්ථයෙමි"යි නගරයෙහි ම නැවතී ධර්ම විනය හදාරන්නට අධිෂ්ඨාන කර ගත්තේ ය. කර්මාස්ථාන ලබා ගත් හිමි නම වනගත ව බවුන් වඩා රහත් ඵලය ලබා ගත් අතර ග්‍රන්ථ ධුරය තෝරා ගත් හිමි නම මනාව ධර්ම විනය ප්‍රගුණ කර ගෙන තැනින් තැන සංචාරය කරමින් ඉගැන්වීමේ කටයුතු කළේ ය. උන් වහන්සේ ගෙන් ධර්ම විනය හදාළ භික්ෂු පිරිස පන්සියයක් පමණ වූ අතර උන් වහන්සේ භික්ෂූන් අටළොස්සකගේ උපාධ්‍යායවරයා ද වූහ.

මේ අතර තුර භාග්‍යවතුන් වහන්සේ ගෙන් කමටහන් ලබා ගත් පන්සිය නමක් භික්ෂූහු විදර්ශනා ධුරය වඩන හිමි නම විසූ ආරණ්‍යයට ගොස් උන් වහන්සේ ගේ අවවාද ද ලබමින් භාවනා කර රහත් ඵලය ලැබූ හ. අනතුරුව උන් වහන්සේට වැඳ නමස්කාර කළ ඒ පන්සිය නම තමන් භාග්‍යවතුන් වහන්සේ දක්නට යා යුතු බව පවසා සිටිය හ. "යහපති. එසේ නම් යන්න. ගොස් භාග්‍යවතුන් වහන්සේට හා අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලාට මා වෙනුවෙන් සිහිකර නමස්කාර කරන්න. එසේ ම මගේ සහෝදර නමට ද "අපේ ගුරු හිමියන් ඔබ සිහිපත් කළා"යි ද පවසන්න" යි පවසා සමු දුන් හ.

ඒ හිමිවරු එසේ ම බුදුරදුන් හා මහා ශ්‍රාවකයන් වහන්සේ වැඳ තම ආචාර්යයන් වහන්සේ ගේ මිතුරු හිමි නම ද බැහැ දැක "අප ගේ ආචාර්යයන් වහන්සේ ඔබ වහන්සේ සිහිපත් කළා"යි පැවසූ හ. "ඒ කවුද?"යි උන් වහන්සේ ප්‍රශ්න කළහ. "ඒ ඔබ වහන්සේ ගේ එකට පැවිදි වූ මිත්‍ර ස්වාමීන් වහන්සේයි."

"එයා ගෙන් ඔබ මොනවා ද ඉගෙන ගත්තේ? එයා ඉගෙන ගත්ත ධර්ම විනයක් නැහැ නේ. පාංසුකූල සිවුරක් අරගෙන කැලෑ වැදුණා මිසක් මොනව ද ඉගෙන ගත්තේ ?" තම මිත්‍ර හිමි නම කවදා හෝ වනයේ සිට නගරයට පැමිණි දිනක මේ තරම් සිසුන් පිරිසක් පිරිවරා ගෙන ඉගැන්වූයේ කුමක්දැයි අසන්නට තීරණය කර ගත්තේ ය. උන් වහන්සේ ගෙන් ධර්ම ප්‍රශ්න විමසන්නෙමියි සිතා ගත්තේ ය.

ටික කලකට පසු භාග්‍යවතුන් වහන්සේ දකින්නට පැමිණි වැඩිහිටි රහතන් වහන්සේ, බුදුරජාණන් වහන්සේට සහ මහා ශ්‍රාවකයන් වහන්සේලාට හර සර දක්වා අනතුරුව සිය මිත්‍ර ග්‍රන්ථ ධුරී හිමි නම දකින්නට ද ගියේ ය. උන් වහන්සේ ද වනවාසී රහතන් වහන්සේට ගෞරවාචාර දක්වමින් පා සිවුරු පිළිගෙන "අද මම මුන් වහන්සේ ගෙන් හොඳ ප්‍රශ්න ටිකක් විමසමි" යි සිතමින් සංග්‍රහ කළේ ය.

භාග්‍යවතුන් වහන්සේ මේ භික්ෂුව මපුතණුවන් ගෙන් ප්‍රශ්න අසා හිරිහැර කර අකුසල් කර ගත හොත් එය ඔහුට ම අලාභ පිණිස පවතී යැයි සිතා ඔවුන් දෙනම වැඩ සිටි තැනට වැඩම කළ සේක. එසේ වැඩ සිටි භාග්‍යවතුන් වහන්සේ ග්‍රන්ථධුරය පිරූ භික්ෂූන් වහන්සේ ගෙන් ප්‍රථම ධ්‍යානය පිළිබඳ ව ප්‍රශ්නයක් විමසූ හ. එම භික්ෂුව ඊට නිවැරදි පිළිතුර දුන්නේ ය. අනතුරුව ද්විතීය ධ්‍යානය ගැන විමසූ හ. ඊට ද නිවැරදි පිළිතුර ලැබිණ.

අෂ්ට සමාපත්තීන් හා රූප ලෝක හා බ්‍රහ්ම ලෝක ගැන ද විමසූ සියළු ප්‍රශ්න වලට සාර්ථක ලෙස නිවැරදි පිළිතුරු දීමට භික්ෂු නම සමත් විය. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ සෝතාපත්ති ඵලය පිළිබඳව ප්‍රශ්නයක් නැගූ හ. ග්‍රන්ථ ධුරය පුරන හිමි නම ඊට පිළිතුරු දීමෙහි අසමත් විය.

**විවරණාත්මක අනුවාදය (19 ගාථාව)**

**පමත්තො නරො සහිතං බහුං භාසමානො අපි චෙ**
**තක්කරො න හොති පරෙසං ගාවො ගණයං ගොපො**
**ඉව සාමඤ්ඤස්ස භාගවා න හොති**

**පමත්තො**: ප්‍රමාද **නරො**: පුද්ගලයා **සහිතං**: ධර්මය **බහුං**: වැඩියෙන් **භාසමානො**: දේශනා කරන්නේ **අපි**: වුව ද **චෙ**: නමුත් **තක්කරො**: එය පිළිපදින්නෙක් **න හෝති**: නො වන්නේ **පරෙසං**: අනුන් ගේ **ගාවො**: ගවයන් **ගණයං**: බලා ගන්නා **ගොපො**: ගව පාලකයෙක් **ඉව**: මෙන් **සාමඤ්ඤස්ස**: පැවිදි ජීවිතයේ ඵලයට **භාගවා**: හිමිකරුවෙක් **න හොති**: නො වන්නේ ය.

බුදු බණ වැඩි වැඩියෙන් දේශනා කරන නමුත් එය ක්‍රියාත්මක නො කරන ප්‍රමාදී පුද්ගලයෝ අනුන් ගේ ගවයන් බලා ගන්නා ගව පාලකයෙක් මෙන් ශ්‍රමණ ජීවිතයේ ඵලය ලබා නො ගනියි.



*මඳ වශයෙන් වුවත් තෙවළාදහම් දැන උගෙන පිළිපැදීම ශ්‍රමණ ගුණයේ පලය හිමිවීමට හේතු වෙයි.*

| | |
|---|---|
| 20. අප්පම් පි චෙ සහිතං භාසමානො | ඉතා ටිකක් බණ දෙසුවත් |
| ධම්මස්ස හොති අනුධම්මචාරි | දහම අනුව පිළිපැද්දොත් |
| රාගඤ්ච දොසඤ්ච පහාය මොහං | රාග-දෝස-මෝහ දුරැර |
| සම්මප්පජානො සුවිමුත්තචිත්තො | මිදුණු සිතින් හොඳ නුවනින් |
| අනුපාදියානො ඉධ වා හුරං වා | නොබැඳී එලොවත් මෙලොවත් |
| ස භාගවා සාමඤ්ඤස්ස හොති (1:20) | පැවිදි දිවිය පලය ලබත් |

# වඩා බවුන් - ලබමු නිවන්

## 1 (14) මිතුරු දෙනමක ගේ වතක් (19-20 ගාථා) ඉතිරි කොටස

එම ප්‍රශ්නය විදර්ශනා ධුරය පිරූ රහතන් වහන්සේට යොමු කරනු ලැබිණ. උන් වහන්සේ ඊට නිවැරදිව පිළිතුරු දුන්හ. සාධු සාධු යි එය අනුමත කළ භාග්‍යවතුන් වහන්සේ අවශේෂ මාර්ග-ඵල පිළිබඳ ව ද උන් වහන්සේ ගෙන් ම විමසූ හ. ඒ හැමකෙකට නිවැරදි පිළිතුරු ලැබුණු අතර ඒ තුන් වාරයේ ම ද භාග්‍යවතුන් වහන්සේ සාධුකාර දුන් හ. ඒ ඇසූ දිව්‍ය බ්‍රහ්මාදීහු ද සාධුකාර දුන් හ.

බුදුරදුන් දුන් සාධුකාරයෙන් ග්‍රන්ථ ධුරය පුරන හිමියන් ගේ සිසු හිමිවරු සහ ගිහි දායකයෝ නො පහන් වූ හ. "ඇයි බුදුරදුන් මෙසේ කරන්නේ? මහළු භික්ෂුව පිළිතුරු දුන් හතර වතාවේ ම උන් වහන්සේ සාධුකාර දුන්නත්, දහම දිවග ලෙලැවූ අපේ ධර්මධර විනය ධර පණ්ඩිත හාමුදුරුවන් පිළිතුරු දුන් විට එසේ කළේ නැහැ. එය අසාධාරණයි" ඔවුහු එකිනෙනා කොඳුරන්නට වූ හ.

"මහණෙනි, ඔබ මොනවා ද කියන්නේ" යි බුදුහු ප්‍රශ්න කළ හ. ඔවුහු තම විමතිය උන් වහන්සේට කියා පෑ හ. "මහණෙනි, ඔබේ ජනප්‍රිය භික්ෂුව මගේ සසුනේ කුලියට හරක් බලනවා වැනියි. එහෙත් මපුතු මහ රහත් නම පස් ගෝ රසය ම තමන් සතු කර ගත් ගව හිමියෙකු වගෙයි" යනුවෙන් ඇති තතු පැහැදිලි කර වදාළ හ.

### විවරණාත්මක අනුවාදය (20 ගාථාව)

**සහිතං අප්පං අපි භාසමානො චෙ ධම්මස්ස**
**අනුධම්මචාරී හොති රාගං ච දොසං ච මොහං ච පහාය**
**සො සම්මප්පජානො සුවිමුත්තචිත්තො ඉධ වා හුරං වා**
**අනුපාදියානො සාමඤ්ඤස්ස භාගවා හොති**

**සහිතං**: බුද්ධ වචනය; **අප්පං**: ස්වල්පයක් ද; **අපි**: වුවත්; **භාසමානො**: දේශනා කරමින්; **චෙ**: ඉදින්; **ධම්මස්ස**: ධර්මයෙහි; **අනුධම්මචාරී හොති**: ධර්මානුකූලව ජීවත් වෙයි (නම්); **රාගං ච**: රාගය ද; **දොසං ච**: ද්වේෂය ද; **මොහං ච**: මෝහය ද; **පහාය**: දුරුකර; **සො**: හෙතෙම; **සම්මප්පජානො**: නිවැරදි ප්‍රඥාව ඇති ව; **සුවිමුත්තචිත්තො**: දුබල හැඟීම් වලින් මනාව මිදී; **ඉධ වා**: මෙලොවට වත්; **හුරං වා**: පරලොවට වත්; **අනුපාදියානො**: බැඳීමක් නැතිව; **සාමඤ්ඤස්ස**: ශ්‍රමණ ජීවිතයේ ඵලයට; **භාගවා**: හිමිකරුවෙක්; **හොති**: වෙයි.

බුද්ධ වචනය දේශනා කරන්නෝ ස්වල්ප වශයෙන් වුව ද ධර්මයට අනුව තම ජීවිතය ගත කරන රාගය, ද්වේෂය හා මෝහය දුරුකර කෙලෙසුන් ගෙන් සිත මුදා ගෙන මෙලොවට හෝ පරලොවට නො බැඳී වසන්නේ නම් හෙතෙම පැවිදි ජීවිතයේ ප්‍රයෝජනය විඳ ගනියි.

### විවරණය

**සහිතං**: යන්නෙන් අදහස් වන්නේ ආගමික සාහිත්‍යයයි. මෙහි දී විශේෂයෙන් ම බෞද්ධ සාහිත්‍යය හෙවත් බුද්ධ වචනය සූත්‍ර හා විනය වශයෙන් ද්විවිධ ය. වර්තමානයෙහි එය ත්‍රිපිටකය ලෙස සංවිධානය කර රැක ගනු ලැබේ.

**භාසමානො**: යන්නෙන් ධර්මය දේශනා කිරීම අදහස් වෙයි. ඇතමුන් ධර්ම දේශනයට හපන් වුව ද නිතර නිතර විචිත්‍ර ලෙස ධර්ම විවරණ ඉදිරිපත් කළ ද එමගින් ජීවිතය ආලෝකවත් කර නො ගනිති. ධර්මය පිළිපැදීමෙන් තොරව ධර්ම දේශනා කරන භික්ෂුව, භික්ෂු ජීවිතයෙහි නියම ආස්වාදය නො ලබන බව මෙහි කියැවෙයි. අනුන් ගේ ගවයන් කුලියට බලන්නහුට පස්ගෝරසය භුක්ති විඳින්නට නො ලැබේ. ඔහු ලබන්නේ සුළු වැටුපක් පමණි.

**සුවිමුත්ත චිත්තො**: යන්නෙන් තෘෂ්ණා-උපාදානයන් ගෙන් හා අපිරිසිදු හැඟීම් වලින් මිදුණු සිත අදහස් වෙයි. විමුක්තිය ලබා ගත හැක්කේ එබඳු හැඟීම් දුරු කිරීමෙනි. එසේ අරහත් ඵලය ලබා ගත් උතුමෝ මෙලොවට හෝ පරලොවට හෝ නො බැඳෙති. 'අනුපාදියානො' යි සඳහන් කළේ එහෙයිනි.





සනාතන බුද්ධ භාෂිතය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ අසහාය සාමයික මෙහෙය උදෙසා, සිය කාලය හා ශ්‍රමය සපුරා වැය කරමින්, මානව වංශයට දහම් මග හෙළි පෙහෙළි කිරීමේ මහා මෙහෙවරට කැප වී සිටින සිංගප්පූරුවේ ප්‍රධාන සංඝ නායක වේරගොඩ සාරද, ස්ථවිරයන් වහන්සේ අද ලොව වෙසෙන ප්‍රශස්ථතම ධර්‍ම දූත යතිනායක වරයාණන් වහන්සේ නමකි.

1941 නොවැම්බර් මස 27 වනදා දකුණු ලක වේරගොඩ දී උපත ලද මේ යති ප්‍රභූවරයානෝ, උපාධි ලාභීව, ධර්‍මදූත මෙහෙය ආරම්භ කළේ ඉතා යොවුන් අවධියේ දීමය. දැනට ශතක 6 ක් පුරා ධර්‍මදූත මෙහෙයෙහි යෙදී සිටින ගරුතර වේරගොඩ සාරද යතිනායකයානන් වහන්සේ මුද්‍රිත මාධ්‍යයෙන් සහ විද්‍යුත් මාධ්‍යයෙන් මෙන්ම දුරකථන තාක්ෂණයෙන් පවා අද ලොවට ධර්‍මදානය සපයන්නේ නවීනයන්ගේ මනස හා ආධ්‍යාත්මික ගති-පැවතුම් පිළිබඳ පැහැදිලි අවබෝධයකිනි.

## කෘතී ස්වාමීන්ද්‍රයන් වහන්සේ

වර්තමානික ග්‍රාහක පිරිස, ශ්‍රව්‍ය-දෘෂ්‍ය මාධ්‍ය මගින් දැනුමත් විනෝදාස්වාදයත් ලබන්නට පුරුදු වී සිටින පරපුරක් හෙයින්, ගරුතර වේරගොඩ සාරද හිමිපාණෝ, ඔවුනගේ මනසට සරිලන පරිද්දෙන් බුද්ධ භාෂිතය, ඔවුන් අතට පත් කරන සේක. මුද්‍රිත හා විද්‍යුත් ප්‍රකාශන 700 ක් පමණ ලොවට පිරිනමා සිටින මේ යතිනායකයන් වහන්සේ විසින් සම්පාදිත ධර්ම භාණ්ඩාගාරය නම් ඉංග්‍රීසි කෘතිය දොරට වැඩීමේ උළෙලේ දී, ඒ පිළිබඳ ව එක් දිනක් තුල පමණක් ලැබුණු දුරකථන ඇමතුම් සංඛ්‍යාව 2000 කටත් අධික විය. ඒ නිසා එය සිංගප්පූරු රාජ්‍යයේ ග්‍රන්ථ ප්‍රකාශන ඉතිහාසයේ සුවිශිෂ්ට වාර්තාවකට හිමිකම් කියන්නේය.

දැනට, සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය භාරව වැඩ සිටින ගරු වේරගොඩ සාරද නායක ස්ථවිර පාදයන් වහන්සේ ලෝකයේ බොහෝ දේශයන් හී බුද්ධ ශාසනයේ ප්‍රගතියට හිතකාමී ධර්ම දූත මෙහෙවරක යෙදී සිටින සේක.

එතුමන් ගේ ප්‍රධාන ප්‍රකාශ අතර, සිංහල හා ඉංගිරිසි ධම්මපදයත්, ජාතක කථා පිළිබඳ විද්‍යුත් ප්‍රකාශනයත් ප්‍රධාන තැන් ගනී. එතුමන් විසින්, ඉටු කෙරෙන මහා සාමයික මෙහෙය අඛන්ඩව පවත්වා ගෙන යනු පිණිස, ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් නිදුක් නිරෝගී සුව පැතීම, බෞද්ධ ජනතාවගෙන් ඉටු විය යුතු කෘතඥතා පූර්වක චාරිත්‍රයකි.

කලා කීර්ති එඩ්වින් ආරියදාස

ISBN: 981-00-4938-2

# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත ධම්මපදය

දෙවන පරිච්ඡේදය

## අප්පමාද වග්ග



ගරු වේරගොඩ සාරද නාහිමිපාණන් වහන්සේ
සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක

"සබ්බදානං ධම්මදානං ජිනාති"

(ධර්ම දානය, සෙසු දාන සියල්ලටම වඩා අගනේය.)



"ධර්ම භාණ්ඩාගාරය" නැමැති

මෙම වටිනා ධර්ම පුස්තකය

**සාමවිනිසුරු බී.ධර්මදාස මැතිතුමාට**

**නිවන් සුව පිණිස**

පූර්ණ අනුග්‍රහකත්වය

**වේරගොඩ සුනන්දා භික්ෂුණිය විසිනි.**

# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත ධම්මපදය


කතෘ

**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**

ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව

විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය



**සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය**

නො: 1, ජලන් මස් පුටේ, සිංගප්පූරුව 128607

ටෙලි: 65 67783330 65 94656570

94 770589498 / 94 755218421

වේරගොඩ ජයන්ති විහාරය, වේරගොඩ, මීටියාගොඩ

විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

**කර්තෘ**
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**චිත්‍ර ශිල්පී**
පී. වික්‍රමනායක

**සැකසුම**
පියරත්න හේවාබට්ටගේ

**පරිගණක රූපාවලි සහ පූර්ව ප්‍රකාශන මෙහෙය**
පූජ්‍ය වේරගොඩ සුනන්දා භික්ඛුණී
බී. දයා සමරසිංහ
බී. රෝහණ ජයතිස්ස

**පරිගණක සහාය**
ශ්‍යාමනී ප්‍රියලක්‍ෂණා ලේකම්වසම්
ඩබ්ලිව්. මාලා කාන්ති
ප්‍රියංකා බෝධිපක්‍ෂ

**සහාය**
බී. පුෂ්පානී ධම්ලතා
බී. ජේ. ධම්ලතා
ඊ. එම්. ලයනල් මොහොට්ටි
ඊ. එම්. යුගාන් සසංක
ශ්‍රියාලතා කග්ගොඩ ආරච්චි

**පරිගණක ප්‍රකාශන**
සමනල ප්‍රින්ටර්ස්, බටපොල
ටෙලි: +94 777557127

**පිටකවරයේ පින්තූරය**
බර්ට් ගුණසේකර

**මුද්‍රණය**
2013 නොවැම්බර් මස 27 දින, සිංගප්පූරුව

**පිටකවරයේ චිත්‍රය**
*පිටකවරයේ බුදු පිළිමය වේරගොඩ ජයන්ති විහාරයේ බුදුමැදුරෙහි.*
*වර්ෂ 1953 ජූනි 3 වෙනිදා අඹන ලද මෙම බුදු පිළිමය දැනට ශ්‍රී ලංකාවේ තිබෙන*
*දර්ශණීයතම බුදු පිළිමය වශයෙන් සැලකේ. මෙම බුදු පිළිමය ඉදිකිරීමේ පුරෝගාමී වූ අපවත් වී වදාළ*
*ගෞරවාර්හ පණ්ඩිත යටලමත්තේ වජිරඤාණ නායක මාහිමිපාණන් වහන්සේට නිවන්සුව අත්වේවායි අපි ප්‍රාර්ථනා කරමු.*

මේ ග්‍රන්ථයෙහි ආගත කරුණු පිළිබඳ පූර්ණ හා සදාකාලික අයිතිය හිමි වන්නේ බුදුරජාණන් වහන්සේටයි.
බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් පහළ වූ සනාතනික සත්‍යයෝ පුහුදුන් මිනිසුන් විසින් පනවන ලද
තාවකාලික වූත්, අසත්‍ය වූත්, අයිතිවාසිකම් පිළිබඳ නීති රීති පිළිගනු නොලබති.

**පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ටෙලි: 65 67783330 65 94656570
+94 770589498 +94 755218421
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

ISBN: 981-00-4938-2

2 වන පරිච්ඡේදය

# අප්පමාද වග්ග





*නො පමා බව නිවණට මගය. පමා බව මරණයට මගය. නො පමාවූවෝ නොමියෙති පමාවූවෝ මළවුන් වැනි වෙති.*

21. අප්පමාදො අමතපදං
පමාදො මච්චුනො පදං
අප්පමත්තා න මීයන්ති
යෙ පමත්තා යථා මතා. (2:1)

නිවනට මග නො පමාවයි
පමාව මරණයට මගයි
නො පමා වූවෝ නො මියෙති
පමා වුවොත් මළවුන් වෙති.

# ලබා ගැනුම නිවන් සුවේ - ලෙහෙසි පහසු දෙයක් නො වේ.

## 2 (1) සාමාවතිය ගේ කතා පුවත (21, 22, 23 ගාථා)

කොසඹෑ නුවර ඝෝසිතාරාමයෙහි වැඩ වසන සේක් භාග්‍යවතුන් වහන්සේ එනුවර රජ කළ **උදේනී** රජතුමා ගේ අග මෙහෙසියක වූ සාමාවතිය පිළිබඳ ව මේ ගාථාත්‍රය දේශනා කර වදාළ හ.

භද්‍රාවතී නම් නගරයක භද්‍රාවතිය නම් සිටුවරයෙක් විසී ය. හෙතෙම ඝෝෂක සිටාණන් ගේ මිත්‍රයෙක් වූයේ ය. එහෙත් ඔවුන් එකිනෙකා දැන නො තිබිණි. භද්‍රාවතී නගරයේ සිට එන වෙළඳුන් අතින් භද්‍රාවතිය සිටාණන් ගේ ධන සම්පත් ගැන ඇසූ ඝෝෂක සිටාණෝ ඔහු සමග මිත්‍රත්වයක් ඇති කර ගන්නට සිතා තෑගි බෝග යැවී ය. එමගින් හෙතෙම අදෘෂ්ට මිත්‍රත්වයක් ඇති කර ගත්තේ ය.

කලකට පසු භද්‍රාවතිය සිටාණන් ගේ නිවසෙහි එක් භයානක රෝගයක් ඇති විය. මෙම රෝගයෙන් මුලින් ම මිය යන්නෝ මැස්සෝ ය. ඉන් පසු ක්‍රමයෙන් කෘමි සත්තු, මීයෝ, කුකුළෝ, ගවයෝ වැනි සත්තු මිය යති. අවසන නිවසේ හැම දෙන ද මිය යති. බිත්තියක් කඩා ගෙන පලා යන්නෝ පමණක් ජීවත් වෙති. භද්‍රාවතිය සිටුතුමා, දේවිය හා දියණිය මෙසේ දිවි ගළවා ගනු පිණිස බිත්තියක් බිඳ ඉන් නික්ම ඝෝෂක සිටාණන් ගේ පිළිසරණ ලබනු පිණිස එහි යාමට පිටත් වූ හ.

ගමන නිම කරන්නට පෙර ම ඔවුන් මඟ දී කෑමට බීමට ගෙනා සියල්ල නිම වී අව්වෙන් හා සුළඟින් පීඩිතව කුසගින්නෙන් වෙළී දුකට පත් වූ හ. අපහසුවෙන් කොසඹෑ නුවරට පැමිනි ඔවුහු එක් පොකුණකින් දිය නා සැරසී රැය ගත කිරීම පිණිස නුවර දොරටුව අසල ලැගුම් හලකට ගිය හ.

පසුදින දුබලව වැහැරී චාම් ඇඳුමින් සැරසී සිටි සිටුතුමා තමන් පත්ව සිටි තත්වය ගැන මෙනෙහි කොට දේවිය අමතා, "දේවිය, මෙලෙස අප මිතුරු බැහැ දකින්නට යා හැකි ද? අපි මෙසේ දුබලව වැහැරී සිටිනවා දුටුව හොත් වැදූ මවට වුව ප්‍රිය මනාප නැත. අපේ මිත්‍රයා ගේ දන්සැලක් ඇත. එහි දුගී දුප්පත් අසරණයන්ට දිනපතා ආහාර පාන දෙනු ලැබේ.

දුව එහි යවා කෑම ගෙන්වා ගෙන අනුභව කර නීරෝගී වී යමු" යි යෝජනා කළේ ය. දේවිය ද එය අනුමත කළෙන් ඔවුහු ලැගුම් හලේ ම නැවතී දියණිය දන් සැලට යැවූ හ. දහවල් වන විට ඔවුහු බඳුනක් දී දියණිය දන් සැලට යැවූ හ. සැප සම්පත් මැද අභිමානවත් ලෙස හැදුණු වැඩුණු නමුත් නිහතමානීව දුගී දුප්පත් යාචකයන් ගැවසෙන දන්සැලට ගිය ඕ බඳුන දිගු කළා ය.

"කොටස් කීයක් නුඹට අවශ්‍ය ද"යි දන්සල භාරකරු ප්‍රශ්න කළ විට 'තුනක්' යි පැවසූ ඇයට කොටස් තුනක් ලැබිණ. ඒවා නවාතැනට ගෙන'වුත් අනුභවයට සැරසුණු විට සිටු දේවිය සිටු වරයා අමතා "අපේ දිවි රැකෙන්නේ ඔබෙන් ය. ඔබ රැකුණොත් මිස අප රැකී කවර පලක් ද? එහෙයින් මේ බත් සියල්ලම ඔබ ම අනුභව කර පණ රැක ගන්නැ"යි සියල්ලම ඔහුට ම අනුභව කර වූවාය. එහෙත් කුසගින්නේ සිට එක්වර මහත් ප්‍රමාණයක් අනුභව කළෙන් දිරවාගත නො හැකිව හෙතෙම රාත්‍රියෙහි කළුරිය කළේ ය. සංවේගයට පත්ව ඔහු ගේ අවසන් කටයුතු කළ ඔවුහු පසු දින ද අහර පිණිස දියණිය යැවූ හ. එදින කොටස් කීයක් අවශ්‍ය දැයි ඇසූ විට ඕ දෙකක් ඉල්ලා ගත්තා ය. එදින මව ඇමතූ දියණිය, "මෑණියෙනි, පියාණනුත් මිය ගිය හෙයින් ඔබ රැකුණොත් මම රැකෙමි. එහෙයින් මේ කොටස් දෙක ම අනුභව කර ඔබ රැකෙන්නැ"යි කීවා ය. ඕ තොමෝ ද කොටස් දෙකම අනුභව කර දිරවා ගත නො හී රාත්‍රියෙහි මිය ගියා ය.

පසු දින දන්සලේ දී දියණිය එක් කෑම කොටසක් පමණක් ඉල්ලූ විට දන්සල පාලකයා "අද ද තී තමන් ගේ බඩේ තරම දැන ගත්තේ?" යි බැණ වැදුණා ය. මහත් ලජ්ජාවට පත් සිටු දියණිය "මා මුල් දිනයේ කොටස් තුනක් ගෙන ගියේ කෑමට අප තිදෙනෙක් සිටි නිසා ය. ඊයේ අපි දෙදෙනෙක් බවට පත් වූමු. අද ඉතිරිව සිටින්නේ මා පමණය" යි පැවසුවා ය. ඒ කවර හෙයින් දැයි විමසා දන්සල් පාලකයා සියලු තාව අසා දැන ගත්තේ ය. ඔහු ගේ දෑසට කඳුළු නැගිණි. "දුක් නො වන්න දියණිය, අද පටන් ඔබ මගේ දියණිය වන්න" යි සිය නිවසට ඇය කැඳවා ගත් හෙතෙම මහත් සෙනෙහසින් ඇය වැඩුවා ය.

**විවරණාත්මක අනුවාදය (21 ගාථාව)**

**අප්පමාදො අමතපදං පමාදො මච්චුනො පදං**
**අප්පමත්තා න මීයන්ති යෙ පමත්තා යථා මතා.**

**අප්පමාදො**: ප්‍රමාද නො වීම; **අමතපදං**: නිවන් ලැබීමේ මඟයි; **පමාදො**: ප්‍රමාදය; **මච්චුනො පදං**: මරණයට මඟයි; **අප්පමත්තා**: අප්‍රමාදවූවෝ; **න මීයන්ති**: නො මැරෙති; **යෙ පමත්තා**: යමෙක් ප්‍රමාද වූ හුද; **යථා මතා**: මළ ගියවුන් වැනිය.

ප්‍රමාද නො වී නිරතුරු අවදිකමින් සිටීම නිවන් ලැබීමේ මග වෙයි. ප්‍රමාද වීම මරණයට හෙවත් සසරට හේතු යි. අප්‍රමාද වූවෝ නො මියෙත්. ප්‍රමාද වූ අය ජීවත් වූවත් මළවුන් මෙනි.





*නුවණැතියෝ නොපමාවෙහි ගුණ දැන, එහි යෙදී, සතොස් ව ආර්යයන්ගේ ගොදුරෙහි ඇලෙති.*

22\. එතං විසෙසතො ඤත්වා
අප්පමාදම්හි පණ්ඩිතා
අප්පමාදෙ පමොදන්ති
අරියානං ගොචරෙ රතා (2:2)

අප්‍රමාදයෙ අගය වෙසෙසින
දැන හැඳින ලොව නුවණ ඇති දන
ප්‍රමෝදය ලැබ අප්‍රමාදෙන්
ඇලෙති පියයෙහි නිවෙන රහතුන්

# ලබා ගැන්ම නිවන් සුවේ - ලෙහෙසි පහසු දෙයක් නොවේ
## 2 (1) සාමාවතිය ගේ කථාව (21, 22, 23 ගාථා) (ඉතිරි කොටස)

දිනක් දන්සලේ ආහාර ගෙන යන්නට පැමිණෙන දුගියන් ගේ කෑ කෝ ගසන හඬ ඇසූ සාමාවතී "පියාණෙනි, මේ මිනිසුන් කල කෝලාහළ කර ගැනීම නවතා ලන්නේ නැත්තේ මන්දැ" යි විමසුවා ය. "දියණියෙනි, එය නවත්තන්නට අපහසු ය. ඒ ඔවුන් ගේ ස්වභාවයය"යි හේ පැවසී ය. "එය පිළිවන් පියාණනි." "කෙසේ ද දියණියනි එය කරන්නේ?" "දන් සල වටා වැටක් ඉදි කරන්න. එක් අයකුට පමණක් එක්වර එන්නටත්, එක් පසෙකින් ඇතුළු වී අනෙක් පැත්තෙන් පිට වන්නටත් හැකි වන පරිදි එය සකස් කරන්න." "ඉතා මැනවි දියණියනි." යි පවසා දන්සල පාලක තෙම එසේ කළේය. එතැන් පටන් දන්සලෙහි කලබල හා ඝෝෂා නැතිව සියල්ල සාමකාමී වූයේ ය.

ඝෝෂක සිටාණෝ දන්සලෙහි ශබ්ද වලට හොඳට හුරු පුරුදුව සිටි හෙයින් නිශ්ශබ්දතාව ගැන විස්මයට පත් විය. එහෙයින් හේ මිත්‍ර නම් වූ දන්සැල් පාලක තැන කැඳවා "දැන් අසරණයන්ට දන් දීම නවත්වලාදැ" යි විමසී ය. "නැත. තවමත් දිනපතා දානය දෙනු ලැබේ." "එසේ නම් දින කීපයක සිට කිසි ශබ්දයක් නැත්තේ කවර හෙයින් ද?" "ඔවුන්ට පිළිවෙළට පැමින කරදරයක් නැතිව ආහාර ගන්නට පිළිවෙළක් යෙදුවෙමි" "ඔබ ඇයි කලින් එසේ නො කළේ?'' "කලින් මම ඒ ගැන දැන ගෙන නො සිටියෙමි" "කලින් නො දැන සිටි දෙයක් දැන් දැන ගත්තේ කෙසේ ද?" "මගේ දියණිය මට කියා දුන්නා ය" "මා නොදත් දියණියක් ඔබට කොහින් ද?" මේ අවස්ථාවේ දි සාමාවති සිටු දියණිය තම දියණිය බවට පත් වූ සියලු කතා පුවත කියන්නට මිත්‍රට සිදු විය.

ඒ ඇසූ සිටුතුමා බලවත් කම්පාවට පත්ව "ඇයි ඔබ මේ බව මට කලින් නො කීවේ? මේ සාමාවති මගේ මිතුරා ගේ දියණියයි" මෙසේ කියා හෙතෙම සාමාවතී ගෙන්වී ය. "ඔබ අසුවල් සිටුතුමා ගේ දියණිය යැයි කියන්නේ සැබෑදැ"යි විමසූ ඔහුට "එසේය" යන පිළිතුර ලැබිණි.

"එසේ නම් දුක් නො වන්න. ඔබේ පියා මගේ මිත්‍රයා ය. දැන් ඔබ මගේ ම දියණියයි" යි පවසා හිස සිඹ ඇය පිළිගත් හෙතෙම පන්සියයක් පිරිවර ළඳුන් ද දී ඇය තමන් ගේ දියණිය ලෙස එතැන් පටන් හදා ගත්තේ ය.

දිනක් නගරයේ උත්සවයක් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම උත්සවයට සාමාන්‍යයෙන් නිවසින් පිට නො යන ප්‍රභූ පවුල් වල දියණියන් තම තමන් ගේ පරිවාර ළඳුන් සමග ගඟට ගොස් ස්නානය කිරීම ද ඇතුළත් ය. ඒ අනුව එදින සාමාවතී ද පිරිවර ලඳුන් 500 ද සමග රජ වාසල ඉදිරියෙන් යෙදී ඇති මාවතින් ගඟට ගියා ය.

සී මැදුරු කවුලුවෙන් මග දෙස බලා සිටි උදේනී රජ තෙම එම ලඳුන් 500 දැක "මේ කෙළි දෙලෙන් යන ළඳුන් කා ගේ ද?" යි විමසා සිටියේ ය. "භද්දවතිය සිටාණන් ගේ සාමාවතී නම් දියණිය ගේ පිරිවර ළඳුන්ය" යි රජතුමාට පිළිතුරු දෙන ලදී. ඒ ඇසූ රජ තෙම සිටුතුමාට දන්වා සාමාවතිය අග මෙහෙසුන් තනතුරේ තබා ගත්තේ ය. ඇය ගේ පිරිවර කතුන් 500 ද රජවාසලට ගෙන්වා ගන්නා ලදී.

මේ අතරතුර තවත් කාන්තාවක් ද රජතුමා ගේ අග මෙහෙසුන් තනතුරට පත් වූවා ය. ඇය ගේ නම මාගන්දි ය. ඇය ගේ දෙමාපියන් ඇය බුදුරදුන්ට පාවා දෙන්නට වෑයම් කළ අවස්ථාවෙහි බුදුරදුන් කී වදනක් පිළිබඳව අමනාපය ඇය සිත් තුළ මුල් බැස තිබිණ. සාමාවතී බුදුරදුන් ගේ භක්තිමත් ශ්‍රාවිකාවක් වූවා ය. එහෙයින් බුදුරදුන් ගෙන් පලිගන්නට සිතමින් සිටි මාගන්දියා ගේ වෛරය සාමාවතිය හා පිරිසට ද යොමු විය.

**විවරණාත්මක අනුවාදය (22 ගාථාව)**

**එතං විසෙසතො ඤත්වා අප්පමාදං හි පණ්ඩිතා**
**අප්පමාදෙ පමොදන්ති අරියානං ගොචරෙ රතා**

**එතං**: මෙය; **විසෙසතො**: විශේෂ වශයෙන්; **ඤත්වා**: දැන; **අප්පමාදං හි**: අප්‍රමාද වීමෙහි නිරතව; **පණ්ඩිතා**: නුවණැත්තෝ; **අප්පමාදෙ**: අප්‍රමාදයෙහි; **පමොදන්ති**: ප්‍රමුදිත වෙති; **අරියානං**: රහතන් වහන්සේලා ගේ; **ගොචරෙ**: ගැලපෙන හැසිරීම් හි; **රතා**: ඇලෙති.

අප්‍රමාදයෙහි අගය විශේෂ වශයෙන් ප්‍රත්‍යක්ෂ කර ගෙන එහි නිරත වන නුවණැත්තෝ අප්‍රමාදයෙහි ප්‍රමුදිත වෙති. රහතන් වහන්සේලාට ගැලපෙන චර්‍යා රටාවක් අනුව හැසිරෙති.





*භාවනා කරන, නිතර දැඩි වෙරැති නුවණැතියෝ නිවන් පසක් කරති.*

23. තෙ ඣායිනො සාතතිකා
නිච්චං දළ්හපරක්කමා
ඵුසන්ති ධීරා නිබ්බාණං
යොගක්ඛේමං අනුත්තරං (2:3)

දිගින් දිගට බවුන් වඩන
නිතර දැඩිව විරිය දරන
නුවණැති දන ලබති නිවන
උතුම් ම තැන - බිය නැති වන

# ලබා ගැන්ම නිවන් සුවේ - සිතන තරම් පහසු නො වේ

## 2 (1) සාමාවතිය ගේ කතාව (21, 22, 23 ගාථා) (ඉතිරි කොටස)

වරක් ඔවුන් බුදුන් දකින්නට බිත්තියේ කුඩා කවුලු ඇති කරගෙන සිටිනු දුටු මාගන්දියා රජතුමාට බොරු කේලාම් කියා වැරදි අවබෝධයක් දෙන්නට වෑයම් කළා ය. එහෙත් එය නිරර්ථක වූයෙන් තවත් වෛර බැඳගත් ඕ සාමාවතී රජතුමා මරන්නට කුමන්ත්‍රණය කරතැයි ද කේලාම් කීවා ය. වරක් උණ බම්බුවක් තුළ සර්පයකු බහා හිල් වසා මල් වල සඟවා රජතුමා සමීපයෙහි තැබුවා ය. නාගයා පෙණය විදහමින් එළියට ආ විට රජතුමා බලවත් ලෙස කෝප වී සාමාවතී ඇතුලු පිරිස පෙළට හිඳුවා විස පෙවූ ඊතල වලින් විදින්නට අණ කළේ ය.

එහෙත් සාමාවතී ඇතුළු පිරිස මෙත් වැඩූ හෙයින් ඊතල වලින් ඔවුන්ට හානියක් නො වීය. සාමාවතී ගේ අහිංසකත්වය තේරුම් ගත් රජ ඇයට බුදුරදුන් මාලිගයට කැඳවා බණ අසන්නටත් දන් දෙන්නටත් අවසර දුන්නේ ය. තම සියළු සැලසුම් නිෂ්ඵල වූ තැන නොවරදින අවසන් උපායක් සිතූ මාගන්දියා තම මාමා කෙනකුට පණිවුඩ යවා සාමාවතී ඇතුළු පිරිස විසූ මාලිගය ඔවුන් එහි සිටියදී ගිනි ලවා මරා දමන්නට කටයුතු යෙදුවා ය. ඒ බියකරු අනතුර සිදුවත්දී ද දහම් දැනුමින් පොහොසත්ව සිටි සාමාවතී ඇතුළු පිරිස භාවනාවෙහි යෙදෙමින් පිළිස්සී මිය ගිය හ.

මෙය මාගන්දියා ගේ කුමණ්ත්‍රණයක් බව රජතුමා සැක කළේ ය. එහෙත් තමා එසේ සැක කරන බව හේ රහසක් වශයෙන් තබා ගත්තේ ය. ඒ වෙනුවට තමන් ඇය කෙරේ බෙහෙවින් ප්‍රසන්නව සිටින බවක් පෙන්වමින් කල් ගත කළ රජතෙම වරක් තමා ඇයටත් ඇයගේ ඥාතිවරුන්ටත් සංග්‍රහයක් කරන්නට යන බව පවසා ඇය ගේ පවුලේ බොහෝ ඥාතීන් ගෙන්වා ගත්තේ ය. හිටි හැටියේ මුළු පිරිස ම අත් අඩංගුවට ගත් රජතුමා මාගන්දියා හා ඔවුන් හැමදෙන රජ ගෙදර මිදුලේ ම මරා දමන්නට සැලැස්වී ය.

මේ සිද්ධි දෙක බුදු පියාණන් වහන්සේට සැල වූ විට උන්වහන්සේ මේ ගාථාවන් තුන වදාළ සේක.

### විවරණාත්මක අනුවාදය (23 ගාථාව)

**තෙ ධීරා ඣායිනො සාතතිකා නිච්චං දළ්හපරක්කමා**
**යොගක්ඛේමං අනුත්තරං නිබ්බාණං ඵුසන්ති.**

**තෙ ධීරා**: ඒ නුවණැත්තෝ; **ඣායිනො**: ධ්‍යාන භාවනා වඩන්නෝ; **සාතතිකා**: නො නවත්වා වෙර දරන්නෝ; **නිච්චං**: නිතරම; **දළ්හපරක්කමා**: දැඩි පරාක්‍රමයෙන් යුක්තව; **යොගක්ඛේමං**: බැඳුම් වලින් නිදහස් වූ; **අනුත්තරං**: අනුත්තර වූ; **නිබ්බාණං**: නිර්වාණය; **ඵුසන්ති**: ස්පර්ශ කෙරෙති.

අප්‍රමාදයෙහි අගය දත් නුවණැත්තෝ ධ්‍යාන භාවනා වඩමින් නිරතුරුව ම වෙර වඩමින් නිතරම දැඩි උත්සාහ දරමින් බැඳුම් වලින් නිදහස් වූ අනුත්තර වූ නිර්වාණය ස්පර්ශ කරති.

### විවරණය

**අප්පමාද**: යන වචනය බුද්ධ දේශනාවේ නිරතුරුව හමුවන්නකි. අවසාන බුද්ධ වචනයෙහි පවා එය හමුවෙයි. අප්පමාද යන්නෙහි හොඳ සිහි නුවණින් ක්‍රියා කිරීම යන අර්ථය ගැබ් වෙයි. නිරතුරුව ම අවදි කමින් යුතුව නො මඟ නො යා සියළු කාර්‍යයන් නුවණින් යුතුව කරන මානසික තත්ත්වය මින් අදහස් වෙයි. මෙය හොඳින්ම අරෝපණ කළ හැක්කේ රහතන් වහන්සේ නමක වෙත ය. සාමාන්‍ය පෘථග්ජනයන් අතර විවිධ මත්වීම්-ප්‍රමාද වීම් ඇත.

**අමත**: බෞද්ධ චර්‍යාවෙහි අවසාන නිෂ්ටාව වූ නිර්වාණය මෙයින් අදහස් වෙයි. නිර්වාණය මරණයෙන් තොර බව අමත යන්නෙන් හැඟවෙයි. එය ශූන්‍යත්වයක් නො වේ. නිර්වාණය ලෝකෝත්තර තත්ත්වයක් හෙයින් ලෞකික පද ව්‍යවහාර වලින් එය විස්තර කළ නො හැක. එහෙත් එය නිත්‍ය, ශාන්ත සුඛයක් බව ප්‍රකාශ කළ හැක.

**න මීයන්ති**: හෙවත් නො මැරෙති යන්නෙන් අදහස් වන්නේ අමරණීය වන බවක් නො වේ. කිසිම සත්වයකුට මරණයෙන් ගැළවී වාසය කළ නො හැක. ප්‍රමාදී නො වූ නිර්වාණාධිගමය කළ අය මරණින් මතු යළි උපතක් නො ලබන හෙයින් සංසාර ලක්ෂණයක් වූ මරණයට පත් නොවන බව මෙයින් හඟවනු ලැබේ. ප්‍රමාදී වූ වෝ දිගටම සසරේ උපදිති. එහෙයින් මැරෙති.

**නිබ්බාණ**: යන වචනයෙන් තෘෂ්ණාවෙන් මිදීම අදහස් කරනු ලැබේ. (නි+වාණ යනු එහි ප්‍රභවයයි.) මෙම ලෝකෝත්තර අධිගමය මේ භවයේදී ම ලද හැකි ය. එහි දි ක්ලේශයන් විනාශ වන බව කියැවෙන පමණින් සර්වශූන්‍ය භාවයක් ලෙස වරදවා නො ගත යුතු ය. ක්ලෙශ සමූලච්ඡේදනයෙන් ලැබෙන විශුද්ධිය හා ශාන්ත සුවපත් ස්වභාවය එහි ලක්ෂණයයි.





*නගා සිටි වෙර හා මනා ගුණැති දහැමින් දිවි පවත්වන නොපමා තැනැත්තාගේ යසස මොනවට වැඩේ.*

24. උට්ඨානවතො සතිමතො
සුචිකම්මස්ස නිසම්මකාරිනො
සඤ්ඤතස්ස ච ධම්මජීවිනො
අප්පමත්තස්ස යසො'භිවඩ්ඪති (2:4)

උට්ඨානය, සතිය සහිත
සිහි නුවණැති, කුසල් නිරත
සංවර, දැමි නො පමා දන
කිතු ගොස පැතිරෙයි දින දින

# පමා නොවන දන - පැතිරේ කිතු ගොස

## 2 (2) කුම්භඝෝෂක ගේ කථාව (24 ගාථාව)

වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි **කුම්භඝෝෂක** නම් සිටුවරයකු ඇරබ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

එක් සමයෙක රජගහ නුවර වසංගතයක් පැතුරුණේ ය. නගරයේ සිටුතුමා ගේ නිවසෙහි සේවකයෝ මේ රෝග යෙන් මළ හ. සිටුතුමා හා බිරිඳ ද රෝගයෙන් පෙළුණ හ. එවිට ඔවුහු තම තුරුණු පුතා අමතා තමන් අතහැර ගොස් කලක් ගිය පසු පමණක් පැමිණෙන්නට උපදෙස් දුන් හ. තමන් ධනය නිදන් කර ඇති ස්ථාන ද මේ මේ යයි පෙන්වා දුන් හ.

පුත්‍රයා ද නගරය හැර ගොස් වන ගතව වසර දොළහක් ම ගත කළේ ය. ආපසු නගරයට එන විට ඔහු තරුණ වියට පත්ව සිටි හෙයින් කිසිවකුට හඳුනා ගත නො හැකි විය. සම්පත් වළලා ඇති තැන් බලන්නට ගොස් ඒවා නිරුපද්‍රැතව පවත්නා බව ද දැන ගත් හෙතෙම මේවා ගොඩ ගෙන භාවිත කරන්නට පටන් ගත හොත් නුවර වැස්සන් කිසියම් දුගියකු හිටි හැටියේ සම්පතක් සොයා ගෙන සැප විඳින්නට පටන් ගත්තේ යැයි සැක කොට රජතුමාට පැමිණිලි කළහොත් තම වස්තුව රජතුමා විසින් රාජ සන්තක කරන්නට ඉඩ ඇතැයි බියට පත්ව එය භාවිතයට නො ගත්තේ ය. එහෙයින් තවම ඒ සඳහා නිසි කල උදානුනේ යයි සිතූ හේ ජීවත් වීමට රැකියාවක් සෙවී ය. ඔහුට පැවරුණු රැකියාව අළුයම පිබිදී නගරයෙහි ජනයා අවදි කරවා, දන් ආහාර පිළියෙල කිරීමට, කරත්ත ගෙන ඒමට හා ගොනුන් බැඳීමට කාලය බව කියමින් ඝෝෂා කිරීමයි.

එක් උදෑසනක බිම්බිසාර රජතුමාට ඔහු ගේ කෑ ගැසීම ඇසිණි. කටහඬින් පුද්ගලයන් විනිශ්චය කිරීමේ සමර්ථයකු වූ රජතෙම "මේ නම් මහා ධනවතකු ගේ කටහඬයැ"යි පැවසී ය. ඒ ඇසූ එක් සේවිකාවක් ඒ ගැන සොයා බලා "ඒ ඉතා දුප්පත් අසරණයෙක් පමණි, දේවයන් වහන්ස" යි වාර්තා කළේ ය. එහෙත් රජතුමා තව දින දෙකක් ම කියා සිටියේ ඒ නම් දුප්පත් අසරණයෙක් නොව මහා ධනවතකු බවයි. නැවත ද පරීක්ෂාවක් කළ මුත් වාර්තා වූයේ ඔහු සුළු වැටුපකට සේවය කරන දුප්පතකු බව පමණ ය. එයින් විස්මයට පත් සේවිකාව මේ ගැන පෞද්ගලිකව ම සොයා බලන්නට රජතුමාගෙන් අවසර ගෙන සාමාන්‍ය දුප්පත් කතක් සේ වෙස් වලාගෙන තම දියණිය ද කැටිව කම්කරුවන් අතරට ගියා ය. තමන් සංචාරයක ආ බව පවසමින් ඔවුහු කුම්භඝෝෂක ගේ ගෙයි ලැගුම් ගත් හ. එක් රැයකට නවාතැන් ඉල්ලා ගත් නමුත් දින කීපයක් එහි නවාතැන් ගැනීමට අවසර ලබා ගත් හ. මේ අතරතුර නගරයේ එක්තරා උත්සවයකට හැම නිවසකින් ම එක්තරා මුදලක් අනිවාර්‍යයෙන් ම දියයුතු බවට රජ තෙම නීතියක් පැනවීය. එහෙත් කුම්භඝෝෂක ළඟ එතරම් මුදලක් නො වීය. එහෙයින් අකැමැත්තෙන් වුව ද නිධානයෙන් රන් කාසියක් දෙකක් ගන්නට කුම්භඝෝෂකට සිදු විණි. ඒවා බාර දෙන්නට බාර ගත් සේවිකාව ඒවා රජතුමා වෙත යවා, උත්සවයට තමා අත වූ මුදල් දුන්නේ ය. ඉන් පසු ඕ රජතුමාට පණිවුඩයක් යවා කුම්භඝෝෂක රජවාසලට ගෙන්වන සේ ඉල්ලීමක් කොට ඔහු එහි යන්නට පෙර තමාත් දියණියත් එහි ගොස් සිටියා ය. රජ වාසලදී රජතුමා කුම්භඝෝෂකට කතා කොට කිසිම දඬුවමක් නො දෙන බවට පොරොන්දු වී ඇත්ත හෙළි කරන සේ ඉල්ලා සිටියේ ය. ඒ කහවුණු තමන් ගේ බව පිළිගත් හේ තමා මියගිය නගර සිටුතුමා ගේ පුත්‍රයා බවත් වසර දොළහකට පෙර තමාට වන ගත වන්නට වූ බවත් හෙළි කළේ ය. එමෙන් ම තම නිධාන ඇති තැන් ද නො වළහා පැවසීය. අන්තිමේ ඒ ධනය රජ වාසලට ගෙන්වා පරීක්ෂා කර බැලූ රජතුමා ඔහුට සිටු පදවියක් පිරිනමා රජ දියණියක් ද විවාහ කරවා දුන්නේ ය. අනතුරුව ඔහු වේළුවනාරාමයට කැඳවාගෙන ගිය රජතෙම භාග්‍යවතුන් වහන්සේට සියළු පුවත් දන්වා සිටියේ ය.

### විවරණාත්මක අනුවාදය (24 ගාථාව)

**උට්ඨානවතො සතිමතො සුචිකම්මස්ස නිසම්මකාරිනො සඤ්ඤතස්ස ච ධම්මජීවිනො අප්පමත්තස්ස යසො අභිවඩ්ඪති.**

**උට්ඨානවතො**: උට්ඨාන වීර්‍යය ඇති; **සතිමතො**: සිහි නුවණින් ක්‍රියා කරන; **සුචිකම්මස්ස**: නිරවද්‍ය ක්‍රියා කලාපයක් ඇති; **නිසම්මකාරිනො**: විමසා බලා ක්‍රියා කරන; **සඤ්ඤතස්ස**: සංවර වූ; **ච**: සහ; **ධම්මජීවිනො**: ධර්මානුකූලව ජීවත් වෙන; **අප්පමත්තස්ස**: අප්‍රමාදී වූ පුද්ගලයා ගේ; **යසො**: කීර්තිය; **අභිවඩ්ඪති**: වර්ධනය වෙයි.

යම් කිසි පුද්ගලයෙක් වීර්‍යය වඩමින්, සිහි නුවණින් යුතුව නිවැරදි ක්‍රියා ම කරමින්, සිහි නුවණින් යුතුව, වැඩ කරමින්, සංවරව ධර්මානුකූල ජීවිතයක් ගත කරයි නම්, ඒ අප්‍රමාදී පුද්ගලයා ගේ කීර්තිය දිනෙන් දින වර්ධනය වෙයි.

### විවරණය

**උට්ඨානවතො**: යන්නෙන් අදහස් වන්නේ මැලිකම් දුරැර පුබුදුවාගත් වීර්‍යයෙන් යුතුව ක්‍රියා කිරීමයි. ආර්‍ය මාර්‍ගයෙහි ගමන් කිරීමෙහි දී කුසීත බව බලවත් බාධකයක් වෙයි. එහෙයින් උට්ඨාන වීර්‍යය අත්‍යවශ්‍ය ය.





*නුවණැත්තා කෙළෙස් මහ වතුරෙන් නසා ලිය නො හැකි රහත් පල නමැති පිහිට හිමි කරන්නේ ය.*

25. උට්ඨානෙන'ප්පමාදෙන
සඤ්ඤමෙන දමෙන ච
දීපං කයිරාථ මේධා වී
යං ඔඝො නාභිකීරතී (2:5)

උත්සාහෙන් නො පමා වෙන්
සංයමයෙන් හා දමනෙන්
තමනට පහනක් කර ගෙන
සැඩ පහරින් ගැළවෙනු මැන.

# තනනු මැන දිවයින - සැඩ දිය පහර වලකන

## 2 (3) චුල්ලපන්ථක ගේ කතාව (25 වන ගාථාව)

ජේතවන විහාරයෙහි වැඩ වසන සමයෙහි රජගහ නුවර සිටාණන් ගේ මුණුබුරකු වූ **චුල්ලපන්ථක තෙරුන්** ඇරබ මේ ගාථාව වදාළ සේක.

රජගහ නුවර සිටාණන්ට මහාපන්ථක හා චුල්ලපන්ථක යැයි මුණුබුරෝ දෙදෙනෙක් වූ හ. ධර්ම ශ්‍රවණය පිණිස විහාරස්ථානයට යන විට තම මුණුබුරන් ද කැටුව යන්නට සිටුතුමා පුරුදුව සිටියේ ය.

මෙසේ දහම් අසන්නට පුරුදුව සිටි මහාපන්ථක පැවිදිව රහත් වූයේ ය. ටික කලකින්ම චුල්ලපන්ථක ද පැවිදි වූයේ ය. එහෙත් ඉගෙනුමෙහි දක්ෂයකු නො වූ හෙතෙම සිවු මසක් ම උත්සාහ කිරීමෙන් ද එක් ගාථාවක් පාඩම් කර ගන්නට අසමත් වූයේ ය. මේ අතරතුර දිනක් ජීවක වෛද්‍යවරයා බුදු පාමොක් මහ සඟනට දානයකට ඇරයුම් කිරීම පිණිස පැමිණියේ ය. එ සමයෙහි ඇරයුම් බාර ගැනීම කළේ මහාපන්ථක හිමියන් විසිනි. උන්වහන්සේ එදින ඇරයුම බාර ගනිද්දී චුල්ලපන්ථක හිමියන් අතහැර පිළිගත් හ. ඒ ඇසූ චුල්ලපන්ථක හිමියෝ මහත් කණස්සල්ලට පත්ව සසුනෙන් ඉවත් වන්නට තීරණය කළේ ය. ඒ ගැන දැනගත් භාග්‍යවතුන් වහන්සේ චුල්ලපන්ථක හිමියන් තමන් වෙත කැඳවාගෙන ගන්ධකුටි දොරටුවෙහි රඳවා සුදු ලේන්සුවක් අතට දී හිරු නැගෙන දිසාවට මුහුණ ලා 'රජෝ හරණං' (දුවිලි පිස දමමි) යි කියමින් එය පිස දමන සේ උපදෙස් දුන් හ. උන්වහන්සේ එසේ කරන අතරතුර බුදුරජාණන් වහන්සේ සඟගණ පිරිවරා ජීවක ගේ නිවසට වැඩම කළ හ.

මේ අතර තුර ලේන්සුව පිස දමමින් සිටි චුල්ලපන්ථක හිමියන්ට තම පිස දැමීම නිසා රෙදි කඩ කිළිටි වන ආකාරය දැක ගන්නට ලැබිණ. ලොව සියල්ලෙහි යථාර්ථය දැන ගන්නට මෙය මඟක් කර ගත් චුල්ලපන්ථක හිමියෝ අසුභය, අනිත්‍යය ගැන මනාව පසක් කර ගත්හ. ජීවක ගේ නිවසේ සිටිමින් ම චුල්ලපන්ථක හිමියන් ගේ සිත විනිවිද දුත් බුදුරජාණන් වහන්සේ ආලෝකයක් යවා මෙසේ ඇසෙන්නට සැලැස්වූ හ. "චුල්ලපන්ථක ලේන්සුව පමණක් නො වෙයි, ඔබ තුළත් කිළිටි තිබෙන බව සිතන්න. කිළිටි හෙවත් කෙලෙස් දුරු කිරීමෙන් පමණයි කෙනකු රහත් බව ලබන්නේ."

බුදුරජාණන් වහන්සේ ගේ සන්දේශය මැනවින් ග්‍රහණය කරගත් චුල්ලපන්ථක හිමියෝ රහත් ඵලය ලබා ගත් හ.

ජීවක වෙදැදුරාණන් ගේ නිවසෙහි දානමය පුණ්‍ය කර්මය ආරම්භ කිරීම පිණිස ආහාර පිළිගන්වන්නට සැරසෙත් ම භාග්‍යවතුන් වහන්සේ ආරාමයෙහි තව භික්ෂූන් වහන්සේලා සිටිත්දැයි විමසූ හ. කිසිවකු නැතැයි පිළිතුරු ලැබුණ ද එය නො පිළිගත් භාග්‍යවතුන් වහන්සේ තව එක් නමක් සිටින බව පවසමින් එක් තැනැත්තෙකු අමතා "ඔබ ගොස් චුල්ලපන්ථක හිමියන් කැඳවාගෙන එන්න" යි උපදෙස් දුන්හ. පණිවුඩකරු ආපසු පැමිණියේ විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේ දහස් නමක් වැඩ හිඳින බව කියමිනි. ඒ හැම දෙන චුල්ලපන්ථක හිමියන් විසින් මවන ලද්දේ ය. "චුල්ලපන්ථක හිමි පමණක් කැඳවා ගෙන එන්න" යි දෙවන වර යවන ලදුව ඔහු ආපසු ආයේ, "හැම දෙන ම මම චුල්ලපන්ථකයැයි පැවසූහ" යි කියමිනි. "මුලින්ම මම චුල්ලපන්ථක යැයි කියන භික්ෂුනම ගේ අතින් අල්ලා ගන්න" යි ඔහුට භාග්‍යවතුන් වහන්සේ උපදෙස් දුන් හ. ඔහු එසේ කළ විට අනිත් පිරිස අතුරුදහන් වූ හ. චුල්ලපන්ථක හිමියෝ ඔහු සමග ජීවක මැදුරට පැමිණිය හ. දානය වළඳා නිම වූ පසු බුදුරජාණන් වහන්සේ භුක්තානුමෝදන බණ දෙසුම උන්වහන්සේට පැවරූ හ. සිංහනාදයක් පවත්වන්නා සේ මධුර ස්වරයෙන් හා නිරාකූලව චුල්ලපන්ථක හිමියෝ රම්‍ය වූ ධර්ම දේශනයක් කළ හ.

### විවරණාත්මක අනුවාදය (25 ගාථාව)

**උට්ඨානෙන අප්පමාදෙන සඤ්ඤමෙන දමෙන ච මෙධාවී දීපං කයිරාථ යං ඔඝො න අභිකීරති.**

**උට්ඨානෙන**: උත්සාහයෙන්; **අප්පමාදෙන**: අප්‍රමාදයෙන්; **සඤ්ඤමෙන**: සංයමයෙන්; **දමෙන**: දමනයෙන්; **ච**: ද; **මෙධාවී**: නුවණැත්තා; **දීපං**: දිවයිනක්; **කයිරාථ**: නිර්මාණය කර ගන්නේ ය; **යං**: යම් (දිවයිනක්); **ඔඝො**: සැඩ පහරින්; **න අභිකීරති**: යට නො වන්නේ ද (එවැනි දිවයිනක් තනා ගනියි).

නුවණැති තැනැත්තා උත්සාහයෙන්, අප්‍රමාදයෙන්, සංයමයෙන් හා ඉන්ද්‍රිය දමනයෙන් සැඩ පහරට හසු නොවන දිවයිනක් තනා ගනියි.

### විවරණය

**මෙධාවී**: යන්නෙන් ප්‍රඥාවන්තයා අදහස් වෙයි. සංස්කාර ධර්මයන් ගේ අනිත්‍ය, දුක්ඛ හා අනාත්ම ලක්ෂණ දක්නා විදර්ශනා ඥානය 'මේධා' නම් වන බව අටුවාවෙහි දැක්වෙයි.

**දීපං**: යන්න පහන යන අර්ථය ද ඇති පදයක් වුව ද මෙහි දී මෙන්ම අත්ත දීපා විහරථ යන මහා පරිනිබ්බාණ සුත්ත පාඨයෙහි ද යෙදී ඇත්තේ දිවයින යන අර්ථයෙන් ය. කාම, දිට්ඨි, භව හා අවිජ්ජා යන මහ ගංවතුරු වලින් හානියක් නො වන පරිද්දෙන් මේ දිවයින නිර්මාණය කර ගත යුතුය.





*බාල වූ අනුවණ ජනයන් ප්‍රමාදයෙහි යෙදී වෙසෙන අතර, නුවණැත්තා නොපමා ගුණය මාහැගි දනයක් සේ රකී.*

26. පමාදමනුයුඤ්ජන්ති
බාලා දුම්මෙධිනො ජනා
අප්පමාදඤ්ච මෙධාවී
ධනං සෙට්ඨං'ව රක්ඛති (2:6)

නුවණ මඳ අමන දන
පමා වෙති තතු නො දැන
නොපමාව නැණැති දන
රකිති ලෙස මහඟු දන

# සම්පතක් වේ අප්‍රමාදය

## 2 (4) බාල නක්ඛත්ත උත්සවයේ විත්තිය (26 සහ 27 ගාථා)

ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි නුවණ මඳ පොදු ජනතාව අතර ජනප්‍රිය වූ එක් නැකැත් කෙළියක් ඇරබ භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ හ.

එසමයෙහි එක් දිනක් මේ නැකැත් උත්සවය සැවැත් නුවර වැසියන් විසින් සංවිධානය කරන ලදී. මේ උත්සවයෙහි විශේෂාංගයක් වූයේ මිනිසුන් තම සිරුරු අළු හා ගොම වලින් තවරා ගෙන විවිධ අසභ්‍ය වචන අඩංගු විහිළු තහළු කරමින් ගෙයක් පාසා යාම ය. මොවුන් පැමිණි විට නිවැසියන් ඔවුනට මුදල් දිය යුතු ය. විහිළු තහළු අසභ්‍ය හෙයින් පැමිණෙන විට ම මුදලක් දී හරවා යැවීම විනීතයන් ගේ සිරිතයි. උත්සවය දින හතක් පැවැත්වෙයි.

මෙය එක් විදියක 'අවිනීත සමයක්' හෙයින් වැඩිහිටියන්, පැවිද්දන්, මිතුරන්, නෑදෑයන් ආදී විශේෂයක් නො තකා අසභ්‍ය විහිළු කිරීම සිරිත ය. එකල සැවැත් නුවර බෞද්ධයෝ පන් කෝටියක් පමණ විසූහයි කියති. ඔවුහු මේ උත්සව සමයෙහි විනෝදවන අඥාන ජනයා ගෙන් භාග්‍යවතුන් වහන්සේට හෝ භික්ෂු සංඝයාට අවමන් වනු නො රිසිව මෙසේ ආරාධනා කළහ.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේත් සියළු ම භික්ෂු සංඝයා වහන්සේත් ආරාමයෙන් පිටතට වැඩම නො කර ආරාමය තුළ ම වැඩ හිඳින සේක්වා. මේ දින හත අපි දාන මානාදිය සකසා විහාරයට ම එවමු. අපිත් පිටත සැරි සැරීමෙන් තොරව අපේ නිවෙස් තුළ ම කල් ගත කරමු" මෙසේ ඇරයුම් කළ ඔවුහු ඒ සතිය මහත් අපහසුවෙන් ගෙවා ගත් හ.

අටවන දින සියලු සැණකෙළි නිම වූ පසු සැදැහැවත්හු එක්ව බුදුපාමොක් මහ සඟගණ නුවරට වඩමවා, මහ දන් පවත්වා විවිධ පූජෝපහාර පැවැත්වූ හ. අනතුරුව එකත් පසෙක හිඳ "ස්වාමීනි, මේ සත් දවස ඉතා අපහසුවෙන් ගෙවා ගත්තෙමු. ඒ අසභ්‍ය කථා බහ කන් වලට යහුල් වලින් අනින්නා වැනි විය. ඔබ වහන්සේලාට ආරාමයටම වී සිටින්නැයි අප ඇරයුම් කළේ ඒ නිසා ය"යි පැවසූ හ. ඒ අසා සිටි භාග්‍යවතුන් වහන්සේ "අඥානයන් මෙසේ තම කාලය වැරදි ලෙස භාවිත කරමින් හැසුරුණත් නුවණැත්තෝ අප්‍රමාදීව ක්‍රියා කොට සසර දුක් කෙළවර කර ගනිති" යි වදාරා මේ ගාථාව ද දේශනා කළ හ.

### විවරණාත්මක අනුවාදය (26 ගාථාව)

**බාලා දුම්මේධිනො ජනා පමාදං අනුයුඤ්ජන්ති මේධාවී ච අප්පමාදං සෙට්ඨං ධනං ඉව රක්ඛති.**

**බාලා**: සාරධර්ම නොදත්; **දුම්මේධිනො**: නුවණ මඳ; **ජනා**: මිනිස්සු; **පමාදං**: ප්‍රමාදී හැසිරීම් වල; **අනුයුඤ්ජන්ති**: යෙදෙති; **මේධාවී ච**: නුවණැත්තා නම්; **අප්පමාදං**: අප්‍රමාදය; **සෙට්ඨං**: ශ්‍රේෂ්ඨ; **ධනං ඉව**: ධනයක් මෙන්; **රක්ඛති**: රැක ගනියි.

නුවණ නැති, සාරධර්ම නො හඳුනන පුද්ගලයෝ අර්ථ ශූන්‍ය විනාශකාරී හැසිරීම් වල යෙදෙති. එහෙත් නුවණැත්තෝ අප්‍රමාදය උතුම් ධනයක් මෙන් සුරකිති. (නාස්තිකාරී ක්‍රියාවල නො යෙදෙති)

### විවරණය

**බාලා**: නමින් ජන කොටසක් නිතර ම පාහේ බෞද්ධ දේශනාවල වගී කරනු ලැබේ. මේ නම්, අනුවණ, නූගත්, නො පැසුණු පුද්ගලයෝ ය. මෙයින් ඔවුන් ගේ ශිල්ප කලා නෛපුණ්‍යයෙහි අඩු පාඩුකම් ගැන කියැවෙතැයි නො සිතිය යුතු ය. යථාර්ථාවබෝධය අතින් හෙවත් විදග්ධභාවය ඔවුන් දුර්වල බව මෙයින් හැඟවෙයි. ලෝකස්වභාවය ගැන අවබෝධය අඩු මෙවැන්නෝ බොළඳ, නොමේරූ හැසිරීම් වල යෙදෙති. ඔවුහු පස්කම් සැපයෙහි ම ගැලෙමින් කාමසුඛල්ලිකානුයෝගය ම ප්‍රිය කරමින් ජීවත් වෙති. ගුණ දම් වැඩීමක් හෝ ගැඹුරු දාර්ශනික යථාර්ථයක් තේරුම් ගැනීමේ වෑයමක් නො දරති. ඔවුහු තමන්ට මෙලොවට හා පරලොවට හිතකර දේ කවරේදැයි තේරුම් ගන්නට අසමත් වෙති.

**පමාදං අනුයුඤ්ජන්ති**: යන්නෙහි 'පමාද' හෙවත් ප්‍රමාදය නම් මත් වීමයි. ගැඹුරට සිතන්නට ශක්තිය නැත්තෝ චිත්තවේග මගින් මුළාකරන ලදුව මත් වෙති. සිය ආවේග පාලනය කර ගන්නට අසමත් වෙති. 'මේ නො වැඩුණු ආවේග තත්ත්වය' එක්තරා විදියක නියුරෝසියාවකැයි කීමේ වරදක් නැත.

**සෙට්ඨං ධනං ඉව**: යන්න අගනා ධනයක් මෙන් තම සිහි නුවණ, විචක්ෂණ චින්තනය රැක ගත යුතු යැයි අවධාරණය කරනු වස් දක්වන ලදී. පැරණි පොත් වල ඉතාම අගනා ධන සප්තකය ලෙස රන්, රිදී, මුතු, මැණික්, වෛරෝඩි, විදුරු, පබලු යන හත දැක්වෙයි. බුරුමයේ ඡට්ඨ සංගායනාවෙන් අනුමත ත්‍රිපිටකයෙහි මෙම පාඨය ධනං සෙට්ඨංව සේ දැක්වෙයි. ඇතැම් පැරණි සංස්කරණවල එසේ ම ආයේ ය. එවිට අර්ථය-"සිටුවරයකු ධනය රකින්නාක් මෙන්" ලෙස ගත යුතු ය.



*කම් සුවයෙහි යෙදීම් හැර නොපමාව ධ්‍යාන භාවනා කරන තැනැත්තා විපුලවූ අමා සුව ලබයි.*

27. මා පමාදමනුයුඤ්ජෙථ
මා කාමරතිසන්ථවං
අප්පමත්තො හි ඣායන්තො
පප්පොති විපුලං සුඛං (2:7)

නො ඇලී පමාවෙහි
නො ගැලී කාම සුවයෙහි
නො පමාව බවුන් වඩමින්
පැමිණෙති උතුම් සුවයට

# වැඩුවොත් බවුන් - ලද හැක උතුම් නිවන්

## 2 (4) බාල නක්ඛත්ත උත්සවයේ පුවත (26 සහ 27 ගාථා) (ඉතිරි කොටස)

### විවරණාත්මක අනුවාදය (27 ගාථාව)

**පමාදං මා අනුයුඤ්ජෙථ කාමරතිසන්ථවං මා (අනුයුඤ්ජෙථ) අප්පමත්තො ඣායන්තො හි විපුලං සුඛං පප්පොති.**

**පමාදං**: ප්‍රමාදයෙහි; **මා අනුයුඤ්ජෙථ**: නො යෙදෙන්න; **කාමරතිසන්ථවං**: කාමාස්වාදයෙහි; **මා (අනුයුඤ්ජෙථ)**: නො යෙදෙන්න; **අප්පමත්තො**: අප්‍රමාදීව; **ඣායන්තො**: ධ්‍යාන වඩන්නා; **හි**: ඒකාන්තයෙන් ම; **විපුලං සුඛං**: ශ්‍රේෂ්ඨ වූ සැපතට; **පප්පොති**: පැමිණෙයි.

පමා නොවන්න. කාමාස්වාදයෙහි නො ගැලී අප්‍රමාදව භාවනා කරන පුද්ගලයා ඉමහත් සුව ලබා ගනියි.

### විවරණය

**කාමරති සන්ථවය**: නම් කම් සුව විඳීමෙහි යෙදීම ය. කාමාස්වාදයෙහි ගැලී සිටින විට මනස කැළඹෙයි. සහනයක් නො ලබයි. සත්‍ය ගවේෂණයෙහි ලා උද්‍යෝගයක් ඇති නො වේ. කම් සැපට ගිජුවන පුද්ගලයා බන්ධනයට හසුවෙයි. කාමය පිපාසයක් වැනිය. කාමයෙන් පිපාසිතව කාමයෙන් දැවෙන පුද්ගලයෝ දිගින් දිගට ම සසර දුක් විඳිති. බෞද්ධ විග්‍රහයට අනුව කුඩා පෞද්ගලික ගැටුම් වල පටන් ලෝක යුද්ධ දක්වා සියළු කලි කලහ පසු පස ඇත්තේ තෘෂ්ණාව ය. රට්ඨපාල සූත්‍රයෙහි දැක්වෙන්නේ මෙසේ ලෝකයා නිතරම අඩු පාඩු කම් ගැන ම සිතමින් අතෘප්තියෙන් පීඩා විඳිමින් තෘෂ්ණාවට දාසව සිටින බව ය.

කාමය වස්තු කාම හා ක්ලෙශ කාම වශයෙන් දෙවැදෑරුම් ය. අපේ සිත් ඇදගන්නා රම්‍ය වස්තු වස්තු කාම වශයෙන් හැඳින් වේ. ඒවායෙහි රම්‍ය භාවය පඤ්චේන්ද්‍රිය මගින් අපි ආස්වාදනය කරමු. මෙම කාම වස්තූන් විෂයෙහි ඇතිවන දැඩි ඇල්ම, කැමැත්ත, ග්‍රහණය ක්ලෙශ කාම නම් වෙයි. ක්ලේශ කාමය විසින් වස්තු කාමය ප්‍රාර්ථනය කරනු ලැබේ.

මෙබඳු කාම වස්තූන් කෙරේ ඇති ආශාව කාමරතියයි. කාම රතිය හා සමග ම බැඳී පැවැත්ම සඳහා වන ආශාව ද වෙයි. කාමච්ඡන්ද නමින් හැඳින්වෙන්නේ ද රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන දේ කෙරේ ඇති ආශාවයි. සාමාන්‍ය පෘථග්ජනයෝ මේවාට ආශක්ත වෙති. කාමාශාව අඩු කිරීම පිණිස උපස්ථම්භක වන කරුණු හයකි.

1. කාම වස්තූන් ගේ අසුභ ස්වභාවය මෙනෙහි කිරීම.
2. පිළිකුල් භාවනාව නිතර නිතර වැඩීම.
3. ඉන්ද්‍රිය දමනය.
4. භෝජනයෙහි පමණ දැනීම.
5. කළ්‍යාණ මිත්‍ර සේවනය.
6. ප්‍රයෝජනවත් කතා බහ.

ෂඩින්ද්‍රිය හා සම්බන්ධ වූ කාමාශාව හෙවත් තෘෂ්ණාව ෂඩ්විධ තෘෂ්ණාව ලෙස හැඳින් වේ. මේ හය බාහිර හා ආධ්‍යාත්මික වශයෙන් ගත් විට දොළොස් වැදෑරුම් වේ. එම දොළස අතීත, වර්තමාන හා අනාගත යන කාල තුනට යෙදූ විට 36 ක් වෙයි. මේවා කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා වශයෙන් ත්‍රිවිධ වූ විට 108 ක් බවට පත් වේ.

භව චක්‍රයෙහි ඉතා වැදගත් සන්ධිස්ථාන වන්නේ අවිද්‍යා හා තෘෂ්ණාවයි. අවිද්‍යාව අතීත හේතුවක් සේ ද තෘෂ්ණාව වර්තමාන හේතුවක් සේ ද දක්වා ඇත. සත්ත්වයා පුනර්භව වශයෙන් දිගින් දිගට සසරේ දුක් විඳින්නේ මේ හේතුවෙනි. එහෙයින් මෙම අවිද්‍යාව හා තෘෂ්ණාව මූලෝත්පාඨනය කිරීම මගින් සංසාර දුක්ඛයෙන් මිදී විමුක්තිය සාධනය කරගත හැකි ය.

**මාපමාදමනුයුඤ්ජෙථ**: යන අවවාදය සත්‍යාවබෝධය අපේක්ෂා කරන්නවුන් සඳහා කෙරෙන අවවාදයකි. විමුක්තිය ප්‍රාර්ථනා කරන්නේ නම් මොහොතකටවත් උට්ඨාන වීර්‍ය්‍යය ලිහිල් නො කළ යුතු ය. එමෙන් ම පෘථග්ජන ස්වභාවය වර්ධනය කරන සුළුපැවතුම් වර්ජනය කළ යුතු ය. බැඳීම් විමුක්තියට ඇති මහා බාධාවකි.





*සෝකය දුරු කළ තැනැත්තා පව්වක සිටියකු බිම සිටිනවුන් දක්නා සේ, සෝකයෙන් පෙළෙන සත්කැල දකියි.*

28. පමාදං අප්පමාදෙන
යදා නුදති පණ්ඩිතො
පඤ්ඤාපාසාදමාරුය්හ
අසොකො සොකිනිං පජං
පබ්බතට්ඨො'ව භුම්මට්ඨෙ
ධීරො බාලෙ අවෙක්ඛති (2:8)

අප්‍රමාදය වහල් කර ගෙන
ප්‍රමාදය පරදවන පඬි දන
නුවණ ප්‍රාසාදයට නගිමින
දුරැර සෝකය සෝක වන දන
කඳු මුදුන සිට පහල නරඹන
විලස නරඹයි දනන් අනුවණ

# දුරැර තම සෝකය - බලයි සෝකී ලෝකය

## 2 (5) මහා කස්සප හිමියන් ගේ වස්තුව (28 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි **මහාකාශ්‍යප මහ රහතන් වහන්සේ** නිමිති කොට මේ ගාථාව වදාළ සේක.

එක් දිනක් පිප්පලි ගුහාවෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ අළුයම පිබිද අද ම විසින් කාහට අනුග්‍රහ දැක්විය යුතු දැයි මහා කරුණා සමාපත්තියෙන් ලොව බලා වදාළ සේක. දුප්පත්, පොහොසත් භේදයක් නැතිව ගොඩ බිම-ජලාශය යැයි වෙනසක් නැතිව සමස්ත ලෝ තලයම පීරා බලන භාග්‍යවතුන් වහන්සේ ගේ කරුණා ජාලයට මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ලක් වූහ.

මහ කසුප් තෙරණුවෝ ඒ මොහොතේ සත්ත්වයන් ගේ චුති-උත්පත්ති විමසමින් උන් හ. ලෝකයේ විවිධ සත්ත්වයන් උපදිනු, මියයනු, නැවත උපදිනු උන්වහන්සේ ගේ දිවැසට ලක් විය. මෙසේ දිවැසින් විවිධ සත්ත්වයන් ඉපැදෙන-මැරෙන විලාසය නිරීක්ෂණය කරමින් උන් මහා කාශ්‍යප මහා ස්ථවිරයන් වහන්සේ දුටු භාග්‍යවතුන් වහන්සේ එම ක්‍රියාව මහා ශ්‍රාවක නමකට අනුරූප නොවන බව පසක් කළ හ. අචින්ත්‍ය වූ සත්ත්ව විෂය ගෝචර වන්නේ බුදු කෙනෙකුන්ට ම පමනි. එහෙයින් මහ කසුප් තෙරුන් එම කාර්‍යයෙන් වළකා ලනු රිසි වූ භාග්‍යවතුන් වහන්සේ මහා කාශ්‍යප හිමියන් අමතා "කාශ්‍යපයෙනි, සත්ත්වයන් ගේ චුති-උත්පත්ති පිළිබඳ පූර්ණ වශයෙන් පසිඳ දැනීම ඔබට කළ නො හැක්කේ ය. ජීවත්වන සත්ත්වයෝ මිය ගොස් මාතෘ කුසයක ප්‍රතිසන්ධි ගනිති. ඒ පිළිබඳව මව හෝ පියා පවා නො දනියි. සමහරු මවුපියන් නො දැනම මිය යති. එබඳු සත්ත්වයන් ගේ ගණනක් මිම්මක් නම් නැත්තේ ය. එය ඔබ ගේ විෂය පථය ඉක්මවා සිටියි. ඔබ ගේ විෂය පථය සීමිත ය. සත්ත්වයන් ගේ චුති-උත්පත්ති නිරීක්ෂණය බුදුවරයකු විසින්ම කළ හැකි වන්නේ ය. ඔබ වැන්නකු විසින් කළ නො හැක්කේ ය"යි පැහැදිලි කළ සේක.

අනතුරුව මේ කාරණය සම්බන්ධයෙන් භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කර වදාළ සේක.

### විවරණාත්මක අනුවාදය (28 ගාථාව)

**පණ්ඩිතො යදා අප්පමාදෙන පමාදං නුදති ධීරො**
**පඤ්ඤාපාසාදං ආරුය්හ අසොකො සොකිනිං පජං**
**පබ්බතට්ඨො භූම්මට්ඨෙ ඉව බාලෙ අවෙක්ඛති.**

**පණ්ඩිතො**: ඥානවන්තයා; **යදා** යම් කලෙක; **අප්පමාදෙන**: අප්‍රමාදයෙන්; **පමාදං**: ප්‍රමාදය; **නුදති**: දුරු කරයි ද; **ධීරො**: නැණවතා; **පඤ්ඤාපාසාදං**: ප්‍රඥා ප්‍රාසාදයට; **ආරුය්හ**: නැගී; **අසොකො**: ශෝක දුරු කළේ; **සොකිනිං**: ශෝක කරන; **පජං**: ප්‍රජාව දෙස; **පබ්බතට්ඨො**: පර්වතයක මුදුනට නැග ගත් අයෙක්; **ඉව**: මෙන්, **භූම්මට්ඨෙ**: පහළ සිටින්නවුන්; **බාලෙ**: බාලයන් දෙස; **අවෙක්ඛති**: බලයි;

අප්‍රමාදයෙන් ප්‍රමාදය දුරු කළ නුවණැත්තා ප්‍රඥාව නම් ප්‍රාසාදයට නැගී, පර්වතයක් මුදුනට නැග ගත්තෙක් පර්වත පාමුල සිටින ජනයා දෙස බලන්නාක් මෙන්, තමා ශෝක දුරු කර, ශෝක කරන ප්‍රජාව දෙස බලයි.

### විවරණය

**සොකිනිං පජං**: යන්නෙන් මෙහි දී සමස්ත සත්ත්ව ලෝකය ම ගැනේ. අවිද්‍යාව හා තෘෂ්ණාව මූලෝත්පාධනය නො කළ හේතුවෙන් සසර ඉපදී මැරෙමින් දුක් විඳින සමස්ත ප්‍රජාව සෝකිනිං පජං ලෙස හැඳින්වේ. සත්ත්වයාට සංසාරයේ දී සැප සම්පත් විඳ ගැනීමේ අවස්ථාව ලැබෙන නමුත් සැප සම්පත් තාවකාලික හෙයින් ද සැප සම්පතින් ලබන ආස්වාදය කෙටි කාලීන හෙයින් ද ඒවා ද ශෝකයට ම හේතු වෙයි. ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස ආදිය නිසා සත්ත්වයෝ නිරන්තරයෙන් ම ශෝක කරති.

**අසොකො** නමින් මෙම ශෝකී ප්‍රජාව විඳගන්නා විවිධ දුක්ඛ දෝමනස්සයන් ගෙන් තොර වූ ප්‍රාඥයා අදහස් වෙයි. අභිඥා ලාභී මහ රහතන් වහන්සේලාට ශෝකයෙන් තොරව සත්ත්වයන් දෙස බැලීමේ ශක්තිය ලැබේ.

පණ්ඩිතයා හෙවත් විචක්ෂණ නුවණින් සමන්විත පුද්ගලයා කිසි ම ලෞකික සම්පත්තියකින් මත් නො වී කුසල් දම් වඩා සසර බැම් සිඳ විමුක්ති ප්‍රතිලාභී වූ විට සියළු දුකින් මිදී සතුටට පත් වෙයි. එසේ වූ විට ඔහු පර්වතයක හෝ ප්‍රාසාදයක මුදුණේ සිටින්නකු මෙනි. ඔහු ලබා ඇති ප්‍රඥාව නො ලත් සාමාන්‍ය පෘථග්ජනයෝ පර්වත පාදයක සිටින්නෝ වැන්නෝ ය. විමුක්තිය ලැබ ගත් තැනැත්තා මහත් අනුකම්පාවෙන් ඔවුන් දෙස බලයි.

සත්ත්වයන් විඳින දුක් පිළිබඳ පූර්ණ විග්‍රහයක් වූ දුක්ඛ සත්‍යයෙහි කාටත් පොදුවේ වැටහෙන කායික මානසික දුක් මෙන් ම සියුම් ලෝක ස්වභාවය ගැන ද අන්තර්ගතය. පොදුවේ කවුරුත් දන්නා පැහැදිලි දුක්, දුක්ඛ, දුක්ඛෙ නමින් හැඳින්වේ. බොහෝ පෘථග්ජනයන් දුක යැයි හඳුන්වන්නේ එපමණකි. එහෙත් දුක්ඛ සත්‍යය නම් එයින් එහාටත් විහිදුණකි. සියළු සැප වේදනාවන් දුක් බවට පරිවර්තනය වෙතැයි තේරුම් ගැනීම පහසු නැත. එහෙයින් එය තේරුම් ගැනීම විපරිණාම දුක්ඛ වශයෙන් හැඳින්වෙයි. ඊටත් වඩා ගැඹුරු හා අවබෝධය දුෂ්කර තත්ත්වය සංඛාර දුක්ඛ නමින් හැඳින්වෙයි. සමස්ත සංස්කාර ධර්ම සමූහය ම පටිච්ච සමුප්පන්න වූ, ස්ව-භාවයකින් තොර වූ (ස්වාධීන පැවැත්මක් නැත්තා වූ) දේ බව වටහා ගැනීම දුක්ඛ සත්‍යාවබෝධයට තුඩු දෙයි. මෙම උසස් මට්ටම 'සංඛාර දුක්ඛ' අවබෝධය ලෙස දැක්වේ.





*නො පමාව නිදිවරා බවුන් වඩන උතුම් නුවණැත්තා වහා නිවන් පසක් කරන්නේ ය.*

29. අප්පමත්තො පමත්තෙසු
සුත්තෙසු බහු ජාගරො
අබලස්සං'ව සීඝස්සො
හිත්වා යාති සුමෙධසො (2:9)

පමාවූවන් අතර - නො පමාව වසමින්
නිදා සිටිනවුන් මැද - අවදියෙන් පසුවෙමින්
අබල අසු පරදමින් - පෙරට යන වේගවත්
අසෙකු මෙන් පෙරට යයි - නුවණ ඇති දන මහත්

# නො පමා දන - යති පෙරමුණ

## 2 (6) යහළු දෙනමක ගේ පුවතක් (29 ගාථාව)

බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසමින් මිතුරු **දෙනමක්** නිමිති කරගෙන මේ ගාථාව වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ ගෙන් භාවනා කර්මස්ථාන ලබා ගත් මේ දෙනම භාවනා පිණිස ආරණ්‍යයට ගිය හ. ඒ දෙනමගෙන් එක් නමක් දවල් දවසෙහි දර එක් රැස්කර රාත්‍රියෙහි ප්‍රථම යාමයෙහි දී ගිනි ගොඩක් ගසයි. ඒ වටා වාඩි වී සාමණේරවරුන් සමග ඕපාදූප-ප්‍රලාප කතා බහෙහි මැදියම් රැය වන තුරු කල් යවයි. අනිත් හිමි නම මුල් යාමය භාවනාවෙන් ගත කරයි. තම මිතුරු හිමි නම ප්‍රමාදයෙන් කල් යවනු දුටු භාවනා කරන හිමි නම "අප වනගත වූයේ බුදුරදුන් වෙතින් කර්මස්ථාන ලබා ගෙන හෙයින් කථා බහින් කල් යැවීම අනුචිත ය. එහෙයින් පමා නො වී භාවනාවෙහි නිරත වන්නැ"යි අවවාද කළ හ. එහෙත් ඒ නොතකා ප්‍රමාදී භික්ෂුව තම චාරිත්‍රය එසේම කරගෙන ගියේ ය. අප්‍රමාදී භික්ෂුව ද අවවාද පිළි නො ගන්නා මොහුට අවවාද කර කුමට වෙහෙසෙම් දැයි සිතා තමන් ගේ සුපුරුදු භාවනාවෙහි යෙදෙයි.

රාත්‍රි ප්‍රථම යාමය භාවනාවෙන් කල් ගෙවන අප්‍රමාදී හිමි නම මැදියම් යාමයෙහි නින්දට යයි. ඒ දැක ප්‍රමාදී භික්ෂුව "වනගත වූයේ නිදන්නට නො වේ. ඔබ කමටහන් ලැබ අවුත් ප්‍රමාදීව වාසය කරනවා නො වේදැ"යි. භාවනා යෝගී භික්ෂුවට චෝදනා කරමින් සිය කුටියට වැදී දොර වසා ගෙන නිදයි. අප්‍රමාදී භික්ෂුව රාත්‍රි මධ්‍යම යාමය පමණක් නිදා අලුයම් යාමයෙහි නැගී භාවනා කරයි. මේ අප්‍රමාදී චර්යාව හේතුවෙන් උන්වහන්සේ ඉතා සුළු කලකින් ම රහත් ඵලය ලබා ගත් හ. ප්‍රමාදී හිමි නම මුළු වස් කාලය ම ගිනි තපිමින් ඕපාදූප දොඩවමින් ගත කළේ ය. වස් කාලය නිම කළ දෙනම භාග්‍යවතුන් වහන්සේ බැහැ දැකීම පිණිස දෙව්රමට පැමිණිය හ.

"මහණෙනි, ඔබ දෙදෙනා ම තම ආරණ්‍ය වාසය අප්‍රමාද විහරණයෙන් සාර්ථක කර ගෙන හොඳ ප්‍රතිඵල ලබා පැමිණියේ යැයි සිතමි"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ හ. එවිට ප්‍රමාදී භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ අමතමින් "ස්වාමීනි, මේ භික්ෂුව අප්‍රමාද විහරණයෙන් වස් කාලය ගත කරන්නේ කෙසේ ද? ආරණ්‍යයට ගිය දා පටන් ම හේ නිදා ගැනීම හැර වෙන යමක් නො කළේ ය"යි පැවසී ය. "ඔබ කල් ගත කළේ කෙසේ ද?"

"ස්වාමීනි, මම දවල් දවසේ දර කඩා එක් රැස් කළෙමි. ප්‍රථම යාමය ගිනි දල්වා මා උණුසුම් කර ගතිමි. ප්‍රථම යාමයෙහි නො නිදාම අවදියෙන් සිටියෙමි."

"මහණ, ඔබේ කාලය ඔබ ප්‍රමාද විහරණයෙන් ගත කර ඇත. ඔබ කාලය නාස්ති කර පමාව සිට 'මම අප්‍රමාදීව කාලය ගත කළෙමි' යි කියයි. ඔබ ප්‍රමාදය අප්‍රමාදය ලෙසත්, අප්‍රමාදය ප්‍රමාදය ලෙසත් පටලවා ගෙන ඇත. ඔබ සමග සසඳන විට මපුතු දුබල අසකු පරදවා පෙරට යන ප්‍රබල අශ්වයකු මෙන් ඉදිරියට ගොස් ඇත." යි වදාළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළ හ.

**විවරණාත්මක අනුවාදය (29 ගාථාව)**

**පමත්තෙසු අප්පමත්තො සුත්තෙසු බහුජාගරො**
**සුමෙධසො සීඝස්සො අබලස්සං ඉව හිත්වා යාති.**

**පමත්තෙසු**: ප්‍රමාදවන්නවුන් අතර; **අප්පමත්තො**: අප්‍රමාදී වන; **සුත්තෙසු**: නිදන්නවුන් අතර; **බහු ජාගරො**: වැඩිපුර අවදියෙන් සිටින; **සුමෙධසො**: ප්‍රඥාවන්තයා; **සීඝස්සො**: ජවාධික අශ්වයෙක්; **අබලස්සං ඉව**: දුබල අශ්වයකු මෙන්; **හිත්වා**: පසු කරමින්; **යාති**: ඉදිරියට යයි.

අන් අය ප්‍රමාද බහුලව නිතර නිදමින් කල් ගත කරන විට අප්‍රමාදීව, වැඩිපුර අවදියෙන් සිටින අතිශය ඥානවන්ත පුද්ගලයා දුර්වල අශ්වයකු පරදවා ඉදිරියට යන දක්ෂ අශ්වයකු මෙන් ඉදිරියට යයි.

**විවරණය**

මේ ගාථාවෙන් ප්‍රමාද නො වී නින්ද අඩුකර අවංකව භාවනා වඩන භික්ෂුව ප්‍රමාදී, නිද්‍රාපරවශ භික්ෂුව අබිබවා පෙරට යන අයුරු දැක්විණ. ඒ සඳහා යොදා ගත් උපමාව සිත් ගන්නා සුළු ය. දුබල අශ්වයකුට කිසි කලෙක ප්‍රබල අශ්වයකු පරදවා ධාවන තරඟයෙන් ජය ගත නො හැක. එසේ ම වීර්යාධික අප්‍රමාදී පුද්ගලයා පරදවන්නට ප්‍රමාදී පුද්ගලයා සමත් නො වෙයි.





*අප්‍රමාද ගුණය රැකීම හේතුකොටගෙන මඝ නම් තරුණයා සක්දෙව් රජය ලැබීය.*

30. අප්පමාදෙන මඝවා
දෙවානං සෙට්ඨතං ගතො
අප්පමාදං පසංසන්ති
පමාදො ගරහිතො සදා (2:10)

අප්‍රමාදයෙන් මඝ තෙම
ලැබුවා සක් දෙව් පදවිය
අප්‍රමාදය ම පසසත්
පමාව හැමදා ගරහත්

# වැඩුවෙන් අප්‍රමාදය - හිමි විය ශක්‍ර පදවිය
## 2 (7) මඝ මානවක වෘත්තාන්තය (30 ගාථාව)

බුදු පියාණන් වහන්සේ විශාලා මහ නුවර කූටාගාර ශාලාවෙහි වැඩ වාසය කරන සේක් දෙවියන් ගේ අධිපති වූ **ශක්‍ර දේවේන්ද්‍රයා** අරමුණු කර ගෙන මේ ගාථාව දේශනා කළ සේක.

භාග්‍යවතුන් වහන්සේ සක්ක පඤ්හ සූත්‍රය දේශනා කළ බව ආරංචි වූ මහාලි නම් ලිච්ඡවි කුමාරයෙක් මෙසේ සිතී ය. "ශක්‍රයා ගේ ආශ්චර්යය භාග්‍යවතුන් වහන්සේ විසින් විස්තර කර ඇත. එහෙත් ඇත්තෙන් ම භාග්‍යවතුන් වහන්සේ ශක්‍රයා දැක තිබේ ද? උන්වහන්සේ ශක්‍රයා සමග කතා බහ කර තිබේ ද? නැතහොත් උන්වහන්සේ තමන් නුදුටු ශක්‍රයෙක් ගැන වර්ණනා කරනවා ද? මම උන්වහන්සේ හමු වී මෙහි ඇත්ත නැත්ත පැහැදිලි කර ගනිමි".

මෙසේ සිතා භාග්‍යවතුන් වහන්සේ හමුවට ගිය හෙතෙම උන්වහන්සේට වැඳ එකත්පස්ව සිට උන්වහන්සේ සමඟ පිළිසඳර කතා නිමවා "භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ ශක්‍ර දේවේන්ද්‍රයා දැක තිබේ ද?"යි විමසූ හ.

"එසේ ය මහාලි, මම ශක්‍ර දේවේන්ද්‍රයා දැක ඇත්තෙමි." "භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ දකින්නට ඇත්තේ ශක්‍ර දේවේන්ද්‍රයා වැනි වෙන කෙනෙකි. ශක්‍ර දේවේන්ද්‍රයා දැක ගැනීම ඉතා ම දුෂ්කර කරුණකි." "නෑ මහාලි, මම ශක්‍රයා හොඳින් දනිමි. ඔහු ශක්‍ර පදවිය ලද්දේ කවර ගුණ පිරීමෙන් ද යන්නත් මම දනිමි"යි පැවසූ භාග්‍යවතුන් වහන්සේ ශක්‍රයා ගේ උත්පත්ති කථාව මහාලිට පැහැදිලි කර දුන් හ.

"මහාලි, එක් පූර්වාත්මභාවයෙක ශක්‍ර දේවේන්ද්‍ර තෙම මනු ලොව ඉපිද සිටියේ ය. එකල ඔහු ගේ නම මඝ නම් විය. ඒ නිසා ඔහුට අද 'මඝවා' යයි ද කියති. හෙතෙම නුවරක් නුවරක් පාසා දන්සැල් සකස් කරවා දන් දුන්නේය. එහෙයින් ඔහුට 'පුරින්දද'යි කියති. ඔහු දන් දුන්නේ මනා පිළිවෙළට ය. එහෙයින් ඔහුට 'සක්ක' යැයි කියති. මිනිස් බව ලැබ සිටිත් දී හේ ආවාසයක් තනා පූජා කළේ ය. එහෙයින් ඔහුට 'වාසව' යැයි කියති.

ඔහුට දැන් එක මොහොතක් තුළ දහසක් කරුණු වටහා ගැනීමේ ශක්තිය ඇත. එහෙයින් ඔහුට 'සහස්සක්ඛ' යැයි කියති. ඔහුට සුජාතා නම් අසුර කන්‍යාවක් ආවාහ කර ගත හැකි වූ හෙයින් 'සුජම්පති' යැයි කියති. ඔහු තව්තිසාවෙහි දෙවියන්ට අධිපති හෙයින් 'දේවින්ද' යැයි කියති. ඔහුට 'ශක්‍ර දේවේන්ද්‍ර' භාවය ලබා ගැනීමට හැකි වූයේ මනුෂ්‍යාත්ම භාවයෙහි දී සප්තව්‍රත පද පූරණය කළ හෙයිනි. ඒ සප්ත ව්‍රත පද නම්,

1. දිවි තිබෙන තුරු ම මවු පියන් රැක බලා ගැනීම
2. කුල දෙටුවන් පිදීම.
3. මෙලොක් බස් කතා කිරීම.
4. කේලාම් නො කීම.
5. මසුරු කම හැර දන් දීම
6. සත්‍යවාදිත්වය
7. කෝප නො ගැනීම යන ප්‍රතිපත්ති හතයි.

මේ ප්‍රතිපත්ති සප්තකය නො කඩවා ආරක්ෂා කළ හෙයින් හෙතෙම ශක්‍ර සම්පත්තිය ලැබී ය.

මෙසේ වදාළ භාග්‍යවතුන් වහන්සේ මඝ මානවකව උපන් සමයෙහි තරුණයන් තිස් දෙදෙනකු සමග එක්ව ගමක් සංවර්ධනය කිරීමට ක්‍රියා කළ අයුරුත් ඊට එරෙහි වූ ගම් මුලාදෑනියා රජතුමාට දන්වා ඔවුන් අත් අඩංගුවට ගත් අයුරුත් වදාල සේක. රජතුමා පසුව නියම තතු දැන ගෙන ඔවුන් නිදහස් කර උදවු උපකාර කළේ ය. මනු ලොව බොහෝ පින්කම් කර යහපත් ජීවිතයක් ගත කළ හේතුවෙන් ඔවුනට තමන් ගේම දේව ලෝකයක් 'තව්තිසා' නමින් නිර්මාණය විය. එහි අධිපති වූ මඝ ශක්‍ර දේවේන්ද්‍ර නමින් ප්‍රකට විය. මේ පුවත් මහාලීට පැවසූ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව ද වදාළ සේක.

### විවරණාත්මක අනුවාදය (30 ගාථාව)

**මඝවා අප්පමාදෙන දෙවානං සෙට්ඨතං ගතො**
**අප්පමාදං පසංසන්ති. පමාදො සදා ගරහිතො**

**මඝවා**: මඝ මානවක තෙම; **අප්පමාදෙන**: අප්‍රමාදයෙන්; **දෙවානං**: දෙවියන් ගේ; **සෙට්ඨතං**: නායකත්වයට; **ගතො**: පත් විය; **අප්පමාදං**: අප්‍රමාදය; **පසංසන්ති**: (නුවණැත්තෝ) පසසති; **පමාදො**: ප්‍රමාදය; **සදා**: හැමවිට ම; **ගරහිතො**: පහත් කොට සලකනු ලැබේ.

මඝ නම් තරුණයා දෙවියන් ගේ නායකත්වයට පත් වූයේ අප්‍රමාදය හේතුවෙනි. අප්‍රමාදය හැමදා නුවණැත්තන් ගේ ප්‍රශංසාවට ලක් වූවකි. ප්‍රමාදය කවදත් ගර්හාවට ලක් වූවකි.

### විවරණය

**පමාදො ගරහිතො සදා**: ප්‍රමාදය හැමවිට ම පහත් කොට සලකනු ලබන්නේ ප්‍රමාද වූවනට උසස් ආධ්‍යාත්මික සාධන ලබා ගැනීමට කිසි කලෙක හැකි නොවන හෙයිනි. එය සියළු ලෞකික ගැටලු වලට ද මුල් වෙයි.

**මඝවා**: මඝ ගේ කතාව ජාතකට්ඨ කථාවෙහි මඝ මානවක ජාතකය වශයෙන් සවිස්තරව දැක්වේ.

**දේව**: නම් සියුම් ශරීර ඇති ආලෝකමත් උසස් ජීව විශේෂයකි. ඔවුහු දිව්‍ය ලෝකවල වාසය කරමින් කර්මානුරූපව උසස් සැප සම්පත් ලබති. ඒ හැර වෘක්ෂ දේවතා. වාස්තු දේවතා දී භූමාටු දේවතාවෝ ද වෙති. දෙවියන්ට පුණ්‍යානුමෝදනා කිරීම බෞද්ධයන් ගේ යහපත් චාරිත්‍රයකි. පින් ලබා සතුටට පත් වන දෙවියන් ගේ ආශීර්වාදය ලෞකික අර්ථසිද්ධියට ඉවහල් වෙයි.



*පමා බැව්හි බිය දැක මහණ දම් වඩන තැනැත්තා කුදු මහත් සසර බැඳුම් වූ (රැහැන්) දවයි.*

31. අප්පමාදරතො භික්ඛු
පමාදෙ භය දස්සි වා
සඤ්ඤොජනං අණුං ථූලං
ඩහං අග්ගී ව ගච්ඡති (2:11)

අප්‍රමාදයෙහි රුචි වන
ප්‍රමාදයේ නපුර දකින
හිමි නම සව් කෙළෙස් තවන
ගිනි දළුවකි බැඳුම් දවන

# දවයි සංයෝජන - අප්‍රමාදය පැතිරෙන

## 2 (8) එක්තරා භික්ෂුවක ගේ වස්තුව (31 ගාථාව)

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් **එක්තරා භික්ෂුනමක්** මුල් කර මෙම ගාථාව වදාළ සේක.

මේ භික්ෂු නම රහත් වීම දක්වා අවශ්‍ය සියලු භාවනා කර්ම ස්ථාන සහ භාවනා උපදේශ තම ආචාර්යයන් වහන්සේ ගෙන් ලබා ගෙන ආරණ්‍ය වාසයට ගියේ ය. එහෙත් කවර තරම් උත්සාහ කළ ද උන්වහන්සේට අධිගමයක් ලබන්නට හැකි නො වී ය. අන්තිමේ උන්වහන්සේ මෙසේ සිතූ හ. "මම බුදු රදුන් හමු වී මගේ චරිතයට වඩාත් ගැළපෙන කමටහනක් ලබා ගනිමි."

මෙසේ සිතූ උන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේ බැහැ දැක කමටහන් ලබා ගැනීම පිණිස ගමනට පිටත් වූ හ. අතර මගදී උන්වහන්සේට මහා ලැව් ගින්නක් දක්නට ලැබිණ. ලැව් ගින්න වහ වහා පැතිරෙමින් පැවතිණ. එහෙයින් උන්වහන්සේ ලඟ ම වූ පර්වතයකට නැග ගත්හ. කඳු මත සිට ගින්න පැතිර යනු බලා සිටි උන්වහන්සේ මෙසේ සිතූ හ. "මේ ගින්න බුර බුරා නැගී වැඩෙන්නා සේ, සියලු බාධක දවා හරිමින් පැතිර යන්නා සේ මම ද සියලු බාධක දවා හැර ආර්‍ය මාර්ගය පරිපූරණය කරමි."

මේ භික්ෂූන් වහන්සේ එදින භාග්‍යවතුන් වහන්සේ ගේ කරුණා ජාලයට හසු වී තිබිණ. සුවඳ ගඳ කිළියේ වැඩ වසමින් ම උන්වහන්සේ එම භික්ෂුව අමතා මෙසේ වදාළ හ. "භික්ෂුව, එය ඉතාමත් උචිත ය. කුදු මහත් සියළු බාධක දවා ගෙන ලැව් ගින්න පෙරට යයි. ප්‍රඥාව නමැති ගින්න ද සියළු කුදු මහත් තෘෂ්ණා බාධක දවා ගෙන පෙරට යා යුතු ය." තමන් වහන්සේ වෙතින් භාග්‍යවතුන් වහන්සේ එම භික්ෂුව වෙත යැවූ ආලෝක ධාරාව, භාග්‍යවතුන් වහන්සේ තමන් අභිමුඛයෙහි සිට ගාථාව දේශනා කරන්නා සේ උන් වහන්සේට දිස් විය.

භාග්‍යවතුන් වහන්සේ වදාළ ගාථාවට සවන් දුන් භික්ෂුව එතැන හිඳිමින් ම වහා සිය සිත කෙලෙසුන් ගෙන් මුදවා ගෙන සියළු කෙළෙසුන් දවා අභිඥා ලාභිව රහත් ඵලය ලැබූ හ. අනතුරුව අහසට නැගුණු උන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ගේ නිර්මිත ශරීරයට වන්දනා කොට ප්‍රශංසා කර නික්ම ගිය හ.

### විවරණාත්මක අනුවාදය (31 ගාථාව)

**අප්පමාදරතො පමාදෙ භයදස්සි වා භික්ඛු අණුං ථූලං**
**සඤ්ඤොජනං අග්ගී ඉව ඩහං ගච්ඡති.**

**අප්පමාදරතො**: අප්‍රමාදයෙහි ඇලුණු; **පමාදෙ**: ප්‍රමාදයෙහි; **භය දස්සි වා**: බිය දක්නා; **භික්ඛු**: භික්ෂුව; **අණුං ථූලං**: සියුම් හා මහත්; **සඤ්ඤොජනං**: බන්ධන; **අග්ගී ඉව**: ගින්නක් මෙන්; **ඩහං**: දවමින්; **ගච්ඡති**: ඉදිරියට (නිවනට) යයි.

සත්‍ය ගවේෂණයෙහි ලා අප්‍රමාදී වූ ප්‍රමාදයෙහි බිය දක්නා භික්ෂුව කුදු මහත් සංයෝජන ගින්නක් මෙන් දවමින් පෙරට යයි.

### විවරණය

සංයෝජන: නම් සත්ත්වයා සසරට බැඳ තබන බන්ධන ය. එබඳු බන්ධන 10 ක් තිබේ. එනම්,

1. සක්කාය දිට්ඨිය
2. විචිකිච්ඡාව
3. සීලබ්බත පරාමාස
4. කාම රාග
5. ව්‍යාපාද
6. රූප රාග.
7. අරූප රාග
8. මාන
9. උද්ධච්ච
10. අවිජ්ජා

යන දහයයි. මෙයින් මුල් සංයෝජන පහ පහළට බැඳ තබන බන්ධන වශයෙන් ද දෙවන සංයෝජන පහ ඉහළට බැඳ තබන බන්ධන වශයෙන් ද හඳුන්වනු ලැබේ. පහලට බැඳීම නම් කාම ලෝක වලට බැඳීමයි. ඉහලට බැඳීම නම් රූප හා අරූප ලෝකවලට බැඳීමයි.

මේවායින් i සිට iii දක්වා සංයෝජන වලින් මිදුනු තැනැත්තා සෝවාන් වූ තැනැත්තකු ලෙස හැඳින්වෙයි. මීට අතිරේකව iv හා v ද තරමකට මර්දනය කර ගත් තැනැත්තා සකෘදාගාමී වුවෙකි. i සිට v දක්වා සියළු සංයෝජන බිඳ හළ විට අනාගාමී වූ බව කියනු ලැබේ. සංයෝජන දහයෙන් ම මිදුණ තැනැත්තා අර්හත් ඵලය ලබා ගත් උතුමෙකි.

**පමාදෙ භය දස්සිවා**: යන්නෙහි අරුත යම් යම් මානසික සාධක හේතුවෙන් මත් ව වීර්ය නො කර ක්ලෙශ වසඟව ජීවත් වීමේ භයංකරත්වය ප්‍රත්‍යක්‍ෂ කර ගන්නා බවයි. සති සම්පජඤ්ඤයෙන් තොරව විසීමෙන් වන්නේ සසර දුක් දික්වීම ය.

**අප්පමාදරතො**: යන්නේ සත්‍ය ගවේෂකයා මානසික ප්‍රබෝධයෙන් යුතුව ආගමික චර්‍යාවෙහි උත්සුක වන ආකාරය හැඟවෙයි. නිර්වාණප්‍රතිලාභය විෂයෙහි උද්‍යෝගය මඳ වුවහොත් වන හානිය දන්නා හෙයින් හෝ අප්‍රතිහත ධෛර්‍යයෙන් භාවනාවෙහි නිරත වෙයි.

**භික්ඛු**: නම් බුදුරජාණන් වහන්සේ වෙත පැවිද්ද ලත් තැනැත්තාය. බෞද්ධ භික්ෂුව පූජකයෙක් නොව පැවිද්දෙක් පමනි. දෙවියන් හා මිනිසුන් අතර මැදි පුරුෂයකු ලෙස ක්‍රියා කරන තැනැත්තකු නොවන හෙයින් පූජකයකු සේ කිව නො හේ. භික්ෂුත්වය නම් සිය කැමැත්තෙන් ආගමික ජීවිතයක් භාර ගැනීමකි. එය අකැමැති වූ විට අත් හළ හැකි ය.





*නො පමාවෙහි ඇලී මහණදම් වඩන තැනැත්තා පිරිහීමට නො පැමිණේ. නිවන් පුර ළඟ ම වේ.*

32. අප්පමාදරතො භික්ඛු
පමාදෙ භයදස්සි වා
අභබ්බො පරිහාණාය
නිබ්බාණස්සෙ'ව සන්තිකෙ (2:12)

ඇලුණු නො පමාවෙහි
බිය දක්නා පමාවෙහි
නො පිරිහෙයි භික්ෂුව
ළංව සිටිනා නිවනට

# ඇතොත් නුවණ - ළඟය නිවන

## 2 (9) නිගාමවාසී තිස්ස හිමියන් ගේ කථාව (32 ගාථාව)

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් නිගාමවාසී **තිස්ස තෙරුන් වහන්සේ** ඇරබ මේ ගාථාව වදාළ සේක.

සැවැත් නුවරින් නුදුරෙහි එක්තරා නියම් ගමෙක ප්‍රභූ පවුලක තරුණයෙක් බුදු සස්නෙහි පැහැද පැවිදි වූයේ ය. නියම් ගමකින් පැවිදි වූ හෙයින් උන්වහන්සේට නිගාම තිස්ස යන නම ව්‍යවහාර විය. ඉතා සැදැහැයෙන් පැවිදි දම් පිරූ උන්වහන්සේ ගේ අල්පේච්ඡ, සන්තුෂ්ට ගුණය හා විනය ගරුක ශික්ෂාකාමී චර්යාව පිළිබඳව ඉතා ඉක්මණින් ම පැතිර ගියේ ය. උන්වහන්සේ තම ඤාතීන් විසූ ගමෙහි නිතර පිඩුසිඟා ගිය හ. නුදුරෙහි ම වූ සැවැත් නුවර අනේපිඬු සිටාණන් වැනි සැදැහැති දානපතියන් විසුව ද, මහා සංඝරත්නයට නිතර ගරු සත්කාර කළ සිවුපසය පිළිගැන්වූ පසේනදී කොසොල් රජතුමා සිටිය ද උන්වහන්සේ කිසි කලෙක එහි නො ගිය හ.

දිනක් භාග්‍යවතුන් වහන්සේ හමු වූ භික්ෂූන් වහන්සේ පිරිසක් උන්වහන්සේට මෙසේ සැළ කර සිටිය හ. "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මේ නිගාමතිස්ස භික්ෂුව තම ඤාතිවරුන් මධ්‍යයේම වාසය කරන්නේ ය. මෙතරම් සැදැහැති දානපති අනේපිඬු මහ සිටාණන් සිටිය ද, අසදෘශ දන් දෙන පසේනදී කෝසල රජතුමාණන් විසුව ද ඒ කිසිවකු ගේ පුණ්‍ය කර්මයකට නො පැමිණෙයි." භාග්‍යවතුන් වහන්සේ ඒ අසා නිගාමතිස්ස හිමියන් සැවැත් නුවරට කැඳවූ හ. "භික්ෂුව, ඔබ ඤාතීන් අතරම රැඳී ඔවුන් වෙතම පිඬු සිඟා යමින් ඔවුන්ට ම සීමිතව කුල සංසට්ඨව සිටින බව සැබෑදැ" යි විමසා සිටිය හ. "භාග්‍යවතුන් වහන්ස, මම කුලයන් හා බැඳී නො වෙසෙමි. මා පිළිගන්නේ මට යැපෙන්නට අවශ්‍ය තරමේ භෝජනයක් පමණි. මට ලැබෙන අහර සුළු හෝ වේවා මඳ හෝ වේවා ප්‍රනීත වේවා ප්‍රනීත නො වේවා මම ඉන් කම්පා නො වී ලද දෙයින් සතුටු වෙමි. වැඩිපුර හෝ වැඩි මිහිරට හෝ මම නො වෙහෙසමි. එසේ අල්පෙච්ඡව ජීවත් වනු මිස ඤාතීන් කෙරේ ඇලී ජීවත් නො වෙමි." යි නිගාමතිස්ස හිමියෝ ප්‍රකාශ කර සිටිය හ.

භාග්‍යවතුන් වහන්සේ "සාධු, සාධු, භික්ෂුව ඉතාමත් සුන්දරය" යි පවසා භික්ෂූන් වහන්සේ අමතා මෙසේ ප්‍රකාශ කළ හ. "මහණෙනි, මා වැනි ගුරුවරයෙක් ලත් ඔබ අල්පෙච්ඡ වීම පුදුමයක් නොවේ. මගේ පරපුරේ මගේ පුරුද්දේ ආකාරය මෙය ය." එසේ වදාළ භාග්‍යවතුන් වහන්සේ නිගාමතිස්ස හිමියන් ගේ අල්පෙච්ඡතාව කීර්තනය කරමින් මේ කතා පුවත ද වදාළ හ.

එක් කලෙක හිමවත පෙදෙස ගංගා නම් ගඟ ඉවුරේ දිඹුල් වනයක ගිරව් දහසක් පමණ විසූ හ. කලක දී මේ දිඹුල් ගස වියලී මැරී යන්නට වූයෙන් බොහෝ ගිරවු එය හැර ගිය හ. එහෙත් එක් ගිරවෙක් තමා විසූ ගසෙහි එල නැති කල ද කොළ, පොතු ආදිය කමින් ගඟේ දිය බොමින් විසීය. ඔහු ගේ අල්පේච්ඡතාව හේතුවෙන් ශක්‍රයා ගේ මන්දිරය පවා කම්පා විය. හෙතෙම ගිරවා වඩාත් විමසනු පිණිස ගස වියලී කුඩු හැලෙන තත්ත්වයට පත් කළ ද හේ එතැනින් නො ගියේ ය. එයින් ප්‍රසන්න වූ ශක්‍ර දේවේන්ද්‍ර තෙම ඔහු විසූ වනය නැවත සරු සාර එල බර උයනක් බවට පත් කළේ ය. එකල "ගිරා රජවත් අල්පේච්ඡභාවය ප්‍රගුණ කළ මගේ පරපුරේ එක් පුරුකක් වූ මේ නිගාමතිස්ස මෙසේ අල්පේච්ඡවීම පුදුමයක් නො වේයැ"යි වදාළ බුදුරජාණන් වහන්සේ මේ ගාථාව වදාළ හ.

### විවරණාත්මක අනුවාදය (32 ගාථාව)

**අප්පමාදරතො පමාදෙ භයදස්සි වා භික්ඛු අභබ්බො**
**පරිහාණාය නිබ්බාණස්ස සන්තිකෙ එව**

**අප්පමාදරතො**: අප්‍රමාදයෙහි ඇලුණු; **පමාදෙ**: ප්‍රමාදයෙහි; **භයදස්සි වා**: භය දක්නා; **භික්ඛු**: භික්ෂුව; **නිබ්බාණස්ස**: නිර්වාණයෙහි; **සන්තිකෙ**: සමීපයෙහි සිටියේ; **පරිහාණාය**: පරිහාණියට; **අභබ්බො එව**: සුදුසු නොවන්නේ ම ය.

අප්‍රමාදයෙහි ඇළුණු, ප්‍රමාදයෙහි භයංකරත්වය හඳුනන භික්ෂුව නිවණට සමීපව වසන හෙයින් පිරිහෙන්නට සුදුසු නො වේ.

### විවරණය

**නිබ්බාණස්ස සන්තිකෙ**: යන්නෙන් අප්‍රමාදී භික්ෂුව නිවණට ඉතා සමීපව වසන බව අදහස් කරනු ලැබේ. නිර්වාණය අජාත, අභූත, අකත, අසංඛත වශයෙන් හඳුන්වන බුදුරජාණන් වහන්සේ එය ඇති දෙයක් බව වදාළ හ. එවැන්නක් නො තිබිණි නම්, ජාත, භූත, කෘත, සංස්කෘත, දෙයින් ගැලවීමක් නො වන්නට තිබිණැයි ද වදාළ හ. ආපො, තෙජො, වායො, පඨවි යන සතර මහා භූතයෝ තැනක් නො ලබති. දිග-පළල, හොඳ-නරක, නාම-රූප ආදී සියල්ල වියැකී යයි. එලොවක්-මෙලොවක්, ඊමක්-යාමක්, උපතක්-විපතක් හෝ කාම වස්තුවක් විද්‍යාමාන නො වේ. "නිවන මෙසේ ඍණ වාචී පද වලින් විස්තර කර ඇති හෙයින් එය උච්ඡේදයක් සේ වරදවා වටහා ගන්නෝ බහුල වෙති. එහෙත් නිර්වාණය උච්ඡේදයක් නො වේ.

**අභබ්බො පරිහාණාය**: පරිහානියට අයෝග්‍යයැයි සඳහන් කළේ එබඳු අයෙක් පිරිහෙන්නේ නැතැයි පැවසීම සඳහා ය. භාවනාවෙන් පිරිහීම හෝ මාර්ග ඵලවලින් පිරිහීම යන එක් විදියකින්වත් පිරිහීම යුතු නැත. ඒ වෙනුවට වර්ධනයක් ම භාවනාවෙහි හා මාර්ග ඵලයන්හි අභිවෘද්ධියක් ම අපේක්ෂා කළ හැකිය.

## කතෘ ස්වාමීන්ද්‍රයන් වහන්සේ



සනාතන බුද්ධ භාෂිතය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ අසහාය සාමයික මෙහෙය උදෙසා, සිය කාලය හා ශ්‍රමය සපුරා වැය කරමින්, මානව වංශයට දහම් මග හෙළි පෙහෙළි කිරීමේ මහා මෙහෙවරට කැප වී සිටින සිංගප්පූරුවේ ප්‍රධාන සංඝ නායක වේරගොඩ සාරද, ස්ථවිරයන් වහන්සේ අද ලොව වෙසෙන ප්‍රශස්ථතම ධර්‍ම දූත යතිනායක වරයාණන් වහන්සේ නමකි.

1941 නොවැම්බර් මස 27 වනදා දකුණු ලක වේරගොඩ දී උපත ලද මේ යති ප්‍රභූවරයානෝ, උපාධි ලාභීව, ධර්‍මදූත මෙහෙය ආරම්භ කළේ ඉතා යොවුන් අවධියේ දීමය. දැනට ශතක 6 ක් පුරා ධර්‍මදූත මෙහෙයෙහි යෙදී සිටින ගරුතර වේරගොඩ සාරද යතිනායකයානන් වහන්සේ මුද්‍රිත මාධ්‍යයෙන් සහ විද්‍යුත් මාධ්‍යයෙන් මෙන්ම දුරකථන තාක්‍ෂණයෙන් පවා අද ලොවට ධර්‍මදානය සපයන්නේ නවීනයන්ගේ මනස හා ආධ්‍යාත්මික ගති-පැවතුම් පිළිබඳ පැහැදිලි අවබෝධයකිනි.

වර්තමානික ග්‍රාහක පිරිස, ශ්‍රව්‍ය-දෘෂ්‍ය මාධ්‍ය මගින් දැනුමත් විනෝදාස්වාදයත් ලබන්නට පුරුදු වී සිටින පරපුරක් හෙයින්, ගරුතර වේරගොඩ සාරද හිමිපාණෝ, ඔවුනගේ මනසට සරිලන පරිද්දෙන් බුද්ධ භාෂිතය, ඔවුන් අතට පත් කරන සේක. මුද්‍රිත හා විද්‍යුත් ප්‍රකාශන 700 ක් පමණ ලොවට පිරිනමා සිටින මේ යතිනායකයන් වහන්සේ විසින් සම්පාදිත ධර්ම භාණ්ඩාගාරය නම් ඉංග්‍රීසි කෘතිය දොරට වැඩීමේ උළෙලේ දී, ඒ පිළිබඳ ව එක් දිනක් තුල පමණක් ලැබුණු දුරකථන ඇමතුම් සංඛ්‍යාව 2000 කටත් අධික විය. ඒ නිසා එය සිංගප්පූරු රාජ්‍යයේ ග්‍රන්ථ ප්‍රකාශන ඉතිහාසයේ සුවිශිෂ්ට වාර්තාවකට හිමිකම් කියන්නේය.

දැනට, සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය භාරව වැඩ සිටින ගරු වේරගොඩ සාරද නායක ස්ථවිර පාදයන් වහන්සේ ලෝකයේ බොහෝ දේශයන් හී බුද්ධ ශාසනයේ ප්‍රගතියට හිතකාමී ධර්ම දූත මෙහෙවරක යෙදී සිටින සේක.

එතුමන් ගේ ප්‍රධාන ප්‍රකාශ අතර, සිංහල හා ඉංගිරිසි ධම්මපදයත්, ජාතක කථා පිළිබඳ විද්‍යුත් ප්‍රකාශනයත් ප්‍රධාන තැන් ගනී. එතුමන් විසින්, ඉටු කෙරෙන මහා සාමයික මෙහෙය අඛන්ඩව පවත්වා ගෙන යනු පිණිස, ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් නිදුක් නිරෝගී සුව පැතීම, බෞද්ධ ජනතාවගෙන් ඉටු විය යුතු කෘතඥතා පූර්වක චාරිත්‍රයකි.

කලා කීර්ති එඩ්වින් ආරියදාස

ISBN: 981-00-4938-2

# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත ධම්මපදය
## 3 වන පරිච්ඡේදය

## චිතත වගග



ගරු වේරගොඩ සාරද නාහිමිපාණන් වහන්සේ
සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක

"සබ්බදානං ධම්මදානං ජිනාති"

(ධර්ම දානය, සෙසු දාන සියල්ලටම වඩා අගනේය.)



''ධර්ම භාණ්ඩාගාරය'' නැමැති

මෙම වටිනා ධර්ම පුස්තකය

**සාමවිනිසුරු බී.ධර්මදාස පියාණන්ට**

නිවන් සුව පතා ප්‍රකාශනය කරන ලදි.

පූර්ණ අනුග්‍රහකත්වය

**වේරගොඩ සුනන්දා භික්ෂුණිය විසිනි**

# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත ධම්මපදය

කතෘ:

**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**

ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව

විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය**

නො: 1, ජලන් මස් පුටේ, සිංගප්පූරුව 128607

ටෙලි: 65 67783330 65 94656570

94 770589498 / 94 755218421

වේරගොඩ ජයන්ති විහාරය, වේරගොඩ, මීටියාගොඩ

විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

**කර්තෘ**
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**චිත්‍ර ශිල්පි**
පී. වික්‍රමනායක

**සැකසුම**
පියරත්න හේවාබට්ටගේ

**පරිගණක රූපාවලි සහ පූර්ව ප්‍රකාශන මෙහෙය**
පූජ්‍ය වේරගොඩ සුනන්දා භික්ඛුණී
බී. දයා සමරසිංහ
බී. රෝහණ ජයතිස්ස

**පරිගණක සහාය**
ශ්‍යාමනී ප්‍රියලක්ෂණා ලේකම්වසම්
ඩබ්ලිව්. මාලා කාන්ති
ප්‍රියංකා බෝධිපක්ෂ

**සහාය**
බී. පුෂ්පානී ධම්මිලතා
බී. ජේ. ධම්මිලතා
ඊ. එම්. ලයනල් මොහොට්ටි
ඊ. එම්. යුගාන් සසංක
ශ්‍රියාලතා කග්ගොඩ ආරච්චි

**පරිගණක ප්‍රකාශන**
සමනල ප්‍රින්ටර්ස්, බටපොල
ටෙලි: +94 777557127

**පිටකවරයේ පින්තූරය**
බර්ට් ගුණසේකර

**මුද්‍රණය**
2013 නොවැම්බර් මස 27 දින, සිංගප්පූරුව

**පිටකවරයේ චිත්‍රය**

*පිටකවරයේ බුදු පිළිමය වේරගොඩ ජයන්ති විහාරයේ බුදුමැදුරෙනි.*
*වර්ෂ 1953 ජූනි 3 වෙනිදා අඹන ලද මෙම බුදු පිළිමය දැනට ශ්‍රී ලංකාවේ තිබෙන*
*දර්ශනීයතම බුදු පිළිමය වශයෙන් සැලකේ. මෙම බුදු පිළිමය ඉදිකිරීමේ පුරෝගාමී වූ අපවත් වී වදාළ*
*ගෞරවාහී පණ්ඩිත යටලමත්තේ වජිරඤාණ නායක මාහිමිපාණන් වහන්සේට නිවන්සුව අත්වේවායි අපි ප්‍රාර්ථනා කරමු.*

මේ ග්‍රන්ථයෙහි ආගත කරුණු පිළිබඳ පූර්ණ හා සදාකාලික අයිතිය හිමි වන්නේ බුදුරජාණන් වහන්සේටයි.
බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් පහල වූ සනාතනික සත්‍යයෝ පුහුදුන් මිනිසුන් විසින් පනවන ලද
තාවකාලික වූත්, අසත්‍ය වූත්, අයිතිවාසිකම් පිළිබඳ නීති රීති පිළිගනු නොලබති.

**පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ටෙලි: 65 67783330 65 94656570
+94 770589498 +94 755218421
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

ISBN: 981-00-4938-2

3 වන පරිච්ඡේදය

# චිත්ත වග්ග





*සැලෙන සුලුවූ, රැක ගැන්මට අමාරු වූ සිත නැණවතා (දොස් නමැති) ඇද හැර මොනවට සදන්නේ ය.*

33. එන්දනං චපලං චිත්තං
දුරක්ඛං දුන්නිවාරයං
උජුං කරොති මෙධාවී
උසුකාරෝ'ව තෙජනං (3:1)

රැක ගැනීම අමාරුයි
සැලෙන චපල සිත අපේ
නුවණැත්තා ඇද අරියි
හී -කරු හීයක් වගේ

# දන නුවණැති - සිත හික්මවති

## 3 (1) මෙඝිය තෙරුන් ගේ කථා වස්තුව (33 සහ 34 ගාථා)

චාලිකා කන්දෙහි වැඩ වසන අතර භාග්‍යවතුන් වහන්සේ **මෙඝිය තෙරුන්** ඇරඹ මේ ගාථාව දේශනා කළ සේක.

මෙඝිය හිමියෝ ගංතෙරක් අයිනේ මනරම් අඹ උයනක් දැක බවුන් වැඩීම පිණිස එහි යන්නට බුදුරජාණන් වහන්සේ ගෙන් අවසර ඉල්ලා සිටිය හ. තම තනියට වෙනත් නමක් සොයා ගන්නා තුරු තමන් හැර නො යන සේ බුදු රදුන් ඉල්ලා සිටිය ද තමන් යා යුතු යැයි තෙවරක් ම බල කොට කියා සිටි මෙඝිය තෙරුන්ට බුදු පියාණෝ තෙවන වර අවසර දුන් හ.

එහෙත් අඹ උයනට ගොස් අඹ රුකක් යට භාවනාවට වැඩ හුන් උන්වහන්සේට තමන් පෙර ජන්ම රැසක ම රජකුව ඉපිද නළඟනන් පිරිවරා එහි විනෝද වූ ආකාරය සිහි වීමෙන් කාම රාගය ද, අපරාධ කරුවකු තමන් වෙත ගෙන ආ බව සිහි වීමෙන් ව්‍යාපාදය ද ඔහුට දඬුවම් නියම කිරීම් වශයෙන් විහිංසාව ද වශයෙන් විතර්ක ඇති විය. මෙයින් විපිළිසරට පත් උන්වහන්සේ වහා ම බුදුරදුන් දක්නට ගොස් මේ තතු හෙළි කර සිටිය හ.

"මෙඝිය ඔබ කළේ වරදකි. මා දැන් තනිවමයි ඉන්නේ. යන්න එපා. වෙනත් තෙරුන් වහන්සේ නමක් එනතුරු ඉන්න. එසේ මා තනිව දමා නොයන්නැයි කියද්දීත් ඔබ ගියෙහි ය. එපා කියද්දී සිතට යටත්ව ගොස් දැන් ත්‍රිවිධ විතර්කයන්ට ම ගෝචර විය.

සිතට වහල් වීම නුසුදුසු ය. සිත තමන් වසඟයට ගත යුතුය" යි වදාළ භාග්‍යවතුන් වහන්සේ 'ඵන්දනං චපලං චිත්තං' යනාදී ගාථාව දේශනා කළ සේක. භාග්‍යවතුන් වහන්සේ ගේ ධම් දේශනාවසානයෙහි මෙඝිය භික්ෂුව සෝවාන් ඵලයෙහි පිහිටියහ. අන්‍ය බොහෝ දෙනාට ද ධර්මාභිසමය විය.

**විවරණාත්මක අනුවාදය (33 ගාථාව)**

**ඵන්දනං චපලං දුරක්ඛං දුන්නිවාරයං චිත්තං මෙධාවී**
**උසුකාරො තෙජනං ඉව උජුං කරොති**

**ඵන්දනං**: ස්ඵන්දනය වන; **චපලං**: චපල වූ; **දුරක්ඛං**: රැක ගැනීම අපහසු වූ; **දුන්නිවාරයං**: සංවර කර ගැනීම දුෂ්කර වූ; **චිත්තං**: සිත; **මෙධාවී**: නුවණැත්තා; **උසුකාරො**: ඊතල හදන්නා; **තෙජනං**: ඊ දණ්ඩ (සෘජු කරන්නාක්); **ඉව**: මෙන්; **උජුං කරොති**: සෘජු කරයි.

සිත නිතර සැලෙයි. වෙනස් වෙයි. රැක ගැනීම හා සංවර කර ගැනීම අපහසු ය. එහෙත් නුවණැත්තෝ ඊතල හදන කම්මල් කරුවකු ඊ දණ්ඩ ඇද හැර සෘජු කරන්නාක් මෙන් සිත සෘජු කරති.

**විවරණය**

**චිත්ත**: පංචස්කන්ධ අතුරෙන් විඤ්ඤාණ ස්කන්ධය චිත්ත වශයෙන් ගැනේ. වේදනා, සඤ්ඤා හා සංඛාර යන චෛතසික ධර්මයෝ චිත්තය මුල් කොට පවතිති. රූපස්කන්ධය වුව ද ක්‍රියාත්මක වන්නේ චිත්තය ඇති කල්හි ම හෙයින් චිත්තය ප්‍රධාන වේ. චින්තනයට උපකාරක වන්නේ සිත හෙයින් එයට චිත්ත යැයි නම් කෙරේ. සිත නිරතුරුවම වෙනස් වෙමින්, පවතින්නකි. එහෙත් අනතුරුව ඇතිවන සිත් මුල් සිතෙහි ලක්ෂණ-ගුණාංග ග්‍රහණය කරන හෙයින් එක් දිගටම පවතින සේ පෙනේ. සිත වෙනස් වන හෙයින් ම එය සක්‍රිය ය.

බටහිර දර්ශනයෙහි ඉගැන්වෙන ආත්ම සංකල්පය කෘත්‍යය විසින් චිත්තයට සම වුවද 'ආත්ම' යන්නෙන් පෙරදිග දාර්ශනිකයන් අවධාරණය කළ නිත්‍ය හා අවිනශ්වර සංකල්පය බුදු සමය විසින් ප්‍රතික්ෂේප කරන ලද්දකි. සිතෙහි අඛණ්ඩතාව පවත්වා ගෙන යන භවංග නම් චිත්තයක් පිළිබඳව අභිධර්මයෙහි සඳහන් වේ. යමකු ගේ උපතේ සිට පවත්නා ස්වභාවික චිත්තය එය වුවද 'ආත්ම' ලෙස එය හැඳින්විය නො හැක්කේ එය ද අනිත්‍ය හෙයිනි. එය නූතන මනෝ විද්‍යාවේ උප විඤ්ඤාණයට ද සම කළ නො හැක්කේ උප විඤ්ඤාණය හෙවත් යටිසිත උඩුසිත හා සමගාමී චිත්තයක් ලෙස විස්තර කරනු ලබන හෙයිනි. භවංග නමින් අභිධර්මාචාර්යවරුන් උද්දේශ කරන්නේ එබඳු සමගාමී චින්තයක් නො වේ.





*ගොඩබිම බාහලූ මසෙකු සේ මේ සිත ඇදෙන සැලෙන බැවින් වෑයමෙන් රැක කෙලෙස්වට දුරැලියැ යුතුය.*

34. වාරිජෝ'ව ථලෙ ඛිත්තො
ඔකමොකත උබ්භතො
පරිඵන්දති'දං චිත්තං
මාරධෙය්‍යං පහාතවෙ (3:2)

දියෙහි හැම කල් වසනා
ගොඩ බිම ලු මසෙකු සේ
සැලෙනා චපල වූ මේ සිත
මිදිය යුතු වේ මරහු බැලුමෙන්

# නලියයි සිත මාළුවකු සේ

## 3 (2) මෙඝිය හිමියන් ගේ වස්තුව (33 සහ 34 ගාථා) (ඉතිරි කොටස)

**විවරණාත්මක අනුවාදය (34 වන ගාථාව)**

**ඔකමොකත උබ්භතො ථලෙ ඛිත්තො වාරිජෝ ඉව ඉදං චිත්තං පරිඵන්දති මාරධෙය්‍යං පහාතවෙ.**

**ඔකමොකත**: ජලාශයෙන්; **උබ්භතො**: ගොඩට ගෙන; **ථලෙ**: ගොඩ බිම; **ඛිත්තො**: තබන ලද; **වාරිජෝ**: මත්ස්‍යයකු; **ඉව**: මෙන්; **ඉදං**: මේ; **චිත්තං**: සිත; **පරිඵන්දති**: ස්ඵන්දනය වෙයි. (ගැහෙයි); **මාරධෙය්‍යං**: මාර බන්ධන; **පහාතවෙ**: ප්‍රහාණය කළ යුතු ය.

ජලයෙන් ගොඩට ගෙන ගොඩ බිම තැබූ මත්ස්‍යයකු ගැහෙන්නාක් මෙන් අප ගේ සිත ද සලිත වෙයි. මාරයා ගේ බන්ධන සිඳහල යුතු ය.

**විවරණය**

මෙහි දියෙන් ගොඩට දැමූ මත්ස්‍යයකු උපමාවට ගෙන ඇත්තේ සිතෙහි ඇති ඉක්මණින් සැලෙන ස්වභාවය ප්‍රබල ලෙස අවබෝධ කරවනු පිණිස ය. මෙඝිය හිමියන් භාවනාවට ගොස් ආරම්භ කළ මොහොතේ පටන් උන් වහන්සේ ගේ චිත්තය කාම විතර්කයෙන් ව්‍යාපාද විතර්කයට ද ව්‍යාපාද විතර්කයෙන් විහිංසා විතර්කයට ද වහ වහා මාරු වූයේ ඒ නියාමය අනුවය.

අභිධර්ම පිටකය සිතෙහි නිරන්තරයෙන් සිදුවන ක්‍රියා කාරිත්වය ඉතා සූක්ෂ්ම ලෙස සාකච්ඡා වෙයි. බාහිර උත්තේජකයක් මගින් සම්බාධිත වන තුරු භවංග අවස්ථාවෙහි පවත්නා සිත, උත්තේජක මගින් චලනයට පත් වෙයි.  ඇසට රූපයක් ආපථ ගමනය වූ විට භවංගය චලනය වී උපච්ඡේද වෙයි. ඉන් පසු පංචද්වාරාවර්ජනය සිදු වෙයි. චක්ඛු විඤ්ඤාණය ඇති වන්නේ ඉන් පසුව ය. මින් පසු එම රූපය පිළිබඳව සිත විසින් ගනු ලබන අනුක්‍රමික සංජානන ක්‍රියාවලිය අභිධර්ම ග්‍රන්ථවල සියුම්ව විවරණය කර ඇති අතර ජවන් සිත් වලදී කර්මය සිදුවන ආකාරය ද පැහැදිලි කර ඇත.

අප විසින් කරනු ලබන සියළුම ක්‍රියා වලට වග කිව යුත්තෝ අපි ම වෙමු. විවිධ බාහිර බලපෑම් අප ගේ සිතට ලැබෙන බව සැබෑ වුව ද සිතා මතා නිදහසේ තීරණ ගෙන ඒවා ක්‍රියාත්මක කිරීමේ හැකියාව හෙවත් ස්වච්ඡන්දතාව අප සැම දෙනා වෙතම පවතින බව පිළිගත යුතුය. මෙම නිදහස ප්‍රයෝජනයට ගෙන නිරතුරුව වෙනස්වන සිත පාපයට අවනත වන්නට නො දී රැක ගැනීම අප ගේ යහපතට හේතු වෙයි.

බෞද්ධ භාවනා ක්‍රමය තුළ අන්තර්ගත චිත්තානුපස්සනාව සිත පිළිබඳ මෙම ශික්ෂණය සඳහා ඇති සාර්ථක උපක්‍රමයයි. නවීන මනෝ විද්‍යාවට පවා සිතෙහි සූක්ෂ්ම හා සංකීර්ණ ස්වරූපය ග්‍රහණය කර ගැනීමට හැකි වී නැත. විවිධ වයසීවන් අධ්‍යයනය කිරීම මගින් ලබා ගන්නා අනුමාන ඥාණයක් මිස ප්‍රත්‍යක්ෂ දැනීමක් ලබා ගන්නට ඔවුන් සමත් වී නැති බව කිව යුතු ය. බෞද්ධ දර්ශනය අන්තරවලෝකන ක්‍රමය මගින් තම සිත තමන් විසින් ම අධ්‍යයනය කර ගැනීමේ ශික්ෂා මාර්ගයක් වශයෙන් භාවනා ක්‍රම නිර්දේශ කරයි.

සිත පිළිබඳ භාවනාව පහසු කරනු වස් චිත්තානුපස්සනා භාවනා නිර්දේශයේ දී සිතෙහි ස්වරූප 16 ක් පිළිබඳව නිරීක්ෂණය කිරීමට උපදෙස් දෙනු ලැබේ. එනම්,

1. සරාග,
2. වීතරාග,
3. සදෝස,
4. වීතදෝස,
5. සමෝහ,
6. වීතමෝහ,
7. සංඛිත්ත,
8. වික්ඛිත්ත,
9. මහග්ගත,
10. අමහග්ගත,
11. ස උත්තර,
12. අනුත්තර,
13. සමාහිත,
14. අසමාහිත,
15. විමුත්ත,
16. අවිමුත්ත. වශයෙනි.





*කැමැති අරමුණක වැටෙන සුලු වූ සිත දමනය කිරීම යහපති. දමනය කළ (හික්ම වූ) සිත සැප එළවන්නේ වෙයි.*

35. දුන්නිග්ගහස්ස ලහුනො
යත්ථ කාමනිපාතිනො
චිත්තස්ස දමථො සාධු
චිත්තං දන්තං සුඛාවහං (3:3)

අපහසුය දමනය
ඉක්මන් ය එහි චලනය
රිසි රිසි තැන නතර කරන
දෙයක් වෙයි මේ චිත්තය
කළෝතින් දමනය
අත්වේය ඉන් සුව සෙත

# සංවර සිත - ගෙන දෙයි සෙත

## 3 (2) එක් හිමිනමක ගේ වත (35 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසමින් **එක්තරා භික්ෂු නමක්** ඇරබ මේ ගාථාව වදාළ සේක.

වරක් භික්ෂූන් වහන්සේලා හැට නමක් බුදුරදුන් වෙතින් කර්මස්ථාන ලබා ගෙන කඳු පාමුලෙක පිහිටි මාතික නම් ගමට ගිය හ. එහි දී ගම්පතියා ගේ බිරිඳ වූ මාතිකමාතා නම් තැනැත්තිය උන්වහන්සේලාට දන් පිළිගැන්වූවා ය. ඒ ගමේ ම වස් කාලය ගත කරන්නැයි ඇරයුම් කළ ඕ, ඒ සඳහා ආරාමයක් ද ඉදි කරවූවා ය.

මේ අතර එක් දිනක් "මටත් භාවනා උගන්වන්න" යි ඕ තොමෝ භික්ෂූන් වහන්සේලාගෙන් ඉල්ලා සිටියා ය. උන් වහන්සේලා ද ශරීරයේ අසුභය දකිමින් දෙතිස් කුණපය පිළිබඳව භාවනා කරන ආකාරය ඇයට ප්‍රගුණ කරවූ හ. ඕ තොමෝ ද අප්‍රමාදීව බවුන් වඩා ඉක්මණින් ම මාර්ග-ඵල තුනක් ම ලබා ගත්තා ය. ඒ හා ම ඇයට ලෞකික සෘද්ධි ද විදසුන් නුවණ ද ලැබිණ.

මාර්ගඵල ලබා සිය දිවැසින් භික්ෂූන් වහන්සේලා ගේ අධිගම ගැන සම්මර්ශනය කළ ඕ තොමෝ උන්වහන්සේලා තවමත් මාර්ග ඵල ලබා නැති බව දැක ඒ සඳහා ඇති අඩුපාඩු කවරේදැයි විමසා බලා ඒ පහසුකම් සැලසුවා ය. භික්ෂූන් වහන්සේලා ගේ රුචි අරුචි වලට ගැළපෙන පරිදි සිවුපසය සකසා දී සියළු උපස්ථාන කිරීම මගින් උන්වහන්සේලාට ද වහා අධිගම ලබා ගන්නට ඉඩ සැලසීම ඇය ගේ අරමුණ විය. එහි ප්‍රතිඵලය වූයේ නො බෝ කලකින්ම සියලු හිමිවරුන් අර්හත් ඵලයෙහි පිහිටීමයි. වස් කාලය අවසානයේ භික්ෂූන් වහන්සේ හැම දෙන ජේතවනාරාමයට ගොස් භාග්‍යවතුන් වහන්සේ බැහැදුට හ. තමන් ට ගැළපෙන ප්‍රත්‍ය පහසුව මාතිකමාතාව විසින් සැලසූ අයුරු ද හොඳ සුවයෙන් පහසුවෙන් වස් කාලය ගත කර පැමිණි බව ද සැල කර සිටිය හ. මාතිකමාතාව තම සිතැගි මනාව දැන තමන් ප්‍රිය කළ ආකාරයට ම දාන මානාදිය සූදානම් කළ බව ද පැවසූ හ.

මේ සියල්ලට සවන් දුන් එක්තරා භික්ෂු නමක් "මාත් මාතිකමාතාවන් ගේ පන්සලට යා යුතුය" යි ඉටා ගත්තේ ය. ඒ අනුව භාග්‍යවතුන් වහන්සේ ගෙන් භාවනා කර්මස්ථාන ලබා ගත් උන්වහන්සේ එහි ගිය හ. සිතූ පරිදිම මාතිකමාතාවෝ උන්වහන්සේ ගේ සිතැගි දැන සියල්ල සකසා පිළිගැන්වූ හ. ඇය පැමිණෙතහොත් මැනවැයි හිමි නම සිතන විට ඕ ආවාය. යම් ආහාරයක් ගැන සිතූ විට එය ද සැපයුවා ය. මෙයින් විස්මයට පත් හිමි නම "ඔබට අනුන්ගේ සිත් දැන ගන්නට ශක්තිය තිබේදැ" යි විමසුවා ය. එයට සෘජුව පිළිතුරු නුදුන් උපාසිකාව "සිත් දැනගත හැකි උදවිය ඒ ඒ සිතැගි අනුව වැඩ කරති" යි පමණක් පැවසුවා ය. කෙසේ වුව ද, "මේ උපාසිකාව පරසිත් දන්නී ය. මා පෘථග්ජන හෙයින් මගේ සිතෙහි අපිරිසිදු සිතුවිලි ඇති වුවහොත් ඒවා ද මෙතුමිය දැන ගන්නීය" යි බියට පත් භික්ෂුව වහාම බුදුරජාණන් වහන්සේ වැඩ සිටි දෙව්රම් වෙහෙරට ආපසු ආවේ ය. තමන්ට මාතිකාරාමයේ වසන්නට බැරි බවත්, උපාසිකාව පරසිත් දන්නා හෙයින් තම සිතෙහි අකුසල සිතුවිල්ලක් උපනහොත් ඇය දැන ගනීතැයි බියක් ඇති වූ හෙයින් ආපසු ආ බවත් උන්වහන්සේ බුදු සමිඳුන්ට සැළ කර සිටිය හ. "භික්ෂුව ඔබ කළ යුත්තේ ඔබේ සිත රැක ගැනීම පමණක් නො වේ ද?"යි උපදෙස් දුන් බුදු පියාණෝ "යන්න, ආපසු මාතිකගාමයට ම යන්න. වෙන කිසිවක් ගැන නොසිතා හුදෙක් භාවනාව ගැන ම සිතන්න" යි අවවාද කළ හ. උපාසිකාව ද ආපසු පැමිණි භික්ෂුවට පෙර හිමිවරුන් ට මෙන්ම බැතිසිතින් සියළු පහසුකම් සලසා දුන්නා ය. පසුතැවිල්ලකින් තොරව සුවසේ විදසුන් වැඩූ භික්ෂුනම නො බෝ දිනකින් ම රහත් ඵලය ලැබී ය.

**විවරණාත්මක අනුවාදය (35 වන ගාථාව)**

**දුන්නිග්ගහස්ස ලහුනො යත්ථ කාමනිපාතිනො චිත්තස්ස**
**දමථො සාධු දන්තං චිත්තං සුඛා වහං**

**දුන්නිග්ගහස්ස**: පාලනය කිරීම ඉතා අපහසු; **ලහුනො**: ඉක්මන් පැවතුම් ඇති; **යත්ථ කාමනිපාතිනො**: කැමති ඕනෑම තැනක රැඳෙන; **චිත්තස්ස**: සිත; **දමථො**: දමනය කර ගැනීම; **සාධු**: යහපත් ය; **දන්තං**: දමනය කරන ලද; **චිත්තං**: සිත; **සුඛා වහං**: සැප ගෙන දෙයි.

සිත අතිශයින් ම සංකීර්ණ හෙයින් දමනය අසීරුය. එය ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් කැමති කැමති අරමුණුවල රැඳෙයි එය දමනය කර ගත හොත් සුවදායක ය.

**විවරණය**

**දුන්නිග්ගහස්ස: යත්ථ කාමනිපාතිනො**: දමනයට අපහසුකම හා තමා ප්‍රිය කරන ඕනෑම අරමුණක් ගැනීම සිතෙහි ප්‍රධාන ලක්ෂණ දෙකක් ලෙස මෙහි දැක්වෙයි. සිත තරම් වේගයෙන් ක්‍රියා කරන වෙනත් දෙයක් නැති තරම්. එහෙයින් එය ග්‍රහණය කර ගැනීම අපහසු ය. සිත යම් අරමුණක් කරා යාම නවතා ගැනීම උසස්ම ආධ්‍යාත්මික ශික්ෂණයකින් යුක්ත උත්තමයකුට මිස අපහසු ය. විශේෂයෙන් ම සාමාන්‍ය පෘථග්ජනයෝ චිත්ත වේගයන්ට අවනත වෙති. චිත්ත වේග සමග අනනය නො වී, ඊට නතු නො වී, ඒවා හඳුනාගන්නට සමත් වීම අවශ්‍ය ය. ඒවා ඇතිවන අයුරු හා නැතිවන අයුරු නිරීක්ෂණය භාවනාවක් වෙයි.





*නුවණැත්තා නො දැක්ක හැකි වූ ඉතා සියුම් වූ සිත රැක ගනී. ඒ සැප ලැබීමට හේතු වේ.*

36. සුදුද්දසං සුනිපුණං
යත්ථ කාමනිපාතිනං
චිත්තං රක්ඛෙථ මෙධාවී
චිත්තං ගුත්තං සුඛාවහං (3:4)

දැක්ම අමාරුයි තියුණුයි
සිත රිසි තැන්වල නවතියි
නුවණැත්තා එය සුරකියි
රැක ගත් සිත සුව ගෙන එයි.

# රැක ගත් සිත සුව ගෙන දෙයි
## 3 (3) උකටලී වූ භික්ෂුනමක ගේ කතාව (36 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සිටුවරයකු ගේ පුත්‍ර **තරුණ භික්ෂුනමක්** පැවිදි ජීවිතයෙහි කළකිරීම නිමිති කරගෙන භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළ හ.

බුදුරදුන් සැවැත් නුවර වසන සමයෙහි එක් සිටුවරයකු ගේ තරුණ පුත්‍රයෙක් තම නිවසට පිඬු සිඟා පැමිණි හිමි නමක් අමතා මෙසේ කීවේ ව. "සමිඳුනි, මම දුකින් මිදෙන්නට කැමැත්තෙමි. මට ඒ සඳහා මාර්ගය පැහැදිලි කළ මැනවි." ඒ ඇසූ හිමිනම ඔහුට "ඔබට යහපතක් ම වේවා සිටු පුත්‍රය. දුකින් මිදෙන්නට අවශ්‍ය නම්, දන් දෙන්න. පිණ්ඩපාතය, අඩ මසකට වරක් දෙන දානය, වස් දානය ආදී දන් දෙන්න. වැසි කාලයට පන්සල් කරවා දෙන්න. සිවු පසය පිරිනමන්න. ඔබේ දේපළ තුනට බෙදා එක් කොටසකින් ව්‍යාපාර කරන්න. තව කොටසකින් අඹුදරු පෝෂණය කරන්න. ඉතිරි කොටස පින්කම් සඳහා යොදවන්න."

"යහපති, හිමියනි" යි පැවසූ සිටු පුත්‍රයා උන්වහන්සේ දුන් උපදෙස් අනුව ම ක්‍රියා කළේ ය. ඒ සියල්ල පිළිපැද නිම කළ හෙතෙම "ස්වාමීනි, තවත් මා කළ යුතු යමක් තිබේ දැ" යි ප්‍රශ්න කළේ ය. "එසේ නම් තරුණය, තිසරණ-පන්සිල් සමාදන්ව රකින්න" යි අවවාද කරන ලදී. ටික කලක් එසේ කළ සිටු පුත්‍රයා "මෙයටත් වැඩි යමක් කරන්නට ඇත්දැ"යි විමසා සිටියේ ය. "එසේ ය" යි පැවසූ හිමිනම "දස සිල් සමාදන් වන්න" යි අවවාද කළේ ය. එය ද පිළිගත් සිටු පුත්‍රයා දසසිල් ආරක්ෂා කිරීමට පටන් ගත්තේ ය. ඔහු මෙසේ එකින් එක, පියවරින් පියවර පුණ්‍ය කටයුතුවල නිරත වීම හේතුවෙන් ඔහුට 'අනුපුබ්බ' යන නම ද යෙදිණි. ඊළඟ වතාවේ "සමිඳුනි, මා කුමක් කරන්නදැ" යි විමසූ විට ලැබුනු පිළිතුර වූයේ "දැන් ඔබ පැවිදිවන්න" යන්න ය.

භික්ෂූන් වහන්සේ ගේ අවවාදය පරිදි ගිහි සුව හැර දමා හෙතෙම පැවිදි බිමට එළැඹුණේ ය. පැවිදි වූ පසු උන්වහන්සේට අභිධර්මය පිළිබඳ විශේෂඥ වූ ආචාර්යයන් වහන්සේ නමක් ද විනය පිළිබඳ විශේෂඥවූ උපාධ්‍යාය නමක් ද ලැබිණි. උපසම්පදාව ලත් පසු ආචාර්‍යයන් වහන්සේ බැහැ දකින්නට යන හැම අවස්ථාවේ ම ඔහුට අභිධර්මයට අනුකූල ධර්ම විවරණ අසන්නට ලැබේ. "අභිධර්මයට අනුව මේ මේ විදියට හැසිරීම උචිතය. මේ මේ විදියට ජීවත් වීම අනුචිතය. මෙසේ කරන්න. මෙසේ නො කරන්න." ආදී උපදේශ රාශියක් ලැබේ. තම උපාධ්‍යයයන් වහන්සේ හමුවට යන හැම විට ම අසන්නට ලැබෙන්නේ "විනයට අනුව මේ මේ දේ අකැපය. මේ මේ දේ කැපය. ඔබ මේ මේ දේ කළ යුතුය. මේ මේ දේ නො කළ යුතුය වැනි උපදෙස් ය." කාලයා ගේ ඇවෑමෙන් හිමිනමට මෙසේ සිතිණ. "මේ මොන කරදරයක් ද? මා පැවිදි වූයේ දුකින් මිදීම පිණිස ය. එහෙත් දැන් මට අතක් පයක් හොළවන්නටවත් නිදහසක් නැත. ගිහි ගෙදර වාසය කරමින් වුවත් දුකින් මිදීමට අමාරුවක් නැත. මා ආපසු ගිහි ගෙදරට යා යුතු ය." භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුව අමතා "මහණ, ඔබ උකටලී වූවා නොවේ දැ" යි විමසූ හ. "එසේ ය, ස්වාමීනි, මම දුකින් මිදීම පිණිස පැවිදි වීමි. එහෙත් මෙහි අතක් පයක් සොලවන්නටවත් නිදහසක් නැත. මට ගිහි ගෙයි සිටත් දුකින් මිදී ගත හැකි වෙයි" යනු භික්ෂු නමගේ පිළිතුර විය.

"මහණ, ඔබට එකක් රකින්නට හැකි වෙයි නම් සෙසු කිසිවක් රකින්නට උවමනා නො වේ" යි බුදුහු වදාළ හ. "ඒ කුමක් ද, සමිඳුනි?" "ඔබට සිත රැක ගත හැකි ද?" "මට හැකි වෙයි ස්වාමීනි," එසේ නම් ඔබේ සිත රැක ගන්න" යි භාග්‍යවතුන් වහන්සේ අවවාද කළ හ.

### විවරණාත්මක අනුවාදය (36 වන ගාථාව)

**සුදුද්දසං සුනිපුණං යත්ථ කාමනිපාතිනං චිත්තං මෙධාවී**
**රක්ඛේථ ගුත්තං චිත්තං සුඛාවහං**

**සුදුද්දසං**: දැක ගැනීම අතිශයින් ම දුෂ්කර වූ; **සුනිපුණං**: අතිශයින් ම සූක්ෂ්ම වූ; **යත්ථ කාමනිපාතිනං**: රිසි රිසි හැම තැන රැඳෙන්නා වූ; **චිත්තං**: සිත; **මෙධාවී**: නුවණැත්තා; **රක්ඛේථ**: රැක ගත යුත්තේ ය; **ගුත්තං**: ආරක්ෂා කරගත්; **චිත්තං**: සිත; **සුඛාවහං**: සැප ගෙන එන්නේ ය.

සිත දැක ගැනීම අතිශයින් ම දුෂ්කරය. එහි ක්‍රියා කාරිත්වය ඉතා සියුම් ය. එය කැමති කැමති අරමුණු වල රැඳෙයි. එබඳු වූ සිත ඥාණවන්තයන් විසින් රැක ගත යුතු ය. රැක ගත් සිත සැප ගෙන එයි.

### විවරණය

**සුදුද්දසං සුනිපුණං**: දුර්දශ බව හා සූක්ෂමත්‍වය සිතෙහි ලක්‍ෂණ දෙකකි. සිත අති විශ්මය ජනක කාර්‍යයන් රාශියක් කරන නමුත් එය දැක ගත නො හැකි. එහෙත් එම සිත නරක අරමුණු කරා යා නොදී රැකගත හැකි නම්, එය මහත් ලාභයකි.





*බොහෝ දුර දිවෙන, ගමන් ඇති, තනිව හැසිරෙන සිත රැකගන්නාහු මර බැඳුමෙන් මිදෙත්.*

37. දූරඞ්ගමං ඒකචරං
අසරීරං ගුහාසයං
යෙ චිත්තං සඤ්ඤමෙස්සන්ති
මොක්ඛන්ති මාරබන්ධනා (3:5)

දුර ගමන් යන, තනිව හැසිරෙන
නැතිව සිරුරක්, ගුහා නිවසන
කළෝතින් සිත යමෙක් සංවර
බිඳ හරියි හේ මාර උවදුර

# කළ සිත සංවර - නැත මර උවදුර

## 3 (4) සංඝරක්ඛිත හිමියන් ගේ කථා වස්තුව (37 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වෙසෙමින් සංඝරක්ඛිත හිමියන් ගේ බෑණා වූ **භාගිනෙය්‍ය සංඝරක්ඛිත හිමි** අරබයා මේ ගාථාව දේශනා කළ හ.

සැවැත් නුවර සංඝරක්ඛිත නමින් එක් ජ්‍යෙෂ්ඨ හිමි නමක් විසූ හ. උන්වහන්සේ ගේ සහෝදරියට උපන් පුතාට සංඝරක්ඛිත හිමියන් ගේ නම ම ගෞරවය පිණිස තබන ලදී. එහෙයින් හේ භාගිනෙය්‍ය සංඝරක්ඛිත නමින් ප්‍රකට විය. වැඩිවියට පත් වූ පසු ඔහු ද පැවිදි කරවන ලදී. සිය ගමෙහි ම ආරාමයේ වැඩ විසූ 'තරුණ සංඝරක්ඛිත හිමියනට වරක් සිවුරු දෙකක් පිරිකර වශයෙන් ලැබිණි.

ඉන් එකක් තම මාමාට පූජා කරනු රිසි වූ හෙතෙම වස් කාලය අවසානයේ උන්වහන්සේ සොයා ගොස් එය පිළිගැන්වී ය. එහෙත්, තමන්ට ඇති පමණ සිවුරු තිබේ යයි පැවසූ සංඝරක්ඛිත හිමියෝ එය නො පිළිගත් හ. නැවත නැවත පෙරැත්ත කළ ද පිළිගනු නො ලැබිණ. මෙයින් බලවත් කළකිරීමට පත් භාගිනෙය්‍ය සංඝරක්ඛිත හිමියෝ තමන් පිදූ පිරිකරක් පිළිගන්නට තරම් වත් කාරුණිකත්වයක් නො ලැබ පැවිද්දේ විසීමෙන් කවර ප්‍රයෝජනයක් දැයි සිතමින් සිවුරු හැර දමා ආපසු ගිහි ජීවිතයට යන්නට රිසි වූ හ.

එම සිතුවිල්ල හා ම සිතුවිලි වැලක් උන්වහන්සේ ගේ සිතට ගලා ආවේ ය. "සිවුරු හැර ගොස් මේ සිවුර විකුණා ඒ මුදලින් එළු දෙනක මිලට ගනිමි. ඇය පැටවුන් බිහි කරනු ඇත. ක්‍රමයෙන් යමක් කමක් එකතු වූ පසු මම විවාහයක් කර ගනිමි. මගේ බිරිඳ පුතකු ලබා දුන් විට බිරිඳත් පුතාත් කරත්තයක නංවාගෙන මාමා වූ සංඝරක්ඛිත හිමියන් බලන්නට යමි. මගදී මම දරුවා වඩා ගන්නට රිසි වෙමි. මගේ බිරිඳ "ඔබ කරත්තය දක්කන්න. දරුවා මම බලා ගන්නෙමි" යි කියනවා ඇත. මම දරුවා ඇය ගෙන් උදුරා ගනිමි. එහෙත් දරුවා මා අතින් වැටුණ හොත්! කරත්ත රෝදය දරුවා ගේ ඇඟ මතින් යනු ඇත. මට දැන් කේන්තියක් එයි. එවිට මම බිරිඳට කෙවිට පහරක් දෙමි."

මේ සිතුවිලි ගලා එනවිට භාගිනෙය්‍ය සංඝරක්ඛිත හිමියන් සිටියේ මාමා වූ හිමියන්ට පවන් සලමිනි. මුළුමනින් ම සිතුවිලි දහරෙනි වෙලී සිටි හේ බිරිඳට කෙවිටි පහර දෙමි යයි සිතා පවන් සලන අවානෙන් මාමාට පහරක් ගැසී ය. පරසිත් දැනීමෙහි දක්ෂව සිටි සංඝරක්ඛිත තෙරණුවෝ " බිරිඳට කෙවිටි පහර දෙන්නට බැරි වුණු නිසා මහලු හිමි නමකට පහර දුන්නා නො වේ ද?" යි ප්‍රශ්න කළ හ. එයින් විස්මයට මෙන් ම බියට ද පත් තරුණ භික්ෂුව පැන දිවුවේ ය. එහෙත් ආරාමයෙහි විසූ තරුණ සාමණේර හිමිවරු ඔහු අල්ලා ගත් හ. අවසානයේ දී තරුණ සංඝරක්ඛිත හිමි බුදුරදුන් හමුවට පමුණුවන ලදී.

මේ සිද්ධිය බුදුරජාණන් වහන්සේට දැනුම් දුන් පසු උන්වහන්සේ "සිත, ඈත දුර පවත්නා දෙයක් වුව සිතීමේ ශක්තිය ඇත්තක් බවත්, එම සිත කෙලෙස් බැම්මෙන් මුදා ගැනීම පිණිස දැඩි ප්‍රයත්නයක් දැරිය යුතු බවත් පැහැදිලි කළ හ. මෙහි එන ගාථාව දේශනා කරනු අසා සිටි තරුණ හිමි නම සෝවාන් ඵලයෙහි පිහිටියේ ය.

### විවරණාත්මක අනුවාදය (37 වන ගාථාව)

**දූරඞ්ගමං ඒකචරං අසරීරං ගුහාසයං චිත්තං යෙ සඤ්ඤමෙස්සන්ති (තෙ) මාරබන්ධනා මොක්ඛන්ති.**

**දූරඞ්ගමං**: දුර ගමන් යන; **ඒකචරං**: තනිව හැසිරෙන; **අසරීරං**: ශරීරයක් නැති; **ගුහාසයං**: නිලීනව සිටින; **චිත්තං**: සිත; **යෙ**: යමෙක්; **සඤ්ඤමෙස්සන්ති**: සංවර කර ගනිත් ද; (**තෙ**: ඔවුහු); **මාරබන්ධනා**: මාරයා ගේ බැම්මෙන්; **මොක්ඛන්ති**: මිදෙති.

දුර ගමන් යන, තනිව හැසිරෙන, ශරීරයක් නැති ගුප්ත වූ මේ සිත සංවර කර ගන්නට යමකුට හැකි නම් මරුවා ගේ බැම්ම වූ සංසාරයෙන් මිදෙන්නට ඔවුනට හැකි වෙයි.

### විවරණය

**දූරඞ්ගමං ඒකචරං අසරීරං ගුහාසයං**: මිනිස් මනසෙහි තවත් අපූර්ව ලක්ෂණ කිහිපයක් මේ ගාථාවෙන් අපට හඳුන්වා දෙනු ලැබේ. ලොව කවර තැනකට වුව ද ක්ෂණයකින් යාමේ හැකියාව සිතට ඇත. එයට ශරීරයක් නැත. ඒකචාරී බව යන්නෙන් අදහස් කරන්නේ එක් ක්ෂණයකදී සිතනු ලබන්නේ එක් අරමුණක් ගැන පමණක් බව ය. අසරීරං යන්නෙන් එයට අවකාශය තුළ භෞතික ශරීරයකට මෙන් ඉඩ කඩක් අනවශ්‍ය බව හැඟවේ. චිත්තය ක්‍රියාකාරිත්වයක් මිස ද්‍රව්‍යයක් නොවන හෙයිනි. ගුහාසයං හෙවත් නිලීනව සැඟවී සිටීම යන්නෙන් එය ස්පර්ශ කිරීමට හෝ පංච ඉන්ද්‍රියානුසාරීව පැහැසීමට සොයාගත නො හැකි බව හැඟවේ.





*නො තිර, සදහම් නො දත්, ඉපිලෙන (පැන පැන යන) සිතැති සැදැහැත්තාට නුවණ නො වැඩේ.*

38. අනවට්ඨිතචිත්තස්ස
සද්ධම්මං අවිජානතො
පරිප්ලවපසාදස්ස
පඤ්ඤා න පරිපූරති (3:6)

නැත හොත් සිත වී තහවුරු
දහමත් කර නැත්නම් හුරු
සැලෙන සැදැහැ ඇති ඒ අය
ප්‍රඥාවෙන් නොමවෙති සරු

# සිත නිති සැලෙතොත් - නුවණත් නො වැඩෙත්

## 3 (5) චිත්තහත්ථ හිමියන් ගේ කථා වස්තුව (38 සහ 39 ගාථා)

ජේතවනාරාමයෙහි වැඩ වාසය කළ භාග්‍යවතුන් වහන්සේ **චිත්තහත්ථ** නම් හිමිනමක් ඇරබ මේ ගාථා යුග්මය දේශනා කළ සේක.

සැවැත් නුවර වැදගත් පවුලක උපන් ගව පාලක තරුණයෙක් නැතිවුණු ගවයකු සොයා වනයට පිවිසියේ ය. ඔහු එහි මෙහි ඇවිද දුකසේ ගවයා සොයා ගන්නා විට මධ්‍යාහ්නය විය. ගමන් වෙහෙස හා හිරු රශ්නය නිසා පීඩිතව සිටි ඔහුට දැඩි කුස ගින්නක් දැනිණ. පිපාසය ද බලගතු ය. කෙසේ අහරක් සොයා ගනිම්දැයි සිතූ ඔහුට වනගත ආරාමයේ බවුන් වඩන තෙරවරුන් සිහිපත් විය. උන්වහන්සේලා ගෙන් කෑමට යමක් ලබා ගත හැකි වෙතියි සිතූ හෙතෙම එහි ගියේ ය. ඒ වන විට භික්ෂූන් වහන්සේලා දන් වළඳා නිම ව තිබිණ. තවත් ආහාර ඉතිරිව ඉවත ලන්නට සැරසෙන මොහොතේ ඔහු එහි ආ හෙයින් ඔහු ගේ දුක්ඛිත ස්වරූපය දුටු භික්ෂූහු අනුකම්පාවෙන් ඔහු ඇමතූ හ. "ඔබට කුසගිනි පාටයි. මේ ආහාර කැමති පරිදි භුක්ති විඳින්න"යි ඔවුහු පැවසූ හ. (භාග්‍යවතුන් වහන්සේ ධරමාණ සමයෙහි සැදැහැවතුන් නිර්ලෝභීව දාන මානාදිය සැපයූ හෙයින් අවශ්‍යතාවටත් වඩා ලැබීම සිරිතක් විය.) ඇති පමණ රසවත් අහරින් සැනසුණු තරුණ තෙම දෑත් සෝදා පැන් බී සුවපත්ව "සමිඳුනි, අද මහා දානමය පුණ්‍යකර්මයකට වැඩම කළා ද?" යි ඇසී ය. "නැත, උපාසකය, දිනපතා අපට දායකයෝ දානය රැගෙන එති" යි හිමිවරු පිළිතුරු දුන් හ.

තරුණයා හිමිවරුන්ගෙන් එය විශේෂ දිනයක පිදෙන සාංඝික දානමය පුණ්‍ය කර්මයක අවශේෂය දැයි විමසා සිටියේ එදින ආහාරය එතරම් ම ප්‍රණීත වූ හෙයිනි. දිනපතා ලැබෙන සාමාන්‍ය දානය එසේ ම ප්‍රණීත බව දැනගත් විට ඔහුට මෙසේ සිතිණ. "අපි දිනපතා කෙසේ හෝ වෙහෙස මහන්සි වී උපයමු. එහෙත් මෙතරම් රස බොදුන් වළඳමින් සුවසේ වසන්නට අපට හැකියාවක් නැත. කුමට දුක් විඳිමින් මහන්සි වෙමු ද? පැවිදි වුව හොත් දවස ගාණේ රස අහර වළඳමින් පහසුවෙන් විසිය හැක. මම ද පැවිදි වෙමි" එසේ සිතූ හේ භික්ෂූන් වහන්සේලා අමතා "ස්වාමීන් වහන්ස, මම පැවිදිවනු කැමැත්තෙමි" යි පැවසීය. "යහපති, උපාසකය, අපි ඔබ පැවිදි කරමු" යි පැවසූ හිමිවරු ඔහු පැවිදි කළ හ.

පැවිදි වූ හෙතෙම ආරාමයෙහි වතාවත් ආදිය කරමින් ටික දිනක් පැවිදි දම් පිරී ය. වැඩි වෙහෙසක් නැතිව සුවසේ ප්‍රණීත භෝජන වළඳමින් විසූ හෙයින් ඒ ටික කාලය තුළ හේ පියකරුව, කාය ශක්තිය වැඩී සුවපත් බවට පත් විය. තම ශරීරයේ ප්‍රසන්න ප්‍රමුදිත බව දැක "පැවිදි ජීවිතයෙන් ඇති ඵල කිම? මම නැවත ගිහි ගෙට යමි" යි සිවුරු හැර දමා සිය නිවසට ම ගියේ ය. එහෙත් නැවත සුපුරුදු පරිදි සිරුර වෙහෙසා වැඩ කරන විට නොබෝ දිනකින් ම ඔහු ගේ සිරුර කෘශව ගියේ ය. පෙර වූ පහන් බව හීන විය. "මෙසේ දුක් විඳ වෙහෙසෙන්නේ කුමට ද? මම යළිත් පැවිදි වන්නෙමි" යි සිතූ හේ නැවත භික්ෂූන් වෙත ගොස් පැවිදි විය. නැවත ද ටික දිනකින් සිරුර ප්‍රසන්නව මහත්ව ප්‍රමුදිත වූ විට "කුමට මේ පැවිදි ජීවිතයේ හිරිහැර විඳිම් ද?"යි සිතා යළිත් ගිහිගෙට ආවේ ය. ගිහිගෙයි මහන්සි වී වැඩ කරන ඔහුට සිරුර යළිත් වැහැරී වෙහෙස දැනෙන විට යළිත් පැවිදි ජීවිතයේ මිහිර මතක් විය. යළිත් හේ ආරාමය කරා ගොස් පැවිදි විය. මෙසේ වරින් වර ආශ්‍රමයෙන් ගිහිගෙයටත්, ගිහි ගෙයින් ආශ්‍රමයටත් මාරුවන ඔහු ගේ චර්යාව දුටු අනෙකුත් හිමිවරු "මෙතෙම සිත විසින් මෙහෙයනු ලබයි" යි පවසමින් 'චිත්තහත්ථ' නම් කළ හ.

නිතර නිතර නිවසටත් ආරාමයටත් මාරුවෙමින් වසන අතරතුර චිත්තහත්ථ ගේ බිරිඳ ගැබ් ගත්තා ය. ඔහු නිවසට ආපසු එන එක් දිනක බිරිඳ මෝරා ගිය ගැබ් ඇතිව ඇඳෙහි නිදා සිටියා ය. ඇය ගේ ඇඳිදවත් ලිහිල්ව තිබිණ. මුව අයා ගෙන නිදා සිටි ඇය ගේ මුවින් කෙළ වැගිරෙමින් පැවතිණ. ගැබ් ගැනීම නිසා ඉදිමී තිබුණ අත පය ඔහු තුළ රාගය වෙනුවට පුගුප්සාවක් ජනිත කළේ ය.

"පැවිදිවන හැම වතාවක ම මැය ගේ රූ සපුව ගැන සිතා මම ගිහි ගෙට ඇදුණෙමි. ඒ සුන්දරත්වයට කුමක් වී ද? මෙලොව සියළු විසිතුරු තාවකාලික ය. සියල්ල අනිත්‍යය. පැවිදි ජීවිතයේ සමෘද්ධියක් ලබන්නට මා අසමත් වූයේ මේ සත්‍යය පසක් නො කළ නිසා නො වේ ද?" යි සිතූ හෙතෙම කහ සිවුර යළිත් බඳවටා ඔතා ගෙන ඉක්මන් ගමණින් ආරාමයට යනු පිණිස නික්මුණේ ය.

සිවුරත් ඉණේ ඔතාගෙන පන්සල දෙසට දුවන බෑණා දැක විස්මයට පත් ඔහු ගේ බිරිඳගේ මව මේ හදිසි කලකිරීමට හේතුව දැනගනු වස් නිවස තුළට පිවිස තම දියණිය ගේ නින්ද දැක කරුණු තේරුම් ගත්තා ය. දියණිය පිබිදවූ ඕ "ඔබ නිදාගත් පිළිකුල් සහගත ස්වභාවය දැක චිත්තහත්ථ ආපසු ගියා. ගිය විදියෙන් නම් මට හිතෙන්නේ ආපසු එන එකක් නෑ කියලයි" පැවසුවා ය. "අම්මා කලබල වෙන්න එපා. එයා ගෙ හැටි මම දන්නවා. තව ටික දවසකින් ආපසු එයි." පැවසූ දියණිය නැවත නින්දට වැටුණා ය.

**විවරණාත්මක අනුවාදය (38 වන ගාථාව)**

**අනවට්ඨිත චිත්තස්ස සද්ධම්මං අවිජානතො**
**පරිප්ලවපසාදස්ස පඤ්ඤා න පරිපූරති.**

**අනවට්ඨිත චිත්තස්ස**: ස්ථාවර නො වූ සසල සිතැති; **සද්ධම්මං**: සද්ධර්මය; **අවිජානතො**: නො දන්නා; **පරිප්ලවපසාදස්ස**: චංචල වන පැහැදීම ඇති තැනැත්තා ගේ; **පඤ්ඤා**: නුවණ; **න පරිපූරති**: වර්ධනය නො වේ.

යම් කිසි පුද්ගලයකු ගේ සිත නිතර චංචල වේ නම්, ධර්මාවබෝධය මඳ හෙයින් ප්‍රසාදය නිතර අඩු වැඩි වේ නම්, එවැන්නහු ගේ ප්‍රඥාව වර්ධනය නො වේ.



*රාගයෙන් නො තෙත් වූ කෝපයෙන් දැඩි නොවූ සිත් ඇති, පින් පව් දුරැලූ රහතුනට කෙළෙස් බිය නැත.*

39. අනවස්සුත චිත්තස්ස
අනන්වාහත චේතසො
පුඤ්ඤපාපපහීණස්ස
නත්ථි ජාගරතො භයං (3:7)

කෙළෙසුන් ගෙන් සිත නො තෙමුණු
වෛර කිරීමෙන් නො තැළුණු
පින් - පවු දෙකමත් දුරු කළ
අය බය නැති වෙති පිබිදුණු

# සිත පිබිදුණු අය - දුරු කර ලති බය.

## 3 (5) චිත්තහත්ථ හිමියන් ගේ කථා වස්තුව (38 සහ 39 ගාථා) (ඉතිරි කොටස)

චිත්තහත්ථ ගේ සිතෙහි ඇති වූ පුජුප්සාව ඉතා දැඩි විය. මග දිගේ ම ඔහු සිතමින් ගියේ "ලොව සියල්ල තාවකාලිකය, අනිත්‍ය ය. ඒ හැමකෙක් ම දුක ය." යනුවෙනි. එය ඔහුට භාවනාවක් විය. මඟදී ම හෙතෙම සෝවාන් ඵලය ලද්දේ ය. ආරාමයට ගිය හේ "මා නැවත පැවිදි කළ මැනවි'' යි ඉල්ලා සිටිය ද භික්ෂූහු ඊට කැමති නො වූ හ. "මේ අන්තිම වාරයයි. මෙවර ආපසු නො යමි. අන්තිම වතාවට මා පැවිදි කරන්න" යි නැවත නැවත ආයාචනා කළ විට, ඔහු ආරාමයේ කුඩු මහත් කටයුතු සැලකිල්ලෙන් කරන බව මෙනෙහි කළ හිමිවරු චිත්තහත්ථ යළිත් පැවිදි කළ හ.

දින කීපයක් ගත වත්ම චිත්තහත්ථ බවුන් වඩා ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය පෑමේ ශක්තිය ද ඇති මහ රහත්නමක් බවට පත් වූයේ ය. චිත්තහත්ථ හිමියන් උපැවිදි වීමක් ගැන නොසිතා දිගට ම පැවිද්දේ රැඳී සිටිනු දුටු විහාරවාසී හිමිවරු විස්මයට පත්ව "චිත්තහත්ථ, කවුදාද ඔබ ගෙදර යන්නේ? ඔබට ම හිතෙන්න ඕන නේද? මෙවර නම් හුගක් දිග කාලයක් මෙහෙම හිටියා නේ ද?" යි ප්‍රශ්න කළ හ. "හිමිවරුනි, ලෞකික ආශාවලින් වෙලී සිටි දවස්වල මම එහෙම ගියා. දැන් මම ඒ ආශා දුරු කරලා දැන් ඉතින් ගෙදර යන අදහසක් නැහැ" යි චිත්තහත්ථ හිමියෝ පිළිතුරු දුන් හ.

චිත්තහත්ථ හිමියන් බුදුරදුන් වෙත කැඳවා ගෙන ගිය භික්ෂූන් වහන්සේ උන්වහන්සේ අමතා මෙසේ කී හ. "බුදුරජාණන් වහන්ස, අපි මේ චිත්තහත්ථට මෙසේ කීමු. උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ. තමන් කෙලෙසුන්ගෙන් මිදුණු බවක් උන්වහන්සේ හැඟවුවත් එය ඇත්ත විය නොහැක" එහෙත් භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, ම පුතණුවන් ගේ සිත සසලව පැවති බව සැබෑ ය. සද්ධර්මය අවබෝධ නොවූ තාක් හෙතෙම ගියේ ය. ආවේ ය. එහෙත් දැන් හෙතෙම පුණ්‍ය පාප දෙකින්ම විමුක්ත වූයේ ය." යි වදාළ සේක.

**විවරණාත්මක අනුවාදය (39 වන ගාථාව)**

**අනවස්සුතචිත්තස්ස අනන්වාහතචේතසො පුඤ්ඤපාප පහීණස්ස ජාගරතො භයං නත්ථි.**

**අනවස්සුතචිත්තස්ස**: සිත රාගයෙන් තෙත් නො වූ; **අනන්වාහතචේතසො**: ද්වේෂයෙන් නො කෙළෙසුණු සිත් ඇති; **පුඤ්ඤපාප පහීණස්ස**: පින් පව් දෙක ම දුරු කළ තැනැත්තා හට; **ජාගරතො**: අවදියෙන් සිටීම හේතුවෙන්; **භයං නත්ථි**: බියක් නො මැත.

සිත රාගයෙන් තෙත් කර නොගත් ද්වේෂයෙන් පළුදු කර නොගත් පුණ්‍ය-පාප දෙකම දුරු කළ, නිතර අවදියෙන් සිටින පුද්ගලයාට බියක් නැත.

**විවරණය**

**අනවට්ඨිතචිත්ත**: යන්නෙන් සාමාන්‍ය පුද්ගලයන් ගේ තැන්පත් නො වූ සිත අදහස් වෙයි. ඔවුන් ගේ සිත ඒකාග්‍ර නැත. සමාධිගත නැත. එබඳු චංචල සිතක් ඇත්තහුට ආර්‍ය්‍ය මාර්ගයේ ඉදිරි ගමන නියත නැත.

**සද්ධම්මං අවිජානතො**: යන්නෙන් තථාගතයන් වහන්සේ ගේ උතුම් ධර්මය නොදන්නා පුද්ගලයා

**පරිප්ලවපසාදස්ස**: නම් ශ්‍රද්ධාව නිතර නිතර අඩු වැඩි වන බවයි. වරින් වර පැහැදීම වෙනස් කර ගන්නා විට ශීඝ්‍ර හා සමබර ප්‍රගතියක් ලබා ගැනීම දුෂ්කර වෙයි.

**අනවස්සුතචිත්ත**: නම් රාගයෙන් සිත තෙත් නො වූ බවයි. එය උතුම් ගුණයකි. සිත තුළට ගංවතුරක් ගලා එන පරිද්දෙන් රාගය ගලා ඒමට ඉඩ ඇත. එසේ සිදු වන්නේ රූප ශබ්ද ගාන්ධාදිය විෂයෙහි දක්වන ප්‍රතිචාර හේතුවෙනි.

**අනන්වාහතචේතසො**: රාග ද්වේෂාදියෙන් නො මැඩුණු සිත අනන්වාහත සිතයි. මෙබඳු ක්ලේශයන් ගෙන් සිත දූෂිත නො වූ විට එය යහපත සඳහා යෙදැවිය හැකි ය.

**නත්ථි ජාගරතො භයං**: නිරතුරුව පූර්ණ අවදිකම යන්නෙන් මෙහි අදහස් වන්නේ සිතට බලපෑම් කළ හැකි ක්ලේශ පිළිබඳ අවදිකමින් සිටීමයි. නිදි නොලබා සිටීමත් 'ජාගරතො' යන්නෙන් අදහස් නො කැරෙන බව මතක තබා ගත යුතු ය. සද්ධා, විරිය, සති, සමාධි හා ප්‍රඥා යන ගුණාංග පඤ්චකය නිරතුරුව පවත්නා හෙයින් අවදිකමින් සිටීම යැයි පැවසෙයි.

**පුඤ්ඤපාප පහීණස්ස** - පුණ්‍ය හා පාප යන සංකල්ප ඉක්මවා සිටීම යන්නෙන් තම හොඳ ක්‍රියා වුවත් භවය තුළදී විපාක ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් ක්‍රියා නො කිරීම අදහස් වෙයි. මෙය ඉතා උත්කෘෂ්ට වූ ආචාර ධර්මීය උපේක්ෂාවකි. ආත්ම විරහිත උපේක්ෂාවකි. දන්දීම කෙරෙහි හෝ දන් පිළිගන්නා පිළිබඳව හෝ දීමනාව පිළිබඳව හෝ කිසිම හැඟීමක් තබා නො ගත යුතු ය. රහතන් වහන්සේ පුනර්ජන්මය ඇති කරවන සකල විධ පුණ්‍ය-පාප ක්‍රියාවලින් ම විනිර්මුක්ත ය.

රහත් වහන්සේලා ගේ ක්‍රියා පුණ්‍ය හෝ පාප ගණයට නො වැටේ. උන්වහන්සේ අකර්මණ්‍ය බවක් මින් අදහස් වන්නේ නැත. උන්වහන්සේ සක්‍රිය ය. එහෙත් ඒ සියලු ක්‍රියා ආත්මාර්ථකාමයෙන් තොරව හුදු අන්‍යයන්ගේ යහපත ම අරමුණු කර ගෙන කරනු ලබන දේය. සාමාන්‍යයෙන් ඒවා හොඳ වැඩ වුව ද තමන්ට ප්‍රතිඵල දීම පිළිබඳ අර්ථයෙන් ගත් විට ඵලදායී ශක්තියෙන් තොරය. රහතන් වහන්සේට අතීත කර්ම විපාක දෙන බව සැබෑ වුව ද වර්තමාන කර්ම රැස්වීමක් නො මැත. රහතන් වහන්සේ ගේ චර්‍යාව හුදෙක් 'ක්‍රියා' ලෙස හැඳින්වේ. සියළු ධර්මයන් ගේ යථාර්ථය අවබෝධ කරගත් උන්වහන්සේ විසින් හේතු-ඵල චක්‍රය බිඳ දමා ඇත.





*සිරුර කළයක් මෙන්ද, සිත නුවරක් මෙන් ද ගෙණ නුවණ අවියෙන් කෙළෙස් මරු පරදවන්න.*

| | |
|---|---|
| 40. කුම්භූපමං කායමිමං විදිත්වා | මේ කය මැටි කළයක් සේ දැනගෙන |
| නගරූපමං චිත්තමිදං ඨපෙත්වා | මෙ සිතට නුවරක් උපමා කරගෙන |
| යොධෙථ මාරං පඤ්ඤායුධෙන | ප්‍රඥා යුධයෙන් මරුවා ජයගෙන |
| ජිතඤ්ච රක්ඛෙ - අනිවෙසනො සියා (3:8) | දිනූ දේ රැක ගත යුතු නො ඇලී ගෙන |

# මරු පරදන අවි

## 3 (6) පන්සියයක් හිමිවරුන් ගේ පුවත (40 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි **භික්ෂූන් වහන්සේ පන්සියයක්** අරබයා තථාගතයන් වහන්සේ මේ ගාථාව වදාළ සේක.

සැවැත් නුවර භික්ෂූන් වහන්සේලා පන්සිය නමක් භාග්‍යවතුන් වහන්සේ වෙතින් කමටහන ලබා ගෙන එහි සිට යොදුන් සියයක් පමණ දුරින් පිහිටි ස්ථානයකට පිටත්ව ගිය හ. එහි වූ භාවනානුයෝගීනට ගැළපෙන වන ලැහැබක නවාතැන් ගත් හ. එම වනයෙහි තුරු ලතාවන් හි රුක් දේවතාවෝ භික්ෂූන් වහන්සේලා එහි වසත් නම් තම අඹු දරුවන් සමග එහි විසීම අයෝග්‍යයැයි සිතමින් තුරුමතින් බිමට බට හ. ඔවුන් සිතුවේ භික්ෂූන් එදා රාත්‍රිය පමණක් එහි වසනු ඇත යනුවෙනි. එහෙත් දෙ සතියක් යන තුරුත් භික්ෂූන් එහි ම විසූ හෙයින් උන්වහන්සේලා මුළු වස් කාලයම එහි ගත කරන්නට ඉඩ ඇතැයි ඔවුනු තේරුම් ගත් හ. එසේ වුවහොත් ඔවුන්ට හා අඹු දරුවනට දිගු කලක් බිම වසන්නට සිදුවනු ඇත. එහෙයින් භික්ෂූන් බිය කොට පළවා හරින්නට තීරණය කර හොල්මන් හා විවිධ භයානක ශබ්ද ආදිය කරන්නට පටන් ගත් හ.

හිස් නැති ශරීර, ශරීර නැති හිස් ආදිය දැක්වූ හ. මෙයින් වියවුලට පත් භික්ෂූහු ඒ ස්ථානය අතහැර බුදුරදුන් හමුවට ආපසු ගියහ. උන් වහන්සේලා ගේ විස්තරය අසා සිටි භාග්‍යවතුන් වහන්සේ මේ සියල්ල සිදු වූයේ කිසි ආරක්ෂාවක් නැතිව ගිය හෙයින් බව ද, දැන් නිසි ආරක්ෂාවක් ඇතිව යා යුතු බව ද පැවසූ හ. එසේ වදාරා කරණීය මෙත්ත සූත්‍රය උගන්වා වදාළ හ. වනයට පිවිසෙන මොහොතේ සිට ආරාමය දක්වා ම මේ පිරිත සජ්ඣායනය කරන්නැයි ඔවුන්ට උපදෙස් ලැබිණ. භික්ෂූහු ද තමන් ලද උපදෙස් පරිදි සූත්‍රය සජ්ඣායනා කළ හ.

භික්ෂූන් වහන්සේලා මෙත්ත සූත්‍ර සජ්ඣායනය මගින් දේවතාවනට මෙත් වඩන විට දේවතාවෝ ද එයින් සොම්නසට පත්ව හිරිහැර කරනු වෙනුවට ගරුසරු ඇතිව භික්ෂු පිරිස ආදරයෙන් පිළිගත් හ. ඉන් පසු අප්‍රසන්න ශබ්ද හෝ හොල්මන් දක්නට නො ලැබිණ. මෙසේ යහපත් පරිසරයක් ඇති වූ පසු භික්ෂූහු කායගතා සති භාවනාව වඩා ශරීරයේ අනිත්‍යත්වය මනාව තේරුම් ගත් හ. භාග්‍යවතුන් වහන්සේ ද දෙව්රම් වෙහෙර වැඩ වසමින් ම භික්ෂූන් වහන්සේලා ගේ ප්‍රගතිය විමසා බලා තමන් වහන්සේ ඔවුන් අබියස පෙනී සිටින්නාක් මෙන් සෘද්ධියක් කර වදාරා 'මහණෙනි, ඔබ තේරුම් ගත් පරිද්දෙන් ම ශරීරය මැටි කළයක් මෙන් අනිත්‍ය ය. විනාශ වන සුලුය'' යි. අනුශාසනා කළ හ.

### විවරණාත්මක අනුවාදය (40 වන ගාථාව)

**ඉමං කායං කුම්භූපමං විදිත්වා ඉදං චිත්තං නගරූපමං ඨපෙත්වා පඤ්ඤායුධෙන මාරං යොධෙථ ජිතං ච රක්ඛෙ අනිවෙසනො සියා.**

**ඉමං කායං**: මේ කය; **කුම්භූපමං විදිත්වා**: කළයකට උපමා කොට තේරුම් ගෙන; **ඉදං චිත්තං**: මේ සිත; **නගරූපමං**: නගරයකට උපමා කොට; **ඨපෙත්වා**: සිත තබා ගෙන; **පඤ්ඤායුධෙන**: ප්‍රඥාව නැමති ආයුධයෙන්; **මාරං**: මාරයාට; **යොධෙථ**: පහර දෙන්න; **ජිතං**: ජයග්‍රහණය කොට; **රක්ඛෙ**: රැක ගන්න; **අනිවෙසනො**: බන්ධනය වන තැනක් නැතිව; **සියා**: වසන්න.

මේ ශරීරය කළයක් සේ සිතන්න. සිත නගරයකට උපමා කරගන්න. ප්‍රඥාව ආයුධය වශයෙන් ගෙන මරු පරදවන්න. දිනා ගත් දේ රැක ගන්න. කිසිවකට ඇලුම් බැඳුම් නො කරන්න.

### විවරණය

**කුම්භූපමං**: මනුෂ්‍ය ශරීරය කළයක් මෙන් බිඳෙන සුළු, නැසෙන සුළු බව සිතන්නට භික්ෂූන් වහන්සේලාට අවවාද කර ඇත.

**චිත්තං නගරූපමං**: සිත බල කොටු ප්‍රාකාර ආදියෙන් යුක්ත නගරයක් ලෙස දක්වා ඇත. බල කොටුවක විශේෂ ලක්ෂණය ඒ තුළ අගනා වස්තූන් පැවතීම ය. මුරකාවල් දුර්වල වුවහොත් බාහිර පුද්ගලයන්ට පැමිණ ඒ වස්තු පැහැර ගත හැක. සිත ද එසේ ආරක්ෂා කරනු නො ලැබුවහොත් බාහිර බලවේග නිසා කිලිටි වීමට ඉඩ ඇත.

**යොධේථ මාරං පඤ්ඤායුධෙන**: ප්‍රඥාව නම් ආයුධයෙන් මරුවා සමග සටන් කරන්න. රැකගත් නගරය වූ සිතට මාර සේනා පහර දෙන විට භාවිත කිරීමට ඇති එකම ආයුධය ප්‍රඥාවයි. එනම් සියළු ධර්මයන් ගේ යථා ස්වභාවය තේරුම් ගැනීමයි.






*මේ සිරුර සිත නැති කල වැඩකට නැත. දර කඩක් සේ පොළෝ මත හෝනේ ය.*

41. අචිරං වත'යං කායො
පඨවිං අධිසෙස්සති
ඡුද්ධො අපෙතවිඤ්ඤාණො
නිරත්ථං ව කලිඞ්ගරං (3:9)

ඇද වැටෙවි මිහිකත මත
වැඩි කල් නො ගොසින් මේ ගත
අතැර දැමූ, පහ වූ සිත
දිරූ ලී කඳක් මෙන් වත.

# සිත නැති ගත - වැඩකට නැත

## 3 (7) පූතිගත්තතිස්ස හිමියන් ගේ කතාව (41 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **තිස්ස නම් තෙර** කෙනකුන් නිමිති කොට ගෙන මේ ගාථාව වදාළ සේක.

බුදු පියාණන් වහන්සේ වෙතින් භාවනා කර්මස්ථාන ලබා ගෙන ශ්‍රද්ධාවෙන් හා උද්‍යෝගයෙන් භාවනා කරමින් සිටි තිස්ස තෙරණුවෝ හිටි හැටියේ රෝගී වූ හ. මුලින් සිරුර පුරා කුඩා බිබිලි මතු වී පසුව ඒවා ක්‍රමයෙන් විශාල වී පුපුරා ගියේ ය. සිරුර පුරා තුවාල ඇති විය. ඒවායින් ගලන සැරව හේතුවෙන් සිවුරු පෙඟී යන්නට පටන් ගත්තේ ය. සිරුර දුගඳ හමන්නට පටන් ගත්තේ ය. ශරීරයෙන් කුණු ගඳ හමන හෙයින් උන්වහන්සේට 'පූතිගත්ත තිස්ස' යන නම පවා යෙදිණ. (පූති = කුණු වූ, ගත්ත = ඇඟ)

දිනකට දෙ වරක් මහා කරුණාවෙන් ලොව විමසා බලන භාග්‍යවතුන් වහන්සේ ගේ කරුණා දිවැසට පූතිගත්ත තිස්ස තෙරණුවෝ හසු වූ හ. පූතිගත්ත තිස්ස තෙරණුවන් රහත් වීමට තරම් නුවණ මෝරා සිටි බව දුටු භාග්‍යවතුන් වහන්සේ "මේ තෙරණුවෝ සිය සබ්‍රහ්මචාරීන් විසින් අතහැර දමන ලද හ. මා හැර දැන් මොහුට පිහිටක් නැත" යි සිතූ හ. එසේ සිතා සුවඳ ගඳ කිළියෙන් නික්ම ගිනිහල් ගෙයට ගොස් ලොකු බඳුනක් සෝදා පිරිසිදු කර ජලය උණු කළ සේක. ජලය රත් වූ පසු උන් වහන්සේ තිස්ස හිමියන් වැතිර සිටි ඇඳ වෙතට ගියේ එම හිමියන් නාවනු පිණිස බැහැරට ගනු පිණිස ය. ඒ දුටු භික්ෂූහු වහා අවුත් "ස්වාමීනි, බුදුරජාණන් වහන්ස, අපි ඒ නම බැහැරට ගෙනෙමු" යි පවසා ඇඳ පිටින් ම ඔසවා උණුදිය නාන කාමරයට ගෙන ආහ. රෝගියා ගේ සිවුර ගළවා උණු දියෙන් සෝදන්නට සැලැස්වූ බුදුරජාණන් වහන්සේ ඒවා වේලෙන්නට දම්මවා, රෝගියා වෙත එළඹ උණුදියෙන් නෑවූ හ.

රෝගී හිමියන් කරුණාවෙන් මනාව නාවා පිරිසිදු කර නිම වන විට සිවුර වේලී තිබිණ, එය හඳවා අඳනය ද උණු වතුරෙන් සේදූ බුදුරජාණන් වහන්සේ එය ද අව්වේ දැමූ හ.අඳනය වියලෙන විට සිරුර ද වියලී තිබුණොත් එය හඳවා මනාව පිරිසිදුව පහන් සිත් ඇතිව සිටි තිස්ස තෙරුන් ගේ හිස සමීපයෙහි වැඩ හිඳිමින් භාග්‍යවතුන් වහන්සේ ඒ තෙරුන් ඇමතූ හ. "භික්ෂුව, ඔබේ ශරීරයෙන් සිත වෙන් වූ දින ගත මුළුමනින්ම නිෂ්ඵල දෙයක් වන්නේ ය. දර කොටයක් මෙන් මිහි මත වැටෙන්නේ ය" යි ධර්‍ම දේශනා කළ හ. දේශනාව අවසන තිස්ස තෙරණුවෝ රහත් ඵලයෙහි පිහිටිය හ. රහත් ඵලය ලත් නොබෝ වේලාවකින් ම උන්වහන්සේ පිරිනිවන් පෑ හ.

### විවරණාත්මක අනුවාදය (41 වන ගාථාව)

**අයං කායො වත අචිරං අපෙතවිඤ්ඤාණො ඡුද්ධො**
**නිරත්ථං කලිඞ්ගරං ඉව පඨවිං අධිසෙස්සති.**

**අයං කායො**: මේ ශරීරය; **වත**: ඒකාන්තයෙන්; **අචිරං**: වැඩි කල් යන්නට පෙර ම; **අපේත විඤ්ඤාණො**: පහ වූ සිත් ඇතිව; **ඡුද්ධො**: ඉවත ලන ලදුව; **නිරත්ථං**: වැඩකට නැති; **කලිඞ්ගරං**: දිරාගිය ලී කොටයක්; **ඉව**: මෙන්; **පඨවිං**: පොළොවෙහි; **අධිසෙස්සති**: පතිත වෙයි.

මේ සිරුර නොබෝ කලකින්ම සිත නිරුද්ධව ගිය පසු වැඩකට නැති දිරා ගිය ලී කොටයක් මෙන් ඉවත දමන ලදුව මිහි මත පතිත වනු ඇත.

#### විවරණය

**අචිරං වත**: වැඩිකල් යන්නට පෙර ස්ථිර වශයෙන් ම යන අර්ථයි. මේ ගාථාවෙන් මනුෂ්‍ය ශරීරයට අත්වන ඉරණම මනාව දක්වනු ලැබේ. නියත වශයෙන් ම එය ඉක්මණින් විනාශ වී යනු ඇත.

**ඡුද්ධො**: ඉවත ලන ලදුව. අපට කවර තරම් නෑදෑ හිතමිතුරන්, ආදරණීයයන් සිටිය ද මිය ගිය පසු කිසිවෙක් මළ සිරුර රැක නො ගනිති. එය වහාම ඉවත ලනු ලැබේ.

**නිරත්ථං කලිඞ්ගරං**: ඉවත ලන ලද සිරුර දිරා ගිය ලී කොටයක් වැනි ය. එයින් කිසි ම ප්‍රයෝජනයක් ගත නො හැක. ප්‍රාණය නිරුද්ධ වූ පසු ශරීරය නිෂ්ඵල ය. දිරා ගිය ලීය දරට ගත හැකි වුවත් ශරීරය දරටවත් ගත නො හැකි හෙයින් ශරීරය දිරූ ලී කොටයක් තරම් වත් ප්‍රයෝජනවත් නො වේ.



*සොර සතුරන් කරන විපතකට වඩා වරදෙහි යෙදු සිත බලවත් නපුරක් කරන්නේ ය.*

42. දිසො දිසං යං තං කයිරා
වෙරී වා පන වෙරිනං
මිච්ඡාපණිහිතං චිත්තං
පාපියො නං තතො කරෙ (3:10)

හොරෙක් හොරෙකුටත් සතුරෙක් සතුරකුටත්
හමු වූ විට දි පමුණති අති කුරිරු විපත්
මිසදිටු වැරදි පිළිවෙත යෙදැවුවොත් සිතත්
ලැබදෙනු නියත වෙයි ඊටත් වඩා විපත්.

# සිත නොමඟක යෙදැවුවොත් - ඉන් සිදුවේ දරුණු විපත්

## 3 (8) නන්ද ගෝපාලයන් ගේ වස්තුව (42 ගාථාව)

කෝසල රාජධානියේ එක් ගමකට වැඩම කළ අවස්ථාවෙහි භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව **නන්ද ගෝපාල** නිමිති කර ගෙන දේශනා කළ හ.

නන්ද අනාථපිණ්ඩික සිටාණන් ගේ ගවයන් බලා ගත් ගෝපාලයා ය. රැකියාවෙන් ගෝපාලයකු වුව ද ඔහුට තමන් ගේ ම ධනයක් ද තිබිණ. ඉඳ හිට අනේපිඬු සිටාණන් ගේ මැදුරට යන නන්ද එහිදී භාග්‍යවතුන් වහන්සේ ගෙන් දහම් ඇසීමට ද අවස්ථාව ලද්දේ ය. තම නිවසට වැඩම කරන සේ නන්ද භාග්‍යවතුන් වහන්සේට ආරාධනය කළේ ය. සුදුසු අවස්ථාවේදී පැමිණෙන්නෙමැයි භාග්‍යවතුන් වහන්සේ එහි වැඩම කිරීම කල් දැමූ හ.

ටික කලකට පසු නන්ද ගේ නිවසට වැඩම කිරීමට දැන් සුදුසු කල්යයි සිතූ භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන් පිරිවරා ඔහු ගේ නිවසට විශේෂයෙන් ම වැඩම කළ හ. භාග්‍යවතුන් වහන්සේ මහත් හරසරින් පිළිගත් නන්ද සත් දිනක් ම උන් වහන්සේට පස්ගෝ රසයෙන් සංග්‍රහ කළේ ය. සත්වන දින භාග්‍යවතුන් වහන්සේ කළ දම් දෙසුමට සවන් දීමෙන් නන්ද සෝවාන් වූයේ ය. එදින භාග්‍යවතුන් වහන්සේ ආපසු ගමන් ගන්නා විට නන්ද ද උන්වහන්සේ ගේ පාත්‍රය රැගෙන සෑහෙන දුරක් පසු ගමන් කළේ ය.

භාග්‍යවතුන් වහන්සේට වැඳ අවසර ගෙන ඔහු ආපසු සිය නිවස බලා එන ගමනේ දී වැද්දකු වරදවා විදි ඊතලයක් ඔහුට වැදිණි. හේ එතැනම මිය ගියේ ය. පසුව භික්ෂූන් වහන්සේලා විසින් ඒ බව භාග්‍යවතුන් වහන්සේට දැනුම් දෙන ලදී. "භාග්‍යවතුන් වහන්ස, නන්ද ඔබ වහන්සේට ඉතා ප්‍රණීත අන්දමින් දාන මානාදී පුද සත්කාර කළේ ය. එහෙත් ඔහුට මේ අනතුර වූයේ ඔබ වහන්සේ ආපසු ඇරලීම පිණිස පසු ගමන් කළ හෙයින් ය. ඔබ වහන්සේ එහි ගිය ගමන නො වූවා නම් ඔහුට මේ විපත නො වන්නට තිබිණ" යි ද උන්වහන්සේලා පැවසූ හ. "මහණෙනි, මා එහි නො ගියා වුව ද ඔහුට මේ විපත සිදුවන්නට තිබිණ. ඔහු ගේ පූර්ව කර්මයක විපාකය මෙය නිසා ඔහුට මරු ගෙන් ගැළවීමක් නම් නො තිබිණි" යි බුදුරජාණන් වහන්සේ පැහැදිලි කළ හ.

### විවරණාත්මක අනුවාදය (42 වන ගාථාව)

**දිසො දිසං වා වෙරී පන වෙරිනං යං තං කයිරා තතො**
**පාපියො මිච්ඡා පණිහිතං චිත්තං නං කරෙ**

**දිසො**: හොරෙක්; **දිසං**: (තවත්) හොරෙකුට; **වා**: හෝ; **වෙරී**: සතුරෙක්; **පන**: වනාහි; **වෙරිනං**: (තවත්) සතුරෙකුට; **යං තං කයිරා**: යම් කිසිවක් කරයි ද; **තතො පාපියො**: ඊට වැඩි දරුණු විපතක්; **මිච්ඡා පණිහිතං**: නොමඟ යවන ලද; **චිත්තං**: සිත; **නං**: ඔහුට; **කරෙ**: කරන්නේ ය.

පල් හොරෙක් තවත් පල් හොරෙකුට හෝ සතුරෙක් තවත් සතුරෙකුට යම් නපුරු කමක් කරයි ද ඊටත් වැඩි නපුරක් වැරදි මාර්ගයෙහි යොමු කළ සිත අපට කරයි.

### විවරණය

**දිසො දිසං**: පල් හොරෙක් නම් දරුණු සිතැත්තෙකි. ඔහු තුළ සත් ගුණ තිබීම අපේක්ෂා කළ නො හැක. එබඳු දරුණු, තෘෂ්ණා හරිත, හොඳ නරක නො දන්නා හොරෙක් තමා බඳුම තවත් හොරෙකු දුටු විට ඔහු මරා දමන්නට පෙළඹෙනු ඇත. එකිනෙකා කෙරේ ආඝාත බැඳගත් සතුරන් දෙදෙනකු හමු වූ විට අපේක්ෂා කළ හැක්කේ ද එබඳුම තත්ත්වයකි. මේ ගාථාවෙන් දක්වනු ලබන්නේ නො මඟ ගිය සිත අපට ඊටත් වඩා දරුණු විපත් පමුණුවන බව ය.

**මිච්ඡා පණිහිතං**: වැරදි ලෙස මෙහෙයන ලද, නො මඟ යෙදැවූ අපේ සිත් යහමඟ යැවීමට මෙන් ම නො මඟ යැවීමට ද අපට පිළිවන. සුමඟ යෙදැවූ සිතින් යහපත් ප්‍රතිඵල ලැබේ. සුමඟ යෙදැවූ සිත අපට අපේක්ෂා කළ හැකි හොඳම මිතුරා වෙයි. එහෙත් පාපයෙහි යෙදැවූ සිත අපට දරුණු විපත් ලබා දෙන සතුරකු බවට පත් වෙයි.

**මිච්ඡා පණිහිතං චිත්තං**: සිත මිථ්‍යා මාර්ගයෙහි පිහිටැවීම යන්නෙන් මූලික වශයෙන් අදහස් වන්නේ දශ වස්තුක මිථ්‍යා දෘෂ්ටියෙහි පිහිටීමයි. එසේ පිහිටි සිත දශවිධ අකුශල කර්ම කරන්නට අප පෙළෙඹවයි. ඉන් අපගේ මෙලොව මෙන් ම පරලොව ද අඳුරු වෙයි.





*මනාකොට පිහිටි සිත මව්පියන් විසින් වුවද නො කළ හැකි ඉතා උතුම් බවෙක් කරන්නේ ය.*

43. න තං මාතා පිතා කයිරා
අඤ්ඤෙ වාපි ච ඤාතකා
සම්මාපණිහිතං චිත්තං
සෙය්‍යසො නං තතො කරෙ (3:11)

මවක් පියෙක් හෝ නෑයෙක්
නො කරන තරමේ මෙහෙයක්
ලැබදෙයි යමකුට වැඩියක්
නිවැරදි මග පිහිටි සිතක්.

# සිතින් උතුම් - වෙතොත් උතුම්

## 3 (9) සෝරෙය්‍ය ගේ කථා වස්තුව (43 ගාථාව)

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් සෝරෙය්‍ය නගරයේ ධනවතකු ගේ පුත්‍රයා වූ **සෝරෙය්‍ය** නැමැත්තා ඇරබ මේ ගාථාව දේශනා කළ සේක.

දිනක් සෝරෙය්‍ය තම මිතුරකු හා සේවකයන් ද සමග වාහනයක නැගී ස්නානය පිණිස යමින් සිටියේ ය. මේ අවස්ථාවෙහි මහා කච්චායන හිමියෝ සෝරෙය්‍ය නුවර පිඬු සිඟා යනු පිණිස සිවුරු පොරවමින් සිටිය හ. උන්වහන්සේ ගේ රන්වන් ප්‍රියංකර තරුණ ශරීරය සෝරෙය්‍ය ගේ දෙනෙතට මැනවින් ලක් විය. "මේ හිමියන් ගේ රූපය අති සුන්දරයි! මේ හිමියන් මගේ බිරිඳ වුණා නම්! මේ මනරම් ජවි කල්‍යාණය එහෙම නම් මගේ බිරිඳට තිබෙනවා නො වේ ද" යි සිතූ සෝරෙය්‍ය තුළ කාම රාගය ඇති විය. මේ අවාසනාවන්ත සිතුවිල්ලත් සමගම හෙතෙම ලිංග විපර්‍යාසයකට භාජන විය. මහත් ලජ්ජාවට පත් හෙතෙම වාහනයෙන් බැස තක්ෂිලාව දෙසට පැන දිවුවේ ය. ඔහු ගේ මිතුරන් බොහෝ වෙහෙස වී සෙව්ව ද සෝරෙය්‍ය කොහි ගියා දැයි සොයා ගන්නට අසමත් වූ හ. කාන්තාවක් බවට පත්ව සිටි සෝරෙය්‍ය තක්ෂිලාව දෙසට යන වාහනයක ගැල්කරුට ගාස්තු වශයෙන් තම මුදුව දී තක්ෂිලාවට ගියේ ය. තක්ෂිලාවට ලඟා වූ පසු ගැල්කරුවෝ ඇය තම හිතවත් තරුණ ධනවතකුට හඳුන්වා දුන් හ. ඇය ගේ රූප ශෝභාවෙන් වශී ප්‍රාප්ත හෙතෙම ඇය විවාහ කර ගත්තේ ය. මේ විවාහයේ ප්‍රතිඵල වශයෙන් පුත්තු දෙදෙනෙක් උපන් හ. සෝරෙය්‍ය ගේ කලින් විවාහයෙන් ලද පුත්තු දෙදෙනෙක් ද වූ හ.

දිනක් සෝරෙය්‍ය නගරයේ කෙළෙඹියකු ගේ පුත්‍රයෙක් ගැල් පන්සියයක බඩු පුරවා ගෙන වෙළඳාම් පිණිස තක්ෂිලාවට පැමිණියේ ය. ඔහු තම පැරණි මිතුරකු බව හඳුනාගත් සෝරෙය්‍ය කාන්තාව පණිවුඩයක් යවා ඔහුට නිවසට පැමිණෙන ලෙස ඇරයුම් කළා ය. තමාට ඇරයුම් කළ කාන්තාව කවුරුන්දැයි නො දත් කෙළෙඹියා විශ්මයට පත් විය. "මම නම් ඔබව හඳුනන්නේ නැහැ. ඔබ මාව හඳුනනවා ද?" යි හෙතෙම සෝරෙය්‍ය කාන්තාව ගෙන් ප්‍රශ්න කළේ ය. "ඔව්. මම ඔබ හඳුනමි" යි පැවසූ කාන්තාව තම පවුලේ සුව දුක් හා තොරතුරු විමසී ය. එවිට කෙළෙඹියා සෝරෙය්‍ය සිටාණන් ගේ පුත්‍රයා ස්නානයට යන අතර මග අරුම පුදුම ආකාරයෙන් අතුරුදහන් වූ පුවත විස්තර කළේ ය. අනතුරුව කාන්තා තොමෝ තමා කවුරුන්දැයි හඳුන්වා දී පාපී සිතුවිල්ලක් නිසා තමන්ට අත් වූ ඉරණම ගැන මුළු ප්‍රවෘත්තියම ඔහුට කියා පෑවා ය. "ඔබට තියෙන්නේ මහා කච්චායන හිමියන් සමා කරවා ගන්නයි" සෝරෙය්‍ය නුවරින් පැමිණි මිතුරා උපදෙස් දුන්නේ ය. ඒ යෝජනාව පිළිගැනිණි. මිතුරා ගේ ද සහාය ඇතිව මහා කච්චායන හිමියන් නිවසට වැඩමවා දන් පිළිගන්වන ලදී. අනතුරුව මිතුරා කච්චායන හිමියනට සෝරෙය්‍ය කාන්තාව හඳුන්වා දී සියලු පුවත් හෙළි කළේ ය. අනතුරුව කච්චායන හිමියන් පාමුල වැඳ වැටුණු කාන්තාව ඉතා යටහත්ව මහා කච්චායන හිමියන් වෙතින් තම වරදට සමාව අයැද සිටියේ ය. "නැගී සිටින්න, මම ඔබට සමාව දෙමි" යි තෙරුන් වහන්සේ වදාළ හ. විශ්මයකි! සෝරෙය්‍ය නැගී සිටියේ පිරිමියෙකු වශයෙනි. එක ම ආත්ම භාවයක දී වරක් පිරිමියකු සේත් තවත් වරක් ගැහැණියක සේත් දරුවන් ද ලබමින් තමන්ට ගත කරන්නට සිදු වූ ජීවිත රටාවන් ගැන මෙනෙහි කරත් දී සෝරෙය්‍යට ලජ්ජාවක් මෙන් ම පුගුප්සාවක් ද දැනිණ. දිගින් දිගට ඒ ගැන සිතත් ම ඔහු ගේ කළ කිරීම දැඩි විය. ගිහි ගෙය අතහැර පැවිදි වන්නට ඔහු ගේ සිත නැමිණ. පැවිදි වූ පසු බොහෝ අය උන් වහන්සේ ගෙන් "ඔබේ දරුවන් ගෙන් ඔබ වඩාත් ආදරේ කාට ද? පියකු ලෙස ලද දරුවන්ට ද, මවක ලෙස දරුවන්ට ද?" යි බොහෝ අය ප්‍රශ්න කළ හ. "මගේ කුසින් ම උපන් දරුවන්ට වැඩියෙන් ආදරය ඇත්තෙමි" යි උන්වහන්සේ පිළිතුරු දෙති. නමුත් ප්‍රශ්නවල ඉවරයක් නැත. පිළිතුරු දී නිමාවක් නැත. අන්තිමේ මෙසේ විමසනු ලැබීම තිත්ත වූ උන් වහන්සේ පිරිස් වලින් ඈත්ව හුදෙකලාව බවුන් වඩා සිවු පිළිසිඹියාපත් මහ රහත් නමක් බවට පත් වූ හ. නැවතත් පැරණි ප්‍රශ්නය ම අසනු ලබන විට දැන් උන්වහන්සේ අලුත් පිළිතුරක් දෙති. "කිසිවෙකුට එබඳු විශේෂ ආදරයක් නැත" යනු ඒ නව පිළිතුරයි. උන්වහන්සේ එසේ කියනවා ඇත්තේ බොරුවට විය යුතුයැයි සිතූ අන්‍ය භික්ෂූහු බුදුරජාණන් වහන්සේට තම අදහස පැවසූ හ. "මගේ පුත් සෝරෙය්‍ය බොරු නො කියයි. ඔහු කියන්නේ සැබෑමය" යි වදාළ භාග්‍යවතුන් වහන්සේ ඒ අරබයා මේ ගාථාව ද වදාළ සේක.

#### විවරණාත්මක අනුවාදය (43 වන ගාථාව)

**මාතා පිතා වා අඤ්ඤෙද ඤාතකා අපි තං න කයිරා**
**සම්මා පණිහිතං චිත්තං නං තතො සෙය්‍යසො කරෙ**

**මාතා**: මව; **පිතා**: පියා; **වා**: හෝ; **අඤ්ඤෙද**: අන්‍ය වූ; **ඤාතකා අපි**: නෑදෑයෝ වුව ද; **තං**: ඔහුට; **න කයිරා**: (යම් උදව්වක්) කරන්නට අසමත් වෙත් ද; **සම්මා පණිහිතං**: මනාව පිහිට වූ; **චිත්තං**: සිත; **නං**: ඔහුට; **තතො සෙය්‍යසො**: ඊට්ත් වඩා උසස් දෙයක්; **කරෙ**: කරයි.

යම් තැනැත්තකු ගේ මව, පියා හෝ වෙනත් ඥාතිවරයකු විසින් ඔහුට යම් උදව්වක් කර ගන්නට අසමත් ද, ඊටත් වඩා ලොකු උපකාරයක් මනාව පිහිටුවා ගත් සිත කරයි.

#### විවරණය

**සම්මා පණිහිතං චිත්තං**: යන්නෙන් දශවස්තුක මිථ්‍යා දෘෂ්ටියෙන් තොරව කුසලය, කුසල මූලය, අකුසලය, අකුසල මූලය මනාව දැක නිවැරදි ශ්‍රද්ධාවෙන් යුක්තව සමථ විදර්ශනා භාවනාවන් හි යෙදීම අදහස් වෙයි.

දෙමාපියන් හා නෑදෑයිනට අපට අගනා වස්තු ආදියෙන් උදවු කළ හැකි වුව ද උසස් අධ්‍යාත්මික සාධක ලබා දීම කළ නො හැක. ඒවා ලබා ගත හැක්කේ සිත නිවැරදි මග ශික්ෂණය කිරීමෙන් පමණි.

## කතෘ ස්වාමීන්ද්‍රයන් වහන්සේ



සනාතන බුද්ධ භාෂිතය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ අසහාය සාමයික මෙහෙය උදෙසා, සිය කාලය හා ශ්‍රමය සපුරා වැය කරමින්, මානව වංශයට දහම් මග හෙළි පෙහෙළි කිරීමේ මහා මෙහෙවරට කැප වී සිටින සිංගප්පූරුවේ ප්‍රධාන සංඝ නායක වේරගොඩ සාරද, ස්ථවිරයන් වහන්සේ අද ලොව වෙසෙන ප්‍රශස්ථතම ධර්ම දූත යතිනායක වරයාණන් වහන්සේ නමකි.

1941 නොවැම්බර් මස 27 වනදා දකුණු ලක වේරගොඩ දී උපත ලද මේ යති ප්‍රභූවරයාණෝ, උපාධි ලාභීව, ධර්මදූත මෙහෙය ආරම්භ කළේ ඉතා යොවුන් අවධියේ දීමය. දැනට ශතක 6 ක් පුරා ධර්මදූත මෙහෙයෙහි යෙදී සිටින ගරුතර වේරගොඩ සාරද යතිනායකයානන් වහන්සේ මුද්‍රිත මාධ්‍යයෙන් සහ විද්‍යුත් මාධ්‍යයෙන් මෙන්ම දුරකථන තාක්ෂණයෙන් පවා අද ලොවට ධර්මදානය සපයන්නේ නවීනයන්ගේ මනස හා ආධ්‍යාත්මික ගති-පැවතුම් පිළිබඳ පැහැදිලි අවබෝධයකිනි.

වර්තමානික ග්‍රාහක පිරිස, ශ්‍රව්‍ය-දෘෂ්‍ය මාධ්‍ය මගින් දැනුමත් විනෝදාස්වාදයත් ලබන්නට පුරුදු වී සිටින පරපුරක් හෙයින්, ගරුතර වේරගොඩ සාරද හිමිපාණෝ, ඔවුනගේ මනසට සරිලන පරිද්දෙන් බුද්ධ භාෂිතය, ඔවුන් අතට පත් කරන සේක. මුද්‍රිත හා විද්‍යුත් ප්‍රකාශන 700 ක් පමණ ලොවට පිරිනමා සිටින මේ යතිනායකයන් වහන්සේ විසින් සම්පාදිත ධර්ම භාණ්ඩාගාරය නම් ඉංග්‍රීසි කෘතිය දොරට වැඩීමේ උළෙලේ දී, ඒ පිළිබඳ ව එක් දිනක් තුල පමණක් ලැබුණු දුරකථන ඇමතුම් සංඛ්‍යාව 2000 කටත් අධික විය. ඒ නිසා එය සිංගප්පූරු රාජ්‍යයේ ග්‍රන්ථ ප්‍රකාශන ඉතිහාසයේ සුවිශිෂ්ට වාර්තාවකට හිමිකම් කියන්නේය.

දැනට, සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය භාරව වැඩ සිටින ගරු වේරගොඩ සාරද නායක ස්ථවිර පාදයන් වහන්සේ ලෝකයේ බොහෝ දේශයන් හී බුද්ධ ශාසනයේ ප්‍රගතියට හිතකාමී ධර්ම දූත මෙහෙවරක යෙදී සිටින සේක.

එතුමන් ගේ ප්‍රධාන ප්‍රකාශ අතර, සිංහල හා ඉංගිරිසි ධම්මපදයත්, ජාතක කථා පිළිබඳ විද්‍යුත් ප්‍රකාශනයත් ප්‍රධාන තැන් ගනී. එතුමන් විසින්, ඉටු කෙරෙන මහා සාමයික මෙහෙය අඛන්ඩව පවත්වා ගෙන යනු පිණිස, ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් නිදුක් නිරෝගී සුව පැතීම, බෞද්ධ ජනතාවගෙන් ඉටු විය යුතු කෘතඥතා පූර්වක චාරිත්‍රයකි.

කලා කීර්ති එඩ්වින් ආරියදාස

ISBN: 981-00-4938-2

# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත ධම්මපදය
### 4 වන පරිච්ඡේදය

# පුපඵ වගග



ගරු වේරගොඩ සාරද නාහිමිපාණන් වහන්සේ
සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක

"සබ්බදානං ධම්මදානං ජිනාති"

(ධර්ම දානය, සෙසු දාන සියල්ලටම වඩා අගනේය.)



''ධර්ම භාණ්ඩාගාරය'' නැමැති

මෙම වටිනා ධර්ම පුස්තකය

**සාමවිනිසුරු බී.ධර්මදාස පියාණන්ට**

නිවන් සුව පතා ප්‍රකාශනය කරන ලදි.

පූර්ණ අනුග්‍රහකත්වය

**වේරගොඩ සුනන්දා භික්ෂුණිය විසිනි**

# ධර්ම භාණ්ඩාගාරය

සිතුවම් සහිත
## ධම්මපදය


කතෘ
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය



**සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය**
නො: 1, ජලන් මස් පුටේ, සිංගප්පූරුව 128607
ටෙලි: 65 67783330 65 94656570
94 770589498 / 94 755218421
වේරගොඩ ජයන්ති විහාරය, වේරගොඩ, මීටියාගොඩ
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

**කර්තෘ**
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**චිත්‍ර ශිල්පි**
පී. වික්‍රමනායක

**සැකසුම**
පියරත්න හේවාබට්ටගේ

**පරිගණක රූපාවලි සහ පූර්ව ප්‍රකාශන මෙහෙය**
පූජ්‍ය වේරගොඩ සුනන්දා භික්ඛුණී
බී. දයා සමරසිංහ
බී. රෝහණ ජයතිස්ස

**පරිගණක සහාය**
ශ්‍යාමනී ප්‍රියලක්‍ෂණා ලේකම්වසම්
ඩබ්ලිව්. මාලා කාන්ති
ප්‍රියංකා බෝධිපක්‍ෂ

**සහාය**
බී. පුෂ්පානී ධම්මලතා
බී. ජේ. ධම්මලතා
ඊ. එම්. ලයනල් මොහොට්ටි
ඊ. එම්. යුගාන් සසංක
ශ්‍රියාලතා කග්ගොඩ ආරච්චි

**පරිගණක ප්‍රකාශන**
සමනල ප්‍රින්ටර්ස්, බටපොල
ටෙලි: +94 777557127

**පිටකවරයේ පින්තූරය**
බර්ට්ටි ගුණසේකර

**මුද්‍රණය**
2013 නොවැම්බර් මස 27 දින, සිංගප්පූරුව

**පිටකවරයේ චිත්‍රය**
*පිටකවරයේ බුදු පිළිමය වේරගොඩ ජයන්ති විහාරයේ බුදුමැදුරෙනි.*
*වර්ෂ 1953 ජුනි 3 වෙනිදා අඹන ලද මෙම බුදු පිළිමය දැනට ශ්‍රී ලංකාවේ තිබෙන*
*දර්ශණීයතම බුදු පිළිමය වශයෙන් සැලකේ. මෙම බුදු පිළිමය ඉදිකිරීමේ පුරෝගාමී වූ අපවත් වී වදාළ*
*ගෞරවාභී පණ්ඩිත යටලමත්තේ වජිරඥාණ නායක මාහිමිපාණන් වහන්සේට නිවන්සුව අත්වේවායි අපි ප්‍රාර්ථනා කරමු.*

මේ ග්‍රන්ථයෙහි ආගත කරුණු පිළිබඳ පූර්ණ හා සදාකාලික අයිතිය හිමි වන්නේ බුදුරජාණන් වහන්සේටයි.
බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් පහළ වූ සනාතනික සත්‍යයෝ පුහුදුන් මිනිසුන් විසින් පනවන ලද
තාවකාලික වූත්, අසත්‍ය වූත්, අයිතිවාසිකම් පිළිබඳ නීති රීති පිළිගනු නොලබති.

**පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ටෙලි: 65 67783330 65 94656570
+94 770589498 +94 755218421
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

ISBN: 981-00-4938-2

4 වන පරිච්ඡේදය

# පුප්ඵ වගග





*කවරෙක් ලොව අවබෝධ කරන්නේ ද? කවරෙක් දහම් පදය අවබෝධ කරන්නේ ද?*

44. කො ඉමං පඨවිං විජෙස්සති
යමලොකඤ්ච ඉමං සදෙවකං
කො ධම්මපදං සුදෙසිතං
කුසලො පුප්ඵමි'ව පචෙස්සති (4:1)

යම ලොවත් දෙව් ලොවත් ඇතුළුව
කවුද මිහි කත හොඳින් දන්නේ
තෝරමින් මල් ගොතන මල් දම්
ලෙස කවුද දම් සිතට ගන්නේ.

# දැන මුනි දෙසූ දම් - ලෙස මල් දම්

## 4 (1) පන්සියයක් භික්ෂූන් ගේ කථා වස්තුව (44 සහ 45 ගාථා)

භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් භික්ෂූන් වහන්සේ පන්සියයක් අරබයා මේ ගාථා දෙක දේශනා කර වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ සමග එක් ව සංචාරයෙහි යෙදුණු භික්ෂූන් වහන්සේ පන්සියයක් නැවත ජේතවනාරාම විහාරයට සම්ප්‍රාප්ත වූ හ. එදින සන්ධ්‍යාවේ උන් වහන්සේලා එක්ව තම සංචාරය ගැන සාකච්ඡා කළ හ. සාකච්ඡාවට විෂය වූයේ ගමන් මඟ විසිතුරු, භූමියේ තත්ත්වය ආදියයි. කඳු, තැනිතලා, මාර්ගයෙහි උස් මිටි බව, පස රතු ද කළු ද යන්න, ආදී බාහිර කරුණු ය. මෙබඳු කරුණු සාකච්ඡා වන බව දැනගත් බුදු පියාණෝ උන්වහන්සේලා හමුවට පැමිණ "මහණෙනි, ඔබ ඔය කතා කළ සියල්ල ඔබෙන් පරිබාහිර කරුණු ය. ඔබගේ ම ශරීරයේ යථා තත්ත්වය ගැන ගැඹුරෙන් පිරික්සා බලා භාවනාවට සැරසෙනවා නම් වඩාත් ප්‍රයෝජනවත් නො වේ ද? " යි උන්වහන්සේ විමසූ හ.

### විවරණාත්මක අනුවාදය (44 ගාථාව)

**කො ඉමං පඨවිං ඉමං සදෙවකං යමලොකඤ්ච විජෙස්සති කො කුසලො පුප්ඵං ඉව සුදෙසිතං ධම්මපදං පචෙස්සති**

**කො**: කවරෙක්; **ඉමං පඨවිං**: මේ පෘථිවිය ද; **ඉමං**: මේ; **සදෙවකං**: දෙව් ලොව සහිත; **යමලොකඤ්ච** : යම ලෝකය ද; **විජෙස්සති** : දැන ගනී ද?; **කො**: කවරෙක්; **කුසලො**: දක්ෂ (මාලා කාරයෙකු); **පුප්ඵං**: මල්; **ඉව**: මෙන්; **සුදෙසිතං**: මනාව දෙසා ඇති; **ධම්මපදං**: දහම් පද; **පචෙස්සති**: රැස් කර ගනියි ද?

දෙව්ලොව, යමලොව හා මනුලොව තේරුම් ගන්නට කවුරු සමත් වෙත් ද?. දක්ෂ මල් දම් ගොතන්නෙක් ගැළපෙන පරිදි මල් තෝරා ගන්නා සේ මනාව දේශනා කර ඇති ධම්ම පද කවරෙක් තෝරා ගනිත් ද?

### විවරණය

**සේඛො**: සේඛ හෙවත් ශෛක්ෂ්‍ය නමින් හඳුන්වන්නේ උසස්තම ගණයේ ශික්ෂණ ලාභීහු ය. ත්‍රිවිධ ශික්ෂාව අනුගමනය කරන මේ අය සප්ත විධ ය. ලෝකෝත්තර මාර්ග ඵල අෂ්ටකයෙන් රහත් ඵලය හැර අවශේෂ හත මේ හත වශයෙන් දැක්වෙයි. රහත් ඵලය ලැබූ උතුමන් තව දුරටත් ශික්ෂණය වන්නට දෙයක් නැති හෙයින් අසේඛ හෙවත් අශෛක්ෂ්‍ය වශයෙන් හඳුන්වනු ලැබේ. සාමාන්‍ය පෘථග්ජනයෝ සෙඛ ගණයට හෝ අසේඛ ගණයට නො ගැනෙති.

**ලෝක**: ලෝක යන්නෙන් මෙහිදී බෞද්ධයන් ගේ සමස්ත විශ්වය ම පැහැදිලි කර දක්වයි. එනම්, කාම ලෝකය, රූප ලෝකය හා අරූප ලෝකයයි. කාම ලෝකය නම් පසිඳුරන් මගින් වින්දන ලබන ලෝක පද්ධතියයි. රූප ලෝකයට අයත් වන්නේ මුල් ධ්‍යාන හතරට අයත් රූප බ්‍රහ්ම ලෝක යි. අරූප ලෝක නම්, අරූප ධ්‍යාන හතරට අයත් වන අරූප බ්‍රහ්ම ලෝක පද්ධතියයි.

**විජෙස්සති**: දැන ගනියි. '**අත්තනෝ ඤාණෙන විජානිස්සති**'යි අටුවාවේ දැක්වෙන පරිදි තමා ගේ නුවණින් ම දැන ගනියි.

**දේව**: යන වචනයෙහි භාෂාමය අර්ථය බබළන, දිලිසෙන යන්නයි. තම තමන් කළ කුශල කර්මයන් හි අනුසස් භුක්ති විඳිමින් ප්‍රීතියෙන් දවසරින සත්ත්ව කොට්ඨාසයකි. ඔවුන් ගේ පැවැත්ම ද කුශල බලය පවත්නා කල් පමණි.

දේව ලෝකය ද අයත් වන්නේ කාම ලෝක වලට ය. අපාය, තිරශ්චීන භවය, ප්‍රේත භවය, යක්ෂ-අසුර ගණය මෙන් ම මනු ලොව ද මේ ගණයට ම වැටෙති. කාම ස්වර්ග වූ දිව්‍ය ලෝක සංඛ්‍යාව හයකි. දෙවිවරු මනුෂ්‍ය දෘෂ්ටියට හසු නො වෙති. කුසල් ඇති තාක් සැප විඳින ඔවුහු ජරාවට පත් නො වෙති. ඔවුන් ගේ මරණය ද මෘත ශරීරාදියෙන් තොරව චුත වීමක් සේ හැඳින්වෙයි. කෙසේ වුවද කුශල බලය හිම වූ පසු නැවත සංසාර දුක්ඛයනට පාත්‍ර වන්නට සිදුවන හෙයින් දෙව්ලොව ඉපදීම සසර දුකින් මිදීමක් සේ හඳුන්වනු නො ලැබේ.

රූප ලෝක හෙවත් පහළ බ්‍රහ්ම ලෝක වලදී ඝ්‍රාණ ඉන්ද්‍රිය හා ශ්‍රවණ ඉන්ද්‍රිය අනිකුත් ඉන්ද්‍රිය ද සමග පවත්නා නමුත් ධ්‍යානයන්හි දී තාවකාලිකව යටපත් කරනු ලැබේ. අරූප බ්‍රහ්ම ලෝකවල දී රූපයක් විද්‍යාමාන නො වේ. ඒවායේ ඇත්තේ ස්කන්ධ චතුෂ්කයක් පමණි.

මෙම ත්‍රිවිධ සත්වාවාසයන් සඳහා පාලි සූත්‍ර ග්‍රන්ථවල යොදා ඇත්තේ 'භව' යන පදය මිස 'ලෝක' යන පදය නො වේ. එතකුදු වුවත්, කාම, රූප, අරූප යන ත්‍රිවිධ ප්‍රවෘත්තීන් පිළිබඳ සංකල්පය බෞද්ධ ත්‍රිපිටකයෙහි සූත්‍ර යුගයට ම අයත් වූවකැයි සිතුම අසාධාරණ නො වේ.





*හික්මෙන තැනැත්තා ලොව පිළිවිද දැනගනී. දහම්පදය ද මොනවට පිරික්සා පිළිවිද දැන ගනී.*

45. සෙඛො පඨවිං විජෙස්සති
යමලොකඤ්ච ඉමං සදෙවකං
සෙඛො ධම්මපදං සුදෙසිතං
කුසලො පුප්ඵම්’ව පචෙස්සති (4:2)

යම ලොවත් දෙව් ලොවත් ඇතුළුව
සේඛ මනු ලොව හොඳින් දන්නේ
තෝරමින් මල් ගොතන මල් දම්
ලෙසයි ඔහු දම් සිතට ගන්නේ

# සේඛ මුනි දැන ගනියි මුනි දම්

## 4 (1) පන්සියයක් භික්ෂූන් ගේ කථා වස්තුව (44 සහ 45 ගාථා) (ඉතිරි කොටස)

### විවරණාත්මක අනුවාදය (45 ගාථාව)

**සෙඛො පඨවිං ඉමං සදෙවකං යමලොකඤ්ච විජෙස්සති සෙඛො කුසලො පුප්ඵං ඉව සුදෙසිතං ධම්මපදං පචෙස්සති.**

**සෙඛො**: ශෛක්ෂ්‍ය තෙම; **පඨවිං**: පෘථිවිය ද; **ඉමං**: මේ; **සදෙවකං**: දිව්‍ය ලෝකය ද සහිතව; **යමලොකඤ්ච**: යම ලෝකය ද; **විජෙස්සති**: දැන ගනියි; **සෙඛො**: ශෛක්ෂ්‍ය තෙම; **කුසලො**: දක්ෂ (මල් කරුවකු); **පුප්ඵං ඉව**: මල් මෙන්; **සුදෙසිතං**: මනාව දේශනා කර ඇති; **ධම්මපදං**: දහම් පද; **පචෙස්සති**: රැස්කර ගනියි.

ශෛක්ෂ්‍ය (හෙවත් සෝතාපන්න, සකෘදාගාමී හා අනාගාමී) පුද්ගලයෝ දෙව්ලොව, යමලොව හා මනුලොව අවබෝධ කරති. දක්ෂ මල්කරුවකු මල් තෝරා ගෙන මල් දම් ගොතන්නාක් මෙන් ශෛක්ෂ්‍යයෝ දහම් පද එක් රැස් කර ගනිති.

### විවරණය

**යම ලෝක**: යම රජු ගේ ලෝකය. යම ලෝකය ප්‍රාග් බෞද්ධ යුගයේ සිට පැවත එන විශ්වාසයකි. මරණින් මතු සියළු දෙනා ම යම රජු නම් ධර්ම විනිශ්චය කරුවකු අබිමුවට ගොස් සිය කුශලා'කුශල කර්මානුරූපව ඉදිරි භවය විනිශ්චය කරගනු ඇත යන අදහස බුද්ධකාලය වන විට ප්‍රචලිතව තිබිණ. පැරණි විශ්වාස වලට නව අර්ථ ගැන්වීමේ බෞද්ධ සම්ප්‍රදාය හා පොදු ජනතාවට සාරධර්ම සන්නිවේදනය කිරීමේ පහසුව තකා මෙම වාග් ව්‍යවහාර වෙනස් නො කර බුදු සමයානුගත කර ගන්නට ඇතැයි සිතේ. පිරිසිදු බෞද්ධ දර්ශනය අනුව අප ගේ කුශල හා අකුශල කර්ම අනුව අප සුගතියට හෝ දුගතියට නියම වන්නේ දිව්‍ය රාජයකු ගේ විනිශ්චය අනුව නොව ස්වයංක්‍රීය නියාමයක් වූ කම්ම නියාමය අනුවය.

එය ක්‍රියාත්මක කිරීමට මහා බලධාරී සියල්ල දක්නා දිව්‍ය රාජයකු අවශ්‍ය වන්නේ ඊශ්වර නිර්මාණවාදය පිළිගන්නා ආගමකට මිස බුදු දහම වැනි ප්‍රබුද්ධ ආගමකට නො වේ. එතකුදු වුවත් දුගතීන් සඳහා යමලෝකය යන වචනය භාවිත කිරීම නිතර සිදුවෙයි. එය වරදවා තේරුම් නො ගෙන අකුශල විපාක ලබා දෙන ස්වයං සිද්ධ නියාමයට භාරතීය සංස්කෘතියට අනුරූපව දෙන ලද සංඥානාමයක් සේ ගැනීම උචිතය. ධම්ම පදයේ ම 'යමාමසේ' යන්න 'මැරෙමු' යන අරුත දෙන ක්‍රියා පදයක් සේ යෙදී ඇත. යම සංකල්පය මෙන් ම සංකීර්ණ වූ හා සංස්කෘතික සංකේත උකහා ගන්නා වූ තවත් සංකල්පයක් සේ මාර සංකල්පය දැක්විය හැක. එය මරණය පෞරුෂත්වාරෝපණයෙන් දැක්වීමට නිරතුරුව භාවිත වේ.

**මාර**: යන්නෙන් හඳුන්වන්නේ ද එක්තරා දිව්‍ය පුත්‍රයකු සේ සම්මත ප්‍රාග් බෞද්ධ යුගයේ සිට උරුම කර ගත්තා වූ විශ්වාසයකි. 'මාරෝ පාපිමා' සහ 'නමුචි' යන සංඥාවලින් ද ඔහු හැඟවේ. 'පාපිමා' යන්නෙන් පව්කාරයා යන්න ද 'නමුචි' යන්නෙන් විමුක්තිය නො දෙන්නා, නො මුදන්නා යන අරුත ද හැඟ වේ.

පාලි පොත්වල මාර යන්න හුදෙක් 'මරණය' යන අරුතෙන් මෙන් ම කෙළෙස් වලට අපර නාමයක් වශයෙන් ද දැක්වේ. එමෙන් ම එම නමින් හැඳින්වෙන පාපය නියෝජනය කරන අමනුෂ්‍ය ලක්ෂණ ඇති ජීවියකු (සත්ත්වයකු) වශයෙන් ද දැක්වේ. (පාලියෙහි එන මාර සංකල්පය ගැන කළ විධිමත් විමර්ශනයක් ලෙස මහාචාර්ය ට්‍රෙවෝ ලිං ගේ The Buddhist Mythology of Evil නම් කෘතිය සඳහන් කළ හැකිය.)

මාරයා පිළිබඳව බෞද්ධ ග්‍රන්ථවල සඳහන් පාලි අටුවාවල පංචමාර සංකල්ප වශයෙන් සංග්‍රහණය කර ඇත. එම පස් මරුන්

1. දේවපුත්ත මාර
2. කිලෙස මාර
3. ඛන්ධ මාර
4. අභිසංඛාර මාර හා
5. මච්චු මාර යනුවෙන් නම් කෙරේ.

ජීවිතයක් ඇති, පෞරුෂයක් ඇති 'පුද්ගලයකු' ලෙස හැඟෙන්නේ දේවපුත්තමාර පමණි. අන් සියල්ල ක්ලේශාදී දේ තත්වාරෝපණය කිරීම් ය. මච්චුමාර නම් කේවල මරණයයි. හෙවත් එක් ජීවිත පරිච්ඡේදයක අවසානයයි. (අභිධර්මානුකූලව නම් ක්ෂණයක් පාසා සිදුවන ස්කන්ධ පරිවර්තනයෝ ද ක්ෂණික මරණය ලෙස හැඳින්වෙති.

එහෙත් එය ආනුභවිකව දැක්විය නො හැකි තරම් සූක්ෂ්ම හෙයින් තාර්කිකව ලැබෙනු මිස යථාර්ථවත්ය ප්‍රත්‍යක්ෂ නොවන්නකි). සියල්ලන්ට ම ප්‍රත්‍යක්ෂ මරණය නම් එක් ජීවිත කාල පරිච්ඡේදයක අවසානයේ දී සිදුවන නාම-රූප සන්තතියෙහි විද්‍යාමාන භේදයයි. එහෙත් එය පූර්ණ විනාශයක් නො වේ. ස්කන්ධ-ධාතු-ආයතනයන් ගේ ප්‍රවාහය තවදුරටත් ප්‍රවර්තනය වන ශක්තිය මරණයෙන් නිම වන්නේ නැත. විදුලි බල්බයක් බිඳී ගිය පමණින් විද්‍යුත් ශක්තිය විනාශයට නො යන්නා සේ භෞතික ශරීරයේ බිඳ වැටීම තුළින් කර්ම ශක්තියෙහි විනාශයක් සිදු නො වේ. එහෙත් පුනර්භවයක් සිදු වන්නේ කිසියම් සාධක සංක්‍රමණයක් නිසා නොව හේතු-ප්‍රත්‍යය බලපෑමෙන් සිදුවන පටිච්ච සමුප්පාද ක්‍රියාවලියක් නිසා බව සටහන් කර ගැනීම වටියි.

**කුසලො**: මෙහි 'කුසලො' යන්න යොදා ඇත්තේ "දක්ෂයා, කෞශල්‍යයන්ගෙන් සමන්විත පුද්ගලයා යන අරුතිනි. කුසල කර්මයක් එ නමින් හඳුන්වන්නේ ද දක්ෂලෙස ක්‍රියා කරන විට අපට උපදින දේ නිසා ය. (කොසල්ල සම්භූතට්ඨෙන) මෙහි අදහස් වන්නේ උචිතානුචිත විචක්ෂණ ඇතිව ක්‍රියා කරන පුද්ගලයා යන අර්ථයයි. ධම්මපදට්ඨ කථාව වෙහි කුසල නමින් හැඳින්වෙන්නේ සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වර්ධනය කරන පුද්ගලයා බව දක්වයි. ඒවා නම්, සතර සතිපට්ඨාන, සතර සම්‍යග් ප්‍රධාන, සතර ඉද්ධිපාද, පංච ඉන්ද්‍රිය, පංච බල, සත්ත බෝජ්ඣංග, ආර්ය අෂ්ටාංගික මාර්ගය යන මේවා ය.





*කය පෙණ පිඩක් මිරිඟුවක් සේ දැන සලකන තැනැත්තා මර බැඳුම් සිඳ බිඳ දමා නිවන් පසක් කරන්නේ ය.*

46. ඵෙණූපමං කායමි’මං විදිත්වා
මරීචිධම්මං අභිසම්බුධානො
ඡෙත්වාන මාරස්ස පපුප්ඵකානි
අදස්සනං මච්චුරාජස්ස ගච්ඡෙ (4:3)

මේ කය පෙණ පිඬුවක් සේ දැන ගෙන
මිරිඟුවක් ය නිසි සේ තේරුම් ගෙන
මරුගේ කම් හී සැර වළකා ගෙන
ගියොත් යෙහෙකි මරුහට නො පෙනෙන තැන

# කවුද සමත් වනු - මරුවා පරදනු

## 4 (2) කය මිරිඟුවක් සේ දුටු හිමි නම (46 ගාථාව)

තථාගතයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන සේක් **එක්තරා භික්ෂුනමක්** අරබයා මේ ගාථාව දේශනා කර වදාළ සේක.

එක් භික්ෂුනමක් භාග්‍යවතුන් වහන්සේ වෙතින් භාවනා කර්මස්ථාන ලබා ගෙන බවුන් වඩනු පිණිස වනගත වූයේ ය. එහෙත් දිගින් දිගට ම උත්සාහ කළත් කිසි අධිගමනයක් ලබා ගන්නට අසමත් වූ තැන හේ මෙසේ සිතී ය. "මට වඩාත් ගැලපෙන වෙනත් භාවනා කර්මස්ථානයක් දෙන්නැයි මා භාග්‍යවතුන් වහන්සේ ගෙන් අයැද සිටිය යුතු ය." එසේ සිතමින් උන්වහන්සේ බුදුරදුන් බැහැ දකිනු වස් ආපසු ගමන් ඇරඹී ය.

අතර මඟදී උන්වහන්සේට මිරිඟුවක් දක්නට ලැබිණ. "උෂ්ණ කාලයේ දී මේ මිරිඟුව ඈත දුර සිට බලන්නහුට යථාර්ථවත් දෙයක් සේ පෙනෙයි. එහෙත් ඊට ලංවත්ම නැතිව යයි. උත්පත්තිය හා මරණය හේතුවෙන් අනාත්ම වූ මෙම සසර පැවැත්ම ද එබඳුම ස්වභාව ඇත්තේ ය" යි උන්වහන්සේ සිතූ හ. මිරිඟුව කෙරේ මෙසේ සිත යොමු කළ උන්වහන්සේ ඒ ගැන භාවනා කළ හ. දිගින් දිගටම ගමන් කිරීම නිසා දැඩි වෙහෙසට පත්ව සිටි භික්ෂුනම ගමන් වෙහෙස නිවා, ගත සනහා ගනු පිණිස අචිරවතී නදියට බැස ස්නානය කළ හ. අනතුරුව නදී ඉවුරේ තුරු සෙවනක වැඩ හිඳ විවේක ගත් හ. ඒ අසල ම දිය ඇල්ලක් ද විය. දිය ඇල්ල දෙස බලා සිටිනා උන් වහන්සේට සුදු පෙණ පිඩු නැගි නැගී ගල්වල හැපෙමින් බිඳී යන අයුරු දක්නට ලැබිණ. "මේ සුදු පෙණ පිඩු නැගී බිඳී යන පරිද්දෙන් ම සියල්ල ඇති වෙයි, නැති වෙයි" යනුවෙන් උන්වහන්සේ කල්පනා කළ හ. එය ක්‍රමයෙන් උන්වහන්සේ ගේ භාවනාව බවට පත් විය.

සුවඳ ගඳ කිළියෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුනම අර්ථ සම්පන්න භාවනාවකට වැටී සිටින ආකාරය දුටු සේක. "භික්ෂුව, එය සැබෑම ය. පැවැත්ම නම් හුදෙක් මිරිඟුවක් වැනි ය. පෙණ පිඩුවක් වැනි ය. ඇති වන පරිද්දෙන් ම නැතිව යයි." එසේ පැවසූ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා ධර්මය ද වදාළ සේක.

### විවරණාත්මක අනුවාදය (46 ගාථාව)

**ඉමං කායං ඵෙණුපමං විදිත්වා මරීචි ධම්මං**
**අභිසම්බුධානො මාරස්ස පපුප්ඵකානි ඡෙත්වාන**
**මච්චුරාජස්ස අදස්සනං ගච්ඡෙ**

**ඉමං කායං**: මේ ශරීරය; **ඵෙණුපමං**: පෙණ පිඩුවක් හා උපමා කොට; **විදිත්වා**: දැන ගෙන; **මරීචි ධම්මං**: මිරිඟුවක ස්වභාවය ඇති බව; **අභිසම්බුධානො**: තේරුම් ගෙන; **මාරස්ස**: මාරයා ගේ; **පපුප්ඵකානි**: මල් හී දඬු; **ඡෙත්වාන**: කඩා බිඳ දමා; **මච්චුරාජස්ස**: මාර දිව්‍ය රාජයාට; **අදස්සනං**: නො පෙනෙන තැනකට; **ගච්ඡෙ**: යන්න.

අප ගේ මේ ශරීරය පෙණ පිඩුවක් හා මිරිඟුවක් වැනි බව නුවණින් මනාව වටහා ගෙන මාරයා එවන මල් හී දඬු (මල්සර) කඩා බිඳ දමා මරුට නො පෙනෙන තැන (අමෘත වූ නිර්වාණය) සොයා යන්න.

### විවරණය

**ඵෙණුපමං**: මේ සිරුර පෙණ පිඩුවකට සමාන කරනු ලබන්නේ එය ඉක්මණින් විනාශ වී යන හෙයිනි. පෙණ පිඩු ද වහා ඇතිව නැතිවන හෙයින් අස්ථිර බව හා නිසරු බව පැහැදිලි කිරීමේ දී එය ප්‍රබල උපමාවක් වෙයි.

**මරීචි ධම්මං අභිසම්බුධානො**: මිරිඟුව පෙණ පිඩුවට ද වඩා නිසරු ය. එය හුදෙක් දෘෂ්ටිමය මායාවක් පමණි. යථාර්ථයක් හෙවත් ඇත්තට ම පවත්නා දෙයක් මෙන් දුරට දිස් වුව ද එයට ලං වත් ම හුදෙක් ඇසේ රැවටිල්ලක් බව හෙළි වේ.

**කාය**: සමූහය යන අරුත ද ඇති 'කාය' යන්නෙන් ශරීරය ගැණෙයි. ඇතැම් විට භෞතික කය මෙන් ම ආධ්‍යාත්මික කාය ගැන ද සඳහන් වේ. එසේ වූ විට ආධ්‍යාත්මික කාය සේ ගත හැක්කේ රූපස්කන්ධය හැර ඉතිරි ස්කන්ධ චතුෂ්කය යි. (නාමස්කන්ධය යි) නැත හොත් වේදනා, සඤ්ඤා හා ඇතැම් සංඛාර ගත හැකි ය. එමෙන් ම පසිඳුරන් අතර පස් වැන්න ද කාය වශයෙන් ගැණෙයි.

**මරීචිධම්මං**: යන්නෙ හි එන ධම්මං යන්නෙන් ස්වභාවය අදහස් වෙයි. 'ධම්ම' යනු බෞද්ධ ශබ්දාවලියෙහි අතිශය විචිත්‍ර හා සංකීර්ණ අර්ථ දනවන වචනයකි. බොහෝ විට එහි අරුත සන්දර්භය තුළින් විග්‍රහ කර ගත යුතු ය. දරන්නා, සංයුතිය, ප්‍රතිමානය, නීතිය, දේශනාව, යුක්තිය, සාධාරණත්වය, ගුණය, ද්‍රව්‍යය, විෂය හා මනස යන මේ විවිධ අර්ථ සඳහා විවිධ සන්දර්භයන් හි මෙය යොදා තිබේ. ගුණ, දේසනා, පරියත්ති හා නිස්සත්ති යන අරුත් හතර ගැන ධම්පියා අටුවාව සඳහන් කරයි. සමහර අර්ථකථකයෝ දේසනා වෙනුවට 'හේතු' යන්න දක්වති. ධර්මය පිළිබඳ විශ්ලේෂණාත්මක ඥානය අවසාන අර්ථයෙන් බලන විට හේතු-ඵල ධර්මය පිළිබඳ ඥානය හෙයින් මෙසේ දක්වනවා විය හැකිය. ධම්ම යන්නට චතුසච්ච යන්න ද ගැළපෙන බව කෙනෙකුට කිව හැක.

'ධම්ම' යන්න මනසට අරමුණු වන ඕනෑ ම දෙයක් සඳහා ද යෙදිය හැකිය. මනෝ ඉන්ද්‍රියට විෂය වන දේ 'ධම්ම' වශයෙන් හඳුන්වන්නේ එහෙයිනි.





*පස්කම්හි ගිජු ව ඇලුණු සිත් ඇත්තා සපල නො වූ අදහස් ඇති ව මැ මිය යයි.*

47. පුප්ඵානි හෙ'ව පචිනන්තං
ඛ්‍යාසත්තමනසං නරං
සුත්තං ගාමං මහොඝො'ව
මච්චු ආදාය ගච්ඡති (4:4)

සොම්නස් මල් නෙළ නෙළා
මුසපත් වන්නන් බලා
ගෙන යයි මරු ගඟ මෙන් එන
නිදිවන් ගමකට ගලා.

# කම් සුව මත් දන - යෙත් ගඟ ගහ ගෙන
## 4 (3) විඩූඩභ ගේ කථා ප්‍රවෘත්තිය (47 ගාථාව)

තථාගතයන් වහන්සේ ජේතවන විහාරයෙහි වැඩ වසමින් ප්‍රසේනජිත් කෝසල රජතුමා ගේ පුත් **විඩූඩභ කුමරුන්** සම්බන්ධයෙන් මේ ගාථාව දේශනා කළ සේක.

ශාක්‍ය වංශයෙන් විවාහයක් කර ගන්නට රිසි වූ ප්‍රසේනජිත් (පසේනදි) කෝසල රජ තෙම ශාක්‍ය කුමරියක තමන්ට විවාහ කර දෙන සේ ඉල්ලමින් කපිලවස්තු නුවරට දූත පිරිසක් යැවී ය. ශාක්‍යයන් මානාධික වුව ද කෝසල රජතුමා අමනාප කර ගන්නට ද අකැමැති හෙයින්, ඒ ඉල්ලීම ඉටු කරමු යි ගිවිස උභතෝ සුජාත ශාක්‍ය කුමාරිකාවක් වෙනුවට මහානාම ශාක්‍යයාට දාව සේවිකාවක ගේ කුසින් උපන් කුමරියක ඔහුට විවාහ කර දුන් හ. කොසොල් රජුගේ එක් අග බිසවක් බවට පත් වූ ඕ තොමෝ කල් ඇවෑමෙන් පුත් කුමරකු ජනිත කළා ය. ඔහුට විඩූඩභ යැයි නම් කරන ලදී.

විඩූඩභ කුමරුන්ට වයස අවුරුදු දහ සය පිරුණු තැන මහානාම රජු ඇතුළු සිය ඤාතීන් දැක බලා ගනු පිණිස ඔහු පිටත් කර යවන ලදී. ශාක්‍යයෝ ඔහුට ආගන්තුක සත්කාරයෙන් සංග්‍රහ කළ හ. එහෙත් වයස අවුරුදු දහසයට අඩු ශාක්‍ය කුමාරවරුන් හැම දෙන විඩූඩභ කුමරුන්ට වැඳ ආචාර කිරීමෙන් වළකනු පිණිස වෙනත් පළාතකට යවා තිබිණ.

කපිලවස්තුවේ දින කිහිපයක් ගත කළ විඩූඩභ ආපසු පිටත්ව ගියේ ය. ඔහු පිටත්ව සුළු වේලාවකින් එක් සේවිකාවක ලවා විඩූඩභ කුමරුන් හිඳ ගත් පුටුව කිරෙන් සේදීම ඇරඹිණ. "මේ දැස්සක ගේ කොල්ලා හිඳ ගත් පුටුව" යි කියමින් ඇය පුටුව සෝදන අතරේ ම තමන්ට අමතකව ගිය යමක් රැගෙන යනු පිණිස විඩූඩභ ගේ සේවකයෙක් එහි පැමිණියේ ය. විඩූඩභ ගේ මව වූ වාසභඛත්තියා උපන්නේ මහානාම රජුට දාව දාසියක ගේ කුසින් බව ඔහුට හෙළි කළා ය.

මේ පුවත විඩූඩභ කුමරුනට නො වළහා හෙළි කරනු ලැබිණ. මේ අපහාසයෙන් බලවත් සේ කෝපයට පත් විඩූඩභ "මම යම් දිනක ශාක්‍යවංශය මිහිමතින් තුරන් කරමි" යි ප්‍රකාශ කළේ ය. ඒ වදන් එසේ ම සත්‍ය කරනු වස් හේ රාජ්‍යපද ප්‍රාප්ත වූ වහා ම යුද හමුදාවක් ද රැගෙන කපිලවස්තුවට ගොස් මහානාම ශාක්‍යයන් ගේ පවුලේ කීපදෙනකු හැර අන් සියළු දෙනාම ඝාතනය කළේ ය. ජයග්‍රහණයෙන් පසු ආපසු කෝසලය බලා එන අතරමග අචිරවතී ගං ඉවුරේ ඔවුහු නවාතැන් ගත් හ.

ඒ රැයෙහි ගඟ ඉහළ ප්‍රදේශයේ මහ වැසි වට හෙයින් ගඟ පිරී යෝධ ගංවතුරක් පහළට ගලා ආවේ ය. ගමන් හා සටන් වෙහෙස නිවා ගනිමින් තද බල නින්දේ පසු වූ විඩූඩභ ගේ සමස්ත හමුදාවම සැඩ පහරට හසු වී මරණයට පත් වූ හ. මේ ව්‍යසන දෙකම සැළ වූ විට භික්ෂූන් වහන්සේ ලා ඇමතූ භාග්‍යවතුන් වහන්සේ තම ඤාතීන්ට මේ ඉරණම අත් වූයේ ඔවුන් පෙර ජන්මයක ගඟක දියට වස දමා එහි විසූ සියලු මත්ස්‍යයන් විනාශ කිරීමෙහි දුර්විපාකය වශයෙන් බව දැක් වූ හ. අනතුරුව විඩූඩභ කරගත් ව්‍යසනය ගැන සඳහන් කරමින් උන්වහන්සේ පූර්වෝක්ත ගාථාව දැක්වූ හ.

**විවරණාත්මක අනුවාදය (47 ගාථාව)**

**ඉහ පුප්ඵානි පචිනන්තං ඉව බ්‍යාසත්ත මනසං නරං**
**මහොඝො සුත්තං ගාමං ඉව මච්චු ආදාය ගච්ඡති**

**ඉහ**: මේ (ලෝකයෙහි); **පුප්ඵානි**: මල්; **පචිනන්තං**
**ඉව**: නෙළන්නාක් මෙන්; **බ්‍යාසත්ත මනසං**:
කාමසුඛාස්වාදයෙහි ම ඇළුණු මනසක් ඇති; **නරං**:
පුද්ගලයා; **මහොඝො**: මහ ගංවතුරක්; **සුත්තං ගාමං**:
නිදිගත් ගමක්; **ඉව**: (වනසන්නාක්) මෙන්; **මච්චු**: මාරයා;
**ආදාය ගච්ඡති**: රැගෙන යයි.

මල් වත්තක මල් නෙලන්නාක් මෙන් මහත් අභිරුචියෙන් පංච කාම රසාස්වාදයෙහි නිරතව වසන මිනිස්සු, සියල්ලන් නිදද්දී ගමකට එන ගංවතුරක් හැම දෙන ගොදුරු කර ගන්නා පරිද්දෙන් මරුවා විසින් ගොදුරු කරගනු ලැබෙති.

**විවරණය**

**පුප්ඵානිහෙව පචිනන්තං**: මල් වත්තක මල් නෙලන්නට යන්නෙක් එහි ඇති පියකරු වර්ණයෙන් හා සුගන්ධයෙන් යුක්ත පුෂ්ප සම්භාරය දැක වශී වෙයි. මල් නෙලන්නට පටන් ගත් පසු ඔහුට වෙන කිසිවක් ගැන අදහස් හිසට නො එයි. ඔහු ගේ මූලික හා එකම අරමුණ හැකි තරම් සුන්දර කුසුම් නෙළීම ය. පංච කාම රසාස්වාදයෙහි ගිජු වන පුද්ගලයා ද එසේ ය. හෙතෙම ජීවිතයේ වෙනත් උදාර අරමුණු සියල්ල අමතක කර හුදෙක් කාමරතිය ම අගය කරයි.

**සුත්තං ගාමං**: පස් කම් සැපතෙහිම ගිලී ජීවිතයේ ගැඹුරු හා උසස් පරමාර්ථ අමතක කර ලන්නෝ නින්දට වැටුණවුන් හා සමාන ය.

**මහොඝො ඉව මච්චු ආදාය ගච්ඡති**: මහ ගංවතුරක් නිදිගත් ගම ගොදුරු කර ගන්නා මෙන් මරුවා පමා වූවන් ගෙන යයි.





*පස්කම් සැපයෙහි ඇලුම් ඇත්තා (මැරෙණ තුරුත්) කාමයන්හි සෑහීමකට නොපැමිණේ.*

48. පුප්ඵානි හෙ'ව පචිනන්තං
බ්‍යාසත්තමනසං නරං
අතිත්තං යෙව කාමෙසු
අන්තකො කුරුතෙ වසං (4:5)

සොම්නස් මල් නෙළ නෙළා
මුසපත් වන්නන් බලා
ගනියි මරු තමන් වසඟෙට
සිටියත් සිත තුටු නොලා

# කම් සුවයෙන් - මුලා නොවත්

## 4 (4) පතිපූජිකා කුමරිය ගේ කථාව (48 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **පතිපූජිකා කුමරිය** ඇරබ මේ ගාථාව දේශනා කර වදාළ සේක.

සැවැත් නුවර උපන් පතිපූජිකා කුමරිය වයස දහසයේ දී විවාහ කර දෙනු ලැබ පුතුන් සිව් දෙනකු ලද්දා ය. සිල්වත් ගුණවත් දානපතිනියක වූ ඕ තොමෝ සඟරුවනට සිවුපසය පිළිගැන්වීමෙහි ලා විශේෂයෙන් ම උනන්දු වූවා ය. නිතර නිතර විහාරස්ථානයට යන ඕ පැන් බඳුන් පිරිසිදු කර පැන් පුරවා වෙනත් වතාවත් ආදිය ද කරයි. පූර්ව ජන්මයන් සිහිපත් කිරීමේ නුවණ ඇති ව සිටි ඇයට තමන් පෙර ජන්මයේ තාවතිංස දිව්‍ය ලෝකයෙහි මාලාභාරී නම් දිව්‍ය පුත්‍රයා ගේ භාර්යාවක් ව සිටි බව සිහිපත් විය. තමා එයින් චුත වූයේ සියලු දෙන උද්‍යානයෙහි මල් නෙළන්නට ගොස් සිටි අවස්ථාවක බව ද මතක් විණි. එහෙයින් පින් කමක් කරන හැම මොහොතක ම තමන් ඒ පුණ්‍යානුභාවයෙන් නැවත තව්තිසාවේ මාලාභාරී දිව්‍ය පුත්‍රයා ගේ භාර්යාවක ව උපදිත්වා යි ප්‍රාර්ථනා කළා ය.

දිනක් පති පූජිකාව හදිසියේ ම ගිලන්ව එදින ම මිය පරලොව ගියා ය. ඇය දිගින් දිගට ම දැඩිසේ ප්‍රාර්ථනය කළ පරිදි මිය ගිය වහා ම ඕ තාවතිංසයේ මාලාභාරී දේවතාවා ගේ බිරිඳක ලෙස ම උපත ලද්දා ය. මෙලොව සියක් වසරක් දෙව්ලොව එක දවසක් හෙයින් පතිපූජිකාව එහි උපදින විටත් අන්‍ය දේවතාවෝ හා අප්සරාවෝ මල් උයනෙහි විනෝද වෙමින් සිටිය හ. එහෙයින් ඇය එහි නැවත පහළ වූ විට සුළු වේලාවක් ඇය දක්නට නො සිටියේ කවර හෙයින් දැයි මාලාභාරී විමසීය. ඕ තමන් එතැනින් චුත ව මනුලොව උපන් බවත් එහිදී විවාහව දරුවන් සිවුදෙනකු ලත් බවත් හදිසියේ අසනීපව මිය ගොස් මෙහි යළිත් උපන් බවත් හෙළි කළා ය.

පතිපූජිකාව ගේ මරණය ඇසූ භික්ෂූන් වහන්සේ සංවේග යට පත් වූ හ. භාග්‍යවතුන් වහන්සේ බැහැදැක ඒ පිළිබඳව කතා කළ හ. උදේ දන් පිළිගැන්වූ ඇය හවස මිය ගිය අයුරු ගැන සඳහන් කළ හ. ජීවිතයේ කෙටි කම ගැන විස්තර කළ භාග්‍යවතුන් වහන්සේ මිනිසුන් කම් සැප විඳ තෘප්තියක් ලබන්නට පෙර ම ඔවුන්ට මරු වසඟයට යන්නට සිදුවන බව පැහැදිලි කර දුන් හ.

### විවරණාත්මක අනුවාදය (48 ගාථාව)

**ඉධ පුප්ඵානි පචිනන්තං ඉව බ්‍යාසත්ත මනසං නරං**
**කාමෙසු අතිත්තං එව අන්තකො වසං කුරුතෙ.**

**ඉධ**: මේ (ලෝකයෙහි); **පුප්ඵානි**: මල්; **පචිනන්තං ඉව**: නෙළන්නාක් මෙන්; **බ්‍යාසත්ත මනසං**: කාම සුඛාස්වාදයෙහි ම ආශක්ත මනස් ඇති; **නරං**: පුද්ගලයන්; **කාමෙසු**: කාමයන් විෂයෙහි; **අතිත්තං එව**: තෘප්තිය නො ලබා සිටියදී ම; **අන්තකො**: මරුවා; **වසං කුරුතෙ**: තම වසඟයට ගනියි.

මේ ලෝකයෙහි මල් නෙලන්නාක් මෙන් කම් රස විඳීමෙහි ම ඇලී වසන මිනිසුන් කාමයෙන් තෘප්තියක් නො ලබා සිටියදී ම මාරයා තමන් වෙත ඇද ගනියි.

### විවරණය

**අන්තකො**: යන්නෙහි භාෂාමය අර්ථය "ඉවරයක් කරන්නා" යන්නයි. මෙය මරණය හෙවත් මාරයාට තවත් වචනයකි. මෙම ගාථාවෙහි දී මේ අන්තකයා මිනිසුන් කාමවස්තූන් රස විඳ දැන් ප්‍රමාණවත් යැයි සිතන තුරු බලා නො සිටින බව කියැවෙයි.

**කාම**: කාම යන වචනය කාමාශාව (විෂයී බද්ධ) මෙන් ම කාම වස්තු (විෂය බද්ධ) යන දෙකම හඟවනු පිණිස සන්දර්භය අනුව යෙදෙයි.

කාමාශාව පංච කාම වස්තූන් විෂයෙහි ම යොමු වෙයි. පංච නීවරණයන් අතර කාමරාගය, දස සංයෝජන අතර කාමච්ඡන්දය, ත්‍රිවිධ තණ්හාවන් අතර කාම තණ්හාව ත්‍රිවිධ චේතනා අතර කාම චේතනා වශයෙන් දැක්වෙන්නේ මේ විෂයී බද්ධ කාමාශාවයි.

කාම වස්තු පංචකය නම්, ඇසට ගෝචර වන රූප, කණට ගෝචර වන ශබ්ද, නාසයට ගෝචර වන ගන්ධ, දිවට ගෝචර වන රස සහ කයට ගෝචර වන ස්පර්ශ වෙති. මේවා ඉෂ්ට, කාන්ත, මනාප, රජනීය වැනි වචන වලින් හැඳින් වේ.

කාමච්ඡන්දය දුරු කර ලන්නේ අනාගාමී ඵලය මගිනි. කාමය ගැන විස්තර කරන පාලි පොත්වල දැක්වෙන පරිදි, හානිකරත්වය ඇත්තේ චක්ෂුරාදී ඉන්ද්‍රිය වලටත් රූපාදී කාම වස්තුවලත් නොව පුද්ගලයා ගේ කාමාශාව තුළ ය.





*බමරා මලේ පැහැය හා සුවඳ නොපෙළමින් පැණිගෙන ගන්නාක් මෙන් මහණහු ගම හැසිරෙති.*

49. යථාපි භමරො පුප්ඵං
වණ්ණගන්ධං අහෙඨයං
පලෙති රසමාදාය
එවං ගාමෙ මුනී චරෙ (4:6)

බමරකු කුසුමක් වෙත ගොස්
නො නසා පාටත් සුවඳත්
පැණි ගෙන යන විලාසයෙන්
සමිඳු ගමේ හැසිරෙනවා

# බඹරකු සේ නිසි - හිමි නම සරයි ගම තුළ

## 4 (5) කෝසිය සිටාණන් ගේ කතාව (49 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **කෝසිය සිටාණන්** අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

රජගහ නුවර සමීපයෙහි සක්කර නම් ගමෙහි තමන් සතු කිසිම දෙයක් කිසි ම කෙනෙකුට නො දෙන මච්ඡරිය කෝසිය නම් සිටුවරයෙක් විසී ය. එක් දිනක් සිටුවරයා හා දේවිය කැවුම් කනු රිසිව එය යම් කිසිවකු දුටුව හොත් ඔවුන්ටත් දෙන්නට සිදු වෙතැයි ලොබ සිතා උඩු මහලට නැගී තමන්ට පමණක් ඇතිවන තරමට කැවුම් තනන්නට පටන් ගත් හ.

එදින උදේ භාග්‍යවතුන් වහන්සේ මහා කරුණා සමාපත්තියෙන් ලොව බලා වදාරන සේක්, සිටුතුමා හා දේවිය දෙදෙනාට ම සෝවන් ඵලය ලැබීමට භාග්‍යය තිබුණු බව දුටු සේක. ඒ අනුව මුගලන් මහ රහතන් වහන්සේ අමතා, සිටු නිවසට ගොස් මධ්‍යාහ්න සමය වන විට දෙදෙනාම ජේතවනාරාමයට කැඳවා ගෙන එන ලෙස උපදෙස් දුන් හ. මුගලන් මහරහතන් වහන්සේ ද ඍද්ධි බලයෙන් ක්ෂණයකින් එහි වැඩම කර කවුළුවක් අසල වැඩ හුන් සේක.

සිටුවරයා මුගලන් හිමි දැක උන්වහන්සේට ඉවත්ව යන සේ නියෝග කළේ ය. උන්වහන්සේ කිසිවක් නො කියා එහිම වැඩ සිටිය හ. අවසානයේ කර ගත හැකි කිසිවක් නැති තැන මුගලන් හිමියන්ට දීම සඳහා ඉතා කුඩා කැවුමක් තනන්නැයි හෙතෙම බිරිඳට පැවසී ය. ඒ අනුව ඕ හැන්දකට පිටි මුසුවෙන් ඉතා ස්වල්පයක් ගෙන තාච්චියට දැම්මා ය. එයින් සෑදුණු කැවුමෙන් මුළු තාච්චිය ම පිරිණි. බිරිඳ වැරදීමකින් පිටි මුසු ව වැඩිපුර දමා ඇතැයි සිතූ සිටාණෝ තමා ම ඇඟිලි දෙකකට අසුවන තරමේ ස්වල්පයක් තාච්චියට දැම්මේ ය. එය ද අති විශාල කැවුමක් බවට පත් විය. ඔවුන් නැවත නැවත වෑයම් කළ ද කුඩා කැවුමක් තනාගන්නට බැරි විය. කුඩා කැවුම් තනන්නට මහන්සි වෙනවා වෙනුවට කලින් තනා ඇති සාමාන්‍ය ප්‍රමාණයේ කැවුම් වලින් එකක් දෙන්නට ඔවුහු තීරණය කළ හ.

කැවුම් තනා රැස්කර තිබුණු පෙට්ටියෙන් එක කැවුමක් ගන්නට බිරිඳ තැත් කළ ද අරුම පුදුම අයුරින් එහි සියලු ම කැවුම් එකට බැඳී තිබිණ. එකක් වෙන් කර ගන්නට හැකියාවක් නො තිබිණ. මේ වන විට කැවුම් කන ආශාව සිටුතුමා ගෙන් තුරන් වී ගියේ ය. සියලු ම කැවුම් මුගලන් හිමියන්ට පූජා කරන්නැයි හේ පැවසී ය. මුගලන් හිමියෝ සිටුතුමා හා දේවියට ධර්ම දේශනාවක් කළ හ. එමෙන් ම බුදු පියාණන් ඔවුන් එනතුරු බලා සිටින බව ද පැවසූ හ. බුදුරදුන් වැඩ සිටි සැවැත් නුවර ජේතවනාරාමයට රජගහ නුවර සිට දුර යොදුන් 45 කි. මුගලන් හිමියෝ සිටුවරයා හා දේවිය සිය ඍද්ධි බලයෙන් බුදුන් හමුවට පැමිණවූ හ. ඔවුන් එහි ගියේ කැවුම් පෙට්ටිය ද රැගෙන ය. එය බුදුරජාණන් වහන්සේට හා භික්ෂූන් වහන්සේලා පන්සියයක් නමට පූජා කරන ලදී. අවසානයේ බුදුරදුන් දෙසූ දහම් දෙසුම අසා කෝසිය සිටුතුමා හා දේවිය සෝවාන් වූ හ.

මේ පුවත පසුදින සන්ධ්‍යාවෙහි භික්ෂූන් වහන්සේ අතර සාකච්ඡාවට ලක් විය. ඔවුන් මුගලන් මහරහතන් වහන්සේ ගේ දක්ෂකම් හා ගුණ මහිමය ගැන කතා කරමින් සිටිය දී එහි වැඩම කළ භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, ඔබ ද ගමේ වාසය කළ යුත්තේ මොග්ගල්ලාන පරිද්දෙන්මය. ප්‍රත්‍ය ලබා ගත යුත්තේ ඔවුන් ගේ ශ්‍රද්ධා භක්තියට හානියක් නො වන පරිද්දෙනි" යි වදාළ හ.

### විවරණාත්මක අනුවාදය (49 ගාථාව)

**යථා අපි භමරො පුප්ඵං වණ්ණගන්ධං අහෙඨයං රසං**
**ආදාය පලෙති එවං මුනී ගාමෙ චරෙ**

**යථා අපි**: යම් සේ; **භමරො**: බමරෙක්; **පුප්ඵං**: මල; **වණ්ණගන්ධං**: පාට හා සුවඳ; **අහෙඨයං**: නොනසා; **රසං**: පැණි; **ආදාය**: රැගෙන; **පලෙති**: ගමන් කරයි ද; **එවං**: මෙසේ ම; **මුනී**: භික්ෂුව; **ගාමෙ**: ගමක; **චරෙ**: හැසිරෙයි.

බඹරා පාටට හා සුවඳට හානියක් නො කර මලෙහි පැණි ගෙන පරාගනය මගින් ඵල දරන තත්ත්වය ද ඇති කරයි. භික්ෂුව ද ගමක හැසිරිය යුත්තේ ඒ අයුරිනි.

### විවරණය

**ගාමෙ මුනී චරෙ**: භික්ෂූන් වහන්සේ නමක් ගමකින් ප්‍රත්‍ය ලබා ගන්නේ ඉතාමත් සෞම්‍ය විලාසයෙනි. පිඩු සිඟා යන භික්ෂුවක් ගෙපිළිවෙලින් නිහඬව ගමන් කරමින් හැන්දක් පමණ වූ ස්වල්පයක් ලබා ගනියි. අනෙකුත් ප්‍රත්‍යය විෂයෙහි වුව ද ඉල්ලීමකින් හෝ බලපෑමකින් තොරව ලබා ගැනීම සිරිතය. කවර අයුරකින් වත් ගම 'සූරාකෑමක්' සිදු නො වේ. බමරකු මලකින් රොන් ගන්නේ ද ඒ අයුරින්මය. මලෙහි වර්ණය හෝ සුගන්ධයට හානියක් නො කෙරෙයි. බමරා රොන් ගත් විට මල පරාගනය වී ඵලෝත්පාදනය සිදු වෙයි. එමෙන් ම භික්ෂූන් වහන්සේ ශික්ෂාව පිළිගත් විට දායකයාට කුශල කර්ම රැස් වෙයි. එමගින් මෙලොව මෙන්ම පරලොව ද අභිවෘද්ධිය සැලසෙයි. භික්ෂුවක් අභිනිෂ්ක්‍රමණය මගින් සමාජයෙන් බැහැර වූවා සේ පෙනුණ ද එතුමන් ගේ ක්‍රියාකාරිත්වය හුදෙක් තමා ගේ විමුක්තිය අරබයා නොව අන්‍යයන්ගේ ද විමුක්තිය අරබයා වූවකි.





*අනුන්ගේ රළුපරළු බස් හා කළ නොකළ දේ ගැන මෙනෙහි නො කොට, සිය කටයුතු සලකා බැලිය යුතු.*

50. න පරෙසං විලොමානි
න පරෙසං කතාකතං
අත්තනො'ව අවෙක්ඛෙය්‍ය
කතානි අකතානි ච (4:7)

අනුන් ගේ දොස් පරොස් බස් හෝ
කළ නො කළ දේ ගැනත් නො සොයා
තමන් ගේ අඩුපාඩු කම් හා
කළ නො කළ දේ බලනු විමසා

# අනුන් ගැන නොව - තමන් විමසනු
## 4 (6) පාවෙය්‍ය ආජීවකයා ගේ වත (50 ගාථාව)

සැවැත් නුවර ආජීවකයකු පුත් තනතුරේ තබා වැඩූ එක් **පොහොසත් කාන්තාවක්** ඇරබ දෙව්රම වැඩ විසූ බුදු රජාණන් වහන්සේ මේ ගාථාව වදාළ සේක.

නිතර නිතර බුදුරදුන් දක්නට යන සැදැහවතුන්, බුදුරජාණන් වහන්සේ ගේ ගුණ මහිමය හා ධර්ම දේශනා කෞශල්‍යය ගැන කරන වැණුම් අසා මේ කාන්තාවට බුදුරදුන් දැක දහම් අසන්නට ආශාවක් ඇති කර ගත්තී ය. එහෙත් ආජීවකයා ඊට කිසි විටෙක ඉඩ නො දෙයි. අන්තිමේ, "එසේ නම් මම බුදුරදුන් මගේ නිවසට වැඩම කරවා ගෙන දහම් අසන්නෙමි"යි සිතා සිය පුත්‍රයාට බුදුරදුන් හමුවී තම නිවසේ දවල් දානය සඳහා වැඩම කරවන සේ ආරාධනය කරන්නැයි නියම කළේ ය.

පුත්‍රයා ද ආරාධනය සඳහා ජේතවනාරාමයට යන අතර මග ආජීවකයා ගේ ආරාමයට ද ගොඩ විය. ඔහු බුදුරදුන්ට දවල් දානය සඳහා පැමිණෙන්නැයි ඇරයුම් කිරීමට යන බව දැනගත් හේ එය වළකන්නට බොහෝ උත්සාහ කළේ ය. එහෙත් මව ගේ අණට අකීකරු වන්නට අකැමැති දරුවා ඊට එකඟ නො වූයෙන්, "එසේ නම්, දානයට ආරාධනා කරන්න. එහෙත් නිවසට එන මාගී විස්තර නො කියා වහා ආපහු එන්න. එවිට බුදුරදුන්ට පැමිණෙන්නට බැරි වනු ඇත. පිසනු ලබන රසවත් ආහාර අප දෙදෙනාට අනුභව කළ හැකිය" යි උපදෙස් දුන්නේ ය. දරුවා ද ඒ කී ලෙසින් ම කළේ ය.

පසු දින බුදුරදුන්ට මග වරදිතියි සිතා ගත් ආජීවකයා උදෙන්ම එම නිවසට ගියේ ය. උපාසිකාව ද ඔහු පසුපස කාමරයෙක හිඳුවා බුදුරදුන් පිළිගැනීමට නිවස සරසා භෝජන පිළියෙළ කොට බලා සිටියා ය. බුදුරදුනට කිසිවකු මග කිවයුතු නැති හෙයින් උන්වහන්සේ නියම වේලාවට එහි වැඩම කළ හ. කාන්තාව ද ඉතා ප්‍රණීත භෝජනයෙන් බුදු පියාණන් වහන්සේට දානමානාදියෙන් උවටැන් කළා ය.

දන් වළඳා අවසානයේ, බුදුරජාණන් වහන්සේ අනුමෙවෙනි බණ දෙසූ හ. උපාසිකාව ද ඉතා සැදැහැයෙන් බණ අසන්නී වරින් වර සාදුකාර දුන්නා ය. ඒ අසා සිටි ආජීවක තෙම ඊර්ෂ්‍යාවෙන් දැවී කාමරයෙන් එළියට අවුත් "තී දැන් ඉතින් මගේ දායිකාවක් නො වේ. තී මොහු ගේ බණට සාදුකාර දුන්නී ය. ඒ නො තරම් ක්‍රියාවකි" ආදී වශයෙන් ඵරුස වචනයෙන් බැණ වැදී යන්නට ගියේ ය.

එතැන් පටන් උපාසිකාව ගේ සිතට බණ නො වැටහෙයි. බුදුරදුනට එම මානසික විපර්යාසය වැටහින. "උපාසිකාව මගේ බණ දැන් ඔබේ සිතට නො වැටහෙයි." බුදු රදුන් පැවසූ විට "ස්වාමීනි, ඒ ආජීවකයා ගේ කතාවෙන් මා සිත වියවුල් විය. ඒ බැණුම් වලින් මම කම්පා වීමි''යි පැවසුවා ය. ඇයට අවවාද කළ භාග්‍යවතුන් වහන්සේ අන්‍යයන් ගේ අවලාද කතා, කළ නො කළ දේ ගැන නො සිතා තමන් කළ නො කළ දේ ගැන බලා ගැනීම වඩා හොඳ බව පවසා මේ ගාථාව ද වදාළ හ.

**විවරණාත්මක අනුවාදය (50 ගාථාව)**

**පරෙසං විලොමානි න පරෙසං කතාකතං න අත්තනො**
**එව කතානි අකතානි ච අවෙක්ඛෙය්‍ය**

**පරෙසං**: අනුන් ගේ; **විලොමානි**: අඩු පාඩු සෙවීම්; **න**: නො සිතන්න; **පරෙසං**: අනුන් ගේ කතා: **කතං**: කළ නො කළ දේ; **න**: නො සිතන්න; **අත්තනො එව**: තමන් ගේ ම; **කතානි**: කළ දේ; **අකතානි**: නො කළ දේ; **අවෙක්ඛෙය්‍ය**: පරීක්‍ෂා කර බලන්න.

අන්‍යයන් අපට දක්වන විරුද්ධ, විවේචන ගැන හෝ අනුන් කරන නො කරන දේ ගැන නොව තමන් කරන හා නො කරන දේ ගැන විමසා බැලීම යහපත් ය.

**විවරණය**

**පරෙසං කතා කතානි**: අනුන් කළ කී දේ හා නො කළ දේ ගැන සෙවීම සමාජයේ බොහෝ දෙනා අතර පවත්නා ස්වභාවයකි. මේ ගාථාව එම දුර්වලතාව පිළිබඳව සඳහන් කරයි. මෙය හුදෙක් ගිහියනට පමණක් උරුම ගතියක් නො ව පැවිද්දනට ද උරුම ස්වභාවයකි. එහෙත් මෙය අධ්‍යාත්මික දියුණුවට බාධාවකි. එමෙන් ම ඉතාමත් ම අවශ්‍ය කාර්‍යයක් වූ අන්තරාවලෝකනය වළකා ලයි.





*දහම් දැන ඉගෙන ඒ අනුව නො පිළිපදින තැනැත්තාට ඒ දහමෙන් වැඩක් නැත්තේ ය.*

51. යථාපි රුචිරං පුප්ඵං
වණ්ණවන්තං අගන්ධකං
එවං සුභාසිතා වාචා
අඵලා හොති අකුබ්බතො (4:8)

හොඳ ලස්සණ මලක් වුවත්
පල නැති සේ සුවඳ නැතොත්
නොපිළිපදින බණ පදයක්
පල නැති වෙයි මිහිරි නමුත්

# පිළිපැද්දෝතින් පමණක් - බණෙන් අපට වේය වැඩක්
## 4 (7) ඡත්තපානි ගේ කතාව (51 හා 52 ගාථා)

**ඡත්තපානි** නම් උපාසක තැන හා පසේනදී කොසොල් රජතුමා ගේ දේවීන් දෙ දෙන ඇරබ භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙරදී මේ ගාථා දෙක වදාළ සේක.

සැවැත් නුවර විසූ ඡත්තපානි, ධර්ම විනය පිළිබඳ මනා දැනුමක් ඇතිව සිටි සකදාගාමි ඵලය පත් ගෘහස්ථ බුද්ධ ශ්‍රාවකයෙක් වූයේ ය. එක් හිමිදිරි පෝදා උදයක ඡත්තපානි භාග්‍යවතුන් වහන්සේ බැහැ දකින්නට ආයේ ය. සාමාන්‍යයෙන් පෝ දින පෙහෙවස් රැකීම ගිහි බෞද්ධයන් ගේ සිරිත වුවද සකදාගාමී වූවන් හැම දා පෙහෙවස් රකින හෙයින් ඒදින වුව ද විශේෂයක් නො වී ය.

සිල්වත් උපාසකයකු වූ ඡත්තපානි එදා භාග්‍යවතුන් වහන්සේ දක්නට ගොස් වැඳ, නමස්කාර කොට ධර්ම ශ්‍රවණය කරමින් හුන්නේ ය. මේ අතර තුර පසේනදී කොසොල් රජතුමා ද භාග්‍යවතුන් වහන්සේ දැක හර-සර දක්වනු වස් එහි පැමිණියේ ය. රජතුමා එනු දුටු ඡත්තපානි "දැන් මහ රජතුමා මෙහි එන විට මා නැඟිට ගරු කළ යුතු ද? රජතුමාට අප ගරු කළ යුතු වුවත් දැන් මා සිටින්නේ තුන් ලෝකාග්‍ර බුදුරජාණන් වහන්සේ සමීපයෙහි ය. එසේ හෙයින් මා රජතුමාට හරසර දක්වන්නට ගිය හොත් බුදුරජාණන් වහන්සේට නිග්‍රහයක් කළා වෙයි. රජතුමා සමඟ සිටින විට මා ප්‍රාන්ත රජ කෙනකුට ගරු නො කළ යුතු පරිද්දෙන් ම බුදුරජාණන් වහන්සේ හමුවෙහි රජතුමාට ගරු නො කළ යුත්තේ ය. එහෙයින් රජතුමා මා කෙරේ කෝප ගන්නේ වුව ද මම හුනස්නෙන් නො නැඟී සිටිමි"යි සිතා ගත්තේ ය. ඒ අනුව රජතුමා පැමිණි විට ඡත්තපානි නැඟී සිට ගරු කිරීමක් නො කළේ ය. (මෙහි දැක්වෙන ආදර්ශය නුවණින් වටහා ගැන් ම ප්‍රයෝජනවත් ය. අපට වඩා ශ්‍රේෂ්ඨයන් සමග යමකු සිටින විට ඔහු ගෙන් හරසර නො ලැබුණා යයි අප කෝප නොගත යුතුය. නුවණැත්තෝ එසේ සිත් නො සතුටු කර නො ගනිති.)

කෙසේ වුව ද ඡත්තපානි නැඟිට තමාට ආචාර සමාචාර නො දැක්වීම ගැන කොසොල් රජු කෝපයට පත් විය. එතකුදු වුවත් නිහඬ ව භාග්‍යවතුන් වහන්සේට වැඳ නමස්කාර කර එකත්පස්ව හුන්නේ ය. රජතුමා කිපී සිටින බව දත් භාග්‍යවතුන් වහන්සේ "මහරජ, මේ ඡත්තපානි උපාසක තැන නැණවතෙකි. ධර්මය පිළිබඳ විශාරදයෙකි. ලාභයෙහි මෙන් ම අලාභයෙහි ද කම්පා නො වන්නෙකි." ආදී වශයෙන් ඔහු පිළිබඳ ගුණ වර්ණනාවක් කළ සේක. ඒ අසා සිටි රජතුමා ගේ හද තරමක් මෘදු විය. එක් දිනක් උදෑසන, මහරජ තෙම සිය මාලිගයෙහි සී මැදුරු කවුළුවෙන් මහ මග දෙස බලා සිටින විට ඡත්තපානි උපාසක තැන පාවහන් පැළඳ කුඩය ද දරා ගෙන රජ වීදිය දිගේ ගමන් කරනු එතුමා ගේ නෙත ගැටිණ. ඔහු වහා ම රජ මැදුරට කැඳවන්නැයි රජ තෙම නියෝගයක් දුන්නේ ය. පණිවුඩය ලත් වහාම කුඩය හකුළා පාවහන් මුදා තබා ගරු සරු ඇතිව මාලිගයට පිවිසුණු ඡත්තපානි රජතුමාට හරසර දක්වා එකත් පසෙක විනීත ව සිටියේ ය. "උපාසකය, පාවහන් මුදා තබා ඡත්‍රය ද පසෙක තබා එන්නට හේතුව?" යි රජතෙමේ ප්‍රශ්න කළේ ය.
"මහ රජතුමනි, ඔබ වහන්සේ මා කැඳවන බව ඇසූ සැණෙකින් ඔබ වහන්සේට හරසර පිණිස ඒවා මුදා තැබුවෙමි." "එසේ නම්, මා මහරජ බව අද ඔබ දැන ගත්තා!"

"දේවයන් වහන්ස මා ඒ බව හැමදාමත් දැන සිටියා"
"එහෙම නම්, එදා බුදුරදුන් හමුවේ දී ඔබ මා දැක දැකත් කිසි ගරු සරුවක් නැතිව හිඳගෙන ම සිටියේ?"
"දේවයන් වහන්ස, ඒ ඔබ වහන්සේ කෙරේ නිග්‍රහ කරනු පිණිස නො වේ. මා එදා සිටියේ තුන් ලොවට ම අග්‍ර වූ භාග්‍යවතුන් වහන්සේ හමුවේ. උන් වහන්සේ හමුවේ ඔබ තුමාට හරසර පිණිස නැඟී සිටියා නම් එයින් භාග්‍යවතුන් වහන්සේට අවමානයක් වන්නට තිබුණා. ඒ නිසා මා නො නැඟිට සිටියා මිස මහරජ තුමාට අවමානයක් කරන්නට සිතුවා නො වෙයි."

ඒ ඇසූ මහ රජතෙම "හොඳයි ගිය දේ ගියාවේ. මට ආරංචියි ඔබ මෙලොව-පරලොව දෙකටම හිතකර ධර්ම කාරණා පිළිබඳව විශාරදයෙක් බව. ඒවගේ ම ධර්ම විනය පිළිබඳ හොඳ දැනුමක් ඔබට තියෙන නිසා මගේ අන්තඃපුරයට නිතර ඇවිත් ඒ කාන්තාවන්ට ධර්ම දේශනා කරන්න මම ඔබට ඇරයුම් කරනවා"යි පැවසී ය. ඡත්තපානි ඒ අදහසට කැමැත්තක් නො දැක්වී ය. "දේවයන් වහන්ස, මම ඒකට නම් කැමැත්තක් නෑ"යි ඔහු පැවසූ විට ඊට හේතු දක්වන ලෙස රජතුමා ඉල්ලා සිටියේ ය. "දේවයන් වහන්ස, රජ ගෙදර බොහොම නීති රීති, දඬුවම් තියෙන තැනක්. චාරිත්‍ර වාරිත්‍ර බොහොමයි. එය ටිකක් අනතුරුදායක වැඩක්"යි හේ පැවසී ය. "එදා සිදු වූ දේ ගැන මගේ හිතේ යම් අමනාපයක් තිබෙනවා යැයි ඔබ වෙත බයක් තියා ගන්න එපා. මම එය අමතක කළා" යි රජතුමා පැවසූව ද "දේවයන් වහන්ස, පැවිදි උතුමන් කළ යුතු දේවල් ගිහි අප කරන්නට යාම හරි නැහැ. ඒ නිසා එයට භික්ෂු නමක් ම යොදවා ගන්න" යි ඡත්තපානි බොහෝ නිහතමානී ලෙස කියා සිටියේ ය.

**විවරණාත්මක අනුවාදය (51 ගාථාව)**

**යථා අපි රුචිරං වණ්ණවන්තං අගන්ධකං පුප්ඵං යථා,**
**එවං සුභාසිතා වාචා අපි අකුබ්බතො අඵලා හොති.**

**යථා අපි**: යම් සේ; **රුචිරං**: ප්‍රියංකර; **වණ්ණවන්තං**: වර්ණවත්; **අගන්ධකං**: සුවඳ නැති; **පුප්ඵං**: මලක්; යථා: යම් සේ (නිෂ්ප්‍රයෝජන) ද; **එවං**: එසේම; **සුභාසිතා වාචා**: සුභාෂිත වචනය (ධර්මය); **අපි**: ද, **අකුබ්බතො**: පිළිපැදීමක් නො කරන්නාට; **අඵලා හොති**: නිෂ්ප්‍රයෝජන වෙයි.

ඉතා ප්‍රියංකර වර්ණවත් පුෂ්පයක් වුව ද සුවඳින් තොර නම් නිෂ්ඵල සේම මනාව දේශිත ධර්මයක් වුව ද ක්‍රියාත්මක නො කරන්නේ නම් ප්‍රයෝජන නො ලැබේ.



*දහම දැන ඉගෙන ඒ අනුව හැසිරෙන තැනැත්තාට ඒ දහම මොනවට හිත සැප එළවයි.*

52. යථාපි රුචිරං පුප්ඵං
වණ්ණවන්තං සගන්ධකං
එවං සුභාසිතා වාචා
සඵලා හොති සකුබ්බතො (4:9)

හොඳ ලස්සණ පාට මලක්
ඇති විට ඉමිහිරි සුවඳක්
ඒ වාගෙයි බණ පදයක්
පිළිපදිතොත් වේය සරණක්.

# පිළි පැද්දෝතින් පමණක් - බණෙන් අපට වේය වැඩක්

## 4 (7) ඡත්තපානි ගේ කතාව (51 සහ 52 ගාථා) ඉතිරි කොටස.

රජතුමා එයට එකඟ ව ඡත්තපානිට සමුදුන්නේ ය. පසේනදී කොසොල් රජතෙම තම අන්තඃපුරයෙහි ධර්ම දේශනා කරන්නැයි භාග්‍යවතුන් වහන්සේට ආරාධනය කර යැව්වේ "ස්වාමීනි, මගේ අග බිසෝවරුන් වූ මල්ලිකා හා වාසභඛත්තියා "අපිත් ධර්මධර වන්නට ආශා ඇත්තෝමු" යි කියති. එහෙයින් නිරතුරුව ම පන්සියයක් භික්ෂූන් වහන්සේ ද කැටුව රජ මාලිගයට වැඩම කර මෙහි ධර්ම දේශනා කළ මැනව'' යි කියමිනි. එහෙත් "මහරජ, එකම තැනකට නිතර නිතර පැමිණීම මට පහසු කාර්‍යයක් නො වේ. එහෙයින් මම ඒ කාර්‍යය ආනන්ද ස්ථවිරයන්ට පවරමි" යි භාග්‍යවතුන් වහන්සේ පිළිතුරු එවූ හ.

ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද නිතර නිතර රජ මාලිගයට වැඩම කර බිසෝවරුනට ධර්මානුශාසනා කරති. රජතුමාගේ දේවීන් අතුරින් මල්ලිකා දේවිය මනාව ධර්මශ්‍රවණය කර නැවත නැවත සිහිපත් කරමින් ධාරණය කර ගන්නා අතර ප්‍රගුණ කිරීම ද කරයි. එහෙත් වාසභඛත්තියා එතරම් උනන්දුවෙන් ධර්මය ඉගෙනීමක් හෝ පිළිපැදීමක් නො කරයි. දැනුම මෙන් ම භාවිතය අතින් ද ඕ බොහෝ පසුබට වූ වා ය. දිනක් භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමියන් අමතා "ආනන්ද, ඔබ ගේ රජවාසල ශ්‍රාවිකාවන් ධර්මය හොඳට ඉගෙන ගන්නවා ද?" යි විමසූ හ. "එසේ ය ස්වාමීනි" යි ආනන්ද හිමියෝ පිළිතුරු දුන් හ.

"කවුද වඩා හොඳින් ඉගෙන ගන්නේ?" "මල්ලිකා දේවිය හොඳට ඉගෙන ගන්නවා. ඇය උනන්දුවෙන් සවන් දෙනවා, හොඳට තේරුම් ගන්නවා. නැවත ආවර්ජනය කරනවා. ඒත් ඔබ වහන්සේ ගේ ඥාති වරිය, වාසභඛත්තියා එතරම් උනන්දුවෙන් සවන් දෙන්නේ නැහැ. හරියට තේරුම් ගන්නේත් නැහැ. නිතර සිහිපත් කරන්නේත් නැහැ" යි ආනන්ද හිමියෝ පිළිතුරු දුන් හ. "ආනන්ද, මා දේශනා කරන ධර්මය සැදැහයෙන් සවන් නො දෙන, ඉගෙන නො ගන්න, නැවත නැවත මතක් නො කරන, දේශනාත් නො කරන තැනැත්තාට සුවඳ නැති ලස්සන මලක් මෙන් නිෂ්ප්‍රයෝජන වෙයි. එයට ශ්‍රද්ධාවෙන් සවන් දී හොඳින් ඉගෙන, නැවත නැවත මෙනෙහි කොට තව අයටත් පැහැදිලි කර දෙන අයට එයින් බොහෝ ප්‍රයෝජන අත් වෙනවා" යි වදාළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා දෙක ද වදාළ සේක.

### විවරණාත්මක අනුවාදය (52 ගාථාව)

**යථා අපි රුචිරං වණ්ණවන්තං සගන්ධකං පුප්ඵං යථා ඒවං සුභාසිතා වාචා අපි සකුබ්බතො සඵලා හොති.**

**යථා අපි**: යම් සේ; **රුචිරං**: සිත්කළු; **වණ්ණවන්තං**: පැහැපත්; **සගන්ධකං**: සුවඳැති; **පුප්ඵං**: කුසුමක්; **යථා**: යම් සේ ද; **ඒවං**: එසේ ම; **සුභාසිතා වාචා අපි**: සුභාෂිත ධර්මය ද; **සකුබ්බතො**: ක්‍රියාත්මක කරන්නාට; **සඵලා හොති**: සප්‍රයෝජන වන්නේ ය.

සිත් පිනවන වර්ණවත් පුෂ්පය සුගන්ධයෙන් ද යුක්ත නම් එය ප්‍රයෝජනවත් ය. එපරිද්දෙන් ම මනාව දේශිත මධුර ධර්මය ක්‍රියාත්මක කරන්නේ නම් එයින් ප්‍රයෝජන සැලසෙයි.

### විවරණය

**අගන්ධකං**: යි හැඳින්වූයේ පුෂ්පයක් සුගන්ධයෙන් තොර වූ බව හඟවනු පිණිසය. මලක අප වඩාත් ම ප්‍රිය කරන අංගය සුවඳයි. සුවඳ නැත හොත් එය අගය නො කරමු. එමෙන් ම ධර්මය ද කවර තරම් මධුර ආකාරයෙන් දේශනා කරනු ලැබුවද ක්‍රියාවට නො නඟන්නේ නම්, එහි පැවැත්මෙන් ප්‍රයෝජනයක් නැත. සද්ධර්මය සුගන්ධිත වන්නේ ක්‍රියාවට නංවන විට ය.

**සගන්ධකං**: පුෂ්පය සුවඳ සහිත වූ විට මල් මාලා තැනීමට, බුදුන් පිදීමට, සුවඳ ද්‍රව්‍ය නිෂ්පාදනයට වැනි දහසකුත් එකක් දේට එය යොදා ගනු ලැබේ. ධර්මය ද එසේ ම ය.

**අකුබ්බතො හා සකුබ්බතො**: යන වචන වලින් ධර්මයෙහි ප්‍රායෝගික අගය දක්වනු ලැබේ. බුදු දහම හුදු විශ්වාස මාත්‍රයක් නො වේ. විශ්වාසය පදනම් කරගත් ආගම් වල බාහිර දේවත්වයක ආධාරය පතා යාඥා කිරීම ප්‍රමාණවත් ය. ප්‍රායෝගිකව තමන් ම ප්‍රගුණ කළ යුතු ශික්ෂාවක් අනවශ්‍ය ය. එහෙත් බුදු දහම විශ්වාසය වෙනුවට භාවිතය අවධාරණය කරයි. තම තම ඥාන ප්‍රමාණය හා ශක්ති ප්‍රමාණය අනුව තම තමා විසින් ප්‍රගුණ කළ විට බෞද්ධ ශික්ෂාව ප්‍රතිඵල දානය විසින් සුගන්ධිත වෙයි. බුදු දහම පිළිපදින්නා වර්ණවත් සුගන්ධිත පුෂ්පයක් බවට පත් වෙයි.



*මල් රැසකින් බොහෝ මල් දම් ගොතන්නේ යම් සේ ද එසේ ම උපන් මිනිසා විසින් බොහෝ කුසල් කළ යුතු.*

53. යථාපි පුප්ඵරාසිම්හා
කයිරා මාලාගුණෙ බහූ
ඒවං ජාතෙන මච්චේන
කත්තබ්බං කුසලං බහුං (4:10)

මල් රැසකින් මනා
මාලා සදන අයුරින්
උපන් අප සැම දෙන
බොහෝ පින් කළ යුතුමය

# මනු ලෝකේ උපන්නොතින් - කළ යුතුවෙයි කුසල් නිතින්

## 4 (8) විශාඛාවන් ගේ කථා ප්‍රවෘත්තිය (53 ගාථාව)

පුෂ්පාරාමය තනවා පූජා කළ **විශාඛා මහෝපාසිකාව** නිමිති කර ගෙන භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව එම විහාරස්ථානයේ ම වැඩ වෙසෙමින් වදාළ සේක.

භද්දිය නුවර ධනංජය සිටාණන් ගේත් සුමනා දේවිය ගේත් දියණිය වූ විශාඛා බිම්බිසාර රජතුමා ගේ පාලනයේ පැවති මගධ රාජ්‍යයේ විසූ පංච මහා සිටුවරුන් ගෙන් එක් අයකු වූ මෙණ්ඩක ගේ මිණිපිරිය වූවා ය.

විශාඛා සත් හැවිරිදිව, සිටිය දී බුදුරජාණන් වහන්සේ භද්දිය නගරයට සම්ප්‍රාප්ත වූ හ. ඒ අවස්ථාවේ දී මෙණ්ඩක සිටාණෝ විශාඛාව හා ඇය ගේ පිරිවර කුමරියන් පන්සියයක් දෙනා ද කැටුව බුදුන් දකින්නට ගිය හ. බුදුරදුන් කළ දහම් දෙසුම අසා මෙණ්ඩක සිටාණෝ ද, විශාඛාවෝ ද පිරිවර කුමරියෝ ද යන මේ හැම දෙනා සෝවාන් ඵලයෙහි පිහිටිය හ.

වැඩි වයසට පත් විශාඛා සැවැත් නුවර මිගාර සිටුවරයා ගේ පුත්‍රයා වූ පුණ්‍ණවර්ධනට විවාහ කර දෙන ලද්දී ය. දිනක් මිගාර සිටුතුමා ආහාර ගනිමින් සිටිනා අතර භික්ෂු නමක් පිඬු සිඟා පැමිණියේ ය. ඔහු එය ගණනකට නො ගෙන ආහාර ගනු දුටු විශාඛා හිමි නම වෙත ගොස් "හිමියනි, මගේ මාමා පුරාණයක් අනුභව කරයි" යි පැවසුවා ය. එයින් කෝපයට පත් මිගාර විශාඛාවනට නිවසින් බැහැර යන සේ නියෝග කළ ද "මම නොයමි. මා යා යුතු ද නැත්දැයි තීරණය කළ යුත්තේ මා විවාහ වූ දිනයේ මෙ බඳු අවස්ථාවලට මැදිහත් වන සේ පත් කළ නැණවත් වෘද්ධ සිටුවරුන් අට දෙනා විසිනි" යි. පැවසූ ඕ ඔවුන් කැඳවූවා ය.

ඔවුන් හමුවේ මිගාර තම පැමිණිල්ල කළේ ය. විශාඛා තමන් පුරාණයක් යැයි කීවේ 'අසුචි' යන අරුතින් නොව පෙර කළ පිනින් ලත් දෙයක් යන අරුතින් බවත් මිථ්‍යාදෘෂ්ටික මිගාර පවුලේ අය වර්තමානයේ පිනක් නො කරන හෙයින් එය අර්ථ සම්පන්න බවත් පැහැදිලි කළ විට ඇය නිවරද බව විද්වත් වැඩිහිටියෝ තීරණය කළ හ. අනතුරුව විශාඛා "මම තෙරුවන් කෙරේ පැහැදුණු බොදු කතක්මි. පිනක් දහමක් නො කෙරෙන මේ මිසදිටු කුලයෙහි මට විසිය නො හැකිය." යි පවසා "මම යමි" යි යන්නට සැරසුණා ය. එහෙත් ඇයට තමන් රිසි පරිදි බුදු පාමොක් මහ සඟනට දන් පිළිගැන්වීමට අවසර ලැබුණු හෙයින් ඕ නො ගියා ය.

පසුදින ම විශාඛා බුදු පාමොක් මහ සඟනට දන් පිරිනැමුවා ය. දන් පිළිගන්වන්නට එන්නැයි මිගාරට ද ඇරයුම් කළද හේ නො පැමිණියේ ය. දන් පිළිගැන්වීමෙන් පසු බුදුරදුන් අනුමෙවෙනි බණ දෙසන්නට සැරසෙන විට ඕ යළිත් තම මාමණ්ඩියට පණිවුඩයක් යැව්වා ය. දෙවන වර ඇරයුම් කළ විට ප්‍රතික්ෂේප කිරීම නුසුදුසු යැයි සිතූ මිගාර එන්නට සැරසෙන විට එහි පැමිණ සිටි නිඝණ්ඨ නාථපුත්ත ගේ බැතිමත්හු ඔහු වැළකූ හ. එහෙත් බුදුරදුනට මුහුණ නො දී තිරයකින් පසුපස සිට දම් අසමියි පැවසූ හේ තිරය පසුපස සිට ඇසූ බණින් බුදුරදුන් කෙරේ පැහැදී සෝවාන් ඵලය ද ලබා තමන්ට දහම් ඇස පාදාගන්නට උදව් කළ ලේලිය මව් තනතුරේ තබා ගෞරව කළා ය. එහෙයින් විශාඛාවට 'මිගාර මාතා' යන නම ද භාවිතයට ආවේ ය.

විශාඛාවෝ පිරිමි දරුවන් දහ දෙනකුට ද ගැහැණු දරුවන් දහ දෙනෙකුට ද මව වූවා ය. ඒ හැමටම ද පිරිමි දරුවන් 10 බැගින් හා ගැහැණු දරුවන් 10 බැගින් ලැබිණ.

විශාඛාවනට සිය පියා විසින් විවාහ මංගල්‍යය දා තෑගි කරන ලද මාණික්‍ය රාශියකින් සමලංකෘත මහා ආභරණයක් විය. දිනක් මෙම මහලිය පළඳනාව පැළඳ දෙව්රම් වෙහෙරට ගිය ඇයට එහිදී එය අමතක විණි. ආභරණය බර වැඩි හෙයින් එය බලා ගන්නැයි සේවිකාවකට බාර දී තිබුණි. ඇය එය පසෙක තබා ගෙන සිටිය ද ආපසු එන විට අමතක විය. ආනන්ද හිමියන් විසින් එය විහාරස්ථානය තුළ පරෙස්සමින් තබා තිබුණ ද දැන් එය තමන්ට හිමි නැතැයි තීරණය කළ විශාඛා එය විකුණා ලැබෙන මුදලින් ආරාමයක් කරවන්නට තීරණය කළා ය. කිසිවකුට ආභරණයක් එතරම් මිළකට ගත නො හැකි වූයෙන් තමා ම එය කෝටි නමයකට මිල දී ගෙන ඒ මුදලින් නගරයෙහි නැගෙනහිර පැත්තෙහි පූර්වාරාමය නමින් පන්සලක් ඉදි කළා ය.

### විවරණාත්මක අනුවාදය (53 ගාථාව)

**යථා අපි පුප්ඵරාසිම්හා බහු මාලාගුණෙ කයිරා එවං
ජාතෙන මච්චෙන බහුං කුසලං කත්තබ්බං**

**යථා අපි**: යම් සේ; **පුප්ඵරාසිම්හා**: මල් රැසකින්; **බහු**: බොහෝ; **මාලාගුණෙ**: මල් දම්; **කයිරා**: කරන්නේ ද; **එවං**: ඒ අයුරින් ම; **ජාතෙන**: උපන්; **මච්චේන**: සත්ත්වයන්; **බහුං**: බොහෝ; **කුසලං**: කුසල්; **කත්තබ්බං**: කළ යුතුය.

මල් දම් නෙලන්නෙක් මල් රාශියක් එකතු කර ගෙන බොහෝ මල් මාලා ගොතන්නාක් මෙන් උපන් සත්ත්වයන් විසින් ද බොහෝ පින්කම් කරගත යුතු ය.

### විවරණය

කුසල් කරමින් සාධු චර්යාවෙන් කල් ගත කරන්නා ගේ ජීවිතය මල් දම් ගොතන්නකුට සමාන කර ඇත. අපේ ජීවිත කාර්‍ය සියල්ල මල් ගොඩක් වැන්න. මේ මල් මල්දම් බවට ගොතා ගැනීමට හැම දෙනාම සමත් වුව මනාය. අප ලබා ඇති තාවකාලික ජීවිතය තුළ හැකි තරම් කුසල් දහම් කර ගත යුතු ය.



*මල් සුවඳ උඩු සුළඟට නො හමන්නේ ය. සත් ගුණවතුන් ගේ සිල් සුවඳ ම ඉහළට හමනේ ය.*

54. න පුප්ඵගන්ධො පටිවාතමෙති
න චන්දනං තගරමල්ලිකා වා
සතඤ්ච ගන්ධො පටිවාතමෙති
සබ්බා දිසා සප්පුරිසො පවාති (4:11)

මල් වල සුවඳ උඩු සුළඟට නොයන්නේ
දැසමන් සඳුන් සුවඳත් නෑ හමන්නේ
සත් ගුණ සුවඳ උඩු සුළඟෙත් විහිදෙන්නේ
යහපත් අය ගෙ ගුණ දස අත දැනෙන්නේ

# විහිදෙන හැම තැන - සුවඳයි යහ ගුණ

## 4 (9) ආනන්ද හිමියන් නැගූ ප්‍රශ්නය (54 සහ 55 ගාථා)

ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සමයෙහි **ආනන්ද හිමියන්** විසින් විමසන ලද ප්‍රශ්නයක් හේතුවෙන් භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා දේශනා කළ හ.

දිනක් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විවේකීව සිටින අතර මෙසේ සිතූහ. "ලොව අග්‍රගණ්‍ය සුවඳ වර්ග තුනක් ගැන බුදුරජාණන් වහන්සේ වදාරති. එනම්,

1. හර සුවඳ (සඳුන් වැනි)
2. මුල් සුවඳ (සැවැන්දරා වැනි)
3. මල් සුවඳ (සමන් වැනි) යන තුනයි.

මේ සුවඳ වර්ග තුන ම යටි සුළඟට මිස උඩු සුළඟට නොයයි. උඩු සුළඟට යන සුවඳක් තිබේ ද? නැතහොත් හැම අතට ම යන සුළඟක් තිබේ ද? මෙය සොයා ගැනීමට මා තනිවම සිතීමෙන් ඇතිවන ප්‍රතිඵලයක් නැත. භාග්‍යවතුන් වහන්සේ ගෙන් ම අසා දැන ගනිමි."

මෙසේ සිතූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ එක් සන්ධ්‍යාවක භාවනාවෙන් නැගිට බුදුරදුන් හමුවට ගොස් උන්වහන්සේ ගෙන් මෙසේ විමසූ හ. "ස්වාමීනි, මේ ලෝකයෙහි අග්‍රගණ්‍ය සුගන්ධයන් වූ හර සුවඳ, මුල් සුවඳ හා මල් සුවඳ යන මේ හැම විහිදෙන්නේ යටි සුළඟේ ය. ඒ එකක් වත් උඩු සුළඟට නො යයි. ස්වාමීනි, උඩු සුළඟට හෝ උඩු හා යටි හැම සුළඟට ම විහිදෙන සුවඳක් නැත් ද?"

"ආනන්ද, උඩු සුළඟට මෙන් ම යටි සුළඟටත් විහිදෙන සුගන්ධයක් තිබේ." යි භාග්‍යවතුන් වහන්සේ වදාළ හ. "ඒ කුමන සුගන්ධයක් ද ස්වාමීනි"යි ආනන්ද හිමියෝ විමසූ හ. "ආනන්ද, කිසියම් ගමක හෝ නගරයක පුරුෂයෙක් හෝ ස්ත්‍රියක් හෝ බුද්ධ, ධම්ම, සඞ්ඝ යන තෙරුවන් සරණ ගියේ ද, ප්‍රාණවධයෙන්, සොරකම් කිරීමෙන්, කාමයෙහි වරදවා හැසිරීමෙන්, බොරු කීමෙන්, සුරා පානයෙන් වැළකුණේ ද, යහගුණ වඩමින්, මසුරු මල හැර පරිත්‍යාගශීලීව, දීමට හුරු වූ අත් ඇතිව, ඉල්ලීම් වලට සවන් දෙන සුළුව, බෙදා හදා ගෙන භුක්ති විඳීමට හුරුව වසයි ද එවැන්නා ගේ උතුම් ගුණ දස දෙසම වසන පැවිද්දෝ ද වර්ණනා කරත්. දෙවියෝ ද වර්ණනා කරත්. අසවල් ගමේ අසවල් ස්ත්‍රිය, අසවල් පුරුෂයා මෙබඳු ගුණ ඇත්තේ යයි කතා බහ කරත්. එබන්දා ගේ ගුණය උඩු සුළඟටත් යටි සුළඟටත් දස අතටමත් විහිදුණේ යැයි කිව හැක"යි භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කළ සේක. අනතුරුව මේ ගාථා දෙක ද වදාළ හ.

### විවරණාත්මක අනුවාදය (54 ගාථාව)

**පුප්ඵගන්ධො පටිවාතං න එති චන්දනං ච තගරමල්ලිකා වා න සතං ගන්ධො පටිවාතං ච එති සප්පුරිසො සබ්බාදිසා පවාති**

**පුප්ඵගන්ධො**: මල් සුවඳ; **පටිවාතං**: උඩු සුළඟට; **න එති**: නො එයි; **චන්දනං ච**: සඳුන් (සුවඳ) ද; **තගර**: තුවරලා ද; **මල්ලිකා වා**: සමන් පිච්ච (සුවඳ) ද; **න**: නො එති; **සතං**: සත් පුරුෂයන් ගේ; **ගන්ධො**: සුවඳ; **පටිවාතං ච**: උඩු සුළඟට ද; **එති**: එයි; **සප්පුරිසො**: යහපත් තැනැත්තා; **සබ්බා දිසා**: හැම දිශාවට ම; **පවාති**: (සුවඳ) හමයි.

මල් සුවඳ, සඳුන් සුවඳ, තුවරලා සුවඳ, සමන් පිච්ච සුවඳ ආදිය උඩු සුළඟේ නො විහිදෙයි - සත් පුරුෂයන් ගේ ගුණ සුවඳ පමණක් උඩු සුළඟේ විහිදෙයි. යහපත් පුද්ගලයන් ගේ ගුණ සුවඳ හැම'තම විහිදේ.

### විවරණය

මේ ගාථා දෙක දේශනා කළේ ආනන්ද ස්ථවිරයන් වහන්සේ අරබයා ය. බෞද්ධ ඉතිහාසයෙහි ආනන්ද හිමියන්ට හිමි වන්නේ ඉතා වැදගත් ස්ථානයකි. භාග්‍යවතුන් වහන්සේ විසින් කරන ලද ධර්ම දේශනා වැඩි හරියක් ම වාර්තා කර ගන්නා ලද්දේ අනඳ හිමියන් විසිනි. උන් වහන්සේ ඒවා ප්‍රථම ධර්ම සංගීතියේ දී ඉදිරිපත් කළ හ. පාලි සූත්‍රවල මුලින් ම හමුවන '**ඒවං මේ සුතං**' යන වචන ආනන්ද මහා ස්ථවිරයන් වහන්සේ ගේ වචන ය.

භාග්‍යවතුන් වහන්සේ ගේ පෞද්ගලික උපස්ථායක ධුරය දරන ලද්දේ අනඳ හිමියන් විසිනි. නිරතුරුව ම උන්වහන්සේ සමග ගැවසෙමින් ධර්මය අසන්නටත්, ධාරණය කර ගන්නටත් භාග්‍යය ලත් හෙයින් අනඳ හිමියන්ට ධර්මභාණ්ඩාගාරික යන ව්‍යවහාරය ද විය.

මුල් දොළොස් වස තුළ භාග්‍යවතුන් වහන්සේට නිත්‍ය උපස්ථායකයෙක් නො වී ය. වරින් වර විවිධ භික්ෂූන් වහන්සේ කීප නමක් තාවකාලිකව උන්වහන්සේ ගේ උපස්ථාන කටයුතු කළ හ. නාගසමාල, නාගිත, උපවාන, සුනක්ඛත්ත, චුන්ද, සාගල, රාධ සහ මෙඝිය යන හිමිවරු ඒ අතර වූ හ.

එක් දිනක් භාග්‍යවතුන් වහන්සේ නාගසමාල තෙරණුවන් සමග දිග ගමනක් ගිය හ. එක්තරා හන්දියක දී නාගසමාල හිමියෝ එක් මගක් ගනිමු යි යෝජනා කළ හ. අනෙක් මග ගනිමුයි භාග්‍යවතුන් වහන්සේ යෝජනා කළ හ. භාග්‍යවතුන් වහන්සේ ගේ යෝජනාව පිළි නො ගත් හිමි නම බුදුරදුන් ගේ පාත්‍රය හා සිවුරු බිම තබා යන්නට සැරසෙත් ම භාග්‍යවතුන් වහන්සේ එය සිය'තට ගත් හ. බුදුරදුන් තනිව එක් මගක යත් දී එයට එරෙහිව වෙනත් මගක් ගත් හිමිනම මුහුණ පෑවේ මහා අතවරයකට ය. මගදී මං පහරන හොරු උන්වහන්සේ ගේ පා සිවුරු පැහැර ගෙන හිසට පොළු පහරක් ද එල්ල කළ හ. ලේ පෙරෙන හිසින් යුතුව නැවත බුදුරදුන් සොයා ආ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ අවවාද කොට සැනසූ හ.

ඊළඟ පිටුව හා බැඳේ





*සඳුන් උපුල් ආදී සුවඳ දෑ අතුරෙන් හට ගැනෙන සුවඳට වඩා සිල් සුවඳ ම ඉතා අගනේ ය.*

55. චන්දනං තගරං වා'පි
උප්පලං අථ වස්සිකී
එතෙසං ගන්ධජාතානං
සීල ගන්ධො අනුත්තරො (4:12)

සඳුන් තුවරලා සුවඳයි
උපුල් සහ සමන් සුවඳයි
මේ කොයි සුවඳත් පරදියි
වඩා උතුම් සිල් සුවඳයි.

# විහිදෙන හැම තැන - සුවඳයි යහ ගුණ

## 4 (9) ආනන්ද හිමියන් නැගූ ප්‍රශ්නය (54 සහ 55 ගාථා) (ඉතිරි කොටස)

### විවරණය

පෙර පිටුව හා බැඳේ

තවත් වතාවක භාග්‍යවතුන් වහන්සේ මෙඝිය හිමියන් සමග ජන්තු නම් ගමට වැඩම කරද්දී මෙඝිය හිමියෝ ගමන වෙනස් කොට අඹ වනයකට පිවිස භාවනා කරන්නට තීරණය කර ගත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ ගේ පා සිවුරු උන්වහන්සේ අතට ම බාරදී භාග්‍යවතුන් වහන්සේ 'එපා' කියද්දී ම මෙඝිය හිමියෝ භාවනාව පිණිස අඹ වනයට ගිය හ. පසුව බුදුරදුන් දක්නට ආ මෙඝිය හිමියෝ තමන් ගේ භාවනාව අසාර්ථක වූ බව සැලකර සිටිය හ. සැවැත් නුවරට වැඩම කළ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා මේ අමිහිරි අත්දැකීම් විස්තර කළ හ. දැන් තමන් වයසින් තරමක් වැඩි හෙයින් නිත්‍ය උපස්ථායකයකු ඇත්නම් යහපත් බව ද භික්ෂූන් වහන්සේලා ට දැනුම් දුන් හ.

සැරියුත් මහ රහතන් වහන්සේ වහා නැඟී සිට තමන් තථාගතයන් වහන්සේ ගේ නිත්‍ය උපස්ථායකත්වය දරන්නට කැමති බව ප්‍රකාශ කර සිටිය ද අග්‍ර ශ්‍රාවක වශයෙන් උන් වහන්සේට වෙනත් කාර්‍ය භාරයන් ඇති හෙයින් බුදුහු එය අනුමත නො කළ හ. මෙසේ බොහෝ ජ්‍යෙෂ්ඨ ශ්‍රාවකයන් එම නිලය අයැද සිටිය ද භාග්‍යවතුන් වහන්සේ ඊට කැමති නො වූ හ. ආනන්ද ස්ථවිරයන් වහන්සේ නිහඬව සිටිනු දුටු භික්ෂූහු ඔබ වහන්සේ නිහඬව සිටින්නේ මන්ද? භාග්‍යවතුන් වහන්සේ ඔබ ඉල්ලා සිටියහොත් කැමති වන්නට ඉඩ තිබේ යැයි කී හ. එහෙත් අනඳ හිමියන් කියා සිටියේ "මම භාග්‍යවතුන් වහන්සේ විසින් ම මා තෝරා පත් කර ගනු ලබන්නට කැමැත්තෙමි" යනුවෙනි. ඒ ඇසූ බුදු පියාණෝ "කවුරුන් නො කීවත් ආනන්ද මා ගේ උපස්ථායකයාණන් වශයෙන් කටයුතු කරනවා ඇත" යි වදාළ හ.

ආනන්ද හිමියන් අග්‍ර උපස්ථායක ධුරය භාර ගත්තේ කොන්දේසි අටක් ඇතිව ය.

1. බුදුරදුන්ට ලැබෙන අගනා සිවුරු අනඳ හිමියන්ට නො දිය යුතු ය.

2. බුදුරදුන්ට ලැබෙන ප්‍රණීත ආහාර ආනන්ද හිමියන්ට නො දිය යුතු ය.

3. භාග්‍යවතුන් වහන්සේ ගේ ගන්ධකුටියෙහි ආනන්ද හිමියන්ට නවාතැන් නො දිය යුතු ය.

4. භාග්‍යවතුන් වහන්සේට දානමානාදියට ලැබෙන ආරාධනාවන්ට යන්නැයි අනඳ හිමියන්ට නිල නොකළ මනාය.

5. අනඳ හිමියන් බාරගන්නා ආරාධනයන්ට බුදුරජාණන් වහන්සේ වැඩම කළ යුතු ය.

6. දුර සිට පැමිණෙන ආගන්තුකයන් බුදුන් දැකීම සඳහා කැඳවා ගෙන ඒමට අනඳ හිමියන්ට ඉඩ දිය යුතු ය.

7. තමන්ට සැකයක් ඇති වූ ඕනෑම වේලාවක බුදුරදුන් බැහැදකින්නට අනඳ හිමියන්ට අවස්ථාව තිබිය යුතු ය.

8. අනඳ හිමියන් නැති තැන කරන ධර්ම දේශනා අනඳ හිමියන්ට ද දේශනා කළ යුතු ය.

බුදුරදුන් මේ ඉල්ලීම් වලට කැමති වූ පසු ආනන්ද හිමියෝ උපස්ථායක ධුරය භාර ගත් හ. එතැන් පටන් භාග්‍යවතුන් වහන්සේට උවටැන් කළ ආනන්ද හිමියෝ උණු පැන්-සිහිල් පැන් ලබාදීමෙන්, ත්‍රිවිධ දැහැටි දඬු පිරිනැමීමෙන්, සිරුර පිරිමැදීමෙන් හා මුළු රෑ තිස්සේ ම ආරක්ෂාව සැලසීමෙන් තම යුතුකම් ඉටු කළ හ. රෑ මුළුල්ලෙහි ගිනි හුළක් හා සැරයටියක් ද සූදානම් කර ගෙන තමන් කැඳවන ඕනෑම විටක ගන්ධකුටියට පැමිණීමට සූදානමින් සිටින අනඳ හිමියෝ රැයකට නව වරක් ගන්ධ කුටිය වටා පරීක්ෂාවෙන් ඇවිද්ද හ. ගන්ධකුටිය අතුපතු ගා පිරිසිදු කළේ ද උන්වහන්සේ ම ය. සම්බුද්ධ පරිනිර්වාණය තෙක් ම අනඳ හිමියෝ මේ වතාවත් නො පිරිහෙලා ඉටු කළ හ.

එතකුදු වුවත් භාග්‍යවතුන් වහන්සේ ගේ ජීවිත කාලය තුළ රහත් වන්නට උන් වහන්සේ අසමත් වූ හ. බුද්ධ පරිනිර්වාණයෙන් සති කිහිපයකට පසු ප්‍රථම සංගායනා වේ මුල් ම දින උන්වහන්සේ රහත් බව ලද හ.

### විවරණාත්මක අනුවාදය (55 ගාථාව)

**චන්දනං තගරං වා උප්පලං අපි අථ වස්සිකී එතෙසං ගන්ධජාතානං සීලගන්ධො අනුත්තරො**

**චන්දනං**: සඳුන්; **තගරං**: තුවරලා; **වා**: හෝ; **උප්පලං**: උපුල්; **අපි**: වුවද; **අථ**: එමෙන් ම; **වස්සිකී**: පිච්ච මල් ද; **එතෙසං**: යන මේ; **ගන්ධජාතානං**: සුවඳ ජාතීන්ට වඩා; **සීලගන්ධො**: සිල් සුවඳ; **අනුත්තරො**: උදාරය.

සඳුන්, සැවැන්දරා, උපුල් සමන් පිච්ච වැනි කවර සුවඳක් වුව ද පරදවන උත්තම වූ සුවඳ සිල් සුවඳයි.





*තුවරලා සඳුන් ආදී සුවඳ ඉතා සුලුය. සිල්වතුන්ගේ සිල් සුවඳ දෙව්ලොව දක්වාම පැතිරේ.*

56. අප්පමත්තො අයං ගන්ධො
යායං තගර චන්දනී
යො ච සීලවතං ගන්ධො
වාති දෙවෙසු උත්තමො (4:13)

සඳුන් තුවරලා සුවඳයි
එහෙත් ඉතා සුළු පමණයි
දෙව් ලෝකයටත් දැනෙන්නේ
සිල් වතුන් ගෙ සිල් සුවඳයි.

# පැතිරෙයි සිල් සුවඳ දෙව්ලොව දක්වා ම.

## 4 (10) මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ (56 ගාථාව)

රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් භාග්‍යවතුන් වහන්සේ **මහා කාශ්‍යප මහ තෙරුන්** ඇරබ මේ ගාථාව දේශනා කර වදාළ හ.

දිනක් මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ සත් දිනක් සමවත් සුවයෙන් වැඩ ඉන් නැගී රජගහ නුවර ගෙපිළිවෙළින් පිඬුසිඟා යන්නට සැරසුණු සේක. එකෙණෙහි සක් දෙවිඳුන් ගේ අප්සරාවෝ පන් සියයක් දෙනා පිඩු පන්සියයක් පිළියෙළ කරගෙන මහා කාශ්‍යප මහ රහතන් වහන්සේට පිරිනමන්නට සූදානම් කළ හ. ඒ ද රැගෙන මඟ රැක සිටි ඔවුහු තෙරුන් අමතා "ස්වාමීනි, අපට අනුකම්පා කර අපගේ දාන වස්තුව පිළිගත මැනව" යි ආරාධනය කළ හ. එහෙත් මහා කාශ්‍යප ස්වාමීන් වහන්සේ "ඉවත්ට යන්න. මම දුගී දුප්පතුන්ට අනුග්‍රහ කරන්නෙමි" යි පැවසූ හ. එයින් මුකුලිත වූ ඔවුහු දුක්මුසුව ගොස් සක් දෙවිරදුන්ට එපවත් කියා පෑහ.

"ඔබ පිළිවෙළ වරදවා ගෙන ඇත. දන් දෙන හැටි මගෙන් ඉගෙන ගන්න" යි පැවසූ හෙතෙම ඉතා වයස්ගත දුගී අසරණයකු ගේ වෙස් ගෙන සුජාතා නම් දිව්‍ය අප්සරාවක් ද මහළු අසරණ ස්ත්‍රියක් සේ වෙස් ගන්නවා ගෙන අවුත් රෙදි වියන්නන් ගේ වීදියෙහි පැලක් මවා ගෙන එහි සිටියේ ය. මහා කාශ්‍යප හිමියෝ ද මම දුප්පතුන්ට අනුග්‍රහ කරන්නෙමැයි එම වීදියෙහි පිඩු සිඟා හැසිරෙන්නට ගිය හ. ශක්‍රයා මවා ගත් පැල හා එහි දුගී වෙස් ගෙන සිටි සක් දෙවිඳු දුටු තෙරණුවෝ මේ අසරණයන් ගෙන් දන් පිළිගෙන ඔවුනට අනුග්‍රහ කරමි යි සිතා එහි පිඩු සිඟා ගිය හ. සක් දෙවිඳු ද තෙරුන් ගේ පාත්‍රය ගෙන "ස්වාමීනි, ආහාර කර්කශ ද මධුරද ආදී වශයෙන් නො සිතා අපට අනුග්‍රහ පිණිස පිළිගෙන වළඳන්නේ නම් යෙහෙකි" යි පවසමින් දන් පිළිගැන්වී ය.

භෝජනයෙහි සුවඳින් ම එය සාමාන්‍ය ආහාරයක් නොව දිව්‍යභෝජනයකැයි දැනගත් මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ දිවැසින් බලා මේ නම් ශක්‍රයා යි දැන හැඳින "ඔබ විසින් කරන ලද්දේ බලවත් පාපයකි. දුප්පතෙකුට මහත් ඵල වන්නට තිබුණු දානයක් ඔබ විසින් පැහැර ගෙන ඇත්තේ ය." යි නිග්‍රහ කළ හ. "ස්වාමීනි, මා පමණ දුප්පතෙක් තවත් සිටී දැ" යි හේ බැගෑපත්ව පැවසී ය. "දෙව්ලොවට අධිපතිව සුර සැප විඳින තොප දුප්පත් වූයේ කෙසේ ද?" යි මහ තෙරුන් ප්‍රශ්න කළ විට ශක්‍ර දේවේන්ද්‍ර තෙම මෙසේ පැවසී ය.

"ස්වාමීනි, ඒ මෙසේ ය. භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වීමට පෙර මම කුසල් කොට මෙහි උපන්නෙමි. භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ පසු පින් කොට මට වඩා පුණ්‍යර්ධි ඇතිව දිව්‍ය පුත්‍රයෝ තුන් දෙනෙක් මෙහි පහළ වූ හ. ඔවුන් ගේ දීප්තිය මට වඩා වැඩි ය. අපි විනෝදගමනක් යමු යි ඔවුන් තම විමාන වලින් මගට බට විට ඔවුන් ගේ තේජසින් මගේ තේජස යට යන හෙයින් මම නිවෙසට වදිමි. මා ගේ තේජසින් ඔවුන් ගේ තේජස යටපත් වන්නේ නැත. එහෙයින් දැන් මා තරම් අසරණ වූ දුප්පතෙක් තවත් නැත" ඒ ඇසූ මහා කාශ්‍යප මහරහතන් වහන්සේ "කෙසේ වුවත් නැවත මෙවැනි ක්‍රියා කොට මා රවටා දන් දෙන්නට නො පෙළඹෙන්නැ"යි අවවාද කළ හ. "ස්වාමීනි, මා දැන් දුන් දනින් පිනක් සිදු නොවීදැ"යි හෙතෙම විමසී ය. "පින් සිදුවිය"යි තෙරුන් වදාළ කල් හි "කුසල් දහම් කිරීමට මම බැඳී සිටිමි, ස්වාමීනි," යි පැවසූ සක්දෙවි තෙම තෙරුන්ට වැඳ නමස්කාර කර පිටත් විය.

ශක්‍ර දේවේන්ද්‍රයා සතුටෙන් උදන් අනමින් ගිය අයුරු දුටු භාග්‍යවතුන් වහන්සේ සිය ශ්‍රාවකයන්ට ඒ බව හෙළි කොට මේ ගාථාව ද වදාළ සේක.

**විවරණාත්මක අනුවාදය (56 ගාථාව)**

**යො අයං තගරචන්දනී අයං ගන්ධො අප්පමත්තො**
**සීලවතං යො ච ගන්ධො උත්තමො දෙවෙසු වාති.**

**යො අයං**: යම් මේ; **තගර**: සැවැන්දරා; **චන්දනී**: සඳුන් (සුවඳක් වේද); **අයං ගන්ධො**: එම සුවඳ; **අප්පමත්තො**: ඉතා ස්වල්ප ය; **සීලවතං ච**: සිල්වතුන්ගේ;
**යො ගන්ධො**: යම් සුවඳක් වේ නම්; **උත්තමො**: (එය) උතුම් ය; **දෙවෙසු**: දෙවියන් අතරට; **වාති**: හමයි.

තුවරලා, සඳුන් ආදියෙහි සුවඳ සිල්වතුන් ගේ සිල් සුවඳ හා සමාන කරන විට ඉතා ස්වල්ප ය. (ඒවා හමන්නේ සුළු දුරක් පමණක් හෙයිනි.) සිල්වතුන් ගේ සීල සුගන්ධය දිව්‍ය ලෝකයට පවා හමයි. (දෙව්වරුන් අතරහිත් පැතිරෙයි)

**විවරණය**

**ගන්ධ**: හෙවත් සුවඳ වර්ග අතර මිනිසුන් විසින් අග්‍රගණ්‍ය කොට සලකන ලද්දේ සඳුන්, තුවරලා (සැවැන්දරා) හා සමන් පිච්ච සුවඳ ය. මේ සුවඳ ඉතා සුළු පරිමිත අවකාශයක පමණක් පැතිරෙයි. එහෙත් සිල් සුවඳ දෙව් ලොව දක්වා පැතිරෙයි.





*මනාකොට සිවුසස් දැන කෙළෙස්වලින් මිදුණු රහතුන් පිරිනිවීම් වශයෙන් වැඩි මග මරු නො දනී.*

57. තෙසං සම්පන්නසීලානං
අප්පමාදවිහාරිනං
සම්මදඤ්ඤා විමුත්තානං
මාරො මග්ගං න වින්දති (4:14)

සපිරි සිල් ගුණයෙන්
යුතුව නො පමා විසුමෙන්
විමුත් යහ නුවණින්
මිදී යන්නෝ මරු ගෙ දෑසින්

# රහතුන් ගිය ලෙසේ - මරුවා සොයයි කෙලෙසේ

## 4 (11) ගෝධික හිමියන් ගේ පුවත (57 ගාථාව)

ගෝධික හිමියන් ගේ පුවත අරමුණු කර ගනිමින් භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළේ වේළුවනාරාමයේ වැඩ විසූ සමයේ ය.

ඉසිගිලි කන්ද අසල කළුගල් තලාවෙක ගෝධික තෙරණුවෝ අප්‍රමාද විහාරීව වීර්‍ය්‍ය වඩමින් භාවනානුයෝගීව වැඩ විසූ හ. භාවනාවෙහි ප්‍රතිඵල වශයෙන් උන්වහන්සේට තාවකාලික ව කෙළෙස් යටපත් කිරීමෙන් ලැබෙන තාවකාලික (සාමයික) චේතෝ විමුත්තිය ලැබී තිබිණ. මේ අතරතුර උන්වහන්සේට වැළඳුණු රෝග යක් නිසා කීප වාරයක් ම ලබාගත් ධ්‍යානයෙන් පිරිහීමට භාජන වූ හ. හය වරක් ම මෙසේ වූයෙන්, සත් වන වර ධ්‍යානය උපදවා ගත් විට "සය වරක් ම මගේ ධ්‍යානය නැතිව ගියේ ය.

ධ්‍යානයෙන් පිරිහී මිය ගියහොත් කවර විදියේ මතු උපතක් ලැබේදැයි කිව නො හේ. එහෙයින් ධ්‍යානය තිබියදී ම මිය යන්නෙමි යි සිතා දැලි පිහියෙන් ගෙල කපා ගෙන මිය යමි යි ඇඳෙහි වැතුරුණ හ.

ගෝධික හිමියෝ ගෙළ සිඳගෙන මිය යන්නට සැරසෙනු දුටු මාරයා "සිය දිවි නසා ගන්නට යන්නේ ජීවිතාශාව නැති හෙයිනි. මරණයට පෙර සියළු ආශා සිඳ රහත් වන්නටත් ඇත. එය වළක්වන්නට මා යමක් කීව ද මේ හිමිනම එය නො පිළිගනු ඇත. එහෙයින් බුදුන් ලවා ම කියවා රහත් වීම වළකා ලමි" යි සිතා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ ඒ බව කියා සිටිය හ.

ගෝධික තෙරණුවෝ දැළිපිහිය ගෙන සිය ගෙල සිඳ ගන්නට සැරසෙනු භාග්‍යවතුන් වහන්සේ විසින් ද දක්නා ලදී. ගෝධික තෙරණුවෝ ගෙල කැපෙන අතර ම රහත් ඵලය ලද හ. මාරයා ඇමතූ බුදුරජාණන් වහන්සේ "මාරය, ස්ථිර වූ නුවණැත්තෝ මෙසේ ද කරති. ම පුතු ගෝධික ජීවිතාශාවෙන් තොර වී ය. හෙතෙම සියලු ආශා සිඳ දමා රහත් ඵලය ලැබ පිරිනිවුණ හ"යි වදාළ හ. මාර තෙම දසත පිරමින් ගෝධික තෙරුන් ගේ ප්‍රතිසන්ධි විඥානය සොයා වෙහෙසුණෝ ය.

බුදුහු භික්ෂූන් අමතා "මහණෙනි, මාරයා දුම් කඳක් හෝ අඳුරු කුටියක් සේ ලොව සිසාරා ගෝධික තෙරුන් ගිය තැන සෙව්ව ද ඒ සෙවිල්ල නිෂ්ඵල ය. ගෝධික තෙරුන් පිරිනිවුණෙන් කිසි තැනෙක නො පිහිටි විඤ්ඤාණය ඇතිව ය" යි පැහැදිලි කළ හ. මරුවා නැවත ද වීණාවක් ද අතැතිව ගොපලු දරුවකු වෙසින් බුදුරදුන් කරා එළඹ "ගෝධික තෙරුන් මිය ගොස් උපන්නේ කොහිදැයි මම සොයමි. ඔහු උපන්නේ කොහි ද?" යි විමසූ හ. "ඔබට තබා ඔබ වැනි ලක්‍ෂයක් එක් වී සෙව්ව ද ගෝධික උපන් තැනක් සොයා ගන්නට හැකි නො වෙයි" යි වදාළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

**විවරණාත්මක අනුවාදය (57 ගාථාව)**

**සම්පන්නසීලානං අප්පමාදවිහාරිනං සම්මදඤ්ඤා**
**විමුත්තානං තෙසං මග්ගං මාරො න වින්දති.**

**සම්පන්නසීලානං**: සීලයෙන් සමන්විත වූ; **අප්පමාදවිහාරිනං**: අප්‍රමාදීව වාසය කරන්නා වූ; **සම්මදඤ්ඤා විමුත්තානං**: නිවැරදි නුවණ ලබා විමුක්තිය සාධනය කර ගත්තා වූ; **තෙසං**: උතුමන් ගේ; **මග්ගං**: ගිය මඟ; **මාරො**: මාරයා; **න වින්දති**: සොයා නො ගනියි.

පිරිසිදු ලෙස සිල් රැක, අප්‍රමාදීව භාවනා වඩා යථාභූත ඥාන දර්ශනය ලැබ විමුක්තිය සාධනය කර ගත් උතුමන් මිය ගිය පසු උපදින ස්ථානය සොයා ගැනීමට මාරයා සමත් නො වෙයි.

**විවරණය**

**සම්මදඤ්ඤා විමුත්තානං**: පරිපූර්ණඥානය ලැබ, ලබා ගන්නා විමුක්තිය මෙයින් අදහස් වේ. සම්මා යන්නෙන් මනාව යන අර්ථය ද අඤ්ඤා යන්නෙන් ඥානය ද ගැණෙයි. චතුරාර්‍ය්‍ය සත්‍යය මනාව අවබෝධ කර ගැනීම මෙයින් අදහස් වේ. අර්ථකථාවන්හි විමුත්තිය,

1. තදංග විමුත්ති 2. වික්ඛ මහාන විමුත්ති. 3. සමුච්ඡේද විමුත්ති. 4. පටිප්පසද්ධි විමුත්ති. හා 5. නිස්සරණ විමුත්ති වශයෙන් පස් වැදෑරුම්ව දක්වා ඇත.

**අඤ්ඤා**: නම් දැනුමයි. අඤ්ඤාය යන්න පූර්ව ක්‍රියා පදයකි. එහි 'ය' ලොප් වී 'අඤ්ඤා' ලෙස යෙදේ. 'දැන ගෙන' යන අර්ථය එහි වෙයි. ස්කන්ධ, ආයතන, ධාතු, දුක්ඛ, සමුදය, නිරොධ, මග්ග, අනිච්චතා යන මේ කරුණු යථාභූත වශයෙන් දැන, තීරණය කොට, තුලනය කොට විභජනය කොට ලබා ගන්නා දැනුම ඇති ව යන අර්ථයෙන් 'අඤ්ඤාය' යන්න යොදන ලදී.

**මාර**: බුදු සමයෙහි 1.මච්චු මාර, 2. ඛන්ධ මාර, 3. කිලෙස මාර, 4. සංඛාර මාර, 5. දේවපුත්ත මාර වශයෙන් පස් මරුන් ගැන සඳහන් වේ. මේ කථාවේ දැක්වෙන්නේ දේවපුත්තමාර ගැන ය.





*මහ මගෑ අසළ දැමූ කුණු කසළ ගොඩක වුව ද හටගැනෙන පියුමෙහි සුවඳ හා පැහැය සිත් කලුය.*

58. යථා සඞ්කාරධානස්මිං
උජ්ඣිතස්මිං මහාපථෙ
පදුමං තත්ථ ජායෙථ
සුචිගන්ධං මනොරමං (4:15)

යම් සේ කුණු වලක
මහ මාවතක් අසලක
පිපේනම් පියුමක්
මනරම් සුවඳ විහිදන

# සිත්කළුය පියුමන් - කුණු මඩ වළක පිපුණත්

## 4 (12) ගරහදින්න ගේ කතා පුවත (58 සහ 59 ගාථා)

මේ ගාථා දෙක භාග්‍යවතුන් වහන්සේ විසින් දෙව්රම වෙසෙන සමයෙහි **ගරහදින්න** නමැත්තකු ඇරඹ දේශනා කරන ලදී.

සැවැත් නුවර සිරිගුත්ත සහ ගරහදින්න නම් මිතුරෝ දෙදෙනෙක් විසූ හ. සිරිගුත්ත බෞද්ධෝපසකයෙකු වූ අතර ගරහදින්න නිගණ්ඨ ශ්‍රාවකයෙක් වූයේ ය. "ඔබේ මිත්‍ර සිරිගුත්තට බුදුරදුන් වෙත යාමේ නිෂ්ඵල භාවය පැහැදිලි කර ඔහු අප වෙත කැඳවා ගෙන නො එන්නේ කවර හෙයින්දැයි නිගණ්ඨයෝ නිතර නිතර ගරහදින්නට බල කරති. එහෙයින් ගරහදින්න ද නිතර නිතර තම මිතුරාට "ගෞතම බුදුන් වෙත යාමෙන් ඔබට අත්වන ප්‍රයෝජනය කුමක් ද? එහි යාම නවතා අප ගේ නිගණ්ඨ භික්ෂූන් වහන්සේ වෙත යන්න. උන් වහන්සේලාට දාන මානාදියෙන් උපස්ථාන කරන්න" යි පෙරැත්ත කරන්නට විය.

ටික දිනක් මේ පෙරැත්තයන් මැදහත් සිතින් ඉවසූ සිරිගුත්ත එක් දිනක් මිතුරා ගෙන් මෙසේ ඇසී ය. "ඔබේ නිගණ්ඨ පැවිද්දන් හමු වී බණ අසන්නට හා දන් පුදන්නට ඔබ මට බල කරන්නේ ඇයි? උන් වහන්සේලා කවර දෙයක් දන්නා නිසා ද? කවර ශක්තීන් තිබෙන නිසා ද?" එයට පිළිතුරු දෙන ගරහදින්න "මිත්‍රය, ඔවුන් නො දන්නා දෙයක් නැත. අතීත, වර්තමාන, අනාගත යන තුන් කාලය ම දනිති. සෑම දෙනා ගේම සිතිවිලි, වචන හා ක්‍රියා ද දනිති. වෙන දේත්, වන්නට ඇති දේත් දනිති." යි පැවසී ය. "ඇයි ඔබ මට ඒ බව කලින්ම නො කීවේ? එබඳු බල ඇති නුවණැති උතුමන් ඇසුරු කරන්න ම අවශ්‍යයි. දැන්ම යන්න. ගොස් මා වෙනුවෙන් උන්වහන්සේලාට ආරාධනය කරන්න" යි සිරිගුත්ත පැවසී ය.

ගරහදින්න ද වහාම ගොස් නිගණ්ඨ භික්ෂූන්ට සිරිගුත්ත ගේ ආරාධනය කළේ ය. "සිරිගුත්ත එයා ම ඔබට කීවා ද මේ ආරාධනය කරන්න කියලා?"යි ඔවුහු විමසූ හ. "එසේ ය. ඔහුමයි ආරාධනය කළේ"යි ගරහදින්න පිළිතුරු දුන් විට සතුටින් ඉපිල ගිය නිගණ්ඨයෝ "සිරිගුත්ත අපේ පැත්තට ආවොත් අපට මොනවායින් ද අඩු" යි පැවසූ හ.

සිරිගුත්ත ගේ නිවස විශාල වූවකි. ලොකු ගෙවල් අතරේ වූ දිග ඉඩ ප්‍රමාණයේ ලොකු අගලක් කපා එහි අසූචි හා මඩ පුරවා, දෙකෙළවර කණු සිටුවා රැහැන් බැඳ, වළ නො පෙනෙන සේ අසුන් තබා ඒ මත ඇතිරිලි දමා සැකසී ය. ඒ මත වාඩි වූ වහාම පුටුව කැරකී හිස පහළට සිටින සේ පුටු වල පසුපස පා රැහැන්වල බැඳ තැබී ය.

ලොකු ගැල් ගෙන්වා ඒවා කඩමාලු වැනි දෙයින් පුරවා කෙසෙල් කොළ අතුරා ඒ මත යම් යම් කෑම වර්ග තබා හැළි කෑම වර්ග වලින් පිරී තිබෙන බව පෙනෙන පරිදි සැරසී ය. බැලු බැල්මට දානය පිණිස බත්, කැඳ, ගිතෙල්, හකුරු, කැවුම්, අතිරස, අග්ගලා, කොකිස්, ආස්මී, දොදොල්, කිරි පැණි ආදිය පිරී තිබුණා මෙන් විය.

උදෙන් ම දානය සඳහා කර තිබුණු සංවිධාන කටයුතු බලන්නට පැමිණි ගරහදින්න ඒ සියල්ල දැක අතිශය සතුටට පත් විය. ආහාර පාන පිරී ඇතැයි පෙන් වූ බඳුන් හිස් බව හේ නො දත්තේ ය.

ගරහදින්න පිටත්ව ගිය පසු නිගණ්ඨ ශ්‍රාවකයෝ 500 ක් දෙනා පැමිණිය හ. සිරිගුත්ත නිවසින් බැහැරට අවුත් වැඳ නමස්කාර කර මෙසේ අධිෂ්ඨාන කළේ ය. "ඔබ වහන්සේලා අතීත, වර්තමාන සහ අනාගත කාලයන් දැක ගන්නට සමත් නම්, මේ වෙන්නට යන දේ තේරුම් ගෙන මගේ නිවසට නො පැමිණ සිටින්න. ඔබ මෙහි පැමිණියා වුව ද මෙහි ඔබට දෙන්නට කිසිම අහරක් නැත. සියලු බඳුන් හිස් ය. අගල පිරී ඇත්තේ අසූචි හා මඩ වලිනි."

එසේ සිතා අනතුරුව තම සේවකයන්ට මෙසේ උපදෙස් දුන්නේ ය. "සියලු දෙනා ම වාඩිවන්නට සැරසෙන විට එක්වරම ඇතිරිල්ල ඉවත් කරන්න. නැත්නම් අපරාදේ එය කිළිටි වනු ඇත." සේවකයන් තම තම ස්ථාන ගත් පසු "ඔබ වහන්සේලා වාඩි වන විට සියලු දෙනා ම එකවර වාඩි ගන්න. මෙහි සිරිත එයයි" යි ඔවුහු නිගණ්ඨ හිමිවරුන්ට ඇරයුම් කළ හ. ඒ පරිදිම ඔවුන් අසුන් ගන්නා විට ඇතිරිල්ල ඉවත් කරන ලද අතර සියලු දෙනම එක් වර පෙරැළී ගොස් අසූචි වළේ ඇද වැටුණ හ.

**විවරණාත්මක අනුවාදය (58 ගාථාව)**

**යථා මහාපථෙ උජ්ඣිතස්මිං සඞ්කාරධානස්මිං තත්ථ සුචිගන්ධං මනොරමං පදුමං ජායෙථ**

**යථා**; යම් සේ; **මහා පථෙ උජ්ඣිතස්මිං**; මහ මඟ අසල එක් වූ; **සඞ්කාරධානස්මිං**; කුණු මඩ වලෙක; **තත්ථ**; එහි; **සුචිගන්ධං**; මනා සුවඳැති; **මනොරමං**; මනෝරම්‍ය; **පදුමං**; පියුමක්; **ජායෙථ**: හට ගන්නේ නම්,

මහා මාර්ගය අසල කුණු රොඩු එක්වන කසල කාණුවක වුවද මනරම් සුවඳ හමන පියුමක් හටගන්නේ වේ ද,





*පුහුදුන් අතරැ උපන් සම්මා සම්බුදු සවු රහත් තෙම නුවණින් අඳ පුහුදුන් ඉක්මවා බබළයි.*

59. එවං සඞ්කාරභූතෙසු
අන්ධභූතෙ පුථුජ්ජනෙ
අතිරොචති පඤ්ඤාය
සම්මාසම්බුද්ධසාවකො (4:16)

මෙසේ කුණු රොඩු බඳු
පුහු දුන් අඳ දනන් මැද
නුවණින් වැඩී බබළති
බුදුරදුන් ගේ සවුවෝ

# බබලයි මහ රහත් - කවර තැන වැඩ සිටියත්
## 4 (12) ගරහදින්න ගේ කතා පුවත (58 සහ 59 ගාථා)

තම නිගණ්ඨ පැවිද්දනට සිරිගුත්ත කළ නිග්‍රහයට පළි ගන්නට ඉටා ගත් ගරහදින්න බුදුරජාණන් වහන්සේට දානයකට ආරාධනය කළේ ය. බුදුරජාණන් වහන්සේ ද රහතන් වහන්සේ පන් සියයක් සමග වැඩම කළ හ. ගරහදින්න නිවසින් පිටතට අවුත් වැඳ නමස්කාර කර එකත් පසෙක සිට දෑත් හිස් මුදුනේ තබා මෙසේ අධිෂ්ඨාන කළේ ය. "හිමියනි, අතීතය, වර්තමානය, හා අනාගතය යන ත්‍රෛකාලය ම දන්නේ නම්, දහස් ආකාරයකට සත්වයන් ගේ සිත් දැන ගත හැකි නම්, ගෙතුළට නො පැමිණෙන්නේ යහපති" එසේ සිතා "ස්වාමීනි, වඩිනු මැනවි. එක නමක් ගොස් හිඳගත් පසු අනිත් නම හිඳ ගැනීම මැනවි" යි ඇරයුම් කළේ ය. ඒ අනුව භාග්‍යවතුන් වහන්සේ මුලින් ම පිවිසුණ හ.

ගරහදින්න ආසන පණවා තිබුණේ ගිනි අඟුරු වලක් තනවා, ඒ මත කළාල අතුරා බුදුරදුන් හා ශ්‍රාවක පිරිස එහි වැටෙන පරිද්දෙනි. එහෙත් භාග්‍යවතුන් වහන්සේ කිහිරි අඟුරු වළට පා තබන විට ම කළාලය අතුරුදහන් වී පියුම් පැන නැංගේය. භාග්‍යවතුන් වහන්සේ පියුම් පිට වැඩ අසුනෙහි වැඩ සිටිය හ. සියලු ම භික්ෂූහු ද එසේ ම වැඩ හුන් හ.

ගරහදින්න ගේ සිරුරින් දහදිය නැඟිණි. ඒ ඔහු කිසිම අහරක් පිළියෙල නො කොට හුදෙක් සිරිගුත්ත කළාක් මෙන් ම හිස් බඳුන් කෑම වගී වලින් සරසා තිබුනු හෙයිනි. හේ දිව ගොස් සිරිගුත්ත ගේ ඇගේ එල්ලී මට පිහිට වන්නැයි ආයාචනා කළේ ය. "දැන් ඉතින් කුමක් කරමු ද?" යි පැවසූ හේ කෙසේ වුවත් ඒ බඳුන් හැර බලන්නැයි කීය. ගරහදින්න ඒ බඳුන් හැර බැලූ විට ඒවා අපේක්ෂිත ආහාර වලින් පිරී තිබිණ. මහත් සතුටට පත් ගරහදින්න බුද්ධප්‍රමුඛ මහා සංඝයා වළඳවා පාත්‍රය ගෙන පසෙක අසුන් ගත් විට තථාගතයන් වහන්සේ මේ ගාථා දෙකින් ධර්මදේශනා කළ හ.

**විවරණාත්මක අනුවාදය (59 ගාථාව)**

**එවං සඞ්කාරභූතෙසු අන්ධභූතෙ පුථුජ්ජනෙ සම්මා සම්බුද්ධසාවකො පඤ්ඤාය අතිරොචති.**

**එවං**; එලෙසින් ම; **සඞ්කාර භූතෙසු**; කුණු ගොඩවල් බවට පත් වූ; **අන්ධභූතෙ**; යථා තත්ත්වය නො දක්නා; **පුථුජ්ජනෙ**; පෘථග්ජනයන් අතර; **සම්මා සම්බුද්ධ සාවකො**; සම්මා සම්බුද්ධ ශ්‍රාවකයා; **පඤ්ඤාය**; ප්‍රඥාවෙන්, **අතිරොචති**; ඉහළින්ම බබලන්නේ ය.

එලෙසින් ම කසළ ගොඩක් බඳු අන්ධපෘථග්ජනයන් අතුරෙහි උපන් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවක වූ රහතුන් වහන්සේ පුහුදුන් ලෝකයා ඉක්ම ප්‍රඥාවෙන් බබලන්නේ ය.

**විවරණය**

**පදුමං තත්ථ ජායෙථ**: අපිරිසිදු තැනක වුවද පිවිතුරු යමක් හට ගැනීම ධර්ම ග්‍රන්ථ වල නිරතුරුව දැක්වෙන අදහසකි. බුදුවරු පෘථග්ජන ලෝකයෙහි ඉපිද, මඩින් හට ගෙන මඩෙහි නො ගැටෙන පියුමක් පරිද්දෙන් පිරිසිදු ව බබලති.

**අතිරොචති පඤ්ඤාය**: ප්‍රඥාව හේතුවෙන් වඩාත් බබලයි. බෞද්ධ ඉගැන්වීමේ හැටියට ලෝකයේ ඉතාම පහල ජනයා අතර වුව ද මෙම බැබළීමේ ශක්තිය නිලීන ව පවතියි.





සනාතන බුද්ධ භාෂිතය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ අසහාය සාමයික මෙහෙය උදෙසා, සිය කාලය හා ශ්‍රමය සපුරා වැය කරමින්, මානව වංශයට දහම් මග හෙළි පෙහෙළි කිරීමේ මහා මෙහෙවරට කැප වී සිටින සිංගප්පූරුවේ ප්‍රධාන සංඝ නායක වේරගොඩ සාරද, ස්ථවිරයන් වහන්සේ අද ලොව වෙසෙන ප්‍රශස්තතම ධර්ම දූත යතිනායක වරයාණන් වහන්සේ නමකි.

1941 නොවැම්බර් මස 27 වනදා දකුණු ලක වේරගොඩ දී උපත ලද මේ යති ප්‍රභූවරයානෝ, උපාධි ලාභීව, ධර්මදූත මෙහෙය ආරම්භ කළේ ඉතා යොවුන් අවධියේ දීමය. දැනට ශතක 6 ක් පුරා ධර්මදූත මෙහෙයෙහි යෙදී සිටින ගරුතර වේරගොඩ සාරද යතිනායකයානන් වහන්සේ මුද්‍රිත මාධ්‍යයෙන් සහ විද්‍යුත් මාධ්‍යයෙන් මෙන්ම දුරකථන තාක්ෂණයෙන් පවා අද ලොවට ධර්මදානය සපයන්නේ නවීනයන්ගේ මනස හා ආධ්‍යාත්මික ගති-පැවතුම් පිළිබඳ පැහැදිලි අවබෝධයකිනි.

## කර්තෘ ස්වාමීන්ද්‍රයන් වහන්සේ

වර්තමානික ග්‍රාහක පිරිස, ශ්‍රව්‍ය-දෘෂ්‍ය මාධ්‍ය මගින් දැනුමත් විනෝදාස්වාදයත් ලබන්නට පුරුදු වී සිටින පරපුරක් හෙයින්, ගරුතර වේරගොඩ සාරද හිමිපාණෝ, ඔවුනගේ මනසට සරිලන පරිද්දෙන් බුද්ධ භාෂිතය, ඔවුන් අතට පත් කරන සේක. මුද්‍රිත හා විද්‍යුත් ප්‍රකාශන 700 ක් පමණ ලොවට පිරිනමා සිටින මේ යතිනායකයන් වහන්සේ විසින් සම්පාදිත ධර්ම භාණ්ඩාගාරය නම් ඉංග්‍රීසි කෘතිය දොරට වැඩීමේ උළෙලේ දී, ඒ පිළිබඳ ව එක් දිනක් තුල පමණක් ලැබුණු දුරකථන ඇමතුම් සංඛ්‍යාව 2000 කටත් අධික විය. ඒ නිසා එය සිංගප්පූරු රාජ්‍යයේ ග්‍රන්ථ ප්‍රකාශන ඉතිහාසයේ සුවිශිෂ්ට වාර්තාවකට හිමිකම් කියන්නේය.

දැනට, සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය භාරව වැඩ සිටින ගරු වේරගොඩ සාරද නායක ස්ථවිර පාදයන් වහන්සේ ලෝකයේ බොහෝ දේශයන් හී බුද්ධ ශාසනයේ ප්‍රගතියට හිතකාමී ධර්ම දූත මෙහෙවරක යෙදී සිටින සේක.

එතුමන් ගේ ප්‍රධාන ප්‍රකාශ අතර, සිංහල හා ඉංගිරිසි ධම්මපදයත්, ජාතක කථා පිළිබඳ විද්‍යුත් ප්‍රකාශනයත් ප්‍රධාන තැන් ගනී. එතුමන් විසින්, ඉටු කෙරෙන මහා සාමයික මෙහෙය අඛන්ඩව පවත්වා ගෙන යනු පිණිස, ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් නිදුක් නිරෝගී සුව පැතීම, බෞද්ධ ජනතාවගෙන් ඉටු විය යුතු කෘතඥතා පූර්වක චාරිත්‍රයකි.

කලා කීර්ති එඩ්වින් ආරියදාස

ISBN: 981-00-4938-2

# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත ධම්මපදය

5 වන පරිච්ඡේදය

# බාල වග්ග



ගරු වේරගොඩ සාරද නාහිමිපාණන් වහන්සේ
සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

(ධර්ම දානය, සෙසු දාන සියල්ලටම වඩා අගනේය.)



**''ධර්ම භාණ්ඩාගාරය''** නැමැති

මෙම වටිනා ධර්ම පුස්තකය

**සාමවිනිසුරු බී.ධර්මදාස පියාණන්ට**

නිවන් සුව පතා ප්‍රකාශනය කරන ලදි.

පූර්ණ අනුග්‍රහකත්වය

**වේරගොඩ සුනන්දා භික්ෂුණිය විසිනි**

# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත ධම්මපදය

කතෘ:

**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**

ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව

විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය




**සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය**

නො: 1, ජලන් මස් පුටේ, සිංගප්පූරුව 128607

ටෙලි: 65 67783330 65 94656570

94 770589498 / 94 755218421

වේරගොඩ ජයන්ති විහාරය, වේරගොඩ, මීටියාගොඩ

විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

**කර්තෘ**
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**චිත්‍ර ශිල්පි**
පී. වික්‍රමනායක

**සැකසුම**
පියරත්න හේවාබට්ටගේ

**පරිගණක රූපාවලි සහ පූර්ව ප්‍රකාශන මෙහෙය**
පූජ්‍ය වේරගොඩ සුනන්දා භික්ඛුණී
බී. දයා සමරසිංහ
බී. රෝහණ ජයතිස්ස

**පරිගණක සහාය**
ශ්‍යාමනී ප්‍රියලක්‍ෂණා ලේකම්වසම්
ඩබ්ලිව්. මාලා කාන්ති
ප්‍රියංකා බෝධිපක්‍ෂ

**සහාය**
බී. පුෂ්පානී ධම්ලතා
බී. ජේ. ධම්ලතා
ඊ. එම්. ලයනල් මොහොට්ටි
ඊ. එම්. යුගාන් සසංක
ශ්‍රියාලතා කග්ගොඩ ආරච්චි

**පරිගණක ප්‍රකාශන**
සමනල ප්‍රින්ටර්ස්, බටපොල
ටෙලි: +94 777557127

**පිටකවරයේ පින්තූරය**
බර්ට් ගුණසේකර

**මුද්‍රණය**
2013 නොවැම්බර් මස 27 දින, සිංගප්පූරුව

**පිටකවරයේ චිත්‍රය**
*පිටකවරයේ බුදු පිළිමය වේරගොඩ ජයන්ති විහාරයේ බුදුමැදුරෙනි.*
*වර්ෂ 1953 ජුනි 3 වෙනිදා අඹන ලද මෙම බුදු පිළිමය දැනට ශ්‍රී ලංකාවේ තිබෙන*
*දර්ශණීයතම බුදු පිළිමය වශයෙන් සැලකේ. මෙම බුදු පිළිමය ඉදිකිරීමේ පුරෝගාමී වූ අපවත් වී වදාළ*
*ගෞරවාහී පණ්ඩිත යටලමත්තේ වජිරඤාණ නායක මාහිමිපාණන් වහන්සේට නිවන්සුව අත්වේවායි අපි ප්‍රාර්ථනා කරමු.*

මේ ග්‍රන්ථයෙහි ආගත කරුණු පිළිබඳ පූර්ණ හා සදාකාලික අයිතිය හිමි වන්නේ බුදුරජාණන් වහන්සේටයි.
බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් පහළ වූ සනාතනික සත්‍යයෝ පුහුදුන් මිනිසුන් විසින් පනවන ලද
තාවකාලික වූත්, අසත්‍ය වූත්, අයිතිවාසිකම් පිළිබඳ නීති රීති පිළිගනු නොලබති.

**පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ටෙලි: 65 67783330 65 94656570
+94 770589498 +94 755218421
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

ISBN: 981-00-4938-2

5 වන පරිච්ඡේදය

# බාල වගග





*නිදිවරන්නහුට රැය ද, ගමන් විඩා ඇත්තහුට යොදුන ද, අනුවණයනට සසර ද ඉතා දික් ය.*

60. දීඝා ජාගරතො රත්ති
දීඝං සන්තස්ස යොජනං
දීඝො බාලානං සංසාරො
සද්ධම්මං අවිජානතං (5:1)

දිග ය රැයක් නිදි මරතොත්
යොදුන දිගය වෙහෙස ඇතොත්
සසර දිගය අමන දනට
සද්ධර්මය නොම දනිතොත්.

# දික් වෙයි සසර - නො දතොත් හසර

## 5 (1) එක්තරා පුද්ගලයෙකු ගේ කථා වස්තුව (60 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන අතර භාග්‍යවතුන් වහන්සේ එක්තරා පුද්ගලයෙක් හා **පසේනදී කෝසල** රජතුමන් නිමිති කර ගෙන මේ ගාථාව වදාළ සේක.

වරක් පසේනදී කොසොල් රජතුමා නගරයෙහි වීදි සංචාරයේ යන අතර නිවසක කවුළුවෙන් වීදිය දෙස බැලූ රූමත් ළඳක් දැක ඇය කෙරේ රාග සිතක් ඇති කර ගත්තේ ය. එහෙයින් ඇය හා ඇසුරට මඟක් පාදා ගන්නට සිතූ රජතෙම තොරතුරු සොයා බැලී ය. ඇය විවාපත් තැනැත්තියක බව සොයා ගත් රජ ඇය ගේ සැමියාට රජවාසල රැකියාවක් දුන්නේ ය.

ටික දිනකින් ම රජතෙම ඇය ගේ සැමියාට ඉටු කිරීමට ඉතා අපහසු කාර්‍යයක් පැවරී ය. සැවැත් නුවර සිට යොදුනක් (සැතපුම් දොළහක්) පමණ දුර තැනකට ගොස් අරුණුවන් මැටි හා කුමුදු මල් රැගෙන රජතුමා ස්නානය කරන සන්ධ්‍යා සමයට පෙර සැවැත් නුවරට ආපසු එන්නට ඔහුට නියම විය. රජු ගේ අරමුණ වූයේ මේ දුෂ්කර කාර්‍යය ඉටු කරන්නට ඔහු අසමත් වූ විට හිස ගසා දමා මරා ඔහු ගේ බිරිඳ හිමිකර ගන්නට ය. වහ වහා බිරිඳ ලවා බත් මුලක් ද සකසා ගත් හේ ගමනට පිටත් විය. මග දී තවත් මගියකු සමග බත් මුල බෙදා ගෙන අනුභව කළ හෙතෙම බත් ටිකක් ඉතිරි කර ගෙන දියට දමා හඬනගා මෙසේ කී ය. "මේ ගඟ වසන ආරක්‍ෂක දේවතාවනි, නාගයනි, පසේනදී කොසොල් රජ තෙම අරුණුවන් මැටි සහ කුමුදු මල් ගෙන එන සේ මට නියෝග කළේ ය. අද මම මගේ බත් මුල තවත් මගියකු සමග බෙදා ගත්තෙමි. නදියෙහි මසුන්ට ද ආහාර දුන්නෙමි. මා අද කර ගත් පින් ඔබට අනුමෝදන් කරන්නෙමි. අනුකම්පා කර මට අද අරුණුවන් මැටි හා කුමුදු මල් ලබා දෙනු මැනවි." ඒ ඇසූ නාගයන් ගේ රජතෙම මහළු මිනිසකු ගේ වෙස් ගෙන ඔහු හමුවට අවුත් අරුණුවන් මැටි සහ කුමුදු මල් ලබා දුන්නේ ය.

සැන්දෑවන විට, තරුණ කත ගේ සැමියා කෙසේ හෝ කුමුදු හා මැටි ලබා ගෙන පැමිණිය හොත් තම අරමුණ ඉටු කර ගන්නට තවත් කල් යන හෙයින් ඔහු එන්නට පෙර ම නුවර දොරටු කල් ඇතිව වසන්නට අණ දුන්නේ ය. මල් හා මැටි ගෙන එන්නට ගිය තැනැත්තා ද නියමිත වේලාවට අවුත් දොරටු වසා තිබෙනු දැක "රජතුමා නියතයෙන් ම බොරු වරදක් ගෙන මා මරන්නට තැතක් දරයි" යි සිතා "දැන් ඉතින් කුමක් කරම් ද? නුවර වැසියන්ට මේ බව හඬගා කියමි" යි හඬ නගා මෙසේ කී ය. "නුවර වැසියනි, රජතුමා මට අරුණුවන් මැටි හා කුමුදු මල් ගෙන එන්නට අණ කළේ ය. මා නියම වේලාවට ඒ ගෙනා මුත් රජතුමා දොරටු වසා ඇති හෙයින් දී ගන්නට නො හැකි ය. මෙය නිවරද මා මරා දමන්නට රජතුමා යෙදූ උපායකි. සියල්ලෝ ම ඒ දැනගනිත් වා!" යි පවසා නිවසට නො ගොස් ජේතවනාරාමයට ගොස් එහි පසෙකට වී නිදා ගත්තේ ය.

මේ අතර තම උපාය සාර්ථක වී යැයි සතුටු වූ රජතුමා හෙට උදයෙන් ම සැමියා මරා රූමත් බිරිඳ ගෙන්වූත් සුව පහස විඳ ගනිමියි සිතමින් රාගයෙන් දැවී දැවී ඇඳෙහි පෙරළෙමින් නිදි නැතිව රැය ගත කළේ ය. ඒ අතරතුර ලෝකුඹු නිරයෙහි පැසෙමින් කලාතුරකින් උඩට මතුවන නිරිසතුන් සිවුදෙනකුන් ගේ හඬ අසා බියට පත් හේ පසුදින මල්ලිකා දේවිය ද සමග බුදුරදුන් හමු වීම පිණිස දෙව්රම් වෙහෙරට ගියේ ය. ඒ හඬ පිළිබඳව පැහැදිලි කළ භාග්‍යවතුන් වහන්සේ ඒ පරදාර සේවනය වැනි විවිධ කාමදුෂ්චරිතයන්හි යෙදී අපාගත වූ සිවු දෙනකු වසර තිස්දහසකට වරක් උඩ මතු වී ගාථා හතරක් කියන්නට මුල් අකුරු පමණක් කී හඬ බව හෙළි කළ හ. පරදාර සේවනයෙහි ආදීනව තේරුම් ගත් රජ තෙම තමා කරන්නට ගිය කාර්‍යයෙහි බරපතල කම තේරුම් ගත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ ඇමතූ රජතෙම "සමිඳුනි, රැයක දිග මා තේරුම් ගත්තේ ඊයේ" යයි පැවසී ය. මේ සංවාදයට සවන් දෙමින් පසෙක සිටි තැනැත්තා "මට මේ ඉදිරිපත් වන්නට නිසි අවස්ථාව" යැයි සිතා පෙරට අවුත් "ස්වාමීනි, යොදුනක දුර මා තේරුම් ගත්තේ ද ඊයේ ය"යි තමන් ගේ කතාව ද සැල කර සිටියේ ය. ඒ සියල්ල සැලකිල්ලට ගනිමින් භාග්‍යවතුන් වහන්සේ පූර්වෝක්ත ගාථාව දේශනා කර වදාළ හ.

**විවරණාත්මක අනුවාදය (60 ගාථාව)**

**ජාගරතො රත්ති දීඝා සන්තස්ස යොජනං දීඝං**
**සද්ධම්මං අවිජානතං බාලානං සංසාරො දීඝො**

**ජාගරතො**: නිදි මරන්නාට; **රත්ති**: රාත්‍රිය; **දීඝා**: දිග ය; **සන්තස්ස**: ගමන් වෙහෙස ඇත්තාට; **යොජනං**: යොදුන; **දීඝං**: දිග ය; **සද්ධම්මං**: සද්ධර්මය; **අවිජානතං**: නො දන්නා; **බාලානං**: අනුවණයන්ට; **සංසාරො**: සංසාරය; **දීඝො**: දීර්ඝය

නිදි නො ලබන විට රැය ඉතා දිග බව දැනෙයි. ගමන් වෙහෙස දැඩි තැනැත්තාට යොදුන ඉතා දිග සේ දැනෙයි. ධර්මය නො දත් අනුවණ පුද්ගලයන්ට සංසාරය ඉතා දීර්ඝ ය.

**විවරණය**

සංසාරය නමින් හඳුන්වන්නේ භවයෙන් භවයට අඛණ්ඩව සිදුවන උපත්-චිපත් ක්‍රියාවලියයි. නැවත නැවත උපදින්නේ නැවත නැවත මැරෙනු පිණිස ය. එහෙයින් පුනර්භවය ආස්වාදනීය දෙයක් නොව නිම කළ යුත්තකි. "සදාකාල ජීවනය" නම් මායාවකි. ජීවිතය නම් උපතේ සිට මරණය දක්වා සිදුවන දිරායාම් ක්‍රියාවලියක් සේ දත යුත්තේ ය. එහෙයින් 'නො මැරී සිටීම' පිළිබඳ අරමුණ සාක්ෂාත් කරන්නේ ජීවිතය දීර්ඝ කිරීමෙන් නොව පුනර්භවය නවතා ලීමෙනි. මෙය උච්ඡේදයක් හෝ විනාශයක් ලෙස හැඳින්විය නො හැක්කේ උච්ඡේදවීම සඳහා ස්ථිර වාස්තවික යමක් නොමැති හෙයිනි. උච්ඡේදයක් නම් 'සත්' වස්තුවක පූර්ණ විනාශයයි. බුදු සමය එබඳු ස්වාධීන, හේතු-ඵල සම්බන්ධයෙන් බැහැරව පවතින සත් පදාර්ථ නො පිළිගන්නා හෙයින් නිර්වාණය උච්ඡේදයක් ලෙස හඳුන්වනු නො ලැබේ.



*නුවණැති උතුමකු ඇසුරු කිරීමට නැති නම් හුදකලාව විසීම වඩා සුදුසු ය.*

61. චරං චෙ නාධිගච්ඡෙය්‍ය
සෙය්‍යං සදිසමත්තනො
එක චරියං දළ්හං කයිරා
නත්‍ථි බාලෙ සහායතා (5:2)

ඇසුරට නිසි සම මිතුරෙක්
හෝ ගැලපෙන උසස් කෙනෙක්
නො ලදොත් තනිවම වසන්න
නො කර ඇසුර අනුවණයෙක්

# ඇසුරු නො කරන් - අමන මිනිසුන්

## 5 (2) මහා කාශ්‍යප හිමියන් ගේ ශිෂ්‍ය භික්‍ෂුවක් (61 ගාථාව)

**මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ** ගේ ශිෂ්‍ය භික්‍ෂු නමක් අරබයා භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ගාථාව වදාරන ලද්දේ ජේතවනාරාමයේ වැඩ වාසය කළ සමයේ ය.

මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ පිප්ඵලී ගුහාවෙහි වැඩ වාසය කරන සමයෙහි උන් වහන්සේට ශිෂ්‍ය භික්‍ෂු දෙනමක් සිටිය හ. එක් නමක් තම යුතුකම් මැනවින් ඉටු කරයි. එහෙත් අනික් භික්‍ෂු නම තමා කිසිවක් නො කළ ද අනිත් නම කරන දෙයෙහි ගෞරවය තමන්ට ලබා ගන්නට ක්‍රියා කරයි. යහපත් ශිෂ්‍යයා මුව සෝදන දිය, දැහැටි දඬු ආදිය සූදානම් කළ විට හේ "සමිඳුනි මුව සෝදන කළමනා සූදානම්" යි දැනුම් දී ගෞරවය ලබා ගනියි. පැන් උණු කළ විට "සමිඳුනි නා ගන්න. පැන් ලැහැස්තියි" කියා දැනුම් දෙයි. වෙහෙස මහන්සිය විනීත ශිෂ්‍ය භික්‍ෂුවටත්, ගෞරවය අවිනීත භික්‍ෂුවටත් ලැබෙයි.

මෙහි කෙළවරක් නැති තැන දිනක් සුවිනීත ශිෂ්‍යයා මෙසේ සිතී ය. "දවස ගාණේම සිදුවන මේ වංචාව හෙළි කළ යුතුයි." එසේ සිතා දිනක් පැන් උණු කොට එය සඟවා තබා හිස් බඳුනකට සුළු පැන් ප්‍රමාණයක් ලිප තැබිය. බඳුනෙන් නගින දුම දුටු අවිනීත ශිෂ්‍යයා එහි උණු පැන් පිරී ඇතැයි සිතා "සමිඳුනි, නාන දිය සූදානම් යැයි දැනුම් දුන්නේ ය.

එහෙත් මහා කාශ්‍යප හිමියෝ නාන්නට සැරසී බැලූ විට දිය නො තිබුණෙන් "කෝ ආයුෂ්මතුනි වතුර?"යි විමසන ලදී. කලබල වූ ඔහු කලයක් රැගෙන වතුර ගෙනෙන්නට ළිඳට යන අතර සුවිනීත නම සැඟවූ වතුර ගෙන'වුත් දුන්නේ ය. යථා තත්ත්වය කුමක්දැයි තේරුම් ගත් මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ මෙබඳු වංචනික ක්‍රියා නො කරන්නැයි අවිනීත භික්‍ෂුවට අවවාද කළ හ. එහෙත් අවවාදක්‍ෂම නො වූ අවිනීත භික්‍ෂුව තෙරුන් වහන්සේ සමග වෛර බැඳ ගත් හ.

පසු දින විනීත ශිෂ්‍ය නම මහ තෙරුන් වහන්සේ සමඟ පිඬු සිඟා ගිය අතර අවිනීත හිමි නම දායක ගෙදරකට ගොස් මහ තෙරුන් ගිලන් බව දන්වා ප්‍රණීත භෝජන පිළියෙල කරවා ගෙන අතර මගදී සියල්ල අනුභව කළේය. එදින පිඬු සිඟා ගිය ගමනේ දී දායකයෝ මහා කාශ්‍යප මහරහතන් වහන්සේට සිවුරු සඳහා නව පිළියක් පිළිගැන්වූහ. එය විනීත භික්‍ෂු නමට දෙන ලදුව හේ ඉන් සිවුරක් කර පඬු පොවා භාවිතයට ගත්තේ ය.

දායකයන් "ඔබ වහන්සේට අප එවූ විශේෂ ආහාරයෙන් රෝගය පහසු වීදැයි විමසූ විට අවිනීත නම කළ දුෂ්කෘතය හෙළි වූයෙන් කසුප් හිමියෝ ඒ ගැන ඔහුට දොස් පැවරූ හ. ඉන් කිපුණ හෙතෙම "මේ මහලු මහණ තෙම දිය ටිකක්, ආහාර ස්වල්පයක් වෙනුවෙන් මට බැණ වදියි. නව සිවුරක් ලද විට අනෙක් ශිෂ්‍යයාට දෙයි. මම කළ යුත්ත දනිමි''යි හිමියන් පිටත යනතුරු හිඳ සියලු භාණ්ඩ විනාශ කර පන්සල් ගේ ගිනි තබා පලා ගියේ ය. මරණින් පසු ඒ අකුශල කර්මය නිසා හේ අවීචි මහා නරකාදියෙහි උපන්නේ ය.

### විවරණාත්මක අනුවාදය (61 ගාථාව)

**චෙ අත්තනො සෙය්‍යං සදිසං චරං න අධිගච්ඡෙය්‍ය**
**එකචරියං දළ්හං කයිරා බාලෙ සහායතා නත්ථි**

**චෙ**: ඉදින්; **අත්තනො**: තමාට; **සෙය්‍යං**: උසස් හෝ; **සදිසං**: සමාන; **චරං**: මිතුරෙක් (එකට හැසිරෙන කෙනෙක්); **න අධිගච්ඡෙය්‍ය**: නො ලැබෙන්නේ නම්; **එකචරියං**: තනිව වාසය; **දළ්හං කයිරා**: දැඩි කරන්න; **බාලෙ**: අනුවණයන් සමඟ; **සහායතා**: මිත්‍රතාවක්; **නත්ථි**: නැත.

තමාට සමාන හෝ තමාට වඩා උසස් මිතුරෙකු සොයා ගන්නට බැරිනම්, තනිව වාසය කිරීම යහපත් ය. බාල ජනයා සමඟ ආශ්‍රය කිරීම කිසිසේත් නො කළ යුත්තේ ය.

### විවරණය

**සහායතා**: මිත්‍රත්වය, එකට වැඩ කිරීම, මෙම ගාථාවේ අභිප්‍රාය වන්නේ නොමේරූ අඥානයන් සමග ආශ්‍රය නො කළ යුතු බව දක්වා කල්‍යාණ මිත්‍ර සේවනයෙහි අනුසස් දැක්වීම ය. පහත් පුද්ගලයන් ඇසුරු කිරීමෙන් තමා දෙලොවින්ම පිරිහෙන අතර කීර්තිය ද කෙළෙසෙයි.

කෙසේ වුවද බාලයකු වුවත් ගුණ යහපත්කම් උගන්වා නැණ නුවණින් දියුණු කරවීමේ කාරුණික අපේක්‍ෂාවෙන් ආශ්‍රය කිරීම වරදකැයි මෙයින් නො කියැවෙන බව සටහන් කළ යුතු ය.





*මට දරුවන් හා ධනය ඇත්තේ ය යි අනුවණයා දුකට පත් වුවත් තමා ද තමාට නැත්තේ ය.*

62. පුත්තාම’ත්ථි ධනංම’ත්ථි
ඉති බාලො විහඤ්ඤති
අත්තා හි අත්තනො නත්ථි
කුතෝ පුත්තා කුතෝ ධනං (5:3)

මට පුතුන් ඇත, මට ධනය ඇත
සිතා අනුවණ දනෝ වෙහෙසෙත
කවර පුත්තු ද? කවර ධනය ද?
තමන් පිහිටට තමන්වත් නැත.

# අවිද්‍යාවේ 'ඵලය දුක වේ'

## 5 (3) ආනන්ද සිටුවරයා ගේ පුවත (62 ගාථාව)

ආනන්ද නම් වූ මසුරු සිටුවරයෙකු නිමිති කොට මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ විසින් ජේතවනාරාමයෙහි දී දේශනා කරන ලදී.

සැවැත් නුවර ආනන්ද නම් ඉතා ධනවත් සිටුවරයෙක් විසී ය. ඔහුට අසූ කෙළක් ධනය තිබුණ ද කිසිවෙකුට කිසිවක් දෙන්නට හේ මැලි විය. තම පුත් මූලසිරි අමතා ඔහු නිතරම කීවේ "මේ මහා විශාල ධනයකැයි නො සිතන්න. ඔබට ඇති කිසිවක් වෙන කිසිවෙකුට නො දිය යුතු ය. ඔබ කළ යුත්තේ ධනය තව තව වැඩි කිරීමයි. නැතහොත් ඉතා ඉක්මණින් ම මේ ධනය නිම වනු ඇත. නිවසේ බිම රන් පිරැවූ මැටි බඳුන් පහක් නිදන් කර ගෙන සිටි ඔහු මිය ගියේ ඒවා තිබුණු බවක් වත් කිසිවෙකුට නො පවසමිනි.

මිය ගිය ආනන්ද සිටු වරයා සැවැත් නුවරට ආසන්නයේ එක් සිඟන පිරිසක උපන්නේ ය. ඔහු උපදින්නට පෙර මවු කුස විසූ සමයෙහි සිඟන්නනට ලැබෙන ආදායම අඩු වූයේ ය. කවුරුන් හෝ අවාසනාවන්තයකු තමන් අතර ඇතැයි සිතූ ඔවුහු, කණ්ඩායම කොටස් වලට බෙදෙමින් අවාසනාවන්තයා අයත් කණ්ඩායම තනි කරන ක්‍රමයට ඔහු ගැබිගත් පවුල තනි කර ගත් හ. ඔවුන් ගමෙන් පළවා හරින ලදී. ඔහු උපන්නේ කැත විකෘත දරුවකු ලෙසිනි. ඔහු ගේ කිසිම ඉන්ද්‍රියයක් පිහිටිය යුතු තැන නියම විදියට නො පිහිටියේ ය. බැලූ බැල්මට පාංශු පිශාචයකු බඳු වූ හේ ඉතා අවාසනාවන්ත විය. මව ඔහු සමඟ සිඟා ගියදාට කිසිවක් නො ලැබේ. තනිව ගිය විට යමක් ලැබෙයි.

එහෙත් මව දැඩි දුක් විඳ ඔහු තරමක් වැඩෙන තුරු පෝෂණය කර, තනිව යමක් කරගන්නට තරමට ඔහු වැඩුණු පසු ඔහු අතට කොළපතක් දුන් මව "පුත, අප මේ ව්‍යසනයට වැටුණේ නුඹ නිසා ය. දැන් ඉතින් මම ඇති තරම් දුක් විඳ හෙම්බත්ව සිටිමි. මේ කොළපතත් රැගෙන සිඟා කා ජීවත් වන්න" යි පැවසුවා ය. සැවැත් නුවර සිඟා යන අතරතුර ඔහුට හිටි හැටියේ තම පෙර ජන්මය හා ඒ ජන්මයේ නිවස සිහිපත් විය. එහෙයින් හේ එය සොයා ගියේ ය. ඔහු ගේ පෙර ජන්මයේ පුත් මූලසිරි ගේ දරුවෝ ඔහු දැක බියෙන් හඬන්නට පටන් ගත් හ. එහෙයින් ඔහුගේ සේවකයෝ ඔහු තළා පෙළා ගෙයින් බැහැරට එළවූ හ.

මේ සිද්ධිය පිඬු සිඟා වඩිනා ගමන් දුටු භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමියන් ලවා මූලසිරි කැඳවූ හ. මේ හිඟන කොළුවා ඔබේ පෙර ජන්මයේ පියා යැයි බුදුරදුන් මූලසිරිට හෙළි කළ ද හේ එය පිළි නො ගත්තේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ හිඟන දරුවා අමතා රන් කළ පහ වළලා ඇති තැන දක්වන්නැයි ඉල්ලා සිටියේ ය. ඒ අනුව කොලුවා රන් කළ පහ පෙන්වූ පසු මූලසිරි ඒ තම පියා බව පිළි ගත්තේ. මෙයින් මහත් කම්පනයට පත් මූලසිරි බුද්ධ ශ්‍රාවකයෙක් බවට පත් විය.

**විවරණාත්මක අනුවාදය (62 ගාථාව)**

**මෙ පුත්තා අත්ථි, මෙ ධනං අත්ථි ඉති බාලො විහඤ්ඤති. අත්තා හි අත්තනො නත්ථි පුත්තා කුතො ධනං කුතො?**

**මෙ**: මට; **පුත්තා**: පුත්තු; **අත්ථි**: සිටිති; **මෙ**: මට; **ධනං**: ධනය; **අත්ථි**: ඇත; **ඉති**: යනුවෙන්; **බාලො**: අඥානයා; **විහඤ්ඤති**: වෙහෙසයි; **අත්තා හි**: තමා ද; **අත්තනො**: තමාට; **නත්ථි**: නැත; **පුත්තා කුතො**: පුත්තු කොහෙන්ද; **ධනං කුතො**: ධනය කොහෙන් ද?

මට දරුවෝ සිටිති, මට ධනය තිබේ, ආදි වශයෙන් සිතමින් අඥාන පුද්ගලයා වෙහෙසෙයි. එහෙත් අඩු ගණනේ තමාට තමාවත් නැත. පුත්තු හා ධනය කෙසේ ද?

**විවරණය**

තමාට පුත්තු, ධනය වෙතියි වෙහෙසීම පෘථග්ජන ගතියකි. එහෙත් යථාර්ථ වශයෙන් ගත් විට තමාට තමාවත් නො මැත.

පුත්තු වර්ග තුනක් වෙති. අතිජාත, අනුජාත හා අවජාත වශයෙනි. අතිජාත නම්, මවුපියන්ටත් වඩා ගුණ නැණ ඇති උතුම් දරුවෝය. අනුජාත නම් අඩුගණනේ මවුපියන් තරම් වත් ගුණ නුවණ ඇති දරුවෝය. සමහරු මේ දෙකින්ම දෙමාපියන්ට වඩා අඩු වෙති. එහෙයින් 'අඩු' යන අරුතින් ඔවුහු 'අවජාත' වෙති.

**අත්තාහි අත්තනො නත්ථි**: මෙහි 'අත්තා' නම් සම්මුති සත්‍යාගත 'අත්තා' ය. පරමාර්ථ වශයෙන් කථා කරන විට 'අත්තා' යි නො යෙදේ.





*තමා ගේ අනුවණකම දන්නා තැනැත්තා නුවණැතියෙක් හෝ නුවණැතියෙකු සමාන හෝ වන්නේ ය.*

63. යො බාලො මඤ්ඤති බාල්‍යං
පණ්ඩිතො වාපි තෙන සො
බාලො ච පණ්ඩිතමානී
ස වෙ බාලො’ති වුච්චති (5:4)

තමන් බාල බව දනිතොත්
පඬිවරයෙකි එ පමණිනුත්
බාලව පඬි බව සිතතොත්
පරම බාලයෙක් ය කියත්

# දැන සත'රුත් - වන්න වියත්

## 5 (4) ගැට කපන්නෝ දෙදෙනෙක් (63 ගාථාව)

**ගැට කපන්නන්** දෙදෙනකු මුල් කරගෙන භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර දී මේ ගාථාව දේශනා කර වදාළ සේක.

සැවැත් නුවර ගැට කැපීම රැකියාව කර ගත් මිතුරෝ දෙදෙනෙක් වූ හ. දිනක් ඔවුහු ගැට කැපීම සඳහා නිතර බණ අසන්නට සෙනඟ ගැවසෙන හෙයින් ජේතවනාරාමය සුදුසු තැනක් යයි සිතා එහි ගිය හ. එක් තැනැත්තෙක් සෙනඟ අතරේ ගැවසෙමින් මුදල් ගැටයක් කපා ගන්නට මාන බැලූ අතර අනෙකා ඉබේ ම මෙන් බුදුරදුන් ගේ දේශනයට සවන් යොමන්නට පටන් ගත්තේ ය.

බණ අසන්නට පටන් ගත් තැනැත්තා උනන්දුවෙන් බණ අසා සෝවාන් ඵලය ද ලබා ගත්තේ ය. අනෙකා එක් සැදැහැවතකු ගේ මුදල් පසුම්බිය කපා ගෙන මසුරන් පහක් ලබා ගත්තේ ය.

මුදල් ලබා ගත් තැනැත්තා ගේ ගෙදර ඒදින භෝජන පිළියෙළ වූ අතර සෝවාන් වූ තැනැත්තා ගේ නිවසේ කෑමට යමක් නො වීය. මේ බව දැනගත් ගැට කැපූ තැනැත්තා හා ඔහු ගේ බිරිඳ "පණ්ඩිතකම් කරන්නට ගොස් අද නුඹලාට බඩගින්නේ ඉන්නට සිදුවුණා නො වේද?" යි ඔවුන් වෙහෙසූ හ. එහෙත් සෝවාන් වූ තැනැත්තා ගේ පවුලේ අය "මේ අඥාන තැනැත්තා තම අඥාන භාවය නිසාම ඒ බව නො දැන තමන් පණ්ඩිතයකු කොට සිතයි" යි සිතා භාග්‍යවතුන් වහන්සේ බැහැ දක්නට ගොස් සම්පූර්ණ සිද්ධිය කියා පෑහ. භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළේ ඒ නිමිත්තෙනි.

### විවරණාත්මක අනුවාදය (63 ගාථාව)

**යො බාලො බාල්‍යං මඤ්ඤති තෙන අපි වා සො පණ්ඩිතො පණ්ඩිතමානි බාලො ච සො වෙ බාලො ඉති වුච්චති.**

**යො**: යම්කිසි; **බාලො**: බාලයෙක්; **බාල්‍යං**: (තම) බාල කම; **මඤ්ඤති**: දනියි ද; **තෙන අපි වා**: එපමණකින් වුව ද; **සො**: හෙතෙම; **පණ්ඩිතො**: පණ්ඩිතයෙක් වෙයි; **පණ්ඩිතමානි**: පණ්ඩිතයෙක් යැයි සිතට ගත්; **බාලො ච**: මෝඩයෙක් වේ නම්; **සො**: හෙතෙම; **වෙ**: ඒකාන්තයෙන් ම; **බාලො ඉති**: මෝඩයෙක් යැයි; **වුච්චති**: කියනු ලැබේ.

යම්කිසි අඥාන පුද්ගලයෙක් අඩු ගණනේ තමන් අඥාන බව තේරුම් ගනියි ද එපමණකිනුත් හේ පණ්ඩිතයෙක් වෙයි. එහෙත් තමන් අඥාන බව නො දන්නා, ඒ බව නො පිළිගන්නා තැනැත්තා ඒකාන්තයෙන් ම මෝඩයෙකැයි කියනු ලැබේ.

### විවරණය

**බාලො**: යන්නෙන් බෞද්ධ ධර්ම සාහිත්‍යයෙහි හඳුන්වන්නේ නුවණින් බාල තැනැත්තා ය. විශේෂයෙන් ම අඥානකම හේතුවෙන් ත්‍රිවිධ දුෂ්චරිතයෙහි යෙදෙන්නා බාලයෙකි. මෙය මෝහයෙහි හෙවත් අවිද්‍යාවෙහි ප්‍රතිඵලයකි. බාලයා තමා මෝහයෙන් වැසුණු නුවණ ඇති හෙයින් යථාර්ථය නො දකියි. සියල්ල අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බව නො දැන මමය, මාගේ යැයි දෘෂ්ටි ගනියි. චතුරාර්‍ය සත්‍යය අවබෝධය කර නො ගනියි.

මෝහය හෙවත් බාලකම දුරුවන්නේ අවිද්‍යාව හෙවත් චතුරාර්‍ය සත්‍යය නො දැනීම දුරු කිරීමෙනි. පටිච්ච සමුප්පාදයෙහි මූලාංගය ලෙස දක්වා ඇත්තේ අවිජ්ජාව ය. එසේ දක්වන්නේ අවිද්‍යාව ලෝකයෙහි ආදි හේතුව නිසාවත්, අවිද්‍යාවට පෙර කිසිවක් ලොව නො තිබිණි යන අරුතින් වත් නො වේ. අවිද්‍යාව ද ප්‍රතීතය සමුත්පන්න ය. "ආසව සමුදය නිසා අවිජ්ජා සමුදය වේ" යි දක්වන්නේ එහෙයිනි.

අවිද්‍යාව සුක්ෂ්ම වශයෙන් හෝ අර්හත් ඵලය ලබන තෙක් පවතියි. එහෙයින් එය දස සංයෝජන අතර දසවැන්න වශයෙන් දැක්වෙයි. අකුශල මූලත්‍රයෙන් වූව ද රාගය හා ද්වේෂය සියුම් ලෙස අවිද්‍යාව පදනම් කර ගෙන පවත්නා හෙයින් වඩාත්ම ප්‍රබල අකුශල මූල සේ මෝහය හඳුනාගත යුතු ය. මනුෂ්‍ය චර්යාව පසුපස පවත්නා අභිප්‍රේරණ වශයෙන් දැක්විය හැකි ආසවයන් අතර අවිද්‍යාව ද එකකි. අප සංසාරයෙහි බැඳ දමනු ලබන්නේ අවිජ්ජා නීවරණ හේතුවෙනැයි භාග්‍යවතුන් වහන්සේ වදාරා ඇත. එය බිඳ දැමූ විට සංසාර චක්‍රය හෙවත් හේතුඵල චක්‍රය බිඳ දමා බුදුවරයෙක් හෝ රහතන් වහන්සේ නමක් විය හැක.

අවිද්‍යාව දුරු කර ගන්නට නම් තමන් වෙත අවිද්‍යාව ඇති බව පිළිගත යුතු ය. අවිද්‍යාවෙන් පිරිතිරි සිටිද්දීම තමන් ප්‍රඥාවෙන් පිරිතිරි සිටිතැයි වරදවා ගතහොත් ප්‍රගතියක් නම් අපේක්ෂා කළ නො හේ. බාල බව දැනුම් මතින් ම වූව ද පණ්ඩිත නාමයට යෝග්‍ය වෙතියි මේ ගාථාවෙහි දැක් වූයේ එහෙයිනි.





*අනුවණයා දිවි ඇති තෙක් පණ්ඩිතයෙකු ඇසුරු කළත් දහමක් (මනාව) දැන නො ගනී.*

64. යාවජීවම්පි චෙ බාලො
පණ්ඩිතං පයිරුපාසති
න සො ධම්මං විජානාති
දබ්බී සූපරසං යථා (5:5)

දිවි ඇති තෙක් වුවත් අමන
දනෝ කළත් පඬි සේවන
නො විඳිති දහමේ රස ගුණ
හැන්දක් මෙන් රස නො දන්න.

# මහ උගතුන් ඇසුරු කළත් - අනුවණයෝ ඵල නොලබත්

## 5 (5) උදයි හිමියන් ගේ ප්‍රවෘත්තිය (64 ගාථාව)

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් **උදයි** නම් එක්තරා පුහු මානයෙන් පිරි භික්ෂුනමක් මුල් කර මේ ගාථාව දේශනා කළ සේක.

උදයි හිමි ධර්මය පිළිබඳ ගැඹුරු අවබෝධයක් නො ලත් සාමාන්‍ය භික්ෂු නමක් විය. දිනක් ධර්ම ශාලාවෙන් මහ තෙරවරුන් නික්ම ගිය පසු එහි ගිය උදයි තෙරණුවෝ ධර්මාසනයෙහි වාඩි වී සිටිය හ. ඒ අවස්ථාවෙහි පිට පළාතක සිට පැමිණි ආගන්තුක භික්ෂු පිරිසක් උදයි හිමි ධර්මාසනයෙහි වැඩ සිටිනු දැක උගත් ධර්මධර හිමි නමක් වන්නට ඇතැයි එහි ගොස් ස්කන්ධ පිළිබඳව ප්‍රශ්නයක් ඇසූ හ. තමන් ගැඹුරු දහම් නො දත් හෙයින් උදයි තෙරණුවෝ ඊට පිළිතුරු දීගන්නට සමත් නො වූ හ. එවිට ආගන්තුකව පැමිණි සිටි හිමිවරු "බුදුරදුන් වැඩ වෙසෙන ආරාමයේ ම වාසය කරමිනුත් ස්කන්ධ, ධාතු, ආයතන වැනි මූලික කරුණු ගැනවත් මේ භික්ෂුවට බින්දු මාත්‍ර අවබෝධයක් නැත. කවුද මේ අඥාන හිස් භික්ෂුව?"යි අවමන් කළ හ. එසේ නින්දා කොට එයින් නො නැවතී භාග්‍යවතුන් වහන්සේට ද ඒ බව දැන් වූ හ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළ හ.

### විවරණාත්මක අනුවාදය (64 ගාථාව)

**බාලො චෙ යාවජීවං අපි පණ්ඩිතං පයිරුපාසති සො**
**යථා දබ්බී සූපරසං ධම්මං න විජානාති**

**බාලො**: අඥාන පුද්ගලයා; **චෙ**: ඉදින්; **යාවජීවං අපි**: දිවි ඇතිතාක් වුව ද; **පණ්ඩිතං**: පණ්ඩිතයකු; **පයිරුපාසති**: ඇසුරු කරන්නේ ද; **සො**: හෙතෙම; **යථා**: යම්සේ; **දබ්බී**: හැන්ද; **සූපරසං**: ව්‍යාංජනයේ රස (නොදන්නා) මෙන්; **ධම්මං**: ධර්මය; **න විජානති**: දැන නො ගනියි.

අඥාන පුද්ගලයා ජීවිතාන්තය දක්වා ම පණ්ඩිතයකු ආශ්‍රය කළත්, හැන්දකට කිසි කලෙක සූපයක රසය නො දැනෙන්නාක් මෙන් හේ ධර්මය ඉගෙන නො ගනියි.

### විවරණය

**දබ්බී සූපරසං යථා**: යන සරල උපමාව බුදුරදුන් විසින් මෙහිදී ඉදිරිපත් කර ඇත්තේ ප්‍රබල ලෙස අරුත සිතට විදින ආකාරයෙනි. රසවත් භෝජන පිළියෙළ කිරීමේ දී හැන්ද නිරන්තරයෙන් ම උපකාර කරගනු ලැබේ. එහෙත් හැන්දෙන් සූපයන් කවර තරමට හැඳිගෑම් කළ ද කිසි කලෙක සූපයේ රස හැන්දට නො දැනේ. ජීවිත කාලයක් පුරා අඥානයන් පණ්ඩිතයකු සේවනය කළ ද ඔහුට එයින් නිසි ඵල ලැබීම අපහසු විය හැකි බව මෙයින් කියැවෙයි. මෙය ඉතා ප්‍රබල හා සිත් කාවදින කියුමකි.

**ධම්ම**: ධම්ම යන වචනයට අරුත් රැසක් තිබේ. පොදුවේ කාගේත් සිතට නැඟෙන ජනප්‍රිය අරුත නම් 'බුද්ධ දේශනාව' යන්නයි. භාග්‍යවතුන් වහන්සේ ලෝකයාට දේශනා කළේ තමන් වහන්සේ ප්‍රත්‍යක්ෂ කළ සත්‍යය යි. බුදුරදුන් පසක් කළ මේ සත්‍යය ගැන ලෝකයා දැන ගන්නේ බෞද්ධ සාහිත්‍යය තුළිනි. බුද්ධත්වයෙන් අනතුරුව විමුක්ති සුවයෙන් විවේකීව වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේට මෙබඳු අදහසක් පහළ විය. "මා විසින් අවබෝධ කරගත් මේ ධර්මය ගැඹුරුය. අවබෝධ කිරීම දුෂ්කර ය. ශාන්තය, ප්‍රණීතය, නිපුණය, අතර්කාවචරය, පණ්ඩිවරුන් විසින් ම දැනගත හැකි ය. මේ සත්ත්වයෝ වූ කලි කාම වස්තූන්ටම ඇළුණා හ. කාමයෙන් ම මත් වූ හ. ආලයරත, ආලය සම්මුදිත ප්‍රජාවට මේ ධර්මය මනාව අවබෝධ කර ගැනීම අපහසු ය. සියලු සංස්කාරයන් ගේ නිරෝධය වූ, සියලු උපධීන් සංසිඳීම වූ, තෘෂ්ණා නිරෝධය වූ, නිර්වාණය අවබෝධය අපහසු ය. මෙය දේශනා කරන්නට යාම මට වෙහෙසක් පමණි." එසේ සිතූ භාග්‍යවතුන් වහන්සේට මෙයද සිතට නැඟිණි.

"මා විසින් දුකසේ අවබෝධ කර ගත් නමුත් දැන් ධර්මය දේශනා කිරීම නිෂ්ඵල ය. මේ ප්‍රතිසෝතගාමී සියුම්, ගැඹුරු, අතිශය දුර්දශ ධර්මය රාගයෙන් හා ද්වේෂයෙන් පිරුණාවුනට අවබෝධ කර ගැන්ම පහසු නො වේ. මෝහාන්ධකාරයේ ගිලුණු රාගයෙන් රත් වූ ජනයා ධර්මය නො දකිති." මෙසේ සිතත් ම ධර්ම දේශනා කෙරෙහි උන්වහන්සේ ගේ සිත උදාසීන විය. බුදුරදුන් ගේ සිතිවිලි වටහා ගත් සහම්පති බ්‍රහ්මයා දහම් අසන්නට නො ලැබීමෙන් ලොව වැනසෙතැයි බියෙන් උන්වහන්සේ හමුවට පැමිණ මෙසේ ආරාධනය කළේ ය. "ස්වාමීනි, බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරන සේක්වා. ඇසෙහි දූවිලි අඩු මිනිස්සු වෙසෙති. ධර්මය අසන්නට නො ලැබීමෙන් ඔවුනට මහත් අලාභයක් වෙයි. ධර්මය අවබෝධ කර ගන්නට සමත් අය වෙති." වැඩි දුරටත් හේ මෙසේ ද පැවසී ය. "කලින් මගධයෙහි පිරිසිදු නො වූ පුද්ගලයන් විසින් පළ කළ අපිරිසිදු දහම් පහළ විය. අමෘතයෙහි දොරටුව විවෘත කළ මැනවි. නික්ලේශී ඔබ වහන්සේ විසින් අවබෝධ කළ ධර්මය ඔවුන්ට අසන්නට සැලැස්සුව මැනවි. පර්වතයක මුදුනේ සිට පහල සිටින්නවුන් දෙස බලන්නකු මෙන් ශෝක රහිත ඔබ වහන්සේ ද ධර්ම ප්‍රාසාදය මත නැඟී ජාති ජරා මරණයෙන් පීඩිත ශෝකී ප්‍රජාව දෙස බලනු මැනවි. වීරයාණන් වහන්ස, නැඟී සිටිනු මැනවි. සටන දිනූ සාර්ථවාහකය, ණය නැති උතුමාණන් වහන්ස, ලොවෙහි හැසිරෙනු මැනවි. භාග්‍යවතුන් වහන්ස, ධර්මය දේශනා කරන සේක්වා, ධර්මය අවබෝධ කර ගන්නට සමත් අය සිටිති"

බ්‍රහ්මයා එසේ පැවසූ විට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ හ. "බ්‍රහ්මය, මට මේ සිතුවිල්ල උපන්නේ ය. ම විසින් දුක සේ අවබෝධ කර ගත් මේ ධර්මය රාගයෙන් හා ද්වේෂයෙන් පිරුණාවුනට අවබෝධ කර ගැනීම පහසු නැත. මෝහාන්ධකාරයෙහි ගිලුණු රාගයෙන් රත් වූ ජනයා මේ ප්‍රතිසෝතගාමී, ගැඹුරු, දුර්දශ සියුම් ධර්මය නො දකිති. මා මෙසේ සිතත් ම ධර්මය නො දෙසීම කෙරේ මා සිත නැමුණේ ය." සහම්පතී බ්‍රහ්ම තෙම දෙවන වරට ද ධර්මය දේශනා කරන්නැයි බුදුරදුන්ට ආයාචනය කර සිටියේ ය. බුදුහු නැවත ද ඒ පිළිතුර ම දුන් හ. බ්‍රහ්මයා තුන්වන වරට ද ආයාචනය කළ විට තථාගතයන් වහන්සේ ලෝකානුකම්පාවෙන් සිය බුදු නුවණ මෙහෙයවා ලොව බැලූ සේක. එසේ ලොව බලත් ම ඇසෙහි දූවිලි අඩු හා වැඩි, නුවණ සියුම් හා නුවණ මඳ සුසිරිත් ඇති හා දුසිරිත් ඇති, ශික්ෂණයට පහසු හා ශික්ෂණයට අපහසු අය මෙන් ම පරලොවට හා වරදට බය සුළු පිරිසකුත් දුටු සේක. නිල්, රතු, සුදු පියුම් පිපෙන පොකුණක දියෙහි ජනිතව දියෙහි වැඩී දිය යට ම පවතින පියුම්, දියෙහි ජනිතව දියෙහි වැඩී දිය මට්ටමට ආ පියුම් හා දියෙහි ජනිතව දියෙහි වැඩී දියෙන් ඉහළට නැඟී දියෙහි නො ගැටී පවතින පියුම් වශයෙන් විවිධ පියුම් පවතියි. එමෙන් ම සිය බුදු ඇසින් ලොව බලන සර්වඥයන් වහන්සේට ඇසෙහි දූවිලි අඩු හා වැඩි තියුණු බුද්ධියෙන් යුතු හා බුද්ධි මට්ටමෙන් හීන, යහපත් චරිත ඇති හා පහත් චරිත ඇති, ශික්ෂණයට පහසු හා ශික්ෂණයට අපහසු අය ද එමෙන් ම පරලෝකයට හා වැරදි කිරීමට යන දෙකට බය ඇති සුළු පිරිසක් ද සිටින බව පෙනී ගියේ ය. ඉක්බිති උන්වහන්සේ සහම්පති බ්‍රහ්මයා අමතා මෙසේ වදාළ හ.

"ඔවුනට අමෘතයෙහි දොර විවර කරන ලදී. කන් ඇත්තෝ ශ්‍රද්ධාව පෙරදැරි කරත්වා! බ්‍රහ්මය, වෙහෙස නිෂ්ඵල වෙති යි. මම දෙවි මිනිසුනට මෙම සද්ධර්මය දේශනා නො කර සිටියෙමි." ධර්මයෙහි උදාව සිදු වූයේ මෙසේ ය.



*නුවණැත්තා මොහොතකුදු පණ්ඩිතයෙකු සෙවුණේ වේද දහම වහා දැනගන්නේ ය.*

65. මුහුත්තමපි චෙ විඤ්ඤූ
පණ්ඩිතං පයිරුපාසති
ඛිප්පං ධම්මං විජානාති
ජිව්හා සූපරසං යථා (5:6)

මොහොතක් හෝ නුවණැත්තෙක්
කළ හොත් පඬිවර ඇසුරක්
සැණකින් දැන ගනියි දහම
සූප රසය ලෙස දිව’ගින්

# උගනිමු සදහම් - ඇසුරෙන් වියතුන්

## 5 (6) පාඨෙය්‍යක තිස් නම ගේ කතාව (65 වන ගාථාව)

**පාඨෙය්‍යක භික්ෂූන්** තිස් නම ඇරඹ මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ ජේතවනාරාමයේ වැඩ විසූ සමයේ ය.

පාඨෙය්‍යක ප්‍රදේශයේ තරුණයෝ තිස් දෙනෙක් වරක් විනෝද චාරිකාවක් සඳහා වනාන්තරයකට ගිය හ. එයින් විසිනම දෙනෙක් තම භාර්යාවන් ද සමග පැමිණ සිටියහ. අවිවාහක තැනැත්තා වෙසඟනක් කැඳවා ගෙන පැමිණ තිබිණ. ඔවුන් කා බී විනෝදයෙන් හැසිරෙත් දී කාගේත් අවධානය ඉවත යොමු වූ මොහොතක් බලා වෙසඟන ඔවුන් ගේ වටිනා ආභරණ ආදිය සොරා ගෙන පලා ගියා ය.

වනය පීරමින් වෙසඟන සොයා යන ඔවුනට තුරු මුලක බවුන් වඩමින් සිටි බුදුරදුන් දක්නට ලැබිණ. උන්වහන්සේ වෙත පැමිණි ඔවුහු "සමිඳුනි, මේ දෙසට කාන්තාවක් යනු දුටු සේක් ද?" යි ප්‍රශ්න කළ හ. "කාන්තාවක් සොයා යනවාට වඩා තමන් සොයා ගත්තොත් නරක ද?" යි බුදුහු ප්‍රශ්න කළ හ. තමන් සොයා ගැනීම වඩා වැදගත් බව ඔවුන් පිළිගත් හෙයින් තථාගතයන් වහන්සේ ඔවුනට ධර්ම දේශනා කළ හ. දහමෙහි පහන් වූ ඔවුහු ඊහි භික්ෂු භාවයෙන් පැවිදි වූ හ.

පසු දිනෙක බුදුන් දක්නට ආ තිස් නම අනමතග්ග සූත්‍ර දේශනාව අසා රහත්ඵලය ලද හ. මේ භික්ෂු තිස් නම ඉතා ඉක්මනින් උසස් අධිගම ලත් අයුරු විස්මය ජනකයැයි භික්ෂූන් වහන්සේලා අතර කතා බහ ඇති විය. ඒ සැලවූ විට භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, මේ ඔවුන් ඉක්මන් ප්‍රතිඵල ලද ප්‍රථම වතාව නො වෙයි. ඉකුත් ජන්මයකත් ඔවුහු සුරා පානය කර කා බී විනෝද වෙමින් සිටියදී කුණ්ඩිල විසින් දෙසූ අවවාද අසා දුසිරිත් හැර යහගුණ වැඩූහ"යි කුණ්ඩිල ජාතකය දේශනා කර වදාළ හ. අනතුරුව උන්වහන්සේ මේ ගාථාව ද දේශනා කළ හ.

### විවරණාත්මක අනුවාදය (65 ගාථාව)

**චෙ විඤ්ඤූ මුහුත්තං අපි පණ්ඩිතං පයිරුපාසති ඛිප්පං ධම්මං විජානාති යථා ජිව්හා සූපරසං**

**චෙ**: ඉදින්; **විඤ්ඤූ**: නුවණැත්තා; **මුහුත්තං අපි**: මොහොතක් වුව; **පණ්ඩිතං පයිරුපාසති**: පණ්ඩිතයකු සේවනය කරයි නම්; **ඛිප්පං**: ඉක්මණින් ම; **ධම්මං**: ධර්මය; **විජානාති**: අවබෝධ කර ගනියි; **යථා**: යම් සේ; **ජිව්හා**: දිව; **සූපරසං**: සූපයන්හි රසය (දැනගනී ද එපරිද්දෙන්ම ය).

නුවණැත්තාට එක් මොහොතක් පණ්ඩිතයකු ආශ්‍රය කරන්නට ලැබුණහොත්, ඉතා ඉක්මණින් ම හේ ධර්මය අවබෝධ කර ගනියි. දිව ඉතා ඉක්මණින් සූපයන් හි රසය තේරුම් ගන්නාක් මෙනි.

### විවරණය

**ජිව්හා සූපරසං යථා**: පෙර ගාථාවෙහි දැක්වූ ආහාර රස දැන ගැනීමේ උපමාවෙහි තේමාව ම මේ ගාථාවට ද අදාළව ඇත. හැන්ද දිනපතාම සූප පිසීමේ දී හා බෙදීමේදී භාවිත කළ ද එය සූප රසය ආස්වාදනය කිරීමෙහි ලා සමත් නො වෙයි. එහෙත් දිව සංවේදී බවින් තියුණු හෙයින් සූපයක් යන්තම් දිව ගැටුණු වහාම එය එහි රසය දැන ගනියි. නැණවතා ද දිවක් වැනිය. මොහොතින් ධර්මය තේරුම් ගනියි. එහෙත් ඇතැම් අනුවණයෝ හැඳි වැනි වෙති. දිවි හිමියෙන් නැණවතුන් ඇසුරු කළ ද ඔවුහු ධර්මය තේරුම් නො ගනිති.

**විඤ්ඤූ**: යම් යම් දේ විශේෂයෙන් තේරුම් ගැනීමේ ස්වභාවය ඇති තැනැත්තා විඤ්ඤූ නම් වෙයි. ''**විසේසං ජානාති සීලෙනාති විඤ්ඤූ**'' යනුවෙන් අටුවාචාර්යවරු මෙය දක්වති. බුද්ධියෙන් උසස් (උසස් බුද්ධි ඵලයක් ඇති) තැනැත්තා ලෙස වර්තමාන අර්ථයෙන් දැක්විය හැක. මෙම සියුම් අවබෝධන ශක්තිය නැති, වහා කරුණු වටහා ගන්නට අසමත් අය බුද්ධි හීනයෝ ය.

බුද්ධිමත් පුරුෂ තෙම මොහොතක් නමුත් ප්‍රඥාව ඇති තැනැත්තෙකු සේවනය කළ හොත් උගත යුත්ත ඉගෙන, ඇසිය යුත්ත අසා, වහා ම ධර්මය ඉගෙන ගනියි. ඉන්පසු කමටහන් වඩා වෑයම් කර උසස් ආධ්‍යාත්මික සුවය ලබයි. එම අවබෝධන කෞශල්‍යයෙහි තීක්ෂ්ණත්වය 'ජිව්හා සූපරසං යථා' යන උපමාවෙන් ප්‍රබල ලෙස සටහන් වෙයි.





*අනුවණයෝ පව්කම් කරමින් තමාට සතුරෙකු වැනි වූ අත් බැවින් යුතු වැ හැසිරෙත්.*

66. චරන්ති බාලා දුම්මෙධා
අමිත්තෙනෙ'ව අත්තනා
කරොන්තා පාපකං කම්මං
යං හෝති කටුකප්ඵලං (5:7)

සරති අනුවණ දනෝ හැම තැන
තමන්ට ම සතුරුකම් කරමින
කරති පවුකම් නොයෙක් අයුරින
කටුක ප්‍රතිඵල ලැබෙයි නිසැකින

# සතුරුය තමන්ට ම පවුකම් කරන්නා

## 5 (7) සුප්‍රබුද්ධ කුෂ්ඨ රෝගියා ගේ කථාව (66 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් **සුප්‍රබුද්ධ** නම් කුෂ්ට රෝගියා අරබයා මේ ගාථාව දේශනා කර වදාළ හ.

එකල රජගහනුවර සුප්‍රබුද්ධ නම් කුෂ්ඨ රෝගියෙක් වාසය කළේ ය. දිනක් හේ භාග්‍යවතුන් වහන්සේ ගෙන් දහම් අසනු කැමතිව වේළුවනාරාමයට ගියේ ය. එහෙත් තමා කුෂ්ට රෝගියකු හෙයින් අන් අයට කරදරයක් වෙතියි සිතූ හෙතෙම පිරිස් මැදට නොගොස් කෙළවරකට වී ධර්ම ශ්‍රවණය කළේ ය. මහත් ශ්‍රද්ධාවෙන් බණ ඇසූ හේ ධර්මානුශාසනාව අවසානයෙහි සෝවාන් ඵලය ලැබීය. එයින් මහත් සොම්නසට පත් ඔහුට තමා ලද අධිගමය භාග්‍යවතුන් වහන්සේට සැල කරන්නට බලවත් ආශාවක් ඇති විය. එහෙත් කුෂ්ට රෝගයෙන් පෙළෙන හෙයින් පිරිස මැදට යන්නට මැලි වූ හේ සියලු දෙනා පිටත්ව යන තුරු පසෙකට වී සිටියේ ය.

සියලු දෙනා බැහැරව ඉඩකඩ සැලසුණු පසු හෙතෙම ආරාමය තුළට යන්නට සූදානම් විය. ඒ මොහොතේ ඔහු පරීක්ෂා කරන්නට සිතූ ශක්‍ර දේවේන්ද්‍ර තෙම අහසෙහි සිට සුප්‍රබුද්ධ අමතා මෙසේ පැවසී ය. "සුප්‍රබුද්ධ, මේ අහන්න. ඔබ දුප්පත් ය. අසරණ ය. මම ඔබට මහත් සම්පත් දෙමි. මට ඔබ එක් කාරියක් කරන්න. 'බුදුහු බුදුහු නො වෙති. ධර්මය ධර්මය නො වේ. සංඝයා සංඝයා නො වේ' යි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්න. මට බුදුන්, ධර්මය, සංඝයා තිත්තයි කියා ඔබ ප්‍රසිද්ධියේ කිවහොත් මම අසීමිත සම්පත් ලබා දෙමි" ඒ ඇසූ සුප්‍රබුද්ධ "මට මේ යෝජනා කරන ඔබ කවුද?" යි විමසී ය.

ශක්‍රයා ද "මම ශක්‍ර දේවේන්ද්‍ර වෙමි" යි පැවසී ය. සුප්‍රබුද්ධ ඒ අසා "ඔබ නම් ලජ්ජා නැති කෙනෙකි. මට කතා කරන්නට ඔබ සුදුස්සෙක් නො වේ. මා දිළින්දෙක් අසරණයෙක් කොට ඔබ කතා කරයි. මම දිළිඳු අසරණයෙක් නො වෙමි. මම සෝතාපන්න උපාසකයෙක් වෙමි. මා සතුව සප්තාර්‍ය ධනය තිබේ. එබඳු ධනයක් ඇත්තෙකුට බුද්ධාදී උත්තමයෝ දරිද්‍ර යැයි නො කියති.

මට මෙවැනි පහත් යෝජනා නො කරව" යි ශක්‍රයාට නිග්‍රහ කළේ ය. ඒ අසා සිටි ශක්‍රයා භාග්‍යවතුන් වහන්සේ හමු වීමට ගොස් පූර්ණ සංවාදය ම උන්වහන්සේට සැලකර සිටියේ ය. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "එක් ශක්‍රයකුට තබා ශක්‍රයන් දහසකටවත් සුප්‍රබුද්ධ ලවා එවැන්නක් කියවා ගත නො හැක. මොනම සම්පතක් ලදුවත් බුදුහු බුදුහු නො වෙති, ධර්මය ධර්මය නො වේ, සංඝයා සංඝයා නො වේ, මට බුදුන්, ධර්මය හා සංඝයා තිත්තය යි ඔහු ගේ මුවින් නො කියැවෙනු ඇත." යි
වදාළ හ.

සුප්‍රබුද්ධ භාග්‍යවතුන් වහන්සේ දකින්නට ගොස් වැඳ නමස්කාර කොට සියල්ල දන්වා සිටියේ ය. එසේ දන්වා ඔහු පිටත්ව ගොස් වැඩිදුර යන්නට නො ලැබිණ. තරුණ ගවදෙනක විසින් අනිනු ලැබ හේ මිය ගියේ ය. එය පැරණි කර්මයක් විපාක දීමක් වූයේ ය.

### විවරණාත්මක අනුවාදය (66 ගාථාව)

**බාලා දුම්මේධා යං කටුකප්ඵලං හොති (තං) පාපකං කම්මං කරොන්තා අත්තනා අමිත්තෙන ඉව චරන්ති**

**බාලා**: නො මේරූ නුවණැති; **දුම්මේධා**: අඥාන ජනයෝ; **යං කටුකප්ඵලං හොති**: යමක් කටුක විපාකදායක නම් එබඳු; **පාපකං කම්මං**: පාප ක්‍රියා; **කරොන්තා**: කරමින්; **අත්තනා**: තමා ගේ; **අමිත්තෙන ඉව**: සතුරකු මෙන්; **චරන්ති**: හැසිරෙ ති.

නුවණ මඳ බාලයෝ කටුක විපාකදායක පාප කර්ම කරමින් තමා තමාගේම සතුරන් බවට පත්ව ජීවත් වෙති.

### විවරණය

**බාලා දුම්මේධා**: නුවණ මඳ බාල ජනයා. බාල හා දුම්මේධ යන වචන දෙකේ ම අරුත සමාන ය. මේධා යන්න කඳු මුදුනකට වන් හෙණ පහරක් මෙන් ලෝභ ද්වේෂා දී වූ සියලු කෙළෙස් වනසන බව හඟවයි. එම මේධා හෙවත් විචක්ෂණ ඥානය නැති අය දුම්මේධා ලෙස හැඳින්වේ.





*කඳුලු පිරුණු මුහුණු ඇතිව දුක් විඳී. පසුතැවිලි වීමට සිදුවන පව්කම් නො කිරීම යහපති.*

67. න තං කම්මං කතං සාධු
යං කත්වා අනුතප්පති
යස්ස අස්සුමුඛො රොදං
විපාකං පටිසෙවති (5:8)

කර තැවෙන්නට වන යමක්
එය නො කළ යුතු පව් කමක්
කඳුළු වැකි මුහුණින් විපාකය
විඳින්නට සිදුවන දෙයක්

# දුක් දෙයි නම් - හළ යුතු කම්

## 5 (8) ගොවියකු ගැන පුවතක්. (67 වන ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ එක්තරා **ගොවියකුට** සිදු වූ විපතක් ඇරබ මේ ගාථාව දේශනා කළ සේක.

සැවැත් නුවර සමීපයෙහි ගොවියෙක් කුඹුරක් සාමින් සිටියේ ය. කලින් දින රැයෙහි ධනවතකු ගේ ගෙයක් බිඳි සොරුන් ඒ කුඹුර අසලින් යමින් සිටිය දී මුදල් පොදියක් එක් සොරකු විසින් අන් අයට හොරෙන් සඟවා ගෙන යද්දී ඇඳුම් අතුරින් ලිස්සා ගොස් බිම වැටී තිබිණි.

පසුදින හිමිදිරියේ ම ගොවියා පැමිණ වැඩ පටන් ගත් අතර භාග්‍යවතුන් වහන්සේ ද ඒ අසලින් ගමන් කරමින් සිටිය හ. උන්වහන්සේ ගේ නෙතට බිම වැටී තිබුණු මුදල් පොදිය ලක්විණි. අනඳ හිමියෝ ද භාග්‍යවතුන් වහන්සේ සමග සිටිය හ. භාග්‍යවතුන් වහන්සේ කුඹුර අසලින් වැඩම කරනු දුටු ගොවියා වහාම අවුත් බුදුරජාණන් වහන්සේට වැඳ නමස්කාර කළේ ය.

ඔහු මේ මුදල් පොදිය නිසා අමාරුවේ වැටෙන්නට යන බවත් තමන් වහන්සේට ඔහුට පිහිට වීමේ හැකියාව ඇති බවත් උදෑසනම මහා කරුණාවෙන් දුටු උන්වහන්සේ මෙහි වැඩම කළේ ද ඔහුට පිහිට වීම සඳහා ය. එහෙයින් ගොවියාට යමක් නො කියා ඔහුට ඇසෙන පරිදි උන්වහන්සේ ආනන්ද හිමියන් අමතා "විසකුරු සර්පයා දැක්කා ද, ආනන්ද?" යි පැවසූ හ. අනඳ හිමියෝ ද මුදල් පසුම්බිය දෙස බලා "එහෙමයි ස්වාමීනි. බොහොම භයානක සර්පයෙක්" යි පැවසූ හ.

බුදු සමිඳුන් හා අනඳ හිමියන් නික්ම ගිය පසු මම ඒ විසකුරු සර්පයා මරමි යි සිතා ගත් ගොවියා එතැනට ගියේ ය. සර්පයකු වෙනුවට ඔහු දුටුවේ මුදල් පොදියකි. කුමක් කළ යුතු දැයි සිතා ගන්නට අසමත් වූ හෙතෙම එය පස් යට සඟවා ගොස් වැඩ පටන් ගත්තේ ය.

මේ අතර ගම් වැස්සෝ ගෙය බිඳි සොරුන් සොයා ඒ මේ අත යන්නෝ කුඹුර අසලට පැමිණ අලුත් පසින් වසා තිබුණු මුදල් පොදිය සොයා ගත් හ. එතැන් සිට කුඹුරට යොමුව තිබූ පා සටහන් අනුව ගොවියා රැයෙහි සොරකම් කොට දහවල් කුඹුරේ වැඩ කරතියි සිතා ඔහු අල්ලා තළා පෙළා රාජ පුරුෂයන්ට භාර කළ හ. ඔහු මහ රජතුමා වෙත පමුණුවන ලදින් මරණ දඬුවම නියම කරන ලදී.

රාජ පුරුෂයෝ ඔහු වධකස්ථානය කරා කස පහර දෙමින් ඇද ගෙන ගිය හ. හේ දිගටම "ආනන්ද, විසකුරු සර්පයා දැක්කා ද? එහෙමයි ස්වාමීනි, බොහෝම භයානක සර්පයෙක්" යන්න කියමින් ගියේ ය. දිගින් දිගට ම මොහු මේ කියවන්නේ බුදු රදුන් හා අනඳ හිමියන් අතර වූ සංවාදයක් බව තේරුම් ගත් රාජ පුරුෂයෝ "ඔබ මේ කියවන දෙයෙහි අර්ථය කුමක් ද?"යි විමසූ හ. "මා මහරජු හමුවට පැමිණ වුවහොත් කියන්නෙමි" යි ගොවියා පැවසූයෙන් රාජ පුරුෂයෝ නැවත ඔහු මහරජු හමුවට පැමිණ වූ හ. එහිදී හෙතෙම "දේවයන් වහන්ස, මම සොරෙක් නො වෙමි. එදා උදේ මා ඔය මුදල් පොදිය දුටු වේලේ භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමියන් සමග එතැන සිටිය හ. උන්වහන්සේලා දෙනම අතර වූ සංවාදය නිසා ම මම එය දුටුවෙමි. ඒ සංවාදය මට හොඳින් මතක සිටියේ ය. මම එය නැවත නැවත කියමින් මරණයට පිය නැගීමි" යි සැල කර සිටියේ ය.

"එසේ නම් නුඹ බුදුරදුන් සාක්ෂ්‍යය වශයෙන් දක්වතියි සිතමි" යි පැවසූ රජ තෙම ඔහුත් සමඟ ම භාග්‍යවතුන් වහන්සේ හමුවට පැමිණියේය. "මහරජ, මොහු කියන බස සැබෑ ය. මම මොහුට වන විපත දැක එහි වැඩම කළෙමි." යි කරුනු පැහැදිලි කර දුන් බුදු පියාණෝ "යමෙකු කළ යුත්තේ පසුව තැවෙන්නට සිදුවන දේ නො වේ. කඳුළු සලමින් විපාක විඳින්නට වන ක්‍රියා නො කිරීම යහපත්ය'' යි වදාරමින් මේ ගාථාව දේශනා කළ හ.

**විවරණාත්මක අනුවාදය (67 ගාථාව)**

**යං කත්වා අනුතප්පති, යස්ස විපාකං අස්සුමුඛො රොදං පටිසෙවති තං කම්මං න කතං සාධු**

**යං**: යම් කිසි ක්‍රියාවක්; **කත්වා**: කොට; **අනුතප්පති**: පසු තැවෙන්නට සිදුවේ ද; **යස්ස**: යම් කිසි කර්‍මයක; **විපාකං**: විපාකය; **අස්සුමුඛො**: කඳුලු වැකි මුහුණින් යුතුව; **රොදං**: හඬමින්; **පටිසෙවති**: විඳින්නට වේද; **තං කම්මං**: ඒ ක්‍රියාව; **න කතං**: නො කළ හොත්; **සාධු**: මැනවි.

යමක් කළ පසු පසුතැවෙන්නට සිදු වේ නම්, එහි විපාකය විඳින්නට වන්නේ කඳුලු පෙරමින් හඬා වැලපෙමින් නම්, එබඳු දේ නො කර සිටීම යහපත් ය.

**විවරණය**

**අස්සුමුඛො රොදං**: ඇසෙහි කඳුලු පුරවා ගෙන විපාක විඳින්නට වන්නේ නරක ක්‍රියාවල ය. එය කල් ඇතිව ම තේරුම් ගෙන එබඳු ක්‍රියා නො කර සිටින්නේ නම් යෙහෙකි.

**අනුතප්පති**: තැවෙයි, පසුතැවෙයි. ඇතැම් ක්‍රියා කළ විට මුලින් සිත් තැවුලක් ඇති නො වුව ද පසුව තමන් කළ දෙයෙහි බරපතල කම තේරුම් ගෙන තැවෙන්නට සිදු වෙයි.





*සොම්නස වැඩෙන දෙයක් කිරීම සැපයට හේතුවන බැවින් එය ඉතා යහපත් වන්නේ ය.*

68. තඤ්ච කම්මං කතං සාධු
යං කත්වා නානුතප්පති
යස්ස පතීතො සුමනො
විපාකං පටිසෙවති (5:9)

කළ පසුව නො තැවෙන යමක්
වෙතොත් එය කළ යුතු දෙයක්
ප්‍රීතියෙන් සතුටින් විපාකය
විඳින්නට හැකි පින්කමක්

# කළොත් හොඳ දේවල් - වේය දෙලොවම යහපත්

## 5 (9) සුමන මාලාකාරයා ගේ කථාව (68 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි **සුමන** නම් වූ මල්කරුවකු ඇරබ මේ ගාථාව දේශනා කළ සේක.

සුමන විසින් දිනපතා උදෑසනින් බිම්බිසාර රජතුමාට සමන් පිච්ච මල් සැපයිය යුතුව තිබිණි. දිනක් උදෑසන මල් ද රැගෙන රජවාසලට යන අතරතුර ඔහුට භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවක සංඝයා පිරිවරා බුදුරැසින් බබළමින් මහ මග වඩනා අසිරිය දක්නට ලැබිණ. බුදුරදුන් ගේ රූසිරි හා බුද්ධානුභාව දුටු මල්කරුට පුදන්නට වෙනත් දෙයක් නො තිබුණෙන් රජුට ගෙන යන මල් පුදන්නට සිතක් පහළ විය. රජුට මල් නැති වුවහොත් තමන්ට දරුණු දඬුවම් ලැබෙන බව දැන දැනත් පහළ වූ සැදැහැ සිත නිසා මා රටින් පළවා හැරියත්, මරා දැමුවත් මේ පූජාව කරමියි සිතා බුදුරදුන් මත මල් වැස්සක් මෙන් මල් ඉස්සේ ය.

ඔහු ඉසින ඉසින මලින් බුදුරදුන් මත මල් වියනක් සේ ද උන් වහන්සේ ගේ හාත් පසින් තිරයේ ද ප්‍රාතිහාර්‍යමය විලාසයෙන් මල් රැඳුණෝ ය. භාග්‍යවතුන් වහන්සේ විදීයෙහි පෙරට යත් ම මල් වියන හා මල් තිර උන්වහන්සේ සමගම පෙරට යයි. සවනක් බුදු රැසින් වඩාත් ප්‍රභාමත් වූ මේ පුෂ්ප මණ්ඩපය දැක අත්‍යන්ත ප්‍රමෝදයට පත් වූ මල්කරු උන්වහන්සේ සමඟ සෑහෙන දුරක් ගමන් කොට සොම්නසින් ම නිවෙස බලා ගොස් බිරින්දෑට ද ඒ පුවත් සැළ කළේ ය.

ඔහු ගේ බිරිඳ දැන උගත් හෝ සැදැහැවත් කෙනෙක් නො වූවා ය. ඇය සිතුවේ ඔහු අනුවණ ක්‍රියාවක් කර ඇති බව ය. රාජ උදහස ඔහු වෙත යොමු වෙතියි සිතූ ඕ, එයින් තමන්ට ද මහත් ව්‍යසනයක් වෙතියි සිතා බියපත්ව රජතුමා හමුවට ගොස් සැමියා කළ අනුවණකමට තමා ගේ සහයෝගයක් නැති බව පවසා තමා ඔහුගෙන් වෙන්ව යන බව දැනුම් දුන්නා ය.

සෝවාන්ව සිටි සැදැහැවතකු වූ බිම්බිසාර රජතුමා එපවත් අසා තොරතුරු විමසා බලා මහත් සොම්නසට පත්ව වහාම බුදුරදුන් මාලිගයට වැඩම කරවා මහ දන් පැවැත්වී ය. ප්‍රාතිහාර්‍යය ගැන සැලව දහස් ගණන් ජනයා රැස්ව සිටි අතර ඔවුහු ජේතවනාරාමය දක්වා බුදුරදුනට පසු ගමන් ද කළ හ. අනතුරුව මල්කරු ගෙන්වූ රජතෙම "බුදුරදුනට මල් පූජා කරද්දී ඔබට සිතුණේ කුමක් ද?"යි ප්‍රශ්න කළේ ය. "දේවයන් වහන්ස, මම මගේ ජීවිතය බුදුරදුනට පුද කළෙමි.

ඔබ වහන්සේ මා රටින් නෙරපන්නට හෝ වධ දී මරන්නට පිළිවන. එසේ කළේ වුව ද කම් නැතැයි සිතුවෙමි"යි මල්කරු පැවසී ය. ඒ ඇසූ බිම්බිසාර රජ තෙම "ඔබ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙකි. ඔබේ ක්‍රියාව මහා පරිත්‍යාගයකි" යි සුමන ගේ ක්‍රියාව අගය කරමින් ඔහුට ඇතුන් අටදෙනෙක්, අසුන් අටදෙනෙක්, සේවකයන් අටදෙනෙක්, සේවිකාවන් අටදෙනෙක්, අනර්ඝ මාණික්‍ය අටක්, මුදලින් කහවණු අට දහසක්, රාජකීය අන්තඃපුරයෙන් සර්වාභරණ විභූෂිත රාජ කන්‍යාවන් අට දෙනෙක් සහ සශ්‍රීක ගම්වර අටක් ද පරිත්‍යාග කළේ ය. මේ අටේ තෑගි අටක් දෙන ලද්දේ මල්කරු මල් අට මිටක් පිදූ හෙයිනි.

සන්ධ්‍යා භාගයෙහි, අනඳ මහ තෙරුහු "මුළු දවස පුරාම රජගහ නුවර සැණකෙළි සිරි ගත්තේ ය. මේ මහෝත්සවයට නිමිති වූ සුමන මල්කරුවාට අත්වන ආනිශංසය කවර විදියේ එකක්දැ"යි බුදුරජාණන් වහන්සේ ගෙන් විමසූ හ. "ආනන්ද, සුමන තම ජීවිතය මා හමුවේ පූජා කළේ ය. තම කුශල කර්මයෙහි විපාක ඔහු සොම්නසින් විඳිනු ඇත. දෙව් මිනිස් දෙගතියෙහි සැප සම්පත් විඳ කෙළවර හෙතෙම සුමන නමින් ම පසේ බුදුවරයෙක් ව අමා මහ නිවන් සුව ලබන්නේ යැ"යි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

**විවරණාත්මක අනුවාදය (68 ගාථාව)**

**යං කත්වා න අනුතප්පති යස්ස විපාකං පතීතො**
**සුමනො පටිසේවති තඤ්ච කම්මං කතං සාධු.**

**යං**ඃ යම්කිසි ක්‍රියාවක්; **කත්වා**ඃ කොට; **න අනුතප්පති**ඃ පසු තැවීමක් නොවන්නේ ද; **යස්ස**ඃ යම් කර්මයක; **විපාකං**ඃ විපාකය; **පතිතො**ඃ ප්‍රීතිමත්ව; **සුමනො**ඃ සොම්නසින්; **පටිසේවති**ඃ ලබන්නේ ද; **තඤ්ච කම්මං**ඃ එවන් වූ ක්‍රියාව; **කතං**ඃ කිරීම; **සාධු**ඃ මැනවි.

යම්කිසි ක්‍රියාවක් කළ පසු පසුතැවෙන්නේ නැතිව ප්‍රීතියෙන් සොම්නසින් විපාකය විඳගන්නට ලැබෙන්නේ නම්, එබඳු කර්ම කිරීම යහපත් ය.

**විවරණය**

**පතීතො සුමනො**ඃ යන්නෙන් ප්‍රීතිය හැඟවෙයි. සිත ප්‍රීතියෙන් පිරුණු පුද්ගලයාට 'පතීතො' යි කිව හැක. 'සුමනො' නම් සොම්නස් සිත ඇති වීමයි. මේ පද දෙකින් හඟවෙන්නේ පුණ්‍ය කර්ම කරන පුද්ගලයාට එහි අනුසස් භුක්ති විඳින විට උත්කර්ෂවත් ප්‍රීති වේගයත්, සෝමනස්සයක් ඇති වන බව ය. සියළු දෙනා විසින් කළ යුත්තේ එබඳු ක්‍රියා ය.





*අකුසලය යම්තාක් කල් විපාක නොදේද ඒතාක් කල් බාලයා එය මිහිරි කොට සිතන්නේ ය.*

69. මධු'ව මඤ්ඤති බාලො
යාව පාපං න පච්චති
යදා ච පච්චතී පාපං
අථ බාලො දුක්ඛං නිගච්ඡති (5:10)

පවු මෝරා යන තුරු මත්
මිහිරිය මී පැණිසේ සිතත්
මේරූ දා අඳ බල සත්
විඳිති නිරා දුක් බලවත්

# කළෝතින් පාපය - අමිහිරි වෙයි විපාකය

## 5 (10) උප්පලවණ්ණා භික්ෂුණිය ගේ කථා වස්තුව (69 ගාථාව)

**උප්පලවණ්ණා** භික්ෂුණිය නිමිති කොට වදාළ මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ විසින් ජේතවනාරාමයෙහි දී දේශනා කරන ලද්දේ ය.

සැවැත් නුවර එක් ධනවත් සිටුවරයකුට ප්‍රියංකර දියණියක් වූවා ය. ඇය නිල් මානෙල් මලක් මෙන් සුන්දර වූ හෙයින් 'උප්පලවණ්ණා' යි නම් කරන ලදී. ඇය ගේ රූප සෞන්දර්‍ය්‍යය පිළිබඳ රට පුරා පැතිර ගියෙන් රජ කුමාරවරු, සිටු කුමාරවරු හා විවිධ ධනවත් ප්‍රභූ තරුණයෝ ඇය අත පතා ආහ. මෙය සිටුතුමාට මහත් ගැටළුවක් වූයෙන් දිනක් හෙතෙම සිය දියණිය සමග ඒ පිළිබඳව සාකච්ඡා කළේ ය.

"දියණියෙනි, මේ තරම් විශාල පිරිසක් ඔබේ අත පතද්දී, එක් අයකු තෝරා ගැනීම අපට මහත් ගැටලුවකි. මේ ගැටලුවෙන් කෙසේ මිදෙමු දැ"යි හේ ඇය ගෙන් පිළිතුරක් අපේක්ෂා කරමින් විමසී ය. සාකච්ඡාව අවසන පින් මෝරා ගිය කුමරියක් වූ උප්පලවණ්ණා හා ඇය ගේ පියා එකඟත්වයට ආ හ. ඔවුන් දෙදෙනාගේම තීරණය වූයේ උප්පලවණ්ණා පැවිදි ජීවිතයට ඇතුළත් විය යුතු බවයි.

පැවිදි වූ අළුතම උපෝසථාගාරයෙහි වතාවතට ගිය උප්පලවණ්ණා, එය ඇමද පහන් දල්වා පහන් දැල්ල දෙස බලා සිටියා ය. එය දෙස එක දිගට බලා සිටින ඇය කසිණ භාවනාවට යොමු වී තෙජෝකසිණ භාවනාවෙන්ම සිවු පිළිසිඹියා පත් රහත් මෙහෙණියක වූවා ය.

දනවු සැරිසරමින් සත්හට සෙත් වඩමින් කල් යැවූ උප්පලවණ්ණා භික්ෂුණිය වරක් අඹවනයෙහි කුටියක් තනවා ගෙන විවේක සුවයෙන් විසුවා ය. ගිහි කල ඇය ගේ රූපශෝභාවෙන් මත්ව කාමාශක්තව සිටි ඇය ගේ මාමා කෙනෙකු ගේ පුත්‍රයා වූ නන්ද නම් තරුණයෙක් එතුමිය පිඩු සිගා ගිය අතර කුටියට වැදී, ඇඳ යට සැඟවී සිට ඇය පැමිණ ඇඳෙහි වැතිර ගත් වහා ම එළියට අවුත් බලහත්කාරකම් කළේ ය. ඔහු ඇඳෙන් බිමට බැස යන්නට සැරසෙත් ම මිහිකත පලාගෙන ඔහු අවීචි මහා නරකාදියට ගිය බව වාර්තා වෙයි.

භික්ෂුණිය තමන්ට වූ ව්‍යසනය අන්‍ය භික්ෂුණියන්ට පැවසුවා ය. භික්ෂුණියන්ගෙන් එපවත් ඇසූ භික්ෂූහු ඒ බව භාග්‍යවතුන් වහන්සේට දැනුම් දුන් හ. ඒ නිමිති කර ගෙන භික්ෂූන් ඇමතූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, ගිහි හෝ වේවා පැවිදි හෝ වේවා, ස්ත්‍රී වේවා පුරුෂ වේවා, කවර හෝ අයකු පාප කර්මයක් කරන විට එය මී පැණි මෙන් මධුරව ඔහුට වැටහෙනු ඇත. එහෙත්, විපාක විඳින විට ඔවුන් දැඩි දුක් විඳිනු ඇත" යි ප්‍රකාශ කළ හ.

උප්පලවණ්ණා භික්ෂුණිය නන්ද ගේ බලහත්කාරකම හේතු කොට ගෙන කාමාස්වාදයක් ලැබීදැයි විමතියක් ඇති වූයෙන් එය විසඳනු පිණිස භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, රහත්හු කම් සැප නො ඉවසති. කාම සේවනය නො කරති. පියුම් පතෙක වැටුණු දිය බිඳ එහි නො ඇලෙන පරිද්දෙන් ඉදිකටු තුඩක අබ ඇටයක් නො රඳන පරිද්දෙන් රහතන් වහන්සේ ගේ සිතෙහි ද කාමය නො රැඳෙයි."යි වදාළ සේක.

**විවරණාත්මක අනුවාදය (69 ගාථාව)**

**පාපං යාව න පච්චති බාලො මධූ ඉව මඤ්ඤති යදා ච**
**පාපං පච්චති අථ බාලො දුක්ඛං නිගච්ඡති**

**පාපං**: පව් කම; **යාව**: යම්තාක්; **න පච්චති**: නො පැසේද (ඒ තාක්); **බාලො**: අඥාන තෙමේ; **මධූ ඉව**: මී මෙන් (මිහිරි කොට); **මඤ්ඤති**: හඟියි; **යදා ච**: යම් කලෙක වනාහි; **පාපං**: පව් කම; **පච්චති**: පැසේද; **අථ**: එකල්හි **බාලො**: අඥාන තෙමේ; **දුක්ඛං**: දුකට; **නිගච්ඡති**: පැමිණෙයි.

අඥාන තෙමේ තමා කළ පාපය විපාක දෙන තුරු එය මිහිරි රසක් මෙන් සිතයි. එසේ වුව ද තමා කළ පාපකර්මය විපාක දෙන විට හෙතෙම දුකට පත් වන්නේ ය.

**විවරණය**

**පාපං**: පාපය, අකුසල චර්‍ය්‍යාව, පාප ශබ්දය ද බෞද්ධ සාහිත්‍යයෙහි යෙදෙයි.

සියලු සචේතනික අකුසල ක්‍රියා හේතුවෙන් පාපය ජනිත වෙයි. පාප ක්‍රියාවන්ට පසුබිම් වන්නේ රාගය, ද්වේෂය හා මෝහයයි. මෝහය හේතුවෙන් තම ක්‍රියාවෙහි පවත්නා නින්දිත දුරාචාරී ස්වභාවය තේරුම් නො ගන්නා දුර්ජනයෝ තාවකාලික ආස්වාද මාත්‍රයම මී පැණිසේ මධුරව ගනිති.





*(මසකට වරක් අහර ගෙන) මිසදිටුගෙන සිටින්නා ධර්‍මය දත් රහතුන්ගෙන් සොළොසින් එකක් වත් නො වටී.*

70. මාසේ මාසේ කුසග්ගෙන
බාලො භුඤ්ජේථ භොජනං
න සො සඞ්ඛතධම්මානං
කලං අග්ඝති සොළසිං (5:11)

මාසයකට වරක් බැගින්
එක් කුස තණ පතක් අගින්
බුදිමින් සුළු පමණ බොජුන්
විසුවත් නැණ මඳ දුදනන්
සදහම් දත් රහතුන් ගෙන්
නැත එක් අගයක් සොළසින්

# රහත් බවයි ඉතා අගේ

## 5 (11) ජම්බුක හිමියන් ගේ විත්තිය (70 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වාසය කරන සේක් **ජම්බුක නම් භික්‍ෂුනම** ගේ පෙර පැවැත්ම ඇරබ මේ ගාථාව වදාළ සේක.

සැවැත් නුවර ධනවත් ප්‍රභූවරයකු ගේ පවුලෙහි උපන් ජම්බුක කුඩා වියේ පටන් ම අරුම පුදුම ගතිගුණ විද්‍යමාන කළේ ය. ඇඳක නිදනු රිසි නො වූ හේ බිම නිදාගන්නට ප්‍රිය විය. බත් වෙනුවට තමන් ගේ ම අසූචි අනුභවයට රුචි කළේ ය. වැඩි වයසට පත් වුව ද මේ අප්‍රසන්න පුරුදු අත්හැර ගන්නට ඔහු අසමත් වූයෙන් දෙමාපියන්ට එය මහත් ගැටලුවක් විය. ඔහු නිවසේ තබා ගන්නට බැරි තරම් මේ  චර්‍යාව පිළිකුල් ජනක වූයෙන් ආජීවකයනට බාරදීමට ඔවුහු තීරණය කළ හ.

ආජීවක ආරාමයේදී ද ඔවුනට ලැබෙන ප්‍රණීත ආහාර ප්‍රතික්‍ෂේප කර අසූචි  අනුභව කර අසු වූ හෙයින් එතැනින් පළවා හරිනු ලැබූ ජම්බුක තනිව ම ගල්තලාවක වාසයට ගියේ ය. එහි ගල් තලාවකට  හේත්තු වී තනි පයින් සිට ගෙන මුව විවර කර ගෙන සිටි හේ "මම සුළං ආහාර කර ගෙන සිටිමි"යි. දිවා කල පවසා රාත්‍රියෙහි අසූචි  අනුභව කර කාටත් හොරෙන් බිම වැතිර නිදයි. නිදි නො ලබන නිරුවත් නිරාහාරී තවුසකු ලෙස ප්‍රසිද්ධ වූයෙන් ඔහුට වඳින පුදන දනෝ බොහෝ වූ හ. ප්‍රණීත ආහාර ගෙන ආවිට කුසතණ පතක අග අහරෙහි ගාවා දිව ගාන හේ එය තමන්ට මසකට ඇති බව පවසයි. මෙසේ පණස් පස් වසරක් හෙතෙම ජනතාව මුළා කර කීර්ති ප්‍රශංසා ආදිය ලබමින් කල් යැවීය. දනෝ ඔහුට 'ජම්බුක ආජීවක' වශයෙන් නම් කළ හ.

එක් දිනක් මහා කරුණාවෙන් ලොව බලන බුදුරදුන්ට ජම්බුක ආජීවකයන් රහත්වන්නට තරම් පින් මෝරා ඇති බව පෙනී ගියේ ය. ඒ අනුව එදින සන්ධ්‍යා භාගයෙහි ඔහු ගේ වාසස්ථානයට වැඩම කළ භාග්‍යවතුන් වහන්සේ ඔහු වසන ගල් පොත්තට ලඟම ගල්පොත්තක රාත්‍රි කාලය ගත කළ සේක. රැයෙහි ප්‍රථම යාමයේ දී චාතුම්මහාරාජික දේව රාජයෝ (හතරවරම් දෙවිවරු) භාග්‍යවතුන් වහන්සේ ගේ සත්කාර පිණිස ආහ. මධ්‍යම යාමයෙහි ශක්‍රදේවේන්ද්‍ර තෙම බුද්ධෝපස්ථානයට ආයේ ය. අලුයම් වේලෙහි පැමිණියේ මහා බ්‍රහ්මයා ය. ඒ අය පැමිණි හැම වතාවේ ම මහ වන රොද ඒකාලෝක වූයෙන් ජම්බුක ආජීවක තෙම විස්මයෙන් බලා ගියේ ය. උදෑසනින් ම බුදුරදුන් හමුවට ගොස් ඒ පැමිණියේ කවුරුන්දැයි අසා දැනගත්තේ ය.

"ඔබ වහන්සේ එසේ නම් ඉතා උත්තම කෙනකු විය යුතුයි. නැත්තම් සතර වරම් දෙවිවරු, ශක්‍රයා, මහා බ්‍රහ්මයා ඔබ වහන්සේ ගේ සේවයට පැමිණෙන්නේ නැහැ. මම මේ පණස්පස් වසරක් නිරුවත්ව, තනි පයින්, සුළං බුදිමින් තවුස් දම් රැකලත් ඔය එක් කෙනෙක්වත් තව ම මගේ සේවයට ආවේ නැහැ" යි ජම්බුක ප්‍රකාශ කළේ ය.

"ජම්බුක, මෝඩ ස්ත්‍රීන්, මෝඩ මිනිසුන් රවටනවා මෙන් මා රවටන්න බැහැ. ඔබ පණස් පස් වසරක් කළේ මොනවාදැයි මම දන්නවා. අසූචි කමින්, බිම නිදන ඔබ කරන දේ මම හොඳින් දන්නවා. ඔබ කළේ ජනතාව රැවටීමක් විතරයි" යි භාග්‍යවතුන් වහන්සේ ඔහු විපිළිසරට පත් කරමින් වදාළ හ ." ඔබට ඔය අප්‍රසන්න ජීවිතය ගත කරන්නට සිදු වුණේ පූර්වාත්මභාවයක කළ අකුසල කර්මයක විපාකය වශයෙන්"යි පැහැදිලි කළ භාග්‍යවතුන් වහන්සේ ඔහු පෙර ජන්මයක භික්‍ෂුවක් ව සිටියදී මහරහත් නමකට තම දායකයකු කළ සංග්‍රහ ඉවසිය නොහැකිව කළ නින්දා අපහාස නිසා මෙසේ ජීවත් වන්නට සිදු වූ බව පෙන්වා දුන් හ. ඒ අසා ලජ්ජාවට පත් වූ ජම්බුකට වස්ත්‍රයක් දුන් බුදුහු බණ කියා ඔහු රහත් බවට පත් කර පැවිදි කර ගත් හ.

උදෑසන පැමිනි ජම්බුක ගේ දායකයෝ බුදුරදුන් ජම්බුක ගේ ශ්‍රාවකත්වයට පත්ව ඇත් ද නැතහොත් ජම්බුක බුද්ධ ශ්‍රාවකත්වයට පත්ව ඇත්දැයි විමතියක් උපන්නෙන් බුදුරදුන් ගේ උපදෙසින් ප්‍රාතිහාර්‍යය පෑ ජම්බුක තමන් බුද්ධ ශ්‍රාවක බව ප්‍රසිද්ධියේ කියා පෑවේ ය. ජම්බුක මසකට වරක් කුසතණ අගින් බොජුන් ගන්නා බවක් පෙන්වමින් ගත කළ පණස්පස් වසරක කුහක ජීවිතය මේ රහත් වූ මොහොතින් සොළසින් අඩක් තරම් වත් නො වටිනා බව පැවසූ තථාගතයන් වහන්සේ මේ ගාථාව වදාළ සේක.

### විවරණාත්මක අනුවාදය (70 ගාථාව)

**බාලො මාසෙ මාසෙ කුසග්ගෙන භොජනං භුඤ්ජේථ**
**සො සඞ්ඛතධම්මානං සොළසිං කලං න අග්ඝති**

**බාලො**: අඥානයා; **මාසෙ මාසෙ**: මසකට එක් වරක් බැගින්; **කුසග්ගෙන**: කුස තණ පතක අගින්; **භොජනං**: ආහාර; **භුඤ්ජේථ**: අනුභව කරයි; **සො**: හෙතෙම; **සඞ්ඛතධම්මානං**: මහ රහතන් වහන්සේ ගේ; **සොළසිං කලං**: දහයෙන් පංගුවක්වත්; **න අග්ඝති**: අගේ නො වෙයි.

නුවණ නැති බාලයකු මසකට වරක් කුස තණ පතක අගින් ආහාර බිඳක් කමින් වාසය කළා වුව ද ඔහු රහතන් වහන්සේ නමක ගෙන් දහසයෙන් කොටසක් තරම් වත් නො වටියි.

### විවරණය

**කුසග්ගෙන භොජනං**: ඉතා සුළු ආහාර ප්‍රමාණයකින් තමාට යැපෙන්නට හැකි යයි දායකයාට හඟවනු පිණිස කළ එක් උපක්‍රමයකි. මේ කතාවෙහි දී දායකයන් රස බොජුන් දුන්විට ජම්බුක කළේ එයයි. එය දැඩි අත්තකිලමථානුයෝගයක් සේ බැලූ බැල්මට දිස් විය.

**සඞ්ඛත ධම්ම**: යන්නෙන් සෝවන් ඵලයේ පටන් ඉහලට ඇති අධිගම ගත හැක.



*දෙවු කෙණෙහි කිරි නොමිදෙන්නා සේ පව ද කළ කෙණෙහි විපාක නොදෙන්නේ ය.*

| | |
|---|---|
| 71. න හි පාපං කතං කම්මං<br>සජ්ජු ඛීරං'ව මුච්චති<br>ඩහන්තං බාලමන්වෙති<br>භස්මච්ඡන්නො'ව පාවකො (5:12) | පල නොදේවි කළ විගසින්<br>කල් යයි මිදෙනා කිරිමෙන්<br>හඹයි බාලයන් දවමින්<br>අළුයට ගිනි පුපුරු ලෙසින් |

# කළ පව් නො නැසේ - අළුයට ගිනි සේ.

## 5 (12) අහිප්‍රේතයා ගේ කතාව (71 ගාථාව)

**අහිප්‍රේතයකු** ගේ වෘත්තාන්තය නිමිති කර ගෙන භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසමින් මේ ගාථාව දේශනා කළ සේක.

වරක් මුගලන් මහ රහතන් වහන්සේ ලක්ඛණ හිමියන් ද කැටුව ගිජ්ඣ කූළු පවුවෙන් බැස ජටිලයන් දහසක් දෙනා මැදින් රජගහ නුවර පිඬු සිඟා වඩිනු පිණිස නික්මුණ හ. ඒ එන අතරමග අහිප්‍රේතයකු (සර්ප ප්‍රේතයකු) දුටු මුගලන් මා හිමියන්ට සිනා පහළ විය. සිනා පහළ කිරීමට හේතුව කුමක් දැයි ලක්ඛණ හිමියන් ප්‍රශ්න කළ විට "ආයුෂ්මත්නි, දැන් නොව, එය භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී විමසන්න." යි මුගලන් හිමියෝ පැවසූ හ. පිඬු සිඟා ගොස් දන් වළඳා බුදුරදුන් හමුවට ගිය විට ලක්ඛණ ස්ථවිරයෝ "සමිඳුනි, ගිජ්ඣ කූළු පව්වෙන් බසිද්දී ඔබ වහන්සේ සිනා පහළ කළේ කවර හෙයින්දැයි මා ඇසූ විට එය බුදුරදුන් හමුවේ විමසන්නැයි ඔබ වහන්සේ පැවසූ හ. දැන් ඒ කවර හෙයින්දැයි හෙළි කළ මැනවි" යි ආරාධනය කළ හ.

"ආයුෂ්මතුනි, මම අහිප්‍රේතයකු දැක සිනාසුනිමි. ඔහු ගේ ස්වරූපය මම ඔබට විස්තර කරන්නෙමි. ඔහු ගේ හිස මනුෂ්‍යයකු ගේ මෙනි. එහෙත් කඳ සර්පයකු ගේ මෙන් ය. ඔහුට අහිප්‍රේතයා යයි කියන්නේ ඒ හේතුවෙනි. ඔහු ගේ දිග යොදුන් 25 කි. ඔහු ගේ හිසෙන් පටන් ගන්නා ගිනි දලු වලිගය දක්වා විහිද යයි. වලිගයෙන් පටන් ගන්නා ගිනි දලු හිස දක්වා පැතිර යයි. හිසෙන් හට ගන්න ගිනි දෙපස දිගේ පැතිර යයි. දෙපසින් හට ගන්නා ගිනි සිරුර මුළුමනින් පැතිරෙයි යොදුන් 25 ක් දිග ප්‍රේතයන් ඇත්තේ දෙදෙනෙක් පමණක් යැයි කියති.

එනම්, මේ අහිප්‍රේතයා සහ තවත් එක් කාක ප්‍රේතයෙකි. ඉතිරි ප්‍රේතයෝ යොදුන් තුන් කාලක් පමණ දිග ය. මේ අහිප්‍රේතයා හා කාක ප්‍රේතයා පමණක් යොදුන් 25 ක් දිගට සිටිති. මම කාකප්‍රේතයා ද දැක ඇත්තෙමි. කාක ප්‍රේතයා දුටු දිනයේ මම ඔහු පෙර කළ කර්‍මය කුමක් දැයි ඇසීමි. පෙර ජන්මයෙක භික්ෂූන් වහන්සේලාට පිළිගැන්වීමට ගෙන ගිය බත් පාත්‍රයකින් කටවල් තුනක් අනුභව කළ පාපයෙන් එසේ කාක ප්‍රේතව දුක් විඳින බව හේ පැවසී ය.

අහිප්‍රේතයා ප්‍රේතාත්මභාවය ලද්දේ ද බලගතු අකුසලයක විපාක වශයෙනි. හෙතෙම ඉකුත් භවයක බරණැස් නුවර කුඹුරක් කරවූයේ ය. කුඹුරෙන් එහා එක් තැනෙක පසේ බුදු නමක් වාසය කළේ ය. උන් වහන්සේ වැඳගන්නට යන සැදැහැවත්තු කුඹුර පාගා ගෙන යති.

මෙයින් ගොවියාට හිරිහැර විය. කුඹුර පාගා ගෙන නො යන්නැයි කීවත් මිනිසුන් ඊට සවන් නුදුන් හෙයින් මේ සියලු කරදර පසේ බුදුන් ගේ පන්සල නිසා නො වේදැයි සිතූ හෙතෙම උන්වහන්සේ පිඬු සිඟා ගිය අතර පන්සල ගිනි තැබීය. පසේ බුදුරජාණන් වහන්සේ ද පන්සල ගින්නෙන් වැනසී තිබෙනු දැක වෙනත් පළාතකට වැඩි සේක.

මිනිසුන් අවුත් පසේ බුදුන් ගැන විපරම් කරන විට "මම පන්සල ගිනි තැබීමි" යි හේ පැවසී ය. කුපිත වූ මිනිස්සු ඔහු ට පහරදී මරා දැමූ හ. අවීචි මහා නරකාදියෙහි පැසී ඉක්බිති හේ දැන් මෙසේ අහි ප්‍රේතයකුව දුක් විඳියි."

ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, මේ මොග්ගල්ලාන ස්ථවිරයන් පැවසූ දේ සැබෑය. මම ද මේ අහිප්‍රේතයා දැක ඇත්තෙමි. එහෙත් මා ඒ ගැන සඳහන් නො කළේ නිකරුණේ සැකකරන්නවුන් තමන්ට ම අලාභ කර ගනිතැයි සිතීමෙනි'' යි වදාරා පුර්වෝක්ත ගාථාව ද දේශනා කළ සේක.

### විවරණාත්මක අනුවාදය (71 ගාථාව)

**කතං පාපං කම්මං ඛීරං ඉව සජ්ජු න හි මුච්චති.**
**භස්මච්ඡන්නො පාවකො ඉව තං බාලං ඩහං අන්වෙති.**

**කතං**: කරන ලද; **පාපං කම්මං**: පාප කර්මය; **ඛීරං ඉව**: කිරිමෙන් ම; **සජ්ජු**: වහා; **න හි මුච්චති**: නො මිදෙන්නේම ය; **භස්මච්ඡන්නො**: අළුවලින් වැසුණු; **පාවකො ඉව**: ගිනි අඟුරු මෙන්; **තං**: එය; **බාලං**: අඥානයා; **ඩහං**: දවමින්; **අන්වෙති**: පසු පස එයි.

පාප කර්මයක් කළ පමණින් එය වහාම විපාක දෙන්නේ නැත. කිරි, වහා නො මිදී කාලයක් ගෙන මිදෙන්නාක් මෙනි. අළු යට තිබුණත් ගිනි අඟුරු යමක් පුළුස්සා දමන්නට සමත් වන්නාක් මෙන් පාප කර්මය ද පසු පසින් අවුත් අඥාන පුද්ගලයා දවාලයි.

### විවරණය

**සජ්ජු ඛීරං ව මුච්චති**: යන්නෙන් විස්තර කරන්නේ කිරි මිදෙන්නට කල් ගත වන බවයි. එසේම කර්‍මය විපාක දෙන්නට පෙරද එක්තරා මුහුකුරා යාමක් සිදුවේ. එහෙත් පව් කරන අනුවණ දනෝ වහාම විපාක නො ලැබෙන විට විපාක නො ලැබෙතැයි සිතා උදම් වෙති. එය මුළාවකි.





අනුවණයාගේ දැන උගත්කම හා ඉසුරුමත් බව ඔහුට ම අවැඩ පිණිස වන්නේ ය.

72. යාවදෙව අනත්ථාය
ඤත්තං බාලස්ස ජායති
හන්ති බාලස්ස සුක්කංසං
මුද්ධමස්ස විපාතයං (5:13)

උගත් සිප්සත මෝඩ මිනිසකු
විපත් පිණිසම සිටි ඔහු හට
ඉදිමිලා හිස පිපිර යන්නේ
හොඳක් ඇත්නම් එයත් වනසා

# මෝඩයන් ගෙ පිපිරෙයි හිස් - උගත් කමින් ඉදිමී ගොස්

## 5 (13) සට්ඨිකූට ප්‍රේතයා ගේ වෘත්තාන්තය (72 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ විසූ සේක් **සට්ඨිකූට** නම් ප්‍රේතයා නිමිති කර ගෙන මේ ගාථාව වදාළ සේක.

ගල් කැට ඉලක්කයට විදීමේ සමත් පිළෙක් (කොරෙක්) බරණැස් නුවර වාසය කළේ ය. නුග ගසක් යට වාසය කළ ඔහුට නුග ගසේ කොළ වලට ගල් කැට විද හිල් කර අව්වේ සෙවනැල්ලෙන් ඇත්රූප අස් රූප ආදිය වැටෙන ආකාරයට කිරීමේ හැකියාවක් තිබිණ. එබඳු දේ කර දක්වන ඔහුට ළමයි කෑම බීම ගෙනවුත් දෙති.

දිනක් බරණැස රජතුමා ඒ අසලින් යන විට ළමයි බියපත් ව කොරා ගසෙහි අතු අතර සඟවා පැන දිවූ හ. එහෙත් කොළවල හිල් අතුරින් බිමට වැටෙන ඇත් රූප ආදිය දැක, මේ කාගේ වැඩක් දැයි විමසා පිළා සොයා ගත් රජතුමා ඔහු රජවාසලට කැඳවා ගෙන ගියේ ය. පුරෝහිත බමුණා ගේ වාචාල කට පාලනය කරනු පිණිස පිළා ලවා එළු බෙටි නැලියක් ඔහු ගේ කටට විද්දවීම ද කරවා ගත් රජ තෙම මහත් සතුටට පත් ව පිළාට සිවු දෙසින් ගම්වර හතරක් හා අගනා තෑගි බෝග පිරිනැමීය.

මේ දක්‍ෂතාවෙන් කොරකු ලද තිළිණ දැක විශ්මයට පත් එක් පුද්ගලයෙක් මා මේ ශිල්පය උගත යුතු යැයි සිතා ඔහු වෙත ගොස් උපස්ථාන කොට සිත් ගෙන ශිල්පයෙහි නිපුණ වූයේ ය.

තම නව ශිල්ප දක්‍ෂතාවෙන් ඔද වැඩුණු හේ කුසල් අකුසල් දන්නා නුවණින් තොර වූ හෙයින් නගරයෙහි පිඬු සිඟා වඩිනා පසේ බුදු කෙනකුන් දැක මේ පසේ බුදුනට කාත් කවුරුත් නැති හෙයින් මා එතුමා මරා දැම්මත් මට නීතියෙන් දඬුවමක් ලැබෙන්නේ නැතැයි සිතා උන්වහන්සේ ගේ දකුණු කණට ඉලක්ක කර ගලක් විද්දේ ය. එය කණ විදගෙන ගොස් වම් කණෙන් නිකුත් විය. හේ පලා ගියේ ය. බලවත් වේදනාවට පත් පසේ බුදුරජාණන් වහන්සේ පිඬු සිඟා වඩින්නට අසමත් ව වහා පන්සලට හැරී ගොස් පිරිනිවන් පෑ හ.

පසේ බුදුන්ට මේ විපත කළ තැනැත්තා සොයා ගත් මිනිස්සු ඔහු තළා පෙළා මරා දැමූ හ. මිය ගොස් අවීචි මහා නරකයෙහි බොහෝ කල් දුක් විඳි හෙතෙම ඉන් මිදී අනතුරුව ගිජුකුළු පව්වෙහි සට්ඨිකූට ප්‍රේතව උපන්නේ ය. ලක්ඛණ තෙරුන් සමඟ ගිජුකුළු පව්වෙහි ගමන් කරන විටකදී ඒ ප්‍රේතයා දුටු මහ මුගලන් තෙරුන්, ප්‍රේතයා පිළිබඳව කළ විස්තරය අසා සිටි, භාග්‍යවතුන් වහන්සේ ඒ නිමිතිකොට මේ ගාථාව වදාළ සේක.

**විවරණාත්මක අනුවාදය (72 ගාථාව)**

**බාලස්ස ඤත්තං යාව එව අනත්ථාය ජායති. බාලස්ස මුද්ධං විපාතයං අස්ස සුක්කංසං හන්ති.**

**බාලස්ස**ඃ මෝඩයා ගේ; **ඤත්තං**ඃ උගත් කම; **යාව එව**ඃ හුදෙක්; **අනත්ථාය**ඃ අනර්ථය පිණිස ම; **ජායති**ඃ පවතියි; **බාලස්ස**ඃ මෝඩයා ගේ; **මුද්ධං**ඃ හිස; **විපාතයං**ඃ බිඳ හෙළමින්; **අස්ස**ඃ ඔහු ගේ; **සුක්කංසං**ඃ අංශුමාත්‍ර වූ හොඳක්; **හන්ති**ඃ වනසයි.

මෝඩයා යමක් උගත්තේ වුව ද එය ඔහුට අනර්ථය පිණිස ම පවතියි. ඔහු ගේ හිස සිඳ හෙළමින් බින්දු මාත්‍ර වූ හොඳක් ඔහු වෙත ඇත් නම් එය ද වනසා දමයි.

**විවරණය**

**ඤත්තං** - උගත් දේ - දත් දේ යනු මෙහි අරුතයි. මෝඩයාට තම උගත්කමින් හිසි, නිවැරදි ඵල නෙළා ගන්නට අවශ්‍ය උචිතානුචිත විචක්ෂණය නැති හෙයින් එය වරදවා භාවිත කොට විපතට වැටෙ යි. ඔහු ලග යම් බින්දු මාත්‍ර හෝ යහපතක්, ගුණයක් වේ නම් එය පවා විනාශ වෙයි.





*අනුවණ මහණතෙම තමන් තුළ නැති ගුණ අඟවා බුහුමන් හා උසස් බැව් පතන්නේ ය.*

73. අසතං භාවනමිච්ඡෙය්‍ය
පුරෙක්ඛාරඤ්ච භික්ඛුසු
ආවාසේසු ච ඉස්සරියං
පූජා පරකුලෙසු ච (5:14)

නැති ගුණ අගයනු රිසි වෙති
ස නායක කම් ද පතති
පන්සල් වල අදිපති කම්
පරකුල පූජා ද සොයති

# ගුණ නුවණින් හිස් - රිසි වෙති කිතු ගොස්
## 5 (14) චිත්ත ගෘහපතියා ගේ ප්‍රවෘත්තිය (73 හා 74 ගාථා)

සුධම්ම ස්ථවිරයන් හා **චිත්ත ගෘහපතියා** නිමිති කොට භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ගාථා දෙක දේශනා කරන ලද්දේ ජේතවනාරාමයේ වැඩ විසූ සමයේ ය.

මච්ඡිකාසණ්ඩ නම් නුවර විසූ චිත්ත නම් ගෘහපතිතෙම පිඬු සිඟා වඩිනා මහානාම මහ රහතන් වහන්සේ දැක උන්වහන්සේ ගේ ප්‍රසන්න ඉරියව් විෂයෙහි පැහැද, නිවසට වැඩම කරවා දන් පිළිගන්වා බණ අසා පැහැදී සෝවන් ඵලය ද ලබා ගත්තේ ය. අනතුරුව තමන් සතු උද්‍යානය අත පැන් වත් කොට සංඝයාට පූජා කළ හෙතෙම එහි විශාල ආරාමයක් ඉදි කරවා පූජා කළේ ය. එතැන් පටන් එය සතර දෙසින් වඩිනා මහ සඟරුවනට විවෘත ස්ථානයක් විය. සුධම්ම නම් තෙර නමක් එහි නේවාසිකව වාසය කරන්නට පටන් ගත්තේ ය.

චිත්ත ගෘහපතියා ගේ සැදැහැ ගුණය කටින් කට පැතිර ගියේ ය. ඒ ඇසූ සැරියුත්-මුගලන් දෑග සව්වෝ ද ඔහුට අනුග්‍රහ කරනු කැමතිව මච්ඡිකාසණ්ඩයට වැඩම කළ හ. අගසවු දෙනම පැමිණෙන පුවත ඇසූ චිත්ත අඩ යොදුනක් පෙර ගමන් කොට උන්වහන්සේලා පිළිගෙන ආරාමයට වැඩම කරවා ගෙන'වුත් ආගන්තුක සත්කාර කොට "ස්වාමීනි, බණ ටිකක් වදාළ මැනව" යි ආරාධනා කළේ ය. ගමන් වෙහෙස තිබුණ ද සැරියුත් මහ තෙරණුවෝ කෙටියෙන් ධර්මානුශාසනයක් කළ හ.

ඒ අසා සිටි චිත්ත සකෘදාගාමී ඵලයට පත් වූයේ ය. අනතුරුව දෑගසව්වන්ටත් උන්වහන්සේලා සමඟ සපැමිණි දහසක් තෙරවරුන්ටත් පසු දින දවල් දානය පිණිස නිවෙසට වැඩම කරන්නැයි ආරාධනය කළ හේ ආරාමික සුධම්ම හිමියන්ට ද ඒ හා වැඩම කරන සේ ඇරයුම් කළේ ය. "මට ආරාධනා කළේ කාටත් පසුවය" යි කිපුණු සුධම්ම හිමියෝ එය පිළි නොගත් හ. දෙතුන් වරක් ම ඇරයුම් කළ ද පිළි නො ගත්තෙන් චිත්ත ද "ඔබ වහන්සේ ගේ කැමැත්තක්" යි පවසා නික්ම ගියේ ය.

පසු දින මොහු මේ අගසවු දෙනම ඇතුළු පිරිසට සංග්‍රහ කරන්නට සූදනම් කර ඇත්තේ කවර දාන වස්තු දැයි දැන ගැනීමේ කුතුහලයෙන් සුධම්ම ස්ථවිරයෝ උදෙන්ම පා සිවුරු ගෙන එහි ගිය හ. "වැඩ හිඳිනු මැනවි, ස්වාමීනි." යි චිත්ත ඇරයුම් කළ ද "මම පිඬු සිඟා යන්නෙමි. වැඩ නොහිඳිමි"යි කී උන්වහන්සේ දාන වස්තු විමසා බලා අඩුපාඩුවක් දක්වනු කැමැත්තෙන් "ඔබ බොහොම ජයට කෑම හදලා තිබෙන නමුත් එක අඩුවක් තිබෙනවා" යි කී හ. "ඒ කුමක් ද ස්වාමීනි?" යි විමසූ විට ''තලගුලි නැහැ" යි කී හ. "ඔබ වහන්සේ හරියට කපුටෙක් වගෙයි" චිත්ත අවමන් පෙරදැරිව පැවසී ය. එයින් කෝපයට පත් සුධම්ම හිමියෝ "ගෘහපතිය, ඔබේ ආවාසය ඔබ ම තියා ගන්න. මට එය රැකිය නො හැක. මම යන්නෙමි"යි යන්නට සැරසුණ හ. "නොයනු මැනවි, හිමියනි" යි දායකයා තුන් වරක් ම ඉල්ලා සිටිය ද උන්වහන්සේ බුදුරදුන් හමුවට ගොස් සියල්ල දන්වා සිටියේ ය. "සැදැහැති දායකයාට නිග්‍රහ කිරීමෙන් ඔබ කර ඇත්තේ බලගතු වරදකි"යි පැවසූ භාග්‍යවතුන් වහන්සේ සුධම්ම හිමියන්ට උන්වහන්සේ ගේ වරද පහදා වහා ම ගොස් ගෘහපතියා සමා කරවා ගන්නැයි උපදෙස් දුන් හ. සුධම්ම හිමියෝ ද ගොස් චිත්ත ගෘහපතියාට "උපාසකය, එය මගේ වරදය. මට සමාවන්න" යි කීව ද "මම සමාව නො දෙමි"යි චිත්ත පැවසී ය. එයින් සිත්තැවුලට හා අමනාපයට පත් සුධම්ම හිමි නැවත බුදුරජාණන් වහන්සේ හමුවට ගියේ ය.

**විවරණාත්මක අනුවාදය (73 ගාථාව)**

> **අසතං භාවනං, භික්ඛූසු පුරෙක්ඛාරඤ්ච, ආවාසේසු ඉස්සරියං ච, පරකුලෙසු පූජා ච ඉච්ඡෙය්‍ය**
>
> **අසතං භාවනං**: තමන් වෙත නැති ගුණ ඇතැයි පිළිගනු ලැබීම; **භික්ඛූසු**: භික්ෂූන් අතර; **පුරෙක්ඛාරඤ්ච**: පුරෝගාමිත්වය ද; **ආවාසේසු**: විහාරස්ථානවල; **ඉස්සරියං ච**: ආධිපත්‍යය ද; **පරකුලෙසු**: වෙනත් දායක පවුල් වලින්; **පූජා ච**: පුද සත්කාර ද; **ඉච්ඡෙය්‍ය**: කැමති වන්නේ නම් (එය ද)

තමන් වෙත නැති ගුණ ඇතැයි අන්‍යයන් පිළිගනු දැක්මට ඇති කැමැත්ත, භික්ෂූන් අතර නායකත්වය ලබන්නට ඇති රුචිය, විහාරස්ථානවල අධිපති පදවි ලබන්නට ආශා වීම, දායක පවුල් වලින් පුද පිරිකර ලබන්නට ඇති රුචිය,





*නුවණ නැති පැවිද්දා ගේ කුදු මහත් කටයුතු ගැන නිසරු අදහස් ද ආසාව හා මානය ද වැඩේ.*

74 මමේ'ව කත මඤ්ඤන්තු
ගිහී පබ්බජිතා උභො
මමේ'ව අතිවසා අස්සු
කිච්චාකිච්චෙසු කිස්මිචි
ඉති බාලස්ස සඞ්කප්පො
ඉච්ඡා මානො ච වඩ්ඪති (5:15)

ගිහි පැවිදි කවුරුත්
මා ගැනම නිති සිතමින්
ලොකු පොඩි කොයි වැඩත්
මගේ වැඩ යයි කියමින්
මා වට සිටිත්වා - මට ම මුල් තැන පුදමින්
සිතුවහොත් මෙලෙසින්
ලොබ මන් වැඩෙයි නිතියෙන්.

# ගුණ නුවණින් අඩු වුණාම - පිම්බෙනවා තමන් ගැනම.

## 5 (14) චිත්ත ගෘහපතියා ගේ ප්‍රවෘත්තිය (73 සහ 74 ගාථා) (ඉතිරි කොටස)

නැවත ගිය ද චිත්ත සමාව නො දෙන බව දනිතත්, මානය දුරු කිරීම පිණිස තිස් යොදුනක් ගොස් ආපසු ගෙන්විය යුතුයයි සිතූ භාග්‍යවතුන් වහන්සේ නැවත ද උන්වහන්සේ ගෘහපතියා වෙත යැවූ හ. එවර ද ගෘහපතියා සමාව නුදුන් හෙයින් මානය මුළුමනින්ම සිඳීගිය තෙරණුවෝ නැවත බුදුසමිඳුන් හමුවට අවුත් ඒ බව සැළ කර සිටිය හ.

"සුධම්ම, මේ මගේ පන්සල, මේ මගේ දායකයෝ, මේවා මගේ ම වැඩ ආදි ලෙසින් සිතීම මානය වැඩෙන, කුසල් පිරිහෙන මෝඩ වැඩකි. එසේ සිතීම භික්ෂූන් විසින් නො කළ යුතුය"යි අවවාද කර "මේ සහායක භික්ෂුවද සමඟ ගොස් ගෘහපතියා සමා කර ගන්න" යි දෙවැන්නකු ද දී යැවූ හ.

බුදුරදුන් වැද අවසර ගෙන බොහෝ නිහතමානී ව චිත්ත ගෘහපතියා වෙත ගිය සුධම්ම තෙරණුවෝ නැවත ද සමාව අයැද සිටිය හ. එවර "හිමියනි මම ඔබට කමා කරමි. මා අතින් ද යම් වරදක් වී නම් ඊට ඔබ වහන්සේ කමා කරන්න" යි පැවසූ චිත්ත උන්වහන්සේට සමාව දුන් හ. සුධම්ම තෙරණුවෝ ද භාග්‍යවතුන් වහන්සේ දුන් උපදෙස් මනාව පිළිපැද ඉතා ඉක්මණින්ම සිවු පිළිසිඹියාපත් මහ රහතන් වහන්සේ නමක් බවට පත් වූ හ. මේ සිද්ධියෙන් පසු චිත්ත ගෘහපතියා මෙසේ සිතී ය. "මා සෝවන් ඵලය ලද්දෙත්, සකෘදාගාමී ඵලය ලද්දෙත් භාග්‍යවතුන් වහන්සේ සියැසින් නොදැකම ය. අනාගාමී ඵලය ලද්දෙත් බුදුන් නො දැකමය. දැන් ඉතින් මා බුදුරදුන් සියැසින් දැකගත යුතුම ය.

එසේ සිතා ගැල් පන්සියයක තල, උඳු, මුං, සහල්, උක්සකුරු, රෙදි පිළි ආදිය පුරවා විශාල පිරිසක් ද කැටුව බුදුන් දක්නට යාම සඳහා පිටත් වූ හ. අතර මග දෙව් මිනිසුන් ගෙන් බොහෝ ආදර සංග්‍රහ විඳිමින් ගොස් මාසයක් ම බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට දාන මානාදියෙන් උපස්ථාන කොට ආපසු පැමිණියේ ය. භාග්‍යවතුන් වහන්සේ ආනන්ද මහ තෙරුන් අමතා චිත්ත ගෘහපතිය පූර්වාත්මභාවයෙක කරන ලද දානමය පුණ්‍යකර්මයක අනුභාවයෙන් මේ යස ඉසුරු ලද බව ද දේශනා කළ හ.

### විවරණාත්මක අනුවාදය (74 ගාථාව)

**ගිහී පබ්බජිතා උභො මම එව කතං අභිඤ්ඤන්තු, කිස්මිචි කිච්චාකිච්චෙසු මම එව අතිවසා අස්සු ඉති බාලස්ස සඞ්කප්පො ඉච්ඡා මානො ච වඩ්ඪති.**

**ගිහි**: ගිහි; **පබ්බජිතා**: පැවිදි; **උභො**: දෙපක්ෂයම; මම **එව**: මා විසින් ම; **කතං**: කළ දේ යැයි; **අභිඤ්ඤන්තු**: පිළි ගනිත්වා; **කිස්මිචි**: කවර වුව ද; **කිච්චාකිච්චෙසු**: කළ යුතු කුදු මහත් දෙයහි; **මම එව**: මා ම; **අතිවසා අස්සු**: මුල් කර ගනිත්වා; **ඉති**: යන මෙය; **බාලස්ස**: නුවණ නැත්තාගේ; **සඞ්කප්පො**: අදහස ය; (එයින්), **ඉච්ඡා**: ආශාව ද; **මානො ච**: මානය ද; **වඩ්ඪති**: වැඩෙයි.

ගිහි පැවිදි කවුරුත් හැම දේම මා විසින් කළ දේ යැයි පිළිගනිත්වා. ලොකු කුඩා ඕනෑ ම වැඩක දී මා ම මුල් කර ගනිත්වා යි සිතීම යන මේ දුබල කම් ඇතිවීම නුවණ නැත්තා ගේ ක්‍රමයයි. එයින් තෘෂ්ණාව හා මානය වර්ධනය වෙයි.

(කලින් ගාථාවේ දැක් වූ දුර්වලකම් මාලාව ද මීට ම එක් කර මෝඩයා ගේ ලක්‍ෂණ බව තේරුම් ගත යුතුය)

### විවරණය

මේ ගාථා දෙකින් ම දක්වන ලද්දේ ආරාමික ජීවිතයක් තුළ විද්‍යාමාන විය හැකි දුර්වලතා ය. ආධ්‍යාත්මික වශයෙන් එතරම් සමෘද්ධියක් නො ලද භික්ෂූන් දායකයන් ගෙන් ලැබෙන වන්දනා මාන, පුද පිරිකර ආදියෙන් මත් වී ඒවාටම ලොල් වී පුහු මානයක් වර්ධනය කරගත හැකි ය. තමන් අධිගම අතින් ඉතා බිළිඳු වුවද පිරිස් මැද හරසර ලබන විට තමන් පිළිබඳ නිසරු මානයක් වගා කරන්නා ඔවුහු හරසර අඩු වූ විට අසහනයට පත් වෙති. වෙනත් දායක පවුල් වලින් හරසර පතන්නට සිතති. මෙසේ වූ විට තෘෂ්ණාව හා මානය වර්ධනය වීමෙන් විමුක්ති මාර්ගය ඇහිරෙයි.





*පැවිද්දා ලාභ උපදවන පිළිවෙත ද නිවන් ලබන පිළිවෙත ද වෙනස් බව දැන කෙලෙස් මලින් වෙන් විය යුතු ය.*

75. අඤ්ඤා හි ලාභූපනිසා
අඤ්ඤා නිබ්බාණගාමිනී
එවමෙතං අභිඤ්ඤාය
භික්ඛු බුද්ධස්ස සාවකො
සක්කාරං නාභිනන්දෙය්‍ය
විවේකමනුබ්‍රෑහයෙ. (5:16)

ලාබ ලබන මඟ අනිකකි
නිවන් ලබන මඟ තවෙකකි
හොඳ නුවණින් දත් භික්‍ෂුව
බුදුරදුන් ගෙ ශ්‍රාවකයෙකි
ලාබ ලෝබ වෙත නො ඇලී
විවේක සුව විඳ ගන්නෙකි.

# හැර ඉසුරු මග - යමු නිවන් මග

## 5 (15) වනවාසී තිස්ස සාමණේරයන්ගේ වත (75 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ වනවාසී **තිස්ස සාමණේරයන්** ඇරබ මේ ගාථාව වදාළ සේක.

තිස්ස සැවැත් නුවර සිටු කෙනෙකුන් ගේ පුත්‍රයෙක් වූයේ ය. ඔහු ගේ පියා අග්‍රශ්‍රාවක සාරිපුත්ත මහ රහතන් වහන්සේට නිතර නිතර දන් පිරිනැමූ හෙයින් තිස්සට කුඩා වියේදී ම සැරියුත් මහ රහතන් වහන්සේ නිතර දකින්නට වාසනාව උදා වී තිබිණ. යන්තම් වයස හත වන විට පැවිදි වන්නට කැමැත්ත දැක්වූ හේ සැරියුත් මහ තෙරණුවන් වෙත පැවිදි වූයේ ය. පැවිදිව දෙව්රම් වෙහෙර වැඩ විසූ තිස්ස සාමණේරයන් දක්නට නිතර නිතර උන්වහන්සේ ගේ මිතුරෝ තෑගි බෝග ද රැගෙන පැමිණෙන්නට වූ හ.

මෙය තමන්ට මහත් හිරිහැරයක් සේ සැලකූ සාමණේර නම භාග්‍යවතුන් වහන්සේ ගෙන් කර්මස්ථාන ලබා ගෙන වනගත වූයේ ය. ගම්වැසියකු යමක් පිදූවිට "**සුඛිතා හෝථ, දුක්ඛා මුඤ්චථ**" (සුවපත් වේවා, දුකින් මිදේවා) හැර වෙන කිසිවක් නො වදරති. එසේ කෙටියෙන් පවසා ආරණ්‍යය තුළට පිවිසෙන උන්වහන්සේ අප්‍රතිහත ධෛර්‍ය්‍ය යෙන් බවුන් වඩති. මෙසේ වෑයම් කොට මාස තුනක් ගතවන විට උන්වහන්සේ රහත් ඵලය ලබා ගත් හ.

වස් කාලය අවසන් වූ පසු භාග්‍යවතුන් වහන්සේ වෙතින් අවසර ලබා ගත් සැරියුත් මහ රහතන් වහන්සේ මුගලන් මහරහතන් වහන්සේ ද කැටුව තිස්ස සාමණේරයන් වසන ආරණ්‍ය සේනාසනය බලා පිටත් වූ හ. අගසවු දෙනම පැමිණි බව ඇසූ ගම්වැසියෝ උන් වහන්සේලාට හරසර දැක්වීම පිණිස රැස් වූහ. තමන්ට අනුකම්පාවෙන් දම් දෙසුමක් කරන්නැයි ඔවුහු සැරියුත් හිමියන්ගෙන් ඉල්ලා සිටිය හ. එහෙත් තමන් වෙනුවට තිස්ස සාමණේරයන් බණ කියනු ඇතැයි උන්වහන්සේ ගැමියාට පැවසූ හ. ඒ ඇසූ ගම්වැසියො "ඒ පොඩි හාමුදුරුවෝ සුවපත් වෙත්වා, දුකින් මිදෙත්වා කියන්නට හැර වෙන යමක් කියන්නට නො දනිති. එහෙයින් වෙනත් නමකට කියන්නැ"යි ඉල්ලා සිටිය හ.

එහෙත් තිස්ස සාමනේරයන් ම බණ කියනු ඇතැයි පැවසූ සැරියුත් හිමියෝ "තිස්ස, මේ අයට අනුශාසනා කරන්න. සුවපත්වන හැටි හා දුකින් මිදෙන හැටි ඔවුනට පහදා දෙන්න" යි තිස්ස සාමණේරයනට පැවසූ හ. තම ගුරු දේවයන් වහන්සේ ගේ බසට අවනතව ධර්මාසනාරූඪවූ තිස්ස සාමණේර හිමියෝ ස්කන්ධා යතන ධාතූන් ගේ යථා තත්ත්වය පහදා සත්තිස් බෝධිපාක්ෂික ධර්ම විවරණය කර රහත් වී නිවන් ලබන පිළිවෙල දේශනා කළ හ. තිස්ස සාමණේරයන් වහන්සේ ගේ දීර්ඝ හා සාරගර්භ ධර්මදේශනය නිම වන විට අලුයම ද වී තිබිණ. ඒ වන විට සියලුම ගම්වැසියෝ ඉමහත් ප්‍රසාදයට පත්ව සිටිය හ. මේ තරම් හොඳින් ධර්මය දැන සිටි තිස්ස සාමණේරයන් මෙතුවක් කල් ඉතා අඩුවෙන් කතා කිරීම ගැන ඔවුහු විස්මයට පත්ව සිටිය හ. කෙසේ වුව ද මේ සා උතුම් හිමිනමක් තමන් ගේ උවටැන් ලබමින් තමන් හා විසීම ගැන ඔවුහු ආනන්දයට පත් වූ හ. දායකයන් ගේ ප්‍රසාදය පිණිස භාග්‍යවතුන් වහන්සේ ද එහි වැඩම කළ අතර, තිස්ස සාමණේරයන් ගේ ගුණය පතළ කරනු පිණිස පූර්වෝක්ත ගාථාව ද දම්සභා මණ්ඩපයෙහි වැඩහුන් භික්ෂූන් වහන්සේලාට දේශනා කළ සේක.

### විවරණාත්මක අනුවාදය (75 ගාථාව)

**ලාභූපනිසා අඤ්ඤා නිබ්බාණගාමිනී අඤ්ඤා හි**
**බුද්ධස්ස සාවකො භික්ඛු එවං එතං අභිඤ්ඤාය**
**සක්කාරං න අභිනන්දෙය්‍ය විවේකං අනුබ්‍රෑහයෙ**

**ලාභූපනිසා**: ලාභ උපදවන මාර්ගය; **අඤ්ඤා**: වෙනකකි; **නිබ්බාණ ගාමිනී**: නිවන් ලබන මග; **අඤ්ඤා හි**: තවෙකක් ම ය; **බුද්ධස්ස සාවකො**: බුද්ධ ශ්‍රාවක; **භික්ඛු**: භික්ෂුව; **එවං**: මෙසේ; **එතං**: මෙය; **අභිඤ්ඤාය**: මැනවින් දැන; **සක්කාරං**: ලාභ සත්කාර; **න අභිනන්දෙය්‍ය**: අභිනන්දනය නො කරන්නේ ය; **විවේකං අනුබ්‍රෑහයෙ**: විවේකය වඩන්නේය.

භෞතික ලාභ ප්‍රයෝජන ලබන මාර්ගය එකකි. නිර්වාණය ලබා ගැනීම සඳහා ඇති මාර්ගය තවත් එකකි. මෙය මනාව හොඳින් දැන තේරුම් ගන්නා බුද්ධ ශ්‍රාවක තෙම ලාභ සත්කාර කෙරේ නො ඇලෙන්නේ ය.

### විවරණය

**විවේක**: විවේකය ත්‍රිවිධ ය. කාය විවේකය, චිත්ත විවේකය හා උපධි විවේකය වශයෙනි. කාය විවේකය නම් පිරිස් වෙත නො ඇලී තනිව විවේකීව වාසය කිරීමයි. ගණසංගණිකාවෙහි නො ඇලී කාය විවේකය වඩන්නැයි වදාරා ඇත්තේ එබැවිනි. ප්‍රථමධ්‍යානයේ සිට රහත් මග දක්වා සියල්ල චිත්ත විවේක නම්. උපධි විවේක නම් නිර්වාණයයි.



# කතෘ ස්වාමීන්ද්‍රයන් වහන්සේ



සනාතන බුද්ධ භාෂිතය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ අසහාය සාමයික මෙහෙය උදෙසා, සිය කාලය හා ශ්‍රමය සපුරා වැය කරමින්, මානව වංශයට දහම් මග හෙළි පෙහෙළි කිරීමේ මහා මෙහෙවරට කැප වී සිටින සිංගප්පූරුවේ ප්‍රධාන සංඝ නායක වේරගොඩ සාරද, ස්ථවිරයන් වහන්සේ අද ලොව වෙසෙන ප්‍රශස්ථතම ධර්‍ම දූත යතිනායක වරයාණන් වහන්සේ නමකි.

1941 නොවැම්බර් මස 27 වනදා දකුණු ලක වේරගොඩ දී උපත ලද මේ යති ප්‍රභූවරයානෝ, උපාධි ලාභීව, ධර්‍මදූත මෙහෙය ආරම්භ කළේ ඉතා යොවුන් අවධියේ දීමය. දැනට ශතක 6 ක් පුරා ධර්‍මදූත මෙහෙයෙහි යෙදී සිටින ගරුතර වේරගොඩ සාරද යතිනායකයානන් වහන්සේ මුද්‍රිත මාධ්‍යයෙන් සහ විද්‍යුත් මාධ්‍යයෙන් මෙන්ම දුරකථන තාක්ෂණයෙන් පවා අද ලොවට ධර්‍මදානය සපයන්නේ නවීනයන්ගේ මනස හා ආධ්‍යාත්මික ගති-පැවතුම් පිළිබඳ පැහැදිලි අවබෝධයකිනි.

වර්තමානික ග්‍රාහක පිරිස, ශ්‍රව්‍ය-දෘෂ්‍ය මාධ්‍ය මගින් දැනුමත් විනෝදාස්වාදයත් ලබන්නට පුරුදු වී සිටින පරපුරක් හෙයින්, ගරුතර වේරගොඩ සාරද හිමිපාණෝ, ඔවුනගේ මනසට සරිලන පරිද්දෙන් බුද්ධ භාෂිතය, ඔවුන් අතට පත් කරන සේක. මුද්‍රිත හා විද්‍යුත් ප්‍රකාශන 700 ක් පමණ ලොවට පිරිනමා සිටින මේ යතිනායකයන් වහන්සේ විසින් සම්පාදිත ධර්ම භාණ්ඩාගාරය නම් ඉංග්‍රීසි කෘතිය දොරට වැඩීමේ උළෙලේ දී, ඒ පිළිබඳ ව එක් දිනක් තුල පමණක් ලැබුණු දුරකථන ඇමතුම් සංඛ්‍යාව 2000 කටත් අධික විය. ඒ නිසා එය සිංගප්පූරු රාජ්‍යයේ ග්‍රන්ථ ප්‍රකාශන ඉතිහාසයේ සුවිශිෂ්ට වාර්තාවකට හිමිකම් කියන්නේය.

දැනට, සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය භාරව වැඩ සිටින ගරු වේරගොඩ සාරද නායක ස්ථවිර පාදයන් වහන්සේ ලෝකයේ බොහෝ දේශයන් හී බුද්ධ ශාසනයේ ප්‍රගතියට හිතකාමී ධර්ම දූත මෙහෙවරක යෙදී සිටින සේක.

එතුමන් ගේ ප්‍රධාන ප්‍රකාශ අතර, සිංහල හා ඉංගිරිසි ධම්මපදයත්, ජාතක කථා පිළිබඳ විද්‍යුත් ප්‍රකාශනයත් ප්‍රධාන තැන් ගනී. එතුමන් විසින්, ඉටු කෙරෙන මහා සාමයික මෙහෙය අඛන්ඩව පවත්වා ගෙන යනු පිණිස, ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් නිදුක් නිරෝගී සුව පැතීම, බෞද්ධ ජනතාවගෙන් ඉටු විය යුතු කෘතඥතා පූර්වක චාරිත්‍රයකි.

කලා කීර්ති එඩ්වින් ආරියදාස

ISBN: 981-00-4938-2

# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත ධම්මපදය

## 6 වන පරිච්ඡේදය

# පණ්ඩිත වගග



ගරු වේරගොඩ සාරද නාහිමිපාණන් වහන්සේ
සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක

"සබ්බදානං ධම්මදානං ජිනාති"

(ධර්ම දානය, සෙසු දාන සියල්ලටම වඩා අගනේය.)



''ධර්ම භාණ්ඩාගාරය'' නැමැති

මෙම වටිනා ධර්ම පුස්තකය

**සාමවිනිසුරු බී.ධර්මදාස පියාණන්ට**

නිවන් සුව පතා ප්‍රකාශනය කරන ලදි.

පූර්ණ අනුග්‍රහකත්වය

**වේරගොඩ සුනන්දා භික්ෂුණිය විසිනි**

# ධර්ම භාණ්ඩාගාරය

සිතුවම් සහිත
## ධම්මපදය

කතෘ:

**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය



**සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය**
නො: 1, ජලන් මස් පුටේ, සිංගප්පූරුව 128607
ටෙලි: 65 67783330 65 94656570
94 770589498 / 94 755218421
වේරගොඩ ජයන්ති විහාරය, වේරගොඩ, මීටියාගොඩ
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

**කර්තෘ**
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**චිත්‍ර ශිල්පි**
පී. වික්‍රමනායක

**සැකසුම**
පියරත්න හේවාබට්ටගේ

**පරිගණක රූපාවලි සහ පූර්ව ප්‍රකාශන මෙහෙය**
පූජ්‍ය වේරගොඩ සුනන්දා භික්ඛුණී
බී. දයා සමරසිංහ
බී. රෝහණ ජයතිස්ස

**පරිගණක සහාය**
ශ්‍යාමනී ප්‍රියලක්ෂණා ලේකම්වසම්
ඩබ්ලිව්. මාලා කාන්ති
ප්‍රියංකා බෝධිපක්ෂ

**සහාය**
බී. පුෂ්පානී ධම්ලතා
බී. ජේ. ධම්ලතා
ඊ. එම්. ලයනල් මොහොට්ටි
ඊ. එම්. යුගාන් සසංක
ශ්‍රියාලතා කග්ගොඩ ආරච්චි

**පරිගණක ප්‍රකාශන**
සමනල ප්‍රින්ටර්ස්, බටපොල
ටෙලි: +94 777557127

**පිටකවරයේ පින්තූරය**
බර්ට් ගුණසේකර

**මුද්‍රණය**
2013 නොවැම්බර් මස 27 දින, සිංගප්පූරුව

**පිටකවරයේ චිත්‍රය**
*පිටකවරයේ බුදු පිළිමය වේරගොඩ ජයන්ති විහාරයේ බුදුමැදුරෙනි.*
*වර්ෂ 1953 ජුනි 3 වෙනිදා අඹන ලද මෙම බුදු පිළිමය දැනට ශ්‍රී ලංකාවේ තිබෙන*
*දර්ශනීයතම බුදු පිළිමය වශයෙන් සැලකේ. මෙම බුදු පිළිමය ඉදිකිරීමේ පුරෝගාමී වූ අපවත් වී වදාළ*
*ගෞරවාර්හ පණ්ඩිත යටලමත්තේ වජිරඤාණ නායක මාහිමිපාණන් වහන්සේට නිවන්සුව අත්වේවායි අපි ප්‍රාර්ථනා කරමු.*

මේ ග්‍රන්ථයෙහි ආගත කරුණු පිළිබඳ පූර්ණ හා සදාකාලික අයිතිය හිමි වන්නේ බුදුරජාණන් වහන්සේටයි.
බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් පහල වූ සනාතනික සත්‍යයෝ පුහුදුන් මිනිසුන් විසින් පනවන ලද
තාවකාලික වූත්, අසත්‍ය වූත්, අයිතිවාසිකම් පිළිබඳ නීති රීති පිළිගනු නොලබති.

**පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ටෙලි: 65 67783330 65 94656570
+94 770589498 +94 755218421
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

ISBN: 981-00-4938-2

6 වන පරිච්ඡේදය

# පණ්ඩිත වග්ග





*වරද දැක නිගාකොට ඔවා දෙන නැණවතා නිදන් පෙන්වන්නෙකු වැනිය.*

76. නිධීනං'ව පවත්තාරං
යං පස්සෙ වජ්ජදස්සිනං
නිග්ගය්හ වාදිං මෙධාවිං
තාදිසං පණ්ඩිතං භජෙ
තාදිසං භජමානස්ස
සෙය්‍යො හොති න පාපියො (6:1)

පෙන්වා දී වැරදි - නිදන් දක්වා ලන මෙන්
ඔවදන් දෙන නිතින් - නිසි තැන්වල ගරහමින්
කළෝතින් භජනය - එසේ කරනා වියතුන්
දියුනුවක් මිස නැත - විපතක් එබඳු ඇසුරින්

# වියතුන් වදන් - සිරසින් දරන්

## 6 (1) රාධ තෙරනුවන් ගේ ප්‍රවෘත්තිය (76 ගාථාව)

කාලක් දුගී බමුණකු ලෙස දිවි ගෙවූ **රාධ තෙරනුවන්** නිමිති කරගෙන භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි මේ ගාථාව දේශනා කරන ලදී.

දුගී අසරණ බ්‍රාහ්මණයකු වූ රාධ, භික්‍ෂූන් වහන්සේලා ගේ සුළු සුළු සත්කාර කරමින් ආරාමයෙහි කල් ගෙවූහ. භික්‍ෂූන් වහන්සේ ද ඔහුට කෑම බීම, ඇඳුම් පැළඳුම්, බේත් හේත් සපයා දෙමින් කළගුණ දැක්වූහ. රාධ භික්‍ෂූන් වහන්සේට පැවිදි වීමේ ආශාවක් ජනිත වුවද කිසිම හිමි නමක් ඔහු පැවිදි නොකළහ. හේ ඒ පිළිබඳව සිත්තැවුලෙන් පසු විය.

මේ අතරතුර දිනක් කුළුණෙන් ලොව බලන භාග්‍යවතුන් වහන්සේ ගේ නුවණ දැලට ඔහු අසු විය. ඔහුට රහත් වීමට පින් මෝරා තිබූ බව දුටු භාග්‍යවතුන් වහන්සේ ඔහු හමුවට ගොස් සුවදුක් විචාළ හ. තමන් සුවසේ ජීවත් වන නමුත් පැවිදි වීමේ ආශාව මුදුන් පත් නොවූ බව හේ බුදු සමිඳුන්ට දන්වා සිටියේ ය.

භික්‍ෂූන් තමන් වෙත කැඳවූ භාග්‍යවතුන් වහන්සේ "මේ රාධ තමන්ට කළ උදව්වක් ගැන කාටවත් මතක නැත්ද?"යි විමසූ හ. බොහෝ දෙන නිහඬව සිටියදී සැරියුත් මහ රහතන් වහන්සේ "ස්වාමීනි මා පිඬුසිඟා යන අවස්ථාවක දී මොහු, තමන්ට දෙනු පිණිස ගෙනා බත් හැන්දක් මට යොමු කළ අයුරු මතකයි" යි පැවසූ හ.''එසේ නම් සාරිපුත්ත, කළ ගුණ සලකා මොහු පැවිදි කරන්න'' යි භාග්‍යවතුන් වහන්සේ වදාළ හ. ඒ අනුව රාධ සැරියුත් හිමිපාණන් ගේ ශිෂ්‍යයකු සේ පැවිදි වූහ.

ඉතා කරුණාවෙන් රාධ රැක ගත් සැරියුත් හිමියෝ ඔහුට භාවනා උපදෙස දුන් හ. අතිශයින් කීකරු සුවිනීත භික්‍ෂුවක් වූ රාධ ඒ උපදෙස් පිළිපැද ඉතා ඉක්මණින් ම රහත් වූ හ. උන්වහන්සේ ගේ කීකරු විනීත ස්වභාවයත් සැරියුත් මා හිමිපාණන් ගේ කාරුණික ඉවසිලිමත් ගතිගුණත් ගැන භික්‍ෂූන් වහන්සේලා අතර නිතර කතා බහ ඇති විය.

වරක් ඒ පිළිබඳ භාග්‍යවතුන් වහන්සේ සමග භික්‍ෂූන් සාකච්ඡා කළ විටෙක උන්වහන්සේ ''මහණෙනි රාධ ආදර්ශයට ගෙන සෑම භික්‍ෂු නමක් ම විනීත භික්‍ෂූන් විය යුතුයැයි වදාළහ.

සාරිපුත්ත ද පෙර ජන්මයක කෙතරම් කළගුණ සැළකීම ප්‍රගුණ කළා ද යත් හුදෙකලා හස්ති රාජයෙක්ව ඉපිද තම පයෙහි තුවාලයක් සුව කළ වඩු කාර්මිකයනට කෘතඥතාව දක්වනු වස් තම පුත් ඇත් පැටවා පරිත්‍යාග කළේය" යි වදාළ හ. රාධ තෙරුන් ගේ අවවාද පිළිගැනීමේ ගුණය අගය කරමින් මේ ගාථාව ද දේශනා කළ සේක.

**විවරණාත්මක අනුවාදය (76 ගාථාව)**

**වජ්ජදස්සිනං නිග්ගය්හවාදිං යං මෙධාවිං නිධීනං**
**පවත්තාරං ඉව පස්සෙ, තා දිසං පණ්ඩිතං භජෙ ,**
**තාදිසං භජමානස්ස සෙය්‍යො හොති පාපියො න.**

**වජ්ජදස්සිනං**: වරද පෙන්වා දෙන; **නිග්ගය්හවාදිං**: නිග්‍රහ කළ යුතු තැන එසේ කරන; **යං**: කිසියම්; **මෙධාවිං**: නුවණැත්තකු; **නිධීනං**: නිධානයක්; **පවත්තාරං**: පෙන්වා දෙන්නකු; **ඉව**: මෙන්; **පස්සෙ**: දකින්නේ නම්; **තාදිසං**: එබඳු ; **පණ්ඩිතං**: පඬිවරයකු; **භජෙ**: ඇසුරු කරන්න; **තාදිසං**: එබන්දකු; **භජමානස්ස**: ඇසුරු කරන්නහුට; **සෙය්‍ය හොති**: යහපතක්ම වන්නේ ය; **පාපියො**: වරදක්; **න**: නොවන්නේය.

යමෙක් තමන් ගේ වරද පෙන්වා දෙමින් නිග්‍රහ කළ යුතු තැන නිග්‍රහ කරත් නම් එබඳු නුවණැත්තා නිධානයක් පෙන්වා දෙන කෙනකු මෙන් සිතා ගෙන ආශ්‍රය කළ යුතුය. එවැන්නන් ආශ්‍රය කරන විට අපට යහපතක් ම මිස විපත්තියක් නො වන්නේ ය.

**විවරණය**

**වජ්ජදස්සිනං නිග්ගය්හ වාදිං**: අපගේ වරද දැක එය පෙන්වා දී නිසි නිග්‍රහය කරන්නවුන් මින් අදහස් වෙයි. මේ ගතිගුණ දෙක පවතින්නේ සාධනීය ලෙස විවේචනය කරන්නන් තුළ ය. සමහරුන් වැරදි සොයන්නේ පුද්ගලයන් වනසාලන අටියෙනි. එහෙත් මෙහි දැක්වූයේ නිර්මාණශීලී විවේචනය හෙවත් අඩුපාඩු හදාගෙන නිවරද වන්නට ආධාරී වන කාරුණික විවේචනය ගැන ය. එබඳු කෙනකු වරදක් පෙන්වා දෙන විට එය නිධානයක් පෙන්වා දීම සේ ගත යුතුය. තම වරද දුරුකර ගෙන වඩාත් පරිපූර්ණ, නිවැරදි හොඳ ගුණ ඇති කාගේත් ප්‍රශංසාවට ලක්වන තැනැත්තකු වීම සඳහා කෙරෙන උපකාරයක් වශයෙන් එබඳු විවේචන සලකන විට මේ කියුමෙහි අගය වැටහෙනු ඇත.





*ඔවාදෙන, අනුශාසනා කරන, පවින් වළක්වන තැනැත්තා සුදනනට ප්‍රිය ය. දුදනට අප්‍රියය.*

77. ඔවදෙය්‍යානුසාසෙය්‍ය
අසබ්භා ච නිවාරයෙ
සතං හි සො පියො හොති
අසතං හොති අප්පියො (6.2)

ඔවදන් අනුසාසනා
කර නරකින් වලකනා
අයට ප්‍රියයි සත්දනා
දුදනන් ප්‍රිය නොම වෙනා

# සුදනන් හට දුන් ඔවදන් - අමවන් වේ සවණට වන්
## 6 (2) අස්සපි හා පුනබ්බසුක දෙනම ගේ කථාව (77 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **අස්සජි** හා **පුනබ්බසුක** හිමිවරුන් අරබයා මේ ගාථාව වදාළ සේක.

අස්සජි හා පුනබ්බසුක යන නම් ඇති භික්ෂූ දෙනම යහපත් පවුල් වලින් අවුත් අග්‍රශ්‍රාවක හිමිවරුන් දෙදෙන වෙත පැවිදි වූහ. එහෙත් ඔවුහු විනය ගරුක නොවී ලජ්ජා භය නැතිව කෙළිලොල් ජීවිත ගත කළහ. ඔවුන් කීටාගිරියේ වාසය කළේ තවත් පන්සියයක් පමණ පිරිවර භික්ෂූන් ද කැටිව ය.

ඔවුහු භාවනා කරනු වෙනුවට මල් වවා මල් දම් ගොතා ළඳුන්ට දීම, සුරා පානය, නැටුම් ගැයුම් කිරීම වැනි විනය විරෝධී ක්‍රියා රැසක්ම කරමින් එම විහාරස්ථානයට කිසිම ගුණවත් සිල්වත් හිමි නමකට යන්නට බැරි තත්ත්වයක් උදා කළ හ.

මේ දුසිරිත් ඇසූ භාග්‍යවතුන් වහන්සේ සැරියුත් මුගලන් මහ රහත් දෙනම කැඳවා "ඔබ දෙපල කීටාගිරියට ගොස් මේ කුලදූෂණාදිය කරන මහණුන්ට අවවාද කරන්න. යමෙක් අවවාද ප්‍රතික්ෂේප කරත් නම් ඔවුන් නෙරපා හරින්න. පිළිගන්න අයට නැවත නැවත අවවාද කර නඟා සිටුවන්න." යි උපදෙස් දුන් හ.

අග්‍රශ්‍රාවක දෙනම ද බුද්ධාවවාදය පරිදි කීටාගිරියට ගොස් එම භික්ෂූන් කැඳවා උපදෙස් දුන් හ. ඇතැම් භික්ෂූහු ඒ අවවාද පිළිගෙන සදාචාර සම්පන්න වූහ. සමහරු නැවත ගිහිගෙට ම ගිය හ. තවත් සමහරුන් බලහත්කාරයෙන් යවන්නට සිදු විය.

මේ ඇරබ භාග්‍යවතුන් වහන්සේ අවවාද ප්‍රිය නොවන්නේ අඥානයන්ට පමණකැයි වදාරා මේ ගාථාව ද දේශනා කළ සේක.

### විවරණාත්මක අනුවාදය (77 ගාථාව)

**ඔවදෙය්‍ය අනුසාසෙය්‍ය,අසබ්භා ච නිවාරයෙ, සො සතං හි පියො හොති, අසතං අප්පියො හොති**

**ඔවදෙය්‍ය**: අවවාද කරන්නේ නම්; **අනුසාසෙය්‍ය**: අනුශාසනා කරන්නේ නම්; **අසබ්භා ච නිවාරයෙ**: සමාජ විරෝධී කටයුතු වලින් වලකන්නේ නම්; **සො**: එබඳු තැනැත්තා; **සතං හි**: සත්පුරුෂයනට; **පියො හොති**: ප්‍රිය වන්නේ ය; **අසතං**: අසත් පුරුෂයනට; **අප්පියො හොති**: අප්‍රිය වන්නේ ය.

අවවාද කරන, අනුශාසනා කරන, අසභ්‍ය පැවතුම් වලින් වළකන තැනැත්තා සත්පුරුෂයාට ප්‍රියවෙයි. අසත් පුරුෂයන්ට ඔහු ප්‍රිය නොවන්නේ ය.

### විවරණය

**ඔවදෙය්‍ය-අනුසාසෙය්‍ය**: අවවාද කිරීම හා අනුශාසනා කිරීම යන මේ වචන දෙකහි අර්ථ විභේදයත් ඇතැම් අටුවාවල එයි. යමක් කළ පුද්ගලයකු වෙත ගොස් ඔහු ඇසුරු කොට කළ යුතු-නොකළ යුතු දේ කියා දීම අවවාද වෙයි. යමක් කර නැතත්,  මෙසේ කළ හොත් මෙසේ වෙයි, මෙය නොකළොත් මෙසේ වෙයි ආදී වශයෙන් අනාගත චර්යාව පිළිබඳ කෙරෙන උපදෙස් දීම අනුශාසනා නම්. අවවාදය අවවාද ලබන පුද්ගලයා කායික වශයෙන් අභිමුඛව සිටින විට කරන්නකි. අනුශාසනාව අනභිමුඛයේ වුවද දූතයකු මගින්, ලිපියක් මගින් වැනි කිසියම් සන්නිවේදන මාධ්‍යයකින් කළ හැකි ය. තවත් අර්ථයක් නම්, වරක් පමණක් කරන්නේ අවවාදයයි. දිගින් දිගට ම කරන්නේ අනුශාසනයයි යන්න ය.

**අසබ්භාව නිවාරයෙ**: සමාජයට, සභාවට අයෝග්‍ය වූ දෙයින් වළකා ලීම.  ප්‍රාණඝාතය, සොරකම් කිරීම වැනි පංච දුෂ්චරිතය සමාජ විරෝධී චර්යා වෙයි. මේවායින් වළකින පුද්ගලයා සමාජයේ අනිකුත් පුරවැසියනට බිය සැක නැතිව ජීවත් වීමට යෝග්‍ය පරිසරය සකසා දෙයි. සියළු සදාචාර චර්යාවන් ගේ පසුබිමෙහි ඇත්තේ මෛත්‍රී හා කරුණා සහගත හැඟීම්ය. මෙම චේතනාවන් ගෙන් තොරව කෙරෙන හැසිරීම් සමාජ විරෝධී බව කිව හැක. මෛත්‍රී හා කරුණා ඇත්තකුට පංච දුෂ්චරිතයෙහි යෙදිය නො හැක. රාග, ද්වේෂ හා මෝහ වැනි පාපී චේතනා ඇත්තනට සමාජ ද්‍රෝහී හැසිරීම් වල යෙදිය හැකයි.

යමකු ගේ චරිතය ගොඩ නැඟෙන්නේ තමන් ගේ ම චර්යාව නිසා ය. කෙනෙකුට තවත් කෙනෙකුන් ගේ චරිතය යහපත් කළ නොහැක. හුදෙක් අවවාද අනුශාසනා මගින් උදවු කළ හැකි වුව ද තම සුසිරිත තමා විසින් ම වර්ධනය කළ යුත්තේ ය.

"පාපය අතහැර දැමිය හැකයි. එසේ නොහැකි නම් පව් නො කරන්නැයි මම උපදෙස් නො දෙමි. කුසලය වර්ධනය කළ හැකිය. එසේ නොහැකි නම් කුසලය වර්ධනය කරන්නැයි මම උපදෙස් නො දෙමි." යි භාග්‍යවතුන් වහන්සේ වදාළ හ. යමකුට සැබවින් ම හැකි වන්නේ මෙබඳු අවවාද කිරීම පමණි.





*පව්ටු මිතුරන් හා සැහැසි පුරිස් නො සෙවිය යුතුය. කළණ මිතුරන් හා උතුම් පුරිස් සෙවිය යුතුය*

| | |
|---|---|
| 78. න භජෙ පාපකෙ මිත්තෙ<br>න භජෙ පුරිසාධමෙ<br>භජෙථ මිත්තෙ කල්‍යාණෙ<br>භජෙථ පුරිසුත්තමෙ (6:3) | පව්ටු මිතුරන් ඇසුරු නොකරනු<br>පහත් මිනිසුන් දුරින් දුරලනු<br>කළණ මිතුරන් උතුම් මිනිසුන්<br>පමණක්ය ඔබ ඇසුරු කලයුතු |

# කරනු ඇසුරු - කලණ මිතුරු

## 6 (3) ඡන්න හිමියන් ගේ වස්තුව (78 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වාසය කරන සේක් **ඡන්න හිමියන්** අරබයා මේ ගාථාව වදාළ සේක.

මහාභිනිෂ්ක්‍රමණය කරන අවස්ථාවේදී සිදුහත් කුමරුන් මාලිගයෙන් පිටත්ව අසුපිටින් ගිය ගමනේදී සිදුහත් කුමරුන් හා එක්ව ගියේ ඡන්න අමාත්‍යයා ය. පසුව සිදුහත් කුමරුන් බුදු බව ලත් බව ඇසූ ඡන්න බුදුරදුන් සොයා අවුත් පැවිද්ද ලද්දේ ය.

පැවිද්ද ලත් පසු බුදු රදුන් ගේ අභිනිෂ්ක්‍රමණයට උදවු කිරීමේ භාග්‍යය හිමි වීම හේතුවෙන් ඡන්න හිමියෝ මානයෙන් පිම්බී සිටිය හ. "අභිනිෂ්ක්‍රමණ කරන වෙලාවේ මමයි තනියට හිටියේ. මම ඇරෙන්න කවුරුවත් හිටියේ නෑ එදා. ඒ වුණාට දැන්නම් සැරියුත් හාමුදුරුවොයි මුගලන් හාමුදුරුවොයි දෙන්නා 'අපි තමයි අග්‍ර ශ්‍රාවක' කියා ගෙන හැම තැනම යනවා" යි ඡන්න හිමියෝ නිතරම දොස් පරොස් කී හ.

භාග්‍යවතුන් වහන්සේ ඡන්න හිමි කැඳවා අවවාද කළ හ. ඒ අවස්ථාවේ නිහඬව අවවාද අසා සිටි නමුත් අග සවුවන් විවේචනය කිරීම අත නොහරින ලදී. ඒ නිසා ඡන්න හිමි නැවත ගෙන්වා අවවාද කරන්නට භාග්‍යවතුන් වහන්සේට සිදු විය. තුන් වරක් ම අවවාද කළ ද වෙනසක් නොවූ හෙයින් භාග්‍යවතුන් වහන්සේ අවසන් වරට ද මෙසේ වදාළ හ. "ඡන්න, මේ උත්තමයන් වහන්සේලා දෙනම ඔබට හිතවත්ය. ඒ අය ඇසුරු කරන්න. උන්වහන්සේලාත් සමග සමගියෙන් සතුටින් වසන්න."

දිගින් දිගට ම මෙසේ බුදුරදුන් විසින් උපදෙස් දෙන ලද නමුත් ඡන්න හිමියෝ අත්තනෝමතිකව ක්‍රියා කරමින් අනිකුත් හිමිවරුන්ට නිගරු කරමින් හැසුරුණ හ. තමන් ජීවතුන් අතර වසන තාක් ඡන්න වෙනස් නොවන බව පැවසූ භාග්‍යවතුන් වහන්සේ, තමන් වහන්සේ ගේ පරිනිර්වාණයෙන් පසු උන්වහන්සේ වෙනස් වෙතැයි පැවසූ හ. පරිනිර්වාණ අවස්ථාවේදී අනඳ හිමියන් ඇමතූ බුදුරජාණන් වහන්සේ ඡන්න හිමියනට බ්‍රහ්මදණ්ඩය පණවන සේ උපදෙස් දුන් හ. බ්‍රහ්මදණ්ඩය නම්, වරදකරු සහමුලින් ම නො තකා හැරීමයි. බුද්ධ පරිනිර්වාණයෙන් පසු තමන්ට බ්‍රහ්මදණ්ඩය පණවා ඇති බව ඇසූ ඡන්න හිමියෝ බලවත් සංවේගයට පත්ව තුන් වරක් ම සිහි නැතිව වැටුණ හ. තම වරද පිළිගෙන භාවනා කර රහත් ඵලය ලබා ගත් උන්වහන්සේ සංඝයා කමා කරවා ගෙන දඬුවම ඉවත් කර ගත් හ.

### විවරණාත්මක අනුවාදය (78 ගාථාව)

**පාපකෙ මිත්තෙ න භජෙ පුරිසාධමෙ න භජෙ කල්‍යාණෙ මිත්තෙ භජෙථ පුරිසුත්තමෙ භජෙථ.**

**පාපකේ මිත්තෙ**: නරක මිතුරන්; **න භජේ**: ඇසුරු නො කරන්න; **පුරිසාධමෙ**: අධම පුරුෂයන්; **න භජේ**: ආශ්‍රය නො කරන්න; **කල්‍යාණ මිත්තෙ**: යහපත් මිත්‍රයන්; **භජේථ**: ආශ්‍රය කරන්න; **පුරිසුත්තමෙ**: උතුම් පුරුෂයන්; **භජේථ**: ආශ්‍රය කරන්න.

පාප මිත්‍රයන් ඇසුරු නො කරන්න. පහත් මිනිසුන් ඇසුරෙන් වලකින්න. කළණ මිතුරන් ම ඇසුරු කරන්න. උතුම් අය ම ආශ්‍රය කරන්න.

### විවරණය

**මිත්ත**: බෞද්ධ සාහිත්‍යයෙහි මිත්‍රත්වය පිළිබඳව ගැඹුරු හා සිත්ග න්නා සුලු විවරණ දක්වා තිබේ. සමස්ත බෞද්ධ චරණය ම කල්‍යාණ මිත්‍රත්වය මත රඳා ඇතැ යි ද එක් තැනක සඳහන්ව ඇත.

අට්ඨකථාවන් හි මිත්‍රයන් වර්ග හතක් දක්වා තිබේ. එනම්:-

1. **පාණ සඛා**: අවන්හලේ දී සුරා පානය සඳහා මිතුරුවන්නෝ,
2. **සම්මිය සම්මියො**: හමු වූ විට පමණක් මිත්‍රත්වය දක්වන්නෝ,
3. **අත්‍ථෙසු ජාතෙසු**: යම්කිසි කාරියක් කර ගැනීම සඳහා මිතුරු දම් දක්වන්නෝ,
4. **උපකාරක**: අවශ්‍ය අවස්ථාවට ඉදිරිපත්ව උදවු කරන මිත්‍රයෝ,
5. **සමාන සුඛ දුක්ඛ**: සැපේදී මෙන් ම දුකේදී ද එකට සිටින මිත්‍රයෝ,
6. **අත්ථක්ඛායී**: වරදින් වළකා යහ මග යොදවමින් දියුණුවට අතදෙන මිත්‍රයෝ,
7. **අනුකම්පක**: අපට විපතක් වන විට දුක් වන අපේ සැපයේ දී සතුටු වන සුහද මිතුරෝ. මොවුහු යම් යම් අය අපේ අගුණ පවසන විට එය වලකා ගුණ කියන විට ප්‍රශංසා කරති.

හොඳ මිතුරන් හඳුන්වන්නේ කල්‍යාණ මිත්‍ර නමිනි. නරක මිතුරෝ පාපමිත්ත වශයෙන් හැඳින්වෙති.

සිඟාලෝවාද සූත්‍රයෙහි මිත්‍රයන් වර්ග 8 ක් දැක්වෙයි. එයින් හතර වර්ගයක් හොඳ මිතුරෝ ය. හතර වර්ගයක් නරක මිතුරෝ ය.

හොඳ මිතුරෝ නම්;

(1) **උපකාරක මිත්ත**: අවශ්‍ය අවස්ථාවේදී ඉදිරිපත්ව උපකාර කරන්නා
(2) **සමාන සුඛ දුක්ඛ මිත්ත**: දුකේ දී හා සැපේදී එකසේ සිටින මිත්‍රයා.
(3) **අත්ථක්ඛායී මිත්ත**: හිත වැඩ සලසන, විපතේ දී සුරකින මිත්‍රයා.
(4) **අනුකම්පක මිතත**: දියුණුවේදී සතුටු වන, පසසන, සුහද, මිතුරු, යන සිවු දෙනා ය.

නරක පාප මිත්‍රයෝ නම්;

(1) **අඤ්ඤදත්ථුහර**: යමක් ලබා ගැනීම සඳහා ම මිතුරු වන තැනැත්තා.
(2) **වචීපරම**: වචනයෙන් පමණක් උදවු කරන තැනැත්තා.
(3) **අනුප්පියභාණී**: හොඳ දේ මෙන්ම නරක දේත් අනුමත කරන තැනැත්තා.
(4) **අපාය සහාය**: මත්පැන් වැනි දුසිරිත් කෙරේ යොමු කරන මිත්‍රයා යන සිවු දෙනා ය.



*දහම් රස බොන තැනැත්තා සුවසේ වෙසේ. ඒ නුවණැත්තා අරියයන් විසින් දන්නා ලද දහම්හි මොනවට ඇලේ.*

79. ධම්මපීති සුඛං සෙති
විප්පසන්නෙන චෙතසා
අරියප්පවෙදිතෙ ධම්මෙ
සදා රමති පණ්ඩිතො (6:4)

දම් රස විඳ වෙසෙති
සුවසේ සිත් පහන් කර
උතුමන් දෙසූ දහමෙහි
සැමදා ඇලෙති පඬිවරු

# වෙසෙමු සුවයෙන් - දහම ඇසුරෙන්

## 6 (4) මහා කප්පින හිමියන් ගේ කතා පුවත (79 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **මහා කප්පින මහ රහතන් වහන්සේ** ඇරබ මේ ගාථාව වදාළ සේක.

මහා කප්පින කුක්කුටවතියෙහි රජතුමා ය. එතුමා ගේ දේවිය වූයේ අනෝජා ය. රට පාලනයෙහි ලා උපකාර පිණිස එතුමාට ඇමතිවරු දහසක් වූ හ. දිනක් ඇමතිවරුන් පිරිවරා උයනට ගිය රජතුමාට සැවැත් නුවර සිට පැමිණි වෙළඳුන් පිරිසක් හමු විය. ඔවුන් වෙතින් ත්‍රිවිධ රත්නය ගැන දැනගත් රජතෙම ඇමතිවරුන් ද කැටුව වහා ම සැවැත්නුවර බලා පිටත් විය.

එදින මහා කරුණාවෙන් ලොව බලා වදාරන භාග්‍යවතුන් වහන්සේට මහා කප්පින රජතුමා සහ පිරිස දිස් විණි. ඔවුනට රහත් වීමට හැකියාව ඇති බව ද උන්වහන්සේට වැටහිණි. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් හමු වීම පිණිස සැවැත් නුවරින් යොදුන් එකසිය විස්සක් දුර තැනකට වැඩම කළ හ. එහි චන්ද්‍රභාග නදී ඉවුරේ නුග තුරු සෙවනක උන්වහන්සේ වැඩ හුන් හ. භාග්‍යවතුන් වහන්සේ වැඩ හුන් තැනට මහා කප්පින රජ සහ ඇමතිවරු සම්ප්‍රාප්ත වූහ. සවනක් බුදුරැසින් බබලමින් වැඩසිටි බුදුරදුන් දුටු ඔවුහු උන්වහන්සේ වෙත එළැඹුණ හ. භාග්‍යවතුන් වහන්සේ ඔවුනට ධර්මය දේශනා කළ හ. ඒ අසා ඔවුහු හැමදෙන සෝවන් ඵලයට පත්ව පැවිද්ද අයැද සිටිය හ. බුදුරජාණන් වහන්සේ ඔවුන් හැම දෙන ඒහිභික්ඛුපබ්බජ්ජාවෙන් පැවිදි කළහ.

රජතුමා සැවැත් නුවරට ගිය පුවත ඇසූ අනෝජා දේවිය ඇමතිවරුන් ගේ බිරින්දන් දහස ද ගෙන්වා ගෙන රජතුමා ගිය මඟින් ම සැවැත් නුවර බලා පිටත් වූවා ය. ඔවුහු ද බුදුරදුන් වැඩ සිටි තැනට පැමිණ සවණක් බුදු රැස් විහිදුවමින් වැඩ සිටි බුදුන් දැක පැහැදී නමස්කාර කළ හ. එම අවස්ථාවේදී භාග්‍යවතුන් වහන්සේ දේවිය හා පිරිසට රජතුමා හා පිරිස නොපෙනෙන පරිදි අධිෂ්ඨාන කළ හ.

රජතුමා හා පිරිස කොහිදැයි විමසූ දේවියට තව නොබෝ වේලාවකින් ඔවුන් ඔබට දැකගත හැකි යැයි වදාළ භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට ධර්ම දේශනා කළ හ. දේවිය හා පිරිස දහම් අසා සෝවාන් වූ අතර එම දෙසුමට සවන් දී සිටි රජතුමා ඇතුළු පිරිස රහත් ඵලය ලැබූහ. අනතුරුව ඒ වන විට පැවිද්ද ලබා සිටි රජතුමා සහ ඇමති පිරිස දේවීනට දක්නට ලැබිණි. එම භික්ෂු පිරිස තම සැමියන් බව හඳුනාගත් ඔවුහු තමන් ද පැවිදි කරන සේ බුදුරදුන්ගෙන් ඉල්ලා සිටිය හ. බුදුරදුන් ගේ උපදෙස් පරිදි සැවැත් නුවරට ගිය ඔවුහු පැවිද්ද ලබා නොබෝ දිනකින් ම රහත් ඵලය ලැබූ හ. භාග්‍යවතුන් වහන්සේ ද දහසක් භික්ෂූන් පිරිවරා දෙව්රම් වෙහෙරට වැඩම කළ හ.

දෙව්රම් වෙහෙර වැඩ වසන මහා කප්පින හිමියන් දිවා රෑ විවේකයෙන් පසුවන අවස්ථාවන් හි "මොන තරම් සුවදායක ද?" (අහෝ සුඛං) යි නිතර පවසනු අසන්නට ලැබිණ. ඒ ඇසූ භික්ෂූහු ඒ බව භාග්‍යවතුන් වහන්සේට සැළ කළ හ. "ම පුත් කප්පින ධර්මාස්වාදය විඳ ගනිමින් සිත පහන් වූ හෙයින් සුවපත්ව එම සුවය ගැන උදන් අනයි" යි වදාළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළ හ.

### විවරණාත්මක අනුවාදය (79 ගාථාව)

**ධම්ම පීති විප්පසන්නෙන චෙතසා සුඛං සෙති පණ්ඩිතො**
**අරියප්පවෙදිතෙ ධම්මෙ සදා රමති.**

**ධම්ම පීති**: දහම් රස විඳින තැනැත්තා; **විප්පසන්නෙන චෙතසා**: පහන් සිතින්; **සුඛං සෙති**: සුවපත්ව වසයි; **පණ්ඩිතො**: නුවණැත්තා; **අරියප්පවෙදිතෙ**: ආර්යයන් වහන්සේලා විසින් වදාරන ලද; **ධම්මෙ**: ධර්මයෙහි; **සදා**: හැමකල; **රමති**: ඇලෙයි.

ධර්මයෙහි රස විඳින තැනැත්තා ප්‍රසන්න සිතින් සුවසේ වාසය කරයි. නුවණැත්තා බුද්ධාදී ආර්යයන් වහන්සේලා විසින් වදාරන ලද ධර්මයෙහි හැම කල සිත් අලවයි.

### විවරණය

**ධම්ම පීති සුඛං සෙති**: යන්නෙන් ධර්මය ඉගෙන පිළිපදිමින් එමගින් ආස්වාදයක් ලබා ගන්නා තැනැත්තා සුවසේ වසන බව ය. මෙහි පීති යන්නෙන් 'පානය කරන' යන අදහස ලැබේ. ධර්මය පානය කිරීම යන්නෙන් එය ජීවිතයට එක්කර ගැනීම අදහස වෙයි.

**අරිය**: නම් කෙළෙසුන් දුරු කර උසස් බවට පත් උත්තමයෝ ය. ජාති වාචක 'ආර්ය' යන්න මෙයින් නො ගැණෙයි. බුදු සමයෙහි දී ආර්ය වන්නේ උදාර වූ චරිත ශක්තියත්, ගුණ වගාවත් ඇති බුදුන්, රහතුන් වැනි උත්තමයෝ ය.





*දිය ගෙනයන්නෝ දිය ද, හී වඩුවෝ හී ද, ලී වඩුවෝ ලී ද සකස් කරති. එසේ පණ්ඩිතයෝ සිත දමනය කරත්.*

80. උදකං හි නයන්ති නෙත්තිකා
උසුකාරා නමයන්ති තේජනං
දරුං නමයන්ති තච්ඡකා
අත්තානං දමයන්ති පණ්ඩිතා (6:5)

දිය හරවද්දී ගොවියන්
හී නවද්දී කම්කරුවන්
ඇද හරිද්දී වඩුවන් ලී
නැණැති දනෝ නමති තමන්

# තමන් සිත දමනය කරති පඬිවරු

## 6 (5) පණ්ඩිත සාමණේරයන් ගේ වස්තුව (80 ගාථාව)

**පණ්ඩිත සාමණේරයන්** අරබයා භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළේ සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි ය.

සැවැත් නුවර ධනවතකු ගේ පුත්‍රයා වූ පණ්ඩිත වයස අවුරුදු හතේදී පැවිදි බිමට පත් විය. දිනක් සැරියුත් හිමියන් ද සමග පිඬුසිඟා යන අතරතුර ගොවියන් තම කෙත් වලට ජලය හරවන ආකාරය උන්වහන්සේ ගේ නෙත ගැටිණි. "සිත් පිත් නැති ජලය අප කැමති ඕනෑම තැනකට හරවා ගෙන යත හැකි ද?" යි පණ්ඩිත සාමණේරයෝ සැරියුත් මහ තෙරුන්ගෙන් විමසූ හ. "ඔව්. අප කැමති ඕනෑම තැනකට ජලය ගෙන යත හැකියි" සැරියුත් මහ තෙරණුවෝ පිළිතුරු දුන් හ. තවත් මඳ දුරක් ගිය පසු පණ්ඩිත සාමණේරයන් ගේ නෙත ගැටුණේ හී වඩුවන් උණ ලී ඇද ඇර මුවහත් කර ඊතල හදන ආකාරයයි. තවත් ටිකක් දුර ගිය විට වඩු කාර්මිකයන් ලී දඬු තමා කැමති පරිදි කපමින් ඇද හරිමින් හැඩ වැඩ යොදමින් කරත්ත රෝද වැනි දේ නිර්මාණය කරන අයුරු දක්නට ලැබිණ.

මේ සියල්ල දුටු සාමණේර නම මෙසේ සිතීය. "ජලය අප කැමති කැමති තැනකට ගෙන යා හැකි නම්, ඇද ඇති උණ ලී ඇද ඇර උල් කර ඊතල තනා ගත හැකි නම්, සිත් පිත් නැති ලී දඬු කපා කැමති හැඩයේ උපකරණ තනා ගත හැකි නම්, සිත් ඇති මට මා රිසි පරිදි සිත දමනය කර කෙළෙසුන් ගෙන් මුදා සංවර කර ගන්නට බැරි ඇයි?" එසේ සිතා ගුරු හිමිපාණන් ගෙන් අවසර ගෙන පිඬුසිඟා යාම නවතා හැරී අවුත් තම ඕවරකයට පිවිසුණු පණ්ඩිත සාමණේරයෝ උත්සාහයෙන් හා උද්යෝගයෙන් භාවනා කරන්නට පටන් ගත්හ. ඒ දුටු දෙවිවරුන් පවා ප්‍රසාදයට පත්ව ආරාමය හා පරිසරය නිහඬව තබා උදව් කළ බව කියවෙයි. දවල් දන් වේලාව එළඹෙන විට සාමණේරයන් වහන්සේ අනාගාමී ඵලය ලබා තිබිණි.

මේ වන විට සැරියුත් මහ රහතන් වහන්සේ සාමණේරනමත් සමග පිණ්ඩපාතය රැගෙන ආපසු වැඩම කරමින් සිටියහ. සාමණේරනම අනාගාමී ඵලය ලබා ඇති බවත් දිගටම භාවනාවෙහි නිරත වුවහොත් නොබෝ වේලාවකින් රහත් ඵලය ලබන බවත් දිව්‍යසින් දුටු භාග්‍යවතුන් වහන්සේ සැරියුත් හිමියන්, සාමණේර හිමියන් විසූ ඕවරකයට පිවිසීම වලකා ලන්නට ඉටා ගත් හ. උන් වහන්සේ සැරියුත් හිමියන් වඩිනා මඟට ගොස් ප්‍රශ්න කිපයක් අසා සාකච්ඡාවේ නිරත වූහ. එම සාකච්ඡාව සිදුවන අතරතුර පණ්ඩිත සාමණේරයෝ රහත් ඵලය ලද හ. මේ වන විට උන්වහන්සේ පැවිදිවී ගෙවී තිබුණේ දින හතක් පමණි. අටවන දින වන විට උන්වහන්සේ රහත් නමක් බවට පත් වූහ.

මේ කරුණ සම්බන්ධයෙන් භික්ෂූන් වහන්සේලා ඇමතූ භාග්‍යවතුන් වහන්සේ "යමකු අවංකව උනන්දුවෙන් භාවනා කරන විට ශක්‍රාදී දෙවිවරු පවා ආරක්ෂාව සලසති. පණ්ඩිත සාමණේරයන් ගේ භාවනාවට බාධාවක් නොවනු පිණිස මම ද සැරියුත් තෙරණුවන් නවතා සිටියෙමි. පරිසරයෙන් ලත් පාඩම් අනුව සාමණේරයෝ දැන් මහ රහතන් වහන්සේ නමක් බවට පත්ව සිටිති" යි වදාළ හ.

#### විවරණාත්මක අනුවාදය (80 ගාථාව)

**නෙත්තිකා හි උදකං නයන්ති උසුකාරා තේජනං**
**නමයන්ති තච්ඡකා දාරුං නමයන්ති පණ්ඩිතා අත්තානං**
**දමයන්ති.**

**නෙත්තිකා**: දියාළුවෝ (දිය ගෙන යන්නෝ); **හි**: ඒකාන්තයෙන්; **උදකං**: ජලය; **නයන්ති**: ගෙනයති; **උසුකාරා**: හී වඩුවෝ; **තේජනං**: ඊතල; **නමයන්ති**: හැඩ ගන්වති; **තච්ඡකා**: වඩුකාර්මිකයෝ; **දාරුං**: ලී; **නමයන්ති**: හැඩ ගන්වති; **පණ්ඩිතා**: නුවණැත්තෝ; **අත්තානං**: තමා; **දමයන්ති**: දමනය කරති.

දියාළුවෝ හෙවත් ජලය හරවා ගන්නා ගොවියෝ තමා රිසි පරිදි ජලය හරවා ගෙන යති. ඊතල හදන්නෝ ඊතලය තමන් කැමති පරිදි ඇද හැර සකස් කර ගනිති. වඩු කාර්මිකයෝ ලී දඬු කපා නවා හැඩ කර භාණ්ඩ නිර්මාණය කරති. නුවණැත්තෝ තමා දමනය කරති.

#### විවරණය

**නෙත්තිකා: උසුකාරා: තච්ඡකා**: නමින් දක්වා ඇත්තේ ක්ෂේත්‍ර තුනක දක්ෂයෝ ය. තම තමාට අදාළ කාර්යයන්හි ඔවුහු විශේෂඥයෝ ය. මේ තෙවර්ගයේ ම ශිල්පීහු සිත් පිත් නැති දේ තමා රිසි පරිදි නමා හැඩ කොට භාවිත කරති. ජලය, උණ ලී හා දැව දඬු ඔවුන් රිසි පරිදි භාවිත කරති. නුවණැත්තෝ මෙ පරිදිම තමා රිසි පරිදි තම සිත දමනය කරති. සිත දමනය කිරීම පෙර දැක්වූ ක්‍රියා තුනට ම වඩා අපහසු ය.






*ගල් පව්ව යම් සේ සුළඟින් නො සැලේ ද, එසේ ම නුවණැත්තෝ නිගා, පැසසුම්හි නො සැලෙති.*

81. සෙලො යථා ඒකඝනො
වාතෙන න සමීරති
එවං නින්දා පසංසාසු
න සමිඤ්ජන්ති පණ්ඩිතා (6:6)

මහ ගල් පර්වතයක් මෙන්
නො සැලෙන සැඩ වා පහරින්
නො සැලෙත් පඬිවරු ලැබුමෙන්
කිත් පැසසුම් හෝ අවමන්

# නුවණැත්තෝ නො සැලෙන්නෝ

## 6 (6) ලකුණ්ටක භද්දිය තෙරුන්ගේ වස්තුව (81 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි බුදුරජාණන් වහන්සේ **භද්දිය තෙරුන්** ඇරබ මේ ගාථාව වදාළ සේක.

ජේතවනාරාමයෙහි වාසය කළ භද්දිය තෙරුන් වහන්සේ මිටි වූ හෙයින් අවශේෂ භික්ෂූහු උන්වහන්සේට ලකුණ්ටක භද්දිය යැයි නම් කළ හ. උන්වහන්සේ ඉතා නිහතමානී සුහද පැවතුම් ඇති කෙනක් වූ හ. සියල්ලෝ ම උන්වහන්සේ සමග විහිළු කළහ. සතුටු සාමීචි කතා කළ හ. සමහරු හිස නිකට අත ගෑහ. නාසයෙන් ඇල්లූ හ. සමහරු "කොහොම ද මාමේ, පන්සලේ ජීවිතේ කොහොම ද? එපාවෙන්නේ නැත් ද?" යි විමසති. එහෙත් භද්දිය හිමියෝ කිසි විටෙක අමනාප නො වෙති. අවමන් වදනක් නො තෙපලති. යටි සිතින් වත් කෝප නොවෙති.

ලකුණ්ටක භද්දිය තෙරුන් ගේ මේ ඉවසිලිමත් ස්වභාවය ගැන භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට දැනුම් දුන්හ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "රහත් නමක් කිසි විටෙක කෝප නො ගනියි, නපුරු වචනයක් නො කියයි. නපුරක් නො සිතයි. උන්වහන්සේ  සුළඟින් නො සැලෙන පර්වතයක් හෝ ගල් කුළක් බඳු ය. රහතන් වහන්සේ නින්දාවෙන් හෝ ප්‍රශංසාවෙන් කම්පා නොවෙති" යි වදාළ හ.

### විවරණාත්මක අනුවාදය (81 ගාථාව)

**යථා එකඝනො සෙලො වාතෙන න සමීරති. එවං**
**පණ්ඩිතා නින්දා පසංසාසු න සමිඤ්ජන්ති.**

**යථා**: යම්සේ; **එකඝනො**: ඝණ; **සෙලො**: ගල් පර්වතයක්; **වාතෙන**: සැඩ සුළඟින්; **න සමීරති**: නො සැලේ ද; **එවං**: ඒ ආකාරයෙන් ම; **පණ්ඩිතා**: නුවණැත්තෝ; **නින්දා පසංසාසු**: නින්දාවෙන් හෝ ප්‍රශංසාවෙන්; **න සමිඤ්ජන්ති**: නො සැලෙති.

සැඩ සුළඟින් නො සැලෙන මහ ගල් පවුවක් මෙන් නුවණැත්තා ද නින්දාවෙන් හෝ ප්‍රශංසාවෙන් කම්පනයට පත් නො වෙයි.

### විවරණය

**නින්දා පසංසාසු**: සාමාන්‍ය මිනිස්සු ජීවිතයේ ලබන මිහිරි හා අමිහිරි අත් දැකීම් නිසා මානසික සමතුලිතතාව නැති කර ගනිති. යමක් වැරදුණු විට ඔවූහු ඉච්ඡා භංගයට හා අසහනයට පත් වෙති. සාර්ථක වූ විට ප්‍රීතියෙන් ඉපිලෙති. එහෙත් නුවණැත්තෝ සියල්ල එකසේ පිළිග නිති. සාමාන්‍යයෙන් ලෝවැසියනට මුහුණ පාන්නට වන අත් දැකීම් අෂ්ට ලෝක ධර්ම වශයෙන් හැඳින්වේ.

**ලාභො අලාභො, අයසො යසො ච,**
**නින්දා පසංසා ච, සුඛං ච දුක්ඛං**
**එතෙ අනිච්චා මනුජෙසු ධම්මා**
**අසස්සතී විපරිණාම ධම්මා**

යනුවෙන් දක්වා ඇති පරිදි, ලාභ, අලාභ, අයස, යස, නින්දා, ප්‍රශංසා, සැප හා දුක යන මේවා අපට විඳගන්නට සිදු වෙයි.

සාමාන්‍ය පෘථග්ජනයෝ මේවා හමුවේ සැලෙති. එහෙත් නුවණැත්තන් මේවා නිසා කම්පනයට පත් නො වන්නේ ලෝක ධර්මයන්හි වෙනස් වන අනිත්‍ය ස්වභාවය ඔවුන් දන්නා හෙයිනි. ඔවුන් සැඩ සුළඟට නො සැලෙන ගල් පර්වතයකට උපමා කර ඇත්තේ එහෙයිනි.

නැණවතුන් අෂ්ටලෝක ධර්මයට මුහුණ දෙන ආකාරය විස්තර කරන තවත් ගාථාවක් මෙසේ ය.

**එතෙච ඤත්වා සතිමා සුමෙධො**
**අවෙක්ඛති විපරිණාම ධම්මා**
**ඉට්ඨස්ස ධම්මා න මථෙන්ති චිත්තං**
**අනිට්ඨතො න පටිඝාතමෙති.**

"නුවණැත්තා මේ දේ සිහි නුවණින් විමසා බලයි. ඒවා වෙනස් වන සුළු බව නිරීක්ෂණය කර තේරුම් ගනියි. ප්‍රිය මනාප දේ සිදු වූ පමණින් සිත කුල්මත් කර නො ගනියි. අකැමැති දේ සිදු වූ විට කෝපයට හෝ පසුතැවිල්ලට පත් නො වෙයි." මෙසේ අනිත්‍ය ස්වභාවය තේරුම් ගැනීම ඔහු ගේ උපේක්ෂා පරවශ ආකල්පයට පදනම් වෙයි.

**ලකුණ්ටක භද්දිය**: ලකුණ්ටක භද්දිය තෙරුණුවන් ගැන තවත් තොරතුරු අපට ලැබේ. උන් වහන්සේ සිරුරින් මිටි වුව ද මිහිරි කටහඬකට හිමිකම් කී හ. මිහිරි කටහඬ ඇත්තන් අතර උන්වහන්සේ අග්‍ර වූ හ. සියළු දාන අතර ධර්ම දානය උසස් ය. උන් වහන්සේ ගේ ධර්මදේශනා හිමාල වනයෙහි වසන කුරවීක පක්ෂීන් ගේ නාදය මෙන් මධුර වූ බව කියති. උන්වහන්සේ මිටිව උපන්නේ පුරාකෘත අකුසලයක් නිසා බව කියැවේ.

සිරුරින් එතරම් ප්‍රියංකර නො වුව ද ප්‍රියංකර කටහඬ හේතුවෙන් උන්වහන්සේ ජනප්‍රිය වූ හ. එමෙන් ම උදාර චරිත ශක්තිය හා උසස් ගති ගුණ නිසා ද තථාගතයන් වහන්සේ ගේ පැසසුමට ලක් වූ හ.

**ගීතයක් බඳු වීය කට හඬ**
**බඳින දහමට අසන්නන් හද**
**බලන්නට ප්‍රිය නැතත් සිරුරින්**
**පිනා යයි සිත සැදැහැ ඇත්තන්.**





*යම් සේ ගැඹුරු වූ සයුර වෙසෙසින් පහන් වේ ද, එසේ මැ පඬුවෝ දහම් අසා මොනවට පහන් වෙත්*

82. යථා'පි රහදො ගම්භීරො
විප්පසන්නො අනාවිලො
ඒවං ධම්මානි සුත්වාන
විප්පසීදන්ති පණ්ඩිතා. (6:7)

විලක් සේ සුපසන්
පැහැදිලි ගැඹුරු දිය ඇති
ඇසීමෙන් සදහම්
පහදිති දන නුවණ ඇති.

# ඇතොත් නුවණ - වෙසෙත් තුටින
## 6 (7) කානමාතාවන් ගේ කතාව (82 ගාථාව)

දෙව්රම් වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **කානමාතාව** ඇරබ මේ ගාථාව වදාළ සේක.

කානමාතාව බුදුරදුන් කෙරේ පහන් බැතිමත් උපාසිකාවක් වූවා ය. ඇය ගේ දියණිය කාන වෙනත් ගමක තැනැත්තකු සමග විවාහ ව සිටියා ය. කානා සිය මව ගේ නිවසට පැමිණ සිටි දිනක සැමියා ඇයට ආපසු එන සේ පණිවුඩයක් එව් ය. සැමියාට ගෙන යනු පිණිස රස කැවිලි ටිකක් සකස් කර දෙනු පිණිස තව එක් දිනක් පමා වන සේ ඇයට පැවසූ මව, රස කැවිලි පිළියෙළ කළා ය. එහෙත් පසු දින උදේ පිඬු සිඟා වැඩි හිමිවරුන් සිවු නමකට ඕ ඒ රස කැවිලි වලින් ටිකක් පිරිනැමුවා ය.

ඒ පිළිගත් හිමිවරු කානාවගේ නිවසේ රස කැවිලි ඇති බව තවත් හිමිවරුනට පැවසූයෙන් ඔවුහු ද එහි පිඬුසිඟා වැඩිය හ. කානමාතාව ද තමා බැතිමත් හෙයින් ඒ හැමට ම රස කැවිලි පිළිගැන්වූවා ය. අන්තිමේ දී කානා ට ගෙනයන්නට කිසිවක් ඉතිරි නො වූයෙන් එදා ගමන යා නො හැකි විය. ඊළඟ දිනයේ සිදු වූයේ ද එය ම ය. තුන්වන දිනයේ සැමියා අන්තිම නිවේදනයත් එවා තිබිණි. කාන නො පැමිණිය හොත් වෙනත් බිරිඳක් ගෙන එන බව ඔහු දන්වා තිබිණ. එහෙත් එදින ද භික්ෂූන් පිඬුසිඟා වැඩි හෙයින් රස කැවිලි සියල්ල නිම විය. කානට සැමියා වෙත යාමට නො හැකි විය.

අන්තිමේ කාන ගේ සැමියා වෙනත් ස්ත්‍රියක බිරිඳ කර ගත්තේ ය. මෙයින් කලකිරීමට පත් කාන භික්ෂූන් කෙරේ අප්‍රසාදයක් ඇති කර ගත්තී ය. ඇය භික්ෂූන්ට බැණ වදින්නට පටන් ගත්තෙන් ඔවුහු කානමාතාව ගේ නිවසට පිඬුසිඟා ඒම නැවැත්වූ හ. බුදුරජාණන් වහන්සේට ද මේ පුවත සැල වූයෙන් උන් වහන්සේ කානමාතාව ගේ නිවසට වැඩම කළ හ. ඕ භාග්‍යවතුන් වහන්සේට සහල් කැඳ පිළිගැන්වූවා ය.

වළඳා අවසන භාග්‍යවතුන් වහන්සේ කාන අමතා "මගේ ශ්‍රාවක භික්ෂූන් පිළිගත්තේ ඒ අයට පූජා කළ දේ ද? නැතහොත් නුඹුන් දේත් ගත්තා ද?" යි ප්‍රශ්න කළ හ. "උන්වහන්සේලා පිළිගත්තේ දුන් දේ පමණි"යි පැවසූ ඕ "වරද උන්වහන්සේලා ගේ නොවේ. මමයි වරද කළේ" යි පැවසුවා ය. මෙසේ සිය වරද පිළිගත් ඕ බුදුන් වැඳ සමා කරවා ගත්තා ය. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ ධර්මානුශාසනාවක් කළෙන්, ඒ අසා සිටි කාන සෝවාන් ඵලය ලැබුවා ය.

ආරාමයට ආපසු පැමිණෙන අතරතුර බුදුරදුන්ට පසේනදී කොසොල් රජතුමා හමු විය. කාන භික්ෂූන් වහන්සේලාට බැණ වදින ආකාරය ගැන අසා තිබුණු රජතුමා බුදුරදුන් ඇයට දම් දෙසූ බව අසා විස්මයට පත් විය. ඇයට සත්‍යය අවබෝධ කරවන්නට බුදුරදුන් සමත් වී දැයි විමසූ රජුට බුදුරදුන් වදාළේ "එසේ ය. මම ඇයට ධර්මය පැහැදිලි කළෙමි. ඇය ගේ මතු භවය සාර්ථක කළෙමි " යනුවෙනි. "මම ඇය ගේ මේ භවය සාර්ථක කරමි." යි පැවසූ රජතෙම දෝලාවක් සමග රාජපුරුෂයන් යවා ඇය ගෙන්වා ගත්තේ ය. ඇය පැමිණි පසු ඇමතියන් ඇමතූ හේ "මගේ දියණිය කානාට සැප සම්පත් දෙන්නට හැකි අයෙකුට එසේ කරන්නට අවසර දෙමි" යි පැවසී ය. එක් අමාත්‍යවරයෙක් "මම ඇය මගේ දියණිය සේ හදා ගනිමි" යි පවසා තමා සතු සියලු දේපළ ඇයට පවරා "දියණියනි, ඔබට කැමති පරිදි දන් පින් කරගන්න" යි කීයේ ය. කානාව ද දිනපතා නුවර දොරටු හතරෙහි දන් පිරිනමන්නට පටන් ගත්තා ය. භික්ෂූන් ඇමතූ භාග්‍යවතුන් වහන්සේ " මහණෙනි, කැළඹී දූෂිතව පැවති කානා ගේ සිත මගේ වදනින් පහන් වූයේ ය'' යි වදාළ හ.

### විවරණාත්මක අනුවාදය (82 ගාථාව)

**යථා ගම්භීරො රහදො විප්පසන්නො අනාවිලො එවං පණ්ඩිතා අපි ධම්මානි සුත්වාන විප්පසීදන්ති.**

**යථා**: යම් සේ, **ගම්භීරො**: ගැඹුරු, **රහදො**: විලක්, **විප්පසන්නො**: බෙහෙවින් ප්‍රසන්නව, **අනාවිලො**: කැළඹීමෙන් තොරව (පවතී ද), **එවං**: එසේ, **පණ්ඩිතා අපි**: නුවණැත්තෝ ද, **ධම්මානි**: දහම්, **සුත්වාන**: අසා, **විප්පසීදන්ති**: ප්‍රසන්න වෙති.

ගැඹුරු දිය විලක් පහන්ව, නො කැලඹී පවත්නා පරිද්දෙන් ධර්මය ඇසීම හේතුවෙන් නුවණැත්තන් ගේ සිත ද කැලඹීමෙන් තොරව ප්‍රසන්න බවට පත් වෙයි.

### විවරණය

ගැඹුරු දිය විලක ජලය ප්‍රසන්නව, මඩ නොවී පවතින ආකාරය ධර්මය අසා සංසුන් කරගත් සිතට උපමා කර ඇත. ධර්මය නො පිවිසුණු සාමාන්‍යය සිත නිතර ම කැළඹී, ආකුලව, වියවුල්ව පවතී. සිතට සහනය ගෙන එන්නේ ධර්මය යි.





*උතුම් පුරිස්හු කිසි දෙයෙක නො ඇලී සුවදුක් දෙක්හි උස් පහත් ගති නො දක්වති*

83. සබ්බත්ථ වෙ සප්පුරිසා වජන්ති
න කාමකාමා ලපයන්ති සන්තො
සුඛෙන ඵුට්ඨා අථ වා දුඛෙන
න උච්චාවචං පණ්ඩිතා දස්සයන්ති (6:8)

නුවණැත්තෝ දුරු කරලති සැප සම්පත්
කම්සැප පතමින් නො දොඩති වදනක්
වාරෙන් වාරෙට දුක සැප ලැබුණත්
නැත පිම්බීමක් - මුකුලිත වීමක්

# නුවණ වඩත් - සංසුන් වෙත්

## 6 (8) පන්සියයක් හිමිවරුන් ගේ කතාවක් (83 ගාථාව)

**පන්සියයක් භික්ෂූන් වහන්සේ** අරබයා වදාළ මේ ගාථාව දෙව්රම වැඩ වසත් දී භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දකි.

වේරඤ්ජා නම් බ්‍රාහ්මණයා ගේ ආරාධනය පරිදි භාග්‍යවතුන් වහන්සේ වරක් භික්ෂූන් වහන්සේලා ද සමග වේරඤ්ජා නම් ගමෙහි වස් විසූ හ. තමන් බුදුරදුන්ට උපස්ථාන කරමැයි පොරොන්දු වී වස් වසන්නට ආරාධනය කළ බව බ්‍රාහ්මණයාට අමතක විය. එ සමයෙහි වේරඤ්ජා ප්‍රදේශයේ ආහාර හිඟයක් වූ හෙයින් පිඬු සිඟා යාමෙන් පවා එතරම් ප්‍රයෝජනයක් නො වී ය.

මේ අමාරු තත්වය යටතේ වුවද භික්ෂූහු දුර්මුඛ නො වූ හ. අශ්වයන් වෙළඳාමේ ගිය වෙළඳුන් විසින් පුදන ලද කඩල ස්වල්පයකින් යැපෙන්නට උන්වහන්සේලා සමත් වූ හ. වස් කාලය අවසාන වේරඤ්ජා බමුණාටද දැනුම් දී බුද්ධ ප්‍රමුඛ භික්ෂු පිරිස යළි ජේතවනාරාමයට ම සම්ප්‍රාප්ත වූහ.

ජේතවනාරාමයේදී දායකයෝ භික්ෂූන් වහන්සේලාට ප්‍රණීත දාන වස්තුවෙන් උපස්ථාන කළ හ. එදින දන් පිරිනැමීමෙන් පසු ඉතිරි වූ ආහාර, විහාරස්ථානයේ සුළු වැඩ කරමින් වසන අයට දෙන ලදී. ඔවුහු ඒ අනුභවයෙන් පසු ප්‍රීතියට පත්ව ගී ගයමින් නටමින් කලබල කළ හ. මාස තුනක් ම නීරස යව අනුභව කිරීමෙන් පසුව වුව ද භික්ෂූහු අමුත්තක් නැතිව උපේක්ෂාවෙන් සිටිය හ. මේ සම්බන්ධයෙන් සවස දම්සභා මණ්ඩපයේ දී භාග්‍යවතුන් වහන්සේට දැනුම් දෙන ලදී. උන්වහන්සේ ඒ නිමිත්තෙන් අඥානයෝ ලාභයේ දී ප්‍රමුදිතව අලාභයේ දී මුකුලිත වීම ස්වභාව කොට ඇත්තෝ වෙති. නුවණැත්තෝ එබඳු උච්චාවචතා නැතිව සියල්ල මධ්‍යස්ථව ඉවසති යි පැහැදිලි කොට මේ ගාථාව වදාළ සේක.

**විවරණාත්මක අනුවාදය (83 ගාථාව)**

**සප්පුරිසා වෙ සබ්බත්ථ චජන්ති සන්තො කාමකාමා**
**න ලපයන්ති සුඛෙන අථවා දුඛෙන පුට්ඨා පණ්ඩිතා**
**උච්චාවචං න දස්සයන්ති.**

**සප්පුරිසා**: සත්පුරුෂයෝ; **වෙ**: ඒකාන්තයෙන්; **සබ්බත්ථ**: සෑම අංශයෙන් ම; **චජන්ති** : අභිනිෂ්ක්‍රමණය කරති, **සන්තො**: (ශාන්ත) යහපත් අය; **කාමකාමා**: කාම වස්තු අපේක්ෂාවෙන්; **න ලපයන්ති**: කථා නො කරති; **සුඛෙන**: සැපයෙන්; **අථ වා**: නැතහොත්; **දුඛෙන**: දුකෙන්; **පුට්ඨා**: පැහැදුණු; **පණ්ඩිතං**: නුවණැත්තෝ; **උච්චාවචං**: ඉහල පහල යාමක්; **න දස්සයන්ති**: නො දක්වති.

සත්පුරුෂයෝ සියල්ල අතහැර නෛෂ්ක්‍රම්‍යය ප්‍රගුණ කරති. ලාභ ලෝභ පතා කතා නො කරති. සැප ලද විට ප්‍රීතියෙන් මත් ව යාමක් හෝ දුක් ලද විට දුකින් හැකිලීමක් නො දක්වති.

**විවරණය**

**සුඛෙන දුඛෙන**: නුවණැති උසස් පුද්ගලයෝ සැප හා දුක නිසා මානසිකත්වයේ වෙනසක් - උච්චාවචතාවක් නො දක්වති. සාමාන්‍යයෙන් මනුෂ්‍යයන්ට ලැබෙන අත්දැකීම් අතර සැප හා දුක ඉතා ප්‍රබල වෙයි. සැපය නම් බොහෝ විට ආශාවක් මස්තකප්‍රාප්ත වීමකි. එසේ වූ විට සිත ප්‍රීතියෙන් ඉල්පෙයි. එහෙත් ඒ ඉක්මණින්ම තවත් ආශාවක් ජනිත වෙයි. එහෙයින් අපි නිතර ම නොතිත් ආශාවන්ගෙන් යුතුව ජීවත් වෙමු. කෙසේ වුව ද සාමාන්‍ය මිනිසාට තම ආශාවක් ඉටු වීම තරම් ප්‍රීතියෙන් තවත් නැත. ඉඳුරන් පිනා ගිය විට ඔවුහු ප්‍රීතියෙන් ඉල්පෙති. එහෙත් මේ ප්‍රීතිය හුදු මායාවක් පමණි. ධනය, බලය, කීර්තිය හෝ විජයග්‍රහණය මගින් ලැබෙන ප්‍රීතිය දිගුකල් පවතින සරු දෙයක් නොවේ. නියම ප්‍රීතිය නම් ආධ්‍යාත්මික ප්‍රීතිය යි.





*යස ඉසුරු නොදැහැමින් නොකැමැතිවන තැනැත්තා සිල්වතෙක් නැණවතෙක් දැහැමියෙක් වේ.*

84. න අත්තහෙතු න පරස්ස හෙතු
න පුත්තමිච්ඡෙ න ධනං න රට්ඨං
න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධි මත්තනො
ස සීලවා පඤ්ඤවා ධම්මිකො සියා (6:9)

තමන් නිසාවත් අනුන් නිසාවත්
පුතුන්, ධනය හෝ රටක් නො පතතොත්
අධර්මයෙන් පොහොසත් වනු නොසිතන
සිල්වත්, නුවණැති දැහැමි කෙනෙක් වේ

# නුවණැති දන - ඇති යහ ගුණ

## 6 (9) ධම්මික ස්ථවිරයන් ගේ වස්තුව (84 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන කල භාග්‍යවතුන් වහන්සේ විසින් **ධම්මික** ස්ථවිරයන් වහන්සේ අරබයා මේ ගාථාව වදාරන ලදී.

ධම්මික සිය බිරිඳත් සමග සැවැත් නුවර වාසය කළේ ය. බිරිඳ ගැබ් ගෙන සිටි සමයක දිනක් හේ තමන් පැවිදිවනු කැමති බව ඇයට පැවසී ය. දරුවා උපදින තුරු ඒ තීරණය පමා කරන්නැයි ඕ ධම්මිකගෙන් ඉල්ලා සිටියා ය. දරුවා උපන් පසු ඔහු පැවිදි වන්නට සැරසුණු විට දරුවාට ඇවිදින්නට හැකි වනතුරු සිටින්නැයි ඇය පැවසූ හෙයින් හේ මෙසේ කල්පනා කළේ ය. "පැවිදි වීම සඳහා බිරිඳගෙන් අවසර ලැබෙන තුරු බලා සිටීමේ පලක් නැත. මගේ විමුක්තිය මම සලසා ගනිමි." මෙසේ සිතා හෙතෙම විහාරස්ථානයට ගොස් පැවිදි විය. භාග්‍යවතුන් වහන්සේ ගෙන් කර්මස්ථානයක් ද ලබාගත් ධම්මික හිමියෝ උද්යෝගයෙන් භාවනා වඩා ඉක්මණින් ම රහතන් වහන්සේ නමක් බවට පත් වූහ.

අවුරුදු ගණනකට පසු තම බිරිඳට හා දරුවාට ධර්මදේශනා කරනු පිණිස හේ සිය නිවස බලා ගියේ ය. උන්වහන්සේ ගේ පුත්‍රයා ද සසුන් ගතව රහත් වූයේ ය. "මගේ සැමියාත් දරුවාත් දෙදෙනාම සසුන් ගත වූ හෙයින් මා පමණක් ගිහිගෙයි විසීමෙන් ඇති අරුත කුමක් ද?" යි සිතූ බිරිඳ ද භික්ෂුණියක් ව රහත් බව ලද්දා ය.

දම් සභා මණ්ඩපයෙහි රැස් වූ භික්ෂූන් වහන්සේ ධම්මික හිමියන් පැවිදිව රහත් වූ අයුරුත් බිරිඳ හා දරුවාත් සසුන් ගත ව නිවන් සුව සාධනය කර ගත් අයුරුත් බුදුරදුන් හා සමග සාකච්ඡා කළ හ. ඒ අවස්ථාවෙහි දී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, නුවණැත්තෝ ධනය හා සමෘද්ධිය පිණිස තමන් සඳහා හෝ අනුන් සඳහා වත් පව්කම් නො කරති. ඔවුහු ධර්මානුකූලව ජීවත් වී සංසාරයෙන් විමුක්තිය ලබා ගැනීම සඳහා ම ක්‍රියා කරති" යි වදාළ හ.

### විවරණාත්මක අනුවාදය (84 ගාථාව)

**අත්ත හෙතු (න) පරස්ස හෙතු (න) පුත්තං (න) ධනං (න) රට්ඨං න ඉච්ඡෙ අධම්මේන සමිද්ධිං, න ඉච්ඡෙය්‍ය සො සීලවා පඤ්ඤවා ධම්මිකො සියා**

**අත්ත හෙතු**: තමා ගේ යහපත පිණිසවත්; **පරස්ස හෙතු**: අනුන්ගේ ප්‍රයෝජනය පිණිසවත්; **පුත්තං**: පුත්‍රයකු; **ධනං**: ධනය; **රට්ඨං**: රටක්; **න ඉච්ඡෙ**: ප්‍රාර්ථනා නො කරන්නේ ය; **අධම්මේන**: අධර්මයෙන්; **සමිද්ධිං**: සමෘද්ධිය; න **ඉච්ඡෙය්‍ය**: අපේක්ෂා නො කරන්නේ නම්; **සො**: හෙතෙම; **සීලවා**: සිල්වතෙක්; **පඤ්ඤවා**: නුවණැත්තෙක්; **ධම්මිකො**: ධාර්මිකයෙක්; **සියා**: වන්නේ ය.

තමා ගේ ප්‍රයෝජන පිණිසවත් අනුන්ගේ ප්‍රයෝජනය පිණිසවත් දරුවන්, ධනය හෝ රාජ්‍යයක් ප්‍රාර්ථනා නො කරන්නේ ය. තමා ගේ සමෘද්ධිය අධර්මයෙන් අපේක්ෂා නො කරන්නේ ය. එසේ වූ විට හේ සිල්වතෙක්, නුවණැත්තෙක් හා ධාර්මිකයෙක් වෙයි.

### විවරණය

"සිදුහත් කුමරුන් තම බිරිඳ, පුතා, දෙමාපියන් හා රාජධානිය හැර පැවිදි වූයේ කවර හෙයින් දැයි" විමසන අයට පිළිතුර මේ ගාථාවෙහි ඇතුළත් ය. එය තමා ගේ කිසියම් ආත්මාර්ථකාමී බලාපොරොත්තුවක් නිසා කළ දෙයක් නො වන බව මෙයින් තේරුම් ගත හැකි ය.

ඒ ලෝක තත්ත්වය මනාව තේරුම් ගෙන අනිච්ච-දුක්ඛ-අනත්ත ලක්ෂණ මැනවින් දැන ගෙන කළ ක්‍රියාවකි.

මෙහි වැදගත් ම පණිවුඩය - "අධර්මයෙන් තමන් ගේ සමෘද්ධිය නො පතන්න"- වත්මන් දූෂිත අර්ථක්‍රමය නිවරද්‍ය කර ගැනීම පිණිස අත්‍යන්තයෙන් ම අදාළ වන්නකි. අධර්මයෙන් ලබන සමෘද්ධිය නිරර්ථකය. එමගින් මෙලොව හා පරලොව දෙකෙහි ම සිදු වන්නේ අනර්ථයකි.



*මිනිසුන් අතුරෙහි පරතෙර (නිවන්) යන්නෝ ටික දෙනෙක් වෙති. සෙසු සත්කැල මෙතර (සසර) මැදිවෙති.*

85. අප්පකා තෙ මනුස්සෙසු
යෙ ජනා පාරගාමිනො
අථායං ඉතරා පජා
තීරමෙවානුධාවති (6:10)

මිනිසුන්ගෙන් සුළු පිරිසක්
පරතෙර වෙත යති පීනා
ඉතිරි පිරිස නැවත වරක්
මෙතර වෙත ම එති ආපසු.

# සුළු පිරිසක් - සසරින් එතරට යත්

## 6 (10) ධර්මය අසන පිරිසක් ගැන පුවතක්. (85 සහ 86 ගාථා)

ධර්මශ්‍රවණය සඳහා පැමිණි සැවැත් නුවර **වැසියන් පිරිසක්** විෂයෙහි මෙම ගාථාවන් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ජේතවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි ය.

එසමයෙහි සැවැත්නුවර විසූ සැදැහැවත්හු පිරිසක් සම්මාදම් කර භික්ෂූන් වහන්සේලාට යම් යම් පිරිකර පූජා කළ හ. මෙම විශේෂ පිරිකර පූජාවෙන් පසු ධර්මශ්‍රවණාභිලාෂී වූ ඔවුහු රාත්‍රිය පුරා ධර්මදේශනා කරනු පිණිස භික්ෂූන් වහන්සේලා කිහිපනමකට ආරාධනා කළ හ. රැය පුරා ම දහම් අසන්නට අසමත් වූ සමහරු අතර මැද දී නැඟිට සිය නිවෙස් බලා ගිය හ. සමහරු රැය පුරා ම ධර්මය ශ්‍රවණය කරන්නට සිතා නැවතුණ ද නිදි කිරමින් සිටිය හ. බණ අසමින් ම සමහරුන්ට නින්ද ගියේ ය. මුළු රාත්‍රිය ම අවධානයෙන් බණ ඇසූ පිරිස ඉතා සුළු විය.

පසු දා උදේ භික්ෂූහු එදින රැයෙහි ජනයා ධර්මය ශ්‍රවණය කළ ආකාරය භාග්‍යවතුන් වහන්සේට දැනුම් දුන් හ. ඒ ඇසූ උන්වහන්සේ ඒ පිළිබඳව කරුණු පැහැදිලි කරමින් ගාථා දෙකක් දේශනා කළ හ.

**විවරණාත්මක අනුවාදය (85 ගාථාව)**

**මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො තෙ අප්පකා අථ අයං ඉතරා පජා තීරං එව අනුධාවති.**

**මනුස්සෙසු**: මිනිසුන් අතර; **යෙ ජනා**: යම් පිරිසක්; **පාරගාමිනො**: පරතෙරට යන්නෝ ද; **තෙ**: ඔවුහු; **අප්පකා**: ඉතා සුළු පිරිසකි; **අථ**: ඉක්බිති; **අයං**: මේ; **ඉතරා පජා**: අවශේෂ පිරිස; **තීරං එව**: මෙතෙරට ම; **අනුධාවති**: ආපසු එන්නෝ ය.

මිනිසුන් අතර සසරින් එතෙරට යන්නෝ ඉතා ස්වල්ප දෙනෙකි. ඉතිරි ප්‍රජාව නැවත සසර නම් වූ මෙතෙරට නැවත ආපසු එන්නෝ ය.

**විවරණය**

**ධම්මෙ ධම්මානුවත්තිනො**: යන්නෙන් මෙහි දී අදහස් කරන ලද්දේ බුදුරදුන් වදාළ ශ්‍රී සද්ධර්මයයි. බුදුරදුන් විසින් මුලින් ම දම් දෙසන ලද්දේ පස්වග මහණුන්ට ය. උන්වහන්සේ ගේ ප්‍රථම ධර්ම දේශනය ධම්මචක්කප්පවත්තන සූත්‍රය යි. ධර්මය චක්‍රයක් හෙවත් රෝදයක් බඳු බව ද එය ප්‍රථම වරට ඉදිරියට යන පරිදි ක්‍රියාත්මක කළ බව ද ඉන් හැඟවෙයි. මුල් ම බුද්ධ ශ්‍රාවක පිරිස බවට පත් වූයේ මේ සූත්‍රය ශ්‍රවණය කළ පස්වග මහණ පිරිස ය. මේ නිසා බරණැස ඉසිපතනය ධර්ම රත්නය හා සංඝ රත්නය පහළ වූ නිජබිම වශයෙන් හැඳින්විය හැකි ය. මුල් ම භික්ෂු පිරිස ඇමතූ භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ හ.

"මහණෙනි, මම සියලු දිව්‍යමය හා මානුෂික බන්ධනයන්ගෙන් මිදුණෙමි.

ඔබද සියලු දිව්‍යමය හා මානුෂික බන්ධනයන් ගෙන් මිදුණාහු ය.

එහෙයින් බොහෝ දෙනා ගේ හිතසුව පිණිස ජනානුකම්පාව පෙරදැරි කරගෙන දෙව් මිනිසුන්ට ශුභ සිද්ධිය සලසනු වස් සංචාරයෙහි යෙදෙන්න. දෙදෙනකු එක මඟ නො යන්න. මුල-මැද හා අග යහපත් වූ අර්ථ සම්පන්න වූ පරිපූර්ණ වූ ධර්මය දේශනා කරන්න. පිරිසිදු ජීවිතයක් ගත කරන ආකාරය උගන්වන්න. ඇසෙහි කුණු රොඩු නැති බොහෝ දෙනා ධර්මය දකිනු ඇත. දහම නො ලදහොත් ඔවුන් විනාශ වී යන්නට ඉඩ තිබේ. දහම තේරුම් ගත හැකි ජනයා ලොව වෙසෙති. මම ද දහම් දෙසනු පිණිස උරුවෙල් දනව්වේ සේනානි ගමට යන්නෙමි."
පන්සාලිස් වසක් පුරා කරන ලද ධර්මදූත කාර්යභාරය ඇරඹුණේ එලෙස ය. තම ශ්‍රාවක පිරිස ද කැටුව දඹදිව මහා මාර්ග හා අනුමාර්ග යන් හි උන්වහන්සේ සංචාරය කළ හ.

දහම් දෙසීමේදී භාග්‍යවතුන් වහන්සේ ජාති-කුල-ගෝත්‍රා දී කිසි ම වෙනසක් නො කළ හ. දුප්පත්-පොහොසත්, කුලීන-කුලහීන, උගත්-නූගත්, පින් ඇති-පින් නැති සෑම සියළු දෙනා ම උන්වහන්සේ හමුවට ආහ. ශ්‍රමණ- බ්‍රාහ්මණ වේවා, රාජකීය හෝ දුගී දුප්පත් වේවා සුදනෙකු හෝ දුදනෙකු වේවා කාට වුව ද නිසි මඟ පෙන්වන්නට අවස්ථාව ලබා ගැන්මට භාග්‍යවතුන් වහන්සේ උත්සුක වූ හ. කිසිවකුට නිවන් මඟ අසුරා නො තිබිණ.ධර්මය විශ්වසාධාරණ වූයේ ය.

දඹදිව බමුණන් මහ ඉහළින් පිළිගත් කුල පාරිශුද්ධිය ගැන භාග්‍යවතුන් වහන්සේ මඳ වූ හෝ තැකීමක් නො කළ හ. කුල භේදය නින්දිත සංස්ථාවක් සේ උන්වහන්සේ හෙළා දුට හ. ඕනෑම කුලයක හෝ පන්තියක අයකු ඔවුන් පැවිද්දෙහි ප්‍රතිඵල ලබාගනිතැයි බුදුරදුනට පෙනී ගිය විට සංඝ සමාජයට ඇතුළත් කර ගන්නා ලදී. මින් පෙර කුල හා පන්ති භේද මගින් භේද භින්නව පැවති සමාජය ඒකාග්‍ර කරන්නට ප්‍රයත්නයක් දැරූ එක ම තත්කාලීන භාරතීය ශාස්තෘවරයා භාග්‍යවතුන් වහන්සේ ය.

බුදුරජාණන් වහන්සේ භාරතීය කාන්තාව ගේ තත්ත්වය ද යහපත් බවට පත් කළ හ. බ්‍රාහ්මණ චින්තනයේ බලපෑම හේතුවෙන් බුද්ධ කාලීන කාන්තාවට වැඩි ගෞරවයක් හිමි ව නො තිබිණ. ඉඳහිට දාර්ශනික චින්තනයෙන් අග තැන්පත් කාන්තාවක ගැන අසන්නට ලැබුණ ද පොදුවේ ඔවුනට හිමි වූයේ පහත් තත්ත්වයකි. ස්වකීය විවෘත හා දයාන්විත ආකල්පය හේතුවෙන් කාන්තාවනට විනීත අයුරින් සැලකූ බුදුහු ඔවුනට ද විමුක්ති මාර්ගය පාදා දුන් හ. ඉතිහාසයේ ප්‍රථම වරට භික්ෂුණී ශාසනයක් ද උන්වහන්සේ විසින් අරඹන ලදී. විවිධ පංතිවල ස්ත්‍රීහු එහි පැවිද්ද ලද හ. ඔවුන් විමුක්ති ලාභය පිණිස පධන් වීර්යය වැඩූ අයුරු හා විමුක්තිය ලබා උදාන ගීතිකා ගැයූ අයුරු ථෙරීගාථාවේ සඳහන් ය.





*මනාකොට දෙසූ දහම් පිළිවෙත පිරුමෙන් ඉතා දුක සේ එතෙර විය යුතු සසර පරතෙරට පැමිණිය හැක.*

86. යෙ ච ඛො සම්මදක්ඛාතෙ
ධම්මෙ ධම්මානුවත්තිනො
තෙ ජනා පාරමෙස්සන්ති
මච්චුධෙය්‍යං සුදුත්තරං. (6:11)

දෙසා ඇති මැනවින්
සදහම් අනුව විසුමෙන්
මාර බල බිඳිමින්
එතර විය හැක සසර කතරින්.

# ධර්මය සිත තුල නම් - සසරින් එතරට යයි
## 6 (10) ධර්‍මීය අසන පිරිසක් ගැන පුවතක්. (85 සහ 86 ගාථා)

**විවරණය**

පෙර පිටුව හා සම්බන්ධයි

ගමින් ගමට, නගරයෙන් නගරයට වැඩම කරමින් බොහෝ දෙනාට ධර්මාස්වාදය සහ නිවන් සුව ලබා දෙමින් සැරිසරන භාග්‍යවතුන් වහන්සේට අවිද්‍යාවෙනි ගිලුණු පොදු ජනයා පශුඝාතනය කරමින්, දෙවියන් යදිමින් මුලාව වසන ආකාරය පෙනී ගියේ ය. ඔවුන් ඇමතූ භාග්‍යවතුන් වහන්සේ

**ජීවිතයක් නැති කිරීම - ඉතා පහසු වැඩක් වුණත්**
**දෙන්නට කිසිවකුට පණක් - මොන ජගතෙක් වේද සමත්**
**ඉපිද මෙලොව ජීවත් වෙන - ඉතා කුඩා සතෙක් වුණත්**
**පණට ආදරෙයි තමන් ගෙ - බයයි මරණයට කවදත්**

යි දේශනා කළ හ.

වාද විවාද, කලකෝලහල, අරගල බුදුරජාණන් වහන්සේට ප්‍රිය නො වීය. භික්ෂූන් ඇමතූ භාග්‍යවතුන් වහන්සේ වරක් මෙසේ වදාළ හ. "මහණෙනි, මම ලෝකයා සමග වාද නො කරමි. ලෝකයා මා සමග වාද කරයි. ධර්මවාදියකු කිසි විටෙක කිසිවකු සමග වාද කළ යුතු නැත."

භාග්‍යවතුන් වහන්සේ වැදගත් කොට සැලකුයේ ධර්මය යි. එහෙයින් සියළු ම බෞද්ධයන් ධර්මානුවර්ති විය යුතු ය. බුදු සමයෙහි ඉගැන්වෙන නිෂ්ටාව සාධනය කර ගන්නට නම් ධර්මය ප්‍රායෝගිකව අනුගමනය කළ යුතු ය.

විමුක්ති සුවය සාක්ෂාත් කිරීම පිණිස කෙටි මං නො මැත. ක්‍රමානුකූලව මානසික සංවර්ධනය සාධනය කිරීම ඒ සඳහා ඇති ඒකායන මාර්ගය බව සූත්‍ර රාශියක ම අවධාරණය කර තිබේ. එය අනුක්‍රමික ශික්ෂාවකි. කය, වචනය හා සිත ක්‍රමානුකූලව ප්‍රගුණ කිරීමෙන් නියම ප්‍රඥාව වර්ධනය කර ගෙන සම්බෝධිය ලබා නිර්වාණය සාක්ෂාත් කර ගත හැකි ය. එය ජාති, කුල, ගෝත්‍ර, පංති, වර්ණ ආදී සකලවිධ භේදයන් ම ඉක්මවා සිටින සර්ව සාධාරණ ප්‍රතිපදාවකි.

බෞද්ධ පුරුෂාර්ථ නියත වශයෙන් දක්වන අවස්ථාවක භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ හ.

"බුදු බව ලත් භාග්‍යවතුන් වහන්සේ බුදු බව පිණිස ධර්මය දේශනා කරති. දමනය වූ භාග්‍යවතුන් වහන්සේ දමනය පිණිස ධර්මය දේශනා කරති. ශාන්ත වූ භාග්‍යවතුන් වහන්සේ ශාන්තිය පිණිස ධර්මය දේශනා කරති. තරණය කළ භාග්‍යවතුන් වහන්සේ තරණය පිණිස ධර්මය දේශනා කරති. පිරිනිවන් පෑ භාග්‍යවතුන් වහන්සේ පරිනිර්වාණය පිණිස ධර්මය දේශනා කරති."

භාග්‍යවතුන් වහන්සේ විසින් සාධනය කර ගත් පුරුෂාර්ථයන් ධර්මානුවර්ති ශ්‍රාවකයාට ද විවෘතව පවත්නා බව මින් සනාථ වෙයි. ධර්මය මනාව දේශනා කර තිබේ. එහෙත් ඒ අනුව පිළිපැදීම හුදෙක් ශ්‍රාවකයනට භාර කාර්යයකි. අසීමිත උද්යෝගයෙන්, අප්‍රතිහත ධෛර්යයෙන් හා කැපවීමෙන් අප ධර්ම මාර්ගයෙහි ගමන් කළ යුතුය. බුදුන් රහතුන් ගමන් කළ ඒ මග කවර බාධා එළැඹුණ ද අප ඒ ජය ගත යුතුය. ධර්මය හුදෙක් වෛද්‍යවරයකු විසින් නිර්දිෂ්ට ඖෂධයක් බඳුය. රෝගියා තම එකම අරමුණ ආරෝග්‍යය බව තේරුම් ගෙන ඖෂධ භාවිතයෙන් හා වෛද්‍යොපදේශ පිළිපැදීමෙන් සුවය ලබා ගත යුතුය.

සසර තරණය ගැන කරුණු දක්වන අවස්ථාවකදී භාග්‍යවතුන් වහන්සේ එය පහුරක් උපකාරයෙන් ගඟකින් එතර වීමක් හා සමකොට දැක්වූ හ. "මහණෙනි, මම ධර්මය පහුරක් මෙන් උගන්වමි. එය තරණය පිණිස උපකාර කර ගැනීමට මිස කර තබා ගැනීමට නොවේ."

දැන් භාග්‍යවතුන් වහන්සේ අප අතර වැඩ වාසය නො කරන බව සැබෑය. එහෙත් උන්වහන්සේ විසින් උතුම් වූ ශ්‍රී සද්ධර්මය අපට දායාද කොට ඇත. එම ධර්මය උන්වහන්සේ විසින් ගොතා නිර්මාණය කළ දෙයක් නොව සොයාගත් දෙයකි. එය කවදාත් ලොව පවත්නා විශ්ව නියාමයකි. එය සදා හැමතැන පවතියි. බෞද්ධ-අබෞද්ධ, පෙර දිග-අපර දිග කාටත් එය විවෘතය. බුදුවරු එය සොයා ගෙන දේශනා කරති. එයට අමුතු ලේබලයක් අනවශ්‍යය. එය සොයා ගන්නා ඕනෑම කෙනෙකුට තවත් අයකුට දේශනා කළ හැකිය. නමුත් අවබෝධ කිරීම පෞද්ගලික ය. ධර්මය නුවණැත්තන් විසින් තම නුවණින් ම ප්‍රත්‍යක්ෂ කර ගත යුත්තකි.

**මච්චුධෙය්‍ය:** මාරයා ගේ බලය ක්‍රියාත්මක වන ක්ෂෙත්‍රය මෙහි මච්චුධෙය්‍ය යන්නෙන් අදහස් වෙයි. මාරයා ක්‍රියාත්මක වීම මරණය සේ ගතහොත්, මච්චුධෙය්‍ය යන්නෙන් සංසාරය ගත හැකිය. සසරින් එතෙර වීම මාරයා ගේ රාජධානියෙන් ඉවත් වීමකි. නිර්වාණාධිගමය කර පිරිනිවි උතුමනට නැවත කිසි කලෙක මරණ දුක විඳින්නට සිදු නොවේ. එමෙන් ම කෙලෙසුන් නිසා පීඩාවක් ද සිදු නො වෙයි.

**විවරණාත්මක අනුවාදය (86 ගාථාව)**

**යෙ ච ඛො සම්මදක්ඛාතෙ ධම්මෙ ධම්මානුවත්තිනො තෙ**
**ජනා සුදුත්තරං මච්චුධෙය්‍යං පාරමෙස්සන්ති**

**යෙ ච ඛො**: යම් කිසිවෙක්; **සම්මදක්ඛාතෙ**: මැනවින් දෙසා ඇති; **ධම්මෙ**: ධර්මයෙහි; **ධම්මානුවත්තිනො**: ධර්මානුකූලව පිළිපදිමින් ජීවත් වෙත් ද; **තෙ ජනා**: ඒ ජනයා; **සුදුත්තරං**: තරණය කිරීම අති දුෂ්කර වූ; **මච්චුධෙය්‍යං**: මරුවා ගේ විජිතය (ඉක්මවා); **පාරං** නිවනට; **එස්සන්ති** පැමිණෙන්නාහු ය.

භාග්‍යවතුන් වහන්සේ විසින් මනාව දේශනා කර ඇති ධර්මය නිසි පරිදි ක්‍රියාත්මක කරමින් පිළිපදින අය තරණයට අති දුෂ්කර වූ මාරයා රජ කරන ප්‍රදේශය වූ සසරින් එතර වෙති.





*නුවණැත්තා ගිහිගෙයින් නික්ම පැවිද්දට පැමිණ අකුසල් දුරුකොට කුසල් වඩන්නේ ය.*

87. කණ්හං ධම්මං විප්පහාය
සුක්කං භාවෙථ පණ්ඩිතො
ඔකා අනොකං ආගම්ම
විවෙකෙ යත්ථ දූරමං (6:12)

අඳුරු පව් වැඩ දුරැර
සුසුදු පින් දහම් කර
ගිහි ගෙදර විත් අතැර
පැවිදි බිම සිත නො හැර

# හික්මීමෙන් ලැබෙයි නිවන්

## 6 (12) පන්සියයක් ආගන්තුක හිමිවරුන් පිළිබඳ කතා පුවත (87,88 සහ 89 ගාථා)

දෙව්රම් වෙහෙර වැඩහුන් සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **ආගන්තුක භික්ෂූන් වහන්සේලා පන්සියයක්** ඇරබ මේ ගාථා තුන දේශනා කළ හ.

කෝසල රාජධානියේ වස් විසීම සඳහා ගොස් සිටි මේ භික්ෂු පිරිස වස් වැස නිමවා භාග්‍යවතුන් වහන්සේ වැඳ නමස්කාර කිරීම පිණිස පැමිණිය හ. එසේ පැමිණ බුදුරදුන් වැඳ එකත් පසෙක අසුන් ගත් හ. උන්වහන්සේලා වැසි සමය ගත කළ ආකාරය පිළිබඳව විස්තර අසා සිටි භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා වලින් ධර්ම දේශනා කළ සේක.

**විවරණාත්මක අනුවාදය (87 ගාථාව)**

**පණ්ඩිතො යත්ථ විවෙකෙ දූරමං ඔකා අනොකං ආගම්ම කණ්හං ධම්මං විප්පහාය සුක්කං භාවෙථ.**

**පණ්ඩිතො**: නුවණැත්තා; **යත්ථ විවෙකෙ**: කිසියම් විමුක්තියක; **දූරමං**: ඇලුම් කිරීම අපහසු වූ ; **ඔකා**: ගිහි ගෙයින්; **අනොකං**: අනගාරික ජීවිතයට; **ආගම්ම**: පැමිණ; **කණ්හං ධම්මං**: අකුසල ක්‍රියාවන්; **විප්පහාය**: අතහැර; **සුක්කං**: කුසලක්‍රියා; **භාවෙථ**: වඩන්නේය.

නුවණැත්තා විවේකයෙහි ඇලීම දුෂ්කර තැනක් වූ ගිහි ගෙයින් නික්ම පැවිදි බිමට එළඹ අකුසල් වලින් වැලකී කුසල් දහම්හි නිරත විය යුතුය.

**විවරණය**

**කණ්හං ධම්මං: අකුශල ධර්මය** - මෙයින් අදහස් වන්නේ සදාචාරමය වශයෙන් දුර්වර්ණ වූ හෙවත් පාප ධර්මයි. විමුක්තියට අහිතකර ඊට අනුග්‍රහ වශයෙන් නො පවත්නා කරුණු අකුසල ධර්මය වෙති.

**ඔකා ආනෝකං**: ඕක නමින් හඳුන්වන්නේ ගිහි ගෙයයි. ගිහි ජීවිතයේ සුව පහසුකම් නිසා එය ඕක නමින් හැඳින් වේ. ගිහි ගෙයින් නික්ම චාම් අපිස් ජීවිතයට හුරුවීම 'අනෝක' ලෙස හඳුන්වා ඇත.

**පරියොදපෙය්‍ය අත්තානං චිත්තක්ලෙසෙහි පණ්ඩිතො**: යන්නෙන් නුවණැත්තන් තම සිත් කෙලෙසුන් ගෙන් මුදා ගන්නා බව කියවෙයි. මනස පිරිසිදු කිරීම පිළිබඳ දීර්ඝ ක්‍රියාවලිය කෙටියෙන් පැවසීමකි මේ. සිත කෙලෙසන කෙලෙසුන් අතර ප්‍රධාන තැනක් ගන්නේ පංච නීවරණ ධර්මයෝ ය.

**පංච නීවරණ**: නම් සිත ආධ්‍යාත්මික වර්ධනය වෙතින් වළකා සිටින බාධාකාරී සාධක පහකි. නිර්වාණ ප්‍රතිලාභය වෙතින් පුද්ගලයා වළකා සිටින මෙම බාධාකාරී ධර්ම පහ නම්,

1. කාමච්ඡන්ද,
2. ව්‍යාපාද,
3. ථීන මිද්ධ,
4. උද්ධච්ච කුක්කුච්ච
5. විචිකිච්ඡා ය.

**1. කාමච්ඡන්ද**

රූප, ශබ්ද, ගන්ධ, රස හා ස්පර්ශ යන පංච විධ කාම වස්තූන් කෙරේ ඇතිවන ඇල්ම කාමච්ඡන්දය යි. අප සසරට බැඳ තබන බන්ධන අතුරෙන් මෙය එකකි. සාමාන්‍ය පෘථග්ජන පුද්ගලයෝ මේවාට ඇළුම් කරති. ඊට හේතුව ඔවුන් තුළ ඉන්ද්‍රියය සංවරය නොමැති වීමයි. ධ්‍යානංග පංචකයෙන් එකක් වන ඒකාග්‍රතාව මගින් මෙම නීවරණය මැඩ පවත්වනු ලැබේ. සකදාගාමී වන විට මෙය දුබල කරන අතර අනාගාමී වීමෙන් සහමුලින්ම වනසනු ලැබේ. රූප රාග, අරූප රාග වැනි සූක්ෂම ඇලුම් දුරුවන්නේ රහත් ඵලය ලැබීමේදී ය. කාමච්ඡන්දය දුරු කිරීමෙහිලා පහත දැක්වෙන තත්ත්වයන් හය මහෝපකාරී වෙයි.

1. කාමය තුනී කිරීමට අදාළ වන අරමුණක් භාවනාව සඳහා යොදා ගැනීම.
2. කාමය තුනී කිරීමට අදාළ වන අරමුණක් යොදා ගෙන ධ්‍යානයක් උපදවා ගැනීම.
3. ඉඳුරන් දමනය කර ගැනීම.
4. ආහාරයෙහි පමණ දැනීම.
5. බඹසර හැසිරෙන උතුමන් ආශ්‍රය කිරීම.
6. තම ක්‍රියාවලියට අදාළ දැහැමි කතාවන්හි නිරත වීම.

**2. ව්‍යාපාද**

ප්‍රිය කරන අරමුණක් හමු වූ විට එහි මනාප වන පරිද්දෙන් ම, අප්‍රිය අරමුණක් හමු වූ විට අමනාප වීම සිරිතයි. මේ දෙක මුළු ලොවම දවන මහා ගිනි දෙකක් සේ හැඳින්වේ. අවිද්‍යාව සමග එක්වන කාමච්ඡන්දය හා ව්‍යාපාදය ලොව සියළු දුක් පසුපස පවත්නා මහා නිදාන දෙක සේ කීම නිවරද ය. ධ්‍යානාංගයක් වූ ප්‍රීතිය ව්‍යාපාද මැඩ ලයි. සකදාග ාමී ඵලය ලැබීමෙන් දුබල වන ව්‍යාපාදය දුරු වන්නේ අනාගාමී ඵලය සාක්‍ෂාත් කළ විටය.

ව්‍යාපාදය දුරු කිරීමෙහි ලා උපස්ථම්භක වන සාධක හය මේ ය.

1. මෙත් සිතින් අරමුණ දෙස බැලීම.
2. මෙත්තා භාවනාව නිරතුරුව ප්‍රගුණ කිරීම.
3. තමන් ගේ ම කර්මය ගැන ආවර්ජනය කිරීම.
4. ඥාන සම්ප්‍රයුක්තව කල්පනා කිරීම.
5. කල්‍යාණ මිත්‍ර සේවනය.
6. අර්ථ සම්පන්න සංවාදයන්හි යෙදීම.

**3. ථීන මිද්ධ**

ථීන නම් අලස කමයි. මිද්ධ නම් නිදිබර ඔතෑනි ගතියයි. මෙය කායික අපහසුකමක් නොව මානසික ස්වභාවයකි. මෙය ගසක එල්ලී සිටින වවුලෙකු හෝ කෝටුවකට ඇලුණු පැණි ටිකක් ලෙස හෝ ගාන්නට අපහසු තරම් උකු වෙඬරු පිඬක් සේ උපමා කර දක්වති. මේ ගතිය ඇති විට වැඩක් කරන්නට උද්යෝගයක් නො නැගෙයි. මේ ගති වීර්යාරම්භයෙන් මැඩ ගත හැකි අතර මුලුමනින් ම දුරු වන්නේ රහත් බව ලත් විට ය.

ථීන මිද්ධ දුරුවීම කෙරේ බලපාන සාධක ද හයක් වෙයි. එනම්

1. පමණ දැන ආහාර ගැනීම.
2. කායික ඉරියව් වෙනස් කිරීම.
3. ආලෝක කසිණය වැඩීම.
4. එළිමහනේ සිටීම.
5. කල්‍යාණ මිත්‍ර සේවනය.
6. අර්ථ සම්පන්න සංවාදයන්හි යෙදීම.

ඊලඟ පිටුව හා සම්බන්ධයි



*නුවණැත්තා කම්කටොලු හැර නිවණෙහි ඇලී සිය සිත මොනවට පිරිසිදු කෙරේ.*

88. තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය
හිත්වා කාමෙ අකිඤ්චනො
පරියොදපෙය්‍ය අත්තානං
චිත්තක්ලෙසෙහි පණ්ඩිතො (6:13)

නිදහස් වී දුරු වී හැම කාමෙන්
විසුවොත් යහපති විවේක සුවයෙන්
තමා ම මැනවින් දමනය වීමෙන්
නැණැති මුදයි සිත හැම කෙලෙසුන්ගෙන්

# පිරිසිදු කරගන්න ඔබගේ සිත

## 6 (12) පන්සියයක් ආගන්තුක හිමිවරුන් පිළිබඳ කතා පුවත (87,88 සහ 89 ගාථා)

**විවරණාත්මක අනුවාදය (88 ගාථාව)**

**පණ්ඩිතො කාමෙ හිත්වා අකිඤ්චනො තත්‍ර අභිරතිං**
**ඉච්ඡෙය්‍ය චිත්තක්ලෙසෙහි අත්තානං පරියොදපෙය්‍ය.**

**පණ්ඩිතො**: නුවණැත්තා; **කාමෙ**: ඉඳුරන් පිණාවීම; **හිත්වා**: අතහැර; **අකිඤ්චනො**: කිසිවකුට ඇළුම් නො කරමින; **තත්‍ර**: එම විවේකයෙහි; **අභිරතිං**: ඇලීම; **ඉච්ඡෙය්‍ය**: ප්‍රිය කරන්නේය; **චිත්තක්ලෙසෙහි**: මානසික කිලිටි වලින්; **අත්තානං**: තමා; **පරියොදපෙය්‍ය**: පිරිසිදු කර ගන්නේය.

නුවණැත්තා කම්සුව හැර දමා සියළු වස්තු සම්පත් කෙරේ ආශාව දුරු කර පැවිදි ජීවිතයෙහි ලැබෙන විවේක සුවය ප්‍රිය කරයි. සිත කෙළෙසුන්ගෙන් මුදවා ගනියි.

**විවරණය**

පෙර පිටුව හා සම්බන්ධයි

**5. විචිකිච්ඡා**

සැකය හෙවත් අතීරණය මෙයින් හැඟෙයි. නුවණ මඳ වූ විට ඇතිවන මේ තත්වය පැටළුණු ව්‍යාකූල චින්තනය ලෙස ද හැඳින්වෙයි. මෙය බුද්ධාදී අවතැන්හි සැකය වශයෙන් නිර්වචනය නො කළ යුත්තේ අබෞද්ධයන් පවා විචිකිච්ඡා දුරු කර ධ්‍යාන ලබන හෙයිනි.

විචිකිච්ඡා නම් වූ සංයෝජනය එසේ හැඳින්විය හැකිය. එහෙත් නීවරණයක් වූ විචිකිච්ඡාව හුදෙක් ඕනෑම වැදගත් ප්‍රස්තුතයන් විෂයෙහි ඇති විය හැකි ව්‍යාකූල චින්තනය යි. අටුවාවෙහි එන මේ නිර්වචනය අනුව විචිකිච්ඡාව අතීරණය ලෙස හැඳින්විය හැකිය. විචිකිච්ඡාව ධ්‍යානාංගයක් වූ විචාරය මගින් මැඩලිය හැකිය. එය සෝවාන් ඵලය මගින් මූලෝත්පාටනය වෙයි. විචිකිච්ඡාව දුරලීමේ විෂයෙහි හිතකර බලපෑමක් විය හැකි කරුණු හයක් දක්වා ඇත. එනම්,

1. ධර්ම විනය පිළිබඳ ඥානය.
2. ප්‍රශ්න කිරීම හා සාකච්ඡාව.
3. ශික්ෂාවෙහි යථා තත්ත්වය පිළිබඳ අවබෝධය.
4. දැඩි ශ්‍රද්ධාව.
5. කල්‍යාණ මිත්‍ර සේවනය.
6. අර්ථවත් කතා බහ යන කරුණු හයයි.

උපමා දක්වන විට, කාමච්ඡන්දය විවිධ වර්ණ මිශ්‍ර ජලයට ද, ව්‍යාපාදය උණු වතුරට ද, ථීන මිද්ධය පෙඳ හා පාසි වලින් වැසුනු ජලයට ද , උද්ධච්ච කුක්කුච්චය වාත වේගයෙන් කැළඹුණු ජලයට ද, විචිකිච්ඡාව කැළඹුණු මඩ වතුරට ද සමාන කර දක්වා තිබේ. මෙබඳු ජලයේ යමෙකුට තම පිළිබිඹුව දැක ගත නො හැකි පරිද්දෙන් ම පංච නීවරණයෙන් යුක්ත සිතක් ඇති විට තමා ගේ යහපත, අනුන්ගේ යහපත හෝ තමාගේත් අනුන්ගේත් යන දෙපිලේ ම යහපත යන කිසිවක් මෙනෙහි කර ගැනීම අපහසු වෙයි. මේ පංච නීවරණ විවිධ ක්‍රම වලින් යටපත් කර ගන්නේ තාවකාලිකව ය. ඒවායේ පූර්ණ ප්‍රහාණය සිදුවන ආකාරය මෙහි දැක්වේ.සෝවාන් වීමේ දී - විචිකිච්ඡා, අනාගාමී වීමේ දී - කාමච්ඡන්ද, ව්‍යාපාද, උද්ධච්ච කුක්කුච්ච සහ රහත් වීමේ දී - ථීන මිද්ධ

**සප්ත බොධ්‍යඞග (සම්බොජ්ඣංග)**: නම් ලෝකෝත්තර සිත්වල නිර්වාණාලම්බනයෙහි එල්බ ඒකක්ෂණික ව හා ලෞකික සිත්වල නානාලම්බනයෙහි එල්බ නානාක්ෂණිකව උපදනා සමෘති, ප්‍රඥා, වීර්යය,ප්‍රීති, ප්‍රශ්‍රබ්ධි, ඒකාග්‍රතා, උපේක්ෂා යන චෛතසික සතය. බුදුබව ලැබීම සඳහා උපකාරී වන මේ ගුණාංග සම්බොජ්ඣංග වශයෙන් හැඳින් වේ. මේ අංග විෂයෙහි සත්‍ය ගවේෂකයා දක්වන්නේ කවර විදියේ ආකල්පයක් ද? සත්‍ය ගවේෂකයා "මා තුළ සම්බුද්ධත්වය ලැබීමේ ගුණාංගයක් වූ සතිය ඇත" යි දනියි.

එය නැති විට නැති බව දනියි. එය ඇති කර ගන්නේ කෙසේ දැයි තේරුම් ගන්නා හෙතෙම එය වර්ධනය කර ගනියි. එය ඇති වූ විට දැන් මා තුළ මෙම සම්බෝධි අංගය වර්ධනය වී ඇතැයි දැන ගනී. මෙය සතිපට්ඨාන සූත්‍රයේ දී සත්‍ය ගවේෂකයා ධම්මානුපස්සනාව වඩන ආකාරය යි. සත්‍ය ගවේෂකයකු සම්බොජ්ඣංග විෂයෙහි දක්වන්නේ මෙම ගතික හා ප්‍රායෝගික ආකල්පය යි. සම්බොජ්ඣංග හත නම්,

1. සති සම්බොජ්ඣංගය
2. ධම්ම විචය සම්බොජ්ඣංගය
3. විරිය සම්බොජ්ඣංගය
4. පීති සම්බොජ්ඣංගය
5. පස්සද්ධි සම්බොජ්ඣංගය
6. සමාධි සම්බොජ්ඣංගය
7. උපේක්ඛා සම්බොජ්ඣංගය

සප්ත බොධ්‍යඞග එනමින් හඳුන්වනු ලබන්නේ බුද්ධත්වය කරා යමකු යොමු කරන ගුණාංග සප්තකයක් හෙයිනි. (බෝධි-අංග) මේවා වර්ධනය වන්නේ **කායානුපස්සනා**, **වේදනානුපස්සනා**, **චිත්තානුපස්සනා**, සහ **ධම්මානුපස්සනා** යන සතර සතිපට්ඨානය ප්‍රගුණ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි. මේ සම්බන්ධයෙන් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාල හ.

(1) "මහණෙනි, භික්ෂුනමක් වීර්යයෙන් යුතුව පිරිසිදු සිහියෙන් යුතුව, සම්පජඤ්ඤයෙන් අභිද්‍යාව හා දොම්නස දුරු කොට වේදනා, සිත හා ධර්මයන් විෂයෙහි සිහිය පිහිටුවා ගෙන වාසය කරයි නම්, ඔහු ගේ සිහිය මනාව පිහිටා සිටියි. ඔහු ගේ සිහිය මනාව පිහිටා සිටි විට සති සම්බොජ්ඣංගය වර්ධනය වී පූර්ණත්වයට පත් වෙයි.

(2) සතියෙන් යුතුව වාසය කරන අතර එම භික්ෂුව නුවණින් යුතුව ධර්මය ගැන සිතමින් විමසමින් වාසය කරන්නේ නම් එවිට ඔහු ගේ ධම්ම විචය සම්බොජ්ඣංගය පූර්ණත්වයට පත්වෙයි.

(3) නුවණින් විමසා බලමින් තහවුරු වූ පධන් වීර්යයෙන් යුතුව එම භික්ෂුව වාසය කරන විට ඔහු ගේ විරිය සම්බොජ්ඣංගය පූර්ණත්වයට පත්වෙයි.

(4) වීර්යය පූර්ණත්වයට පත් වී වාසය කරන භික්ෂුව තුළ අතින්ද්‍රිය වූ ප්‍රණීතකර වූ සමාධිජ ප්‍රීතිය වර්ධනය වීමෙන් පීති සම්බොජ්ඣංගය පරිපූර්ණ වෙයි.

(5) සිත සමාධිගතව, සිත හා ගත සංවරව වාසය කරන එම භික්ෂුවට පස්සද්ධි සම්බොජ්ඣංගය වර්ධනය වෙයි.

(6) කාය පස්සද්ධිය ඇති වී ප්‍රීතිය වර්ධනය වී චිත්තේකාග්‍රතාව වර්ධනය වූ විට සමාධි සම්බොජ්ඣංගය වර්ධනය වෙයි.

(7) තම සිත දෙස පූර්ණ උපේක්ෂාවෙන් නිරීක්ෂණය කරන විට යෝගාවචර භික්ෂු තෙම උපේක්ඛා සම්බොජ්ඣංගය පරිපූර්ණය කර ගනියි."

**තත්‍රාභිරති මිච්ඡෙය්‍ය**: විමුක්තිය විෂයෙහි ඇල්ම ඇති කර ගැනීම.

**අකිඤ්චන**: සියලු උපභෝග- පරිභෝග වස්තු අතහැර තෘෂ්ණා විරහිත ජීවිතයක් ගත කිරීම.

**චිත්තක්ලෙසේහි**: සිත කිලිටි කරන කෙලෙස්.



*සම්බෝධියට පත් වන දහම්හි මනාකොට පුරුදු කළ සිතැති රහත්හු ලොව පිරිනිවි උතුමෝ ය.*

89. යෙසං සම්බෝධිඅඞ්ගෙසු
සම්මා චිත්තං සුභාවිතං
ආදානපටිනිස්සග්ගෙ
අනුපාදාය යෙ රතා
ඛීණාසවා ජුතී මන්තො
තෙ ලොකෙ පරිනිබ්බුතා (6:14)

සම්බුදු අංග වඩමින්
සිය සිත පුහුණු කළ අය
හැම බැඳුම් සිඳ හැර
නො රඳා ඇළුම් දුරු කර
බබලති රහත් වී
වෙති පිරිනිවන් පෑවෝ

# රහත් පල ලැබගෙන - යති ලොව ඉක්මවා ගෙන

## 6 (12) පන්සියයක් ආගන්තුක හිමිවරුන් පිළිබඳ කතා පුවත (87,88 සහ 89 ගාථා)

### විවරණාත්මක අනුවාදය (89 ගාථාව)

**යෙසං චිත්තං සම්බෝධි අඞ්ගෙසු සම්මා සුභාවිතං යෙ අනුපාදාය ආදාන පටිනිස්සග්ගෙ රතා ජුතිමන්තො තෙ ඛීණාසවා ලොකෙ පරිනිබ්බුතා.**

**යෙසං**: යම්කිසි (නිර්මල) තැනැත්තකු ගේ; **චිත්තං**: සිත; **සම්බෝධි අඞ්ගෙසු**: සම්බොජ්ඣංගයන් විෂයෙහි; **සම්මා සුභාවිතං**: මැනවින් වඩන ලද ද; **යෙ**: යම් කිසි කෙනෙක්; **අනුපාදාය**: කිසිවක් උපාදාන වශයෙන් ග්‍රහණය නො කර; **ආදාන පටිනිස්සග්ගෙ**: ග්‍රහණයන් අතහැර දැමීමෙහි; **රතා**: ඇලුම් කරත් ද; **ජුතිමන්තො**: බැබළෙමින් සිටින;**තෙ ඛීණාසවා**: ඒ රහතන් වහන්සේලා; **ලොකෙ**: ලෝකයෙහි; **පරිනිබ්බුතා**:- පිරිනිවන් පෑ උත්තමයෝ ය.

බෝධ්‍යංග නිසි ලෙස වර්ධනය කර ගත්, කිසිම වස්තුවක් මගේ යැයි ග්‍රහණය නො කරන, උපාදාන නො ගන්නා යමෙක් වෙත් නම්, එම දීප්තිමත් රහතන් වහන්සේලා නිවන් සුව පසක් කර ගත්තෝ ය.

### විවරණය

**ආදාන පටිනිස්සග්ගේ**: අල්වා ගැනීම (ග්‍රහණය) කෙරෙහි ඇති ප්‍රවණතා නැති කර දැමීම. අල්ලා ගැනීමේ ස්වභාවය දුරු කිරීම.

**ලෝකේ පරිනිබ්බුතා**: මේ භවයේදීම (මේ ලෝකයේදී ම) නිවන් සුවය සාක්ෂාත් කරගෙන ඇත්තේ ය. පරිනිබ්බුත යන වචනයෙන් මරණය අදහස් නොවන බව තේරුම් ගැනීම මැනවි. මෙහිදී සෝපාධිසේස පරිනිර්වාණය අදහස් කර ඇත.

පරිනිබ්බුත යන්නෙන් සාමාන්‍යයෙන් භාග්‍යවතුන් වහන්සේ ගේ පිරිනිවන් පෑම අදහස් වෙතත් රහතන් වහන්සේ නමක් සම්බන්ධයෙන් වුවද එය යෙදිය හැකිය. බුදුරජාණන් වහන්සේ ගේ පරිනිර්වාණය පිළිබඳව මහා පරිනිර්වාණ සූත්‍රයෙහි පැහැදිලිව විස්තර කර ඇත. මුලින් ම ප්‍රථම ධ්‍යානයට සමවැදුණු භාග්‍යවතුන් වහන්සේ අනතුරුව ඉන් නැඟී ද්විතීය ධ්‍යානයට සම වැදුණාහ. මේ ක්‍රමයෙන් තෘතීය, චතුර්ථ ධ්‍යානයන්ට ද ඉන් පසු ආකාසානඤ්චායතන ධ්‍යානය, විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය, ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය, හා නේ’ව සඤ්ඤා නාසඤ්ඤායතනයට ද සමවන්හ. ඉන් නැඟී සඤ්ඤාවේදයිත නිරෝධයට සමවන්හ. ඉන් පසු නැවත අවරෝහණ ක්‍රමයෙන් මුල් ධ්‍යානය දක්වා සමවැද නැවත චතුර්ථ ධ්‍යානය දක්වා ආරෝහණ ක්‍රමයට සම වැදුණාහ.

එයින් නැඟී සිටි භාග්‍යවතුන් වහන්සේ අනුපදිසේස පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළ හ.

# කතෘ ස්වාමීන්ද්‍රයන් වහන්සේ



සනාතන බුද්ධ භාෂිතය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ අසහාය සාමයික මෙහෙය උදෙසා, සිය කාලය හා ශ්‍රමය සපුරා වැය කරමින්, මානව වංශයට දහම් මග හෙළි පෙහෙළි කිරීමේ මහා මෙහෙවරට කැප වී සිටින සිංගප්පූරුවේ ප්‍රධාන සංඝ නායක වේරගොඩ සාරද, ස්ථවිරයන් වහන්සේ අද ලොව වෙසෙන ප්‍රශස්ථතම ධර්ම දූත යතිනායක වරයාණන් වහන්සේ නමකි.

1941 නොවැම්බර් මස 27 වනදා දකුණු ලක වේරගොඩ දී උපත ලද මේ යති ප්‍රභූවරයානෝ, උපාධි ලාභීව, ධර්මදූත මෙහෙය ආරම්භ කළේ ඉතා යොවුන් අවධියේ දීමය. දැනට ශතක 6 ක් පුරා ධර්මදූත මෙහෙයෙහි යෙදී සිටින ගරුතර වේරගොඩ සාරද යතිනායකයානන් වහන්සේ මුද්‍රිත මාධ්‍යයෙන් සහ විද්‍යුත් මාධ්‍යයෙන් මෙන්ම දුරකථන තාක්‍ෂණයෙන් පවා අද ලොවට ධර්මදානය සපයන්නේ නවීනයන්ගේ මනස හා ආධ්‍යාත්මික ගති-පැවතුම් පිළිබඳ පැහැදිලි අවබෝධයකිනි.

වර්තමානික ග්‍රාහක පිරිස, ශ්‍රව්‍ය-දෘෂ්‍ය මාධ්‍ය මගින් දැනුමත් විනෝදාස්වාදයත් ලබන්නට පුරුදු වී සිටින පරපුරක් හෙයින්, ගරුතර වේරගොඩ සාරද හිමිපාණෝ, ඔවුනගේ මනසට සරිලන පරිද්දෙන් බුද්ධ භාෂිතය, ඔවුන් අතට පත් කරන සේක. මුද්‍රිත හා විද්‍යුත් ප්‍රකාශන 700 ක් පමණ ලොවට පිරිනමා සිටින මේ යතිනායකයන් වහන්සේ විසින් සම්පාදිත ධර්ම භාණ්ඩාගාරය නම් ඉංග්‍රීසි කෘතිය දොරට වැඩීමේ උළෙලේ දී, ඒ පිළිබඳ ව එක් දිනක් තුල පමණක් ලැබුණු දුරකථන ඇමතුම් සංඛ්‍යාව 2000 කටත් අධික විය. ඒ නිසා එය සිංගප්පූරු රාජ්‍යයේ ග්‍රන්ථ ප්‍රකාශන ඉතිහාසයේ සුවිශිෂ්ට වාර්තාවකට හිමිකම් කියන්නේය.

දැනට, සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය භාරව වැඩ සිටින ගරු වේරගොඩ සාරද නායක ස්ථවිර පාදයන් වහන්සේ ලෝකයේ බොහෝ දේශයන් හී බුද්ධ ශාසනයේ ප්‍රගතියට හිතකාමී ධර්ම දූත මෙහෙවරක යෙදී සිටින සේක.

එතුමන් ගේ ප්‍රධාන ප්‍රකාශ අතර, සිංහල හා ඉංගිරිසි ධම්මපදයත්, ජාතක කථා පිළිබඳ විද්‍යුත් ප්‍රකාශනයත් ප්‍රධාන තැන් ගනී. එතුමන් විසින්, ඉටු කෙරෙන මහා සාමයික මෙහෙය අඛන්ඩව පවත්වා ගෙන යනු පිණිස, ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් නිදුක් නිරෝගී සුව පැතීම, බෞද්ධ ජනතාවගෙන් ඉටු විය යුතු කෘතඥතා පූර්වක චාරිත්‍රයකි.

කලා කීර්ති එඩ්වින් ආරියදාස

ISBN: 981-00-4938-2

# ධර්ම භාණ්ඩාගාරය

සිතුවම් සහිත ධම්මපදය

හත්වන පරිච්ඡේදය

## අරහනත වග්ග



ගරු වේරගොඩ සාරද නාහිමිපාණන් වහන්සේ

සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක

"සබ්බදානං ධම්මදානං ජිනාති"

(ධර්ම දානය, සෙසු දාන සියල්ලටම වඩා අගනේය.)



''ධර්ම භාණ්ඩාගාරය'' නැමැති

මෙම වටිනා ධර්ම පුස්තකය

**සාමවිනිසුරු බී.ධර්මදාස පියාණන්ට**

නිවන් සුව පතා ප්‍රකාශනය කරන ලදි.

පූර්ණ අනුග්‍රහකත්වය

**වේරගොඩ සුනන්දා භික්ෂුණිය විසිනි**

# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත
## ධම්මපදය

කතෘ:
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය**
නො: 1, ජලන් මස් පුටේ, සිංගප්පූරුව 128607
ටෙලි: 65 67783330 65 94656570
94 770589498 / 94 755218421
වේරගොඩ ජයන්ති විහාරය, වේරගොඩ, මීටියාගොඩ
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

**කර්තෘ**
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**චිත්‍ර ශිල්පි**
පී. වික්‍රමනායක

**සැකසුම**
පියරත්න හේවාබට්ටගේ

**පරිගණක රූපාවලි සහ පූර්ව ප්‍රකාශන මෙහෙය**
පූජ්‍ය වේරගොඩ සුනන්දා භික්ඛුණී
බී. දයා සමරසිංහ
බී. රෝහණ ජයතිස්ස

**පරිගණක සහාය**
ශ්‍යාමනී ප්‍රියලක්‍ෂණා ලේකම්වසම්
ඩබ්ලිව්. මාලා කාන්ති
ප්‍රියංකා බෝධිපක්‍ෂ

**සහාය**
බී. පුෂ්පානී ධම්මලතා
බී. ජේ. ධම්මලතා
ඊ. එම්. ලයනල් මොහොට්ටි
ඊ. එම්. යුගාන් සසංක
ශ්‍රියාලතා කග්ගොඩ ආරච්චි

**පරිගණක ප්‍රකාශන**
සමනල ප්‍රින්ටර්ස්, බටපොල
ටෙලි: +94 777557127

**පිටකවරයේ පින්තූරය**
බර්ට් ගුණසේකර

**මුද්‍රණය**
2013 නොවැම්බර් මස 27 දින, සිංගප්පූරුව

**පිටකවරයේ චිත්‍රය**
*පිටකවරයේ බුදු පිළිමය වේරගොඩ ජයන්ති විහාරයේ බුදුමැදුරෙනි.*
*වර්ෂ 1953 ජුනි 3 වෙනිදා අඹන ලද මෙම බුදු පිළිමය දැනට ශ්‍රී ලංකාවේ තිබෙන*
*දර්ශණීයතම බුදු පිළිමය වශයෙන් සැලකේ. මෙම බුදු පිළිමය ඉදිකිරීමේ පුරෝගාමී වූ අපවත් වී වදාළ*
*ගෞරවාහී පණ්ඩිත යටලමත්තේ වජිරඤාණ නායක මාහිමිපාණන් වහන්සේට නිවන්සුව අත්වේවායි අපි ප්‍රාර්ථනා කරමු.*

මේ ග්‍රන්ථයෙහි ආගත කරුණු පිළිබඳ පූර්ණ හා සදාකාලික අයිතිය හිමි වන්නේ බුදුරජාණන් වහන්සේටයි.
බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් පහල වූ සනාතනික සත්‍යයෝ පුහුදුන් මිනිසුන් විසින් පනවන ලද
තාවකාලික වූත්, අසත්‍ය වූත්, අයිතිවාසිකම් පිළිබඳ නීති රීති පිළිගනු නොලබති.

**පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ටෙලි: 65 67783330 65 94656570
+94 770589498 +94 755218421
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

ISBN: 981-00-4938-2

# අරහන්ත වගග





*නිමි සසර ගමන් ඇති සියලු කෙලෙස් ගැට සිඳ ලූ රහතුනට සිත් තැවිල්ලෙක් නැත්තේ ය.*

| | |
|---|---|
| 90. ගතද්ධිනො විසොකස්ස<br>විප්පමුත්තස්ස සබ්බධි<br>සබ්බගන්ථප්පහීනස්ස<br>පරිළාහෝ න විජ්ජති (7:1) | ගමන නිම කළ, දුරැර සෝකය<br>සියල්ලෙන් ලැබගත් විමුක්තිය<br>පුපුරුවා හළ සියලු බන්ධන<br>උතුමනට නැත කිසි දැවීමක් |

# නිවී යයි කෙලෙස් ගිම්

## 7 (1) ජීවක නැගූ ප්‍රශ්න (90 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ **ජීවක** නම් අඹවනයේ වැඩ විසූ සමයෙහි ජීවක විසින් විමසන ලද ප්‍රශ්නයක් විෂයෙහි මේ ගාථාව දේශනා කළ සේක.

එසමයෙහි අජාසත් රජ සමග එක් වූ දේවදත්ත ස්ථවිරයෝ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වෛර බැඳ ගලක් පෙරළා උන් වහන්සේ මරා දමමි යි සිතා ගිජ්ඣකූළු පව්වට නැග ගත්තේ ය. ඔහු කඳු මත සිට බුදුන් වෙතට කළු ගලක් වෙර යොදා පෙරලූ නමුත් බුදුරදුන් ගේ පින් මහිමයෙන් මතු වූ ගලක් එම ගල නවතාලීය. එහෙත් ගලෙන් බිඳුණු පතුරක් භාග්‍යවතුන් වහන්සේ ගේ පයෙහි වැදී ලේ ගලන්නට පටන් ගත්තේ ය. බුදුරජාණන් වහන්සේට දැඩි වේදනාවක් දැනුණෙන් භික්ෂූහු උන් වහන්සේ මද්දකුච්ඡියට ගෙන ගිය හ.

අම්බ වනයෙහි සිටි ජීවක වෛද්‍යවරයා වෙතින් පිළියම් ලබනු රිසි වූ උන් වහන්සේ "මා ජීවක වෙත ගෙන යන්නැ"යි භික්ෂූන් වහන්සේලාට කියා සිටිය හ. වහා ක්‍රියාත්මක වූ ජීවක බුදුරදුන් ගේ පාදයෙහි ඖෂධයක් ගල්වා "සමිඳුනි, නගරයේ එක් රෝගියකු බලන්නට ඇත. ඔහුට පිළියම් කොට වහා ආපසු එමි. මා එන තුරු මේ බෙහෙත තිබෙන්නට හරින්න"යි කියා හේ තම රෝගියාට පිළියම් කරන්නට ගියේ ය.

ඔහු රෝගියාට පිළියම් කර ආපසු එන විට ගේට්ටුව වසා තිබුණු හෙයින් පැමිණීමට අපහසු විය. ඔහුට මෙසේ සිතිණි."බෙහෙත ලිහා දැමීමට දැන් වේලාවයි. එසේ නො කළ හොත් බුදුරදුන්ට බොහෝ වේදනා ඇති වනු ඇත. මට තිබුණේ බෙහෙත ලිහන්නට වෙන කෙනෙකු යොදවා යාමට යි. මා කර ඇත්තේ බරපතල පාප කර්මයකි." මෙසේ සිතමින් හේ පසු තැවුණේ ය.

ජීවක එසේ පසුතැවෙන අතරතුර භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමියන් අමතා "ආනන්ද, ජීවකට ගේට්ටුව වසා ඇති බැවින් මෙහි පැමිණීම දුෂ්කර විය. දැන් බෙහෙත ගළවා දමන්නට යෝග්‍ය වේලාවයි." ඒ ඇසූ ආනන්ද හිමියෝ වෙළුම් පටි ගලවා බෙහෙත ඉවත් කළ හ. තුවාලය සුව වී තිබිණ.

උදෑසනින් ම ජීවක බුදුරදුන් දකින්නට පැමිණ,"සමිඳුනි, ඔබ වහන්සේට බරපතල වේදනාවක් දැනුණා ද?"යි ප්‍රශ්න කළ හ. "ජීවක, බුද්ධත්වය ලත් දින වජ්‍රාසනය මත දී තථාගතයන් වහන්සේ ගේ සියලු වේදනා අවසන්ව ගියේ ය" යි උන් වහන්සේ පැවසූහ.

**විවරණාත්මක අනුවාදය (90 ගාථාව)**

**ගතද්ධිනො විසොකස්ස සබ්බධි විප්පමුත්තස්ස සබ්බ ගන්ථප්පහීණස්ස පරිළාහෝ න විජ්ජති.**

**ගතද්ධිනො**: ගමන නිම කළ; **විසොකස්ස**: ශෝකය දුරු කළ; **සබ්බධි**: හැම දේ කෙරෙන් ම; **විප්පමුත්තස්ස**: විමුක්ත වූ; **සබ්බ ගන්ථප්පහීණස්ස**: සියළු බන්ධනයන්ගෙන් මිදුණු; **පරිළාහො**: වේදනාවක්; **න විජ්ජති**: විද්‍යාමාන නොවේ.

සසර ගමන නිමැවූ, සියලු ශෝක දුරු කළ හැම අතින්ම විමුක්ත, සියළු බන්ධන සිඳලූ බුදුන් වහන්සේ, රහතන් වහන්සේ වැනි උතුමනට පරිළාහයන් හෙවත් වේදනාවක් නො මැත.

**විවරණය**

**ගතද්ධිනො**: යන්නෙන් අදහස් වන්නේ සසර ගමන නිමවා වදාළ බුද්ධාදී උතුමෝය. සියලු මිනිසුන් ගමන් ගන්නා සංසාර මාර්ගය හැරෙන විට තවත් මිනිසුන් විසින් ගමන් ගන්නා මාර්ග තිබේ. එනම්,

1. සොර සතුරන් ගැවෙසෙන මාර්ගය
2. වන සතුන් ගැවසෙන මාර්ගය
3. ජලය නැති මාර්ගය
4. අමනුෂ්‍යගෘහිත මාර්ගය හා
5. ආහාර විරහිත මාර්ගය යි.

මෙහි දී එම දුගී මාර්ග නොව සංසාර මාර්ගය අදහස් වෙයි.

**සබ්බ ගන්ථප්පහීන**: මින් සියලු බන්ධනයන්ගෙන් මිදුණු යන්න කියැවෙයි. බන්ධන වර්ග හතරක් වෙයි.

1. අභිධ්‍යා: අධික තෘෂ්ණාවයි. අන්‍යයන් ගේ සම්මාන ලබා ගැනීම සඳහා ඇතිවන දැඩි තෘෂ්ණාව යි.

2. ව්‍යාපාද: අන්‍යයන් විෂයෙහි අමනාප ව ක්‍රෝධය හෙවත් වෛරය ඇති කර ගැනීම යි.

3. සීලබ්බත පරාමාස: විධිමත් ශික්ෂණයෙන් බැහැරව විවිධ මිථ්‍යා ව්‍රත චාරිත්‍ර ආදියට යොමු වීමයි.

4. ඉදං සච්චාභිනිවෙසො: මා පිළිගන්නා දෙය පමණක් ම සත්‍යය යි, අන් සියල්ල මුසාවාද වෙති, යි පිළිගැනීම. යන මේ හතර එබඳු බන්ධන වෙති. මේ හතර මිනිසා සසරට බැඳ තබයි.

**ජීවක**: බුදුරජාණන් වහන්සේ ගේ වෛද්‍යවරයා ය. උපන් හැටියේ ම මව විසින් කූඩයක දමා කුණු ගොඩක දමා තිබිණි. බිම්බිසාර රජුගේ පුත්‍රයකු වූ අභයරාජ කුමාරයා ඔහු දැක දරු සෙනෙහසින් හදා ගත්තේ ය. කුණු ගොඩෙන් ගනිද්දී පණ තිබුණු හෙයින් (ජීවති) ඒ බව කියැවෙන ජීවක නම ඔහුට යෙදිණි. කුමරකු විසින් හදා වඩා ගත් හෙයින් කෝමාරභච්ච යන්න ද නමට ඈඳිණි. වෛද්‍ය ශාස්ත්‍රය හදාරා දක්ෂ වෛද්‍යවරයකු වූ හෙතෙම ශල්‍ය කර්මයන්හි ද දක්ෂ විය. දරුණු ශීර්ෂාබාධයකින් පෙළුණු සිටුවරයකුට සැත්කම් දෙකක් කළ බව පත පොතේ සඳහන් වේ. දිනකට තුන් වරක් බුදුරදුන් හමු වීමට ගිය සැදැහැවතකු වූ හේ ගල් පතුර වැදී තුවාල වූ බුදුරදුන් ගේ පාදයට ද පිළියම් කළේ ය.





*විල හැරපියා හංසයන් යන්නා සේ - රහත්හු, වසන හැමතැනක්ම ඇලීම් රහිතව හැරයත්.*

91. උයයුඤ්ජන්ති සතිමන්තො
න නිකෙතෙ රමන්ති තෙ
හංසා'ව පල්ලලං හිත්වා
ඔකමොකං ජහන්ති තෙ (7:2)

සිහි ඇත්තෝ බවුන් වඩන
නවාතැනක සිත නො රඳන
හංසයන් සේ විල හැර යන
හැරලති යන යන නිවහන

# උතුමෝ අරහත් - කිසිතැනක නො ඇලෙත්

## 7 (2) මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ (91 ගාථාව)

**මහා කාශ්‍යප මහ තෙරුන් වහන්සේ** ඇරබ බුදුරදුන් මේ ගාථාව වදාරන ලද්දේ වේළුවනාරාමයෙහි වැඩ සිටි සමයේ ය.

රජගහ නුවර වස් වැස නිමැ වූ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "දෙසතියකින් පසු මම පිණ්ඩපාත චාරිකාවෙහි නිරත වන්නෙමි" යි වදාළ හ. ඒ ඇසූ බොහෝ භික්ෂූන් වහන්සේලා පාත්‍ර සූදානම් කර ගත්හ. සිවුරු සෝදා පඬු පොවා සකස් කරන්නට පටන් ගත්හ. ඒ අවස්ථාවෙහි මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ද තම සිවුරු සෝදා පිරිසිදු කර ගත්හ.

මහා කාශ්‍යප තෙරුන් සිවුරු සෝදා වේලා සකස් කරනු දුටු ඇතැම් භික්ෂූහු "මහා කාශ්‍යප හිමියන් මේ සිවුරු සූදානම් කරන්නේ කුමට ද? රජගහ නුවර දහ අට කෝටියක් ජනයා වෙසෙති. මේ අයගෙන් වැඩි හරිය එක්කෝ කාශ්‍යප හිමියන් ගේ දායකයෝ ය. නැත්නම් නෑදෑයෝ ය. ඔවුන් අතහැර උන්වහන්සේ කොහි වැඩම කරන්නට ද? ඒ අය උන්වහන්සේට නො අඩුව සිවුපසය පිරිනමන්නෝ ය. ඒ අය හැර දමා උන්වහන්සේ කොහි වඩින්නට ද? ගියත් උන්වහන්සේ මාපමාද ගුහාවෙන් එහාට නො යනවා ඇත." යි කතිකා කළ හ. (මාපමාද ගුහාව නම්, භාග්‍යවතුන් වහන්සේ තමන් සමග යන්නට එන භික්ෂූන්ගෙන් සමහරුන් ආපසු එවන්නට සිතා නැවතී "මහණෙනි, ඔබ මෙතැනදී ආපසු හැරී ආරාමයට යන්න. ප්‍රමාද නො වී ක්‍රියා කරන්න. (මා පමජ්ජිත්ථ)" යි අවවාද කරන තැනය.) භාග්‍යවතුන් වහන්සේ ද ගමනට පිටත් වී, "මේ රජගහනුවර ඇතුළත හා පිටත දහ අට කෝටියක් ජනයා වෙසෙති.

මේ අය ගේ විවිධ ආගමික අවශ්‍යතා තිබේ. එහෙයින් ආරාමය හිස් වන්නට ඉඩ හැරීම නුසුදුසු ය. මෙහි කවුරුන් හෝ සිටිය යුතු ය. මේ වැඩිදෙනා එක්කෝ මහා කාශ්‍යප ගේ දායකයෝ ය. නැත්නම් ඥාතිවරුය. එහෙයින් මා උන්වහන්සේ හා පිරිස මෙහි නවතා යන්නේ නම් මැනවි" යි සිතා, මහා කාශ්‍යප හිමියන් අමතා මෙසේ වදාළ හ. "මහා කාශ්‍යප, ආරාමය හිස්ව තැබීම නුසුදුසු ය. මහ ජනතාවට උත්සව අවස්ථාවල හෝ විපත්ති අවස්ථාවල සංඝයා අවශ්‍ය වෙයි. එහෙයින් ඔබ ඔබ ගේ පිරිසත් සමග නවතින්න." ඒ ඇසූ මහා කාශ්‍යප හිමියෝ ද "මැනවි, ස්වාමීනි" යි ආපසු හැරී ගියහ.

ඇතැම් භික්ෂූහු ඒ දැක "අප කීවා බොරු ද? මහා කාශ්‍යප හිමියන් සිවුරු සෝදා සකසත් දී මාපමාද ගුහාවෙන් එහාට නො යන බව අපි නො කීවෙමු ද? අප කී දේ එලෙස ම ඉටු වුවා නොවේ ද?'' යි කියන්නට වූහ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ නැවතී "මහණෙනි, ඔබ මේ දැන් කතා කළේ කුමක්ද" යි විමසූයෙන් භික්ෂූහු සියල්ල නොවළහා කියා පෑහ. "මහණෙනි, මහා කාශ්‍යපයන් නැවතුණේ ඔබ කියන පරිදි ඥාතීන් හෝ දායකයන් ප්‍රත්‍ය පිරිනමන නිසා නොව, මාගේ වචනය නිසා ය. මට ඇති අවනත බව නිසා ය. මහා කාශ්‍යපයෝ කුල ගෙවලට හෝ ගිහියන්ගෙන් ලැබෙන ප්‍රත්‍යයට ඇලුම් කරන්නෝ නො වෙති. ඇත්තම කිවහොත් පෙර අත් බවෙක මහා කාශ්‍යප ස්ථවිරයෝ මම චන්ද්‍රයා මෙන් නො ඇලී වසන්නට සමත් වෙම්වා යි ප්‍රාර්ථනා කළේ ය. මහා කාශ්‍යප දායකයන් වෙත හෝ විහාරය වෙත හෝ බැඳුණෝ නො වෙයි. මහා කාශ්‍යප ගේ පටන් සියලුම ශ්‍රාවකයන්ට මා අවවාද කර ඇත්තේ චන්ද්‍රයා උපමා කොට හැසිරෙන ලෙස නොවේ ද? සියළු භික්ෂූන් හංසයන් විලකට නො ඇලී විලෙන් විලට පියාඹන්නා සේ එක් ස්ථානයකට නො ඇලී සෙනසුනෙන් සෙනසුනට ඇල්මක් නොකර සැරිසරන්නට සමත් වුව මනාය"යි අවවාද කළ හ.

**විවරණාත්මක අනුවාදය (91 ගාථාව)**

**සතීමන්තො උයුඤ්ජන්ති තෙ නිකෙතෙ න රමන්ති තෙ**
**පල්ලලං හිත්වා හංසා ඉව ඕකමොකං ජහන්ති.**

**සතීමන්තො**: සිහිය වඩන උතුමෝ; **උයුඤ්ජන්ති**: නිරතුරුව බවුන් වඩති; **තෙ**: ඔවුහු; **නිකෙතෙ**: ඇලුම් බැඳුම් විෂයෙහි; **න රමන්ති**: උනන්දු නො වෙති; **තෙ**: ඔවුහු; **පල්ලලං හිත්වා**: විල හැර යන; **හංසා ඉව**: හංසයන් මෙන්; **ඕකමොකං**: නවාතැන් පොළවල්; **ජහන්ති**: හැරයති.

සිහි නුවණින් දවසරින නිරතුරු බවුන් වඩන උතුමෝ කිසි ම බන්ධනයක් ඇති කර නොගනිති. හංසයන් විලක් හැර විලකට යන පරිද්දෙන් ඔවුහු ආරාම කෙරේ නො ඇලී හැර යති.

**විවරණය**

**සතීමන්තො**: සතිය නම් අවධානය යි. නිරන්තර අවදිකම යි. සතිය පංච ඉන්ද්‍රිය හා පංච බල අතර එකකි. බෝධි අංගයන් ගෙන් ද එකකි. ආර්යය අෂ්ටාංගික මාර්ගයෙහි සත් වන පියවරයි. කුසල කර්ම හා කර්මජ මහග්ගත චිත්තයන්ගේ ද යෙදෙන අනිවාර්ය ය චෛතසිකයකි.

**අරහන්ත**: හෙවත් රහතන් වහන්සේලා කිසිවකට හෝ කිසිවෙකුට ඇලුම් නොකරන්නෝ ය. මම ය, මාගේ ය වැනි සංකල්පයන්ගෙන් ද තොරය හ.





*නිවණ ගොදුරු කොටැති රහතුන් ගේ ගතිය නොදතහැක. අහසේ සකුණයන් ගිය මග නො දත හැක්කාක් මෙනි.*

92. යෙසං සන්නිචයො නත්ථි
යෙ පරිඤ්ඤාතභොජනා
සුඤ්ඤතො අනිමිත්තො ච
විමොක්ඛො යස්ස ගොචරො
ආකාසෙ'ව සකුන්තානං
ගති තෙසං දුරන්නයා.(7:3)

නැත ඔවුන් රැස් කරන්නේ
පමණ දැනගෙන බුදින්නේ
නිවුණු සලකුණු දකින්නේ
නිවන් අරමුණු කරන්නේ
නුබ සියොත් පිය ලෙසින්නේ
නොමැත සලකුණු තියන්නේ

# ගුණවත් රහතුන් - නො ලබන අවමන්

## 7 (3) බෙල්ලට්ඨිසීස තෙරුන් වහන්සේ (92 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **බෙල්ලට්ඨිසීස** තෙරුන්වහන්සේ ඇරබ මේ ගාථාව දේශනා කළ හ.

දිනක් බෙල්ලට්ඨිසීස තෙරහු පිඬු සිඟා ගොස් අතර මඟ එක් පහසු තැනක වැඩ හිඳ වළඳා නිම කොට පාත්‍රය පිරිසිදු කර නැවත පිඬු සිඟා ගිය හ.එසේ එක් කර ගත් බත ද රැගෙන වෙහෙරට පැමිණි උන් වහන්සේ ඒවා අව්වේ ලා වේළා ගත් හ. ඊළඟ දිනයේ පිඬු සිඟා යාමේ අවශ්‍යතාව වලකා ගන්නට උන්වහන්සේ එසේ කළ හ. අනතුරුව උන්වහන්සේ දින දෙක තුනක් ම එක දිගට ධ්‍යාන සුවයෙන් භාවනානුයෝගී ව කල් ගත කළහ. ධ්‍යානයෙන් නැගී සිට වියළා තබා ගත් ආහාර දියෙන් පොඟාවා වළඳා කුසගිනි නිවා ගත්හ.

මේ ක්‍රියාව භික්ෂු ජීවිතයට නො ගැලපෙතැයි තීරණය කළ අන්‍ය භික්ෂූහු ඒ බව භාග්‍යවතුන් වහන්සේට දැනුම් දුන්හ. ආහාර තැන්පත් කර තබා ගෙන භුක්ති විඳීම භික්ෂුත්වයට අගෝචර හෙයින් භාග්‍යවතුන් වහන්සේ එය නො මනාය යැයි ශික්ෂාවක් පැණවූ හ.

එතකුදු වුවත් බෙල්ලට්ඨිසීස හිමියන් ආහාර තැන්පත් කරගෙන සිටියේ ශික්ෂාවක් පණවන්නට කලින් හෙයින් උන්වහන්සේ නිවරදකරු වූ අතර එසේ කළේ ආහාර තෘෂ්ණාව නිසා නො ව හුදෙක් භාවනානුයෝගී වීමේ චේතනාවෙන් ම හෙයින් එය අහිංසක ක්‍රියාවක් බව ද පිළිගන්නා ලදී.

### විවරණාත්මක අනුවාදය (92 ගාථාව)

**යෙසං සන්නිචයො නත්ථි, යෙ පරිඤ්ඤාතභොජනා, යස්ස සුඤ්ඤතො අනිමිත්තො විමොක්ඛො ච ගොචරො, තෙසං ගති ආකාසෙ සකුන්තානං ඉව දුරන්නයා.**

**යෙසං**: යම් කිසි (රහත්) උතුමන් වෙත; **සන්නිචයො**: රැස්කිරීම; **නත්ථි**: නැත් ද; **යෙ**: යම් (උතුමන්) පිරිසක්; **පරිඤ්ඤාත භොජනා**: පමණ දැන වළඳත් ද; **යස්ස**: යමෙකුට; **සුඤ්ඤතො**: ශුන්‍ය වූ; **අනිමිත්තො**: නිමිත්තක් විරහිත වූ; **විමොක්ඛො**: විමෝක්ෂය; **ච**: ද; **ගොචරො**: අරමුණු වේ ද; **තෙසං**: ඔවුන් ගේ; **ගති**: ගිය මග; **ආකාසෙ**: අහසෙහි; **සකුන්තානං ඉව**: කුරුල්ලන් ගේ මෙන්; **දුරන්නයා**: දැක ගත නො හැකි ය.

වස්තු රැස් නො කරන, පමණ දැන අනුභව කරන, ශූන්‍ය වූ අනිමිත්ත වූ විමෝක්ෂය (නිවන) ගෝචර කර ගන්නා උතුමන් ගිය මග අහසෙහි කුරුල්ලන් පියාසර කළ මග මෙන් ම දැක ගත නො හැකි ය.

### විවරණය

**සන්නිචයෝ නත්ථි**: යන්නෙන් රැස් කිරීමක් නැති බව දැක්වේ. එක් අතකින් උන්වහන්සේ ලා ලෞකික භෞතික වස්තු රැස් නො කරති. එමෙන් ම අනිත් අතට සසර සඳහා අලුතෙන් පින් රැස් කිරීමක් ද නො කරති. නව කර්ම වලින් උන් වහන්සේලාට ප්‍රයෝජනයක් නො මැත. එහෙයින් මේ අර්ථ දෙකින් ම රහතන් වහන්සේලා සන්නිචයෙන් තොර බව කිව යුතු ය.

මේ ගාථාවෙන් කරුණු දක්වන ලද්දේ රහතන් වහන්සේලා පිළිබඳව ය. ආර්යය මාර්ගය පරිපූර්ණය කොට විමුක්තිය ලද උතුමෝ රහතන් වහන්සේ වෙති. භාග්‍යවතුන් වහන්සේ ද "අහං හි අරහා ලෝකේ"යි වරක් තමන් වහන්සේ රහතන් වහන්සේ නමක් ලෙස හඳුන්වා ගත් හ. රහතන් වහන්සේලා සියලු ඇළුම්-බැඳුම් දුර හැරි උතුමෝ වෙති. ශූන්‍යත, අනිමිත්ත හා අප්‍රණිහිත විමෝක්ෂයන් දකිතැයි අදහස් කරන්නේ එහෙයිනි.

බුදුරජාණන් වහන්සේ "අරහං සම්මා සම්බුද්ධෝ" වශයෙන් රහතන් වහන්සේ නමක ලෙස හැඳින්වුව ද සාමාන්‍ය රහතන් වහන්සේ නමකට වඩා වෙනසක් ද තිබේ. "මහණෙනි, බුදුන් වහන්සේ ද රහත් ය. සම්මා සම්බුද්ධ ය. උන්වහන්සේ පෙර හෙළි නො වූ මාර්ගයක් හෙළි කරති. උන්වහන්සේ මාර්ගය දත්හ. මාර්ගය තේරුම් ගත්හ. මාර්ගයෙහි විශාරද ය. ශ්‍රාවකයෝ උන්වහන්සේ ගිය මග යන්නා හ." අරහත් සම්මා සම්බුද්ධ හා අරහන්ත දෙදෙනා ගේ වෙනස එය ය. අරහත් යන වචනයෙහි අර්ථය "පූජා සත්කාරයන්ට යෝග්‍යය, ගෞරව නමස්කාරයට සුදුසු ය." යන්නයි. ප්‍රථම වරට බුදුරදුනට 'අරහං' යන නම යෙදුවේ බුදුරජාණන් වහන්සේ ම ය. ඒ උපක ආජීවකයා හමු වූ අවස්ථාවේ ය. දෙවන වරට 'අරහං' යන වචනය බුදුරදුන් තමන්ට ම යොදා ගත්තේ පස්වග මහණුනට තමා හඳුන්වා දුන් අවස්ථාවේදී ය. රහත් යන වචනය සියළු කෙළෙසුන් මිදූ උතුමන්ට ම යෙදේ. ඒ අරුතින් ගතහොත් අපේ යුගයේ ප්‍රථම රහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේම ය.





*රහතුන් ගේ ඉපැද්ම නො දත හැක. අහසැ සකුණයන් ගිය මඟ පිය නො දත හැක්කාක් මෙනි*

| | |
|---|---|
| 93. යස්සා'සවා පරික්ඛීණා | සියලු කෙලෙසුන් නසන්නේ |
| ආහාරෙ ච අනිස්සිතො | අහර වෙත නැත ඇලෙන්නේ |
| සුඤ්ඤතො අනිමිත්තො ච | නිවුණු සලකුණු දකින්නේ |
| විමොක්ඛො යස්ස ගෝචරො | නිවන් අරමුණු කරන්නේ |
| ආකාසෙ'ව සකුන්තානං | නුබ සියොත් පිය ලෙසින්නේ |
| පදං තස්ස දුරන්නයං (7:4) | නො මැත සලකුණු තියන්නේ |

# ගිය මග රහතුන් - සොයමු ද කෙලෙසින්
## 7 (4) අනුරුද්ධ තෙරුණුවන්ගේ කතා පුවත (93 ගාථාව)

**අනුරුද්ධ තෙරුණුවන්** ඇරබ මේ ගාථාව දේශනා කරන ලද්දේ භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ විසූ අවදියේ ය.

අනුරුද්ධ තෙරුණුවන්ගේ සිවුර පරණ වී දිරා ගොස් තුබූ හෙයින් අළුත් සිවුරක් තනා ගනු පිණිස උන් වහන්සේ තැන් තැන් වල වීසි කළ රෙදි කැබලි රැස් කරමින් සිටිය හ. තෙරුණුවන් මෙසේ කැලි කසළ පීරමින් රෙදි කැබලි සොයනු උන් වහන්සේ ගේ පූර්ව ජන්මයක භාර්‍යාවක්ව සිට, දැන් තව්තිසා දෙව්ලොව ජාලිනී නමින් ඉපද සිටි දිව්‍ය අප්සරාවට පෙනිණි. උන් වහන්සේට උදව් කරන්නට සිතූ ඕ තොමෝ රියන් 13 ක් දිග රියන් 4ක් පළල දිව්‍ය වස්ත්‍රයක් ගෙන මා මේ අයුරින් දැක්වුව හොත් එය තෙරුන් වහන්සේ විසින් නො පිළිගන්නට ඉඩ ඇතැයි සිතා, තෙරුන් පීරමින් සිටි කුණු ගොඩ ඉදිරියේ තවත් කුණු ගොඩක වාටියක් පමණක් පෙනෙන පරිදි සැඟවූවා ය.

අනුරුද්ධ හිමියෝ රෙදි කඩ ලැබ එයින් සිවුරක් කර ගනු පිණිස විහාරයට ගෙන ගිය හ. උන් වහන්සේ ගේ සිවුරු මැසීමට උදවු කරනු පිණිස බුදුරජාණන් වහන්සේ අසූ මහා ශ්‍රාවකයන් වහන්සේ ද කැටුව එහි වැඩම කළ හ. සිවුර මැසීම පිණිස පහලින් මහා කාශ්‍යප හිමියෝ හිඳ ගත් හ. ඉහළ කොනෙහි ආනන්ද හිමියෝ හිඳ ගත්හ. මැද සාරිපුත්ත හිමියෝ හිඳගත් හ. භික්‍ෂූන් වහන්සේලා පිරිසක් නූල් කැට දුන් හ. භාග්‍යවතුන් වහන්සේ ඉඳිකටුව ඇමිණීම කළ හ. අවශ්‍ය දේ ලඟට සපයා දීම සඳහා මුගලන් හිමියෝ එහා මෙහා සක්මන් කළ හ.

දෙව් දුව ගම් වැසියන් වෙත ගොස් "අද අනුරුද්ධ තෙරුන් වහන්සේට සිවුරක් කරවන දිනයයි. භාග්‍යවතුන් වහන්සේත් අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලාත් තවත් බොහෝ භික්‍ෂූන් වහන්සේලාත් සාමූහිකව ක්‍රියා කරති. ආරාමයෙහි සඟරුවන බොහෝ ය. කැඳ බත් ගෙන ගොස් පූජා කර පින් ලබා ගන්න" යි දැනුම් දුන්නා ය.

දන් වළඳන මොහොත වන විට මුගලන් හිමියෝ විශාල ජම්බු ගෙන ආහ. සංඝයාට එය වළඳා නිම කළ නො හැකි විය. ශක්‍රයා උන් වහන්සේලා සිවුරු කර වූ තැන වටා රැකවල් ලෑවේ ය. මිහි කත ලතුයෙන් නැහැවූවා සේ දිස් විණි. ආහාර පානයෙන් ස්ථානය පිරී තිබිණි. සංඝයා වහන්සේලා වැළඳූ පසුත් විශාල ආහාර ප්‍රමාණයක් ඉතිරි විය. "මේ තරම් විශාල ආහාර ප්‍රමාණයක් මේ සුළු පිරිසකට සූදානම් කළෝ කවුරු දැ"යි සමහර භික්‍ෂූහු ප්‍රශ්න කළ හ. සමහරු ඒ ගැන බුදුරජාණන් වහන්සේට පැමිණිලි කළහ. "මහණෙනි, මේ මහ දන් අනුරුද්ධ තෙරුන් විසින් සංවිධානය කරන ලදැයි ඔබ සිතනවා ද?" උන් වහන්සේ එසේ ප්‍රශ්න කළ විට භික්‍ෂූහු "එහෙම යි, ස්වාමීනි" යි පැවසූ හ. "නැත මහණෙනි, ම පුත් අනුරුද්ධ එසේ නො කරයි. ආශා දුරු කළ උතුමෝ ආහාර වැනි දේ ගැන එසේ උනන්දු නො වෙති. මේවා දෙව්දුවක විසින් පහන් සිතින් කළ දේ ය" යි භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කළ හ.

### විවරණාත්මක අනුවාදය (93 ගාථාව)

**යස්ස ආසවා පරික්ඛීණා ආහාරෙ ච අනිස්සිතො යස්ස සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො ගොචරො තස්ස පදං ආකාසෙ සකුන්තානං ඉව දුරන්නයං**

**යස්ස**: යමකු ගේ; **ආසවා**: ක්ලේශ; **පරික්ඛීණා**: දුරු කරන ලද ද; **ආහාරෙච**: ආහාර විෂයෙහි ද; **අනිස්සිතො**: ඇල්මක් නැති ද; **යස්ස**: යමෙකුට; **සුඤ්ඤතො**: ශුන්‍ය වූ; **අනිමිත්තො**: නිමිති විරහිත ව; **විමොක්ඛො**: විමෝක්‍ෂය; **ගොචරො**: ගෝචර වේද; **තස්ස පදං**: ඔහු ගිය මග; **ආකාසෙ**: අහසෙහි; **සකුන්තානං ඉව**: පක්‍ෂීන් ගේ මෙන්; **දුරන්නයං**: දැක ගැනීම දුෂ්කර ය.

සියලු කෙලෙසුන් දුරු කළ ආහාර විෂයෙහි අභිරතියක් නැති, ශුන්‍ය හා අනිමිත්ත විමෝක්‍ෂය ගෝචර කර ගත් උතුමන් ගේ ගමන් මග දැක ගැනීම අහසෙහි පක්‍ෂීන් ගේ පිය සටහන් නැතිවාක් මෙන් දුෂ්කර ය.

### විවරණය

**ආසව**: යන්නෙන් අදහස් වන්නේ කෙළෙස් ය. පාලි පොත් වල ආසව වර්‍ග හතරක් ගැන සඳහන් වෙයි.

1. කාමාසව (ඉඳුරන් පිණවීමට ඇති ප්‍රවණතාව)
2. භවාසව (පැවැත්ම සඳහා ඇති ප්‍රවණතාව)
3. දිට්ඨාසව (විවිධ දෘෂ්ටීන් ඇති කිරීමේ ප්‍රවණතාව)
4. අවිජ්ජාසව (යථාර්ථය නො දැනීම පිළිබඳ ප්‍රවණතාව)

ඇතැම් සූත්‍රයක දිට්ඨි ඉවත් කර ඉතිරි තුන දක්වා තිබේ. මේවා ඕඝ වශයෙන් ද හඳුන්වා තිබේ.

සෝවාන් වන විට දිට්ඨාසය ප්‍රහීණ වෙයි. අනාගාමී වීමෙන් කාමාසව ද රහත් වීමෙන් භවාසව හා අවිජ්ජාසව ද වනසනු ලැබේ. රහත්වීම 'ආසවක්ඛය' වශයෙන් හඳුන්වන්නේ එහෙයිනි. ආසව ප්‍රහාණය විදර්ශනාවෙන්, ඉන්ද්‍රිය දමනයෙන්, විරතියෙන් හා විචක්‍ෂණවත් ප්‍රත්‍ය පරිභෝගයෙන් සිදුවන බව බුදුහු පෙන්වා දුන්හ.

**ඛීණාසව**: යනු රහතන් වහන්සේට නමකි. එය යොදන්නේ ආසව දුරු කළ හෙයිනි. ආසව යන්න තණ්හා යන්නට පර්‍යායව යෙදිය හැකිය. තණ්හාවද කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා වශයෙන් ත්‍රිවිධව දක්වනු ලැබේ.





*දැමුණු ඉඳුරන් ඇති පුහු මාන නැති කෙලෙස් රහිත රහතුන්ගේ දැක්ම දෙවියෝ පතති.*

94. යස්සි'න්ද්‍රියානි සමථං ගතානි
අස්සා යථා සාරථිනා සුදන්තා
පහීණමානස්ස අනාසවස්ස
දෙවා'පි තස්ස පිහයන්ති තාදිනො (7:5)

ඇත්ද යමකුට දැමුණු ඉඳුරන්
වගේ හොඳ හීලෑ අශ්වයන්
මාන දුරු කළ, කෙළෙස් කළ සුන්
ඔහුට දෙවියොත් කරති බුහුමන්

# දෙවියොත් පුදත් - සමිඳුන් රහත්

## 7 (5) මහා කච්චායන මහ රහතන් වහන්සේ (94 ගාථාව)

පූර්වාරාමයෙහි වැඩ සිටි සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **මහා කච්චායන මහ රහතන් වහන්සේ** නිමිති කොට මේ ගාථාව වදාළ සේක.

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ වැසි සාරමස අවසන පැවැත්වුණු මහා පුණ්‍යකර්මයක් වෙනුවෙන් ශ්‍රාවක සංඝයා පිරිවරා මිගාරමාතා ප්‍රාසාදයෙහි බිම් මහලෙහි වැඩ හුන් සේක. එකල මහා කච්චායන හිමියන් වැඩ සිටියේ අවන්ති දේශයේ ය. සාමාන්‍යයෙන් ඈත දුරු රට වැඩ විසුවත් ධර්ම දේශනය ආරම්භ වන විට පැමිණ සිටීම මේ මහා තෙරුන් ගේ පිළිවෙළයි. එහෙයින් අවසන් මොහොතේ හෝ උන්වහන්සේ පැමිණෙන බව දන්නා සංඝයා වහන්සේ උන්වහන්සේට අසුනක් වෙන් කර තබා ගෙන සිටිති.

ශක්‍ර දේවේන්ද්‍රයා එදින පින්කමට සහභාගි වීම පිණිස පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ පුදා ගෙන මහ සඟරුවනට ද ගරු සත්කාර දක්වා එකත් පස්ව මහා කච්චායන තෙරුන් නො දැක " අපේ මහා කච්චායන හිමියන් වැඩම කර නැත්තේ ඇයි? උන් වහන්සේ වැඩම කළා නම් කවර තරම් යහපත් ද" යි සිතී ය. ඔහු එසේ සිතන විට ම මහා කච්චායන හිමියෝ එහි වැඩම කළහ. ඒ දුටු ශක්‍ර දේවේන්ද්‍රතෙම පස්වනක් ප්‍රීතියෙන් පිනා ගොස් මහ තෙරුන් වහන්සේ ගේ වළලුකරින් අල්වා ගෙන "ඔබ වහන්සේ වැඩම කළ එක හොඳයි. මම සිතමින් සිටියේ ඔබ වහන්සේ ගැන යි. ඔබ වහන්සේ හිටියා නම් හොඳයි කියා සිතූ වහා ම ඔබ වහන්සේ පහල වුණා."යි දෙපා අතගාමින් සුවඳ මල් දමක් පුදා හරසර දැක්වීය. අනතුරුව යළි එකත් පසෙක හිඳ ගත්තේ ය.

මේ දුටු ඇතැම් භික්‍ෂූනමක් අසන්තෝෂයට පත්වූ හ. "ශක්‍ර දේවේන්ද්‍රයා වඳින්නෝ පුදන්නෝ පක්‍ෂග්‍රාහී ක්‍රමයට ය. වෙන කිසි ම භික්‍ෂු නමකට නො දැක්වූ ගරුසරු මහා කච්චායන හිමියන්ට දැක්වීය. අපේ මහා කච්චායන හිමියන් වැඩම කළ එක හොඳයයි කියමින් හේ දෙපා අතගාමින් වැන්දේය" යි දෝෂාරෝපණය කළ හ.

භාග්‍යවතුන් වහන්සේ ඒ අසා "මහණෙනි, මපුත් කච්චායන වැනි භික්ෂූන්ට දෙවියොත් විශේෂ ගරුසරු දක්වති"යි පූර්වෝක්ත ගාථාව දේශනා කළ හ.

### විවරණාත්මක අනුවාදය (94 ගාථාව)

**යස්ස ඉන්ද්‍රියානි සාරථීනා සුදන්තා අස්සා යථා සමථං ගතානි පහීණමානස්ස අනාසවස්ස තාදිනො තස්ස දෙවා අපි පිහයන්ති.**

**යස්ස**: යමකුගේ; **ඉන්ද්‍රියානි**: ඉඳුරන්; **සාරථීනා**: රථාචාර්‍යයා විසින්; **සුදන්තා**: මැනවින් දමනය කරන ලද; **අස්සා**: අශ්වයන්; **යථා**: යම්සේ ද; **සමථං ගතානි**: සමථයට ගියේ ද; **පහීණමානස්ස**: මානය දුරුකළ; **අනාසවස්ස**: කෙළෙස් නැති; **තාදිනො**: චිත්තෛකග්‍රතාව ලත්; **තස්ස**: ඒ රහතන් වහන්සේට; **දෙවා අපි**: දෙවියෝ ද; **පිහයන්ති**: ප්‍රිය වෙති.

රථාචාර්‍යයන් විසින් මනාව හික්මවා ගත් අශ්වයන් මෙන් තම ඉන්ද්‍රියයන් හික්මවා ගත්, මානය දුරු කළ, කෙළෙස් වැනසූ එබඳු රහතන් වහන්සේලාට දෙවියන් ද ප්‍රීති වෙති.

### විවරණය

**ඉන්ද්‍රියානි**: ඉඳුරන්. මෙයින් අදහස් වන්නේ අපට බාහිර ලෝකයෙන් අරමුණු ගෙන එන

1. ඇස: චක්ඛු
2. කණ: සෝත
3. නාසය: ඝාන
4. දිව: ජිව්හා
5. කය: කාය
6. මනස: මනො යන ඉන්ද්‍රිය හය ය.

**තාදිනො**: තහවුරු වූ, අභ්‍යන්තර හා බාහිර පෙලැඹීම් මගින් කම්පනය නො වන බව. භාග්‍යවතුන් වහන්සේ ගැන පවසන විට තාදිත්වය මෙසේ විවරණය කරති.

1. **භගවා කාමොඝං තිණ්ණො**; භාග්‍යවතුන් වහන්සේ කාමය නම් සැඩ පහරෙන් එතර වූහ.

2. **භගවා භවොඝං තිණ්ණො**; භාග්‍යවතුන් වහන්සේ භවය නම් සැඩ පහරෙන් එතර වූහ.

3. **භගවා අවිජ්ජෝඝං තිණ්ණො**; භාග්‍යවතුන් වහන්සේ අවිද්‍යා ඕඝය ද තරණය කළ හ.

මේ හේතු හා තවත් හේතු නිසා උන්වහන්සේ තාදී යයි කියති. පුද්ගලයකු තාදී වන්නේ චිත්තවීර්යය වශයෙන් ස්ථාවර වූ විටය. උචිතානුචිත විචක්‍ෂණය ඇති ව කලබල නොවී ක්‍රියා කරන විට තාදී ගුණය වැඩෙයි.





*රහත්හු අවමන් බුහුමන් මැදහත් ව වසති. නින්දා පැසසුම්හි කම්පා නො වෙති.*

95. පඨවිසමො නෝ විරුජ්ඣති
ඉන්දඛීලූ'පමො තාදී සුබ්බතො
රහදො'ව අපෙතකද්දමො
සංසාරා න භවන්ති තාදිනො (7:6)

මහ පොළොව මෙන් සාමකාමී
ඉන්ද්‍රඛීලය සේ අචල වී
විලක් සේ පිරිසිදුව නො මඩව
එතර වෙති සසරින් රහත් වී

# ලොව පූජිත - රහත් චරිත

## 7 (6) සැරියුත් මහ රහතන් වහන්සේ ගේ චරිතය (95 ගාථාව)

**අග්‍රශ්‍රාවක සාරිපුත්ත මහ රහතන් වහන්සේ** සහ තරුණ භික්ෂුනමක් නිමිති කොට දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයේ දී භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ගාථාව දේශනා කරන ලදී.

එක් වස්සාන සමයක් අවසානයේ පිණ්ඩපාත චාරිකාවෙක යෙදෙනු කැමති වූ සැරියුත් මහ රහතන් වහන්සේ, බුදුරදුන් බැහැ දැක වැඳ නමස්කාර කොට අවසර ගෙන සිය අන්තේවාසික භික්ෂූන් ද කැටිව සංචාරය පිණිස නික්මුණු සේක. තෙරුන් වහන්සේ ගෙන් සමුගැනීමට භික්ෂූහු පැමිණ සිටියහ. නම් ගොත් දත් හිමිවරුන් සමග උන් වහන්සේ නමින් අමතා කතා කළ හ. ඒ අතර විසූ එක් නමක් තමාට ද පෞද්ගලික නාමයෙන් අමතා ආශිර්වාද කරනු ඇතැයි බලා සිටිය ද මහ පිරිස මැද සැරියුත් මහ රහතන් වහන්සේට එම භික්ෂුව නෙත ගැටුණේ නැත.

එමෙන් ම ඒ භික්ෂූන් වහන්සේ ගේ නම් ගොත් සැරියුත් හිමියන් දැන සිටියේත් නැත. එහෙයින් තමා නමින් අමතනු නො ලැබීමෙන් දොම්නසට පත් හෙතෙම "වෙනත් අයට නමින් කතා කළත් මට එසේ කතා කළේ නැත" යි තෙරුන් කෙරේ ආඝාත බැඳ ගත්තේ ය. එසේ සිතමින් සිටින අතර සැරියුත් හිමියන් උන් වහන්සේ අසලින් යද්දී නො දැනුවත්ව උන්වහන්සේ ගේ චීවරය මේ හිමියන් ගේ ඇඟෙහි ගැටිණි. එය හිතාමතා කළ දෙයකැයි පිළිගත් එම භික්ෂු නම මහත් කෝපයට පත්ව සැරියුත් හිමියන් දොරටුවෙන් පිටත් වෙනවාත් සමගම භාග්‍යවතුන් වහන්සේ හමු වී "ඔබ වහන්සේ ගේ අග්‍රශ්‍රාවක පදවිය ලබාගෙන සැරියුත් හිමියන් බොහොම ආඩම්බර වෙලා. මට ගැහුවා පාරක්, තව පොඩ්ඩෙන් මගෙ කණත් පැලෙනවා. මගෙන් සමාව ඉල්ලුවේවත්, කණගාටුයි කිව්වේවත් නැතුව පිණ්ඩපාත චාරිකාවකට පිටත් වුණා'' යි පැමිණිලි කළේ ය. වහා ම සැරියුත් හිමි ආපසු කැඳවන සේ භාග්‍යවතුන් වහන්සේ නියම කළ හ.

සැරියුත් මහ රහතන් වහන්සේ තම අන්තේවාසික භික්ෂූන් වහන්සේලා ද කැටුව ආපසු පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ නමස්කාර කළ හ. මේ භික්ෂු නමට පහර දුන්නේ කවර හෙයින් දැයි භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්න කළ විට "මම උන්වහන්සේට පහර නො දුන්නෙමි" යි පවසා ඔහු බොරු කාරයකු කරනු වෙනුවට තම පැවතුම් ගැන අහිංසක විස්තරයක් කළහ. සැරියුත් හිමියන් තමන් වහන්සේ ගේ පැවතුම් ගැන කියත් කියත් ම බොරු පැමිනිල්ල කළ හිමි නම ගේ සිත කම්පා විය.

හේ බුදුපාමුල වැටී තමා බොරු පැමිණිල්ලක් කළ බවත් සැරියුත් හිමි තමාට පහර නුදුන් බවත් කියා සිටියේ ය. සැරියුත් හිමියන් ඇමතූ බුදුරජාණන් වහන්සේ "සාරිපුත්ත, මේ මුළා වූ භික්ෂු නමට සමාව දෙන්න" යි වදාළ හ. එවිට එම භික්ෂු නම ඉදිරියේ දෑත් එක් කොට දණ ගසා ගත් සැරියුත් හිමියෝ "මම මේ භික්ෂූන් වහන්සේට සමාව දෙමි. මේ භික්ෂූන් වහන්සේත් මගෙන් උන්වහන්සේට යම් වරදක් සිදු වී ඇත්නම්, ඊට ද සමාව දෙන සේක්වා"යි පැවසූ හ. ඒ දුටු භික්ෂූහු "බලන්න, සැරියුත් හිමියන් තුළ ඒ භික්ෂුව කෙරෙහි අංශු මාත්‍ර වූ හෝ අමනාපයක් නැති හැටි. මේ භික්ෂුව බොරු නඩුවක් කියා තමන්ට කරන්නට ගිය අවමානය මුළුමනින් ම අමතක කළ ආකාරය පුදුමයි. ඒ විතරක් ද, සැරියුත් හාමුදුරුවෝ උන්වහන්සේ ඉදිරියේ දණත් ගහගෙන ගෞරවත් කරනවා"යි පැවසූ හ. ඔවුන් ගේ කතා බහ අසා දැනගත් භාග්‍යවතුන් වහන්සේ "සාරිපුත්ත වැනි මනා ගති පැවතුම් ඇති අයට කෝප විය නො හැකිය. සාරිපුත්ත ස්ථවිරයන්ගේ සිත මහ පොළොව මෙන් ය. පැහැදිලි පිරිසිදු දිය ඇති විලක් වැනි ය." යි වදාළ හ.

**විවරණාත්මක අනුවාදය (95 ගාථාව)**

**සුබ්බතො පඨවිසමො නො විරුජ්ඣති ඉන්ද්‍රඛීලූපමො තාදී රහදො ඉව අපෙතකද්දමො තාදිනො සංසාරා න භවන්ති.**

**සුබ්බතො**: මනා පැවතුම් ඇති රහතන් වහන්සේ; **පඨවිසමො**: මහා පෘථිවිය මෙන්; **නො විරුජ්ඣති**: ගැටුම් ඇති කර නො ගනියි; **ඉන්ද්‍රඛීලූපමො**: ඉන්ද්‍රඛීලයක් (නො සැලෙන කණුවක්) බඳුව; **තාදී**: ස්ථාවර වූ; **රහදො ඉව**: විලක් මෙන්; **අපෙතකද්දමො**: මඩ නැති; **තාදිනො**: රහතන් වහන්සේට; **සංසාරා**: සසර සැරි සැරීම්; **න භවන්ති**: නැත.

මනා පැවතුම් ඇති රහතන් වහන්සේ මිහිකත මෙන් කිසි විටෙක නො කිපෙති. ඉන්ද්‍රඛීලයක් මෙන් නො සැලී සිටිති. මඩ නැති විලක් මෙන් ප්‍රසන්න පැවතුම් ඇති උන් වහන්සේලාට සසර සැරි සැරීමක් නැත.

**විවරණය**

**ඉන්ද්‍රඛීලය**: නම් ශක්‍රයා විසින් සිට වූ බල කණුවක් මෙන් තහවුරු දෙයකි. ඉන්ද්‍රඛීල නම් අචල මහා කණු බව අටුවාව කියයි. මේවා නගර වල ඇතුළත හෝ පිටත ඉඳි කරති. සාමාන්‍යයෙන් මේවා ගඩොල් හෝ ලී වලින් අෂ්ටාශ්‍රාකාර ලෙස තනති. නො සැලෙන යමක් ගැන උපමාවට මෙය ගනු ලබන්නේ එහි ස්ථාවර බව නිසා ය.

**තාදිනො**: ප්‍රිය දේ කෙරේ බැඳීමක් හෝ අප්‍රිය දේ කෙරේ ද්වේෂයක් නැති ව තහවුරු ව මධ්‍යස්ථව සිටිය හැකි නම් එය තාදී ගුණය යි. ලෝ දහමින් කම්පා නො වෙන මහ රහතන් වහන්සේලාට 'තාදී' යි කියති.





*මනාව දැන නිවී සැනහුණු රහත්හු සිත, සන්සුන් ය. වචනය හා කටයුතු ද සන්සුන් ය.*

| | |
|---|---|
| 96. සන්තං තස්ස මනං හොති | ඔහු ගේ සිත සංවරය |
| සන්තා වාචා ච කම්ම ච | කය-වචන සංවරය |
| සම්මදඤ්ඤා විමුත්තස්ස | ඇත්ත දැන නිවුණු ඔහු |
| උපසන්තස්ස තාදිනො (7:7) | මුළුමනින් සංවර ය |

# අරහත් තෙරණුවෝ - චෙති සංවර මැනවින්

## 7 (7) කොසඹෑ නුවර සාමණේර නමගේ කතාව (96 ගාථාව)

ජේතවනාරාම විහාරයෙහි වැඩ වාසය කළ තථාගතයන් වහන්සේ කොසඹෑ නුවර **තිස්ස තෙරුන් වහන්සේ** ගේ ශිෂ්‍ය සාමණේර නමක් මුල් කොට මේ ගාථාව දේශනා කළ සේක.

කොසඹෑ නුවර ධනවත් පවුලක තරුණයෙක් සසර කළකිරී බුදු සසුනෙහි පැවිදි විය. උපසම්පදාව ලත් පසු උන්වහන්සේ ප්‍රකට වූයේ කෝසම්බිවාසී තිස්ස නමිනි. උන්වහන්සේ කොසඹෑ නුවර වස් එළඹි විට උන්වහන්සේ ගේ දායකයා තුන් සිවුරු, ගිතෙල්, උක් හකුරු වැනි පූජා වස්තු ද රැගෙන අවුත් උන් වහන්සේ ගේ දෙපා මුල තබා වැඳ "ස්වාමීනි, ඔබ වහන්සේට උපස්ථානයට සාමණේර නමක් නැති හෙයින් මාගේ පුත්‍රයා ඔබ වහන්සේ ලඟ පැවිදි කරනු කැමැත්තෙමි" යි පැවසීය. තිස්ස හිමියෝ ද මහත් සතුටින් එය අනුමත කළ හ. තම සත් හැවිරිදි පුත්‍රයා කැඳවා ගෙන ආ උපාසක තැන "ස්වාමීනි, මොහු පැවිදි කර ගත මැනවැ යි" කියා සිටියේ ය.

දරුවා ගේ හිස කෙස් තෙමා, තච පඤ්චක කර්මස්ථාන ඉගැන්වූ තිස්ස හිමියෝ ඔහු ගේ හිස මුඩු කරන්නට පටන් ගත්හ. හිස කෙස් කපන්නට පටන් ගත් වහා ම කමටහන් වැඩූ දරුවා රහත් බවට පත් විය. දරුවා පැවිදි කළ තිස්ස තෙරණුවෝ ටික දිනක් එහි ම වැඩ හිඳ භාග්‍යවතුන් වහන්සේ බැහැ දකින්නට යන්නට තීරණය කර, සාමණේර නම ලවා අවශ්‍ය මාර්ගෝපකරණ ගෙන්වා ගෙන ගමනට පිටත් වූහ. අතරමග දී ආරාමයකට පිවිසුණු දෙනම එහි නවාතැන් ගත් හ. සාමණේර නම කාමරයක් ලදින් එහි ගුරු හිමියනට අවශ්‍ය සියල්ල සකස් කළ හ. ගුරු හිමියන්ට නවාතැන් සකසත් දී රෑ බෝ වූයෙන් තමාට රැය ගත කරන්නට තැනක් පිළියෙල කර ගැනීම අපහසු විය. එහෙයින් හෙතෙම ගුරු හිමියන් ගේ ඇඳ අසල බද්ධ පයඞ්කයෙන් වාඩි වී රැය පහන් කළේ ය.

පසුදා හිමිදිරියේ පිබිදුණු ගුරු හිමියෝ සාමණේර නම කාමරයෙන් පිටත යවනු කැමතිව ඇඳ පසෙක තිබුණු විජිනි පත ගෙන මිට පැත්ත සාමණේරයන් සිටි පැත්තට ගටා "සාමණේරයෙනි පිටතට යන්නැයි" කීහ. එහෙත් සාමණේර නම වාඩි වී සිටි හෙයින් විජිනි පත් මිට වැදී එක් ඇසක් තුවාල වී අන්ධ විය. ඒ වේදනාව ගැන කිසිත් නො කී සාමණේරයෝ කාමරයෙන් පිටතට ගිය හ. අනතුරුව කළ යුතු හැම වැඩ ම එක් අතකින් ඇස වසා ගෙන කළහ. ඉදල හා කොස්ස තනි අතින් ගෙන අතුගෑම් කළ හ. ගුරු හිමියන්ට මුව සෝදන දිය හා දැහැටි දඬු ද සකසා තබා දැහැටි දඬු පිළිගන්වන විට තනි අතින් පිළිග න්වන්නට සිදු වූ හෙයින් තමාට වූ හදිය ගැන එළි කළ හ.

ඒ ඇසූ තිස්ස තෙරහු බලවත් කම්පාවට පත් වූහ. තමන් නො දැනුවත් ව කළ වරදක් වුවද සාමණේර නම සමා කරවා ගන්නට උන් වහන්සේ පෙළැඹුණහ. "සමිඳුනි, එය ඔබ වහන්සේ ගේ වරදක් වත් මගේ වරදක් වත් නො වේ" යි පවසමින් ගුරු හිමි සැනසූ හ. එහෙත් දැඩි සංවේග යෙන් පිරි සිතින් යුතුව තිස්ස තෙරණුවෝ සාමණේරයන් ද කැටු ව බුදුරදුන් හමුවට ගියහ.

"භික්ෂුව සියල්ල යහපත් ව සිදු වේද?" යි බුදුන් ප්‍රශ්න කළ විට

"මා පිළිබඳව නම් සියල්ල යහපත් යැයි කිව හැකිය. එහෙත් මේ අසරණ සාමණේර නම ආශ්චර්යය ජනක ය. මා අතින් මෙබඳු වරදක් සිදුවී ම විසින් සමාව යදිද්දීත් මෙසේ කියයි."යි සියලු විස්තරය සැල කර සිටියේ ය.

ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "තිස්ස, සියලු ආසවයන් දුරු කළ උතුමෝ තරහක් හෝ වෛරයක් කිසිසේත් සිත තබා නො ගනිති" යි වදාරා මේ ගාථාව දේශනා කළහ.

**විවරණාත්මක අනුවාදය (96 ගාථාව)**

**සම්මා අඤ්ඤාය විමුත්තස්ස උපසන්තස්ස තාදිනො**
**මනං සන්තං හොති තස්ස වාචා ච කම්මං ච සන්තා.**

**සම්මා**: මැනවින්; **අඤ්ඤාය**: දැන; **විමුත්තස්ස**: විමුක්තිය ලද; **උපසන්තස්ස**: උපශාන්ත වූ; **තාදිනො**: රහතන් වහන්සේ ගේ; **මනං**: සිත; **සන්තං හොති**: ශාන්ත ය; **තස්ස**: උන්වහන්සේ ගේ; **වාචා ච**: වචන ද; **කම්මං**: ක්‍රියා ද; **සන්තා**: ශාන්ත ය.

චතුරාර්‍ය්‍ය සත්‍යය මනාව අවබෝධ කර ගෙන විමුක්ති සුවය ලැබ නිවී සැනසුණු රහතන් වහන්සේ ගේ සිත ශාන්තය. වචනය ද ශාන්ත ය. ක්‍රියා ද ශාන්ත ය.

**විවරණය**

**සන්ත**: යන්නෙන් මෙහි අදහස් වන්නේ කැලැඹීමෙන් හා අසහනයෙන් තොර සැනසුණු ස්වභාවයයි. රහතන් වහන්සේ ලෝක ස්වභාවය මනාව දන්නා හෙයින් තමන්ට සිදුවන කවර විපතක දී වුව ද කලබලයට පත් නො වෙති. සිත, කය, වචනය යන ත්‍රිවිධ ද්වාරයෙන් ම මෙම පිරුණු, මේරූ, නො සැලෙන ස්වභාවය විද්‍යමාන වෙයි.





*ඇදහිලි නැති නිවණ දන්න සදැසිඳලු ඉපැද්ම නැසූ වමාරා දැමු ආසා ඇත්තා උතුම් පුරිස් ය.*

97. අස්සද්ධො අකතඤ්ඤූ ච
සන්ධිච්ඡෙදො ච යො නරො
හතාවකාසො වන්තාසො
ස වෙ උත්තමපොරිසො (7:8)

හැර දමා සැදැහැ සිත් ලබා ගෙන නිවන් සෙත්
බඳින සසරට සියළු සිඳ දැමූ බන්ධනත්
නසා කෙළෙසුන් නවතමින් නැවත ඉපදුමත්
සිටිත් නම් යම් කෙනෙක් උතුමෙක්ය ඔහු රහත්

# කෙළෙස් මල නැසුවහොත් ඔහු ලොවට උතුම් වෙත්

## 7 (8) සැරියුත් මහ තෙරුන්ගේ වත (97 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **සැරියුත් මහ රහතන් වහන්සේ** අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

දිනක් වනවාසී හිමිවරු තිස් නමක් භාග්‍යවතුන් වහන්සේ දක්නට පැමිණ වැඳ නමස්කාර කොට එකත්පස් ව උන්හ. මේ පිරිසට රහත් ඵලය ලැබීමේ වාසනාව පවත්නා බව දිවැසින් දුටු බුදු රජාණන් වහන්සේ සැරියුත් හිමියන් අමතා මෙසේ වදාළ සේක. "සාරිපුත්ත, ශ්‍රද්ධාවේ ස්වරූපය නම්, එය ඇති කර ගෙන වැඩි වර්ධනය කරගත් විට නිර්වාණාධිගමයට හේතුවන බවත්, නිර්වාණාධිගමයෙන් එය නිම වන බවත් ඔබ විශ්වාස කරනවා ද?"

මේ ක්‍රමයට ගුණාංග පංචකයක් සම්බන්ධයෙන් ම බුදුරජාණන් වහන්සේ ප්‍රශ්න කළ හ. එයට සැරියුත් හිමියන් ගේ පිළිතුර වූයේ "ස්වාමීනි, ශ්‍රද්ධාව ඇති කරගෙන වැඩි වර්ධනය කිරීමෙන් නිර්වාණාධිගමය සිදුවන බවත්, නිර්වාණාධිගමයෙන් එය කෙළවර වන බවත් මා විශ්වාසයෙන් පිළිගත්තක් නො ව ප්‍රත්‍යක්ෂ කර ගත්තකි. එහෙත් ස්වාමීනි, මේ කරුණ ප්‍රත්‍යක්ෂ කර නො ගත්, විමුක්තිය නුවණින් පසිඳ නොදත් කෙනෙකුට නම්, එම කරුණ ශ්‍රද්ධාවෙන් ම පිළිගත යුත්තක් වෙයි" යන්නයි.

මේ ඇසූ ඇතැම් භික්ෂූහු "සාරිපුත්ත ස්ථවිරයන් තවමත් සාවද්‍ය දෘෂ්ටීන් දුරලා නැති බව පෙනේ. අද පවා උන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ගේ වචන විෂයෙහි ශ්‍රද්ධාවෙන් තොර ව කතා කළ හ." යි කතිකා කළ හ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, ඔබ මෙසේ ප්‍රකාශ කරන්නේ කවර හෙයින් ද? මා සාරිපුත්ත ස්ථවිරයන් වෙතින් පංච විධ ගුණාංගයන් වර්ධනය නො කර අධ්‍යාත්මික ශාන්තිය හා විමුක්තිය ලද හැකි දැයි ප්‍රශ්න කළ විට, ඒවා ප්‍රගුණ නො කොට අධ්‍යාත්මික ශාන්තිය හා විමුක්තිය ලද නො හැකි බව සාරිපුත්ත ස්ථවිරයෝ ප්‍රකාශ කළ හ.

අනතුරුව දානාදී කුශල කර්මයන් ගේ විපාකය ගැන හා බුද්ධාදී උතුමන් ගේ ශ්‍රේෂ්ඨත්වය ගැන ඔබ වෙත ශ්‍රද්ධාවක් නැත්දැයි ප්‍රශ්න කළෙමි. මේවා සැබෑ වශයෙන් ම සාරිපුත්ත ස්ථවිරයන් ශ්‍රද්ධාවෙන් පිළිගත් දේ නො ව තමන් විසින් ම ප්‍රත්‍යක්ෂ ඥානයෙන් යථාර්ථ දර්ශනයෙන් ප්‍රත්‍යක්ෂ කර ගත් දේ ය. උන් වහන්සේ තමා ම මාර්ග ඵලාධිගමය කොට යථාභූත ඥාන දර්ශනය ලබා විමුක්ති සුඛ වින්දනය කරමින් වාසය කරන හෙයින් ශ්‍රද්ධාව පිළිබඳ ප්‍රශ්නයක් හට නො ගනියි. එහෙයින් සැරියුත් තෙරණුවන්ට නිග්‍රහ කිරීම යුක්ති සහගත නො වෙයි" යි කරුණු පැහැදිලි කර මේ ගාථාව දේශනා කළ හ.

### විවරණාත්මක අනුවාදය (97 ගාථාව)

**යො නරො අස්සද්ධො අකතඤ්ඤූ ච සන්ධිච්ඡෙදො**
**හතාවකාසො වන්තාසො ච සො වේ උත්තම පෝරිසො.**

**යො නරො**: යම් කිසි පුද්ගලයෙක්; **අස්සද්ධො**: ශ්‍රද්ධාව අනවශ්‍ය තත්ත්වයට පත් ව සිටී ද; **අකතඤ්ඤූ ච**: අකතව හෙවත් විමුක්තිය ප්‍රත්‍යක්ෂ කළේ ද; **සන්ධිච්ඡෙදො**: සියළු සන්ධි බිඳ හළේ ද; **හතාවකාසො**: නැවත ඉපදීමට ඇති අවස්ථා අත් හළේ ද; **වන්තාසො**: සියලු ආශාවන් ප්‍රහීණ කළේ ද; **සො**: හෙතෙම; **වෙ**: ඒකාන්තයෙන්; **උත්තම පොරිසො**: උත්තම පුරුෂයෙක් වෙයි.

යම් කිසි තැනැත්තෙක් ශ්‍රද්ධාවෙන් ධර්මය පිළිගන්නා තත්ත්වයෙන් ඔබ්බට ගොස් එය ප්‍රත්‍යක්ෂ ඥානයෙන් දැන ගත්තේ නම්, නිර්වාණය අවබෝධ කර ගෙන ඇත්නම්, නැවත ඉපදීමට ඇති අවස්ථාව අත්හැර දැමී නම්, සියලු කෙළෙසුන් දුරු කර හළේ නම්, හෙතෙම උත්තමයෙකි.

### විවරණය

මේ ගාථාව 'දහම් ගැට' නමින් ජනවහරේ හැඳින්වෙන ප්‍රහේලිකාත්මක ශෛලියෙන් කරන ලද දේශනයකි. ඇසූ පමණින්, වචනාර්ථය තුළින් එන අරුත නො ව විග්‍රහ කර දත යුතු අරුතක් එහි වෙයි. මෙහි එන වචන සාමාන්‍ය වහරේදී දෙන අර්ථය ගාථාවෙහි දී නො ගත යුතුය. අසන්නා විස්මයට පමුණුවා අනතුරු ව ගැඹුරු අරුත් වෙත මෙහෙයවන මෙ වැනි ' දහම් ගැට' පෞරාණික අධ්‍යාපනික උපාය මාර්ගයක් වෙයි.

**අස්සද්ධෝ**: යන්න සාමාන්‍ය වචනාර්ථයට අනුව ශ්‍රද්ධාව නැත්තා, මිථ්‍යා දෘෂ්ටිකයා යන තේරුම දෙයි. එහෙත් මෙහි යොදා ඇත්තේ ප්‍රත්‍යක්ෂ අවබෝධය ඇති හෙයින් ශ්‍රද්ධාවෙන් ප්‍රයෝජනයක් නැති හෙයින් එය හැර දැමූ තැනැත්තා සඳහා ය. ශ්‍රද්ධාව හෙවත් විශ්වාසය අවශ්‍ය වන්නේ ප්‍රත්‍යක්ෂ අවබෝධය නැත්නම් පමණි.

**අකතඤ්ඤූ**: යන්නේ සාමාන්‍ය අර්ථය කෘතඥතාව නැති, කළගුණ නො තකන තැනැත්තා යන්න යි. මෙහි දී යොදා ඇත්තේ (අ-කත-අඤ්ඤ) කිසිවකු විසින් නිර්මාණය කළ දෙයක් නො වන නිර්වාණය (අකත) පසක් කර ගැනීම අදහස් වෙයි.





*රහතුන් වහන්සේලා ගමෙහි, වනයෙහි නිම්නයෙහි හෝ ගොඩ වෙසෙතත් ඒ බිම් පෙදෙස ඉතා සිත්කලු ය.*

98. ගාමෙ වා යදි වා'රඤ්ඤෙ
නින්නෙ වා යදි වා ථලෙ
යත්ථ අරහන්තො විහරන්ති
තං භූමිං රාමණෙය්‍යකං (7:9)

ගමක් හෝ වනයක්
නිම්නයක් හෝ කන්දක්
රහතුන් වාසයක්
නම් සිත් අදන පියසක්

# වාසය නිකෙලෙස් උතුමන් - පිනවයි හැම සිත් නිතියෙන්

## 7 (9) රේවත හිමියන් ගේ කතාව (98 ගාථාව)

**ඛදිරවනිය රේවත හිමියන්** ඇරබ වදාළ මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයේ ය.

රේවත හිමියෝ සාරිපුත්ත හිමියන් ගේ බාල සොහොයුරා වූ හ. සැරියුත් හිමියන් ගේ සොහොයුරු සොහොයුරියන් අතර අවසන් වරට ගිහිගෙයින් නික්මුණේ රේවත ය. ඔහු පමණක් ගිහි දිවියේ ඉතිරි ව සිටි සමයෙහි දෙමාපියෝ ඔහුට විවාහයක් කර දෙන්නට බොහෝ වෑයම් කළ හ. කෙසේ හෝ ඔහුට ගැලපෙන යුවතියක් සොයාගත් ඔවුහු විවාහ මංගල්‍ය උත්සවය ද සැලසුම් කළ හ.

විවාහ මංගල දිනයේ දී එහි පැමිණ සිටි, එකසිය විසි හැවිරිදි කාන්තාවක් දුටු හෙතෙම සියලු කාන්තාවන් ඒ තත්ත්වයට පත්වන බව මෙනෙහි කර කම් සුවයෙහි කළකිරුණේය. එහෙයින් විවාහය පසෙක තබා පලා ගිය හෙතෙම අසල වූ විහාරස්ථානයකට ගොස් පැවිද්ද ඉල්ලා සිටියේ ය. විහාරස්ථානයෙහි විසූ හිමිවරුන් තිස් නමට තම සොහොයුරු හමු වූ විටක ඔහු පැවිදි කරන සේ සැරියුත් හිමියන් විසින් කල් තබා උපදෙස් දී තිබුණ හෙයින් රේවත වහා ම පැවිදි කරන ලදී.

පැවිද්ද ලත් රේවත සාමණේරයෝ විහාරවාසී භික්ෂූන් වහන්සේ වෙතින් කර්මස්ථාන ලබා ගෙන යොදුන් තිහක් ඈත පිහිටි කිහිරි වනයට ගොස් භාවනා වඩන්නට පටන් ගත් හ. වස් කාලය අවසන් වත් ම රේවත හිමියෝ රහතන් වහන්සේ නමක් බවට පත් වූහ.

තම සොහොයුරාණන් දක්නට ඛදිරවනයට යාම සඳහා සාරිපුත්ත හිමියෝ තථාගතයන් වහන්සේ වෙතින් අවසර ඉල්ලා සිටිය හ. තමන් වහන්සේ ද එහි යාමට කැමති බව පළ කළ බුදුහු සැරියුත් හිමියන් හා සිවලී හිමියන් ඇතුළු බොහෝ භික්ෂූන් වහන්සේ ද සමග එහි වැඩම කළ හ.

ගමන දීර්ඝ එකක් විය. මාර්ගය දුෂ්කර වූ අතර අතර මග එතරම් ජනාකීර්ණ ද නො වීය. එහෙත් සංඝයා වහන්සේලා පිරිවරා වඩින බුදුරදුන් ගේ සුව පහසුව ගැන සිතූ දෙවිවරු යොදුනක් පාසා ආරාම මවා ආහාරපානාදිය ද සැලසූ හ. දිනකට යොදුන බැගින් මාර්ගය ද පිරිසිදු කර සම කර තැබූ හ. බුදුරදුන් සහපිරිවරින් පැමිණෙන බව දත් රේවත සාමණේර හිමියෝ ද උන්වහන්සේ පිළිගැනීම සඳහා සූදානම් වූහ. තම සෘද්ධි බලයෙන් බුදුරදුන් සඳහා විශේෂ ගඳකිළියක් ද අනිකුත් හිමිවරුන් සඳහා ආවාසඝර පන්සියයක් ද මවා සියලු සුව පහසුකම් පිළියෙල කොට තැබූ හ.

රේවත හිමියන් ගේ ආරාමයෙහි විවේක සුවයෙන් වැඩ සිටි බුද්ධප්‍රමුඛ සංඝරත්නය ආපසු ජේතවනාරාමයට සම්ප්‍රාප්ත වූයේ ද පෙර මෙන් ම දිනකට යොදුන බැගින් පා ගමනින් මය. මසක් අවසන සැවැත් නුවර නැගෙනහිර පිහිටි පූර්වාරාමයට වැඩම කළ උන් වහන්සේලා අනතුරුව විශාඛා උපාසිකාව ගේ නිවසෙහි දන් පිළිගත් හ. දන් වළඳා අවසන විශාඛාව රේවත හිමියන් විසූ ඛදිර (කිහිරි) වනය රම්‍ය දැයි විමසූ විට භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කර වදාළ හ.

### විවරණාත්මක අනුවාදය (98 ගාථාව)

**ගාමෙ වා යදි අරඤ්ඤෙ වා, නින්නෙ වා යදි ථලෙ වා**
**යත්ථ අරහන්තො විහරන්ති, තං භූමිං රාමණෙය්‍යකං**

**ගාමෙ වා**: ගමක හෝ; **යදි**: නැතහොත්; **අරඤ්ඤෙ වා**: ආරණ්‍යයක හෝ; **නින්නෙ වා**: පහත් බිමක හෝ; **යදි**: නැතහොත්; **ථලෙ වා**: කඳු මුදුනක හෝ; **යත්ථ**: යම් තැනෙක; **අරහන්තො**: රහතන් වහන්සේලා; **විහරන්ති**: වාසය කරත් ද; **තං භූමිං**: ඒ බිම; **රාමණෙය්‍යකං**: සිත් ගන්නා සුලු ය.

ගමක හෝ ආරණ්‍යයක වේවා තැනිතලාවක හෝ කඳු මුදුනක වේවා, ඕනෑම තැනක මහ රහතන් වහන්සේ වෙසෙත් නම්, ඒ තැන රමණීය ය.

### විවරණය

**අරහත්**: රහතන් වහන්සේ නම් ආර්‍යයී පුද්ගලයන් අතරින් රහත් මාර්ග ඵල ලත් උත්තමයෝ ය. සෝවාන්, සකදාගාමී, අනාගාමී හා මහ රහත් යන මාර්ගස්ථ හා ඵලස්ථ පුද්ගලයන් වශයෙන් ආර්‍යයී පුද්ගලයෝ අට දෙනෙක් වෙති. මාර්ගයෙහි රැඳී සිටීමක් නැති ව ඇසිල්ලකින් ම ඵලයට පත් වන හෙයින් මේ පුද්ගලයන් යුගල වශයෙන් ගෙන 'චත්තාරි පුරිස යුගානි' වශයෙන් ද සැලකීම සිරිතය. අභිධර්මයට අනුව මාර්ගය වූ කලී සතර ඵලයන්ට පත් වීමට පෙර ඇති චිත්තක්ෂණය පමණකි. නිවන් අරමුණු කර ගෙන අනිච්ච, දුක්ඛ හා අනත්ත පිළිබඳව ලබන විදර්ශනා ඥාණයෙහි ඵලයක් වශයෙන් කෙනකු තුළ ක්ෂණික ව හට ගන්නා ආධ්‍යාත්මික පරිවර්තනයක් මෙසේ නම් කර ඇත. ඊළඟ ක්ෂණයෙහි වහා ම ඵල සිත හටගන්නා බව දැක්වෙයි. ඇතැම් පොත් වල අෂ්ඨායයී පුද්ගලයනට අතිරේක ව 'ගෝත්‍රභූ' නම් වන වන ආර්‍යයී පුද්ගලයකු පිළිබඳව ද දැක්වෙයි.





*පුහුදුන් අය නො ඇලෙන සිත්කලු වනයෙහි රහත්හු ඇලෙති. එ තුමෝ කම් සැප සෙවුම්හි ආසා නැත්තෝය.*

99. රමණීයානි අරඤ්ඤානි
යත්ථ න රමතී ජනො
වීතරාගා රමෙස්සන්ති
න තේ කාමගවේසිනො (7:10)

රමණීය වන ගහණ
නොපිනවන දනන් මන
විරාගී සිත් අදියි
කම් සුවෙන් වැළකුණොන්

# විරාගී සිත - අදියි වන පෙත

## 7 (10) එක් යුවතියක ගේ වත (99 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ සිටි භාග්‍යවතුන් වහන්සේ එක්තරා **නොසරුප් පැවතුම්** ඇති ස්ත්‍රියක් මුල් කරගෙන මේ ගාථාව දේශනා කළ සේක.

එක්තරා පිණ්ඩපාතික තෙර නමක් භාග්‍යවතුන් වහන්සේ වෙතින් කමටහන් ගෙන බවුන් වඩනු පිණිස පාළුවට ගිය උද්‍යානයකට වැඩම කළ හ. එසමයෙහි එක් තුරුණු වෙසඟනක් එම වනයෙහි දී හමුවෙමුයි කිසියම් පුද්ගලයකු හා ගිවිසගෙන ඔහු එන වේලාවට එහි ගොස් බලා සිටියා ය. එහෙත් කිසියම් හේතුවක් නිසා ගිවිසගත් වේලාවට ඔහු නො පැමිණි හෙයින් දොම්නසට පත් ඕ උයනෙහි ඒ මේ අත ඇවිදිමින් සිටියා ය.

තුරු සෙවනක බවුන් වඩනු පිණිස පළඟක් බැඳ වැඩ සිටි තරුණ හිමි නම දුටු ඕ තොමෝ "මේත් පිරිමියෙක් නොවේ ද? මොහු ගේ සිත අවදි කොට පොළඹවා ගනිමි"යි සිතා හිමි නමට පෙනෙන පරිදි හිස කෙස් කඩා කඩා නැවත බැන්දාය. ඇය මෙසේ කරන විට හිමි නම ගේ නෙත් ඒ දෙස බැඳිණි. ඇය ගේ සිරුරත් සිනහවත් දැක තමන් ගත පිබිදෙන බව උන්වහන්සේට දැනිණි. "මේ වෙන්නේ කුමක් දැ"යි උන්වහන්සේ විමතියට පත් වූහ.

මේ අතරතුර භාග්‍යවතුන් වහන්සේ "කමටහන් ගෙන බවුන් වඩමැයි පිටත් ව ගිය භික්ෂුනමට කුමක් වීද?" යි සිතමින් බුදු ඇසින් බලා වදාරන සේක් එම යුවතිය ගේ භාව භාව ලීලාවන් දැක හිමිනම ගේ සිත විපිළිසර වනු දැක ගත්හ. තමන් වහන්සේ ඒ භික්ෂුවට පෙනෙන පරිදි අධිෂ්ඨානයක් කළ බුදුරජාණන් වහන්සේ සිත පාලනය කර ගත හැකි පරිදි ධර්මෝපදේශ ලබා දුන් හ. අනතුරුව භික්ෂූන් අමතා මේ ගාථාව ද වදාළ හ.

### විවරණාත්මක අනුවාදය (99 ගාථාව)

**යත්ථ ජනො න රමතී රමණීයානි අරඤ්ඤානි වීතරාගා**
**රමෙස්සන්ති තෙ කාමගවෙසිනො න**

**යත්ථ**: යම් තැනක, **ජනො**: පොදු ජනයා, **න රමති**: නො ඇලෙත් ද, **රමණීයානි**: රමණීය වූ, **අරඤ්ඤති**: (එබඳු) වනාන්තර, **වීතරාගා**: වීතරාගීහු, **රමෙස්සන්ති**: ඇසුරු කරති, **තෙ**: ඔවුහු, **කාමගවේසිනො**: කම් සුව සොයන්නෝ, **න**: නො වෙති.

පොදු ජනයා වනාන්තර වල වාසයට ප්‍රිය නො වෙති. එහෙත් එබඳු රමණීය ආරණ්‍යවලට වීතරාගී උතුමෝ ප්‍රිය වෙති. උන් වහන්සේලා කාමාස්වාදය සොයන්නෝ නො වන හෙයිනි.

### විවරණය

වනගහනයට ප්‍රිය වන රහතන් වහන්සේලා සියලු කෙළෙසුන් මුදා හළ හෙයින් කම්සුව නො පතති. කළ යුතු සියල්ල නිම කර සියලු බර පසෙක තබා සැහැල්ලු සිතින් වසන රහතන් වහන්සේලා අලුතින් කර්ම රැස් කිරීමක් නො කරති. නැවත උපතක් ද නො ලබති.

රහතන් වහන්සේලා තම ශික්ෂණය මුළුමනින් ම නිමවා ප්‍රතිඵල ද සාක්ෂාත් කරගෙන වෙසෙන හෙයින් තවදුරටත් ශික්ෂණය අනවශ්‍යයි යන අරුතින් ' අසෙඛ' වශයෙන් හඳුන්වනු ලැබේ. සෝතාපත්ති ඵලයේ සිට රහත් බව දක්වා සිටින අධිගම ලාභීන් තව දුරටත් ශික්ෂා මාර්ග යෙහි ශේෂයන් ඇති හෙයින් ' සෙඛ' සේ හැඳින්වෙයි. පිරිනිවන් පාන්නට පෙර ම නිර්වාණික පූර්වාස්වාදයක් ලබන්නට රහතන් වහන්සේලාට ඉඩ තිබේ. නිරෝධ සමාපත්ති සුවය සේ හැඳින්වෙන්නේ එයයි.



සනාතන බුද්ධ භාෂිතය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ අසහාය සාමයික මෙහෙය උදෙසා, සිය කාලය හා ශ්‍රමය සපුරා වැය කරමින්, මානව වංශයට දහම් මග හෙළි පෙහෙළි කිරීමේ මහා මෙහෙවරට කැප වී සිටින සිංගප්පූරුවේ ප්‍රධාන සංඝ නායක වේරගොඩ සාරද, ස්ථවිරයන් වහන්සේ අද ලොව වෙසෙන ප්‍රශස්ථතම ධර්‍ම දූත යතිනායක වරයාණන් වහන්සේ නමකි.

1941 නොවැම්බර් මස 27 වනදා දකුණු ලක වේරගොඩ දී උපත ලද මේ යති ප්‍රභූවරයානෝ, උපාධි ලාභීව, ධර්‍මදූත මෙහෙය ආරම්භ කළේ ඉතා යොවුන් අවධියේ දීමය. දැනට ශතක 6 ක් පුරා ධර්‍මදූත මෙහෙයෙහි යෙදී සිටින ගරුතර වේරගොඩ සාරද යතිනායකයානන් වහන්සේ මුද්‍රිත මාධ්‍යයෙන් සහ විද්‍යුත් මාධ්‍යයෙන් මෙන්ම දුරකථන තාක්ෂණයෙන් පවා අද ලොවට ධර්‍මදානය සපයන්නේ නවීනයන්ගේ මනස හා ආධ්‍යාත්මික ගති-පැවතුම් පිළිබඳ පැහැදිලි අවබෝධයකිනි.

## කතෘ ස්වාමීන්ද්‍රයන් වහන්සේ

වර්තමානික ග්‍රාහක පිරිස, ශ්‍රව්‍ය-දෘෂ්‍ය මාධ්‍ය මගින් දැනුමත් විනෝදාස්වාදයත් ලබන්නට පුරුදු වී සිටින පරපුරක් හෙයින්, ගරුතර වේරගොඩ සාරද හිමිපාණෝ, ඔවුනගේ මනසට සරිලන පරිද්දෙන් බුද්ධ භාෂිතය, ඔවුන් අතට පත් කරන සේක. මුද්‍රිත හා විද්‍යුත් ප්‍රකාශන 700 ක් පමණ ලොවට පිරිනමා සිටින මේ යතිනායකයන් වහන්සේ විසින් සම්පාදිත ධර්ම භාණ්ඩාගාරය නම් ඉංග්‍රීසි කෘතිය දොරට වැඩීමේ උළෙලේ දී, ඒ පිළිබඳ ව එක් දිනක් තුල පමණක් ලැබුණු දුරකථන ඇමතුම් සංඛ්‍යාව 2000 කටත් අධික විය. ඒ නිසා එය සිංගප්පූරු රාජ්‍යයේ ග්‍රන්ථ ප්‍රකාශන ඉතිහාසයේ සුවිශිෂ්ට වාර්තාවකට හිමිකම් කියන්නේය.

දැනට, සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය භාරව වැඩ සිටින ගරු වේරගොඩ සාරද නායක ස්ථවිර පාදයන් වහන්සේ ලෝකයේ බොහෝ දේශයන් හී බුද්ධ ශාසනයේ ප්‍රගතියට හිතකාමී ධර්ම දූත මෙහෙවරක යෙදී සිටින සේක.

එතුමන් ගේ ප්‍රධාන ප්‍රකාශ අතර, සිංහල හා ඉංගිරිසි ධම්මපදයත්, ජාතක කථා පිළිබඳ විද්‍යුත් ප්‍රකාශනයත් ප්‍රධාන තැන් ගනී. එතුමන් විසින්, ඉටු කෙරෙන මහා සාමයික මෙහෙය අඛන්ඩව පවත්වා ගෙන යනු පිණිස, ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් නිදුක් නිරෝගී සුව පැතීම, බෞද්ධ ජනතාවගෙන් ඉටු විය යුතු කෘතඥතා පූර්‍වක චාරිත්‍රයකි.

කලා කීර්ති එඩ්වින් ආරියදාස

ISBN: 981-00-4938-2

# ධර්ම භාණ්ඩාගාරය

සිතුවම් සහිත ධම්මපදය

අටවන පරිච්ඡේදය

## සහසස වග්ග



ගරු වේරගොඩ සාරද නාහිමිපාණන් වහන්සේ
සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක

"සබ්බදානං ධම්මදානං ජිනාති"

(ධර්ම දානය, සෙසු දාන සියල්ලටම වඩා අගනේය.)



**''ධර්ම භාණ්ඩාගාරය''** නැමැති

මෙම වටිනා ධර්ම පුස්තකය

**සාමවිනිසුරු බී.ධර්මදාස පියාණන්ට**

නිවන් සුව පතා ප්‍රකාශනය කරන ලදි.

පූර්ණ අනුග්‍රහකත්වය

**වේරගොඩ සුනන්දා භික්ෂුණිය විසිනි**

# ධර්ම භාණ්ඩාගාරය

සිතුවම් සහිත
ධම්මපදය

කතෘ:
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය**
නො: 1, ජලන් මස් පුටේ, සිංගප්පූරුව 128607
ටෙලි: 65 67783330 65 94656570
94 770589498 / 94 755218421
වේරගොඩ ජයන්ති විහාරය, වේරගොඩ, මීටියාගොඩ
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

**කර්තෘ**
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**චිත්‍ර ශිල්පි**
පී. වික්‍රමනායක

**සැකසුම**
පියරත්න හේවාබට්ටගේ

**පරිගණක රූපාවලි සහ පූර්ව ප්‍රකාශන මෙහෙය**
පූජ්‍ය වේරගොඩ සුනන්දා භික්ඛුණී
බී. දයා සමරසිංහ
බී. රෝහණ ජයතිස්ස

**පරිගණක සහාය**
ශ්‍යාමනී ප්‍රියලක්ෂණා ලේකම්වසම්
ඩබ්ලිව්. මාලා කාන්ති
ප්‍රියංකා බෝධිපක්ෂ

**සහාය**
බී. පුෂ්පානී ධම්ලතා
බී. ජේ. ධම්ලතා
ඊ. එම්. ලයනල් මොහොට්ටි
ඊ. එම්. යුගාන් සසංක
ශ්‍රියාලතා කග්ගොඩ ආරච්චි

**පරිගණක ප්‍රකාශන**
සමනල ප්‍රින්ටර්ස්, බටපොල
ටෙලි: +94 777557127

**පිටකවරයේ පින්තූරය**
බර්ට් ගුණසේකර

**මුද්‍රණය**
2013 නොවැම්බර් මස 27 දින, සිංගප්පූරුව

**පිටකවරයේ චිත්‍රය**

*පිටකවරයේ බුදු පිළිමය වේරගොඩ ජයන්ති විහාරයේ බුදුමැදුරෙහි.*
*වර්ෂ 1953 ජූනි 3 වෙනිදා අඹන ලද මෙම බුදු පිළිමය දැනට ශ්‍රී ලංකාවේ තිබෙන*
*දර්ශණීයතම බුදු පිළිමය වශයෙන් සැලකේ. මෙම බුදු පිළිමය ඉදිකිරීමේ පුරෝගාමී වූ අපවත් වී වදාළ*
*ගෞරවාහී පණ්ඩිත යටලමත්තේ වජිරඤාණ නායක මාහිමිපාණන් වහන්සේට නිවන්සුව අත්වේවායි අපි ප්‍රාර්ථනා කරමු.*

මේ ග්‍රන්ථයෙහි ආගත කරුණු පිළිබඳ පූර්ණ හා සදාකාලික අයිතිය හිමි වන්නේ බුදුරජාණන් වහන්සේටයි.
බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් පහළ වූ සනාතනික සත්‍යයෝ පුහුදුන් මිනිසුන් විසින් පනවන ලද
තාවකාලික වූත්, අසත්‍ය වූත්, අයිතිවාසිකම් පිළිබඳ නීති රීති පිළිගනු නොලබති.

**පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ටෙලි: 65 67783330 65 94656570
+94 770589498 +94 755218421
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

ISBN: 981-00-4938-2

# සහස්ස වග්ග





*අවැඩ සිදුවන වචන දහසකට වඩා සංසිඳීමට හේතු වූ එක වචනයකදු ඉතා උතුම්ය.*

100. සහස්සමපි චෙ වාචා
අනත්ථපදසංහිතා
එකං අත්ථපදං සෙය්‍යො
යං සුත්වා උපසම්මති (8:1)

වැඩකට නැති වචන
එක් දහකටත් වැඩියෙන්
අසා සිත සැනසෙන
එක වචනයක් මහඟුයි.

# අගෙයි එක් වදනත් - සිතට සැනසුම ගෙනෙතොත්

## 8 (1) තම්බදාඨිකගේ පුවත (100 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ සොරුන් ඝාතනය කරන වධකයා වූ **තම්බදාඨික** නිමිති කොට මේ ගාථාව වදාළ සේක.

තම්බදාඨික නමැත්තා රජු යටතේ පණස් පස් වසරක් වධකයා ලෙස සේවය කළේ ය. මහළු වියට පත් වූ පසු සොරකු ගේ හිස එක් කඩු පහරින් සිඳ දමන්නට බැරි තත්වයට හේ පත් විය. එහෙයින් ඔහුට විශ්‍රාම ගන්නට සිදු විය.

විශ්‍රාම ගන්නා දිනයේ තමන්ට අනුභව කිරීම පිණිස මිහිරි කිරි කැඳක් උවමනා බව හේ කියා සිටියේ ය. ඒ අනුව ඔහුට රසවත් කිරි කැඳක් පිළියෙල කරන ලදී. තම පැරණි ඇඳුම් ද රැගෙන පිච්ච මල් හා සුවඳ විලවුන් ද රැගත් හෙතෙම ගඟට ගොස් නා පිරිසිදු වී ඇඳුම් ඇඳගෙන මල් මාලයක් පැළඳ ගත්තේ ය. අත පය තෙල් ගා සාත්තු කර ගත්තේ ය. නිවසට ගොස් සුව පහසු පරිදි හිඳගෙන කිරිකැඳ පානයට සැරසුණා පමණි. සැරියුත් මහරහතන් වහන්සේ වධකයා ගේ නිවසෙහි දොරකඩ පෙනී සිටි සේක. සැරියුත් මහ රහතන් වහන්සේ දුටු තම්බදාඨික උන්වහන්සේ නිවස තුළට වඩමවා අසුනක වඩා හිඳුවා පාත්‍රයට කිරිකැඳ පිළිගැන්වී ය. ඒ මත ගිතෙල් ස්වල්පයක් ද වත් කළේ ය. උන්වහන්සේ එය වළඳන තුරු ළඟින් සිටගෙන පවන් සලන්නට පටන් ගත්තේ ය. වළඳා නිම වූ පසු සැරියුත් මහ රහතන් වහන්සේ ඔහුට ධර්ම දේශනා කරන්නට පටන් ගත් හ. එහෙත් ඒ සඳහා සිත එකඟ කර ගන්නට තම්බදාඨික සමත් නො වීය. රජතුමා ළඟ වධකයා වශයෙන් සේවය කරද්දී දිනපතා කළ මනුෂ්‍ය ඝාතන ඔහු ගේ සිහියට නැඟිණි.

ඔහු පත්ව ඇති අපහසුව තේරුම් ගත් සැරියුත් හිමියෝ දේශනය නවතා ඔහුගෙන් ප්‍රශ්නයක් ඇසූ හ. “ඔබ වධකයා වශයෙන් ඝාතනය කළේ ඔබේ උවමනාවට ද නැතහොත් රජ අණට කීකරු වීමක් වශයෙන් ද?” ඊට පිළිතුරු දෙමින් තම්බදාඨික “මට ඔවුන් මරන්නට සිතුවිල්ලක් නොවීය. හුදෙක් රජතුමා අණ කළ හෙයින් ම එසේ කළෙමි” යි පැවසී ය. “එසේ නම්, ඔබ ඊට වරදකරු ද, නිවරදකරු ද?” “මම වැරදි කරුවෙක් නො වෙමි” යි පැවසූ තම්බදාඨිකට සංසුන්ව බණ ඇසී ය.

උනන්දුවෙන් බණ ඇසූ හෙයින් හෙතෙම සෝවාන් මඟට ඉතා ආසන්නයෙහි වූ අනුලෝම ඥාණය ලැබීය. ධර්ම දේශනයෙන් පසු ටික දුරක් සැරියුත් හිමියන්ට පසු ගමන් කළ තම්බදාඨික මඟදී ආපසු හැරී නිවස බලා පිටත් විය. එහෙත් නිවසට ළඟා වන්නට පෙර එළදෙනකු විසින් ඇන ඔහු මරා දමනු ලැබිණ.

සන්ධ්‍යාවෙහි භාග්‍යවතුන් වහන්සේ දම් සබා මණ්ඩපයට වැඩම කළ විට භික්‍ෂූහු තම්බදාඨික ගේ මරණය ගැන භාග්‍යවතුන් වහන්සේට දැනුම් දුන් හ. ඔහු මරණින් මතු උපන්නේ කොහිදැයි භික්‍ෂූහු බුදුරජාණන් වහන්සේ ගෙන් විමසූ හ. තම්බදාඨික ජීවිත කාලයක් පව්කම් කරමින් ජීවත් වුව ද අවසන් මොහොතේ සාරිපුත්ත මහ තෙරුන් වෙතින් බණ අසා අනුලෝම ඥාණය ලත් හෙයින් මිය ගිය පසු තුසිත දෙව්ලොව උපන් බව උන්වහන්සේ ප්‍රකාශ කළ හ. මෙබඳු පව්කාර පුද්ගලයෙක් එක ම ධර්ම දේශනාවක් පමණක් අසා මේ සා විශාල යහපතක් සිදු කර ගන්නේ කෙසේ දැයි භික්‍ෂූහු විමතිය පළ කළ හ. භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළේ ඒ නිමිත්තෙනි.

### විස්තරාත්මක අනුවාදය (100 ගාථාව)

**අනත්ථපද සංහිතා වාචා වෙ සහස්සං අපි යං සුත්වා**
**උපසම්මති එකං අත්ථ පදං සෙය්‍යො.**

**අනත්ථ පද සංහිතා**: වැඩකට නැති පද වලින් යුත්; **වාචා**: දේශන; **වෙ**: ඉදින්; **සහස්සං අපි**: දහසක් තිබුණේ වුව ද; **යං සුත්වා**: යමක් ශ්‍රවණය කොට; **උපසම්මති**: සිත ශාන්තියට පත් වේද; **එකං අත්ථ පදං**: එබඳු එකම අර්ථවත් පදය; **සෙය්‍යො**: ඊට වඩා උතුම් වෙයි.

වැඩකට නැති නිසරු කියුම් ඇතුළත් දෙසුම් දහසකට වඩා මානසික ශාන්තිය උදාකරන එකම දේශනයක් වුව ද ශ්‍රේෂ්ඨ වෙයි.

### විවරණය

**අනර්ථ පද සංහිතා**: කතා බහ නම් උසස් මානසික සාධන සඳහා අදාල නොවන නිසරු ප්‍රලාප කතා ය. අටුවා වල එබඳු නිසරු කතා ලෙස අහස, පොළොව, ඉර, හඳ, තරු, උද්‍යාන, ජලාශ, මධුපානෝත්සව, ප්‍රිය සම්භාෂණ ආදිය ගැන කෙරෙන දෙඩැව්ලි නම් කර ඇත. පෙළ පොත් වල සඳහන් රාජ කථා, චෝර කථා, මහා මච්ච කථා, සේනා කථා, භය කථා, යුද්ධ කථා ආදිය ද මෙබඳු නිසරු කතා වෙති.





*අවැඩ සහිත පදයෙන් යුතු වු ගාථා දහසකට වඩා සැනසීමට හේතු වූ එක් ගාථා පදයකුදු උතුම් ය.*

101. සහස්සමපි චෙ ගාථා
අනත්ථපද සංහිතා
එකං ගාථා පදං සෙය්‍යො
යං සුත්වා උප සම්මති (8:2)

එක්දාහකටත් ඉහළින්
හරයක් නැති ගාථාවන්
තිබුණත් සිත කරන පහන්
එකක් අගේ ඇත වැඩියෙන්

# හර ඇති ගාථා එකක් - පරදයි හර නැති දහක්

## 8 (2) බාහිය දාරුචීරිය වෘත්තාන්තය (101 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **බාහිය දාරුචීරිය** තෙරුන් වහන්සේ අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

වෙළඳ පිරිසක් නැව් නැඟී වෙළඳාම් පිණිස සමුදුරු තරණයට නික්මුණ හ. මහ මුහුද මැදදී නැව බිඳී වැනසී එක් අයෙක් හැර අන් සියල්ලෝම මිය ගිය හ. හේ නැවේ ලෑල්ලක් මතට වී පාවී ගොස් සුප්පාරක නම් තොටට ගොඩ බැස්සේ ය. ගොඩ බිමට පා වන විට සියළු ඇඳුම් අහිමිව නිරුවත්ව සිටි හෙයින් හෙතෙම ගස්වල පොතු ගලවා වියා විලි වසා ගන්නට ඇඳුමක් තනා ගත්තේ ය. ආහාර ලබා ගැනීමට සුදුසු බඳුනක් ද සොයා ගත් හේ මිනිසුනට පෙනෙන තැනක හිඳ ගෙන සිටියේ ය. ඒ දුටු සමහරු තවුසෙකැයි සිතා වැඳ පුදා කැඳ බතින් සංග්‍රහ කළ හ. සමහරුන් ඔහුට ඇඳුම් දෙන්නට වෑයම් කළ ද හේ ඒවා ප්‍රතික්ෂේප කළේ සාමාන්‍ය ඇඳුම් ඇඳ ගතහොත් තමන් ට ලැබෙන පුද සැලකිලි අඩු වෙතැයි බියෙනි. සමහරුන් ඔහු රහතන් වහන්සේ නමක් ලෙස හඳුන්වනු ඇසුණෙන්, ඇත්තට ම තමා රහත් ව ඇතැයි ඔහුට ද සිතිණි. ඔහු අමුතු ආගමික පිළිවෙතක් දරන හෙයින් හා ගස් පොතු වලින් තැනූ වස්ත්‍රයක් දරන හෙයින් ඔහුට බාහිය දාරුචීරිය යන නම ව්‍යවහාර වන්නට පටන් ගත්තේ ය.

දිනක් රැයෙහි මහා බ්‍රහ්මයා තමන් හමුවට පැමිණ "බාහිය, ඔබ රහත් වී නැත. රහත් නමක් වෙත තිබිය යුතු ගුණාංග කිසිවක් ඔබ වෙත නැත" යි කියනු ඔහුට ඇසිණි. "එසේ ය. මා රහත් වී නැතැයි මම දනිමි. එහෙත්, මේ ලොව කවර තැනක හෝ රහත් වූ අයෙක් සිටිත් ද?" යි හේ ප්‍රශ්න කළේ ය. එවිට මහා බ්‍රහ්මයා සැවැත් නුවර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ පිළිබඳ සියළු තොරතුරු ඔහුට පැවසී ය.

භාග්‍යවතුන් වහන්සේ සොයා ගිය බාහිය දාරුචීරිය තෙමේ උන්වහන්සේ භික්ෂූන් පිරිවරා පිඬු සිඟා යනු දැක පසු පසින් ගියේ ය. තමන්ට ධර්ම දේශනාවක් කරන්නැයි ඔහු ඉල්ලා සිටි විට "බාහිය, මේ අප පිඬු සිඟා වඩන වේලාවයි. මේ බණක් කීමට සුදුසු වේලාව නො වේ" යි බුදු රජාණන් වහන්සේ පිළිතුරු දුන් හ. "ස්වාමීනි, ඔබ වහන්සේ ගේ ජීවිතයට හෝ මගේ ජීවිතයට කවර මොහොතේ අනතුරක් වේ දැයි අපි නො දනිමු. එහෙයින් පමා නො කර මට දැන්ම ම දහමක් දෙසනු මැනවි'' යි දාරුචීරිය ඉල්ලා සිටියේ ය. යොදුන් එකසිය විස්සක් එක් රැයකින් ගෙවා පැමිණ දැඩි වෙහෙසට පත්ව සිටි බාහිය දාරුචීරිය බුදුරදුන් දුටු ප්‍රීතියෙන් ඔද වැඩී සිටි හෙයින් ඔහු මඳක් සංසුන්වන තුරු පමා කරන්නට බුදුරජාණන් වහන්සේට අවශ්‍ය විය. එහෙත් බාහිය දිගින් දිගටම ආයාචනා කරන්නට වූයෙන් භාග්‍යවතුන් වහන්සේ මග නැවතී "බාහිය, රූපයක් ඔබේ නෙත ගැටෙන විට රූපයක් දිස්වන බව පමණක් සිතන්න. ශබ්දයක් කණ වැකෙන විට ශබ්දයක් ඇසෙන බව පමණක් සිතන්න. සුවඳක් දැනෙන විට සුවඳක් දැනෙන බව පමණක් සිතන්න. රසයක් දිවට දැනෙන විට රසයක් දිවට දැනෙන බව පමණක් සිතන්න. ස්පර්ශයක් ගතට දැනෙන විට ස්පර්ශයක් බව පමණක් සිතන්න. සිතට සිතිවිල්ලක් එන විට සිතිවිල්ලක් නැගෙන බව තේරුම් ගන්න." යි වදාළ හ. මේ දෙසුම අසා සිටි බාහිය රහත් ඵලය ලද්දේ ය.

රහත් බව ලද බාහියට පැවිදි වන්නට රුචියක් ඇති විය. එහෙත් සිවුරු පිරිකර නො වූයෙන් ඒවා සපයා ගැනීමට හේ පිටත්ව ගියේ ය. එහෙත් මගදී එළදෙනක විසින් අනිනු ලැබ හේ මිය ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ සහ භික්ෂූන් වහන්සේලා දන් වළඳා ආපසු වඩින විට බාහිය කුණු ගොඩක් අසල මැරී වැටී සිටිනු උන්වහන්සේලා ගේ නෙත ගැටිණි. බුදුරජාණන් වහන්සේ ගේ උපදෙස් පරිදි භික්ෂූහු මළ සිරුර ආදාහන කර භෂ්මාවශේෂ නිදන් කර සෑයක් ද තැනවූ හ. දෙව්රම් වෙහෙර දම්සබා මණ්ඩපයේ දී බාහිය මිය ගියේ රහතන් වහන්සේ නමක් වශයෙන් බව ප්‍රකාශ කළ බුදුරජාණන් වහන්සේ ඉක්මණින් ධර්මාවබෝධය කළවුන් අතුරින් බාහිය දාරුචීරිය අගතැන්හි තැබූ හ. බාහිය රහත් වූයේ කවදා කොහේ දී දැයි විමසූ භික්ෂූන් වහන්සේලාට "මා ඔහුට මගදී දෙසූ වචන කිහිපය අසා හෙතෙම මහ මග මැද ම රහත් වීය" යි වදාළ උන් වහන්සේ අර්ථසම්පන්න එක් වචනයක් වුවත් අර්ථ විරහිත වචන දහසකට වඩා අගනා බව මේ ගාථාවෙන් දේශනා කර වදාළ හ.

### විස්තරාත්මක අනුවාදය (101 ගාථාව)

**අනත්ථ පද සංහිතා ගාථා චේ සහස්සං අපි යං සුත්වා**
**උපසම්මති එකං ගාථා පදං සෙය්‍යො.**

**අනත්ථපද සංහිතා**: නිරර්ථක ප්‍රකාශයන්ගෙන් පිරුණු; **ගාථා**: ගාථාවන්; **සහස්සං අපි**: දහසක් වුව; **චෙ**: (තිබුණ) ද; **යං සුත්වා**: යමක් අසා; **උපසම්මති**: නිවී සැනසේ ද (එබඳු); **එකං ගාථාපදං**: එකම ගාථාපදය; **සෙය්‍යො**: වඩා උතුම් ය.

නිෂ්ප්‍රයෝජන කියමන් සහිත ගාථා දහසකට වුව ද වඩා, ඇසීමෙන් සිත නිවී සැනසී යන එක ගාථා පදයක් වුවත් වටියි.

### විවරණය

ගාථා නමින් හඳුන්වන්නේ පාලි භාෂාවෙන් කරන ලද පද්‍ය ස්වරූපී ප්‍රබන්ධ ය. සිංහලයෙන් මේවා ගී හෝ කවි වශයෙන් හැඳින්විය හැක. කිසියම් ඡන්දසකට අනුව මාත්‍රා පිහිටුවා ගාථා වාදනය කරන අතර ඇතැම් විට තාල වෙනස් වන පරිදි නිදහසේ ප්‍රබන්ධ කර ඇති අවස්ථා ද වෙයි. එසේ කරන්නේ අර්ථයට මුල් තැන දීම හේතුවෙනි. නවංග සාසනයෙන් එක් අංගයක් ලෙස ගාථා දක්වා ඇත. ධම්මපදය ද ගාථාමය ධර්ම ග්‍රන්ථයකි. සාමාන්‍යයෙන් ගාථාවකට පද හතරක් ඇතත්;, ඉඳහිට පද හයක් ඇති අවස්ථා ද දක්නට ලැබේ.



*අවැඩට මඟ සැලසෙන කරුණු සහිත වු ගාථා සියයකට වඩා ඇසුවන් සන්සිඳුවන එක දහම් පදය ඉතා උතුම් ය.*

| | |
|---|---|
| 102. යො වෙ ගාථා සතං භාසෙ<br>අනත්ථපදසංහිතා<br>එකං ධම්මපදං සෙය්‍යො<br>යං සුත්වා උපසම්මති. (8:3) | සීයක් ගැයුවත් හර නැති<br>ගාථා කිසි වැඩකට නැති<br>එක ගාථාවක් හර ඇති<br>උතුම්ය ඉන් සිත් සැනහෙති. |

# පද දහම් - වේ උතුම්

## 8 (3) කුණ්ඩලකේසී තෙරණිය ගේ වත (102, 103 ගාථා)

දෙව්රම් වෙහෙර වැඩ විසූ තථාගතයන් වහන්සේ මේ ගාථා යුග්මය දේශනා කර වදාළේ **කුණ්ඩලකේසී භික්ෂුණිය** අරබයා ය.

රජගහ නුවර එක් සිටුවරයකුට සොළොස් හැවිරිදි දියණියක් වූවා ය. අතිශයින් රූප සම්පන්න වූ දකින්නන් ගේ මන බඳින සුළු වූවා ය. දෙමාපියෝ ඇය සත් මහල් පායක ඉහල ම මහලේ රඳවා දාසියක් ද සමග සියළු සැප සම්පත් දී පෝෂණය කළ හ. එසමයෙහි එක් සොරෙක් සොරකමේ ගොස් රාජපුරුෂයන් විසින් අල්ලා ගනු ලැබ මරණීය දණ්ඩනයට නියම කරන ලද්දේ ය. ඔහු ගේ අත් පිටුපසට තබා බැඳ හතරමං හන්දි වලදී කස පහර දෙමින් මරා දැමීම පිණිස ගෙන යමින් තිබිණ. මහ මග කලබල හඬ ඇසූ සිටු දියණිය මතු මහලේ සිට ඒ කුමක්දැයි බැලුවා ය. චෞරයා ගේ ආරෝහ පරිණාහ සම්පන්න සිත් අලවන පෙනුම දැක ඇය සිත තුළ ඇල්මක් ඇති විය. කෙතරම් දැඩි ලෙස ඇය ගේ සිත බැඳුනා ද යත් ඕ තොමෝ කෑම බීම ප්‍රතික්ෂේප කරමින් ඇඳෙහි වැතුරුණා ය. "මා දියණියනි, ඇයි මේ?" යි මව විචාළ විට "මරා දමනු පිණිස ගෙන යනු ලබන තරුණයා ලදොත් පමණක් ජීවත් වෙමි. නැතහොත් මේ ජීවිතයෙන් ප්‍රයෝජනයක් නැත. නොකා නොබී මිය යන්නෙමි" යි කීවා ය. කිසි අයුරකින් දියණිය සනසන්නට අසමත් වූ මව මෙ පවත් සිටුවරයාට දැන්වී ය.

වෙන කළ යුත්තක් නැති තැන හෙතෙම කහවණු දහසක් රාජපුරුෂයනට අල්ලස් දී සොරා බේරා ගත්තේ ය. ඔහු වෙනුවට වෙනත් අයකු මරා දමන ලදී. සිටුවරයා සොරාට තම දියණිය විවාහ කර දුන්නේ ය. සිටු දියණිය ද ඔහු ගේ ආදරය දිනා ගනු පිණිස දිනපතා පියකරුව සැරසී, විසිතුරු ඇඳුම් ඇඳ, අගනා ආභරණ පැළඳ ඔහුට සෙනෙහස දක්වන්නී ය. ආහාර පාන ආදිය ද ප්‍රණීත ලෙස සකසා සියතින් ම පිළිගන්වන්නී ය. එහෙත් සොර තරුණයා නිතර ම කල්පනා කළේ සිටු දියණිය මරා දමා ඇය ගේ අගනා ආභරණ ද රැගෙන පලා යන ක්‍රමයකි. "මැය මරා ආභරණ රැගෙන පලා ගොස් හොඳ රා පොලකින් සුරා පානය කර විනෝද වෙමි" යි සිතූ හේ උපක්‍රමයක් සිතා ගෙන ආහාර පානාදිය නො ගෙන ඇඳට වී සිටියේ ය.

"හිමියනි ඔබ අසනීපයෙන් ද?" යි ඕ විමසුවා ය. "නැත සොඳුර". "එසේ නම් මගේ දෙමාපියන් ගෙන් වරදක් වූවා ද?" "නැත. ඔවුන්ගෙන් වරදක් නොවී ය." "එසේ නම්, ප්‍රශ්නය කුමක් ද ස්වාමීනී?" "සොඳුර, මා එදා අත් බැඳ මරන්නට ගෙන යද්දී මා දිවි ගැලවුවහොත් ඉටු කරන්නෙමැයි චෝරපබ්බතයෙහි දේවතාවාණනට බාරයක් වුණෙමි. මා දිවි ගැලවුණෝත් ඔබ වැනි බිරිඳක් ලැබුණෝත් දේව කරුණාවෙන් මය. ඉතින් මා ඒ බාරය ඉටු කළ යුතු ය. ඒ ගැන සිතා තැවෙමි". "හිමියනි, එය තැවෙන්නට කරුණක් නො වේ. උවමනා කවර පූජා වස්තුදැයි මට කියන්න. අපි ඒ බාරය ඔප්පු කරමු" යි ඕ කීවා ය.කිරිබත්, මීපැණි, ලඳ පස් මල් වැනි දේ සූදානම් කරන්නැයි ස්වාමියා කී හෙයින් සිටු දියණිය ඒ සියල්ල ඉටු කළා ය. ඔවුන් බාරය ඉටුකරන්නට යන දිනයෙහි "සොඳුර, ඔබේ නෑදෑ කිසිවකු නාවාට කම් නැත. ඔබත් මමත් තනිව ගොස් මේ බාරය ඔප්පු කරමු. ඔබ ගේ අගනා ම ආභරණ පැළඳ ගනිමු." යි හෙතෙම පැවසී ය. සිටු දියණිය ද ඒ අනුව ම සැරසුණා ය. ඔවුහු ඉතා සතුටින් විනෝදයෙන් චෝරපබ්බතය නැග ගත් හ. එහෙත් කඳු මුදුනෙහි දී සොරා අමුතු මිනිසෙක් බවට පත් විය. "මට මේ පූජාවස්තු වලින් පලක් නැත. මා වූ බාරයකුත් නැත." යි හේ පැවසී ය.

"එසේ නම් මා මෙහි කැඳවාගෙන ආයේ කුමට ද ස්වාමීනී?" යි ඕ විමසුවා ය. "තී මරා දමා ආබරණ සියල්ල ද රැගෙන පලා යන්නට ය" භීතියට පත් සිටු දියණිය "හිමියනි, මගේ අබරණ සියල්ලත්, මාත් මේ හැමෙකක්මත් ඔබගේ මය. එසේ තිබිය දී ඔබ මේ කුමක් කියන්නේ දැයි" විමසුවා ය. යළි යළිත් ඔහුට කරුණු කියමින් තේරුම් කරන්නට උත්සහ කළ ද ඔහු දිගට ම කියා සිටියේ ඇය මරා දැමිය යුතු බව ය. "මා මරා දැමීමෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? මේ ආභරණ සියල්ල රැගෙන මා මුදා හරින්න" යි ඕ ආයාචනා කළා ය. අන්තිමේ දී ඔහු වෙත තිබුණු ඇල්ම දුරු කළ කුණ්ඩලකේසී මෙසේ සිතුවා ය. "මේ මොන දුෂ්ට වැඩක් ද? කොහොම වුණත්, නුවණක් කියා දෙයක් අපට ලැබී තිබෙන්නේ උයාගෙන කන්නට ම නොවේ. පනින්නට පෙර සිතා බැලිය යුතුය.

### විස්තරාත්මක අනුවාදය (102 ගාථාව)

**යො අනත්ථපද සංහිතා ගාථා සතං භාසෙ ච යං සුත්වා උපසම්මති එකං ධම්මපදං සෙය්‍යො.**

**යොඃ** යම්කිසි කෙනෙක්; **අනත්ථපද සංහිතාඃ** නිරර්ථක ප්‍රකාශ ඇතුළත්; **ගාථාඃ** ගාථා; **සතංඃ** සියයක්; **භාසේ චඃ** කියුව ද; **යංඃ** යමක්; **සුත්වාඃ** අසා; **උපසම්මතිඃ** සැනසිල්ල ලැබේ ද; **එකං ධම්මපදංඃ** එවන් එක් ධම්මපදයක්; **සෙය්‍යොඃ** ඊට වැඩියෙන් උතුම් ය.

යම්කිසි කෙනෙක් නිෂ්ඵල කරුණු ඇතුළත් ගාථා දහසක් පාඩම් කරගෙන ගායනා කළ ද, ඊට වඩා අසන්නා ගේ සිත සනසන එක ධර්ම පදයක් වුව ද ශ්‍රේෂ්ඨ ය.






*දස ලක්‍ෂයක් සෙනග පරදවා යුදයෙහි දිනුමට වඩා යමෙක් එක ම තමා දිනන්නේ නම් උතුම් ය.*

103. යො සහස්සං සහස්සෙන
සඞ්ගාමේ මානුසේ ජිනේ
එකඤ්ච ජෙය්‍ය අත්තානං
ස වෙ සඞ්ගාමජුත්තමො (8:4)

දහසක් වර දහසක් දෙන
දිනුවත් මිනිසුන් සටනින
උසස් නොවෙයි තමන් දිනන
තරම්, එයයි උතුම් සටන

# උතුම් දිනුම තමන් දිනුම

## 8 (3) කුණ්ඩලකේසී තෙරණිය ගේ වත (102 හා 103 ගාථා)

මේ දුෂ්ට මිනිහාගෙන් ගැලවෙන ක්‍රමයක් යොදා ගත යුතු ය." "ස්වාමි පුරුෂයාණෙනි, ඔබව වධ බෙර වයමින් පිටිතල හයා බැඳ මරන්නට ගෙන යන මොහොතේ දී මම මගේ දෙමාපියන්ට කියා කහවණු දහසක් දී ඔබ බේරා ගතිමි. ඒ ඔබට ඇති වූ ආදරය නිසා ය. මම ඔබට ඒ උපකාරය කළෙමි. අද මේ ජීවිතයේ අවසන් මොහොතේ ඔබ මට ද උපකාරයක් කළ මැනවි. මට ඔබතුමා ප්‍රදක්ෂිණා කර වැඳ මියයන්නට ඉඩ දෙනු මැනැවි" යි ඕ ඉල්ලා සිටියා ය.

"කදිමයි, සොඳුර, ඊට ඉඩ දෙමි" යි සොරා ඊට ඉඩ දුන්නේ ය. ඒ වන විට ඔවුන් සිටියේ පර්වතයෙහි මුදුනේ ම ප්‍රාන්තයේ ය. "හිමියනි මේ මගේ අන්තිම මොහොතය. අදින් පසු ඔබේ ප්‍රිය දර්ශනය මට නො ලැබේ. මට ඔබ ආදරයෙන් සිප වැළඳ ගැන්මට ඉඩ දෙන්න" යි කියමින් ඕ ඔහු ඉදිරියෙන් සිප ගෙන පසු පසින් ද සිප ගනිමින් හිටි හැටියේ ම ඔහු පර්වතයෙන් පහලට තල්ලු කර දැම්මා ය. කන්දෙන් පහළට පෙරළී ගිය සොරා කඩ කඩ වී ගොස් මිය ගියේ ය. අනතුරුව ඕ තොමෝ පරිබ්‍රාජකාරාමයකට ගොස් පැවිදි වූවා ය.

පරිබ්‍රාජිකාවක වශයෙන් දහම් හදාරා ගැටළු දහසක් විසඳන්නට සමාර්ථ්‍යය ලත් තැන ඔවුහු ඇයට මෙසේ කී හ. "දැන් ඔබ ධර්මධර ය. දඹදිව පුරා සංචාරය කරමින් ඔබ සමග තර්ක කරන්නට සමත් අයෙක් සිටීදැයි සොයන්න." එසේ පවසා ජම්බු අත්තක් ඇය අතට දී " සොහොයුරිය, යන්න. යම් ගිහියෙක් ඔබ තර්කයෙන් පැරදවුව හොත්, ඔහු ගේ වහලිය වන්න. යම් භික්ෂුවක් හෝ භික්ෂුණියක් එසේ කළ හොත් ශ්‍රාවිකාවක් වන්න" යි ද කීහ.

තර්ක ශක්තියෙන් හා වාග් චාතුර්යයෙන් පොහොසත් වූ ඇය ගේ කීර්තිය දඹදිව පුරා පැතිර ගියේ ය. ඇය යනු දකින විට මිනිස්සු "ඔය යන්නේ ජම්බු පරිබ්‍රාජිකාව" යි කියන කරමට ඕ ප්‍රකට වූවා ය.

නගරයකට හෝ ගමකට පිණ්ඩපාතයෙහි හැසිරෙනු පිණිස ඇතුල් වෙත්දී නුවර දොරටුව අසල වැලි ගොඩක් ගසා ජම්බු අත්ත සිටුවන ඕ "මා වාදයෙන් පරදන්නට හැකි යයි සිතන කෙනෙක් මෙය පෙරලත්වා. මම ඔහු සමග වාද කරමි" යි පවසා පිඬු සිඟා යයි. අත්ත ඉවත් කරනු තබා කිසිවෙක් ඒ අසලටවත් නො යති. එක් අත්තක් වියලී ගිය විට ඕ එය ඉවත දමා අළුත් අත්තක් සොයා ගනියි.

මේ ක්‍රමයෙන් ගමක් ගමක් පාසා නගරක් නගරයක් පාසා සැරිසරන ජම්බු පරිබ්‍රාජිකා හෙවත් කුණ්ඩලකේසාවෝ සැවැත් නුවරට පිවිසුණ හ. ඇය සුපුරුදු පරිදි ජම්බු අත්ත සිටුවා පිඬු සිඟා ගිය අතර එහි වැඩම කළ සැරියුත් තෙරණුවෝ අසල සෙල්ලම් කළ ළමයින් ලවා අත්ත ගලවා දැම්මවූ හ. ඕ පැමිණ "හිමියනි, මේ අත්ත ඉවත් කළේ ඔබ වහන්සේ ද?" යි විමසූ හ. "එසේ ය නැඟණිය" "එසේ නම් ඔබ වහන්සේ මගේ ප්‍රශ්න වලට පිළිතුරු දීමට සූදානම් ද?" "එසේ ය නැඟණිය, මම සූදානම්."
තමා උගත් ධර්ම ප්‍රශ්න දහසම ඕ සැරියුත් හිමියන්ගෙන් විමසුවා ය. ඒ සියල්ලට ම උන් වහන්සේ සාර්ථක පිළිතුරු දුන් හ. අනතුරුව සාරිපුත්ත හිමියෝ "නැඟණිය මම ඔබට සාර්ථකව පිළිතුරු දුන්නෙමි. මගේ එකම එක ප්‍රශ්නයට ඔබ පිළිතුරු දෙන්න" යි පැවසූහ. "අසන්න ස්වාමීනී, මම විසඳමි" ඇය එසේ පවසා එකඟ වූයෙන් සැරියුත් හිමියෝ "එක නම් කුමක් ද" යි විමසූ හ.

පිළිතුරු නො දත් ඕ "ඒ කුමක් ද ස්වාමීනී" යි තෙරුන් වහන්සේගෙන් විමසූ හ. "නැඟණිය, මෙය බුදුරජාණන් වහන්සේ ගේ ප්‍රශ්නයකි" යි සැරියුත් හිමියෝ වදාළ හ. "මට පිළිතුරක් කියා දුන මැනවි ස්වාමීනී" යි ඕ අයැද සිටියා ය. "ඔබ පැවිදි වන්නට කැමති නම් කියා දෙමි" "හොඳමයි ස්වාමීනී මම පැවිදි වන්නෙමි'' යි ඇය එකඟ වූයෙන් සැරියුත් හිමියෝ ඇය මෙහෙණවරට යවා පැවිදි කරවූ හ. භික්ෂුණී ශාසනයට ඇතුළුව ධර්මය ඉගෙන දින කිහිපයකින් ම රහත් වූ ඕ තොමෝ උපසම්පදාව ද ලබා කුණ්ඩලකේසා භික්ෂුණිය වශයෙන් ප්‍රකට වූවාය. සෘද්ධිප්‍රාතිහායයී දැක්විය හැකි භික්ෂුණීන් අතර අග්‍රස්ථානය ද ලද්දා ය.

### විස්තරාත්මක අනුවාදය (103 ගාථාව)

**යො සඞ්ගාමේ සහස්සෙන සහස්සං මානුසෙ ජිනෙ ච**
**එකං අත්තානං ජෙය්‍ය සො වෙ සඞ්ගාමජුත්තමො**

**යො**: යම්කිසි කෙනෙක්; **සඞ්ගාමෙ**: යුද්ධය මගින්; **සහස්සෙන**: දහස් වරක්; **සහස්සං**: දහසක්; **මානුසෙ**: මිනිසුන්; **ජිනෙ ච**: පරදවයි නම්; **ඒකං අත්තානං**: එක් අයෙක් තමන්; **ජෙය්‍ය**: ජය ගන්නේ නම්; **සො**: හෙතෙම; **වෙ**: ඒකාන්තයෙන් ම; **සඞ්ගාමජුත්තමො**: යුද්ධ දිනන උත්තමයා වේ.

යුද්ධ කිරීම මගින් දහස් වරක් දහසක් දෙනා පරාජය කර ජයග්‍රහණය කළ ද යමෙක් තමන් දිනීම තරම් එය ශ්‍රේෂ්ඨ නොවේ. උසස් ම ජයග්‍රාහකයා තමන් ජයගන්නා තැනැත්තා ය.

### විවරණය

මේ ගාථාවෙන් අගය කරනු ලබන්නේ තමා ජය ගැනීම ය. තමා ජය ගන්නා තැනැත්තා ජය ගන්නේ එකම එක පුද්ගලයෙකි. යුද්ධ කරන තැනැත්තා දහසක් දෙනා පරදවා ජය ගනියි. නමුත් ඔහු ගේ ජයග්‍රහණය තනි තැනැත්තකු ජය ගන්නා ගේ ජයග්‍රහණය තරම් වටින්නේ නැත. තමා ජය ගැනීම අතිශය දුෂ්කර වුත් ආධ්‍යාත්මික වුත් නිරවද්‍ය වුත් ජයග්‍රහණයක් හෙයිනි.



*තම අතබැව් දිනීම ඉතා උතුම් දිනීමය*

104. අත්තා හවෙ ජිතං සෙය්‍යො
යා චා යං ඉතරා පජා
අත්තදන්තස්ස පොසස්ස
නිච්චං සඤ්ඤත චාරිනො (8:5)

තමා දිනුමයි උතුම් වන්නේ
අනුන් පරදා දිනුම වෙනුවට
තමා දමනය කරන අය ගේ
නිතර සංවර විලස හැසිරෙන

# වෙනත් ජයක් නැත සමවෙන - ජයට තමන් දිනා ලබන

## 8 (4) අනත්ථපුච්ඡක බමුණා ගේ කථාව (104, 105 ගාථා)

භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් **අනත්ථපුච්ඡක බමුණා** අරබයා මේ ගාථාව වදාළ සේක.

වරක් භාග්‍යවතුන් වහන්සේ හමුවීමට පැමිණි අනත්ථපුච්ඡක නම් බමුණා මෙසේ පැවසී ය. " ස්වාමීනි, මට හැඟෙන්නේ ඔබ වහන්සේ දන්නේ අර්ථ සම්පන්න (ප්‍රයෝජනවත්) දේවල් ගැන පමණක් බවයි. ඔබ වහන්සේ අනර්ථ සම්පන්න (විනාශකාරී) දේවල් ගැන දන්නේ නැතැයි මට හැඟෙයි.'' ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ අර්ථ සංහිත දේ පමණක් නොව අනර්ථ සංහිත දේත් දන්නා බව ප්‍රකාශ කර ධන හානිය සිදුවන නරක පුරුදු හයක් නම් කර දැක්වූහ.

1. හිරු නැඟෙන තුරු නිදා ගැනීම.
2. අලසකම.
3. කුරිරුකම.
4. මදයට හා ප්‍රමාදයට හේතුවන බීමත් කම.
5. නොකල්හි වීථි සංචාරය.
6. කාම මිථ්‍යාචාරය යන හයයි.

මේ අසාසිටි බමුණා සාධුකාර දී "යහපති ස්වාමීනි, ඉතා මැනවි. ඔබ වහන්සේ අර්ථ සංහිත දේ පමණක් නොව අනර්ථකාරී දේත් දන්නා සේක"යි ප්‍රකාශ කළේ ය."එසේ ය බ්‍රාහ්මණය, අනර්ථකාරී දේ මොනවාදැයි මා තරම් දන්නා වෙනත් අයෙක් නැත" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ හ.

අනතුරුව මේ බ්‍රාහ්මණයා මෙවන් ප්‍රශ්නයක් නැඟුවේ කවර හෙයින්දැයි විමසනු රිසි වූ භාග්‍යවතුන් වහන්සේ "බ්‍රාහ්මණය, ඔබ ජීවත් වන්නේ කවර වෘත්තියකින්දැයි" විචාළ හ. "සූදුවෙනි" යි හෙතෙම පිළිවදන් දුන්නේ ය.

"කවුද දිනන්නේ, ඔබ ද වෙන අය දැයි" බුදුරජාණන් වහන්සේ විමසූ හ. "සමහර විට මා දිනනවා. සමහර විට අනුන් දිනනවා" "බ්‍රාහ්මණය අනුන් පරදවා ජයග්‍රහණය කිරීම එතරම් වැදගත් දිනුමක් නොවේ. තමා ගේ දුබලතා තේරුම් ගෙන දිනන තැනැත්තා නියම ජයග්‍රාහකයා ය." යි භාග්‍යවතුන් වහන්සේ පැවසූ හ.

**විස්තරාත්මක අනුවාදය (104 ගාථාව)**

**අත්තා ජිතං හවෙ සෙය්‍යො යා ච අයං ඉතරා පජා**
**අත්තදන්තස්ස නිච්චං සඤ්ඤතචාරිනො පොසස්ස**

**අත්තා**: තමන්; **ජිතා**: දිනාගැනීම; **හවෙ**: ඒකාන්තයෙන්; **සෙය්‍යො**: ශ්‍රේෂ්ඨ ය; **යා ච**: යම් මේ; **ඉතරා පජා**: අවශේෂ ජනයා (දිනා ගැනීම ශ්‍රේෂ්ඨ නොවේ.); **අත්තදන්තස්ස**: තමා දමනය කරගත් සහ; **නිච්චං**: නිතර; **සඤ්ඤතචාරිනො**: සංවර හැසිරීම් ඇති; **පොසස්ස**: පුද්ගලයා ගේ දිනීම

තමන් දිනා ගැනීම ඒකාන්තයෙන් ම ශ්‍රේෂ්ඨ ය. අන් අය පරදවා ජය ගැනීම එතරම් වැදගත් නැත. තමා ජයගත් සංයත හැසිරීම් ඇති.

**විවරණය**

**ගන්ධබ්බ**: ගාන්ධර්ව නමින් හඳුන්වන්නේ ගී ගයමින් නටමින් විනෝදකාමී ජීවිතයක් ගත කරන දේව ගණයකි. අටුවාවල එන විස්තර අනුව ගාන්ධර්වයන් වසන්නේ චාතුම්මහා රාජික දේව ලෝකයේ ය.

**අත්තදණ්ඩස්ස පොසස්ස**: මෙවැනි සන්දර්භයන්හි 'අත්ත' යන වචනය යෙදෙන්නේ බ්‍රාහ්මණික චින්තනයේ මෙන් 'ආත්ම' නමින් පවත්නා නිත්‍ය, අවිපරිණාමී පදාර්ථයක් හඟවන්නට නොව සම්මුති අරුතකින් 'තමා' යන්න හැඟවීමට ය. ස්ථාවර ආත්මයක් නැති බව බුදු දහමේ කේන්ද්‍රිය ඉගැන්වීමකි. භාරතීය ඇතැම් ආගම් වල මෙන් ජගදාත්මයක් හා පුද්ගලාත්මයක් වශයෙන් දීර්ඝ සම්බන්ධයක් ඇති අධිභෞතික සංකල්පයක් පිළි ගැනීමට බුදු සමයෙන් ඉඩක් සැලසී නැත. නිත්‍ය වූ ආත්මයක් ගතික ලක්‍ෂණයෙන් තොර හෙයින් සංවර්ධනයක් හෝ පරිහානියක් ඇති වීමට හෝ ඇති කිරීමට ඉඩක් නැත. එසේ වුවහොත් ශික්‍ෂාව නිරර්ථක දෙයක් වෙයි.

බටහිර දර්ශනයෙහි පෙර පිළිගත් කාය - චිත්ත භේදය හෙවත් භෞතිකය හා ආත්මය වශයෙන් පැවති ද්විභේදතාව ද දැන් නො පිළිගැනෙයි. එහෙයින් විද්‍යානුකූලව ආත්මයක පැවැත්ම සනාථ කරන තර්කයක් ඉදිරිපත් කිරීම දුෂ්කර ය.





*තම සිත් දිනාගත් අය කිසිවෙකුටත් නොපරදිති.*

105. නෙව දෙවො න ගන්ධබ්බො
න මාරො සහ බ්‍රහ්මුනා
ජිතං අපජිතං කයිරා
තථා රූපස්ස ජන්තුනො (8:6)

ගන්ධබ්බයෙක් කිසිම දෙවියෙක්
මාරයෙක් හෝ කිසි බ්‍රහ්මයෙක්
නො පෙරලයි ඒ ජය පරාජය
ලබා ගත් ඒ වගේ උතුමෙක්

# කළහොත් දමනය තමන් - නො හෙති වෙනසකට අනුන්

## 8 (4) අනත්ථපුච්ඡක බමුණා ගේ කථාව (104, 105 ගාථා)

### විස්තරාත්මක අනුවාදය (105 ගාථාව)

**තථාරූපස්ස ජන්තුනෝ ජිතං දෙවො න එව අපජිතං
කයිරා ගන්ධබ්බො න බ්‍රහ්මුණා සහ මාරො න.**

**තථාරූපස්ස**: එබඳු වූ; **ජන්තුනෝ**: පුද්ගලයා ගේ; **ජිතං**: ජයග්‍රහණය; **දෙවො**: දෙවිවරු; **න අපජිතං කයිරා**: පරාජයක් බවට පත් නො කරති; **ගන්ධබ්බො න**: ගාන්ධර්වයෙක් ද නො කරයි; **බ්‍රාහ්මුණා සහ**: බ්‍රාහ්මයන් සහ; **මාරො න**: මරුවා ද නොකරයි.

එවන් (තමා දමනය කළ සංයත) පුද්ගලයා ගේ ජයග්‍රහණය පරාජයක් බවට පත් කරන්නට දෙවියකුට ගාන්ධර්වයකුට, බ්‍රහ්මයාට හෝ මාරයාට නො හැකි ය.

### විවරණය

ඇතැම් දේවධර්මවල ඉගැන්වෙන පරිදි මිනිසාට ඇත්තේ මැවුම්කාර දෙවියන් වහන්සේ විසින් දෙන ලද ආත්මයකි. මෙම ආත්මය මරණින් පසු සදාකාලික ස්වර්ගයට හෝ සදාකාලික අපායට නියම කරනු පිණිස නැවත දෙවියන් හමුවට කැඳවනු ලැබේ. වර්තමාන ශරීරයන් ම සුසානයෙන් නැගිටුවා එම ආත්මය ද සහිතව දේවාධිකරණය හමුවට කැඳවන බව ඔවුහු විශ්වාස කරති. මිනිසා නිර්මාණය කරන අවස්ථාවේ දී ඔහු නිමැවුයේ මැටියෙන් බවත් අනතුරුව එම දේවසම රූපී ශරීරයට දෙවියන් වහන්සේ විසින් ජීවය දුන් බවත් ඔවුහු කියති. "Riddle of univese" නම් ග්‍රන්ථය ලියූ විද්වතා මෙසේ කියයි. "පෞරුෂේය දෙවිකෙනකුන් මනුෂ්‍යයාට අමරණීය ආත්මය හුස්ම තුළින් ප්‍රදානය කළ බව (මේ දුන් ආත්මය දෙවියන් ගේ ආත්මයෙන් ම අංශුවකැයි ද සිතති.) පිළිබඳ මෙම දේවධර්ම වාදීන් ගේ තර්කය සම්පූර්ණයෙන්ම ප්‍රවාද කතාවකි. ලෝකයේ සදාචාරය පිළිබඳ නියාමයක් ක්‍රියාත්මක වන බව පෙනේ යැයි ද ඒ අනුව මානව ආත්මය සනාතනව පවතින්නක් විය යුතු යැයි ද ඔවුන් නඟන විශ්ව විභාග විද්‍යාමය තර්කය පදනම් විරහිත ආදානග්‍රාහී විශ්වාසයක් පමණි. එමෙන් ම මිනිසා ගේ අසම්පූර්ණ, දෝෂ සහිත පෘථිවි බද්ධ ආත්මය පරිපූර්ණ කිරීම පිළිබඳ උත්තම පරමාර්ථය සාර්ථක කර ගැනීම පිණිස මනුෂ්‍යාත්මය සුසාන භූමියෙන් එහාටත් ව්‍යාප්ත විය යුතු යැයි පැවසීම ද (සාධනවාදී තර්කය) ව්‍යාප්ත වූ මානව රූපාන්තරණවාදී ප්‍රකාශයකි. අඩුපාඩු සහිත වූ අසන්තෘප්තිදායක වූ පෘථිවි බද්ධ පැවැත්ම සදාකාල පැවැත්මේ අවශේෂ භාගයට සම්බන් ධ පරිපූරක යුක්තිය විසින් පූරණය කළ යුතු යැයි නඟන සදාචාර තර්කය ද දැහැමි ප්‍රාර්ථනාවකට වැඩි දෙයක් නොවේ. අමරණීයත්වය හා ඊශ්වර නිර්මාණය පිළිබඳ විශ්වාසය සමස්ත මානව සංහතිය විසින් ම අවිවාදයෙන් සර්වත්‍රගතව පිළිගනු ලබන විශ්වාසයකි යි පවසන මානව වංශ විද්‍යාත්මකැයි හඳුන්වනු ලබන තර්කය ද කරුණු විකෘත කිරීමකි. ආත්මය සරල, අරූපී, විනාශ කළ නොහැකි පදාර්ථයක් හෙයින් මරණින් පසු උච්ඡේදයට යතැයි සිතිය නොහැකි බව පදනම් කරගෙන නඟන සත්භාව තර්කය ද පාරමනෝ පදාර්ථ පිළිබඳව වැරදි මතයක් ඉදිරිපත් කිරීමකි. එය ආධ්‍යාත්මවාදී භ්‍රමයකි. මේවා සහ මෙබඳු වෙනත් තර්ක සියල්ල ම ඉකුත් දශක දෙක තුන තුළ විද්‍යාත්මක විචාරය විසින් මුළු මනින්ම බිඳහෙළා අවසානය."

මේ භවයෙන් ඊළඟ භවයට සංක්‍රමණය වන ආත්මයක් හෝ ජීවයක් නැත්නම් පුනර්භවයක් ලබන්නේ කුමක් ද? මේ ප්‍රශ්නය අසන්නේ පුනර්භවය වීමට යමක් තිබිය යුතු යැයි කල් තබා ම තීරණය කර ගැනීමෙනි. සියවස් කිහිපයකට පෙර එක් චින්තකයෙක් "මම සිතමි. ඒ නිසා මම සිටිමි "යි පැවසී ය. මෙසේ කියනවිට සිතන්නට 'මම' කෙනකු සිටින බව මුලින් ම සනාථ කළ යුතුව තිබේ. නැගෙනහිරින් නැඟෙන හිරු බටහිරින් බැස යතැයි අපි කියමු. එහෙත් හිරු නඟින්නේවත් බසින්නේවත් නැති බව අපි හොඳ හැටි දනිමු. එමෙන් ම එක් අයෙකුට දෙවරක් එකම දේකට තට්ටු කළ නො හැක. එම දෙය පෙනුමට එක සේ දිස් වුව ද ඊළඟ මොහොත වන විට වෙනසකට පත්වන හෙයිනි. ලොව සියල්ල වහ වහා වෙනස් වෙයි. කිසිවක් එකම ස්වරූපයෙන් දෙමොහොතක් පවතින්නේ නැත."ඊයේ සිටි මම අද සිටින මට සමාන පුද්ගලයෙකි යි සිතුමට යම් හේතුවක් තිබිය යුතු ය. වඩාත් පැහැදිලි නිදසුනක් ගනිතොත් මා මිනිසකු දිස්වන මොහොතේ ම ඔහු ගේ කට හඬ ද ඇසේ නම් මා දකින, අසන දෙයෙහි යම් අරුතක් තිබේ" යයි පවසන දාර්ශනිකයා සමග බෞද්ධයනට එකඟ විය හැකි ය. බ්‍රහ්ම ආත්ම දමනට කළ පුද්ගයා ගේ ජයග්‍රහණය වෙනස් කිරීමට බ්‍රහ්මයෙක්වත් සමත් නො වන බව මේ ගාථාවෙහි දැක්වෙයි. මෙහි බ්‍රහ්මයා නම් මැවුම් කරුවකු සේ බ්‍රාහ්මණ ආගමෙහි පිළිගැනෙන බ්‍රහ්ම නොව බ්‍රහ්මකායික දෙවියෝ වෙති.

බ්‍රහ්මකායික දෙවියෝ නම්, ප්‍රථම ධ්‍යානය ලබන්නවුන් මිය ගොස් උපදින රූප ලෝක අතුරින් ප්‍රථම ලෝක තුනෙහි වාසය කරන දෙවිවරු වෙති. මේ දිව්‍ය ලෝක වල උත්තරීතර පාලකයා මහා බ්‍රහ්මයා ය. ඔහු "මම බ්‍රහ්මයා වෙමි, මහා බ්‍රහ්මයා වෙමි, සියල්ල අභිභවා සිටිමි. කිසිවකුට මා අභිභවනය කළ නො හැක. සර්වඥ වෙමි. පාලකයා වෙමි. නායකයා වෙමි ලොව මැවූ නිර්මාතෘ වෙමි. සියළු අයුරින් ම පරිපූර්ණ වෙමි. ලොව රකිමි. පරිපාලනය කරමි. ලොව උපන් හා උපදින සියල්ලන් ගේ පියා වෙමි" යන ව්‍යාජ දෘෂ්ටිය ( ඔහුට මුල අමතක වීම නිසා) ප්‍රකාශ කළ බව දීඝනිකායෙහි එක් සූත්‍රයක අවඥ ස්වරයෙන් දක්වා ඇත. බ්‍රහ්ම ලෝකය නම් පුළුල් අරුතින් ගන්නා විට සියළු රූප හා අරූප ලෝක වලට නමකි. පටු අරුතින් ගත් විට ප්‍රථම රූප ලෝකත්‍රය මින් ගැනෙයි. බ්‍රහ්මයෝ ද දේව කොට්ඨාශයක් ම වෙති. දේව (බබලන්නෝ, ලතින් බසින් deus ) දිව්‍ය ලෝකවල වාසය කරන සැප සම්පතින් පොහොසත් සත්ත්වයෝ දෙවි වරුය. ඔවුහු මනුෂ්‍යයන් ගේ පියවි නෙතට දෘශ්‍යමාන නො වෙති. මිනිසුන් මෙන් ම දෙවියෝ ද ජාති- ජරා- මරණ සංසාරයෙහි ම සංචරණය කරන සත්වයෝ ය. එහෙයින් යථාර්ථ වශයෙන් දුකින් නො මිදුණෝ ය. පින් ඇතිතෙක් දෙව්ලොව සැප විඳින සත්ත්වයෝ නැවත සැප අඩු ලෝකවල උත්පත්තිය ලබති. දෙවිවරු වර්ග කිහිපයකට අයත් වෙති.

(1) **කාමාවචර** හෙවත් කාම ලෝක වල වාසය කරන දෙවි වරු වර්ග පහකට අයත් වෙති. එනම්, **චාතුම්මහාරාජික**, **තාවතිංස**, **යාම**, **තුසිත**, **නිම්මාණරති** හා **පරනිම්මිත වසවත්ති** ය.

(2) **රූපාවචර** හෙවත් රූප ලෝකවල වසන දෙවිවරු දොළොස් වර්ගයකි. ඔවුහු මෙසේ ගණ හතරකින් දැක්වෙති.

1. **බ්‍රහ්ම පාරිසජ්ජ**, **බ්‍රහ්ම පුරෝහිත**, **මහා බ්‍රහ්ම**, ප්‍රථම ධ්‍යානය අල්ප වශයෙන්, මධ්‍ය වශයෙන් හෝ පූර්ණ වශයෙන් වැඩූ තැනැත්තෝ මේ බ්‍රහ්ම ලෝක වල උපදිති.

2. **පරිත්තාභ**, **අප්පමණාභ**, **ආභස්සර** ද්විතීය ධ්‍යානය වර්ධනය කළෝ මේවායේ උත්පත්තිය ලබති.

3. **පරිත්ත සුභ**, **අප්පමාණ සුභ**, **සුභ කිණ්ණ** ( **සුභ කිණ්හ** ) තෘතීය ධ්‍යානය ලද්දෝ මෙම බ්‍රහ්ම ලෝක වල උපදිති.

4. **වෙහප්ඵල**, **අසඤ්ඤ සත්ත**, සුද්ධාවාස ප්‍රථම දෙකෙහි චතුර්ථ ධ්‍යානය ලද්දෝ උපදිති. තුන්වැන්නෙහි උත්පත්තිය ලබන්නේ අනාගාමී ඵලය ලත් අය පමණි.

(3) **අරූපාවචර** හෙවත් අරූප ලෝකවල උපදින දෙවියෝ නම්, ආකාසානඤ්චායතනූපග දෙවිවරු, විඤ්ඤාණඤ්චාය තනූපග දෙවිවරු, ආකිඤ්චඤ්ඤායතනූපග දෙවිවරු, නේවසඤ්ඤනා සඤ්ඤායතනූපග දෙවිවරු ය. ඒ නම් වලින් හැඳින්වෙන සතර අරූප ධ්‍යාන ලද්දෝ පිළිවෙලින් මේ අරූප ලෝකවල පුනර්ජන්මය ලබති.



*අවුරුදු සියයක් මුළුල්ලෙහි පුහුදුනට දෙන දනට වඩා අරිය පුගුලෙකුට මොහොතක් පිදීම උතුම් ය.*

106. මාසෙ මාසෙ සහස්සේන
යො යජේථ සතං සමං
එකඤ්ච භාවිතත්තානං
මුහුත්තං අපි පූජයෙ
සායෙව පූජනා සෙය්‍යො
යං චෙ වස්සසතං හුතං (8:7)

මාස්පතා සියක් වසක්
වැය කර කහවණු දහසක්
යාග කළත් දහස් වරක්
නැත ඉන් සිදුවන්නෙ පලක්
සොයා උතුම් රහත් නමක්
කළොත් එකම පූජාවක්
අගේය ඒ එක් මොහොතක්
හෝම පිදූ සිය වසරක්

# හොඳම පිදුම

## 8 (5) සැරියුත් හිමියන් ගේ මාමා (106 ගාථාව)

රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ සාරිපුත්ත මහ රහතන් වහන්සේ ගේ මාමා වූ **බ්‍රාහ්මණයකු** අරබයා මේ ගාථාව දේශනා කොට වදාළ සේක.

සැරියුත් හිමියෝ දිනක් තම මාමා හමුවන්නට ගොස් මෙසේ විමසූ හ.

"බ්‍රාහ්මණය, ඔබ ඉඳ හිට වත් පුණ්‍ය කර්මයක් කරන්නේ නැත්ද?"

"මම කරනවා ස්වාමීනි "

"මොනවා ද ඔබ කරන පින්කම්?"

"මාස් පතා මම දහස බැගින් වියදම් කර දන් දෙනවා"
"කාටද දෙන්නේ?"

"නග්න පරිබ්‍රාජකයන්ට යි ස්වාමීනි"

"ඉතින් ඒ දීමෙන් ඔබ බලාපොරොත්තු වන්නේ මොන විදියේ ආනිසංසයක් ද?"

"බ්‍රහ්ම ලෝකයේ උපදින්නයි ප්‍රාර්ථනාව"

"ඉතින් බ්‍රහ්ම ලෝකයේ උපදින්න මාර්ගය ඕක ද?"
"එහෙමයි"

"කවුද එහෙම කියන්නේ?"

"ස්වාමීනි, මගේ ගුරුවරු එහෙම කියනවා"

"බ්‍රාහ්මණය, ඔබවත් ඔබේ ගුරුවරුවත් බ්‍රහ්ම ලෝකයේ උපදින විදිය දන්නේ නැහැ. ඒ විදිය දන්නේ බුදු රජාණන් වහන්සේ පමණයි. එන්න මාත් එක්ක. මම බුදු රජාණන් වහන්සේට ආරාධනා කරන්නම් ඔබට බ්‍රහ්ම ලෝකයේ උපදින මාර්ගය දේශනා කරන්න කියලා." මෙසේ පැවසූ සාරිපුත්ත හිමියෝ තම මාමා තථාගතයන් වහන්සේ හමුවට කැඳවා ගෙන ගියහ.

"ස්වාමීනි, මේ බ්‍රාහ්මණයා බ්‍රහ්ම ලෝකයේ උපදින්නට හිතාගෙන මාස්පතා දහසක් වියදම් කර නග්න පරිබ්‍රාජකයනට දන් දෙනවා. " යාග හෝම කරනවා. මොහුට අනුකම්පා කර බඹ ලොව උපදින ක්‍රමය පැහැදිලි කර දෙනු මැනවි " යි ආරාධනය කළ හ.

"බ්‍රාහ්මණය, ඔබ මෙවැනි දන්දීම් අවුරුදු සීයක් කළත් ඊට වඩා ඉඳුරන් දමනය කළ කෙළෙසුන් දුරු කළ උතුමකුට එක මොහොතක් ගරු සත්කාර කළොත් වටිනවා " යි පැවසූ භාග්‍යවතුන් වහන්සේ ඔහුට ධර්ම දේශනා කළ හ.

### විස්තරාත්මක අනුවාදය (107 ගාථාව)

**යො මාසෙ මාසෙ සහස්සේන සතං සමං යජෙථ**
**භාවිතත්තානං එකං ච මුහුත්තං අපි පූජයෙ චෙ**
**වස්සසතං යං හුතං සා පූජනා යෙව සෙය්‍යො.**

**යො**: යම්කිසි පුද්ගලයෙක්; **මාසෙ මාසෙ**: මාසයක් මාසයක් පාසා; **සහස්සේන**: දහසක් වියදම් කර; **සතං සමං**: අවුරුදු සියයක්; **යජෙථ**: යාග කරනු ඇත; **භාවිතත්තානං**: තමා දමනය කරගත් උතුමකුට (රහතන් වහන්සේ නමකට); **එකං ච මුහුත්තං අපි**: එක් මොහොතක් වුව ද; **පූජයෙ**: පූජා සත්කාර කරන්නේ නම්; **වස්ස සතං**: අවුරුදු සියයක්; **හුතං**: කළ යාගයන්ට වඩා; **සා පූජනා යෙව**: එම පිදුම ම; **සෙය්‍යො**: ශ්‍රේෂ්ඨ ය.

යම් අයකු මාසයකට වරක් දහස බැගින් වියදම් කර වර්ෂ සියයක් යාග කළ හැකි ය. එසේ අවුරුදු සියයක් කරන යාගයට වඩා ඉඳුරන් දමනය කර ගත් උත්තමයකුට එක් මොහොතක් ගරු සත්කාර කරන්නේ නම් එය ශ්‍රේෂ්ඨ ය.

### විවරණය

**යජෙථ**: **හුතං**: මේ වචන දෙකින් ප්‍රාග් බෞද්ධ යුගයේ (වෛදික යුගයේ පටන්) භාරතයේ ක්‍රියාත්මක වූ යාග- හෝම සංස්කෘතිය අදහස් වෙයි. දෙවියන් අරමුණු කර ගෙන යාග ද්‍රව්‍ය සූදානම් කර මන්ත්‍ර හා ස්තෝත්‍ර ගායනා කර ඒවා ගින්නට දැමීම ඒවායේ මූලික ලක්ෂණය වූයේ ය.





*අවුරුදු සියයක් මුළුල්ලෙහි පුහුදුනට දෙන දනට වඩා අරිය පුගුලෙකුට මොහොතක් පිදීි උතුම් ය.*

107. යො ච වස්සසතං ජන්තු
අග්ගිං පරිචරෙ වනෙ
එකඤ්ච භාවිතත්තානං
මුහුත්තමපි පූජයේ
සායෙව පූජනා සෙය්‍යො
යඤ්චෙ වස්සසතං හුතං (8:8)

ගිනි පුද ගාණේ දවසක්
කළමුත් අවුරුදු සියයක්
පුද කළ හොත් එක මොහොතක්
හමුව උතුම් රහත් නමක්
එබඳු එකම පූජාවක්
ගිනි පුදයට වැඩි අගයක්

# රහතුන් වැන්දොත් මොහොතක් - අත් වෙයි ඉන් වැඩි කුසලක්

## 8 (6) සැරියුත් හිමියන් ගේ බෑණා ( 107 ගාථාව )

වේළුවනාරාමයෙහි වැඩ වාසය කළ භාග්‍යවතුන් වහන්සේ සාරිපුත්ත මහ රහතන් වහන්සේ ගේ **බෑණා නුවන්** අරබයා මේ ගාථා ධර්මය දේශනා කොට වදාළ සේක.

තම බෑණා වූ බ්‍රාහ්මණයකු වෙතට වැඩම කළ සැරියුත් මහ තෙරණුවෝ ඔහු ගෙන් මෙසේ ප්‍රශ්න කළ හ.

"බ්‍රාහ්මණය, ඉඳ හිට හෝ ඔබ යම් කුසල කර්මයක් කරන්නේ නැත්ද?"

"කරනවා ස්වාමීනී"

"මොන විදියේ පින්කමක් ද ඔබ කරන්නේ?"

"මසකට වරක් මම සතකු මරා යාග කරනවා"

"මොන බලාපොරොත්තුවක් ඇතිව ද ඔබ එසේ කරන්නේ?"

"ඒ තමයි බ්‍රහ්ම ලෝකයේ උපදින්නට ඇති මාර්ගය ස්වාමීනී"

"කවුද එහෙම කියන්නේ?"

"මගේ ගුරුවරු"

"ඔබවත් ඔබේ ගුරුවරුන් බ්‍රහ්ම ලෝකයේ උපදින්නට ඇති මග දන්නේ නැහැ. එය බුදු රජාණන් වහන්සේ දන්නවා. එන්න, මාත් එක්ක. එය බුදු රජාණන් වහන්සේ ඔබට පැහැදිලි කරයි."

ඒ අනුව බ්‍රාහ්මණතෙම සැරියුත් හිමියන් සමග බුදුරජාණන් වහන්සේ බැහැදකින්නට ගිය හ.

"ස්වාමීනි, මේ මගේ බෑණාට බ්‍රහ්ම ලෝකයේ ඉපදීමට අදාළ පිළිවෙත පැහැදිලි කර දෙනු මැනවි" යි සැරියුත් හිමියෝ ඇරයුම් කළ හ.

ඔහු අමතා ධර්මදේශනා කළ භාග්‍යවතුන් වහන්සේ වසර සියයක් ගිනි පුද කළ ද එක් මොහොතක් කෙළෙසුන් දුරු කළ උතුමකු පිදීම තරම් නො අගින බව හෙළි කරමින් මේ ගාථාව දේශනා කර වදාළ සේක.

**විස්තරාත්මක අනුවාදය (107 ගාථාව)**

**යො ජන්තු වනෙ වෙ වස්ස සතං අග්ගිං පරිචරෙ**
**භාවිතත්තානං එකං මුහුත්තං අපි පූජයෙ වස්ස සතං**
**යං හුතං සා පූජනා එව සෙය්‍යො.**

**යො ජන්තු**: යම් කිසි පුද්ගලයෙක්; **වනෙ**: වනගතව; **වෙ**: ඉදින්; **වස්ස සතං**: වසර සියයක්; **අග්ගිං පරිචරෙ**: ගිනි පුජා කරන්නේ ද; **භාවිතත්තානං**: රහතන් වහන්සේලාට; **එකං මුහුත්තං අපි**: එක මොහොතක් පමණක් වත්; **පූජයෙ**: පූජා කළේ නම්; **වස්සසතං**: අවුරුදු සියයක්; **යං හුතං**: යම් යාග හෝ ගිනි පූජා කළේ ද (ඊට වඩා); **සා පූජනා එව**: එම පූජාව ම; **සෙය්‍යො**: ශ්‍රේෂ්ඨ ය.

යම්කිසි පුද්ගලයෙක් වනගතව අවුරුදු සියයක් ගිනි දෙවියන් පිදූ නමුත්, කෙළෙසුන්ගෙන් මිදුණු මහ රහතන් වහන්සේ නමකට එක් මොහොතක් පූජා කිරීම එම සියවසේ ම කළ පූජා වලට වඩා අගියි.

**විවරණය**

**අග්ගිං පරිචරෙ වනෙ**: ගිනි පුද අතුරින් මෙහි වනගතව ගිනි පිදීම ගැන සඳහන් වෙයි. වන ගතව ගිනි පුදන්නේ බ්‍රාහ්මණයන් ගේ ජීවිත අවස්ථා හෙවත් ආශ්‍රම වලින් තුන්වන ආශ්‍රමය වූ වානප්‍රස්ථ තත්වයට පත් වූ අයයි. ගිහි ජීවිතයේ සුව අත හැර මහළු වයසේ දී වන ගතවන බ්‍රාහ්මණයෝ ගිනි පුදමින් ජීවත් වෙති. බ්‍රාහ්මණික විශ්වාසය අනුව ගින්න දෙවි කෙනෙකි. එමෙන් ම අන්‍ය දෙවියන් වෙත පූජාවස්තු රැගෙන යන පුරෝහිතයා වශයෙන් සලකනු ලබන්නේ ද ගින්නයි. ගින්නට ගිතෙල් ආදී පූජා වස්තු පිරිනමන විට ගිනි දැල්ල උඩට නැගෙන ආකාරය බමුණන් දකින්නේ ගිනි දෙවියන් පූජාව දැතින් ම පිළිගන්නා විලාසයක් සේ ය.

ගිනි පිදීම හුදෙක් සම්පත් විනාශයක් පමණි. බුදු සමය එය නිසරු ක්‍රියාවක් ලෙස හඳුන්වයි. විමුක්තිය සඳහා අවශ්‍යවන්නේ කෙළෙසුන් දවා හැරීම මිස ගිතෙල්, මීපැණි, උක් හකුරු වැනි ප්‍රණීත භෝජන හෝ අහිංසක සතුන් ගේ සිරුරු දැවීම නොවේ. බ්‍රහ්ම ලෝකයෙහි උපදින්නට මෙවන් ක්‍රියා කිසිසේත් ප්‍රයෝජනවත් නොවන බව භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දුන්හ.





*ලොව කුඩාදන් හා මහදන් පිදීමට වඩා ආර්ය පුද්ගලයකුට කළ වැඳීමම ඉතා උතුම්ය.*

108. යං කිඤ්චි යිට්ඨං ච හුතං ච ලොකෙ
සංවච්ඡරං යජෙථ පුඤ්ඤපෙක්ඛො
සබ්බම්පි තං න චතුභාග' මෙති
අභිවාදනා උජ්ජුගතෙසු සෙය්‍යො (8:9)

සුලු දන් මහ දන් නිතර පුදන්නේ
අවුරුද්දක් වුව නොකඩ කරන්නේ
අරි උතුමකුට වැඳි පමණින්නේ
අත් වූ පිනමය වඩා වටින්නේ

# ආර්ය පුද්ගලයකුට වැඳීම පවා උතුම්ය

## 8 (7) සැරියුත් මහතෙරුන් වහන්සේගේ යහළු බමුණු (ගාථා අංකය 108)

රජගහ නුවර වේළුවන වෙහෙර වැඩ සිටි සැරියුත් මහතෙරහු සිය (උපතිස්ස නම් මහබමුණු) ගමට වැඩි සේක. ඒ දවස එහි බමුණන්ගේ පුද සිරිත් පැවැත්වෙන දිනයකි. බඹලෝ සැප පතා නිවටුන්ට මහදන් දෙමින් උන්හ. ගවයන් ආදී සතුන් මරා කරන පිදීම්ද ගිනිදෙවි පිදීම්ද සිදුකළහ. ගිනි දෙවි පුදන **එක් බමුණෙක්** සැරියුත් මහ තෙරුන්ට හිත මිතුරුව සිටියේය.

ඒ ගිහිගෙය කුමරවියේ සිට ඇති වූ මිතුරු දහමෙකි. ඔහු තෙරුන්ගේ ගුණද උසස් කමද දනී. එහෙයින් සියනිවසට වැඩි තෙරුනට බොහෝ බුහුමන් කොට පිළිගෙන වඩා හිඳුවා පිළිසඳර පැවැත්වීමෙහි යෙදුන බමුණාගේ සතුට කෙමෙන් වැඩී ගියේය.

සැරියුත් තෙරණුවෝ යහළු බමුණා අමතා "බමුණ, පින් කරවුදැ"යි ඇසීය.

යහළු බමුණ. "එසේය, පින් කරමි ස්වාමීනි"යි පිළිතුරු දුන්නේය.

සැරියුත් තෙරුන් වහන්සේ "ඒ කුමන පිනක්දැ"යි යළිත් ඇසූහ.

යහළු බමුණා "බඹලෝ සැප පතා බොහෝ වියදම් කොට යාග (පුද) පවත්වමි"යි කීය.

සැරියුත් තෙරණුවෝ "බඹලෝ සැප ලබනු තබා බඹලෝ යන මං වත් නොදන්නෙ"හි යයි පවසා  දහම් දෙසූ සේක.

සැරියුත් මහතෙරුන්ගේ දෙසුමට පැහැදුණු ඒ බමුණා කැඳවාගෙන වෙහෙරට වැඩමවා බුදුරදුන් හමුවේ බමුණාගේ අදහස පැවසීය.

ඒ නිමිතිකොට "ලොව පින් කැමැති යමෙක් කුඩා දනක් හෝ මහ දනක් හෝ අවුරුදු සියයක් මුළුල්ලෙහි පිදූයේ නමුදු ඒ සියල්ල සෝවාන් ආදී මඟ-පලවලට පැමිණි අරිය පුද්ගලයෙකුට කළ වැඳීමෙන් උපදනා කුසල් සිතින් සතරෙන් පංගුවක් පමණ වත් නොවටනා බවද, අරිය පුගුලෙකුට කළ වැඳීම ම ඉතා උතුම් බව"ද වදාරා ඒ බමුණා සෝවාන් පලයෙහි පිහිට වූ සේක.

### විස්තරාත්මක අනුවාදය (108 ගාථාව)

**ලොක පුඤ්ඤපෙක්ඛො යං කිඤ්චි යිට්ඨං වා හුතං වා සංවච්ඡරං යජෙථ, තං සබ්බං අපි චතුභාගමෙති (චතුභාගං + එති) චතුභාගං න එති, උජ්ජුගතෙසු අභිවාදනා සෙය්‍යො**

**ලොකෙ**: මේ සත්ත්ව ලෝකයෙහි; **පුඤ්ඤපෙක්ඛො**: පින් කරනු කැමති තැනැත්තේ; **යංකිඤ්චි යිට්ඨං වා හුතං වා**: මංගලාදී අවස්ථාවන්හි දෙන යම් දාන වස්තුවක් හෝ කම්පල අදහා දෙන මහ දනක් හෝ; **සංවච්ඡරං යජෙථ**: අවුරුද්දක් මුළුල්ලෙහි (මුළු සක්වළ මහා ජනයා හට නිරන්තරයෙන්) දුන්නේ වී නමුදු; **තං සබ්බං අපි**: ඒ සියලු දානයම; **න චතුභාගමේති**: (**චතුභාගං න එති**) සෝවාන් ආදී ආර්‍ය පුද්ගලයකු උදෙසා දුන් දීමනාවෙහි සතරෙන් කොටසකුදු නො අගනේය; **උජ්ජුගතේසු**: කායවඞ්කාදිය රහිත හෙයින් ඍජු බවට පැමිණි සෝවාන් ආදි ආර්‍ය පුද්ගලයන් උදෙසා කරන ලද; **අභිවාදනා සෙය්‍යො**: වන්දනාවම උතුම් වේ.

ලොව පින් කැමැතියෙක් සියක් වසක් දෙන දන ආර්ය පුද්ගලයෙකුට වැඳීමෙන් ලැබෙන පිනෙන් සතරෙන් එකක් පමණවත් නොඅගී.

### විවරණය

**පුඤ්ඤපෙක්ඛො**: පින් රැස් කිරීමෙහි ආසා ඇත්තාය. පරලොව සැප කැමැති ව මෙලොවෙහි කුසල් රැස්කරනු කැමැති පුද්ගලයාය.

**යිට්ඨං**: කුඩා දන්ය. මඟුල් අවමඟුල් ඈ කිසි දැයක් නිමිතිකොට දියුණුව සඳහා සුලු වශයෙන් පැවැත් වෙන දන්ය.

**හුතං**: මහදන්ය. වෙසෙසින් කම්පල අදහා බොහෝ වියදම් කොට උසස් ලෙස පැවැත්වෙන විසාල දන් දීම්ය.

**සංවච්ඡරං යජෙථ**: අවුරුද්දක් මුළුදා (නොකඩවා) පිදීමය. මුළු සක්වලම පුරවා අවුරුද්ද මුළුදා පුහුදුන් පුද්ගලයන්ට කරන පිදීමය.

**චතුභාගං න ඒති**:  සතරෙන් කොටසක් පමණට වත් නොපැමිනි මය. කෙලෙසුන්ගෙන් මිදුණු අරිය පුද්ගලයෙකුට වැඳීමෙන් ලැබෙන කුසලය සතරට බෙදා ඉන් කොටසක් පමණ වත් නො අගනා බව දැක්වීමය.

**උජ්ජුගතේසු**: උජු (ඇදනැති) බවට පැමිණිය වුන් කෙරෙහිය. නිකෙලෙස් වු එතුමන්ගේ කය හෝ පැවසෙන බස හෝ සිතෙන දැය හෝ ඇද නැත්තේය.





*සිල්වතුන්ට හා වැඩිහිටියනට පුදන තැනැත්තාගේ ආයුෂ පැහැය සැප හා බලය යන සිවු ගුණ වැඩේ.*

109. අභිවාදන සීලිස්ස
නිච්චං වද්ධාපචායිනො
චත්තාරො ධම්මා වඩ්ඪන්ති
ආයු වණ්ණො සුඛං බලං (8:10)

සිල්වතුන් හා වැඩිහිටි යන්නේ
ගුණය උතුම් වැඳුමෙන් පින් වන්නේ
ආයු පැහැය බලද ලැබෙ න්නේ
ඒකයි වැඩිහිටියන්ට වඳින්නේ

# ආයු පැහැ සැප බල වැඩෙන පින්කම්

## 8 (8) ආයුවඩ්ඪන කුමරු (ගාථා අංකය 109)

දීඝලම්බික නුවර වැසි **බමුණෙක්** තපස් රැකීමට වනවැද අටසාළිස් වසක් තපස් වත රැඳීසිට පසුව කුලය නැසුනොත් පරපුරට වන හානිය සලකා තපස හැර ගොස් බිරිඳක් සරණ කර ගත්තේය.

දරුවෙක් ලැබුණු පසු ඒ බමුණු-බැමිණි දෙදෙනා කුඩා පුතුද සමග දීඝලම්බික නුවර ඇසුරු කොට වන කුටියෙක්හි වැඩ වෙසෙන බුදුරදුන් වෙත එළඹ වැඳ සිටියහ. බුදුරදහු "( දීඝායුක හොථ ) බොහෝ ආයු විඳුවවු"යි වදාළ සේක. ඔවුන් එයට කරුණු විමසූ කළ "මේ ළදරුවාට උවදුරක් ඇත. ආයු සත් දවසෙකැ"යි වදාළ පසු දෙමාපියෝ තැතිගෙන කඳුලෙන් පිරුණු නෙත් ඇත්තෝ වූහ.

ඔවුහු "බුදුරදුන් වහන්ස ඒ උවදුර වැළකුමට උවදෙසක් වේ නම් වදාළ මැනැවැ" යි අයදියහ. "එසේ නම් සිය ගෙදොර මණ්ඩපයක් තනා එහි අසුන් පනවා සඟුන් වහන්දෑ අට නමක් හෝ සොළොස් නමක් වඩා හිඳුවා සතියක් මුළුල්ලෙහි නොකඩවා පිරිත් දෙසුම් පවත්වා ඒ උවදුරු දුරු කැර ගන්න"යි  වදාළ සේක. බමුණා විගස ගෙදොර පිරිසිදු කරවා මණ්ඩප තනා සියලු කටයුතු නිමවා සඟුන් වැඩමවා පුතු ද පසෙක බිම හොවා සතියක් මුළු දා නොකඩවා පිරිත් දෙසුම් කැරැවීය. සත්වන දවස බුදුරජාණන් වහන්සේද වැඩම කළසේක. එහෙයින් දෙවියන්ගේ පැමිණීමද ඇතිවිය. බෙහෙවින් සෙත සැලසුණෝය. ඒ කුමරු උතුරු දිගට අධිපති වෙසවුණු රජුගේ නියමය පරිදි අවරුද්ධ නම් යකුට බිලිව සිටියේය.

පිරිත් දෙසුමේ අනුහසින් සෙත සැලසී ඔහුට ආයු වැඩුණෝය. තුනුරුවන් ගේ පිහිට ලැබිණි. දෙවියන් ගේ රැකවල් ඇතිවිය. එහෙයින් වෙසවුණු රජුගේ නියමය වැරැදුණෝය. අවරුද්ධ යකුගේ බිලි වැළකුණෝය. අනතුරුව ඒ ළදරුවන් ලවා බුදුරදුන් වැන්ද වූහ. බුදුරදුහු 'දීඝායුකො හොථ' (බොහෝ ආයු විඳුව) යි වදාළ සේක. එක්සිය විසි අවුරුද්දක් ආයු වැඩුණෝය. ඒ කුමරු ආයුවඩ්ඪන නමින් පසිඳුවිය. ඒ නිමිති කොට 'නිතර සිල්වතුන්ට වඳින වැඩිහිටියනට පුදන තැනැත්තාගේ ආයු හා සිරුරු පැහැය ද සැපය ද කාය බල හා නැණ බලද වැඩෙන බැව්' වදාළ සේක.

**විස්තරාත්මක අනුවාදය (109 ගාථාව)**

**අභිවාදන සීලිස්ස නිච්චං වද්ධාපචායිනො ආයු වණ්ණො සුඛං බලං චත්තරෝ ධම්මා වඩ්ඪන්ති.**

**අභිවාදනසීලිස්ස**: (සිල්වතුන්හට) වඳින්නා වූ; **නිච්චං වද්ධාපචායිනෝ**: නිතර ගුණයෙන් වැඩි සිටියවුන් පුදන්නහු ගේ; **ආයු**: ජීවිතේන්ද්‍රියයාගේ පැවැත්ම; **වණ්ණෝ**: ඡවිගත වර්ණය; **සුඛං**: සිත කය දෙක්හි සුවය; **බලං**: කාය ශක්තිය හා ඥාන ශක්තිය (යන); **චත්තරෝ ධම්මා වඩ්ඪන්ති**: (මේ) සතර ගුණයෝ වැඩෙන්නාහුය.

නිතොර සිල්වතුන් වඳිනා සුලුවූ ද ගුණයෙන් වැඩිහිටියන් පුදන සුලු වූද පුද්ගලයාගේ ආයුෂය, වර්ණය, සැපය, බලය යන කරුණු සතරක් වැඩේ.

**විවරණය**

**ආයු**: ආයුගුණය අතුරු අනතුරුවලින් වැළකී ආයුවඩ්ඪන කුමරුට මෙන් අවුරුදු සිය ගණන් ආයු විඳීමට ලැබීමය.

**වණ්ණෝ**: පැහැ ගුණය මනා සුව පහස් එළවමින් සොම්නසින් යුතුව නිදුකින් කය-සිත දෙක වැඩීමය.

**බලං**: බල ගුණය. කය පෙළීම් සිත පෙළීම් රහත්ව කය බල ඥාණ බල දෙකින් මොනවට වැඩීමය. පැවිදි වූ තැන් පටන් ළදරු හෙරණුවෝ වුවද ගිහියනට සිල්වත්හුය. ගුණවත්හුය. මවුපියන් විසින් පවා වැඳීමට පිදීමට සුදුස්සෝය. පැවිද්දනට (වයස් පිළිවෙළින්) පැවිදි වූ තැන් සිට හෝ උපසපුව වැඳීම් වැඩිහිටියනට පිදීම් කරන්නාහු අතුරු අනතුරුවලින් වැළකී බොහෝ ආයු විඳ ඉතිරි ගුණ නැණ ද දියුණුව යසසින් සැපතින් වැඩෙති.





*දුශ්ශිලයෙක් ව සියක් වසක් ජිවත් වීමට වඩා සිල්වත්  ව එක දවසක් ජීවත්වීම උතුම්ය.*

110. යො වෙ වස්සසතං ජීවෙ
දුස්සීලො අසමාහිතො
එකා'හං ජීවිතං සෙය්‍යො
සීලවන්තස්ස ඣායිනො (8:11)

දුසිල්ව අසමාහිත සිත් වන්නේ
සියක් වසර ගෙව්වත් නොව ටින්නේ
නැණවත් වී හිඳ දැහැන් වඩන්නේ
දවසක් මුත් එය තමයි වටින්නේ

# දුසිල්වත්ව සිටීමට වඩා සිල්වත්ව ජීවත්වීම උතුම්ය.

## 8 (9) සංකිච්ච රහත් හෙරණපාණන් වහන්සේ (ගාථා අංකය 110)

සැවැත් නුවර උසස් කුල තිහකින් **කුමරහු තිස් දෙනෙක්** පැවිදිවූහ. පිළිවෙත් පිරීමෙහි නියැලුණු ඒ තිස් නමට විදසුන් වැඩීමට සිත් පහළ විය.

ඔවුන් බුදුරදුන් වෙතින් කමටහන් (භාවනාවට අරමුණු පිළිවෙත්) උගෙන වනයට යාමට පිළිවෙළ වූහ. බුදුරදහු ඒ තිස් නම වැඩමවන පෙදෙස උවදුරක තතු දැන ඒ වළකනු සඳහා සංකිච්ච රහත් හෙරණුන් සමඟ යාමට සැලසූහ. ඒ එක් තිස් නම සාරසිය අසූගව්වක් මග ගෙවා පසල් (පිටිසර) ගමකට වැඩියහ. ඒ ගම්වැස්සෝ ඔවුනට උවටැන් කොට විසීමට සෙනසුන් සලසා පිදූහ. විදසුන් වඩා වෙසෙන උන්වහන්සේලාට රසවත් අහර සුලභව ලැබිණි.

එක් සිඟන මිනිසෙක් එහි පැමිණ කුස පුරා අහාර ගනිමින් 'අනේ' රෑ දාවල් වැඩ කරන අයට මෙබඳු රසවත් අහරෙක් නැත. මේ හාමුදුරුවරුන් සැමදාම මෙසේ වළඳති"යි සිතුයේය. ඔහු එහි කලක් නැවතී වැඩුණු සිරුරැතිව මහ වනයට වැද යන කල පන්සියයක් පමණ සොරන්ට අසුවිය. සොරු ඔහු මරා වන දෙවියනට බිලි පිදුමට සැරසුණහ. එකල ඒ මිනිසා "පින්වත්නි, මා සිඟන්නෙකි, මා බිලි පූජාවට නුසුදුසුය. වන දෙවියන් සතුටු කළ නොහැකිය. අසුවල් තැන සඟහු වෙසෙති. ඔවුන් බිලි පූජාවට ඉතා උතුම්ය"යි කීයේය. සොරදෙටුහු එබඳු කෙනෙක් වෙත් නම් බිලි පිදුමට අගනේය"යි සිතා සිඟන්නාගෙන් මං අසා ගොස් එක නමක් ගෙනයාමට තැත් කළහ.

සංකිච්ච හෙරණුවෝ ඒ බිලි පූජාවට දිවි දීමට වැඩියහ. සොර දෙටු බිලියට හෙරණුන්ගේ දිවි නැසීමට සූදානම් විය. එවේලෙහි උන්වහන්සේ සමවතට සමවැදුණාය. සොර දෙටු කඩුව හයා (ඇද) ගෙලට ගැසීය. කඩුව මිට දක්වා හැකුළුණෝය. සොරු පන් සියයම පුදුමයට පැමිණ "අහෝ සිත් පිත් නැති මේ කඩුව පවා මුන් වහන්සේගේ ගුණ දනිති"යි පැහැද ඒ හෙරණුන් වෙතම පැවිදි වූහ. පසුව බුදුරදුන් වෙත පැමිණි කල්හි ඒ නිමිති කෙට "දුසිල් වූ එකඟ වූ සිත් නැති යමෙක් සියක් වසක් ජිවත් වීමට වඩා දැහැනයෙහි ඇලුණු සිල්වත් තැනැත්තා ගේ එක දවසකුදු ජීවත් වීම උතුම්"යයි වදාරා ඒ සියලු දෙන රහත් පලයෙහි පිහිටවූ සේක.

**විස්තරාත්මක අනුවාදය (110 ගාථාව)**

**දුස්සීලො අසමාහිතො යො වෙ වස්සසතං ජීවෙ,**
**(තතො) සිලවන්තස්ස ඣායිනො එකාහං ජිවිතං**
**සෙය්‍යො.**

**දුස්සීලො**: සීල සමාදානයක් නැති හෙයින් දුස්සීලවූ; **අසමාහිතො**: චිත්ත සමාධියෙන් සමාහිත නොවූ; **යො**: යම් පුද්ගලයෙක්; **වේ වස්සසතං ජීවේ**: ඉදින් අවුරුදු සියයක් ජිවත්වන්නේ නමුදු; (ඒ ජීවිත්වීමට වඩා) **සීලවන්තස්ස**: සිවු පිරිසිදු සීලයෙන් සිල්වත් වූ; **ඣායිනො**: සමථවිදර්ශනා භාවනාවන්හි නියුක්ත භික්‍ෂුවගේ; **එකාහං ජීවිතං සෙය්‍යො**: එක දවසකුදු ජීවත් වීම උතුම් වේ.

විසිරුණු සිත් ඇති දුසිල්වතෙකු අවුරුදු සියයක් ජිවත්වනවාට වඩා දැහැන් වඩන සිල්වතෙකුගේ එක් දිනක් ජිවත්වීම ශ්‍රේෂ්ඨවෙයි.

**විවරණය**

**දුස්සීලො**: දුසිල්වත් තැනැත්තාය. ගිහියන් විසින් රැක්ක යුතු පන්සිල් - අටසිල් නොවඩන ගිහියෝ ගිහි දුසිල්හුය. පැවිද්දන් වූ හෙරණ උපසපන් දෙපස අතර යම් කෙනෙක් පැවිදි වත නොවඩා 'අරහත් දදයට' (සිවුරට) මුවාවී දුසිල් දේ කෙරෙත් නම් ඔවුහු පැවිදි දුසිල්හුය.

**අසමාහිතො**: නොඑකඟ (සමාධියෙන් නොවැඩුණු) සිත් ඇත්තාය. භාවනා වශයෙන් නොවැඩුණු සිත ඉතා නොසන්සුන්ය. දමනය නොකළ කුළු හරකෙකු සේ අකීකරුය. තැන්පත් වීමෙක් නැත.

**සීලවන්තස්ස**: සිල්වත්හටය. පන්සිල් අටසිල් ඈ සිල් පිරිසිදුව රකින ගිහියෝ ගිහිවතින් සිල්වත්හුය. හෙරණ සිල් සිවු පිරිසිදු සිල් පිරිසිදුව රකින පැවිද්දෝ පැවිදිවතින් සිල්වත්හුය.

**ඣායිනො**: භාවනා කරන තැනැත්තාගේය.





*නුවණ නැත්තාගේ සියක් වසක් ජීවත්වීමට වඩා නුවණ ඇත්තාගේ දවසකුදු ජීවත්වීම උතුම්ය.*

111. යො වෙ වස්සසතං ජීවෙ
දුප්පඤ්ඤො අසමාහිතො
එකා'හං ජීවිතං සෙය්‍යො
පඤ්ඤාවන්තස්ස ඣායිනො (8:12)

නුනුවණ අසමාහිත සිත් වන්නේ
වසර සියක් ගෙවුවත් නොව ටින්නේ
ඇරඹූ වෙරැ'තිව දහම් වඩන්නේ
නම්, එක දවසක් වුනත් වටින්නේ

# නුවණ ඇතිව එක දවසක් ජීවත්වීම වුවද උතුම්ය.

## 8 (10) ඛාණුකොණ්ඩඤ්ඤ තෙරුන්වහන්සේ (ගාථා අංකය 111)

සැවැත් නුවර දෙවුරම් වෙහෙර වෙසෙන බොහෝ වහන්දෑ විදසුන් වැඩීමෙහි නියැලීම සඳහා නිතොර වන පෙදෙස් කරා වැඩමවති. පිලිවෙත් පිරිමෙහි රැදී වෙසෙන කොණ්ඩඤ්ඤ තෙරහුද "මාගේ සබ්රම් සරුන්ද තමන් හා සමාන සිල් පිරුම් ඇති අය වහන්දෑ රහත්ව මහණ දම් සරුකර ගෙන බුදුරදුන් වෙත පැමිණ තමන් ලත් උසස් පල පවසා උදන් අනති. (සතුට පල කෙරෙති.) මාත් එබඳු පල ලබන්ට නුසුදුසු ද"යි සිතා වනයට වැඩ විදසුනෙහි යෙදී වෑයම් කළහ. රෑ දාවල් දෙක්හි කළ වෑයමේ පල ලැබ බුදුරදුන් දැක්මට දෙවුරම් වෙහෙරට පැමිණිම සඳහා පිටත් වූහ.

අතර මඟ රෑ නවාතැනට සුදුසු මනා වැලිතලාවක් හා ගල්තලාවක් ද පැන් පොකුණක් ද දැක ගල්තලාවට පැමිණ පැන් පෙරා වළදා විඩා සන්සිඳුවා ධ්‍යානයට සමවැද වැඩ හුන්සේක. එදා රෑ සොරු පන්සිය දෙනෙක් ගමක් පැහැර බඩු පොදි බැඳගෙන ඒ ගල්තලාවට පැමිණියහ. ඒ ඔවුන්ගේ පුරුදු තැනකි. එහි පසෙක සමවතට සමවැද හුන් තෙරුන් දැක ඒ කණුව කැයි සිතා මුලින් ආ සොරු ගෙනා පොදිය උන් වහන්සේගේ හිසමත තැබූයේය. අන් අයද තම තමන් ගෙනා පොදිත් එසේම (තෙරුන් වසා) මුල් පොදිය වටා තබා ඒ ඒ තැන වැතිර නිදාගත්හ. එළිවන්නට පෙර අවදිවී පොදිගන්නා සොරහු තෙරුන් දැක බියට පැන දුවන්නට වූහ.

තෙරහු 'පින්වත්නි, බිය නොවන්න. අපි බුදුරදුනගේ සවු වෙමු"යි පැවසූකල සොරහු පෙරළා පැමිණ වැඳ හෙව කණුවකැ"යි සිතා නොදැනීමෙන් සිදුවූ වරදට සමා අයැද සිටියහ. එතැන් සිට උන් වහන්සේ ඛාණුකොණ්ඩඤ්ඤ නම් වූහ. සොරහු බොහෝ සෙයින් පැහැද බණ අසා ඒ තෙරුන් වෙතම පැවිදි වූවාහුය. පසුව ඒ අතවැස්සන්ද සමඟ දෙවුරම් වෙහෙරට පැමිණ බුදුරදුන් වැඳ එකත් පස්ව සිටියහ. බුදුරදුහු පිළිසඳර පවත්වා අනතුරුව, "නුවණ නැති එකඟ වූ සිත් නැති යමෙක් සියක් වසක් ජීවත් වීමට වඩා නුවණැති දැහැන් වැඩීමෙහි ඇලුණු තැනැත්තාගේ එක දවසක්වුවත් ජීවත් වීම උතුම්ය"යි වදාරා ඒ පන්සියයම රහත් පලයෙහි පිහිට වූ සේක.

**විස්තරාත්මක අනුවාදය (111 ගාථාව)**

**දුප්පඤ්ඤො අසමාහිතො යො ච වස්සසතං ජීවෙ,**
**(තතො) පඤ්ඤාවන්තස්ස ඣායිනො එකාහං ජීවිතං සෙය්‍යො**

**දුප්පඤ්ඤො**: ලෞකික ලෝකෝත්තර ප්‍රඥාවන්ගෙන් යුක්ත නොවූ හෙවත් ප්‍රඥා නැත්තා වූ; **අසමාහිතො**: චිත්ත සමාධියෙන් සමාහිත නොවූ; **යො**: යම් පුද්ගලයෙක්; **ච වස්සතං ජීවේ**: ඉදින් අවුරුදු සියයක් ජීවත්වන්නේ නමුදු (ඒ ජීවත්වීමට වඩා); **පඤ්ඤාවන්තස්ස**: සමථ විදර්ශනා හා මාර්ගඵල යන ලෞකික ලොකෝත්තර ප්‍රඥාවන්ගෙන් යුක්ත වූ; **ඣායිනො**: සමථ විදර්ශනා භාවනාවන්හි නියුක්ත භික්ෂුවගේ; **එකාහං ජීවිතං**: එක් දවසකුදු ජීවත් වීම වුවද; **සෙය්‍යො**: උතුම් වේ.

නුවණ නැති අයෙක් අවුරුදු සියයක් ජීවත්වෙනවාට වඩා භාවනාවෙන් සිත් එකඟකිරීමේ යෙදුනු නුවණ ඇති අයෙකුගේ එක් දිනක් ජීවත්වීම වුවද ශ්‍රේෂ්ඨය.

**විවරණය**

**දුප්පඤ්ඤො**: නුවණ නැත්තාය. දත යුතු දහම් නොදැනුමෙන් හා පිරිය යුතු වත් පිළිවෙත් නොවැඩුමෙන් පසුබට වූ අනුවණ පුගුල්ය.

**පඤ්ඤාවන්තස්ස**: නැණවත් තැනැත්තා ගේය. දහම් හැදෑරී මෙන් හා පිළිපැදීමෙන් මොනවට වැඩුණු නැණින් යුත් තැනැත්තා ගේය.

'**පඤ්ඤාවන්ත**' යනුවෙන් දැක්වෙන්නේ සිවුසස් දහම් පිළිබඳ හෝ අරිඅටහිමග දහම් පිළිබඳ හෝ වෙසෙස් දැනුම් ඇත්තාය.

පැණ නම් - සමත් - විදසුන් ප්‍රඥා වශයෙන් දැක්වෙන ලෞකික නුවණ හා මගඵල ප්‍රඥා වශයෙන් දැකවෙන ලොවුතුරා නුවණය.

**ඣායිනො**: ධ්‍යාන (සමාධි) යෙහි ඇලුණු තැනැත්තාගේය.





*හීන වීර්‍යයෙන් යුත්තා සියක් වසක් ජීවත් වීමට වඩා දැඩි වීර්‍යය ඇතියෙකුගේ ජීවත්වීම උතුම්ය.*

112. යො වෙ වස්සසතං ජීවෙ
කුසීතො හීනවීරියො
එකා'හං ජීවිතං සෙය්‍යො
විරිය'මාරභතො දළ්හං (8:13)

අලසව වෙර නැතිවම නම් ඉන්නේ
වසර සියක් වුව එය නොව ටින්නේ
ඇරඹූ වෙරැතිව දහම් වඩන්නේ
දවසක් මුත් එය උතුමැයි දන්නේ

# වීර්යවන්තව ගෙවන ජීවිතය ඉතා උතුම්ය.

## 8 (11) සප්පදාස තෙරුන් වහන්සේ (ගාථා අංකය 112)

සැවැත් නුවර සැදැහැවත් පවුලක **කුල දරුවෙක්** පැවිදිව වත් පිළිවෙත්හි නියැලී මහණදම් පුරා පසුව උකටලී වී (කලකිරී) ගිහිවීමට සිතුයේය. පැවිදිව සිට ගිහිවීම ශක්‍රව සිට හෝ බ්‍රහ්මව සිට ඉන් වෙන්වීමක් වැනිය. එහෙයින් මහණකමේම සිට මියයාම යහපතැ"යි සිතා එයට උපා සොයමින් සිටියේය. එක් දවසෙක කලකිරීමට පත් මහණහු ගිනිහල් ගෙය සිටි නාගයෙකු කලයකට ගෙන දුරලෑමට යන බැව් දැක තමන් දුරැලන බව කියා තමා කලය ගෙන කිසිවෙකු නැති තැනකට ගොස් නයා ලවා කවාගෙන මැරෙන්නට වෑයම් කෙළේය. ඈත මෑත ඇවිදුවා අත්පා කටටදීත් නොකෑයේය. ඒ තෙර තෙමේ එතැන් සිට සප්පදාස නම් විය.

දිනක් කරණැවෑමියෙක් (දැළි රැවුළු කපන්නෙක්) වෙහෙරට අවුත් කර සඟලෙන් (දැළිපිහියා දෙකෙන්) එකක් බිම තබා අනිකෙන් හිසකේ කැපුයේය. උකටලී තෙර බිම තිබූ කරය අරගෙන "මින් බොටුව (බෙල්ල) කපා ගෙන මියෙමි"යි එක් රුකක හිස තබා ගෙන කරය බොටුවේ තබා, තමන් මේ දක්වා සුරැකි සිල් පිරික්සා බැලුයේය. මනාව රැකි සිල්හි පිරිසිදු බැව් දැක හටගත් සොම්නසින් මුළු සිරුරම පිනාගියේ එය. මැඩ පවත්වමින් විදසුනට සිත නන්වා ඔහු රහත් පලයට පැමිණියේය.ඒ තෙරුන් බොටුව කපාගන්ට ගොස් රහත් වූ බැවු සැලවිය. එහෙයින් වහන්දෑ බුදුරජාණන් වෙතින් ඒ තෙරුන් උකටලීවීමටත් නයා නොකෑමටත් කරුණු විමසූහ. බුදුරජාණන්වහන්සේ 'කසුප් බුදුරදුන්ගේ සස්නෙහි ඒ තෙරුන් මහණව සිට කලකිරුණු පැවිදි නමකගේ සිවුරු පිරිකර ගැනීමට ආසාකොට ඒ නමගේ කලකිරීමට අනුබල දීම නිසා මේ අත් බැව්හි තමන් ගේ උකටලී වීමට එය හේතු වූ බවද ඒ නයා මෙයට තුන්වන අත් බැව්හි  ඒ තෙරුන්ගේ මෙහෙකරු ළමයෙක්ව සිටි බැවින් හිමියාට ඇති වූ බියෙන් නොකෑ බව ද වදාළසේක. අනතුරුව වහන්දෑ බොටුවේ කරය තබා කපාගන්නට තැත් කරනතුරු රහත්වීම ගැන විමසූහ. බුදුරදුහු වඩන ලද වෙර ඇතියනට ඔසවාලු පය බිම තබන්ට පෙර රහත් බැව් වේයයි පවසා 'මැලි වූ වෙර නැති යමෙකු සියක් වසක් ජීවත්වීමට වඩා දැඩිසේ වෙර වඩන තැනැත්තා එක දවසකුදු ජීවත් වීම උතුමැයි වදාළ සේක.

**විස්තරාත්මක අනුවාදය (112 ගාථාව)**

**කුසීතො හීනවීරියො යො වෙ වස්සසතං ජීවෙ, (තතො) දළ්හං (විරියමාරභතො - විරියං + ආරභතො) විරියං ආරභතො එකා හං ජීවිතං සෙය්‍යො.**

**කුසීතො**: වත්පිළිවෙත් ආදියෙහි මැළි වූ හෙවත් කුසීත වු; **හීනවීරියො**: කායික චෛතසික වීර්‍ය්‍ය තැනැත්තා වූ; **යො**: යම් පුද්ගලයෙක්; **වෙ වස්සතං ජීවේ**: ඉදින් අවුරුදු සියයක් ජීවත්වූයේ නමුදු (ඒ ජීවත්වීමට වඩා); **දළ්හං**: දැඩි කොට; **විරියමාරභතො**:(විරියං + ආරභතෝ) කායික චෛතසික වීර්‍ය්‍ය වඩන භික්‍ෂුවගේ; **එකාහං ජීවිතං**: එක් දවසකුදු ජීවත් වීම; **සෙය්‍යො**:  උතුම් වේ.

කුසිත වූ හීන වීර්‍ය්‍ය ඇති අයෙක් සියවසක් ජීවත්ව විසීමට වඩා දැඩිසේ වෙර වඩනහුගේ එක් දිනක් ජීවත්වීම වුවද ශ්‍රේෂ්ඨ වේ.

**විවරණය**

**කුසීතො**: අලසය. වත් පිළිවෙත්හි හැදෑරීම් පිරවීම්හි (පාඩම් කිරීමෙහි හා පාඩම් කීමෙහි) මැලි තැනැත්තාය. උදය-දාවල-සවස-පින්න-අව්ව-වැස්ස වශයෙන් සලකා කටයුත්ත පමා කොට කල්දමා පවු සිතිවිලිවලට යටහත්ව විසීම කුසීතයා ගේ ගතිය වේ.

**කුසීතයා**: නිතොර 'කාම විතක්ක - ව්‍යාපාද විතක්ක - විහිංසා විතක්ක නම් මන වඩන රූ - සද ඈ පස්කම් ගුණ විෂයෙහි ඇස් කන් - නාස් ඈ ඉදුරන පිණවීම සඳහා සිත යොමු කිරීමයි.

**ව්‍යාපාද විතක්ක නම්**: අන්සතුහු නැසෙත්වා, වැනසෙත්වා යන අනුන් පිළිබඳ නපුරු සිතිවිලි ගැන සිත යොමු කිරීමයි.

**විහිංසා විතක්ක නම්**: අනුන්ට හිංසා පීඩා ඇතිවෙන යම් යම් දේ කිරීමට හා කරවීමට සිත යොමු කිරීමයි.

**දළ්හං වීරියං**: දැඩි වීර්යය. එළඹ සිටි කටයුත්ත මුදුන් පැමිණ වීම සඳහා ඇරඹූ සිත්සතන්හි බල පවත්නා වැර වෑයමය. අකුසල් මැඩීම හා කුසල් වැඩීම සඳහා ද කෙලෙස් කැවීම් - දැවීම් සඳහා ද ඇරඹූ විරියය.





*හටගැනීම හා නැසීම දක්නා තැනැත්තාගේ එක දවසකුදු ජීවත්වීම උතුම්ය.*

113. යො ච වස්සසතං ජීවෙ
අපස්සං උදයව්‍යයං
එකාහං ජීවිතං සෙය්‍යො
පස්සතො උදයව්‍යයං (8:14)

ඇතිවනු නැතිවනු නොදැක සිටින්නේ
වසර සියයක් විසුවත් නො වටින්නේ
ඇතිවනු නැතිවනු පිරිසිඳ දන්නේ
දවසක් විසුවත් එය සෙට වන්නේ

# උදය ව්‍යය දුටුවහුගේ ජීවිතය උතුම්ය

## 18 (12) පටාචාරා මෙහෙණිය (ගාථා අංකය 113)

සැවැත් නුවර සතළිස් කෙළක් පමණ ධනයෙන් හා ඉසුරෙන් වැඩුණු සිටු කුලයක් විය. **සිටු දියණි** තුරුණු විය පත්ව කම් සැපයෙහි ගිජුව මෙහෙකරු තරුණයෙකු සමඟ පෙම් බැඳ ඈත පෙදෙසකට ගොස් මෙහෙ කොට දුක්සේ රැකේ.

ඒ අතර සිටු දුව කුස ගැබක් හට ගැනුණේය. එහෙයින්, "මා දෙමාපියන් ළඟට යායුතුයැ"යි සිතා. ඒ බව සැමියාට සැලකළ කල "මා කල වරදට මා නසා පළිගනිති"යි සිතා ගමන පමා කළේය. ගමන පමාවීම නිසා අතර මඟදී පුතෙකු ලැබුනු හෙයින් දෙදෙනාම පුතු ද රැගෙන විසූ තැනටම පැමිණියහ.

දෙවන වරද දරු ගැබක් හට ගැනුණේය. පෙරසේම මවුපියන් වෙත යාමට සිතා පුතුන් රැගෙන මගට වන. තද වැසි සුළං විදුලි ගැසීම් ඇති දවසෙක දෙවන ළමයා ද ලැබුණේය. බිරිඳට හා දරුවනට සාත්තු කරන අතර සැමියා නයෙකු විසින් දෂ්ට කරන ලදුව මිය ගියේය. සැවැත් නුවරට යාම සඳහා කුඩා දරුවන් සමග අචිරවතී ගඟබඩට පැමිණ වැඩිමහල් දරු මෙගොඩ සිටුවා කුඩා දරු එගොඩ ගෙන ගොස් හොවා ගඟ මැද පෙරළා යන්නී අහස හඬක් ඇසී බැලුවාය. අහස යන උකුස්සෙක් ඈතදීම ඒ දරුවා දැක ඩැහැගෙන යාමට අහසින් බස්නේය. මව වේගයෙන් අත්ලෙන් අත්ල ගසා හඬ නගා දියෙහි පැන යන අතර උකුසු ළඳරු ඩැහැගෙන ගියේය. මෙගොඩ සිටි පුතු "මා මව මට හඬ ගසනේය"යි සිතා දියට බැස ගිලී මළේය.

සිටු දු හැඬීම් වැළපීම් සහිතව සැවත් නුවර බලා මවු පියන් වෙත යන්නී හමුවන මිනිසුන් ගෙන් ඔවුන්ගේ පවත් කෙසේදැ"යි ඇසුවාය. ඔවුහු තද වැස්ස හා සුළං වේගයත් හේතු කොට සිටු මාලිගාව ඇද වැටී සිටුත් දේවිත් පුතුත් එයට යටව මළහ. දැන් ඔවුහු එකම දරසෑයක දවති"යි කීහ. දෙදරුවන්ගේද, සැමියාගේද, එකම දර සෑයක දැවෙන මවුපියන්ගේද සොහොයුරාගේද මරණ නිසා සිටුදුව සිහි මුළා වී උමතු විලස් පහළ විය. මවුපියන් හා සොහොයුරු දවන සෑයේම තමනුත් දැවෙන්ට සිතා පනින්ට යන කල නොහඳුනන තැනැත්තියෙකැයි ගල්මුල්වලින් ගසා එළවන්නට වූහ.

සිටු දු ඔවුන්ගේ පහරින් මිදෙනු සඳහා උමතු වෙසින් ඉවත් වූ පිළි ඇතිව වහා යන්නී දෙවුරම් වෙහෙරට වන් කල උවැසියෝ පිළි හැඳ වූහ. බුදුරදුන් ඈට පිහිටවිය. දහම් දෙසා සෝ ගිනි නිවා සෝවාන් පල පිහිටුවිය. ඈ මරණ බියෙන් තැති ගෙන සසරට කලකිරී මෙහෙණින් වෙසෙන අරමක මහණවූවාය.

ඇය හඳිනට පිළි නැතිව සිට පිළි ලද හෙයින් පටාචාරා නමින් හැඳුනුණි. විදසුනෙහි ඇලුණු ඒ මෙහෙණ දුටු බුදුරදුහු රැස් විහිදුවා ඉදිරියේ වැඩ සිටි සේ අමතා "උදය - ව්‍යය (හටගැනීම් - නැසීම්) නොදක්නා වූ යමෙක් අවුරුදු සියයක් ජීවත්වීමට වඩා හට ගැනීම් නැසීම් නුවණින් දක්නහුගේ එක දවසක ජීවත්වීම උතුම්ය"යි වදාරා ඒ මෙහෙණ රහත් පලයෙහි පිහිට වූ සේක.

**විස්තරාත්මක අනුවාදය (113 ගාථාව)**

**උදයව්‍යයං අපස්ස යො වෙ වස්සතං ජීවෙ (තතො)**
**උදයව්‍යයං පස්සතො එකාහං ජිවිතං සෙය්‍යො**

**උදයව්‍යයං අපස්සං**: පංචස්කන්ධයෙහි උදයව්‍යය හෙවත් ඇතිවීම හා නැතිවීම නොදක්නා වූ; **යො**: යම් පුද්ගලයෙක්; **වෙ වස්සසතං ජීවේ**: ඉදින් අවුරුදු සියයක් ජීවත්වන්නේ නමුදු (ඒ ජීවත් වීමට වඩා); **උදයව්‍යයං පස්සතො**: පංචස්කන්ධයෙහි උදයව්‍යය දක්නා වූ භික්ෂුවගේ; **එකාහං ජීවිතං**: එක් දවසකුදු ජීවත් වීම; **සෙය්‍යො**: උතුම් වේ.

ලෝකය හැම දෙයක්ම ඇතිව නැතිව නැති වන බව නොසිතා සියවසක් විසීමට වඩා එය ගැන සිතමින් එක් දිනක් විසීම ශ්‍රේෂ්ඨ වෙයි.

**විවරණය**

**උදයව්‍යය**: ( රූ ඈ පස් කඳයන්ගේ) හැටගැනීම හා නැසීමය.

**උදය නම්**: ඉපදීම - පහළ වීම - හටගැනීම යන තේරුම් ඇති වචනයකි.

**ව්‍යය නම්**: නැසීම් - නැතිවීම් යන තේරුම් ඇති වචනයකි.

**පස්සතො**: (පස්කඳ පිළිබඳ උදය - වය) දක්නහුගේය.

**උදයව්‍යය**: දැක්ම රූ ඈ පස්කඳයන් ගේ වසයෙන් පස් විසි අයුරකි.





*නිවන නොදක්නහු සියක් වසක් ජීවත්වීමට වඩා නිවන දක්නහු එක දවසකුදු ජීවත්වීම උතුම්ය.*

114. යො වෙ වස්සසතං ජීවෙ
අපස්සං අමතං පදං
එකාහං ජීවිතං සෙය්‍යො
පස්සතො අමතං පදං (8:15)

නිවන් අමාපද නොදැන වසන්නේ
වසර සියක් විසුවත් නො වටින්නේ
නිවන් අමාපද දැක නිවසන්නේ
එක දවසක් වුව උතුමැයි වන්නේ

# අමාපදය දක්නහුගේ ජීවිතය උතුම්ය
## 8 (13) කිසාගෝතමී මෙහෙණිය (ගාථා අංකය 114)

සැවැත් නුවර ඉසුරුමත් සිටු කුලයෙක **ගෝතමී** නම් කුමරියක් වූහ. ඒ සිටු කුමරිය මනා රූ ඇත්තිය, සන්සුන් පැවැතුම් ඇත්තීය. සැම දෙන සතොස් බවට පමුණුවන තෙපුල් හා දීමට සතුටු අත් ඇත්තීය. හීන් සිරුරු ඇතිව වැඩෙන ඒ කුමරී කිසාගෝතමී නමින් හැඳුනුණි. දෙමාපියෝ සිය කුලයට සරිලන සිටු කුමරෙකුට ඈ සරණ පාවා දුන්හ.

කුස දරු ගැබක් හටගෙන දසමස් ඇවෑමෙන් පුතෙකු ලැබ සෙනේහයෙන් රැකේ. පුතු දණ ගා යනෙන කල ඉක්මවා පිය ඔසවා ඇවිදින තරම් වියේ දී මළේය. පුතුගේ නැසීම නිසා මුළු සිරුරම සෝ ගිනියෙන් දැවෙන ඈ සැනසීමට කිසිවෙකුටත් නොහැකි විය.

කිසාගෝතමී සොවින් පෙළෙමින් වැළපෙමින් පුතුගේ මළ සිරුර කර හොවාගෙන "මා පුතුට බෙහෙත් කියන්න"යි ඇවිදී. නුවණැති සපුරිස් කෙනෙකුට කිසාගෝතමීයට සොවින් ඇතිවුණු උමතු ගතිය දැනුණේය. ඔහු "ඇයි ගෝතමියනි දුක්වන්නේ? ඔබ පුතුට බෙහෙත් කරවා ගතමනා නම් දෙවුරම් වෙහෙරට නිසැකව යන්න. බුදුරදුහු බෙහෙත් දනිත්"යයි කීහ. කිසාගෝතමී වෙහෙරට ගොස් "බුදුරදුන් වහන්ස, මා පුතුට බෙහෙත් දැනිත්දැ"යි ඇසී. බුදුරදුහු ඇගේ සෝගිනි නිවීමට පිළිවෙළක් යොදනු සඳහා "බෙහෙත් දනුම්හ"යි වදාළ සේක. උවමනා බෙහෙත් ඇසූ කල "නොමළ ගෙයකින් අබමිටක් පමණ ගෙනෙව"යි වදාළහ. ඈ "ඒ ඉතා සුලු දෙයකැ"යි සැලකී.

කිසාගෝතමී මළසිරුර කර හොවාගෙන ගෙන් ගෙට ඇවිද නොමළ ගෙයකින් බෙහෙතට අබමිටක් සොයාගත නොහැකිවීය. "ජීවත්ව සිටිනවුන්ට වඩා මළහු බොහෝ වෙති. පමණෙක් නොදත් හැකි"යි සිතා මළ සිරුර ඉවතලා කලකිරී වෙහෙරට ගොස් බණ අසා සෝවාන්ව මෙහෙණින් වෙසෙන අරමක මහණ වූහ. දවසක කිසා ගෝතමී විදසුනට සිත නංවා සිටින අතර බුදුරදුහු රැස් විහිදුවා ඉදිරියේ වැඩ සිටි සේ අමතා "නිවන නොදක්නා වූ යමෙක් සියක් වසක් ජීවත් වීමට වඩා අමාපදය දක්නා වූ තැනැත්තාගේ එක් දවසකුදු ජීවත්වීම උතුම්ය"යි වදාරා ඒ මෙහෙණ රහත් පලයෙහි පිහිටවූ සේක.

### විස්තරාත්මක අනුවාදය (114 ගාථාව)

**අමතං පදං අපස්සං යො වෙ වස්සසතං ජීවෙ, (තතො)**
**අමතං පදං පස්සතො එකාහං ජීවිතං සෙය්‍යො.**

**අමතපදං**: මරණ රහිත වූ පදය හෙවත් අමෘත මහා නිර්‍වාණය; **අපස්සං**: නොදක්නා වූ; **යො**: යම් පුද්ගලයෙක්; **වෙ වස්සසතං ජීවේ**: ඉදින් අවුරුදු සියයක් ජීවත්වන්නේ නමුදු (ඒ ජීවත්වීමට වඩා); **අමතං පදං පස්සතො**: අමෘත මහා නිර්වාණය දක්නා වූ පුද්ගලයාගේ; **එකාහං ජීවිතං**: එක දවසකුදු ජීවත් වීම; **සෙය්‍යො**: උතුම් වේ.

නිවන නොදක්නා අයගේ සියවස් දිවියට වඩා එය දක්නහුගේ එක් දිනක් ජීවත්වීම ශ්‍රේෂ්ඨ වේ.

### විවරණය

**අමතං පදං**: අමාපදය, මඟ-පල නැණින් පසක් කළ යුතු වු නිවනය. ජරා-මරණ රහිත වූ 'අමා' සුවය. අමා නම් නොයෙක් කප් කෙළ ගණන් පුරණ ලද පෙරුම් ඇති බුදු-පසේබුදු-මහසවු යන උතුමන් සෙවුණු සිත් ගැන්වූ එකම පිහිට වූ උතුම් සෙතය. ඒ සිහි නුවණින් යෙදී මනාව රැකි සිල් ඇති නොපසුබට දැඩි වැරැති විදසුන් මගින් වැඩුණු සිතැති පුගුලන් විසින් සිවු මඟ-පලයනට පැමිණ පසක් කොට දැක්ක යුතු. එසේම ලැබිය යුතු නිවනය.

**අමත පදං පස්සතො**: අමා පදය දක්නා තැනැත්තාගේය. අමා පදය දැකීම නම්, නිවණ මඟ-පල නැණයනට අරමුණු කොට පසක් කර ගැනීමයි. එබඳු තැනැත්තා එක දවසක් වුවත් ජීවත්වීමට උතුම්ය. අමා පදය නොදක්නහුගේ හෝ දක්නට වැර වෑයම් නොකරන්නහුගේ සියක් වසක් නමුදු ජීවත්වීම නිසරුය. උතුම් නොවන්නේය.



*දහම් නොදක්නහු සියක් වසක් ජීවත් වීමට වඩා දහස් දක්නහු එක දවසකුදු ජීවත්වීම උතුම්ය.*

115. යො වෙ වස්සසතං ජීවෙ
අපස්සං ධම්මමුත්තමං
එකාහං ජීවිතං සෙය්‍යො
පස්සතො ධම්මමුත්තමං (8:16)

උතුම් දහම් පද නැතිනම් දන්නේ
සියක් වසක් සිටියත් නොවටින්නේ
උතුම් දහම් පිරිසිඳ දැන ගන්නේ
එක දවසක දිවි වුවද වටින්නේ

# උතුම් දහම් දක්නහුගේ ජිවිතය උතුම්ය
## 8 (14) බහුපුත්තික මෙහෙණිය (ගාථා අංකය 115)

සැවැත් නුවර නොමඳ ඉසුරෙන් වැඩුණු පවුලක්විය. එහි දෙමාල්ලෝ පන්සිල් රැක දස අකුසලින් වැලකී වෙසෙති.  ඔවුනට පුත් කුමරුන් සත් දෙනෙකුත් දු කුමරියන් සත් දෙනෙකැයි තුදුස් (දස සතර) දූ පුත් කෙනෙක් වූහ. නිසි වයස්හි සිය කුලයට සැසැඳෙන (ගැළපෙන) අයුරු පුතණුවන්ට යෙහෙළියන් සත් දෙනෙක් ද දුවනියන්ට බෑණනුවන් සත් දෙනෙක් ද මඟුල් උළෙලින් සරණ කැර දුන්හ. ඔවුහු මුල් ගෙය මවු පියනට තබා ගෙවල් තනාගෙන වෙන් ව වෙසෙති. මව බොහෝ දරු පිරිසක් ඇති කළ හෙයින් **බහුපුත්තික** යයි පසිඳුවිය. පියා මළ කල ධනයට හිමි වූයේ මවය. ඒ සියලු දෙනම මවට සලකති. උවටැනෙහි අඩුවක් නොපෙන්වති.

ඒ දරුවෝ "මෑණියෙනි, ධනය බෙදා දුන මැනව. අපි නුඹ මෙසේ රකුම්හ"යි මව රැවටීමට ඇවිටිලි බස් කියති. මවගේ කිසි රැවටිමෙක් නැත. දරුවනට කුලුණු සිතැත්තීය. මව "මේ ධනය අයිති මා දරුවනට මැයි සිතා දරුවන් නිසා මම රැකෙමි"යි සලකා තුදුස් දු පුතුනට තමන් සතු කිසිවක් ඉතිරි කර නොගෙන සම සම සේ ධනය සතුටින් බෙදා දුණි. මෑණියෝ කිහිප දවසකට පසු වැඩිමහල් පුතුගේ ගෙදරට ගියහ. එදා දෙටු යෙහෙළි පිළිගැනුමක්වත් සාද (සත්කාර) කිරීමක් වත් පිළිසඳරක් (සුවදුක් විචාරීමක්) වත් නොකොට ගෙට ගොඩ වූ සැටියේ ම වේගයෙන් "ඔබ වැඩිමල් පුතු යයි යමක් වඩා දීලාද මෙහෙට ආවේ"යි කිසි සැලකිල්ලක් නොකළාය.

සෙසු යෙහෙළිහුත් එසේම කිවාහ. දූවරුන් සත් දෙන ගෙන්ද එයට වඩා සාදයක් (සත්කාරයක්) නොලැබිණ. මව කලකිරී "මා වදා හදා ධනය බෙදා දුන් දරුවෝ ද මා හෙළ දකිති. තවත් බලාපොරොත්තු නොවිය යුතු"යයි සිතා මෙහෙණවර (මෙහෙණින් වෙසෙන අරම) මහණව බහුපුත්තික නමින් පසිඳුවිය. ඒ මෙහෙණ දැඩි වැරතිව තුන්යම් රෑ මුළුල්ලෙහි විදසුනට සිත නංවා සිටි බැව් බුදුරදුහු දැක රැස් විහිදුවා ඉදිරියෙහි වැඩ සිටි සේ අමතා "උතුම් දහම් (නව ලොවුතුරු දහම්) නොදක්නා වූ යමෙක් අවුරුදු සියයක් ජීවත් වීමට වඩා උතුම් දහම් දක්නා තැනැත්තාගේ එක දවසකුදු ජීවත්වීම උතුම්ය"යි වදාරා ඒ මෙහෙණ රහත් පලයෙහි පිහිටු වූ සේක.

### විස්තරාත්මක අනුවාදය (115 ගාථාව)

**(ධම්මමුත්තමං  - ධම්මං + උත්තමං) උත්තමං**
**ධම්මං අපස්සං යො වෙ වස්සසතං ජීවෙ (තතො)**
**(ධම්මමුත්තමං  - ධමමං + උත්තමං) උත්තමං ධම්මං**
**පස්සතො එකාහං ජිවිතං සෙය්‍යො.**

**උත්තමං ධම්මං**: උත්තම වූ නවලෝකෝත්තර ධර්‍මය; **අපස්සං**: නුවණැසින් නොදක්නා වූ; **යො**: යම් පුද්ගලයෙක්; **වේ වස්සසතං ජීවේ**: ඉදින් අවුරුදු සියයක් ජීවත්වන්නේ නමුදු (ඒ ජිවත්වීමට වඩා); **උත්තමං ධම්මං පස්සතෝ**: උත්තම වූ නවලෝකෝත්තර සද්ධර්‍මය නුවණින් දක්නහුගේ; **එකහං ජීවිතං**: එක දවසකුදු ජීවත් වීම; **සෙය්‍යො**: උතුම් වේ.

උතුම් දහම් නොදත්තහුගේ සියවස් විසීමට වඩා එය දක්නහුගේ එක් දින දිවිය උතුම් වෙයි.

### විවරණය

**ලෝකුත්තරධම්ම**: (ලෝක+උත්තර+ධමම) ලෝක නම් - පුහුදුන් ලොවය. උත්තර නම් එතෙරය. ධම්ම නම් මග - පල දහම්ය. පුහුදුන් ලොවින් (කෙලෙස් සහිත පස් කඳින්) මග - පල දහම් පසක් කොට එතෙර වූ හෙයින් ඒ නවය නව ලොවුතුරු දහම් නම්.

**සෝවාන්**: මේ තැනැත්තා පවා මොක් මග හෙළි කොට පුහුදුන් ලොවින් එතෙරට ගමන් ගත් හෙයින් ද නැවත පුහුදුනට ඇතුළත් නොවන හෙයින් ද ලොවුතුරු බැව්හි පිහිටියේ වේ. හේ කෙමෙන් සෙසු මග පල ලැබ සව් කෙලෙස් මුලිනුපුටා නැසීමෙන් නව ලොව්තුරු දහම් හිමි කර ගනී. සියලු දුකින් මිදී සෙත් පුරා සැනසේ.





සනාතන බුද්ධ භාෂිතය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ අසහාය සාමයික මෙහෙය උදෙසා, සිය කාලය හා ශ්‍රමය සපුරා වැය කරමින්, මානව වංශයට දහම් මග හෙළි පෙහෙළි කිරීමේ මහා මෙහෙවරට කැප වී සිටින සිංගප්පූරුවේ ප්‍රධාන සංඝ නායක වේරගොඩ සාරද, ස්ථවිරයන් වහන්සේ අද ලොව වෙසෙන ප්‍රශස්ථතම ධර්ම දූත යතිනායක වරයාණන් වහන්සේ නමකි.

1941 නොවැම්බර් මස 27 වනදා දකුණු ලක වේරගොඩ දී උපත ලද මේ යති ප්‍රභූවරයානෝ, උපාධි ලාභීව, ධර්මදූත මෙහෙය ආරම්භ කළේ ඉතා යොවුන් අවධියේ දීමය. දැනට ශතක 6 ක් පුරා ධර්මදූත මෙහෙයෙහි යෙදී සිටින ගරුතර වේරගොඩ සාරද යතිනායකයානන් වහන්සේ මුද්‍රිත මාධ්‍යයෙන් සහ විද්‍යුත් මාධ්‍යයෙන් මෙන්ම දුරකථන තාක්ෂණයෙන් පවා අද ලොවට ධර්මදානය සපයන්නේ නවීනයන්ගේ මනස හා ආධ්‍යාත්මික ගති-පැවතුම් පිළිබඳ පැහැදිලි අවබෝධයකිනි.

# කර්තෘ ස්වාමීන්ද්‍රයන් වහන්සේ

වර්තමානික ග්‍රාහක පිරිස, ශ්‍රව්‍ය-දෘෂ්‍ය මාධ්‍ය මගින් දැනුමත් විනෝදාස්වාදයත් ලබන්නට පුරුදු වී සිටින පරපුරක් හෙයින්, ගරුතර වේරගොඩ සාරද හිමිපාණෝ, ඔවුනගේ මනසට සරිලන පරිද්දෙන් බුද්ධ භාෂිතය, ඔවුන් අතට පත් කරන සේක. මුද්‍රිත හා විද්‍යුත් ප්‍රකාශන 700 ක් පමණ ලොවට පිරිනමා සිටින මේ යතිනායකයන් වහන්සේ විසින් සම්පාදිත ධර්ම භාණ්ඩාගාරය නම් ඉංග්‍රීසි කෘතිය දොරට වැඩීමේ උළෙලේ දී, ඒ පිළිබඳ ව එක් දිනක් තුල පමණක් ලැබුණු දුරකථන ඇමතුම් සංඛ්‍යාව 2000 කටත් අධික විය. ඒ නිසා එය සිංගප්පූරු රාජ්‍යයේ ග්‍රන්ථ ප්‍රකාශන ඉතිහාසයේ සුවිශිෂ්ට වාර්තාවකට හිමිකම් කියන්නේය.

දැනට, සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය භාරව වැඩ සිටින ගරු වේරගොඩ සාරද නායක ස්ථවිර පාදයන් වහන්සේ ලෝකයේ බොහෝ දේශයන් හී බුද්ධ ශාසනයේ ප්‍රගතියට හිතකාමී ධර්ම දූත මෙහෙවරක යෙදී සිටින සේක.

එතුමන් ගේ ප්‍රධාන ප්‍රකාශ අතර, සිංහල හා ඉංගිරිසි ධම්මපදයත්, ජාතක කථා පිළිබඳ විද්‍යුත් ප්‍රකාශනයත් ප්‍රධාන තැන් ගනී. එතුමන් විසින්, ඉටු කෙරෙන මහා සාමයික මෙහෙය අඛන්ඩව පවත්වා ගෙන යනු පිණිස, ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් නිදුක් නිරෝගී සුව පැතීම, බෞද්ධ ජනතාවගෙන් ඉටු විය යුතු කෘතඥතා පූර්වක චාරිත්‍රයකි.

කලා කීර්ති එඩ්වින් ආරියදාස

ISBN: 981-00-4938-2

# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත ධම්මපදය

නවවන පරිච්ඡේදය

# පාප වග්ග



ගරු වේරගොඩ සාරද නාහිමිපාණන් වහන්සේ
සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක

"සබ්බදානං ධම්මදානං ජිනාති"

(ධර්ම දානය, සෙසු දාන සියල්ලටම වඩා අගනේය.)



''ධර්ම භාණ්ඩාගාරය'' නැමැති

මෙම වටිනා ධර්ම පුස්තකය

**සාමවිනිසුරු බී.ධර්මදාස පියාණන්ට**

නිවන් සුව පතා ප්‍රකාශනය කරන ලදි.

පූර්ණ අනුග්‍රහකත්වය

**වේරගොඩ සුනන්දා භික්ෂුණිය විසිනි**

# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත
## ධම්මපදය


කතෘ:

**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**

ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව

විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය



**සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය**

නො: 1, ජලන් මස් පුටේ, සිංගප්පූරුව 128607

ටෙලි: 65 67783330 65 94656570

94 770589498 / 94 755218421

වේරගොඩ ජයන්ති විහාරය, වේරගොඩ, මීටියාගොඩ

විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

**කර්තෘ**
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**චිත්‍ර ශිල්පී**
පී. වික්‍රමනායක

**සැකසුම**
පියරත්න හේවාබට්ටගේ

**පරිගණක රූපාවලි සහ පූර්ව ප්‍රකාශන මෙහෙය**
පූජ්‍ය වේරගොඩ සුනන්දා භික්ඛුණී
බී. දයා සමරසිංහ
බී. රෝහණ ජයතිස්ස

**පරිගණක සහාය**
ශ්‍යාමනී ප්‍රියලක්‍ෂණා ලේකම්වසම්
ඩබ්ලිව්. මාලා කාන්ති
ප්‍රියංකා බෝධිපක්‍ෂ

**සහාය**
බී. පුෂ්පානී ධම්ලතා
බී. ජේ. ධම්ලතා
ඊ. එම්. ලයනල් මොහොට්ටි
ඊ. එම්. යුගාන් සසංක
ශ්‍රියාලතා කග්ගොඩ ආරච්චි

**පරිගණක ප්‍රකාශන**
සමනල ප්‍රින්ටර්ස්, බටපොල
ටෙලි: +94 777557127

**පිටකවරයේ පින්තූරය**
බර්ට් ගුණසේකර

**මුද්‍රණය**
2013 නොවැම්බර් මස 27 දින, සිංගප්පූරුව

**පිටකවරයේ චිත්‍රය**
*පිටකවරයේ බුදු පිළිමය වේරගොඩ ජයන්ති විහාරයේ බුදුමැදුරෙහි.*
*වර්ෂ 1953 ජුනි 3 වෙනිදා අඹන ලද මෙම බුදු පිළිමය දැනට ශ්‍රී ලංකාවේ තිබෙන*
*දර්ශණීයතම බුදු පිළිමය වශයෙන් සැලකේ. මෙම බුදු පිළිමය ඉදිකිරීමේ පුරෝගාමී වූ අපවත් වී වදාළ*
*ගෞරවාර්හ පණ්ඩිත යටලමත්තේ වජිරඤාණ නායක මාහිමිපාණන් වහන්සේට නිවන්සුව අත්වේවායි අපි ප්‍රාර්ථනා කරමු.*

මේ ග්‍රන්ථයෙහි ආගත කරුණු පිළිබඳ පූර්ණ හා සදාකාලික අයිතිය හිමි වන්නේ බුදුරජාණන් වහන්සේටයි.
බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් පහල වූ සනාතනික සත්‍යයෝ පුහුදුන් මිනිසුන් විසින් පනවන ලද
තාවකාලික වූත්, අසත්‍ය වූත්, අයිතිවාසිකම් පිළිබඳ නීති රීති පිළිගනු නොලබති.

**පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ටෙලි: 65 67783330 65 94656570
+94 770589498 +94 755218421
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

ISBN: 981-00-4938-2

9 වන පරිච්ඡේදය

# පාප වග්ග





කුසල් කිරීමෙහි යුහුසුලු වන්න. සිත පවින් වළකා ගන්න. පිනට අලස වන්නාහු ගේ සිත පවෙහි ඇලේ.

116. අභිත්ථරෙථ කල්‍යාණෙ
පාපා චිත්තං නිවාරයෙ
දන්ධං හි කරොතො පුඤ්ඤං
පාපස්මිං රමතී මනෝ (9:1)

කරනු ඇසුරු කලණ මිතුරු
පව් කර දුරු සිත නිර තුරු
වුණොත් නුහුරු පිනට මහරු
පවට ඇදෙන්නයි සිත හුරු

# පිනෙහි ඇලී - නොවන් මැලී

## 9 (1) චුල්ල ඒකසාටකගේ වත (116 ගාථාව)

**චුල්ල ඒකසාටක** නමින් පතළ බමුණු යුවලක් අරබයා භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි මේ ගාථාව දේශනා කළ සේක.

සැවැත් නුවර විසූ එක් බමුණු යුවලකට ගමනක් බිමනක් යන විට හැඳ ගනු පිණිස වූයේ එක ම උතුරු සළුවකි. එහෙයින් යුවලටම එකවර එකට ගමනක් යා ගත නොහැකි විය. එහෙයින් බණ අසන්නට යන විට බිරිඳ දිවා කාලයෙහි ගොස් ආ විට රාත්‍රි කාලයෙහි ස්වාමියා යයි. ඔවුනට 'ඒකසාටක' නම යෙදුනේ එහෙයිනි.

එක් දිනක් රැයෙහි ඒකසාටක බමුණා බණ අසන්නට ගියේය. එදින මුල් යාමයෙහි දහම් අසන විට බමුණා ගේ සිත පරිත්‍යාගශීලය කෙරේ බෙහෙවින් නැමිණි. යමක් පරිත්‍යාග කිරීමේ බලගතු ආශාව සිත උපන්න ද පුදන්නට වස්තුවක් නොවීම ගැටළුවක් විය. දෙන්නට ඇති එකම වස්තුව වූ උත්තරසාටකය පිදුවහොත් බමුණාට කෙසේ වෙතත් බැමිණියට මගට බසින්නට ක්‍රමයක් නැති වෙයි. එහෙයින් හෙතෙම සිත පාලනය කර ගෙන දහම් ඇසීය. රාත්‍රි දෙවන යාමයෙහි දී ද ඔහුට බලගතු දාන චේතනාවක් ඇති වුව ද උත්තර සාටකය පිදීමේ චේතනාව පාලනය කර ගන්නට සිදුවිය.

රැයෙහි තුන්වන යාමයෙහි දි ධර්ම ශ්‍රවණය කරන අතර ඔහුට මෙසේ සිතිණි. "මගේ මසුරු සිත පරදවා ගන්නට මා අසමත් වුවහොත් සසර දුක් නිවාගන්නට බැරිවෙයි. මා මේ වතාවේදී තෘෂ්ණාව පාලනය කර මේ උතුරු සළුව බුදුරදුන්ට පිදිය යුතුය." එසේ සිතා හේ උත්තර සාටකය බුදු පාමුල තැබීය. එසේ කොට තමන් තම ලෝභය පරදවා ජයගත් ප්‍රීතිය හේතුවෙන් "මම ජයගතිමි"යි තුන්වරක් ප්‍රකාශ කළේය. පිරිසේ අසුන් ගෙන බණ අසමින් සිටි පසේනදි කොසොල් රජ ඒ අසා කලබල වූයේ ඔහු කිසියම් කුමන්ත්‍රණයක් කළා දැයි සිතා ඔහු ගෙන් ප්‍රශ්න කරන්න රාජපුරුෂයනට උපදෙස් දුන්නේය. ඇති තතු දැනගත් රජතුමා බමුණා කර ඇත්තේ කිසිවකු විසින් කළ නොහැකි තරම් දුෂ්කර කාර්යයක් හෙයින් ඔහුට ත්‍යාගයක් දිය යුතු බව තීරණය කළේය.

බමුණාට වස්ත්‍ර දෙකක් ත්‍යාග වශයෙන් දෙන්නට රජතුමා තීරණය කළේය. ඒ වස්ත්‍ර දෙකද හෙතෙම බුදුරජාණන් වහන්සේට පූජා කළේ ය. එවිට රජතුමා ඔහුට වස්ත්‍ර හතරක් පිරිනැමීය. එය ද හේ බුදුන්ටම පූජා කළේ ය. මෙසේ වැඩි කරමින් ගොස් වස්ත්‍ර 32 ක් වූ තැන බමුණා එක් වස්ත්‍රයක් තමාටත් එකක් බිරිඳටත් තබා ගෙන ඉතිරි වස්ත්‍ර තිහ බුදුරජාණන් වහන්සේට පූජා කළේ ය. බමුණා දුන් දානය අතිශය දුෂ්කර එකක් බව දත් රජතුමා ඔහුට සෑහෙන සංග්‍රහයක් කළ යුතු යැයි සිතා එකක් දහස බැගින් වටිනා විල්ලුද රෙදි දෙකක් මාලිගයෙන් ගෙන්වා බ්‍රාහ්මණයාට තෑගි කළේ ය. බමුණා ඉන් එකකින් වියනක් කරවා ජේතවනාරාමයෙහි බුදුරදුන් වැඩ විසූ ගඳ කිළියෙහි උන්වහන්සේ ගේ ඇඳ මත්තෙහි සවි කරවී ය. අනෙක් වස්ත්‍රයෙන් වියනක් කරවා සිය නිවසෙහි දිනපතා භික්ෂු නමක් දන් වළඳවන අසුනට ඉහලින් සවි කළේය. පසු දිනෙක රජතුමා බුදුන් වඳින්නට දෙව්රමට ගිය විට බුදුරදුන් ගේ ගඳ කිළියෙහි සකසා තිබුණු වියන දැක ඒ තමා ඒකසාටකට පිරිනැමූ විල්ලුද වස්ත්‍රය බව හඳුනා ගත්තේය. මෙවර වඩාත් පැහැදුණු රජතුමා සබ්බචතුක්ක ත්‍යාගය නමින් එක් වර්ගයෙන් හතර බැගින් තෑගි හත් වර්ගයක් යැවීය. ඇතුන් හතර දෙනෙක්, අසුන් හතර දෙනෙක්, සේවිකාවන් හතර දෙනෙක්, සේවකයන් හතර දෙනෙක්, පණිවුඩ කරුවන් හතර දෙනෙක්, ගම්වර හතරක් හා මුදලින් හාර දහසක් යවන්නට යෙදිණ.

මේ ත්‍යාගය පිළිබඳ පුවත ඇසූ භික්ෂූහු "ඒක සාටක බමුණා ගේ කුසල කර්මය ඇස්පනාපිට ම මහානිසංස දී ඇති ආකාරය ආශ්චර්යජනකය" යි කතිකා කළ හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ හ. "මහණෙනි, බ්‍රාහ්මණයා ප්‍රථම යාමයේදී ම ඒ වස්ත්‍රය පිදුවා නම්, එක් වර්ගයෙන් 16 බැගින් ලැබෙන්නට තිබිණ. ද්විතීය යාමයේ දී පිදුවා නම් 8 බැගින් ලැබෙන්නට තිබිණ. කෙසේ වුවද අවසන් යාමයෙහි පිදූ හෙයින් සබ්බ චතුක්ක (4 බැගින්) වශයෙන් ලැබිණ. එහෙයින් යම් හොඳක් කරන්නට සිතට අදහසක් එයි නම්, එය වහාම ක්‍රියාත්මක කළ යුතු ය. පමා කළහොත් ආනිශංස ද පමා වන අතර සිතෙහි පහළ වූ අදහස පවට නැමීම නිසා එය කර ගැනීම අපහසු වීමට ද පිළිවන.

**විවරණාත්මක අනුවාදය (116 ගාථාව)**

**කල්‍යාණෙ අභිත්ථරෙථ ,පාපා චිත්තං නිවාරයෙ පුඤ්ඤං**
**දන්ධං හි කරෝතෝ මනෝ පාපස්මිං රමති.**

**කල්‍යාණෙ**: හොඳ වැඩ (සුචරිත ධර්මයෙහි) කිරීමෙහි; **අභිත්ථරෙථ**: යුහුසුලු වන්නේ ය; **පාපා**: පව්කමින්; **චිත්තං**: සිත; **නිවාරයෙ**: වළකාගන්න; **පුඤ්ඤං**: පින් කිරිමෙහි; **දන්ධං කරොතො**: ප්‍රමාද වන්නහුගේ; **මනො**: සිත; **පාපස්මිං**: පාපයෙහි; **රමති** :ඇලෙයි.

පින් කිරිමෙහිදී උනන්දුවෙන් වහා වහා එය කළ යුතු ය. සිත පාපයෙන් වළකා ගත යුතුය. පින් කිරීමෙහි ලා පමා වුවහොත් සිත පාපයට ඇදෙන්නට ඉඩ තිබේ.

**විවරණය**

**අභිත්ථරෙථ කල්‍යාණෙ**: යහපත් දේ කෙරේ සිත යොමු වීම නිතර සිදුවන්නක් නො වේ. සිතෙහි ස්වභාවය ආකර්ශණීය වූ පංචකාමය හා පාප ක්‍රියා වෙත යොමු වීමයි. එහෙයින් පුණ්‍ය චේතනාවක් ඇති වූ වහාම පමා නො කර මැලි නොවී වහා එයකර නො ගතහොත් සිත යළිත් පහත් දෙයට ම යොමු වන්නට ඉඩ තිබේ. හොඳ දේ කිරීම උඩුගම් බලා පිහිනීමක් වැනිය.



*පව් නැවත නැවතත් නො කරන්න, එයට කැමැත්ත ද නො කරන්න. පව් රැස්වීම දුකට කරුණු ය.*

117. පාපං චෙ පුරිසො කයිරා
න තං කයිරා පුනප්පුනං
න තම්හි ඡන්දං කයිරාථ
දුක්ඛො පාපස්ස උච්චයො (9:2)

කළත් වරදක් කෙනකු වරකට
නොකළ යුතු එය තවත් වරකට
ඇළුම් නොකරනු යළි කරන්නට
වැඩී පව් වෙයි දුක් විඳින්නට

# වරකදී කළ පවු - යළි යළි නොකරවු

## 9 (2) සෙය්‍යසක තෙරුන් ගේ වත. (117 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ තථාගතයන් වහන්සේ **සෙය්‍යසක තෙරුන්** ඇරබ මේ ගාථාව වදාළ සේක.

සෙය්‍යසක තෙරණුවෝ කාළුදායි තෙරුන්ගේ හිතමිත්‍ර වූ හ. පැවිදි ජීවිතයේ ඇති විවිධ බඹසරට අදාල නීති රීති ගැන එතරම් සතුටක් උන්වහන්සේ තුළ නො වීය. අන්තිමේ උන්වහන්සේ ස්වයං ආස්වාදයට පුරුදු වූහ. උන්වහන්සේ දිගටම එසේ කරන බව බුදුරජාණන් වහන්සේටද දැනගන්නට ලැබිණ.

"සෙය්‍යසක, ඔබ මෙවැනි ක්‍රියාවක යෙදෙන බව සැබෑවක් ද?" බුදුරජාණන් වහන්සේ ප්‍රශ්න කළහ.

"එහෙමයි ස්වාමීනි."

"මෝඩ භික්ෂුව, තමන්ගේ තත්වයට නො ගැලපෙන මෙවැනි අමන ක්‍රියාවක් කරන්නට ඔබ පෙළැඹුණේ කෙසේ ද?" යි පැවසූ භාග්‍යවතුන් වහන්සේ එම ක්‍රියාවෙහි පහත් බව දක්වමින් ධර්ම දේශනා කොට ශික්ෂා ගෞරවයෙන් ක්‍රියා කරන්නැයි අවවාද කළහ. මෙවැනි අනුචණකම් වලින් සිදුවන්නේ පව් වැඩි වී දුගතියෙහි දුක් විඳින්නට බව පැහැදිලි කළ බුදුරජාණන් වහන්සේ වැරදීමකින් වරක් පව්කමක් කළ ද එය දිගින් දිගට නො කළ යුතු බව දැක්වූ හ.

### විවරණාත්මක අනුවාදය (117 ගාථාව)

**චෙ පුරිසො පාපං කයිරා තං පුනප්පුනං න කයිරා.**
**තම්හි ඡන්දං න කයිරාථ පාපස්ස උච්චයො දුක්ඛො**

**චෙ**: ඉදින්; **පුරිසො**: යම් පුද්ගලයෙක්; **පාපං**: පව්කමක්; **කයිරා**: කළේ වුවද; **තං**: එය; **පුනප්පුනං**: නැවත නැවත; **න කයිරා**: නොකළ යුතුය: **තම්හි**: එහි: **ඡන්දං**: ඇල්මක් (රුචියක්): **න කයිරාථ**: නොකරන්න: **පාපස්ස**: පව්වල **උච්චයො**: එකතු වීම: **දුක්ඛො**: දුකකි.

යමෙකු පාප කර්මයක් කළ ද එය නැවත නැවතත් නො කළ යුතුය. ඒ පාප ක්‍රියාව පිළිබඳ රුචියක් ඇති කර නො ගත යුතුය. පව් රැස්වීම දුකට හේතුවක් හෙයිනි.

### විවරණය

**කාළුදායි තෙරණුවෝ**: සෙය්‍යසක හිමියන් සුමග යැවීමේ වගකීම උන්වහන්සේගේ හිතමිත්‍ර කාළුදායි හිමියනට පැවරිණි. කාළුදායි තෙරුන් නම් බුදුරදුන් ලොව පහල වූ දිනම පහල වූ සත් රුවනින් එකකි.

(1. **ශ්‍රී මහා බෝධීන් වහන්සේ,** 2. **යශෝධරා දේවිය**, 3. **සතර මහා නිධාන**, 4. **අරෝහනීය නම් රාජකීය හස්තියා**, 5. **කන්ථක අශ්වයා**, 6. **ඡන්න ඇමති** 7. **කාළුදායි** යන හත එදා පහළ විය.

බෝසතුන් බුදු වූ පසු කපිලවස්තුවට වඩමවා ගනු වස් සුදොවුන් රජතුමා යැවූ සියලුම දූතයන් තම ගිවිසුම් අමතක කර රහත්ව පැවිදි වූ නමුත්, කාළුදායි තෙරුණුවෝ නිසි කලට භාග්‍යවතුන් වහන්සේ ගමට කැඳවා ගෙන ආහ.

**පාප**: ලෝභ, දෝස, මෝහ චේතනා මුල් වීමෙන් කය, වචනය හා සිත යන තුන් දොරින් සිදු වන සචේතනික ක්‍රියාවෝ අකුශල ක්‍රියාවෙති. අකුශල ක්‍රියාවන් ගෙන් ලැබෙන ලෞකික දුක්ඛදායක ප්‍රතිඵල ගැන සලකා ඒවා පාප වශයෙන් නම් කෙරේ. සංසාරයෙහි අපාගත කරන ජීවිතයෙහි ගුණාත්මක භාවය විෂයෙහි පාප කර්ම නිෂේධනාත්මක ලෙස බලපායි. තිරශ්චීන යෝනියෙහි හා අපායෙහි ඉපිද පාපයෙහි විපාක විඳින්නට සිදු වෙයි.

අකුසල සාධාරන චෛතසික: පාප ක්‍රියාවන්ට මුල් වන අකුසල සාධාරණ චෛතසික හතරක් ගැන අභිධර්මයෙහි දැක්වේ.

එනම්,
1. **අහිරික** - සදාචාරමය ලජ්ජාවෙන් තොර බව
2. **අනොත්තප්ප** - සදාචාරමය බිය (පවට බය) නැතිකම
3. **අසහනය** (උද්ධච්ච)
4. **මෝහ** - මුලාව යන මේ හතරයි.

**මූල**: පාප කර්මයට මුල්වන අකුශල මූල හෙවත් අකුශල හේතු තුනක් වෙයි. මේවා චේතනාවක කුසල හෝ අකුසල ස්වරූපය විනිශ්චය කරයි.

අකුශල හේතු තුන නම්, ලෝභය, දෝසය හා මෝහයයි.

ඊට ප්‍රතිපක්ෂ අලෝභ, අදෝස හා අමෝහ යන තුන කුශල මූල වෙති.

කෙනකු තුල ලෝභය උපදින්නේ ප්‍රියජනක රූප විෂයෙහි අඥාන ආකාරයෙන් දිගින් දිගට සිතීම හේතුවෙනි. අප්‍රිය ජනක රූප විෂයෙහි එසේ අඥාන ලෙස සිතීමෙන් ද්වේෂය ඇතිවෙයි. මේ දෙක තුළට සියුම් හා රළු සියලුම අනුනය-ප්‍රතිඝ මනෝ වෘත්තීන් අන්තර්ගත වේ. මෙම අකුශල චේතනාවන් මුල් කරගෙන කරනු ලබන පාප ක්‍රියා අතර ප්‍රාණඝාතය, සොරකම, කාම මිථ්‍යාචාරය, මුසාවාදය, කේලාම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම, අභිද්‍යාව, ව්‍යාපාදය, හා මිථ්‍යාදෘෂ්ටිය ඇතුළත් ය. මේවා සිදුවන්නේ ලෝභ, දෝස හෝ මෝහ පාදක වීමෙනි.

මෙම දුෂ්ට චේතනාවන්ගෙන් පිරි සත්වයෝ තමන් ගේ විනාශය පිණිස, අනුන්ගේ විනාශය පිණිස හෝ අනුන් හා තමන් යන උභය පක්ෂයේම විනාශය පිණිස ක්‍රියා කරති. කාය, චිත්ත, වාක් යන ත්‍රිවිධ ද්වාරයෙන් මෙසේ පාප ක්‍රියාවන් හි නිරත වන්නෝ ආත්මාර්ථයෙහි හා පරාර්ථයෙහි යථාරූපය නො දනිති. අවිද්‍යාවෙන් අන්ධව මෝහයෙන් මුළාව ක්‍රියා කරන ඔවුහු ආධ්‍යාත්මික ශාන්තිය විඳ නො ගනිති.

භාග්‍යවතුන් වහන්සේ "නො දැන ගිනි අඟුරු මැඩගත් කෙනෙක් එහි ම පය ඔබා නොසිට වහා පාදය ඉන් ඉවතට ගන්නා සේ, සිහිනුවණින් තොරවීමක් නිසා හෝ පාපිෂ්ඨයන් හා එක්ව විසීමක් නිසා යම්කිසි පාපකර්මයක් කළේ නමුදු එකෙණෙහිම නුවණින් මෙනෙහි කොට "මෙබඳු ලාමක ක්‍රියා කිරීම ඔබේ ජාති, ගෝත්‍ර, වයස් ආදියට නුසුදුසුය" යි සලකා වහාම ඉන් වැළකිය යුතුය"යි වදාළ සේක.





පිනක් කළේ නම් එය නැවත නැවතත් කරන්න. කුසල් රැස්වීම සැපයට කරුණුය.

118. පුඤ්ඤං චෙ පුරිසො කයිරා
කයිරාථෙතං පුනප්පුනං
තම්හි ඡන්දං කයිරාථ
සුඛො පුඤ්ඤස්ස උච්චයෝ (9:3)

පින්කම් නම් කළ යුතු වෙයි
නැවත නැවත කළ යුතු මයි
පිනට ඇළුම් කළ යුතු වෙයි
පින් වැඩි නම් සැප වැඩි වෙයි

# ලැබෙයි සැප වැඩියෙන් - කළොත් පින්කම් වැඩියෙන්

## 9 (3) ලාජා දෙවඟනගේ කථා ප්‍රවෘත්තිය (118 ගාථාව)

වේළුවනාරාමයේ... 

දෙව්රම් වෙහෙරෙහි වැඩ විසූ තථාගතයන් වහන්සේ **ලාජා නම් දෙවඟනක්** අරබයා මේ ගාථාව වදාළ සේක.

මහා කස්සප තෙරුන් වහන්සේ පිප්පලි වනයෙහි වැඩ වාසය කරන සේක් සත් දිනක් නො කඩවා සමවත් සුවයෙන් ගත කළ සේක. සමාධියෙන් නැඟී සිටි උන්වහන්සේ තමන් වහන්සේට පිඩු සිඟා වඩින්නට තැනක් විමසන සේක් එක් කුඹුරක් රක්නා ගෙවිලියක් දිවැසින් දැක ඕතොමෝ සැදැහැතියක් ද, නො එසේ නම් සැදැහැ නැත්තියක් ද යි විමසූ සේක් සැදැහැතියක් බව දැන ඕ තොමෝ තමන්ට අනුග්‍රහ කරන්නට සමර්ථවේදැයි විමසූහ. "ඕ තොමෝ නුවණැත්තී ය. කළ පින් ඇත්තී ය. ඕ තොමෝ මට අනුග්‍රහ කොට එහි පුණ්‍යර්ධිය හේතුකොට ගෙන උසස් ප්‍රතිඵලයක් ලබන්නීය"යි දැනගත් උන්වහන්සේ පා සිවුරු ගෙන ඇය රක්නා කෙත අසලට වැඩම කළ හ. ස්ථවිරයන් වහන්සේ කුඹුර අසලට වැඩ සිටිනු දුටු සැදැහැවත් ගෙවිලිය පස්වණක් ප්‍රීතියෙන් පිනා ගියාය. ඕ තොමෝ වහාම දිව ගොස් උණු බත් ගෙනවුත් ස්වාමීන් වහන්සේට පිළිගැන්වී ය. එසේ පිළිගන්වා "ස්වාමීනි, ඔබ වහන්සේ දැකගත් සත්‍යයට මම ද හිමිකරුවෙක් වෙම්වා."යි ප්‍රාර්ථනය කළා ය. "ඔබගේ ප්‍රාර්ථනය සමෘද්ධ වේවා"යි පින් දුන් තෙරුන් වහන්සේ ඇය නමස්කාර කර සමුගත් පසු ආපසු පිටත් වූ සේක.

ඒ සැදැහැති ගෙවිලිය ද තෙරුන් වහන්සේට පිළිගැන්වූ දානය පිළිබඳවම මහත් සන්තෝෂයෙන් ආවර්ජනා කරන්නී ද නිවෙස බලා යන්නට පිටත් වූවා ය. මඟ දෙපස වූයේ කුඹුරුය. කුඹුරක් අසල වූ එක් තුඹසක විෂඝෝර සර්පයෙක් වාසය කළේ ය. තෙරුන් වහන්සේ දුටු සර්ප තෙම සිවුරෙන් පා වැසී තිබුණෙන් දෂ්ඨ කරන්නට අසමත් වූයේ ය. එහෙත් කාන්තාව එතැන පසු කර යත් ම ඇය ගේ පය දෂ්ට කළේ ය. දරුණු විෂ සිරුරෙහි පැතිර ගියෙන් සිහිසුන්ව ඇද වැටුණු කාන්තාව එකෙණෙහිම මිය ගියා ය. සැදැහැ සිතින් දුන් දානය පිළිබඳව සිතමින් සිට මිය ගිය හෙයින් වහාම දිව්‍යාත්මභාවයක් ලද්දා ය. තමන් මේ දිව්‍යානුභාව ලද්දේ කවර හෙයින්දැයි බැලූ ඕ "තෙරුන් වහන්සේ නිසාය"යි දැන ගෙන උන්වහන්සේ ගේ ආරාමය පවිත්‍ර කිරීම් ආදිය කළා ය. විහාරස්ථානය මනාව පිරිසිදු කර තිබෙනු දුටු උන්වහන්සේ කිසියම් අළුත් සාමණේර නමක් හෝ පරිවාසික භික්ෂුවක් මෙය කරන්නට ඇතැයි සිතූහ. දෙවන දිනයේ ද දෙව්දුව එසේ කළ අතර තෙරුන් වහන්සේ ද එම තීරණයටම එළඹුණ හ. එහෙත් තුන්වන දින අතුගාන හඬ ඇසී කවුරුන් විසින් මෙය කරනු ලැබේදැයි දැක ගනු රිසි වූ තෙරුණුවෝ යතුරු සිදුරෙන් බැලූ හ. ශරීරයෙන් රශ්මි විහිදෙන රූප ශෝභා සම්පන්න අප්සරාව දුටු මහා කස්සප තෙරණුවෝ "කවුද ඔය අතුගාන්නේ?" යි විමසූහ. "ස්වාමීනි, ඒ මම ඔබ වහන්සේ ගේ ශ්‍රාවිකාව ලාජා" "ඒ නමින් මට ශ්‍රාවිකාවක් නැහැ" "ස්වාමීනි, මා ගෙවිලියක් ව කුඹුර රක්නා විට ඔබ වහන්සේ පිඩු සිඟා වැඩියා. එදාම සර්පයකු දෂ්ට කොට මියගිය මම ඔබ වහන්සේ ට දන් දුන් පිනින් දිව්‍යාත්මභාවයක් ලබා ගත්තා. ඉතින් මා මේ දිව්‍ය ශ්‍රී සම්පත් ලබා ගත්තේ ඔබ වහන්සේ ගේ කරුණාව නිසා. ඒ හේතුවෙන් මම ඔබ වහන්සේ ගේ කුදු-මහත් කටයුතු කරන්නට කැමැත්තෙමි. ඒ උවටැන් මගින් මට දෙව් මිනිස් දෙගතියෙහි සැපට වඩා උතුම් නිවන් සුව සලසා ගත හැකි වෙතියි සිතමි." දෙව්දුව කීවාය.

"ඊයේ මේ මිදුල අතුගා පිරිසිදු කළෙත්, පැන් පෙරා සකසා තැබුවෙත් ඔබම ද?" "එසේය ස්වාමීන් වහන්ස."

"වහාම මෙතනින් පිටවන්න දෙව්දුව. ඔබ විසින් කළ සේවා තිබේවා. නැවත මෙහි නො පැමිණෙන්නේ නම් යෙහෙකි."

"සමිඳුනි, එසේ නො කළ මැනවි. මට මෙහි කුදු-මහත් කටයුතු කර ගෙන සිට මගේ විමුක්තිය සලසා ගන්නට උපකාර වුව මැනවි."

"දෙව්දුව, කරුණාකර මෙතනින් යන්න. 'අනාගතයේ දී ධර්ම කථිකයන් බණ කියන්නට පටන් ගත් විට මහා කස්සප ස්ථවිරයන්ට කුදු-මහත් කටයුතු කර දෙන දෙව්දුවක් සිටියාය'යි කියන්න ඉඩ නො තබන්න."

ඒ ඇසූ දෙව්දුව හඬා වැලපී, ශෝකයෙන් පීඩිත හද ඇතිව, කඳුලින් පිරුණු දෙනෙතින් යුතුව ඉවත්ව ගියා ය. මේ නිමිති කරගෙන භාග්‍යවතුන් වහන්සේ මෙලොවදී මෙන්ම පරලොවදී ද සැප ලැබෙන්නේ පින් කිරීමෙන් පමණක් බව පැහැදිලි කර දී මෙම ගාථාව ද දේශනා කළ සේක.

**විවරණාත්මක අනුවාදය (118 ගාථාව)**

> **පුරිසො චෙ පුඤ්ඤං කයිරා. තං පුනප්පුනං කයිරාථ.**
> **තම්හි ඡන්දං කයිරාථ පුඤ්ඤස්ස උච්චයො සුඛො.**

**පුරිසො**: පුරුෂ තෙමේ; **චෙ**: ඉදින්; **පුඤ්ඤං**: පින්කමක්; **කයිරා**: කරන්නේ නම්; **තං**: එය; **පුනප්පුනං**: නැවත නැවත; **කයිරාථ**: කළ යුතුය; **තම්හි**: එහිම; **ඡන්දං**: ඇල්ම; **කයිරාථ**: කළයුත්තේය; **පුඤ්ඤස්ස උච්චයො**: පින් රැස්වීම; **සුඛො**: සුවදායකය.

පින් කරන තැනැත්තා නැවත නැවත පින් කිරීම සුදුසුය. පින් කිරීමට ම කැමති වීම යෝග්‍යය. පින් වැඩි වැඩියෙන් එකතු වීම සැප ලැබෙන්නට හේතු වෙයි.

**විවරණය**

**පුඤ්ඤ**: පින්. සාමාන්‍ය ව්‍යවහාරයෙහි දී කුසල් හා පින් අතර වෙනසක් නො දක්වතත් එහි සියුම් වෙනසක් තිබේ. එකම ක්‍රියාව නිර්වාණය පිළිබඳ අපේක්ෂාව මුල් කර ගෙන විග්‍රහ කරන විට කුසලයක් ලෙසද දිව්‍ය-මනුෂ්‍ය සම්පත් ලැබීම පිළිබඳ දෘෂ්ටියෙන් විග්‍රහ කරන විට පින් වශයෙන් ද හඳුන්වනු ලැබේ. සෑම කුසල කර්මයකින් ම අනිවාර්යයෙන් පින්සිදු වේ.



*පව් කළ තැනැත්තා පව් පල දෙනතාක් එහි යහපත දකී. පව් පල දෙන කල එහි විපාක දුක් දකී.*

119. පාපො'පි පස්සති භද්‍රං
යාව පාපං න පච්චති
යදා ච පච්චති පාපං
අථ පාපො පාපානි පස්සති (9:4)

මෝරන තුරු කළ පාපය
කරන අයට පව් මිහිරිය
මේරූ දවසට පාපය
ගෙන එයි ඔහු වෙත සාපය

# මෝරන තුරු - පව සුමියුරු

## 9 (4) අනේපිඩු සිටු වත (119 සහ 120 ගාථා)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වාසය කළ කීර්තිමත් දානපති **අනාථපිණ්ඩික සිටුවරයා** ඇරබ මේ ගාථා දෙක දේශනා කළ සේක.

භාග්‍යවතුන් වහන්සේට දෙව්රම් වෙහෙර තනා දීමට පමණක් කෝටි පණස් හතරක් වියදම් කළ අනේපිඩු සිටාණෝ සිරිතක් වශයෙන් දිනපතා තුන් වරක් බුද්ධෝපස්ථානයට පැමිණියහ. විහාරස්ථානයට යන හැම විටම කුඩා සාමණේරවරු පැමිණ "අපට මොනවාද ගෙනාවේ? යි මගේ අත බලා විමසති"යි සිතමින් යමක් රැගෙන යයි. කිසිවිටෙක හේ හිස් අතින් නො යයි.

සාමාන්‍යයෙන් උදේ යන විට හේ කැඳ ගෙන යයි. උදේ හීල් දානයෙන් පසු යන්නේ නම්, එළඟි තෙල්, වෙඬරු වැනි යමක් හෝ ගිලානපච්චය ගණයට වැටෙන දෙයක් ගෙන යයි. සවස් වරුවෙහි යන විට සුවඳ විලවුන්, මල් දම් වැනි දෙයක් හෝ සිවුරු පිරිකර ගෙන යයි. සිටුතුමාට අතමිට සරු හෙයින් බොහෝ අය ඔහුගෙන් ණය ගනුදෙනු කරති. මෙසේ වෙළඳුන්ට දුන් ණය වලින් කෝටි දහ අටක් ආපසු ගෙවනු නො ලැබිණ. මේ අතර ඔහුගේ පවුලේ නිධන් කර තිබුණ ධනයක් වූ කෝටි දහ අටක් ගංවතුරට අසුව ගසා ගෙන ගියේ ය. මේ හේතුවෙන් සිටුතුමාට ආර්ථික දුෂ්කරතා ඇති විය. එහෙත් ඒ නො හඟවා සුපුරුදු පරිදි සංඝයා වහන්සේලාට දන් දීමේ කටයුතු කර ගෙන ගියේ ය. කෙසේ වුව ද පෙර මෙන් ප්‍රණීත ආහාර-පානාදිය සපයන්නට අපහසු වූ හෙයින් දාන වස්තු සාමාන්‍ය තත්වයෙන් සකසන ලදි.

දිනක් භාග්‍යවතුන් වහන්සේ සිටුතුමාගෙන් "ඔබ නිවසේ බුදු පාමොක් මහ සඟ රුවනට නො කඩවා දන් පිළියෙල වෙනවා නො වේද?" යි විමසූ විට "ස්වාමීනි, එසේ ය. එහෙත් ආහාර ප්‍රණීත නැත. නීරස අහර සහ ඇඹුල් කැඳ බොහෝ විට පිරිනමන්නට සිදුවෙයි." ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "සිටුවරය, මා බුදු පාමොක් මහ සඟනට පිරිනමන්නේ නීරස අහර යැයි දුක් නො වන්න. චේතනාව පිරිසිදු නම් බුද්ධාදී උතුමනට දෙන ආහාර නීරස වන්නේ නැත." යි වදාළ හ. අනේපිඩු සිටාණන්ගේ මැදුරෙ හි ප්‍රවේශයෙහි එක් දෙව්දුවක් වාසය කළා ය. බුදුරදුන් හා අනඳ හිමියන් පිවිසෙන විට උන්වහන්සේලාගේ ගුණ මහිමය නිසා ඇයට බිමට බැස ගරු කරන්නට වෙයි. නිතර නිතර එසේ කිරීමෙන් පීඩාවට පත්ව උන් ඕ දැන් සිටුතුමා ආර්ථික අහේනියට මුහුණ පා සිටින හෙයින් ඔහුට කරුණු කියා උන්වහන්සේලා ගේ ගමන නවතන්නෙමි යි සිතා රාත්‍රියෙහි සිටුතුමා ගේ නිදන කාමරයෙහි අහසෙහි පෙනී සිටියා ය. "මේ කවුදැයි" සිටුතුමා ප්‍රශ්න කළ විට "සිටුතුමනි, මම ඔබගේ වාසල වාසය කරන දේවතාවා වෙමි. මම ඔබට අවවාදයක් කරනු සඳහා පැමිණියෙමි" යි පැවසුවා ය. "හොඳයි ඔබට කියන්නට ඇති දේ කියන්න" යි සිටු තෙම පැවසීය.

"සිටුතුමනි, දුර දිග නොබලා ගෞතමයන් ගේ ශාසනය වෙනුවෙන් වියදම් කිරීම නිසා ඔබ දැන් දුප්පත්ව සිටියි. එහෙත් තවමත් ඔබ කරන්නේ ඉවරයක් නැතිව දන් දීම ය. මෙසේ කරගෙන ගියහොත් තව ටික දිනකින් කෑමට ඇඳීමටවත් දෙයක් නැති තත්ත්වයට ඔබ වැටෙනු ඇත. ඔබට ඔය ගෞතමයන් ගෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? දානපතිකම් මඳකට නවතා තමන්ගේ ව්‍යාපාර ගැන සිත යොදවන්න." දෙව්දුව කීවා ය.

"ඔය ඔබ මට දෙන්නට ආ අවවාදය ද?"

"එසේ ය සිටුතුමනි. ඔබේම යහපතට එය ඔබට පැවසුවෙමි."

"එසේ නම් මේ පලාතේවත් නො සිට දුරින් දුරටම යන්න. ඔබ වැනි අය ලක්ෂයක් අවුත් කීවත් මගේ ගමන් මග වෙනස් නො වනු ඇත. ඔබ මට කීවේ ඔබට අයිති නැති දෙයකි. මගේ නිවසේ විසීමෙන් පලක් නැත. වහාම බැහැර වෙනු."

සිටුතුමා එසේ පැවසූ පසු තවදුරටත් ඒ මැදුරෙහි වසන්නට අසමත් වූ දෙව්දුව තම දරුවන් ද රැගෙන පිට වූවා ය.

(මතු සම්බන්ධයි)

**විවරණාත්මක අනුවාදය (119 ගාථාව)**

**යාව පාපං න පච්චති පාපො අපි භද්‍රං පස්සති. යද ච පාපං පච්චති අථ පාපො පාපානි පස්සති.**

**යාව**: යම්තාක්; **පාපං**: පව්කම; **න පච්චති**: මෝරා නොගියේ ද (එතෙක්); **පාපො අපි**: පව් කරන්නා ද; **භද්‍රං**: (එය) යහපත් සේ; **පස්සති**: දකියි; **යද ච**: යම් දිනක; **පාපං**: පාප කර්මය; **පච්චති**: විපාක දේද; **අථ**: එකල්හි; **පාපො**: පව්කරන්නා; **පාපානි**: දුර්විපාක; **පස්සති**: දකියි.

පව්කම් කරන පුද්ගලයා පාපය මෝරා යනතුරු එහි ආස්වාදනීය පැත්ත දකියි. පාපය මෝරා ගිය දිනට හේ එහි විපාකය විඳියි.





*පින් කළ තැනැත්තා ද පින්පල දෙනතුරු එය අපහසු සේ දකී. පින්පල දෙන කල එහි යහපත දකී.*

120. භද්‍රෝ’පි පස්සති පාපං
යාව භද්‍රං න පච්චති
යදා ච පච්චති භද්‍රං
අථ භද්‍රෝ භද්‍රානි පස්සති (9.5)

මෝරන තුරු කළ පින්කම්
නො දනිති එහි වටිනාකම්
මේරූ දින පින් කළ දන
විඳිති මිහිරි ඵල පින්කම්

# මෝරා ගොස් එල දෙන තුරු - පිනත් පෙනේ පවක් අයුරු

## 9 (4) අනේ පිඬු සිටු වත (119 - 120 ගාථා) (ඉතිරි කොටස)

නවතින්නට මැදුරක් සොයමින් සැවැත් නුවර පුරා සැරිසැරුව ද ඇයට තැනක් නො ලැබිණි. "දැන් කරන්නට දෙයක් නැත. මම සිටුතුමා සමා කරවා ගෙන නැවත එතුමා ගේ නිවසේම වාසයට අවකාශ ලබා ගත යුතු ය"යි සිතූ ඕ තොමෝ නගරාරක්ෂක දේවතාවාණන් වෙත ගොස් "කරුණාකර මා සිටුතුමාණන් වෙත කැඳවා ගෙන යන්න. මට එතුමා ගෙන් සමාව ලබා ගන්න අවශ්‍යය"යි කීවා ය.

"ඔබ කර ඇත්තේ අයිති නැති වැඩකි. වරද ඉතා බරපතල හෙයින් සිටුතුමා වෙත ඔබ කැඳවා ගෙන යන්නට මම අකමැත්තෙමි"යි හේ ප්‍රතික්ෂේප කළේ ය. අනතුරුව ඕ හතරවරම් දෙවියන් වෙත ගියා ය. එහෙත් ඔවුහු ද ඇයට උදව් කිරීම ප්‍රතික්ෂේප කළ හ. අනතුරුව ශක්‍ර දේවේන්ද්‍රයා හමුවට ගිය ඕ සිදු වූ සියල්ල හෙළි කොට ඉතා යටහත්ව මෙසේ කීවා ය. "මට වාසයට කිසිම තැනක් නැත. මට කෙසේ හෝ මා විසූ තැනම ලබා දුන මැනවි." ඒ අසා සිටි ශක්‍ර දේවේන්ද්‍රයෝ සිටුතුමාට මේ ගැන කියන්නට මම ද අසමත් වෙමි. එහෙත් ඔහු සමා කරවා ගන්නට හොඳ උපක්‍රමයක් මම කියා දෙමි"යි පැවසූ හෙයින් "මැනවි ස්වාමීනි, කියා දෙනු මැනවි" යි ඕ කීවා ය.

"යන්න, සිටුතුමා ගේ සේවකයකු ගේ වෙස් ගන්න. සිටුතුමා අතින් ලියූ ණය කරුවන් ගේ ලැයිස්තුවක් ලබා ගන්න. ඔබ ගේ දිව්‍යමය තේජස, බල මහිමය යොදවා ණය ගත්තවුන් ගෙන් ලැබෙන්නට ඇති දහ අට කෝටිය එකතු කර සිටුතුමා ගේ භාණ්ඩාගාරය පුරවන්න. ගංවතුරට අසු වී මහ මුහුදට ගිය සිටු තුමා ගේ දහ අට කෝටියක් රන් කහවණු ද ගෙන'වුත් එහි පුරවන්න. තවත් රට පුරා තැන් තැන් වල අස්වාමික ධනය නිදන්ව තිබේ. ඒවායිනුත් දහ අට කෝටියක් ගෙනවුත් ගබඩාවෙහි තබන්න. මේ සියල්ල කළ විට එතුමා ගේ භාණ්ඩාගාරය පිරෙනු ඇත. මෙසේ කළ විට ඔබේ වරදට දඬුවම ලැබුණා හා සමාන වෙයි. අනතුරුව ගොස් සිටුතුමා සමා කරවා ගන්න." ශක්‍ර දේවේන්ද්‍රයා මේ ක්‍රමය කියා දුන් විට එයට එකඟ වූ දෙව් දුව ඒ සියල්ල කර, නිමවූ පසු සිටුතුමා ගේ ඇතුළු ගැබෙහි ශරීරාලෝකය විහිදුවමින් අවකාශයෙහි පෙනී සිටියා ය.

"ඔබ කවුද?" සිටුතුමා ප්‍රශ්න කළේ ය. "ඒ මම, ඔබතුමා ගේ නිවසේ සිටි අන්ධ බාල දෙව්දුව. මම මගේ වරද පිළිගෙන ශක්‍ර දේවේන්ද්‍රයා දුන් උපදෙස් පරිදි, ඔබතුමා ගේ භාණ්ඩාගාරය කෝටි පනස් හතරක් රන් කහවණු වලින් පිරවූයෙමි. මගේ වරදට මම පිළියම් කළෙමි. මට වාසය පිණිස වෙනත් ස්ථානයක් නො මැත. එහෙයින් මම දුකට පත්ව වෙසෙමි" යි ඕ කීවා ය.

අනේපිඬු සිටුතුමා ද "මේ දෙව්දුව ඇය කළ වරදට පිළියම් කළ බව කියයි. ඇය ගේ වරද පිළිගනියි. මම ඇය බුදුරදුන් හමුවට පමුණුවන්නෙමි" යි සිතා ඇය තථාගතයන් වහන්සේ හමුවට කැඳවා ගෙන ගොස් "ඔබ කළ සියළු දේ කියන්න" යි පැවසී ය.

බුදු පාමුල වැඳ වැටුණු දෙව්දුව "ස්වාමීනි, මාගේ නො දැනුවත්කම නිසා, ඔබවහන්සේගේ කීර්තිමත්භාවය නො දැන පාපී වචන පැවසුවෙමි. මාගේ එම දුර්වචන වලට සමාවන සේක්වා!" යි පැවසුවා ය. මෙසේ ඒ දෙව් දූ තොමෝ බුදුරදුන් හා සිටුතුමා සමා කරවා ගත්තී ය.

පින් හා පව් මුහුකුරා යන අයුරු ගැන දෙව් දුව හා සිටුතුමා අමතා ධර්ම දේශනා කළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා දෙක වදාළ සේක.

### විවරණාත්මක අනුවාදය (120 ගාථාව)

**යාව භද්‍රං න පච්චති භද්‍රෝ අපි පාපං පස්සති. යදා ච භද්‍රං පච්චති අථ භද්‍රො භද්‍රානි පස්සති.**

**යාව**: යම්තාක්; **භද්‍රං**: කුශල කර්මය; **න පච්චති**: විපාක නො දේද (එතෙක් කල්); **භද්‍රෝ අපි**: කුශල් කළ තැනැත්තේ ද; **පාපං**: (එය) නපුරු සේ; **පස්සති**: දකියි; **යදා ච**: යම් දිනක; **භද්‍රං**: කුශල කර්මය; **පච්චති**: විපාක දේද; **අථ**: එකල්හි; **භද්‍රො**: කුශල් කරන්නා; **භද්‍රානි**: ඉෂ්ටවිපාකයන්; **පස්සති**: දකියි.

යම්තාක් කල් කුශල කර්මය විපාක නො දේ ද එතෙක් කල් කුශල් කර්ම කරන පුද්ගලයා එය නපුරු සේ දකියි. කුශල කර්මය මෝරා ගිය දිනට ඔහු එහි ඉෂ්ට විපාකයන් දකියි.

### විවරණය

**අනාථපිණ්ඩික සිටුතුමා**: (අනේපිඬු සිටුතුමා) භාග්‍යවතුන් වහන්සේට සිටි ප්‍රධාන දයකයා ය. ඔහු ගේ නියම නම 'සුදත්ත' ය. එහෙත් භාග්‍යවතුන් වහන්සේගේ දායකයකු බවට පත්ව දානපතියකු වූ පසු 'අනාථයන්ට උපකාර කරන තැනැත්තා' යන අරුතින් 'අනාථපිණ්ඩික' නම යෙදිණි. ඔහු උපන්නේ සැවැත් නුවර ය. බුදුරජාණන් වහන්සේට ආරාමයක් පූජා කරනු පිණිස ඉඩමක් සෙවූ හෙතෙම ජේත කුමාරයා ගේ උද්‍යානය රන්කාසි අතුරා මිළයට ගෙන, ජේතවනාරාමය ඉදි කර බුදුරජාණන් වහන්සේට පූජා කළේ ය.

**අථ පාපො පාපානි පස්සති**: පව් කරන පුද්ගලයෝ තමන් ගේ පැරණි පින්වල භුක්ති විඳිමින් සුවසේ වෙසෙනු අපි දකිමු. වර්තමාන පාප එක් රැස් වෙද්දී පැරණි කුසල් විපාක දෙයි. මේ දක්නා සාමාන්‍ය ජනයා එහි අසාධාරණයක් දකිති. ඇතැම් විට පාපයට විපාක නැතැයි වැරදි දෘෂ්ටි පවා ඇති කර ගනිති. එහෙත් එය මුලාවක් පමණි. අනිවාර්ය ස්වභාව න්‍යායක් වූ කම්ම නියාමය අනුව පාපයෙහි විපාක යම් දිනක ලැබෙනු ඇත. එසේ වූ කල පාපියා පාප විපාක දැන ගනියි.

**අථ භද්‍රෝ භද්‍රානි පස්සති**: කුසල් කරමින් ජීවත් වන යහපත් පුද්ගලයෙක් වුව ද අතීත පාප විපාක විඳිමින් සිටින විට කුසල විපාකය ගැන සමහරුන් විමතියට පත් විය හැක. එහෙත් එක් රැස් වන පුණ්‍ය විපාකය ඔහුට ඊට උචිත අවස්ථාවක ලැබෙනු ඇත.



*අකුසලය සුලු යැයි අවමන් නො කරන්න. මඳ මඳ වුව ද පව් රැස් කරන අනුවණයා පවින් පිරේ.*

121. මාප්පමඤ්ඤේථ පාපස්ස
න මං තං ආගමිස්සති
උදබින්දු නිපාතෙන
උදකුම්භො'පි පූරති
පූරති බාලො පාපස්ස
ථොක ථොකම්පි ආචිනං (9:6)

පව සුළු කොට නොතකන්නේ
පල නොදෙතියි සිතමින්නේ
දිය බිඳ බිඳ රැස්වන්නේ
දිය කලයක් පිරැවෙන්නේ
අමන බාල ජනයන්නේ
ටික ටික පව් ගොඩ වන්නේ

# පව් සුළු කොට නොතකන්නේ

## 9 (5) නොසැලකිලිමත් භික්ෂුවක් (121 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ ආරාමයට අයත් ගෘහ භාණ්ඩ නාස්ති කළ **භික්ෂුනමක්** අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

එම භික්ෂුන් වහන්සේ පන්සලේ කව්ච්චි, පුටු, බංකු, ඇඳන් ආදී කවර භාණ්ඩයක් වුව ද, පාවිච්චි කර මිදුලේ එලිමහනේ දමයි. ඒවා වැස්සට තෙමී හානියට පත් වේ. සමහර ඒවා වේයන් විසින් හානි කරනු ලැබේ. මෙසේ භාණ්ඩ විනාශයට යන ආකාරය දැක භික්ෂූහු මේ වගකීමෙන් තොර නාස්තිකාර ස්වරූපය ගැන දොස් පැවරූ විට "මම මේවා නාස්ති කරන්නේ නෑ. බලන්න, ඒ තරම් ලොකු නාස්තියක් වෙලා නැහැනේ?" යි කියයි. එහෙත් දිගටම නාස්තිකාරකම් කරයි.

මේ නාස්තිකාර භික්ෂුව ගැන බුදුරජාණන් වහන්සේට ද සැල විය. "මහණ ඔබ මෙසේ කිරීම වැරදි ය. පාපක්‍රියා ගැන සැහැල්ලුවෙන් නො සිතන්න. යමක් සුළු සේ පෙනුන ද ක්‍රමයෙන් එය විශාල විය හැකිය" යි අවවාද කොට මේ ගාථාව වදාළ හ.

### විවරණාත්මක අනුවාදය (121 ගාථාව)

**තං මං න ආගමිස්සති පාපස්ස මාප්පමඤ්ඤෙථ (පාපං අප්පං මාවමඤ්ඤෙථ) උදබින්දුනිපාතෙන අපි උදකුම්භො පූරති. ථොකථොකං අපි ආචිනං බාලො පාපස්ස පූරති**

**තං**: ඒ සුළු අකුශලය; **මං**: මා කරා; **න ආගමිස්සති**: (විපාක වශයෙන්) නො එන්නේ යයි; **පාපස්ස**: පාපයට; **මාප්පඤ්ඤෙථ**: අවමන් නො කරන්නේය; නොහොත්; **පාපං**: පාපය; **අප්පං**: ස්වල්පයයි; **මා වමඤ්ඤෙථ**: නො සිතන්නේය; **උදබින්දුනිපාතෙන අපි**: (එක් එක්) දිය බිඳ එකතුවීමෙන්; **උදකුම්භො**: දිය බඳුන; **පූරති**: (යම් සේ) පිරේ ද; (එමෙන්) **ථොක ථොකං අපි**: ටිකින් ටික වුව ද; **ආචිනං**: (පව්) රැස් කරණ; **බාලො**: අඥාන තෙමේ; **පාපස්ස**: පාප කර්මයෙන්; **පූරති**: පිරෙයි.

අකුශලය ඉතා සුළු යැයි සිතමින්, එය මට විපත් පිණිස නො පවතී යැයි අවමන් නො කරන්න. දිය බින්දුව, බින්දුව බැගින් එකතු වීමෙන් හිස් කලය පවා පිරෙයි. එසේම ටිකින් ටික පව් එකතු වීමෙන් පව්කාරයා ද පවෙන්ම පිරෙයි.

### විවරණය

භික්ෂු නමක ගේ එක් යුතුකමක් නම් විහාරස්ථානයක ඇති කුදු මහත් පරිෂ්කාර, උපභෝග පරිභෝග භාණ්ඩ ආරක්ෂා කිරීමයි. ඒවා සඟ සතු කොට පිදූ දේපල හෙයින් ඒවා ආරක්ෂා කළ යුතු ය.

සංඝ සන්තක දේපල ආරක්ෂා කිරීම පිණිස එවිට සංවිධාන හා උපදේශ බුද්ධ කාලයේ සිට ම යෙදී තිබිණි. සංඝයා වහන්සේලා ට පිරිනමනු ලබන පූජා වස්තු ගරු භාණ්ඩ හා ලඝු භාණ්ඩ වශයෙන් දෙ වැදෑරුම් ය. ඒවායින් ගරු භාණ්ඩ ආරාමයට අයත්ය. ඒවා බෙදනු නො ලැබේ. බෙදනු ලබන භාණ්ඩ සඳහා භික්ෂුන් වහන්සේලා අතුරින් ම නිල දරන පිරිසක් පත්ව සිටි බව දැක්වයි. මුව පිස දමන තුවා භාරගෙන බෙදන්නට සිටි හිමි නම මුඛ පුඤ්ඡක චොළ භාජක නම් විය. සිවුරු බෙදන භික්ෂුව චීවර භාජක නම් විය. මේ ක්‍රමයට විශාල පිරිසක් ඉතා සැලකිල්ලෙන් සාංඝික දේපල පරිහරණය කළ හ.

ආරාමය වුව ද අතුගා, මකුළු දැල් කඩා, බිම රතු පැහැ ගල්වා ප්‍රියංකර පෙනුමෙන් තබා ගත යුතු විය. මිදුල් අතු පතු ගා තබා ගත යුතුය.

සඟ සතු දේපල අනිසි ලෙස පරිහරණය කරන භික්ෂුන්ට පාචිත්තිය අපත්තියක් සිදුවයි. එම නීතිය පාචිත්තිය පාලියෙ හි දක්වා ඇත.

සංඝයා වහන්සේලා විසින් තමන්ට පිරි නැමෙන දේපල පරිහරනය කරන ආකාරය ක්‍රමානුකූලව වර්ධනය වී විශේෂ පාලන සංවිධානයක් ඇති විය. ලංකාවේ ජේතවන විහාරය පාලනයට එබඳු විශේෂ කමිටුවක් පිහිටුවා ගෙන තිබිණ. දිනපතා අය වැය වාර්තා තැනීම, සති පතා, මාස් පතා වාර්තා තැනීම ගැන හා වාර්ෂික අය වැය සමාලෝචනය ගැන දීර්ඝ විස්තර එහි දැක්වයි. ආරාම දේපල පාලනය ගැන මුල් විනය පිටකයෙහි නො වූ විස්තර පසුව සකස් වූ පාලි මුත්තක විනයෙහි දැක්වේ.

භික්ෂුනමකට පෞද්ගලික වස්තුව වශයෙන් ඇත්තේ අට පිරිකර පමණි. තනි පට සිවුර, දෙපට සිවුර, අඳනය, පටිය, ඉඳිකටුව හා නූල්, පාත්‍රය, පෙරහන් කඩය සහ දැලි පිහිය එම අට පිරිකර ය. මෙම පෞද්ගලික පිරිකර වුව ද භික්ෂු නමකගේ මරණයෙන් පසු සාංඝික වවයි.

භික්ෂුන් වහන්සේලා සැදැහැයෙන් පිදූ දේ නාස්ති නො කර උපරිම වශයෙන් ප්‍රයෝජන ගන්නා ආකාරය සිවුරු විශාල ප්‍රමාණයක් ලැබුණු අවස්ථාවක එවායෙන් කරන්නේ කුමක්දැයි විමසනු ලැබූ විට දුන් පිළිතුරු වලින් පෙනේ. අළුත් සිවුරු ලැබුණු විට පරණ සිවුරු අත පිස දැමීමට, පාපිසි හැදීමට වැනි දේට යොදනු ලැබේ. එයින් පසු වෙනත් ප්‍රයෝජනයක් ගත නොහැකි තත්වයට ආ විට හීනියට කපා මැටි සමඟ අනා බිත්ති සැදීමට ගනිති. ඒවා කවර හේතුවක් නිසාවත් නාස්ති කරනු නො ලැබේ.





*කුසලය සුලු යැයි අවමන් නො කරන්න. මඳ මඳ වුව ද කුසල් රැස් කරන නැණවතා පිනෙන් පිරේ.*

122. මාප්පමඤ්ඤේථ පුඤ්ඤස්ස
න මං තං ආගමිස්සති
උදබින්දුනිපාතෙන
උදකුම්භොපි පූරති
පූරති ධීරෝ පුඤ්ඤස්ස
ථොකථොකම්පි ආචිනං (9:7)

පින සුළු කොට නො තකන්නේ
ඵල නොදෙති යි සිතමින්නේ
දිය බිඳ බිඳ රැස්වන්නේ
හිස් කලයක් පිරැවෙන්නේ
දැන නුවණැති ජනයන්නේ
ටික ටික පින් වැඩිවන්නේ

# පින් රැස් වේවි - ටික ටික එක් වී

## 9 (7) බිලාලපාදක සිටුවරයාගේ කතා වස්තුව (122 ගාථාව)

**බිලාලපාදක** නම් සිටුවරයකු මුල් කර ගෙන භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කර වදාළේ දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි ය.

සැවැත් නුවර එක් තැනැත්තෙක් බුදුරදුන් වෙතින් ධර්ම ශ්‍රවණය කර පැහැදී උන්වහන්සේ වදාළ ධර්මයට අනුව ජීවත් වන්නට තීරණය කළේ ය. බුදුරදුන් එදා දේශනා කළේ දන් දීම ගැන ය. තමා පමණක් දන් දීම වෙනුවට අනුන් ද එක් කර ගෙන දන් දීමෙන් යස ඉසුරු පමණක් නොව පරිවාර සම්පත්තිය ද ලැබෙන බව උන්වහන්සේ ඉගැන්වූ හ. එහෙයින් තමා ද එසේ කළ යුතු යැයි සිතූ හෙතෙම පසු දින දානය සඳහා බුද්ධ ප්‍රමුඛ සංඝයාට ආරාධනය කළේ ය. අනතුරුව හේ ගෙයින් ගෙට යමින් හෙට දින පිරිනැමෙන දානයට තමා සමඟ එක් වන සේ ජනතාවට ඇරයුම් කරමින් ඔවුන් දාන වස්තු සම්පාදනයට හවුල් කර ගත්තේ ය. ඔහු ගේ මේ ක්‍රියාව බලා සිටි බිලාලපාදක නම් සිටුවරයෙක් එය විවේචනය කළේය.

"මේ මිනිසා තමන්ට කරගන්නට බැරි තරම් විශාල සඟ පිරිසකට දනට ඇරයුම් කළේ ඇයි? තමන්ට කරන්න බැරි දේ බාර ගෙන අනුන්ට කරදර කරනවා" යි පවසමින් සිතා ඉතා සුළුවෙන් පමණක් උදව් කරන්නට තීරණය කළේ ය.

හේ බඳුනකට හාල් ස්වල්පයක්, වෙඬරු ස්වල්පයක් හා හකුරු ටිකක් දුන්නේ ය. දාන වස්තු රැස් කරන්නෝ එය අනිකුත් ආහාර සමඟ මිශ්‍ර නො කර වෙනම තබා ගත්තෝය. මෙසේ කරන්නේ සිටුවරයෙක් දුන් ආහාර ස්වල්පයක තරම යැයි අනුන්ට පෙන්වා තමන්ට නිග්‍රහ කරන්නට විය හැකි යැයි සිතූ බිලාලපාදක තමන් දුන් දාන වස්තුවට  කරන්නට යන්නේ කුමක්දැයි බලා ගන්නැයි සේවකයෙක් යැවීය.

දානය සංවිධානය කළ පුද්ගල තෙම සිටුවරයාට කුසල් වැඩිවීම සඳහා යැයි ඔහු දුන් ආහාරය ඉතා ස්වල්පය බැගින් ගෙන පාත්‍ර රාශියකට බෙදුවේ ය. සේවකයා මේ පුවත බිලාලපාදකට දැනුම් දුන් නමුත් දායකයා එසේ කළේ කවර හේතුවෙන් දැයි හරි හැටි තේරුම් ගන්නට අසමත් වූ හෙතෙම එය තමන් ලජ්ජාවට පත් කිරීම සඳහා ම කළ ක්‍රියාවක් සේ වරදවා වටහා ගත්තේ ය. එහෙයින් දායකයා සමඟ වෛර බැඳගත් හෙතෙම පසුදින දානය දෙන ස්ථානයට ගියේ උල් පිහියක් ද රැගෙන ය.

"සමහර විට ඔහු මා දුන්නේ ඉතා ස්වල්පයක් බව සබා මැද කියා මා ලජ්ජාවට පමුණුවන්නට ඉඩ තිබේ. එසේ කළහොත් ඔහු එතැනම මරා දමමි" යි ඔහු සිතා ගෙන තිබිණි.

එහෙත් දායක තැන බුදුරදුන් අමතා මෙසේ පැවසීය. "ස්වාමීනි, මෙය සම්මාදම් කර දෙන දානයකි. කවුරුන් වැඩියෙන් දුන්නා ද?, කවුරුන් අඩුවෙන් දුන්නා ද? යන්න ප්‍රශ්නයක් නො වේ. අප කවුරුත් සම්මාදම් වූයේ ශ්‍රද්ධාවෙනි. එහෙයින් සෑම දෙනාටම එකම තරමින් පින් සිදු වේවා!" මේ ඇසූ බිලාලපාදකට තමන් දායක තැන වරදවා වටහා ගත් බව අවබෝධ විය. "මා මොහුට කළේ බලවත් වරදකි. මා සිතූ පාපී සිතුවිලි මෙතුමාට කියා සමා කර නො ගත්තොත් මට සිදු වන්නේ සතර අපායෙන් එකක දුක් විඳීමටය." එසේ සිතූ හෙතෙම ඔහු වෙත ගොස් "මා මිතුර, මම ඔබට ලොකු වරදක් කළෙමි. මම ඔබ වරදවා තේරුම් ගත්තෙමි. කරුණාකර මට සමා වනු මැනවි" යි ප්‍රකාශ කළේය.

මේ සමාව යැදීම බුදුරදුන්ගේ සවනට ද ඇසිණි. ඔහු කැඳවා සියළු පුවත් අසා දැනගත් භාග්‍යවතුන් වහන්සේ "උපාසකය, පිනක් සුළුයයි කිසිවිට නො සිතන්න. කෙතරම් සුළු වුව ද පින නම් වැදගත් ය. සුළු සුළු පින් එක් වීමෙන් දිනෙක එය මහා පුණ්‍යස්කන්ධයක් බවට පත්වන්නේ ය" යි පැහැදිලි කර මේ ගාථාව වදාළ සේක.

**විවරණාත්මක අනුවාදය (122 ගාථාව)**

**තං මං න ආගමිස්සති පුඤ්ඤස්ස මා අවමඤ්ඤෙථ (පුඤ්ඤස්ස අප්පං මා මඤ්ඤෙථ) උදබින්දු නිපාතෙන අපි උදකුම්භොපි පූරති ථොකථොකං අපි ආචිනං ධීරො පුඤ්ඤස්ස පූරති**

**තං**: ඒ සුළු කුශලයම; **මං**: මා වෙතට; **න ආගමිස්සති**: (විපාක වශයෙන්) නො එන්නේ යයි; **පුඤ්ඤස්ස**: පින්කමට; **මා අවමඤ්ඤෙථ**: අවමන් නො කරන්නේ ය නොහොත්; **පුඤ්ඤස්ස**: කුශල කර්මය; **අප්පං**: ස්වල්පයයි; **මා මඤ්ඤෙථ**: නො සිතන්නේ ය; **උදබින්දුනිපාතෙන අපි**: (එක් එක්) දිය බිඳ වැටීමෙනුත්; **උදකුම්භොපි**: දිය බඳුන; **පූරති**: පිරෙයි; (මෙසේ) පිරේ ද (එමෙන්); **ථොකථොකං  අපි**: ටික ටික වුවද; **ආචිනං**: (කුශල්) රැස් කරණ; **ධීරො**: නුවණැත්තා; **පුඤ්ඤස්ස**: කුශල කර්මයෙන්; **පූරති**: පිරෙයි.

මේ සුළු පින මට විපාක දෙන්නට සමත් නො වෙතියි සිතා පිනට අවමන් නො කරන්න. දිය බිඳ බැගින් වැටීමෙන් පිරෙන දිය බඳුනක් මෙන් නුවණැත්තා පින් ටික ටික කිරීමෙන් පිනෙන් සමෘද්ධ වෙයි.

**විවරණය**

**මාප්පමඤ්ඤේථ: මා අවමඤ්ඤේථ**: මේ ගාථාවෙහි අරමුණ පින සුළු යයි ඒ ගැන හරි ඇගයුමක් නො කරන සිරිත වෙනුවට කුඩා වුව ද පින අගය කරන්නට දහන් පෙළැඹවීමයි. කුඩා පිනක් වුව ද යහපත් අනුසස් ලබා දෙයි. ස්වල්ප වශයෙන් හෝ සිරිතක් ලෙස නිතර නිතර පින් කරන විට ඒවා එක් රැස්වීමෙන් අපට මහා පුණ්‍යස්කන්ධයක හිමිකරුවන් විය හැක. එහෙයින් සුළු පිනක් හෝ කර ගන්නට ඉඩක් ලත් විට එය පැහැර නො හළ යුතුය.




*විස දුරු කොට දිවි රැකගනු කැමැතියහු සේ පව දුරින්ම දුරැලිය යුතුය.*

123\. වාණිජෝ'ව භයං මග්ගං
අප්පසත්ථො මහද්ධනො
විසං ජීවිතු කාමො'ව
පාපානි පරිවජ්ජයෙ (9:8)

වැඩි පිරිසක් නැති - ලොකු ධනයක් ඇති
වෙළඳකු අනතුරු මඟ දුරලන සේ
සහමුලින් ම පාපය දුරලන්නේ
පණට ආදරෙන් විස දුරලන සේ

# පවු දුර ලන් - විස විලසින්

## 9 (7) මහ ධන සිටාණන් ගේ කතාව (123 ගාථාව)

දෙවිරම් වෙහෙර වැඩ වසන සමයෙහි **මහාධන සිටුවරයා** ඇරබ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළ සේක.

මහාධන සැවැත් නුවර සිටුවරයෙකි. එක් වරක් හොරු පන්සියයක් ඔහු මංකොල්ලකෑමට සැලසුම් කළ හ. එහෙත් ඔවුන්ට ඊට අවස්ථාව නො ලැබිණි. එහෙත් ඔවුහු සිටාණන් ගේ ගමන් බිමන් ගැන විමසිල්ලෙන් සිටිය හ. සිටාණන් ලඟදීම වෙළඳ භාණ්ඩ පිරවූ ගැල් පන්සියයක් ද රැගෙන බැහැර යන්නට සූදානම් වන බව ඔවුන්ට සැළවිණ.

තමන් හා එක්ව යන්නට කැමති භික්‍ෂූන් වහන්සේලා වෙත් නම් ගමනේ දී සියළු උවටැන් කරමියි පැවසූ සිටුතෙම භික්‍ෂූන් වහන්සේට තමන් හා යන්නට ඇරයුම් කළේ ය. ඒ ඇසූ පන්සියයක් භික්‍ෂූන් වහන්සේ ඔහු සමග යන්නට එකඟ වූහ. සිටුතුමා පිටත් වන බව දැනගත් සොරු කල් ඇතිව ම ගොස් අතරමග රැක සිටිය හ.

සිටුවරයා ද සොරුන් රැඳී සිටි වනාන්තර මාර්ගයට පිවිසෙන්නට පෙර වනදොර ටික දිනක් නැවතුණ හ. සොරු ද වන මගට තවලම පිවිසුණු පසු කොල්ලකෑමට සූදානම්ව බලා සිටිය හ. සොරුන් තමන් එනතුරු බලා සිටින බව සිටුතුමාට සැලවූයෙන් ගමන නවතා ආපසු යන්නට හේ තීරණය කළේ ය. සිටුතුමා ආපසු හැරුණු බව සැළ වූ සොරු කෙටි මගකින් අවුත් නිවසට යන අතරමග රැඳී සිටිය හ. සොරුන් ගේ ක්‍රියා පටිපාටිය ගැන ගම්වැසියෝ සිටුතුමාට පණිවුඩ එවූ හ. ඒ අනුව සිටුතුමා ටික දිනක් ගමෙහි ම රැඳී සිටින්නට තීරණය කර, ඒ බව භික්‍ෂූන් වහන්සේලාට ද දැනුම් දුන්නේ ය. ඒ ඇසූ භික්‍ෂූහු තනිවම සැවැත් නුවරට ආපසු ආහ.

දෙව්රම් වෙහෙරට ආපසු ආ භික්‍ෂූහු බුදුරදුන් හමුව තමන් ගමන අතහැර ආ බව ප්‍රකාශ කර සිටිය හ. බුදුරජාණන් වහන්සේ "මහණෙනි, මහා ධන ඇති මහාධන සිටුවරයා සොර සතුරන් ගැවසුණු මග මඟ හරියි. ජීවිතාශාව ඇත්තා වස විසෙන් දුරුව සිටිය යුතුය. එමෙන්ම මහණෙනි, නුවණැති භික්‍ෂුව ගමන් මග උවදුරු සේ භවත්‍රය දකිමින් පාපයෙන් වළකින්නට තීරණය කළ යුතු ය"යි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

### විවරණාත්මක අනුවාදය (123 ගාථාව)

**භයං මග්ගං අප්පසත්ථො මහද්ධනො වාණිජෝ ඉව**
**විසං ජීවිතුකාමො ඉව පාපානි පරිවජ්ජයේ**

**භයං මග්ගං**: අනතුරු සහගත මාර්ගය (හැර යන); **අප්පසත්ථො**: (කැටුව යන) වෙළඳ මුලක් නැති; **මහද්ධනො**: බොහෝ ධනය ඇති; **වාණිජෝ ඉව**: වෙළෙන්දකු මෙන් ද; **විසං**: විසක් (දුරු කරන); **ජීවිතුකාමෝ ඉව**: ජීවිතාශාව ඇති තැනැත්තකු මෙන් ද; **පාපානි**: පව්කම්; **පරිවජ්ජයෙ**: දුරු කරන්නේ ය.

සුළු පිරිසක් සමග සංචාරයෙහි යෙදෙන මහා ධනයක් ඇති වෙළෙන්දා අනතුරු සහිත මාර්ගයෙන් බැහැර වෙයි. ජීවිතාශාව ඇති පුද්ගලයා වස විස වලින් දුරු වෙයි. එසේ ම අප පාපයෙන් වැළකිය යුතු ය.

### විවරණය

**අප්පසත්ථ**: සුළු පරිමාණ තවලමක් මෙයින් අදහස් වෙයි. සත්ථ නම් ගැල්කරු කණ්ඩායමකි. වෙළඳ භාණ්ඩ වෙනත් නගර වලට ගැල් මගින් ගෙන යාම පැරණි භාරතයේ වූ වෙළඳ රටාවයි. වනගත දුර්ග මාර්ග වලින් යා යුතු නිසා ආරක්‍ෂාව පිණිස කණ්ඩායම් වශයෙන් යා යුතු ය. සොරු වනයෙහි රැක සිට වෙළඳුන් වෙත කඩා පැන මංකොල්ල කති. විශාල ගැල්සාත්තු වශයෙන් යා යුත්තේ මේ උවදුරු වැළකීමට ය.

අටුවාවල **සත්ථ** (වෙළෙන්දෙ) දෙවර්ගයක් විස්තර වෙති.

එනම්,

1. **ජංඝ සත්ථ** - තනිවම පා ගමනින් බඩු සුළු ප්‍රමාණයක් රැගෙන ගොස් විකුණන වෙළෙන්දෝ
2. **සකත සත්ථ** - ගැල්වල බඩු පටවා ගෙන ගොස් විකුණන වෙළෙන්දෝ.

මෙසේ ගැල්වල ද බඩු පටවා ගෙන වෙළඳාමේ යාම බුද්ධ කාලීන භාරතීය සමාජයේ ප්‍රචලිතව තිබිණ.

පාපානි: ලෝභ, දෝෂ, මෝහ චේතනා මුල් කරගෙන කරන කායික, වාචසික හා මානසික වශයෙන් ත්‍රිවිධ වන සංචේතනික ක්‍රියාවෝ පාප වෙති.

පුද්ගලයා පහත් බවට හෝ සතර අපායාදී දුගතියට පමුණුවන ප්‍රාණඝාතාදී දුශ්චරිත කම් පාප නම්.





*වණයක් අතේ නැති කල්හි අතින් විස ගතහැකිවාක් මෙන්ම පව් නැති කල්හි දුක් ද නැත.*

| | |
|---|---|
| 124. පාණිම්හි චෙ වණො නා'ස්ස<br>හරෙය්‍ය පාණිනා විසං<br>නාබ්බණං විසමන්වේති<br>නත්ථී පාපං අකුබ්බතො (9:9) | තුවාලයක් අත නැති විට<br>නො බියව විස ගන්න අතට<br>වැරදි නො කරනා කෙනෙකුට<br>පවක් සිදු නො වේ එලෙසට |

# දූෂිත නම් සිත - පව් සිදු වනු ඇත.

## 9 (8) කුක්කුටමිත්ත ගේ කතාව (124 ගාථාව)

වේළුවනාරාමයෙහි වැඩ වාසය කළ ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ **කුක්කුටමිත්ත** හා ඔහුගේ මිත්‍රයා අරමුණු කර ගෙන මේ ගාථාව දේශනා කළ සේක.

රජගහ නුවර එක් සිටුවරයකුට බාල වියේදීම සෝවාන් වූ දියණියක් සිටියේ ය. දිනක් කුක්කුටමිත්ත නම් දඩයක්කාරයෙක් කරත්තයක් පුරා මුව මස් පටවා ගෙන වෙළඳාමේ ආයේ ය. ඔහුගේ කායික පෙනුම දුටු සිටු දියණිය ඔහු කෙරේ පෙම් බැඳ ඔහු සමග ගියා ය. ඔවුන් දෙදෙනා ගේ විවාහ ජීවිතයේ ප්‍රතිඵල වශයෙන් පුත්තු හත් දෙනෙක් උපන්හ. නිසි වයසට පැමිණි පුත්තු විවාපත් වූහ.

දිනක් ලොව බලා වදාරන භාග්‍යවතුන් වහන්සේට කුක්කුටමිත්තටත් ඔහු ගේ දරුවන් හත් දෙනාටත්, ලේලියන් හත් දෙනාටත් සෝවාන් වීමට වාසනාව ඇති බව දිස් විය. එහෙයින් ඔවුන් කෙරේ අනුකම්පාවෙන් කැලෑවෙහි කුක්කුටමිත්ත සතුන්ට උගුල් අටවන තැනට ගිය භාග්‍යවතුන් වහන්සේ උගුල අසල පිය සටහනක් තබා තුරු සෙවනක වැඩ හුන් හ.

සතෙකු උගුලට අසුවී ඇත්දැයි බැලීමට ආ දඩයක්කරුට කිසිම සතෙක් අසුවී නැති බව දැකීමෙන් සිත පෑරිණි. උගුල අසල දුටු පා සටහන දුටු හෙතෙම කවුරුන් හෝ උගුලට අසුවූ සතා මුදා හරින්නට ඇතැයි සැකයක් ඇති විය. වටපිට බැලූ ඔහුට තුරු සෙවණේ වැඩ සිටි බුදුරදුන් දක්නට ලැබිණ.

"මොහු තමයි, එකත් එකට ම සතා මුදා හළේ!" යි සිතූ හේ දුන්නට ඊ තලයක් යොදා බුදුන් නසන්නට ඊයක් විදීමට සැරසුණේ ය. එහෙත් බුදුරදුන් ගේ සෘද්ධි බලය හේතුවෙන් හෙතෙම එසේම පාෂාණිභූත වූවාක් මෙන් දුනු දිය නගා ගත් වහාම  සෙළවීගත නො හැකිව සිටියේ ය. තම පියා නිවසට ඒම පමා වත් ම අනතුරක් වූවා දෝයි සිතූ දරුවෝ පියා බුදුරදුන්ට විදින්නට සැරසී සිටින අයුරු දැක, තම පියාගේ සතුරු බුදුරදුන් යැයි සිතා තමනුත් බුදුන් විදින්නට දුනු ඊතල නගා ගත් හ. ඔවුහු ද දුනු ඊතල නගා ගත් වන ම ගල් පිළිම සේ එසේම සිටිය හ.

මෙසේ සෑහෙන වේලාවක් ගිය පසු තම සැමියා හා දරුවන් හත්දෙනා සොයා දඩයක්කාරයා ගේ බිරිඳ සිය ලේලියන් හත් දෙනා ද කැටුව ආවාය. ඔවුන් සිටි විලාසයත් භාග්‍යවතුන් වහන්සේත් දුටු ඕ "මගේ පියා මරන්න එපා"යි කියා ගෙන ඉදිරියට ආවාය. ඒ ඇසූ කුක්කුටමිත්ත "එසේ නම් මේ මගේ මාමණ්ඩිය විය යුතු යැ"යි සිතා සිත මොළොක් කර ගත්තේ ය. දරුවෝ ද "මේ අපේ සීයා විය යුතු යැ"යි සිතා ද්වේෂය ලිහිල් කළ හ. "ඔය දුනු ඊතල අහක දමන්න"යි ඕ නැවතත් කීවා ය. මේ මොහොතේ කුක්කුටමිත්ත හා දරු පිරිස ගේ සිත් මෘදුවී ඇති බව දුටු භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට අත පය ලිහිල් කර ගන්නට ඉඩ සැලසෙන පරිදි අධිෂ්ඨාන කළ හ. ඒ අනුව ඔවුනට දුනු ඊතල බිම දමන්නට හැකියාව ලැබිණි.

ඔවුහු බුදුන් වැඳ එකත්පස වූහ. ඔවුන් ඇමතූ බුදුරජාණන් වහන්සේ ඔවුනට ධර්මදේශනයක් කළ හ. දහම් ඇසූ කුක්කුටමිත්ත, පුතුන් හත්දෙනා සහ ලේලිලා හත්දෙනා ද සෝවාන් ඵලයෙහි පිහිටිය හ.

භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙරට යළි වැඩම කළ පසු ආනන්ද ස්ථවිරයන් වහන්සේ ප්‍රමුඛ සංඝයා වහන්සේලා අතර මේ සිද්ධිය ගැන සාකච්ඡා ඇති විය. භාග්‍යවතුන් වහන්සේ ඇමතූ භික්ෂූහු "ස්වාමීනි, කුක්කුටමිත්ත ගේ බිරිඳ සෝවාන් උපාසිකාවක් වූ නමුත් ඕ තොමෝ සිය සැමියාට දුනු ඊතල ගෙනැවිත් දුන්නා ය. දැල් ගෙනැවිත් දුන්නා ය. ඇය ඔහුගේ දඩයමෙහි කොටස්කරුවකු වූවා නොවේද? සෝවාන් වූ ඇය තමන් නො මරනවා පමණක් නොව මරණයට අනුබලත් නො දිය යුතු නො වේ ද?" යි ප්‍රශ්න කළ හ.

භාග්‍යවතුන් වහන්සේ ඊට පිළිතුරු දෙමින් "මහණෙනි, සෝවාන් වූවෝ නො මරති. නො මරවති. අනුබල ද නො දෙති. මෙහි දී සිදුවූයේ ඇය තම සැමියා ගේ අණට කීකරු වීමක් පමණකි. අතක තුවාලයක් නැති විට විස බීජ අත ගැටුණත්  තමාට අනතුරක් සිදු නො වන පරිද්දෙන් ඇයට අකුසලයක් සිදු නො වීය" යි පවසා මේ ගාථාව දේශනා කළ හ.

**විවරණාත්මක අනුවාදය (124 ගාථාව)**

**චෙ පාණිම්හි වණො න අස්ස, පාණිනා විසං හරෙය්‍ය,**
**විසං අබ්බණං න අන්වෙති අකුබ්බතො පාපං නත්ථි**

**චෙ**: ඉදින්; **පාණිම්හි**: අත්ලෙහි; **වණො**: වණයක් (තුවාලයක්); **න අස්ස**: නැත්නම්; **පාණිනා**: අත්ලෙන්; **විසං**: විස; **හරෙය්‍ය**: හැරගන්නේය; **විසං**: විස; **අබ්බණං**: වණයක් නැති අතට; **න අන්වෙති**: ප්‍රවිෂ්ට නො වෙයි (එසේම); **අකුබ්බතො**: පව් නො කරන්නාට; **පාපං නත්ථි**: පව් සිදු නො වෙයි.

අතෙහි තුවාලයක් නැත්නම් විස ගැන බිය විය යුතු නැත. විස සිරුරු ගත වන්නේ තුවාලයක් ඇති විට හෙයින් තුවාල නැති අතට පිවිසෙන්නේ නැත. එසේ ම වැරදි වැඩ නො කරන අයට පව් සිදු වන්නේ නැත.

**විවරණය**

**විසං**: විස මෙයින් අදහස වන්නේ තුවාල මගින් ශරීරය තුළට පිවිසෙන විෂ වර්ගී යි.

අත්ලෙහි තුවාලයක් නැත්තහු අතින් ගත් විෂ සිරුරෙහි නො පැතිරෙන්නා සේ පව්කම් කරන්නෙකුට දුනු හී ආදිය සූදානම් කර දුන්නත් තමන් කායා දී තුන් දොරින් පව් නොකරන්නාට අකුශල චේතනා රහිත හෙයින් සිද්ධ වන අකුශල කර්මයක් නැත.



*නිදොස් පුගුලෙකුට අවැඩක් කෙරේ නම් උඩු සුළඟට දැමූ දූවිලිසේ පෙරළා පැමිණේ.*

125. යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පොසස්ස අනංගනස්ස
තමෙ'ව බාලං පච්චේති පාපං
සුඛුමො රජො පටිවාතං'ව ඛිත්තො (9:10)

කෙළෙස් නැති - බැඳුම් නැති
නොමැති කිසි ලෙස දුෂ්ට
කළෝතින් දුෂ්ට කම් - එවැනි හොඳ කෙනකු හට
උඩු සුළඟෙ පිඹ හරින දූවිල්ල එන ලෙසට
පාප කර්මය ඇදෙයි - කළ අමන දන වෙතට

# අනුන්ට කළ දේ - තමන්ට පල දේ
## 9 (9) කෝක නම් වූ දඩ වැද්දා පිළිබඳ කථාව (125 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වාසය කළ භාග්‍යවතුන් වහන්සේ **කෝක** නම් වැද්දා අරමුණු කරගෙන මේ ගාථාව දේශනා කළ සේක.

දිනක් උදෙන්ම තම දඩයම් උපකරණ ද රැගෙන දඩයම් පිණිස නික්මෙන කෝක නම් වැද්දාට පිණ්ඩපාතය පිණිස නගරයට පිවිසෙන භික්ෂු නමක් මුහුණට හමු විය. එය නරක නිමිත්තක් යැයි ඔහුට හැඟිණි."මේ කාලකන්නි භික්ෂුනම මුහුණට හමු වුනු හෙයින් අද මට කිසිම දඩයමක් ලැබෙන එකක් නැත" යි හේ තමාටම කියා ගත්තේය. ඔහු සිතූ පරිදිම එදා ඔහුට 'මුසල' දවසක් විය. එකම එක සතෙකුවත් මරා ගන්නට ලැබුණේ නැත. හිස් අතින් දොම්නසින් හේ ගෙදර ආවේ ය.

ඔහු එසේ එන අතර අවාසනාවට මෙන් ඒ භික්ෂුනම ම ඔහුට හමු විය. "අද දවස අවාසනාවන්ත වුණේ මොහු මුණ ගැසුණු නිසා ය. දැනුත් මොහු මට ඇසට පේන්නට එයි" සිතා කෝපයෙන් පිපිරුණු හෙතෙම තම දඩ බල්ලන් තෙරුන් වහන්සේ වෙත උසි ගැන්වීය. බල්ලන් තමා හපන්නට එන නිසා බියට පත් භික්ෂුනම ගහකට නැග ගත්තේ ය. බල්ලෝ ගස වටා කැරකෙමින් උඩ බලමින් බුරන්නට වන් හ. ගස මුලට ගිය වැද්දා ගසේ සිටි භික්ෂුනමගේ පයට ඊතල වලින් අනින්නට පටන් ගත්තේ ය. වේදනාවෙන් දඟලන භික්ෂුනමගේ චීවරය ලිහිල් වී වැද්දා ගේ ඇඟ මත වැටිණි.

කහවත වැද්දා මත වැටුණු විට හේ එයින් වැසී ගියේ ය. බල්ලන් සිතුවේ හිමිනම බිම වැටුණු බවකි. බල්ලෝ සිවුරෙන් වැසුණු වැද්දා මැරෙන තුරු හපා කෑහ. ඒ වේදනාවෙන් වැද්දා මිය ගියේ ය.

සියල්ල සංසුන් වූ පසු ගසෙන් බැස ගත් භික්ෂුනමට වැද්දා ගේ මරණය මහත් පසුතැවිල්ලට හේතු විය. තමා ඊට වගකිවයුතුදැයි ඔහුට සැක සිතිණි. තම සැකය දුරු කරගනු රිසි වූ උන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ හමුවට ගොස් සියළු පුවත් සැළකර ප්‍රශ්න කර සිටියෙන් භාග්‍යවතුන් වහන්සේ "භික්ෂුව, සැකයක් සිත තබා ගන්නට උවමනා නැත. වැද්දාගේ මරණයට ඔබ කිසිසේත් වග කිව යුතු නැත. ඔබ ගේ ශීලයට හානියක් නැත. තමාට වරදක් නො කළ දුෂ්ටකමක් නො කළ අයකුට දුෂ්ටකම් කිරීමෙන් වැද්දා කර ඇත්තේ වරදකි. ඔහුට එබඳු ඛේදවාචකයකට මුහුණ පාන්නට සිදු වූයේ ඒ නිසා ය" යි පැහැදිලි කර, මේ ගාථාව දේශනා කළ සේක.

**විවරණාත්මක අනුවාදය (125 ගාථාව)**

**යො අප්පදුට්ඨස්ස සුද්ධස්ස අනංගනස්ස නරස්ස**
**පොසස්ස දුස්සති පාපං පටිවාතං ඛිත්තො සුඛුමො**
**රජො ඉව තං එව බාලං පච්චේති**

**යො**: යමෙක්; **අප්පදුට්ඨස්ස**: දුෂ්ටකම් නැති; **සුද්ධස්ස**: පිරිසිදු වූ; **අනංගනස්ස**: කෙලෙසුන් ගෙන් මිදුණු; **නරස්ස පොසස්ස**: නර පුරුෂයකුට; **දුස්සති**: දුෂ්ටකම් කරයි ද; **පාපං**: (ඔහු විසින් කළ ඒ) පාප කර්මය; **පටිවාතං**: උඩු සුළඟට; **ඛිත්තො**: දමන ලද; **සුඛුමො**: සියුම්; **රජො ඉව**: දූවිලි මෙන්; **තං එව බාලං**: ඒ බාලයා වෙතම; **පච්චේති**: (විපාක වශයෙන්) ආපසු එයි.

වරදක් නො කළ පිරිසිදු සිත් ඇති නික්ලේශී (කෙලෙස් නැති) උතුමකුට යමෙක් දුෂ්ටකම් කරයි නම්, උඩු සුළඟට පිඹ හල දූවිල්ලක් ආපසු තමන් වෙතම එන්නාක් මෙන් එම ක්‍රියාවෙන් ජනිත පාපය එම ක්‍රියාව කළ අඥානයා වෙත ම ආපසු එයි.

**විවරණය**

**අනංගනස්ස**: මෙහි අනංගන යන්නෙන් කෙළෙසුන්ගෙන් තොර වීම අදහස් වෙයි. අනංග නම් රාග, ද්වේෂ, මෝහ වැනි ක්ලේශයෝ ය. අංගන යන වචනයෙහි පිට්ටනිය, කහට යන වචනාර්ථ ඇත.





*ඇතමෙක් මෙලොව උපදිත්. පව් කළහු නිරයේ උපදිත්. පින් කළහු දෙව්ලොව යති. රහත්හු පිරිනිවෙති.*

126. ගබ්භං එකෙ උප්පජ්ජන්ති
නිරයං පාපකම්මිනො
සග්ගං සුගතිනො යන්ති
පරිනිබ්බන්ති අනාසවා (9:11)

සමහරු මව් කුස ට
පව් කළෝ යෙති නිරය ට
පිනෙන් සුර පුරයට
පිරිනිවී යෙති කෙළෙස් දුරු කොට

# සමහරු සසරට - සමහරු නිවනට

## 9 (10) තිස්ස තෙරණුවන් ගේ කථා වස්තුව (126 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **තිස්ස තෙරණුවන්** අරබයා මේ ගාථාව දේශනා කළ හ.

සැවැත් නුවර මැණික් කපා ඔප දමන පුද්ගලයෙක් වාසය කළේ ය . තිස්ස නම් වූ තෙර නමක් ඔහු හා මිතුරුව සිටියේ ය. නිතර මැණික් ඔප දමන්නා ගේ නිවසට ගිය හෙයින් උන්වහන්සේට 'මණිකාර කුළුපග තිස්ස' යැයි ද ව්‍යවහාර විණි. දිනක් තෙරුන් වහන්සේ ද නිවසෙහි වැඩ සිටි මොහොතක මණිකාර තෙම මස් කපමින් සිටියේ ය. එවේලෙහි රාජ දූතයෙක් රජතුමාට ඔප දමා ගැනීමට අවශ්‍ය වූ මැණිකක් රැගෙන ආයේ ය. මණිකාර තෙම ලේ මස් තැවරුණු අතින්ම මැණික ගෙන පසෙක තබා කිසියම් කාරියකට ගෙට ගියේ ය. නිවසෙහි සුරතලයට ඇති කරන කුකුළෙක් මේ අවස්ථාවෙහි ගෙට අවුත් ලේ සුවඳ නිසා මැණික ගිල දැම්මේ ය. තිස්ස හිමියෝ එය දැක්ක හ.

මණිකාරයා නැවත අවුත් බලන විට මැණික පෙනෙන්නට නො තිබුණු හෙයින් තෙරුන් වහන්සේ ගෙන් විමසී ය. එහෙත් තෙරුන් වහන්සේ තමන් එය නොගත් බව මිස ගත් කෙනකුන් ගැන නො කියති. එහෙයින් එහි සිටි එකම තැනැත්තා වූ උන්වහන්සේ සැක කළ මණිකාරයා වධ දී හෝ මැණික ආපසු ගන්නට තීරණය කළේ ය. මැණික නැති වුවහොත් රාජ උදහසට ලක්වන්නට වන හෙයින් තෙරුන් වහන්සේට එසේ වධ දී හෝ මැණික ගත යුතු ය. එහෙත් බිරිඳ ඔහුට කීවේ එසේ නොකරන ලෙස ය. "මේ හාමුදුරුවෝ විසි අවුරුද්දක් අපිට බණ කිව්වා. අපේ ගුරුවරයෙක් වගේ. ඉෂ්ට දේවතාවෙක් වගේ හිටපු මේ හාමුදුරුවෝ ගැන එහෙම හිතන්න එපා. හාමුදුරුවන්ට වධ දෙනවාට වඩා රාජ උදහසට ලක් වෙලා දඬුවම් විඳින එක හොඳයි" එහෙත් ඒ කිසිවකට සවන් නොදුන් මණිකාර තෙම උන්වහන්සේ කඹවලින් වෙලා නාසයෙන් කටින් ලේ එනතුරු වධ දුන්නේ ය. තෙරුන් වහන්සේ ගෙන් වහනය වූ රුධිරය පානය කිරීම පිණිස කුකුළා නැවත ආයේ ය. දරුණු කේන්තියෙන් සිටි මණිකාර තෙම කුකුළාට පා පහරක් දුන්නේය. ඌ එතනම මිය ගියේ ය.

එවිට තෙරුන් වහන්සේ මණිකාරයා අමතා "කුකුළාට පණ තිබේ ද? මිය ගොස් ද?" කියා බලන සේ ඉල්ලීමක් කළේ ය. "කුකුළා මැරිලා. තමනුත් මැරෙන්නේ එහෙම තමයි" මණිකාරයා ගෝරනාඩු කළේ ය. "එහෙම නම් උපාසකතුමනි, කුකුළාගේ බඩ පලා මැණික ගන්න. කුකුළා මැණික ගිලිනවා මම දැක්කා. ඌට පණ තිබුණා නම් මම මැරුණත් ඒක කියන්නේ නෑ"යි තෙරුන් වහන්සේ පැවසූ හ. කුකුළා ගේ බඩ පලා මැණික ගත් මණිකාරයා බියෙන් හා ලජ්ජාවෙන් වෙව්ලන්නට පටන් ගත්තේ ය.
"මට සමාවන්න සමිඳුනි" හේ දෙපාමුල වැඳ වැටුණේ ය. "උපාසකය, වරද මගේ ය. ඔබේ නොවේ. මෙය අපගේ පෙර කර්මයක දෝෂය නිසා වූවා විය හැක. පරණ ණය ගනුදෙනුවක් නිම වූවා යයි සිතා ගනිමු. මගේ සිතෙහි ඔබ කෙරේ ද්වේෂයක් නැත. ඇත්තටම මෙය සිදු වූයේ ගිහි ගෙවල් වලට යාමේ නරක පුරුද්ද නිසා ය. මින් මතු මම එළිපත්තෙන් මෙහාට නො එමි." යි උන්වහන්සේ පැවසූ හ. උන් වහන්සේ ලද වධ වේදනා නිසා වැඩි දවසක් ජීවත් නො වූහ. කලකට පසු මේ කතාවේ එන පුද්ගලයන්ට මරණින් මතු සිදු වූයේ කුමක් දැයි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ගෙන් විමසූ හ. "කුකුළා මණිකාරයා ගේ දරුවෙක් වී උපන්නේ ය. මණිකාරයා අපාගත විය. මණිකාරයා ගේ බිරිඳ දෙව්ලොව උපන්නා ය. තෙරුන් වහන්සේ අපවත් වීමට පෙර රහත් වූයෙන් පිරිනිවන් පෑහ"යි භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කර දුන් හ.

### විවරණාත්මක අනුවාදය (126 ගාථාව)

**එකෙ ගබ්භං උප්පජ්ජන්ති. පාපකම්මිනො නිරයං.**
**සුගතිනො සග්ගං යන්ති අනාසවා පරිනිබ්බන්ති.**

**එකෙ**: සමහර සත්වයෝ; **ගබ්භං**: මවුකුස; **උප්පජ්ජන්ති**: උපදිති; **පාපකම්මිනො**: (කළ) පව්කම් ඇත්තෝ; **නිරයං**: නරකයෙහි (උපදිති); **සුගතිනො**: යහපත්ව හැසුරුණු අය; **සග්ගං**: දිව්‍ය ලෝකයට ද; **යන්ති**: යන්නාහ; **අනාසවා**: (කාමාදී) ආශ්‍රව නැති රහත්හු; **පරිනිබ්බන්ති**: පිරිනිවන් පාති.

මරණින් මතු කර්මානුරූපව සමහරු ගැබක පිළිසිඳෙති. පව් කළ අය අපාගත වෙති. පින් කළ අය දෙව්ලොව උපදිති. කෙළෙස් දුරු කළ උතුමෝ පිරිනිවන් පාති.

### විවරණය

**සග්ග**: දෙව්ලොව. අටුවාවල ස්වර්ගය විස්තර කරන්නේ "රූපාදීහි පඤ්ච කාම ගුණෙහි සුත්ථු අග්ගොති සග්ගො" යනුවෙන් "රූපා දී වූ පංචකාම ගුණයන් ගෙන් මනාව පරිපූර්ණව ඇති ස්ථානය" වශයෙනි. දිව්‍ය ලෝකවල උපදින සත්වයන් මවුකුස කල් යැවීමක් නැතිව පහල වන බවද මිය යන විට මළ සිරුරක් අවශ්‍ය නො වන බව ද කියනු ලැබේ.

**ගබ්භං එකෙ උප්පජ්ජන්ති**: බුදු දහමේ සත්ත්වයන් ගේ උත්පත්ති ක්‍රම හතරක් ඉගැන්වෙයි. බිජු වටින් උපදන ක්‍රමය අණ්ඩජ නම් වෙයි. ගර්භයකින් උපදින ක්‍රමය ජලාබුජ නමින් හැඳින්වේ. ජලය ඇසුරෙහි උපදින ක්‍රමය සංසේදජ ය. මාධ්‍යයකින් තොරව උපදින ක්‍රමය හෙවත් 'පහළ වීම' ඕපපාතික ක්‍රමයයි.

**නිරයං පාප කම්මිනො**: පව් කළ අය නිරයේ උපදිති. නිරය යන වචනය සෑදී ඇත්තේ නි+අය = සැපත නැති තැන (නිරය) යන ක්‍රමයට ය. නිරය සිවු වැදෑරුම්ය.

1. අපාය
2. තිරිසන් භවය (තිරච්ඡාන යෝනි)
3. ප්‍රේතාත්මය (පේත යෝනි)
4. අසුරාත්මය (අසුර යෝනි) වශයෙනි.

මේ එකක්වත් ස්ථිර සදාකාලික වාසස්ථාන නො වේ. තම අකුසල් ගෙවෙන තුරු ඒවායේ වෙසෙන සත්ත්වයෝ ඉන් අනතුරුව මනු ලොව හෝ පූර්ව ජන්මයක කරන ලද කුශලයකට ගැලපෙන තැනක උපදිති.

**පරිනිබ්බන්ති අනාසවා**: කෙළෙසුන් දුරු කළ උතුමන්ට උපතක් නැත.



*පව්කමින් මිදිය හැකි තැනක් අහසෙහිවත් ද මුහුද මැදවත් පර්වත විවරයකවත් නැත.*

| | |
|---|---|
| 127. න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ<br>න පබ්බතානං විවරං පවිස්ස<br>න විජ්ජති සෝ ජගතිප්පදෙසො<br>යත්ඨට්ඨිතො මුඤ්චෙය්‍ය පාපකම්මා (9:12) | අහස් කුස හෝ මුහුද මැද හෝ<br>ගල් ගුහාවක හැංගිලා හෝ<br>කිසි තැනක මේ ලෝකයේ නැහැ<br>පාප කර්මෙන් බේරුමක් නම් |

# බේරුමක් නැත පාප කර්මෙන්
## 9 (11) කණ්ඩායම් තුනක විත්තිය (127 ගාථාව)

**භික්ෂූන් වහන්සේලා පිරිසක්** භාග්‍යවතුන් වහන්සේ දැක ගැනීමට පැමිණෙන අතරමග එක්තරා ගමක නවාතැන් ගත් හ. ඇතැම්හු භික්ෂූන් වහන්සේලා සඳහා දානය පිසමින් සිටිය හ. මේ අතර එක් නිවසක් ගිනිගත්තේ ය. එම ගින්නෙන් ගිනි ගත් පිදුරු ටිකක් අහසට නැඟිණි. ඒ මොහොතේ එතනින් කපුටෙක් පියාසර කළේ ය. ගිනිගත් පිදුරු රැල් ඒ කපුටා ගේ ගෙල වටා පටලැවිනි. කපුටා ගින්නෙන් පිළිස්සී ගම මැද ඇද වැටිණි. මැරී වැටුණු කපුටා දුටු භික්ෂූන් වහන්සේලා මේ අද්භූත මරණයේ පසුපස ඇති හේතුව භාග්‍යවතුන් වහන්සේ මිස වෙන කිසිවකුට විවරණය කළ නො හැකි නිසා, දානය වැළඳීමෙන් පසු යළිත් බුදුරදුන් දක්නට යන ගමන ඇරඹූ හ. මේ අතර තවත් භික්ෂු පිරිසක් භාග්‍යවතුන් වහන්සේ බැහැ දකිනු පිණිස මුහුදු  මගින් එමින් සිටිය හ. මුහුද මැදදී ඔවුන් ගේ යාත්‍රාව හිටි හැටියේ එකතැන නතර විය. කවර විදියකින් වත් නැවතුණු තැනින් සොලවා ගත නොහැකි වූ විට "මේ නැවේ කවුරුන් හෝ පව්කාරයකු සිටින හෙයින් එය ගමන් කරවිය නො හැක. ඔහු සොයා ගත හොත් ඔහු මුහුදට දමා අනිත් අය ගේ ජීවිත බේරා ගත හැකිය" යි කතිකා කරගත් ඔවුහු පව්කාරයා සෙවීම පිණිස සලාක දමන්නට එකඟ වූහ. තුන් වතාවක්ම සලාකය නැවියා ගේ බිරිඳටම වැටිණි. කවුරුත් බලවත් විස්මයට පත් වූහ. එහෙත් නැවියා තම බිරිඳ අමතා කඳුළු පිරුණු නෙතින් මෙසේ කී ය. "සොඳුර, ඔබ ගේ අවාසනාව නිසා මේ සියළුදෙනාම මිය යන්නට හැරීම සුදුසු නො වේ." එසේ පැවසූ හෙතෙම ඇය ගේ ගෙලෙහි වැලි කලයක් එල්ලා දියෙහි ගිල්වන ලෙස අන්‍යයනට උපදෙස් දුන්නේ ය. පුදුමයකට මෙන් ඇය මුහුදෙහි ගිල්වූ පසු නැව පිටත් විය. නැව ගොඩ බිමට ලඟා වූ පසු භික්ෂූහු "මේ සිද්ධිය පසුපස වූ යථාර්ථය භාග්‍යවතුන් වහන්සේ වෙතින් ම දැනගනිමු" යි කතිකා කර ගත් හ. තවත් භික්ෂූන් වහන්සේ හත්නමක් භාග්‍යවතුන් වහන්සේ දක්නට එන අතරමග නවාතැන් ගන්නට ආරාමයක් ගැන විමසූ විට උපාසකවරු ගල් ගුහාවක් පෙන්වා එහි නවාතැන් ගන්නැයි ඇරයුම් කළ හ. ඔවුහු එහි රාත්‍රිය ගත කළ හ. මැදියම් රැයෙහි මහ කළු ගලක් අවුත් ගුහා දොර වැසිණි. උදෑසන අසල විහාරස්ථානයක භික්ෂූහු පැමිණ ගුහාවෙහි භික්ෂූන් හත්නමක් හිරව සිටි බව දැන, අසල ගම් හතක සෙනඟ කැඳවා ගෙන ගල ඉවත් කරන්නට වෑයම් කළ හ. එහෙත් සත් දිනක් ගත වන තුරු ම ගල සොලවා ගන්නට ඔවුහු අසමත් වූහ. ගුහාව තුළ හිර වූ භික්ෂූන්ට ඒ සත් දින ම ආහාර තබා දිය බිඳකුදු නො ලැබිණ. සත්වන දින ගල ඉබේම ඉවත් වූයෙන් භික්ෂූහු යන්තම් දිවි ගලවා ගත් හ. "අපට මෙබඳු අතවරයක් වන්නට ඇත්තේ අප පෙර කළ කර්මයක විපාක වශයෙන්ම විය යුතු ය. එය බුදුරජාණන් වහන්සේ ගෙන්ම විමසා දැන ගනිමු" යි කතිකා කර ගත් ඔවුහු බුදුරදුන් හමුවට පිටත් වූහ. මේ කණ්ඩායම් තුනම බුදුරදුන් හමු වී තම අත්දැකීම් පවසා ඊට හේතු කවරේදැයි විමසූ හ. භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, එක් සමයෙක එක්තරා ගොවියෙක් තම අකීකරු හීලෑ නැති ගොනා කෙරේ බලවත්ව කිපී උගේ ගෙල වටා පිදුරු ඔතා ගිනි තැබීය. ඌ දැවී මිය ගියේ ය. එම අකුශල කර්මයෙන් දිගු කලක් අපාදුක් විඳි හෙතෙම ආත්මභාව හතක්ම ගින්නෙන් දැවී මිය ගියේ ය. මේ කපුටා වශයෙන් මිය ගියේ ද ඒ ගොවියා ය"යි පළමු කණ්ඩායමට පැහැදිලි කළ සේක. දෙවන කණ්ඩායමට මෙසේ වදාළ හ. "මහණෙනි, එක් කාන්තාවකට ඉතා හිතවත් බල්ලෙක් සිටියේ ය. බල්ලා තම ස්වාමිදුවට බලවත් සෙනෙහසින් යන යන තැන පස්සෙන්ම ගියේ ය. මේ හේතුවෙන් ඇතැම් ගැමි තරුණයෝ ඇයට විහිළු තහළු කළ හ. එයින් බලවත් ලෙස කුපිත වූ ඕ බල්ලා මරා දමන්නට සිතා ගත්තා ය. දිනක් ඕ වැලි කලයක් බල්ලාගේ ගෙලෙහි බැඳ දියේ ගිල්වා මරා දැම්මා ය. එම අකුසල කර්‍මයෙන් දිගු කලක් අපාගතව දුක් විඳි මේ ස්ත්‍රිය මේ භවයෙහි නැවියා ගේ බිරිඳව ඉපිද මෙසේ වැලි කලයක් ගෙල බැඳ මුහුදට දමනු ලැබුවා ය." තුන්වන කණ්ඩායම ඇමතූ භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, ඉකුත් ජන්මයක ඔබ ගවයන් බලන තරුණයන් හත් දෙනකුව ඉපිද සිටි අවදියෙහි තලගොයකු තුඹසකට රිංගනු දැක එහි කට වසා දමා විනෝද වූහ. එය විවෘත කරන්නට අමතකව ගිය ඔවුහු දින හතකට පසු එය දැක තමන් කළ ක්‍රියාව මතක් වී තුඹස් කට විවෘත කළහ. ආහාර-පාන නැතිව දුක සේ සිටි තලගොයා එළියට අවුත් දිවි රැක ගත්තේ ය. ඔබට සත් දිනක් ආහාර-පාන නැතිව ගල් ගුහාවේ හිර වී සිටින්නට සිදු වූයේ ඒ අකුශල කර්‍මය හේතුවෙනි" යි ඔවුන් ගේ අකුශල කර්‍මය ද විවරණය කළ හ. අවසානයේ දී උන්වහන්සේ මේ සිද්ධි සියල්ල අරබයා මේ ගාථාව දේශනා කළ හ.

### විවරණාත්මක අනුවාදය (127 ගාථාව)

**යත්ථ ඨිතො පාපකම්මා මුඤ්චෙය්‍ය සො**
**ජගතිප්පදෙසො න විජ්ජති අන්තලික්ඛෙ න**
**සමුද්දමජ්ඣෙ න පබ්බතානං විවරං පවිස්ස න.**

**යත්ථ**: යම් තැනක; **ඨිතො**: සිටි සත්ව තෙමේ; **පාපකම්මා**: (තමා කළ) පාප කර්මයෙන්; **මුඤ්චෙය්‍ය**: මිදෙන්නේ නම්; **සො  ජගතිප්පදෙසො**: එබඳු වූ බිම් පෙදෙසක්; **න විජ්ජති**: නැත; **අන්තලික්ඛෙ**: අහසෙහි ද; **න**: (එබඳු වූ තැනක්) නැත; **සමුද්දමජ්ඣෙ**:  මුහුද මැද ද; **න**: (එබඳු වූ තැනක්) නැත; **පබ්බතානං**: පර්‍වතයන්ගේ; **විවරං**: කුහරයට; **පවිස්ස**: පිවිසීමෙනුත්; **න**: (පව්කමින් මිදෙන්නට සුදුසු තැනක්) නැත,

මේ මිහිකත මත, පාප කර්‍මයෙන් මිදිය හැකි තැනක් කිසි තැනක නැත. අහසෙහි සිටියත්, මුහුද මැද සිටියත් පර්‍වත විවරයක් තුළට පිවිසියත් පවින් නො මිදෙන්නේ ය.

### විවරණය

**න විජ්ජති සෝ ජගතිප්පදෙසො**: තමා කළ පාප කර්‍මයාගේ විපාක දුක් අනුභව නො කොට ඉන් මිදෙනු පිණිස වාසයට සුදුසු වූ බිම් පෙදෙසක් කෙසඟක් පමණවත් නැත. අහස, මුහුද හෝ පර්‍වත ගුහාවක් වැනි කවර තැනක සිටියත් පාප කර්‍මය විපාක දෙන්නට සූදානම් වන විට එයින් ගැලවී ගත නො හැක.



*නොමැරී සිටින්නට අහස ද මුහුද මැද ද කඳු කුහරය ද සුදුසු තැනෙක් නො මැත.*

128. න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජති සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතං නප්පසහෙථ මච්චු (9:13)

අහස් කුස හෝ මුහුද මැද හෝ
ගල් ගුහාවක හැංගිලා හෝ
කිසි තැනෙක මේ ලෝකයේ නැහැ
මාරයාගෙන් බේරුමක් නම්

# ගැලවීමක් නැත මරුගෙන්

## 9 (12) සුප්පබුද්ධ රජු ගේ කතා පුවත (128 ගාථාව)

**සුප්පබුද්ධ** රජු අරබයා භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළේ නිග්‍රෝධාරාමයෙහි වැඩ වසමිනි.

සුප්පබුද්ධ (සුප්‍රබුද්ධ) රජතුමා දෙව්දත් හිමියන්ගේ සහ යශෝධරා කුමරියගේ පියා වූයේ ය. කරුණු දෙකක් හේතුවෙන් සුප්පබුද්ධ රජ තෙම භාග්‍යවතුන් වහන්සේ සමඟ අමනාපයෙන් පසු විය. මූලික හේතුව වූයේ තම දියණිය වූ යශෝධරා කුමරිය විවාහ කර ගෙන ඇය අත්හැර දමා ගොස් පැවිදි වීමයි. දෙවන හේතුව නම්, තම පුත්‍රයා වූ දේවදත්ත හිමියන් බුදුරදුන් ගේ පරම හතුරා බවට පත් වීමයි.

දිනක් භාග්‍යවතුන් වහන්සේ සහ මහා සංඝයා වහන්සේ පිඬු පිණිස වඩිනා බව සැළ වූ සුප්පබුද්ධ බීමත්ව උන්වහන්සේට ගමන් කරන්නට බැරිවන පරිදි මඟ අහුරා සිටියේ ය. "ශ්‍රමණ ගෞතම මට  වඩා බාලය. එහෙයින් මම ඔහුට ඉඩ දී මාර්ගයෙන් ඉවත් නො වෙමි"යි පැවසූ හේ දිගට ම මඟ වළකා සිටියේ ය. මාර්ගය විවෘත නොවන බව දත් බුදුපාමොක් මහ සඟන ආපසු ගිය හ. විහාරස්ථානයට ගිය පසු බුදුරදුන් තමන් ගැන විවේචනය කරනු ඇතැයි සැක කළ සුප්පබුද්ධ "බුදුරදුන් පවසන දේ අසා සිට තමන්ට වාර්තා කරන්නයැ"යි චර පුරුෂයන් යැවී ය.

භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමියන් අමතා මෙසේ වදාළ හ. "ආනන්ද, මගේ මඟ අහුරා සිටි සුප්පබුද්ධ ඒ කරගත් අකුශලය නිසා අදින් සත්වන දින ඔහුගේ මාලිග යේ සඳළු තලයට පිවිසෙන පිය ගැට පෙළ අසල දී පොළව පලා ගෙන නරකාදියට ගෙන යනු ලබන්නේ ය." චර පුරුෂයෝ ඒ ප්‍රකාශය රජුට සැල කර සිටිය හ. "මම පියගැට පෙළ අසලටවත් නො ගොස් බුදුරදුන් ගේ අනාවැකිය බොරු කරමි"යි පැවසූ සුප්පබුද්ධ තම සේවකයන් ලවා පිය ගැට පෙළ ඉවත් කරවීය. තමා එතැනට යන්නට සැරසුණහොත් එය කෙසේ හෝ වළක්වන්නට උපදෙස් දී රාජ පුරුෂයන් පිරිසක් ද එහි රැඳවා ගත්තේ ය.

මේ තොරතුරු භාග්‍යවතුන් වහන්සේට ද සැලවිය. ඒ ඇසූ උන්වහන්සේ "මහණෙනි, සුප්පබුද්ධ කුළුණක් මත මහලක් තනා ගෙන සිටියත්, අහසෙහි සිටියත්, මහා මුහුදෙහි සිටියත්, ගුහාවක සිටියත් මගේ වචනය බොරු කළ නො හැක. මා පැවසූ තැනදීම පොළව පලාගෙන අපාගත වනු ඇත."යි පැවසූ හ.

හත්වන දින කෑම වේලාව ආසන්නයෙහි රාජකීය අශ්වයා කිසියම් හේතුවකින් බලවත් සේ කලබලව කුපිතව මාලිගය දෙවනත් කරන්නට පටන් ගත්තේ ය. හේෂාරව නඟමින් සියල්ලන්ටම පා පහර දෙමින් කලබල කරනු සැල වූ රජ තෙම තමන්ට මිස වෙන කිසිවකුට අශ්වයා හික්මවන්නට බැරි බව දන්නා හෙයින් එසේ කළ යුතු යැයි සිතා ගත්තේ ය. සියලු උපදෙස් අමතකව ගිය රජතෙම දොර දෙසට ගියේ ය. තද කොට වසා යතුරු ලා තිබුණු දොර ඉබේම ඇරිණි. ගලවා දමන ලද පිය ගැට පෙල ද එහිම වූයේ ය. ඔහු නවතාලන්නට ඔහු ගේ සේවකයන්ට අමතක විය. පිය ගැට පෙල බැස පොළවට පාදය තබත්ම මිහි මඬල විවරව රජතුමා අවීචි මහා නරකාදියටම ඇද ගෙන යන ලදි.

මොන තරම් වෑයම් කළ ද ඔහුට මරණයෙන් ගැලවී ගන්නට බැරි විය. කර්මානුරූපව සිදු විය යුත්ත සිදු විය. මේ නිමිති කර ගෙන භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

**විවරණාත්මක අනුවාදය (128 ගාථාව)**

**යත්ථ ඨිතං මච්චු නප්පසහෙථ සො ජගතිප්පදෙසො න විජ්ජති අන්තලික්ඛෙ න සමුද්ද මජ්ඣෙ න පබ්බතානං විවරං පවිස්ස න**

**යත්ථ**: යම් තැනක; **ඨිතං**: සිටි (සත්වයා); **මච්චු**: මරුවා; **නප්ප සහෙථ**: නො මැඩලන්නේ ද; **සෝ ජගතිප්පදේසෝ**: එබඳු බිම් පෙදෙසක්; **න විජ්ජති**: නැත්තේය; **අන්තලික්ඛෙ**: අහසෙහි ද; **න**: (එබඳු වූ තැනක්) නැත; **සමුද්දමජ්ඣෙ**:  මුහුද මැද ද; **න**: (එබඳු වූ තැනක්) නැත; **පබ්බතානං**: පර්වතයන්ගේ; **විවරං**: කුහරයට (ගුහාවකට); **පවිස්ස**: පිවිසීමෙනුත්; **න**: (මරණින් මිදෙන්නට සුදුසු තැනක්) නැත,

යම් තැනක සැඟවී සිට මරුගෙන් ගැලවෙත හැකි යයි කිවහැකි තැනක් මේ මිහිමත නැත. එමෙන් ම අහසේ ද නැත. මුහුද මැද ද නැත. පර්වත ගුහාවක් තුළ ද නැත.

**විවරණය**

**නප්පසහෙථ මච්චු**: මේ ගාථාවෙන් මරුගෙන් ගැලවෙන තැනක් ලොව කිසි තැනක නැති බව අවධාරණය කරයි. උපත හා සමගම මරණය ද නිශ්චිත වන හෙයින් ලොව උපදින සියළු සත්ත්වයන් මරණයට පත් වන බව සනාතන සත්‍යයකි.





සනාතන බුද්ධ භාෂිතය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ අසහාය සාමයික මෙහෙය උදෙසා, සිය කාලය හා ශ්‍රමය සපුරා වැය කරමින්, මානව වංශයට දහම් මග හෙළි පෙහෙළි කිරීමේ මහා මෙහෙවරට කැප වී සිටින සිංගප්පූරුවේ ප්‍රධාන සංඝ නායක වේරගොඩ සාරද, ස්ථවිරයන් වහන්සේ අද ලොව වෙසෙන ප්‍රශස්ථතම ධර්‍ම දූත යතිනායක වරයාණන් වහන්සේ නමකි.

1941 නොවැම්බර් මස 27 වනදා දකුණු ලක වේරගොඩ දී උපත ලද මේ යති ප්‍රභූවරයානෝ, උපාධි ලාභීව, ධර්‍මදූත මෙහෙය ආරම්භ කළේ ඉතා යොවුන් අවධියේ දීමය. දැනට ශතක 6 ක් පුරා ධර්‍මදූත මෙහෙයෙහි යෙදී සිටින ගරුතර වේරගොඩ සාරද යතිනායකයානන් වහන්සේ මුද්‍රිත මාධ්‍යයෙන් සහ විද්‍යුත් මාධ්‍යයෙන් මෙන්ම දුරකථන තාක්‍ෂණයෙන් පවා අද ලොවට ධර්‍මදානය සපයන්නේ නවීනයන්ගේ මනස හා ආධ්‍යාත්මික ගති-පැවතුම් පිළිබඳ පැහැදිලි අවබෝධයකිනි.

## කතෘ ස්වාමීන්ද්‍රයන් වහන්සේ

වර්තමානික ග්‍රාහක පිරිස, ශ්‍රව්‍ය-දෘෂ්‍ය මාධ්‍ය මගින් දැනුමත් විනෝදාස්වාදයත් ලබන්නට පුරුදු වී සිටින පරපුරක් හෙයින්, ගරුතර වේරගොඩ සාරද හිමිපාණෝ, ඔවුනගේ මනසට සරිලන පරිද්දෙන් බුද්ධ භාෂිතය, ඔවුන් අතට පත් කරන සේක. මුද්‍රිත හා විද්‍යුත් ප්‍රකාශන 700 ක් පමණ ලොවට පිරිනමා සිටින මේ යතිනායකයන් වහන්සේ විසින් සම්පාදිත ධර්ම භාණ්ඩාගාරය නම් ඉංග්‍රීසි කෘතිය දොරට වැඩීමේ උළෙලේ දී, ඒ පිළිබඳ ව එක් දිනක් තුල පමණක් ලැබුණු දුරකථන ඇමතුම් සංඛ්‍යාව 2000 කටත් අධික විය. ඒ නිසා එය සිංගප්පූරු රාජ්‍යයේ ග්‍රන්ථ ප්‍රකාශන ඉතිහාසයේ සුවිශිෂ්ට වාර්තාවකට හිමිකම් කියන්නේය.

දැනට, සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය භාරව වැඩ සිටින ගරු වේරගොඩ සාරද නායක ස්ථවිර පාදයන් වහන්සේ ලෝකයේ බොහෝ දේශයන් හී බුද්ධ ශාසනයේ ප්‍රගතියට හිතකාමී ධර්ම දූත මෙහෙවරක යෙදී සිටින සේක.

එතුමන් ගේ ප්‍රධාන ප්‍රකාශ අතර, සිංහල හා ඉංගිරිසි ධම්මපදයත්, ජාතක කථා පිළිබඳ විද්‍යුත් ප්‍රකාශනයත් ප්‍රධාන තැන් ගනී. එතුමන් විසින්, ඉටු කෙරෙන මහා සාමයික මෙහෙය අඛන්ඩව පවත්වා ගෙන යනු පිණිස, ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් නිදුක් නිරෝගී සුව පැතීම, බෞද්ධ ජනතාවගෙන් ඉටු විය යුතු කෘතඥතා පූර්වක චාරිත්‍රයකි.

කලා කීර්ති එඩ්වින් ආරියදාස

ISBN: 981-00-4938-2

# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත ධම්මපදය

දහවන පරිච්ඡේදය

# දණ්ඩ වග්ග



ගරු වේරගොඩ සාරද නාහිමිපාණන් වහන්සේ
සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක

"සබ්බදානං ධම්මදානං ජිනාති"

(ධර්ම දානය, සෙසු දාන සියල්ලටම වඩා අගනේය.)



''ධර්ම භාණ්ඩාගාරය'' නැමැති

මෙම වටිනා ධර්ම පුස්තකය

**සාමවිනිසුරු බී.ධර්මදාස පියාණන්ට**

නිවන් සුව පතා ප්‍රකාශනය කරන ලදි.

පූර්ණ අනුග්‍රහකත්වය

**වේරගොඩ සුනන්දා භික්ෂුණිය විසිනි**

# ධර්ම භාණ්ඩාගාරය

සිතුවම් සහිත
## ධම්මපදය

කතෘ:
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය**
නො: 1, ජලන් මස් පුටේ, සිංගප්පූරුව 128607
ටෙලි: 65 67783330 65 94656570
94 770589498 / 94 755218421
වේරගොඩ ජයන්ති විහාරය, වේරගොඩ, මීටියාගොඩ
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

**කර්තෘ**
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**චිත්‍ර ශිල්පී**
පී. වික්‍රමනායක

**සැකසුම**
පියරත්න හේවාබට්ටගේ

**පරිගණක රූපාවලි සහ පූර්ව ප්‍රකාශන මෙහෙය**
පූජ්‍ය වේරගොඩ සුනන්දා භික්ෂුණී
බී. දයා සමරසිංහ
බී. රෝහණ ජයතිස්ස

**පරිගණක සහාය**
ශ්‍යාමනී ප්‍රියලක්‍ෂණා ලේකම්වසම්
ඩබ්ලිව්. මාලා කාන්ති
ප්‍රියංකා බෝධිපක්‍ෂ

**සහාය**
බී. පුෂ්පානී ධම්මලතා
බී. ජේ. ධම්මලතා
ඊ. එම්. ලයනල් මොහොට්ටි
ඊ. එම්. යුගාන් සසංක
ශ්‍රියාලතා කග්ගොඩ ආරච්චි

**පරිගණක ප්‍රකාශන**
සමනල ප්‍රින්ටර්ස්, බටපොල
ටෙලි: +94 777557127

**පිටකවරයේ පින්තූරය**
බර්ට් ගුණසේකර

**මුද්‍රණය**
2013 නොවැම්බර් මස 27 දින, සිංගප්පූරුව

**පිටකවරයේ චිත්‍රය**

*පිටකවරයේ බුදු පිළිමය වේරගොඩ ජයන්ති විහාරයේ බුදුමැදුරෙනි.*
*වර්ෂ 1953 ජුනි 3 වෙනිදා අඹන ලද මෙම බුදු පිළිමය දැනට ශ්‍රී ලංකාවේ තිබෙන*
*දර්ශණීයතම බුදු පිළිමය වශයෙන් සැලකේ. මෙම බුදු පිළිමය ඉදිකිරීමේ පුරෝගාමී වූ අපවත් වී වදාළ*
*ගෞරවාර්හ පණ්ඩිත යටලමත්තේ වජිරඤාණ නායක මාහිමිපාණන් වහන්සේට නිවන්සුව අත්වේවායි අපි ප්‍රාර්ථනා කරමු.*

මේ ග්‍රන්ථයෙහි ආගත කරුණු පිළිබඳ පූර්ණ හා සදාකාලික අයිතිය හිමි වන්නේ බුදුරජාණන් වහන්සේටයි.
බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් පහල වූ සනාතනික සත්‍යයෝ පුහුදුන් මිනිසුන් විසින් පනවන ලද
තාවකාලික වූත්, අසත්‍ය වූත්, අයිතිවාසිකම් පිළිබඳ නීති රීති පිළිගනු නොලබති.

**පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ටෙලි: 65 67783330 65 94656570
+94 770589498 +94 755218421
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

ISBN: 981-00-4938-2

10 වන පරිච්ඡේදය

# දණ්ඩ වග්ග





*තමා උපමාකොට සිතා අන් සතුනට තැළීම් - පෙළීම් නැසීම් නො කොට වැළකිය යුතු*

129. සබ්බේ තසන්ති දණ්ඩස්ස
සබ්බේ භායන්ති මච්චුනො
අත්තානං උපමං කත්වා
න හනෙය්‍ය න ඝාතයේ (10:1)

ලොව සියළු සත්වයෝ - තැති ගනිති දඬුවමින්
කොයි කවුරු වුණත් ලොව - බිය ගනිති මරණයෙන්
අනුන් තේරුම් අරන් - තමා උපමා කරන්
වළකින්න මැරීමෙන් - මැරීමට පෙළඹුමෙන්

# තමන් ලෙසින් - සිතන් අනුන්

## 10 (1) භික්ෂූන් වහන්සේලා හය නමක ගේ කතාවක් (129 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **භික්ෂු හය නමක්** අරබයා මේ ගාථාව දේශනා කළ හ.

එ සමයෙහි භික්ෂූහු හය නමක් නවාතැන් ගැනීම පිණිස ජේතවනාරාමයෙහි ගොඩනැගිල්ලක් පිරිසිදු කරමින් සිටිය හ. එහෙත් එය කරගෙන යද්දී එහි පැමිණි තවත් භික්ෂු පිරිසක් "අපි ඔබට වඩා වැඩිමහල් භික්ෂූන් වෙමු. ඒ නිසා ඔබ අපට ගරු සරු කළ යුතු ය. මේ ගොඩනැගිල්ලේ අපි නවාතැන් ගන්නෙමු. අප මෙහි නැවතීම නවත්වන්නට කිසිවකුට නො හැක" යි කියමින් බාධා කළ හ.

එහෙත් මේ ආගන්තුක පිරිස ගේ බාධා කිරීම පිළිගන්නට සූදානම් නොවූ මුල් පිරිස, ඒ ඉල්ලීමට ඉඩ දෙන්නට කැමති නො වූහ. එවිට පසුව ආ ජ්‍යෙෂ්ඨ භික්ෂූහු ඒ පිරිසට පහර දෙන්නට පටන් ගත් හ. වේදනාව උසුලා සිටින්නට අසමත් වූ භික්ෂූහු කෑගසන්නට පටන් ගත් හ.

මේ කෝලාහලය බුදුරදුන්ට ද සැලවිය. දෙපක්ෂයම ගෙන්වූ භාග්‍යවතුන් වහන්සේ කිසිම භික්ෂුවක් තවත් භික්ෂුවකට පහර නො දිය යුතු යයි විනය නීතියක් පැණවූ හ. මේ ගාථාව දේශනා කරන ලද්දේ එම සිද්ධිය නිමිත්තෙනි.

### විවරණාත්මක අනුවාදය (129 ගාථාව)

**සබ්බේ දණ්ඩස්ස තසන්ති සබ්බේ මච්චුනො භායන්ති**
**අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ**

**සබ්බේ**: සියලු (සත්වයෝ); **දණ්ඩස්ස**: දඬුවමින්; **තසන්ති**: තැති ගනිති; **සබ්බේ**: සියලු සත්වයෝ; **මච්චුනො**: මරණයට; **භායන්ති**: බිය වෙති; **අත්තානං**: තමා; **උපමං කත්වා**: උපමාවට ගෙන; **න හනෙය්‍ය**: (කිසි සතෙකු) නො මරන්න; **න ඝාතයෙ**: (අනුන් ලවා ද) නො මරවන්න.

ලොව සියල්ලෝම දඬුවමට බිය වෙති. මරණයට බියවෙති. "මා මෙන් හැම සත්හු දණ්ඩනයට බියපත් වෙති. මරණයට බියපත් වෙති."යි තමා උපමා කොට අත් පා ආදියෙන් කිසි සතෙකුට හිංසා නො කට යුතුය. අන් කිසිවෙකු ලවා ද එසේ නො කර විය යුතුය.

### විවරණය

**මච්චුනො භායන්ති**: මරණය ලොව කිසිවකුට ප්‍රිය දෙයක් නොවේ. සියල්ලෝ ම මරණය අප්‍රිය කරති. ඊට බිය වෙති. එහෙත් එය සියල්ලන්ටම සාධාරණ සංසිද්ධියකි. මරණය සිදුවන ක්‍රම හතරක් ගැන ධර්ම ග්‍රන්ථවල සඳහන් වෙයි.

1. ජනක කර්මයෙහි අවසානය නිසා සිදුවන මරණය (කම්මක්ඛය මරණ)

කිසියම් පුද්ගලයකු තම ජීවිත කාලය පුරා ප්‍රගුණ කළ සිතුවිලි රටාව මරණ මොහොතෙහි ඇතිවන චුති චිත්තයට බලපායි. එය ඊළඟ ජන්මය සඳහා විශාල බලපෑමක් ඇති කරයි. එවැනි තත්ත්වයක දී බලපාන චේතනාව ජනක කම්ම නම් වෙයි. මෙම ජනක කර්මයෙහි ශක්තිය පිරිහී ගිය විට ආයු කාලය ඉතිරිව තිබුණ ද මරණය සිදු වෙයි. මෙය බහුල වශයෙන් සිදුවන්නේ අපායෙහි උපන් සත්ත්වයන්ට වුව ද එය අන්‍ය ලෝකවල වුව ද සිදුවිය හැකිය.

2. ආයුෂ නිම වීමෙන් සිදුවන මරණය (ආයුක්ඛය මරණ)

පරමායුෂ විවිධ උත්පත්ති ස්ථානයන් හි විවිධ වේ. වයස් ගතවී ස්වාභාවිකව සිදුවන මරණය මෙසේ ආයු කාලය ඉකුත් වී සිදුවන මරණ සේ හැඳින්වේ. ඒ සත්ත්ව නිකායට හිමි විවිධ ආයු ප්‍රමාණ තිබේ. කර්ම ඉතිරිව තිබුණ ද, උපරිම ආයු සීමාව ඉක්මවිය නො හැක. ජනක කර්මය ඉතාමත් ප්‍රබල අවස්ථාවකදී ඊළඟ උපත ද එම කාලයේම සිදුවීමට ඉඩ ඇත.

3. කර්මය හා ආයු සීමාව යන දෙකම එකවර ගෙවී ගිය විට සිදුවන මරණය (උභයක්ඛය මරණ)

4. උපච්ඡේදක මරණ

ජනක කර්මයට වඩා ප්‍රබල වූ වෙනත් කර්මයක් හිටි හැටියේ ඉදිරිපත්ව ජීවිතය අකාලයේ නිම වීමට ද ඉඩ ඇත. අකාලයේ මිය යන පුද්ගලයෝ මෙන්ම ළමා කාලයේ මිය යන්නෝ ද මේ හේතුව නිසා මිය යති. ඉලක්කයක් කරා යන ඊතලයක් ඊට වඩා ප්‍රබල වේගයකින් බිම දැමීමට මෙය සම කළ හැක. මෙබඳු බලගතු කර්ම උපච්ඡේදක කර්ම ලෙස හඳුන්වනු ලැබේ. දේවදත්ත තෙරුන්ගේ හදිසි මරණය මේ ජන්මයේම කරන ලද බලගතු කර්මය උපච්ඡේදක වශයෙන් ක්‍රියා කිරීමෙන් සිදුවිය.

මේ වගී හතරින් මුල් තුන එකට ගත් විට කාල මරණ වශයෙන් ද, හතරවැන්න අකාල මරණ වශයෙන් ද හඳුන්වති.

පොල්තෙල් පහනක් නිවී යාමට තිරය නිම වීම, තෙල් නිම වීම, තිරය හා තෙල් යන දෙකම නිම වීම හෝ තද සුළඟක් හැමීම වැනි බාහිර හේතුවක් බලපෑම යන හතර විදියෙන් එකක් හේතු විය හැක. ඒ ආකාරයෙන්ම මරණය ද පූර්වෝක්ත සිවු අයුරින් එක විදියකින් සිදු විය හැක.

මරණය අනිවාර්යයෙන් ම කාටත් සිදුවන දෙයක් නමුත් ඒ බව පිළිගන්නෝ ඉතා ස්වල්ප වෙති. ඔවුහු දිගින් දිගට ම ජීවත් වන්නට රුචි වෙති. පැවැත්ම කෙරේ විශේෂ ඇල්මක් ඇත්තන් වුව ද මරණයට බිය නො විය යුත්තේ ඉදිරියට තවත් ජීවිත රැසක්ම පවත්නා හෙයිනි. අනිත් අතට මරණය සෑම දෙනාටම එක සේ වේදනාදායකයයි සිතුමද අනවශ්‍ය ය.





*සියලු සතුනට සිය දිවි ප්‍රිය ය. තමා උපමා කොට අනුන් පෙළීම් - නැසීම් නො කොට වැළකිය යුතු*

130. සබ්බේ තසන්ති දණ්ඩස්ස
සබ්බේසං ජීවිතං පියං
අත්තානං උපමං කත්වා
න හනෙය්‍ය න ඝාතයෙ (10:2)

ලොව සියළු සත්ත්වයෝ - තැති ගනිති දඬුවමින්
කොයි කාට වුණත් ලොව - ජීවිතය ප්‍රිය හෙයින්
අනුන් තේරුම් අරන් - තමා උපමා කරන්
වළකින්න මැරීමෙන් - මැරීමට පෙළඹුමෙන්

# ලොව හැමට ජීවිතය - එක සේම ප්‍රියවේය.

## 10 (2) භික්ෂූන් භය නමක් කළ කලබලයක් (130 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **භික්ෂූන් වහන්සේලා භය** නමක් කළ කලබලයක් ඇරබ මෙය වදළ හ.

පෙරදැක්වූ ගාථාවට අදාළ භික්ෂු භයනම තමන් බලහත්කාරයෙන් උදුරා ගන්නට තැත් කළ ලැගුම් ගෙය පිළිබඳ අරගලය නිම නො කළහ. ඔවුහු නැවතත් ගොස් පෙර සේම එහි නැවතී සිටි භික්ෂූන් පලවා හරින්නට වෑයම් කළ හ.

භාග්‍යවතුන් වහන්සේ විසින් කිසිම භික්ෂුවක් වෙනත් භික්ෂුවකට පහර නො දිය යුතුයයි නීතියක් පැණවූ හෙයින් මෙවර ඔවුහු නේවාසික භික්ෂූනට පහර නො දුන්හ. එහෙත් අරගලය මැද එක් අවස්ථාවක එක් භික්ෂුවක් තවත් භික්ෂුවකට භයංකර විලාසයෙන් තර්ජනය කළෙන් තමා මරා දමති යි බියවූ හෙතෙම  මහ හඬින් කෑ ගැසීය. ඒ පිළිබඳ භාග්‍යවතුන් වහන්සේට පැමිණිලි කරන ලදුයෙන් උන්වහන්සේ තවත් නීතියක්  පණවමින් කිසිම භික්ෂුවක් තවත් භික්ෂුවකට තර්ජනය නො කළ යුතු යැයි නීතියක් පැණවූ හ. අනතුරුව මේ ගාථා ධර්මය ද දේශනා කළ හ.

**විවරණාත්මක අනුවාදය (130 ගාථාව)**

**සබ්බේ දණ්ඩස්ස තසන්ති සබ්බේසං ජීවිතං පියං**
**අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ**

**සබ්බේ**: සියළු දෙනා; **දණ්ඩස්ස**: දඬුවමින්; **තසන්ති**: ත්‍රස්ත වෙති; **සබ්බේසං**: හැම දෙනාටම; **ජීවිතං**: ජීවිතය; **පියං**: ප්‍රිය ය; **අත්තානං**: තමා; **උපමං කත්වා**: උපමා කර ගෙන; **න හනෙය්‍ය**: නො මරන්න; **න ඝාතයෙ**: නො මරවන්න.

ලොව සියල්ලෝම දඬුවමට බියවෙති. ජීවිතයට ප්‍රිය වෙති. එහෙයින් තමා උපමා කොට කල්පනා කරමින් කිසිවකු නො මරන්න. නො මරවන්න.

**විවරණය**

**න හනෙය්‍ය න ඝාතයෙ**: නො මරන්න; නො මරවන්න. මෙහි විවරණය වන්නේ බෞද්ධ සදාචාර ධර්මයෙහි ඉතා වැදගත් වන උපමාවකි. තමන් ජීවියකු වශයෙන් මරණයට හා දඬුමට ඇති බියත් තමන් තුළ පවත්නා ජීවිතාශාවත් මිම්මක් වශයෙන් ගනිමින් අනිකුත් ජීවීන් ද ඒ හා සමාන ම ජීවිතාශාවකින් හා මරණ භයකින් සමන්විත බව තේරුම්ගෙන ඒ අනුව කිසිම සත්ත්වයකුට මරණ භය ඇති නො කර හිරිහැර නො කර කාරුණිකව පිළිපැදීම මෙහි හරය යි. තමා අකැමැති කිසිවක් අනුන්ට ද නො කරන්නැයි බුදු දහම උගන්වයි.

මෙහි "හැම සත්හු දණ්ඩනයෙන් තැති ගණිති, මරණයෙන් බියපත් වෙති"යි වදාළේ නමුදු මෙහි අර්ථය සාවශේෂ බැවින් කේශරසිංහයන් ද ආජානේය හස්ති-අශ්ව-වෘෂභයන් හා ක්ෂීණාශ්‍රවයන් ද හැර අවශේෂ සත්ත්වයෝ පමණක් බියපත් වෙතියි දත යුතුයි. මොවුන් අතුරෙන් ක්ෂීණාශ්‍රව තෙම සක්කායදෘෂ්ටිය ප්‍රහීණ වූ හෙයින් නාම-රූප ධර්මයන්ගේ බිඳීමක් විනා මියෙන සත්ත්වයෙකු නො දක්නේ බියපත් නොවෙයි. කේසරසිංහාදීහු සක්කායදෘෂ්ටිය බලවත් හෙයින් තමන්ට ප්‍රතිපක්ෂසත්ත්වයෙකු නො දක්නාහු මරණයට බිය නොවේ.

**මෙත්තා**: තමා උපමා කර අන් අයගේ දුක-සැප ගැන සිත ඇති කර ගන්නා ආකල්පය මෛත්‍රිය සඳහා පාදක වෙයි. කිසිවෙකුට වධ වේදනා හිරිහැර නො කරනු. ඔවුන් සුඛී සුවපත් වේවා යි සිතුම මෛත්‍රිය හෙවත් මිත්‍රත්වයේ ආකල්පය වැඩීමයි.

කරණීයමෙත්ත සූත්‍රයෙහි දැක්වෙන පරිදි අප ලොවට මෙත් වැඩිය යුත්තේ එකම දරුවකු ඇති මවක් එම දරුවාට දක්වන මෙත් සිත උපමාවට ගනිමිනි. මෙත් සිත වැඩීමේදී රාගය, කාමය වැනි සිතුවිලි බැහැර කර හුදෙක් මිත්‍රත්වයම වර්ධනය කළ යුතුය. වෛරය, ඊර්ෂ්‍යාව, තරගකාරීත්වය වැනි සිතුවිලි දුරුකර මේ ආකල්පය වර්ධනය කිරීමෙන් සිත් පහන් වෙයි.

භාග්‍යවතුන් වහන්සේ තමන්ට වෛර කළ සතුරන්ට හිරිහැර කර මරා දමන්නට තැත් කළ අයට පවා මෙත් වැඩූ හ. තම පුත් රාහුලටත් දෙව්දත් තෙරුනටත් එකම සෙනෙහසින් මෙත් වැඩූ හ .

මෙත්තාව සතර බ්‍රහ්ම විහරණයන් ගෙන් එකකි. මෙත් සිත ප්‍රගුණ කරන අය කරුණාව, මුදිතාව හා උපේක්ෂාව ද වඩති. මේ සතර බ්‍රහ්ම විහරණ වැඩූ අය මරණින් මතු බඹලොව උපදින බව ද කියැවේ.

**මෛත්‍රියෙහි ආනිශංස**

මෙත් වඩන්නා සුවසේ නින්දට යයි. ඔහු නින්දට සැරසෙන්නේ වෛරයෙනි තොර සැහැල්ලු හදින් හෙයින් පහසුවෙන් ඉක්මනින් නින්දට වැටෙයි. හදෙහි මෙත් ගුණ පිරි අය දෙනෙත් පියා ගත් වහාම සුව නින්දක් ලබති.





*සැප බලාපොරොත්තුවන යමෙක් සැප කැමැති සතුන් පෙළා නම් ඔහු සැප නො ලබන්නෙකි.*

131. සුඛ කාමානි භූතානි
යො දණ්ඩේන විහිංසති
අත්තනො සුඛ මෙසානො
පෙච්ච සෝ න ලභතෙ සුඛං (10:3)

සැපට කැමති සත්වයන්ට
කර හිරිහැර දුක් දැනෙන්ට
තමන්ට සැප රිසි වුනාට
නො ලැබෙයි මතු සැප විඳින්ට

# පැතුවත් නො ලබත් - මතු සැප සම්පත්

## 10 (3) ළමා පිරිසක ගේ පුවතක් (131 සහ 132 ගාථා)

සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ එක් **යොවුන් පිරිසක්** ඇරබ මේ ගාථාව වදාළ සේක.

දිනක් භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස හැසිරෙන වස් සැවැත් නුවරට පිවිසුණා හ. එක් වීදියක වඩිනා උන්වහන්සේට ළමුන් පිරිසක් කෑ කෝ ගසමින් කිසියම් දෙයක් වෙත ගල් ගසනු පෙනිණි. ඒ කුමක් දැයි කිට්ටු වී බැලූ උන්වහන්සේට ළමුන් ගල් ගසන්නේ ගැරඬියකුට බව පෙනිණි.

උන්වහන්සේ ඔවුන් ගෙන් ප්‍රශ්නයක් නැගූ හ.

"ළමයි මොකද ඔය කරන්නේ?"

"අපි මේ සර්පයකුට ගල් ගහනවා"

"ඇයි ඒ?"

" සර්පයා විසයි. අපිට දෂ්ට කරයි"

"ඉතින්, සර්පයා දෂ්ට කරනවට ඔය ළමයි බය ද?"

"ඔව්. අපි බයයි. අපි අපේ පණට ආදරෙයි. අපි සර්පයා ගෙන් බේරෙන්න තමයි මේ ගහන්නේ. ගහලා මරනවා."

"ඔය ළමයි, ඔය ළමයින්ගේ පණට ආදරෙයි. ඒ වගේ මේ සර්පයාත් උගේ පණට ආදරේ ඇති නේ ද?"

ළමෝ කතා නො කරති.

"ඔය ගොල්ලන්ට කවුරු හරි වට කර ගෙන ගහනවට ඔය ගොල්ල කැමති නැහැ නේ ද?"
"නැහැ."

"ඒ වගේ තමයි මේ සතාට ඔය ළමයි වට කර ගෙන ගහනවට එයා කැමති නෑ. දැක්ක නේද දුවල බේරෙන්න හදන හැටි. ඉතින් අපි අපේ සැප බලාගෙන අනුන්ට දුක් හිරිහැර දෙනවා නේ ද? ළමයිනේ, අපි එහෙම කළොත් අපිට සැපක් නම් ලැබෙන්නේ නෑ. ඇයි? අපි පව් කරන නිසා. පව් කරන අයට සංසාරේ දුකම තමයි ලැබෙන්නේ"

භාග්‍යවතුන් වහන්සේ ගේ උපදෙස් ඇසූ ළමෝ කැට කැබලිති පසෙකලා උන්වහන්සේට වැඳ තමන් නැවත සතුන්ට හිරිහැර නොකරන බව කියා සිටිය හ.

**විවරණාත්මක අනුවාදය (131 ගාථාව)**

**අත්තනො සුඛමෙසානො යො සුඛකාමානි භූතානි**
**දණ්ඩේන විහිංසති සො පෙච්ච සුඛං න ලභතෙ**

**අත්තනො**: තමහට; **සුඛමෙසානො**: සුව කැමැති වූ; **යො**: යමෙක්; **සුඛකාමානි**: (එසේම) සුව කැමති වූ; **භූතානි**: සත්ත්වයන්; **දණ්ඩේන**: තැළීම් පෙළීම් ආදියෙන්; **විහිංසති**: හිරිහැර කරයි ද; **සො**: හෙතෙම; **පෙච්ච**: මතු (ආත්මයේ දී); **සුඛං**: සැප; **න ලභති**: නො ලබයි.

තමහට සුව කැමැති වූ යමෙක් (එසේම) සුව කැමති වූ සත්ත්වයන් තළා පෙළා හිරිහැර කරයිද, ඔහුට පරලොව දිව්‍ය මනුෂ්‍ය සැප හෝ නිවන් සැප නො ලබන්නේය.





*සැප පතන යමෙක් සැප කැමැති සතුන් පෙළීම් - නැසීම් නො කෙරේ නම් ඔහු සැප ලබන්නෙකි.*

132. සුඛකාමානි භූතානි
යො දණ්ඩේන න හිංසති
අත්තනො සුඛ මෙසානො
පෙච්ච සො ලභතෙ සුඛං

සැපට කැමති සත්ත්වයන්ට
තැළුම් පෙළුම් නො දෙන්නන්ට
සැප සම්පත් රිසි තමන්ට
මතු ජන්මෙක හැකි ලබන්ට

# අනුන්ට දුක් නො දෙන්නන්ට - හැකි මතුවට සැප ලබන්ට
## 10 (3) ළමා පිරිසක් ගේ පුවතක් (131  සහ 132 ගාථා) (ඉතිරි කොටස)

**විවරණාත්මක අනුවාදය (132 ගාථාව)**

**අත්තනො සුඛමෙසානො යො සුඛකාමානි භූතානි**
**දණ්ඩේන න හිංසති සො පෙච්ච සුඛං ලභතෙ**

**අත්තනො**: තමහට; **සුඛමෙසානො**: සැප කැමති වූ; **යො**: යමෙක්; **සුඛ කාමානි භූතානි**: (එසේම) සැප කැමති වූ සත්වයන්ට; **දණ්ඩේන**: තැළීම් පෙළීම් ආදියෙන්; **න හිංසති**: හිරිහැර නො කරයි ද; **සො**: හෙතෙම; **පෙච්ච**: මතු භවයෙහි; **සුඛං**: සැප; **ලභතෙ**: ලබයි.

තමහට සුව කැමති යමෙක් එසේම සුව කැමති සත්වයන් තැළීම් පෙළීම් ආදියෙන් නො පෙළන්නේ නම් හෙතෙම පරලොව දිව්‍ය මනුෂ්‍ය හා නිවන් සැප ලබන්නේය.

**විවරණය**

**අනාථ පිණ්ඩික සිටුතුමා**: මේ ගාථා වැඩි හරියක් දේශනා කර ඇත්තේ සැවැත් නුවර ජේතවනාරාමයේ දී ය. බුදුරදුන් වස් විස්සක් පමණ විසූ මේ ආරාමය ඉදි කර පූජා කරන ලද්දේ අනාථ පිණ්ඩික සිටුතුමා විසිනි.

අනේ පිඬු සිටුතුමාණන් ගේ නියම නම සුදත්ත ය. ඔහු ගේ අසමාන දානපතිත්වය හේතුවෙන් අනාථ පිණ්ඩික යන නම යෙදිණ. මේ නමෙන්ම පැහැදිලි වන්නේ බුද්ධ ශාසනයට කරන ලද පූජාවන්ට මෙන්ම අසරණයන්ට පරිත්‍යාග කිරීම මගින් ඔහු කීර්තියට පත්ව සිටි බවකි.

සුදත්ත උපන්නේ සැවැත් (සාවත්ථි) නුවර ය. ඔහු ගේ මස්සිනා විසූයේ රජගහ නුවර ය. වරක් ඔහු මස්සිනා ගේ නිවසට ගිය ගමනේ දී වෙනදා මෙන් තමා පිළිගන්නට පෙරට නො ආ මස්සිනා කිසියම් සාදයකට සැරසෙන බවක් දුටු හේ ඒ ගැන විමසී ය. පසු දින බුද්ධ ප්‍රමුඛ සංඝයාට දන් පිරිනමන බව ඔහුට පවසන ලදි. 'බුද්ධ' යන වචනය ඇසූ පමණින්ම ඔහුට කිසියම් අමුත්තක් දැනිණි. තමා දිගු කලක් සොයමින් සිටි යමක් ලැබුණු බවක් දැනුණු ඔහුට වහාම බුදුන් දකින්නට රිසි විය.

'බුද්ධ' යන වචනය ඇසූ මොහොතේ සිට පස්වණක් ප්‍රීතියෙන් පිනා ගොස් සිටි සුදත්තට පසුදින උදාවන තුරු සිටින්නට ඉවසිල්ලක් නො වීය. එහෙයින් රෑ අඩ නින්දේ සිට ඉතා අළුයම පිබිදුණු හෙතෙම කාටත් නො දන්වා බුදුරදුන් වැඩ සිටි සීතවනය බලා අඳුරේම පිටත් විය. රැය අඳුරු වුව ද බුදුරදුන් දක්නට ඔහු තුළ වූ ප්‍රසාදාත්මක උද්‍යෝගය හා භක්තිය නිසා මග පෙනෙන තරමේ ආලෝකයක් ඔහු ගේ ශරීරයෙන් විහිදුණු බව කියනු ලැබේ. එහෙත් අතර මගදී සුසාන භූමියක් පසු කර යද්දී ඔහුට බියක් දැනිණි. ආපසු හැරෙන්නට පවා සිතුන ද සීවක නම් යක්ෂයා එතුමා දිරි ගැන්වී ය.

"ඇතුන් සීයක් - අසුන් සීයක්
සියක් වාහන - සියක් යුවතින්
රුවන් කණකර - පැළඳ ගත් නිසි
මුදු මාල මොන - තරම් තිබුණත්
පියවරක ඔබ - පෙරට තබනා
එක් සොළොස් අඩ - තරම් නො වටී
සිටු තුමාණනි - යන්න පෙරටම
එපා කිසි ලෙස පසු බසින්නට"

ඔහු ගේ බිය දුරු වී බුදුරජාණන් වහන්සේ කෙරේ භක්තියෙන් සිත පිරී ගියේ ය. දිරි උපදවා ගත් හේ පෙරටම ගමන් කළේ ය. මෙ බඳු පසුබෑම් දෙ තුන් වරක් ම සිදු වුව ද අන්තිමේ හේ සීත වනයටම ගියේ ය.

ඔහු ගේ පැමිණීම අපේක්ෂාවෙන් සිටි භාග්‍යවතුන් වහන්සේ ඔහු "සුදත්ත" යැයි නමින් අමතා පිළිගත් හ. එසේ අමතනු ලැබීමෙන් පහන් වූ, හෙතෙම "බුදුරදුන් සුවසේ සැතපිනිදැ"යි විමසී ය. එයට පිළිතුරු වශයෙන් භාග්‍යවතුන් වහන්සේ

"කෙලෙස් ගිනි නිවාලූ - කම් සුවය හැර දැමූ
රහත් පල ලත් අයට - නිදා ගත හැක සුවෙන්
සියළු බර බහා ලූ - නිවී සැනසුණු සිතැති
නැවුම් දිවියක් ලැබූ - පහන් සිත් ඇති ඔවුහු
දුක් වේදනා මුදා - සුවෙන් සැතපෙති සදා"

යි පිළිතුරු දුන් හ. දහම් අසා සෝවාන් වූ හෙතෙම භාග්‍යවතුන් වහන්සේට සැවැත් නුවර වස් වසන්නට ඇරයුම් කළ හ. බුදු රදුන් ඒ ඇරයුම පිළිගත්තෙන් හෙතෙම ජේත කුමරුන් ගේ උයන රන් කාසි අතුරා මිලයට ගෙන ජේතවනාරාමය තනවා පූජා කළේ ය. බුදුරදුන් වස් දහ නමයක්ම ගත කළේ ජේතවනාරාමයේ ය.

අනාථ පිණ්ඩික සිටාණන් ගේ ලේලිය වූ සුජාතා තරමක් සැර පරුෂ, කලබලකාරී තැනැත්තියක වූවා ය. වරක් සිටුතුමාගේ නිවසට වැඩම කළ බුදුරදුන්ට ඇය ගේ කට හඬ  අසන්නට ලැබිනි. "ඒ මගේ ලේලිය යි. ඕ සැර පරුෂයි. ඇය සැදැහැ ඇත්තියක නො වේ" යි සිටුතුමා පැවසී ය.

ඇය කැඳවූ බුදුහු භාර්යාවරුන් සත් දෙනකු සිටින බව විස්තර කළ හ. එනම්,

1. වධක භාර්යාව
2. චෝර භාර්යාව (හෙරක් වැනි බිරිඳ)
3. අය්‍ය භාර්යාව (ස්වාමිදුවක් බඳු බිරිඳ)
4. මාතු භාර්යාව (මවක් වැනි බිරිඳ)
5. භගිනි භාර්යාව (නැගණියක වන් බිරිඳ)
6. සඛී භාර්යාව (මිතුරියක වැනි බිරිය)
7. දාසි භාර්යාව (දැස්සක වැනි බිරිඳ)

මෙයින් ඔබ කවරෙක්දැයි ඇසූ විට 'මම දාසි භාර්යාවක් වෙමි' යි ඕ නිහතමානීව කීවා ය. දිනපතා දෙව්රමට ගොස් බුදුරදුන් දකින්නට පුරුදුව සිටි අනාථ පිණ්ඩික සිටුතුමා උන්වහන්සේ ආරාමයේ නැති විට උන්වහන්සේ වෙනුවට වඳින්නට පුදන්නට යෝග්‍ය සංකේතයක් සේ ආනන්ද හිමියන් ලවා බෝධියක් රෝපණය කරවා ගත්තේ ය.

**සුඛ**: බුදු සමය මෙලොව සැප හා පරලොව සැප පිළිබඳව උගන්වන දහමකි. දිට්ඨධම්ම සුඛ හා සම්පරායික සුඛ වශයෙන් හඳුන්වන්නේ දෙලොව සැපත යි. දිට්ඨධම්ම හෙවත් මෙලොව සැපත ගිහි සුඛ හා පබ්බජිත සුඛ වශයෙන් ද්විවිධ ය. ගිහියා ගේ සැප ලෞකිකත්වයට බර වෙතත් පබ්බජිත සුඛය නෛෂ්ක්‍රම්‍යයට බර ය.

ගිහියා ගේ සැපත ගැන විස්තර කරන භාග්‍යවතුන් වහන්සේ

1. **අත්ථි සුඛ** (දැහැමින් දැන දෙපය වෙහෙසා උපයා ගත් ධනයක් තමන්ට ඇති බව සිතන විට ඇති වන සැපය)

2. **භොග සුඛ** (උපයා ගත් ධනයෙන් තමා, තම දෙමාපියන්, අඹු දරුවන්, මිත්‍රාමාත්‍යයන් සතුටු කර, පිණවා පංච විධ බිලිද ඉටු කළ විට ඇතිවන සතුට)

3. **අණන සුඛ** (තමා කිසිවකුට ණය නැති බව සිතන විට ඇති වන සතුට)

4. **අනවජ්ජ සුඛ** (නිරවද්‍ය ජීවිතයක් ගත කරන බව සිතන විට ඇතිවන සතුට)

යනුවෙන් එය සිව් වැදෑරුම් වන අයුරු පැහැදිලි කළ හ.



*කිසිවෙකුට පරොස් බස් නො කියන්න. එසේ කීවොත් ඔබට ද ඇණුම් - බැණුම් වලට මුහුණ පෑමට සිදුවේ.*

133. මා'වොච ඵරුසං කඤ්චි
වුත්තා පටිවදෙය්‍යු'තං
දුක්ඛා හි සාරම්භ කථා
පටිදණ්ඩා ඵුසෙය්‍යු තං (10:5)

නො කියනු මැන පරුස වචන - ඔබ ඒවා කීවොත්
සිත් රිදෙනා වචන ඔබට - කියත හැකිය අනුනුත්
එකට එක කියා ගැනීම දුකක් වේය ඔබටත්
එකිනෙකාට බැන වැදීම විඳින්න වෙයි කාටත්

# කළොත් එකට එක - අත් වෙනවා දුක

## 10 (4) කුණ්ඩධාන තෙරුන්ගේ කථාව (133 සහ 134 ගාථා)

**කුණ්ඩධාන** තෙරුන් වහන්සේ ඇරබ බුදුරජාණන් වහන්සේ මේ ගාථා දෙක දේශනා කළේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කරමිනි.

කුණ්ඩධාන තෙරුන් පැවිදි වූ දා පටන් උන්වහන්සේ ගමන් කරන හැම තැනම රූමත් කාන්තාවක් ද උන්වහන්සේ කැටුව ඇවිදිනා බවක් පෙනෙයි. එහෙත් තෙරුන් වහන්සේට ඇය පෙනෙන්නේ නැත. තෙරුන් ගම පුරා පිඬු සිඟා වැඩි විට දායකයෝ තෙරුන්ගේ පාත්‍රයට එක් හැන්දක් බෙදා "ඔබ වහන්සේටය" කියා, තවත් හැන්දක් "මේ ඔබ වහන්සේ සමග යන මිතුරියට"යැයි බෙදති.

මෙම අරුමය සිදු වූයේ උන්වහන්සේ අතින් කාශ්‍යප බුදුන් සමයෙහි සිදු වූ පාප කර්මයක විපාකයක් වශයෙන් යැයි වාර්තා වෙයි.

කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ගේ ශාසනයෙහි භික්ෂු දෙනමක් එක මවගේ දරුවන් මෙන් මහත් සෙනෙහසින් විසූ හ. කොහි යතත් දෙනම එකටම යති. දිනක් මේ දෙනම උපෝසථ කර්මය පිණිස යමු යි එකට පිටත් වූ හ. එකල්හි එක් දෙව් දුවක් මේ දෙනම දැක "මුන් වහන්සේලා ගේ මිතුරු කම උවමනාවට වැඩිය. මේ දෙදෙනා භේද කළ යුතුය" යි සිතා උපක්‍රමයක් කල්පනා කරමින් සිටියා ය.

අතර මඟ දි එක් නමකට ශරීරකෘත්‍යය කිරීමේ අවශ්‍යතාවක් ඇතිවිය. මා ශරීරකෘත්‍යය කර එනතුරු ඔබ ඔතැනම සිටිනු මැනවැයි උන්වහන්සේ වනරොද තුළට පිවිසුණ හ. මේ අවස්ථාවෙහි තම අරමුණ ඉටු කර ගන්නට ඉඩ ලැබිණැයි සිතූ දෙව් දුව මනුෂ්‍ය ස්ත්‍රියක ගේ වේශයක් මවා ගෙන තෙරුන් වනයෙන් පිටතට එන විට ඇඳිවත සකස් කරමින් හිස කෙස් සකසමින් උන්වහන්සේ සමඟම පිටතට ආවාය. තෙරුන්ගේ මිතුරු හිමිනමට පෙනෙන්නට එසේ අවුත් ඕ වෙන'තක නොපෙනී ගියා ය.

මිතුරු හිමිනම මේ සියල්ල බලා සිට තෙරුන් වහන්සේ ගෙන් "ඔබේ සිල් බිඳ ගත්තා නො වේ දැ" යි ප්‍රශ්න කළේය. "නැත. මා එවැන්නක් කර ගත්තේ නැත"යි තෙරහු පිළිවදන් දුන් හ. "ඇයි නැත්තේ මා දුටුවා ඔබ පසු පස රූමතියක් එන බව." "නැහැ ඇවැත්නි, මා එවැන්නියක් දැක්කේ නැහැ. එබඳු දෙයක් කළෙත් නැහැ. නිකරුණේ මා වැනසෙන කතාවක් හදන්න එපා." "මගේ ඇහින් දුටු දේ බොරු කරන්න හදන්න එපා. ඇය ආපු විදියෙන් මට හොඳටම විශ්වාසයි නරක දෙයක් වෙලා තියෙන බව." මෙසේ දිගින් දිගටම කරුණු කීවත් ඇසින් දුටු දේට වඩා වෙනත් දෙයක් පිළිගන්නට හිමිනම කැමති නො වීය. "මම ඔබ සමග පෝය නො කරමි."යි හේ කියා සිටියේ ය.

උපෝසථාගාරයේ දී චෝදක හිමිනම සියළු භික්ෂූන් ඉදිරියේ "මේ භික්ෂු නම පාරාජිකා වූයේ ය. මම මේ සිද්ධිය දුටුවෙමි. ඔහු සමඟ පෝය කළ නො හැක"යි චෝදනා කළේ ය. චූදිතයා ඒ චෝදනාව ප්‍රතික්ෂේප කළ ද ඇසින් දුටු සාක්ෂිය ප්‍රබල විය. අන්තිමේ දී උපෝසථ කර්මය ඉදිරියට ගෙන යා නො හැකිව මහා අර්බුදයක් ඇති විය.

මේ සියල්ල බලා සිටි දෙව් දුව ''මා විසින් මිතුරු දමක් බිඳින්නට ගොස් කර ඇත්තේ මහා බරපතල වරදකි. දැන් මේ අර්බුදය විසඳිය යුත්තේ ද මා විසිනි"යි සිතා සංඝයා වහන්සේලා අමතා "ස්වාමීනි, මේ භික්ෂුනම වරදක් නො කළේ ය. මා මේ විහිළුව කළේ දෙනම ගේ මිතුරු දම් බිඳ දමා විනෝද වීමට ය. සමා වී පෝය කරනු මැනවි"යි කියා සිටියේ ය. දෙව් දුව අහසේ පෙනී සිට ප්‍රකාශ කළ හෙයින් හිමිවරු එය පිළිගත් හ. කෙසේවුව ද දෙනමගේ මිත්‍රත්වය පෙර මෙන් කුළුපග තත්වයට යළි පත් නො වීය.

**විවරණාත්මක අනුවාදය (133 ගාථාව)**

**කඤ්චි එරුසං මා අවෝ ච වුත්තා තං පටිවදෙය්‍යුං**
**සාරම්භ කථා හි දුක්ඛා පටිදණ්ඩා තං ඵුසෙය්‍යුං**

**කඤ්චි**: කිසිවකුට; **එරුසං**: රළු බසක්; **මා අවෝ ච**: නො කියන්න; **වුත්තා**: බැණුම් ලද්දෝ; **තං**: ඔබට; **පටිවදෙය්‍යුං**: පිළිවදන් කියන්නා හ; **සාරම්භ කථා හි**: හරස් කතා කිරීම හෙවත් එකටෙක කියා ගැන්ම; **දුක්ඛා**: දුකක් වෙයි; (එහෙයින්) **පටි දණ්ඩා**: ප්‍රති ප්‍රහාර; **තං**: ඔබට; **ඵුසෙය්‍යුං**: පැමිණෙයි.

කිසිවකුට බැණ නො වදින්න. බැණුම් ලද්දෝ ඔබට ද බණිනු ඇත. (එකට එක කියා ගනිමින්) බැණ ගැනීම දුකකි. එහි ප්‍රතිඵල වශයෙන් ප්‍රති ප්‍රහාරයට ලක්වන්නට සිදුවෙයි.





*නිසල තැනැත්තා නිවණට පැමිණියකු වැනි ය. ඔහු එකටෙක කීමෙක් කෙරීමෙක් නැත.*

134. ස වෙ නෙරෙසි අත්තානං
කංසො උපහතෝ යථා
එස පත්තෝසි නිබ්බාණං
සාරම්භො තෙ න විජ්ජති (10:6)

බිඳුණු පිත්තල බඳුන
නැවත හඬ නොම නගන
විලස නිවනට පැමිණ
මැන කලහ දුර හරින

# සැනසුම් සිත - යුතු රැක ගත

## 10 (4) කුණ්ඩධාන තෙරුන්ගේ කතාව (133 සහ 134 ගාථා) (ඉතිරි කොටස)

හිමිවරු ඒ ආත්ම භාවයේ ම රහත් වී ගත නුහුණු හෙයින් අපවත් ව දෙව් ලොව උපන් හ. දෙව් දුව තමන් කළ අකුශල කර්මය නිසා අවීචි මහා නරකාදියෙහි උපන්නා ය. බොහෝ කලක් අපාදුක් විඳි ඕ අප බුදුන් සමයෙහි සැවැත් නුවර කුල පුත්‍රයෙක් ව ඉපිද පැවිදිව උපසම්පදාව ද ලද්දේ ය.ඒ මේ කුණ්ඩධාන තෙරණුවෝ ය. එහෙත් උන්වහන්සේ පැවිදි වූ දා පටන් මහ මග වඩිනා විට රූමත් කාන්තාවක් පසු පසින් යන අයුරක් දිස් වෙයි. එය උන්වහන්සේ නො දකිති.

පුරාකෘත අකුශලයෙහි විපාක වශයෙන් මෙය සිදු වන බව කිසිවෙක් නො දනිති. එහෙයින් මෙය මුළු සඟ පරපුරට ම නිග්‍රහයක් සේ සිතූ භික්ෂූහු අනේ පිඬු සිටාණන් හමු වී "සිටාණෙනි,මේ අබ්‍රහ්මචාරී භික්ෂුව ඔබේවිහාරස්ථානයෙන් නෙරපා දමන්න. උන්වහන්සේ ගේ නොමනා පැවතුම් නිසා සියළු භික්ෂූන්ටම සිදු වී ඇත්තේ නින්දාවකි" යි පැවසූ හ. "හිමිවරුනි, බුදුරදුන් විහාරයේ නැති ද?" යි සිටුතෙම විමසීය. "සිටිති"යි ඔවුහු පිළිවදන් දුන් හ."එසේ නම් උන්වහන්සේම මෙය දකිත්වා"යි හේ නිහඬ විය. අනතුරුව භික්ෂූහු විශාඛා උපාසිකාව හමුවට ගොස් ඒ ඉල්ලීම කළ හ. ඕ ද එම පිළිතුර ම දුන්නා ය. දායකයන් මෙසේ උදාසීන වීම ගැන නො සතුටු වූ හිමිවරු රජතුමා හමුවන්නට ගොස් මෙ පවත් පැවසූ හ. රජතුමා ඒ හිමි නම වසන ආරාමය අසා දැක ගෙන පරීක්ෂණයක් කරනු පිණිස තෙමේ ම ගියේ ය.

රජතුමා තෙරුන් පරීක්ෂාවට එතැයි ඇසූ බොහෝ ගිහි-පැවිදි පිරිස එහි රැස් වූයෙන් ඇති වූ කලබල හඬට කුණ්ඩධාන තෙරණුවෝ ද ලැගුම් ගෙයින් පිටතට ආහ. එවිටම හිමි නම සමග කාන්තාවක් ද පිටතට එනු රජතුමාට දිස් විණි. රජතුමා වෙහෙරට පැමිණෙනු දුටු කුණ්ඩධාන තෙරණුවෝ උඩුමහලේ සිය ඕවරකයට ගොස් වැඩ හුන් හ. රජතුමා උඩු මහලට නැගී නමුත් තෙරුන් නො වැන්දේ ය. එහෙත් ස්ත්‍රී රූපය පෙනෙන්නට නුවූයෙන් උඩු මහල පුරා බලා ඇය නො දැක "හිමියනි ඔබ වහන්සේ සමග උඩු මහලට ආ ස්ත්‍රිය කොහිදැ"යි විචාළ හ. "මහරජ මා දුටු ස්ත්‍රියක් නැත" යි හිමිනම පිළිතුරු දුන්නේ ය. "ස්වාමීනි, මඳකට පහල මාලයට වැඩම කරන්නැ"යි රජතුමා ඉල්ලා සිටියෙන් තෙරණුවෝ එසේ කළ හ. මතු මාලයේ දී නො පෙනුනු ස්ත්‍රී රූපය පහල මාලයේ දී යළි පහළ විය. නැවත උඩු මහලට ගිය විට ස්ත්‍රී රූපය අතුරුදහන් විය. දෙ තුන් වරක් මෙය පිරික්සූ රජ තෙම "ස්වාමීනි, මෙහි තේරුම කුමක් ද? මට ඇත්ත කියනු මැනවි"යි විමසී ය. "මහරජ, මම මෙහි ඇත්ත නැත්ත නො දනිමි. මා සමග කාන්තාවක් ඇවිදින බව බොහෝ දෙනා කියති. එහෙත් මම කිසි කලෙක ඇය නො දකිමි" යි පිළිතුරු දුන්නේය.

යම්කිසි අබිරහස් ඉරණමකින් හිමිනම අසරණ බවට පත්ව සිටින බව තේරුම් ගත් රජතෙම "හිමියනි, මේ තත්වය යටතේ ඔබ වහන්සේට කිසිවකු දාන-මානාදිය නො පිරිනමනු ඇත. එහෙයින් දිනපතා රජ මැදුරට පැමිණ ආහාර වළඳා යනු මැනවි" යි ආරාධනය කර ගියේ ය. පැමිණිලිකාර හිමිවරු මෙයින් වඩාත් අමනාපයට පත්ව " දුශ්ශීලයා දැන් රජතුමා සමග මිත්‍ර වූවා"යි කීහ. ඒ ඇසූ කුණ්ඩධාන තෙරණුවෝ දැන් තමන් රාජ කුලුපග හෙයින් මානයෙන් ද යුතුව "දුස්සීල කමත් සුසීල කමත් ඔබවහන්සේලා ලගම ය" යි බැණ වැදුණෝ ය.

එයින් අමනාපයට පත් හිමිවරු බුදුරදුන් කරා එළඹ "මේ භික්ෂුව තමන් දුශ්ශීල වූවා මදිව අපට දුශ්ශීල වාදයෙන් චෝදනා කරයි" යි පැමිණිලි කළ හ. ඒ පිළිබඳව භාග්‍යවතුන් වහන්සේ විමසූ විට කුණ්ඩධාන තෙරණුවෝ "දුශ්ශීල නොවූ මට එසේ කී හෙයින් මමත් එසේ කීමි" යි පිළිතුරු දුන් හ. භාග්‍යවතුන් වහන්සේ එවිට "එසේ එකට එක කීම නො වටී. මේ හිමිවරුන් ඔබ දුශ්ශීලයැයි කීවේ කාන්තා රූපයක් ඔබ හා ඇවිදිනු ඇසට පෙනෙන හෙයිනි. එහි නිදහසට කරුණක් තිබේ. එහෙත් ඔබ ඔවුන්ට දුශ්ශීල චෝදනාව කරන්නේ එසේ නැතිව නිකරුණේ ය.
ගිය ආත්මයක කළ බලවත් අකුශල කර්මය නිසා දැන් මෙසේ නිග්‍රහ ලබන්නේහි ය. දැනුත් සිල්වතුන්ට බැණ වැදී තවත් අයසට පත් වන්නට වෑයම් නොකරන්න. කිසිවකුට එකට එක නො කියන්න. පිත්තල කළයක් කෑලිවලට කැඩූ පසු හඬ නැතුවා සේ නිහඬව ඉන්න"යි අවවාද කර මේ ගාථා වදාළ සේක.

**විවරණාත්මක අනුවාදය (134 ගාථාව)**

**සචෙ උපහතො කංසො යථා අත්තානං නෙරෙසි එසො**
**නිබ්බාණං පත්තො අසි තෙ සාරම්භා න විජ්ජති**

**සචෙ**: ඉදින්; **උපහතො**: බිඳ දැමූ; **කංසො**: ලෝහ තලියක්; **යථා**: විලසින්; **අත්තානං**: තමා; **නෙරෙසි**: නිහඬ කර ගන්නේ නම්; **එසො**: ඒ ඔබ; **නිබ්බාණං**: නිවනට; **පත්තො අසි**: පැමිණියේ වෙහි; **තෙ**: ඔබට; **සාරම්භො**: වචන හුවමාරුවක්; (එකට එක කියුම් කෙරුම්) **න විජ්ජති**: නො වන්නේ ය.

බිඳ දැමූ ලෝහ තලියක් මෙන් නිහඬව ඔබට ඉන්නට හැකි නම්, මේ පිළිවෙත පුරන්නා වූ ඔබ නිවනට පැමිණියෙක් වන්නේය. එසේ නිවන් ලබන ඔබට කිසිවකු සමඟ වචන හුවමාරු කර ගන්නට අවශ්‍ය නො වන්නේ ය.

**විවරණය**

**ඵරුසං මා අවො ච**: රළු වචන නො කියා වාග් සදාචාරය පුරන්නට පෙළඹවීමකි. බොරුව, කේලම, ඵරුස වචනය හා සම්ප්‍රලාප කතාව යන හතරෙන්ම වැළකුණු විට වාග් සුචරිතය පිරුවා වෙයි.

**කංසඃ**: ලෝහයෙන් තැනූ තලියක් වැනි බඳුන් කංස නම් වෙයි. ලෝහ ගණයට රන්, රිදී, තඹ, යකඩ හා ඊයම් යන පහ ගැනේ. ලෝහයෙන් තැනූ තලියක් හඬ නගන්නේ එහි ගෝල හැඩය තිබෙන තුරු පමණි. කඩා බිඳ දැමූ විට ඝණ්ටා නාදය වැනි රාවයක් නගන්නේ නැත.



*ගොපලු ගවයන් කෙවිටෙන් ගොදුරට ගෙනයන සේ ජරා මරණ දෙ දෙන සතුන් ගේ ආයු ගෙවාලත්.*

135. යථා දණ්ඩේන ගොපාලො
ගාවො පාචෙති ගොචරං
එවං ජරා ච මච්චූ ච
ආයුං පාචෙන්ති පාණිනං (10:7)

කෙවිටි පාහර දී ගව රැළ
ගෙන යන සේ තණ පිටියට
ජරා මරණ දෙක මිනිසුන්
ගෙන යනවා දිවිය අගට

# ජරා මරණ එයි - දිවි කෙළවර වෙයි.

## 10 (5) සිල් ගත් උවැසියන් පිරිසක් (135 ගාථාව)

පූර්වාරාමයෙහි වැඩ වාසය කරන සමයෙහි අප බුදුපියාණන් වහන්සේ විසින් මේ ගාථාව පෙහෙවස් සමාදන් වූ **උපාසිකාවන්** පන්සියයක් මුල් කරගෙන වදාරන ලදී.

වරක් සැවැත් නුවර කාන්තාවෝ පන්සියයක් පූර්වාරාමයට පැමිණ අටසිල් සමාදන් වූ හ. විහාරය කරවා පූජා කළ දානපතිනිය වූ විසාකා සිටු දියණියෝ ඔවුන් බැහැ දකින්නට පැමිණ විවිධ වයස් වල අයගෙන් සිල් ගන්නට හේතුව කුමක්දැයි විමසූ හ. ඇයට විවිධ වයස් වල අය ගෙන් ලැබුණේ විවිධ පිළිතුරු ය. වයස්ගත උපාසිකාවන් පැවසුවේ තමන් ආවේ අටසිල් රැකීම මඟින් මරණින් මතු දිව්‍ය ලෝකවල ඉපිද දෙව් සැප විඳින්නට බව ය. සමහර මැදිවියේ කාන්තාවෝ පැවසුවේ සැමියා ගේ සම බිරින්දෑන් සමග දිගටම නිවසෙහි සිටින්නට ඇති අකමැත්ත නිසා දිනය විහාරස්ථානයේ ගත කිරීමට පැමිණි බව ය. තරුණ කාන්තාවන් කරා ගොස් විමසූ විට පුතුන් ලැබේවා යි ප්‍රාර්ථනා කරමින් සිල් ගන්නට ආ බව කී හ. බාල ළඳුන් කියා සිටියේ තමන් නව යොවුන් වියේ දීම විවාහ වීම ප්‍රාර්ථනා කර පැමිණි බවය. මේ සියළු පිළිතුරු රැස් කර ගත් විසාකා තොමෝ බුදුරදුන්ට ඔවුන් හඳුන්වා දී මේ අය අට සිල් ගන්නට පෙළැඹුණු විවිධ හේතු සැළ කර සිටියා ය. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "විසාකාවෙනි, ගවයන් කෙවිටෙන් හසුරුවා තණ බිමට ගෙන යන්නා සේ ජරාව හා මරණය අපේ ජීවිත අවසානය කරා ගෙන යයි" යි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

### විවරණාත්මක අනුවාදය (135 ගාථාව)

**යථා ගොපාලො දණ්ඩේන ගාවො ගොචරං පාචෙති එවං ජරා ච මච්චූ ච පාණිනං ආයුං පාචෙන්ති**

**යථා**: යම් සේ; **ගොපාලො**: ගව පල්ලෙක්; **දණ්ඩේන**: කෙවිටෙන්; (පහර දෙමින්) **ගාවො**: ගවයන්; **ගොචරං**: තණ බිම කරා; **පාචෙති**: ගෙන යයි ද; **එවං**: ඒ පරිද්දෙන්; **ජරා ච**: ජරාව ද; **මච්චූ ච**: මරණය ද (යන මොහු); **පාණිනං**: සත්වයන්ගේ; **ආයුං**: ආයුෂය; **පාචෙන්ති**: (ක්ෂයට) පමුණුවන්නාහ.

කෙවිටි පහර දෙමින් ගවයන් තණ බිමට ගෙන යන ගෝපාලයකු මෙන් ජරාව හා මරණය සත්ත්වයන් ජීවිතාවසානය කරා ගෙන යයි.

### විවරණය

**ජරා ච මච්චූ ච**: මෙහි ජරා මරණ දෙක ගොපල්ලා මෙන් ද, ජීවිතේන්‍ද්‍රියය ගොනුන් මෙන් ද, මරණය තණබිම මෙන් ද දත යුතුයි. එහි ජාති තොමෝ වනාහි සත්වයන්ගේ ජීවිතේන්‍ද්‍රියය ජරාව වෙතට මෙහෙයවයි. ජරා තොමෝ ව්‍යාධිය වෙතට ද, ව්‍යාධි තොමෝ මරණය වෙතට මෙහෙයවයි. ඒ මරණ තෙමේම කෙටේරියෙන් සින්දාක් මෙන් ඒ පුද්ගලයා ගේ ජීවිතේන්‍ද්‍රියය සිඳ දමා යන්නේය.

**විසාකා මහා උපාසිකාව**: විසාකාව ධනංජය සිටුතුමා ගේ දියණිය වූවා ය. ඇය ගේ මව සුමනා දේවිය යි. ප්‍රකට ධනවත් සිටුවරයකු වූ මෙණ්ඩක ඇය ගේ සීයා වූයේ ය. විසාකාවට වයස හතක් වූ සමයෙහි බුදුරජාණන් වහන්සේ ඇය ගේ උපන්බිම වූ අංග රාජ්‍යයේ භද්දිය නම් ගමට වැඩම කළ හ. ඒ ප්‍රවෘත්තිය ඇසූ විසාකාවගේ මුත්තණුවෝ සිය මිනිබිරිය කැඳවා "විසාකාවෙනි, මෙය ඉතා ප්‍රීතිමත් දිනයකි. ඔබේ සහායිකාවන් හැමදෙනා කැඳවන්න. මනාව සැරසී වාහන වල නැගී සේවක සේවිකාවන් ද කැටුව බුදු පියාණන් පිළිගනු පිණිස පිටත් වන්න" යි උපදෙස් දුන්නේ ය. එයට එකඟ වූ ඕ වහා සියල්ල සූදානම් කර ගෙන බුදුරදුන් එන පෙර මගට ගොස් වැඳ නමස්කාර කර පිළිගත්තා ය.
මේ කුඩා දැරියන් ගේ විනීතාචාරවත් බව දුටු භාග්‍යවතුන් වහන්සේ බෙහෙවින් ප්‍රසන්නව ඔවුන්ට ධර්ම දේශනා කළ සේක. පින් මෝරා සිටි විසාකා කුමරිය ධර්ම දේශනය අවසානයෙහි සෝවාන් ඵලය ලැබුවා ය. ඇය ඒ බාල වියේ දී පවා මුහුකුරා ගිය නුවණින් යුත් වූවා මෙන්ම කාය ශක්තියෙන් ද අන් අයට වඩා මුල් පෙළේ සිටියා ය. එමෙන්ම වනිතාවන් සතු ප්‍රියංකරත්වයෙන් හා ආකර්ශනීයත්වයෙන් ද නො අඩු වූවාය. දිග වරලස, මොනර පිලක් මෙන් වූ බව ද අගින් ඉහලට නැමී සිටි බව ද කියැවෙයි. ඇය ගේ දෙතොල් දීප්තිමත් රක්ත වර්ණයෙන් බැබලුණු අතර මෘදු හා ප්‍රියජනක ද විය. මනාව පිහිටි සුදු දත් මුතු පෙළක් බඳු විය. ඇය ගේ රන්වන් සම මානෙල් පෙති මෙන් සුමුදු විය. දරුවන් රැසක ගේ මවක් වූ පසුව ද ඇය ගේ රූ සපුව මනාව සුරැකිණි.

කේශ කල්‍යාණය, මාංස කල්‍යාණය, අස්ථි කල්‍යාණය, චර්ම කල්‍යාණය හා වය කල්‍යාණය යන පංච කල්‍යාණයෙන්ම යුක්ත වූ ඕ ලෞකික හා ලෝකෝත්තර කරුණු විෂයෙහි ප්‍රඥාවෙන් ද අග්‍රප්‍රාප්ත වූවාය. වයස 16 දී පමණ ඕ තොමෝ පිරිවර සමඟ එක් උත්සව දිනක දිය කෙළි පිණිස ගං ඉවුරට ගියා ය. උන් හිටි හැටියේ වැස්සක් කඩා වැටිණි. විසාකාව ගේ පිරිස වහලක් ඇති තැනක් සොයා දිව ගිය හ. ඔවුන් පිවිසුණු ශාලාවෙහි තමන් ඇසුරු කරන සිටු පවුලක සිටුකුමරකු සඳහා පංච කල්‍යාණියක සොයා ආ බමුණෝ පිරිසක් වූහ. විසාකාව, තම පිරිස දිව ගෙන ආ නමුත් තමා හෙමිහිට තෙමෙමින් අවුත් එහි පිවිසුණු අයුරු දුටු බමුණෝ "අලස කෙල්ලක්" යැයි ඇයට විහිලු කළ හ.

"මට අනිත් අයට වඩා වේගයෙන් දුවගෙන එන්න තිබුණා. නමුත් ඔටුණු පළන් රජතුමා, සැරසූ මඟුල් ඇතා, භික්ෂුනම, අබරණ ලා සැරසුණු කාන්තාව යන සිවු දෙනා දිවීම සිත්කළු හෝ නිවැරදි නොවන බව ඕ පෙන්වා දුන්නා ය. ඇය ගේ පිළිතුරෙන් සතුටට පත් බමුණෝ මේ පංච කල්‍යාණයෙන් පොහොසත් උගත් වියත් රූමතිය අප ගේ සිටු පුත්‍රයාටම ගැලපෙතැයි තීරණය කොට ඒ සඳහා කටයුතු කළ හ. එහි ප්‍රතිඵලය වූයේ මිගාර නම් වූ සිටුවරයා ගේ පුත්‍ර පූර්ණවර්ධන සමඟ ඇය විවාහ වීම යි. ඒ සිටු පවුල තෙරුවන් සරණ ගිය පිරිසක් නො වූහ. විවා මඟුල් දින ඇයට මහා ලතා ප්‍රසාදනය හෙවත් මහ ලිය පළඳනාව දායාද වශයෙන් පියාණන් ගෙන් ලැබිණ. පියාණන් විසින් ඇයට

1. ඇතුළත ගිනි පිටත නො දෙන්න.
2. පිටත ගිනි ඇතුළට නො ගන්න.
3. දෙන්නන්ට පමණක් දෙන්න.
4. නො දෙන්නන්ට නො දෙන්න.
5. දෙන්නන්ට හා නො දෙන්නන්ට ද දෙන්න.
6. සුවසේ හිඳින්න.
7. සුවසේ ආහාර ගන්න.
8. සුවසේ නිදන්න.
9. ගිනි පුදන්න.
10. කුල දේවතාවන් පුදන්න"යි යන උපදෙස් දහය දෙන ලදී.

විවාහයෙන් පසු වාසනාවන්ත පුතුන් දහයක් හා දූවරුන් දහයක් ලද ඕ තොමෝ කාරුණික මවක් වූවා ය. මාමාණ්ඩිය බුදු දහමට හරවා ගත් පසු ඇය ඔහුට ද මවක් වූවා යන අරුතින් "මිගාර මාතා" නමින් ද පතළ වූවා ය. පින් දහම් කරමින් ප්‍රමුදිත ජීවිතයක් ගත කළ ඇය මිය යන විට වයස අවුරුදු එකසිය විස්සක් වී තිබිණි.



*අකුසල් කරන අනුවනයා තමා කළ පව් විපාක විඳැ ගින්නෙන් දැවුනකු මෙන් තැවේ.*

136. අථ පාපානි කම්මානි
කරං බාලො න බුජ්ඣති
සෙහි කම්මේහි දුම්මේධො
අග්ගි දඩ්ඪෝ'ව තප්පති (10:8)

නො වැටහෙන මුත් බාලයන් හට
පාපයෙහි රඟ එය කරන විට
දැවෙයි ගින්නෙන් පිළිස්සෙන මෙන්
විපාකය පෙරැළී පැමිණි විට

# දවයි විපාකය - කළ වුන් පාපය.
## 10 (6) අජගර ප්‍රේත වස්තුව (136 ගාථාව)

සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කළ භාග්‍යවතුන් වහන්සේ අජගර ප්‍රේතයකු නිමිති කර ගෙන මේ ගාථාව දේශනා කළ සේක.

දිනක් මුගලන් මහ රහතන් වහන්සේ ලක්ඛණ හිමියන් සමග ගිජුකුළු පව්වෙන් පහළට වැඩම කරන සේක් යොදුන් විසි පහක් දිග පිඹුරකු වන් ප්‍රේතයකු සිය දිව්‍යැසින් දුටු සේක. ඔහු ගේ හිසෙන් නැගෙන ගින්න වල්ගය තෙක් දවා ලයි. වල්ගය දෙසින් නැගෙන ගින්න හිස තෙක් දවයි. දෑලයෙන් නැගෙන ගින්න සිරුර මැද තෙක් දවාලයි. මේ ප්‍රේතයා දුටු මුගලන් මහ රහතන් වහන්සේ සිනා පහළ කළ සේක."ස්වාමීනි, සිනාසෙන්නෙ කවර හෙයින්දැ" යි ලක්ඛණ තෙරුන් විමසූ විට "ආයුෂ්මත්නි, එය භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී විමසන්නැ" යි මුගලන් හිමියෝ පැවසූ හ.

ලක්ඛණ තෙරණුවෝ ඒ අනුව භාග්‍යවතුන් වහන්සේ හමුවේ දී මුගලන් හිමියන් ගෙන් ඒ ප්‍රශ්නය විමසූ හ. "ආයුෂ්මත්නි, මම එතැනදී ප්‍රේතයකු දුටුවෙමි. ඔහු ගේ ශරීරය පිඹුරකු බඳු විය. මුළු සිරුරම හැම අතින්ම දැවෙමින් තිබුණේය"යි විස්තර කර "එවන් ප්‍රේතයකු මීට කලින් මම දැක නො තිබුණෙමි. මෙවන් රුදුරු දුක් ඇති සසරින් මම මිදී ඇත්තෙමි. එහෙයින් සිනා පහළ කළෙමි"යි පැහැදිලි කළ හ. එවිට භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, මගේ ශ්‍රාවකයන්ට දෙනෙත් ඇතුවා පමණක් නොව ඒවායින් ප්‍රයෝජන ගන්නා ශක්තිය ද තිබේ. ඔය අජගර ප්‍රේතයා මම බුදු වූ දා විදුරසුනේ සිටම දිටිමි. එහෙත් එවන් ප්‍රේතයන් සිටින්නටත් පිළිවන් දැයි සැක කර ශ්‍රාවකයන් විමතියට පත් වන හෙයින් ඒ ගැන යමක් කිසිවකුට නො වදාළෙමි"යි ප්‍රකාශ කළ හ.

දම් සබාවෙහි රැස්ව හුන් භික්ෂූන් වහන්සේලාට එම ප්‍රේතයා එසේ දුක් විඳින්නට හේතුව කුමක්දැයි දැන ගන්නට රුචියක් ඇති වූයෙන් බුදුරජාණන් වහන්සේ එය හෙළි කර වදාළ හ.

කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ගේ සමයෙහි සුමංගල නම් එක් සිටුවරයෙක් රන් ගඩොලින් විශාල ඉඩමක් වහා මිළදී ගෙන තවත් විශාල රන් ප්‍රමාණයක් වැය කොට මහා විහාරයක් කරවා කෝටි ගණන් වැය කර බුද්ධෝපස්ථාන කළ හ. දිනක් පාන්දරින් බුදුන් දකින්නට යන අතර මග රෑ තිස්සේ හොරකමේ ගොස් දෙපාවල තැවරුණු මඩවත් සෝදා නො ගෙන කළු රෙද්දකින් හිස වසා ගෙන නුවර දොරටුව අසල නිදා සිටි සොරෙක් සිටාණන් ගේ නෙතට ලක් විය. ඒ දුටු සිටාණෝ "මේ තැනැත්තා රෑ එළිවන තුරු හොරකමේ ගොස් දෙපාවල මඩවත් සෝදා නොගෙන නිදා ඉන්න හැටි" යි පැවසී ය. ඒ වචන අඩ නින්දේ සිටි සොරා ගේ කණ වැකිණ. "හොඳයි මම ඒක බලා ගන්නම්'' යි දත් මිටි කෑ හේ සිටාණන් ගෙන් පලි ගැනීම පිණිස එතුමා ගේ කුඹුර හත්වරක් ගිනි තැබී ය. ගවයන් ගේ පාද හත් වරක් ම කපා ලීය. සිටු මැදුරට ද හත් වරක් ගිනි තැබීය.

ඔහු තුළ සිටුතුමා කෙරේ වූ වෛරය මේ කිසිවකුනුත් නිවී නොගිය හෙයින් සිටුතුමා ගේ සේවකයකු වෙතින් ''ඔය සිටු තුමා ඉතාම ප්‍රිය කරන වස්තුව කුමක් ද?'' යි විමසූ හේ ''බුදු රදුන්ට ඉදි කළ ගඳ කිළිය තරම් සිටුතුමා අගය කරන වස්තුවක් තවත් නැත''යි ඔහු කී හෙයින් ගඳ කිළිය විනාශ කර මගේ වෛරය සංසිඳවා ගනිමි යි සිතා බුදු රදුන් පිඬු පිණිස ගිය අතර තුර ගඳ කිළියේ වූ සියළු පරිභෝග භාණ්ඩ කුඩුකර දමා ඊට ගිනි තැබී ය. සිටු තුමා එහි අවුත් බලන විට මුළු ගඳ කිළිය ම දැවී අළුවී තිබිණි. වචනයක් වත් නො කී සිටු තුමා අළුතෙන් ගන්ධකුටියක් ඉදි කර පූජා කළේය. එම පූජාව දින ''මේ මිනිසාට කවර දෙයක් කළත් ඔහු කම්පාවට පත්වන්නේ නැත. ඔහු මරා ඉවරයක් කරමි'' යි සිතූ හොරා උල් පිහියක් කකුලේ බැඳ ගෙන උත්සවයට සහභාගි විය.

ගඳ කිළිය බුදුන්ට පිදූ සිටුවරයා ''මා සමඟ වෛර බැඳගත් පුද්ගලයෙක් මගේ දේපල වනසා දමා මේ ගන්ධකුටිය ද ගිනි තැබීය. ඔහු ගඳ කිළිය ගිනි තැබූ නිසා මට මේ පින කර ගන්නට පිළිවන් විය. ඔහුට මේ පින් අනුමෝදන් කරමි. ඔහු සුවපත් වේවා !'' යි පින් අනුමෝදන් කරනු ඇසූ සොරා ''මේ නම් පුදුම සාධු ගුණ ඇති උතුමෙකැ'' යි ළය හුණු වී වැඳ සමාව අයැදී ය. සිටු තුමා ද තමන් එදා කී වචනයට සමාව ඉල්ලා සිටියේ ය.

''කළ අකුසල් නිසා දිගු කලක් අපා දුක් විඳ දැන් මේ අජගර ප්‍රේතව උපන්නේ ඒ තැනැත්තා ය'' යි වදාළ භාග්‍යවතුන් වහන්සේ පූර්වෝක්ත ගාථාව ද දේශනා කළ හ.

#### විවරණාත්මක අනුවාදය (136 ගාථාව)

**අථ පාපානි කම්මානි කරං බාලො න බුජ්ඣති අථ**
**දුම්මේධො සෙහි කම්මෙහි අග්ගි දඩ්ඪො ඉව තප්පති**

**අථ**: එපමණක් නොවෙයි (අඥානයා ක්‍රෝධ වශයෙන් පව්කම් කරනවා පමණක් නො වෙයි) **පාපානි කම්මානි**: පාප කර්ම, කරං: කරන්නා වූ, **බාලො**: අඥානයා (මෝඩයා), **න බුජ්ඣති**: (මේ පව්කමට මෙබඳු විපාකයක් ඇතැයි දැ) නො දනියි. **දුම්මේධො**: (ඒ) අඥාන තැනැත්තා, **සෙහි කම්මෙහි**: තමා කළ පව්කමින්, **අග්ගි දඩ්ඪො ඉව**: ගින්නෙන් පිළිස්සෙන්නාක් මෙන්, **තප්පති**: දැවෙයි.

අඥාන පුද්ගලයා පව් කරන අතරතුර එහි බරපතලකම තේරුම් නො ගනියි. එහෙත් පසු කලක කම් විපාකයන් ගින්නකින් දැවෙන්නාක් මෙන් දුක් විඳි යි.

#### විවරණය

මෙහි **බාල**, **දුම්මේධ** යන වචන වලින් නුවණ මඳ තැනැත්තා අදහස් වෙයි. ඔහුට හොඳ - නරක වෙන් කර හඳුනා ගන්නා විචක්ෂණය නැත. එහෙයින් සම්මා දිට්ඨියෙන් තොර ය.



*නිදොස් උතුමනට අවැඩ කරන තැනැත්තා දසදුක් කරුණු අතුරෙන් එකකට වහා ම පැමිණේ.*

137. යො දණ්ඩේන අදණ්ඩේසු
අප්පදුට්ඨේසු දුස්සති
දසන්නං අඤ්ඤතරං ඨානං
ඛිප්පමෙව නිගච්ඡති (10:9)

වද නොකළ යුතු අයට - වද වේදනා කරන
දුෂ්ට කම් සිත නොමැති - උතුමන් ට දුෂ්ට වන
යමෙක් වෙත්නම් ඉපිද - දස නරකයෙන් එකක
වහා දුකටම වැටෙති - එහි විපාකය විලස

# කළොත් වෛර උතුමන්හට - වෙයි විපාක විඳ ගන්නට

## 10 (7) මුගලන් මහ තෙර වත (ගාථා 137 සිට 140 දක්වා)

**මුගලන් මහ රහතන් වහන්සේ** නිමිති කොට බුදු පියාණන් වහන්සේ විසින් මේ ගාථා හතර දේශනා කර වදාරන ලද්දේ දෙව්රම් වෙහෙරෙදී ය.

එක් සමයෙක් හි මිසදිටුවෝ එක් රැස්ව මහා කුමන්ත්‍රණයක් කළ හ.

"සොහොයුරනි, බුදු රදුන්ටත් ශ්‍රාවකයන්ටත් බොහෝ දාන මානාදියත් පිරිකරත් ලැබෙන රහස ඔබ දනිත් ද?" එක් අයෙක් විමසූ හ.

"ලාභ ප්‍රයෝජන ලැබෙන බව නම් දනිමු. රහස නම් නො දනිමු. ඔබ දනිත් නම් අපටත් කියන්න" යි අන්‍යයෝ පැවසූ හ.

"අහන්න, මුගලන් මහ රහතන් වහන්සේ එක් වරකට දිව්‍ය ලෝකයට යති. පින් කර දේවාත්ම භාව ලබා උපන්නවුන් ගෙන් ඔබ මෙහි උපදින්නට කළ පින්කම කුමක්දැයි අසා දැන ගෙන මනු ලොව අවුත් ජනයාට ඒ ගැන කියා පින් කළ මැනවැ යි පිනට දිරි ගන්වති. තවත් වරක අහසට යති. එහිද නිරා දුක් විඳින සත්ත්වයන් ගෙන් ඔබ මේ දුක් විඳින්නට කළ පාප කර්මය කුමක් දැයි අසා දැන ගෙන එය ද මනු ලොව ජනයාට විස්තර කර දී පාපයෙන් වළකා පිනට යොදවති. මිනිස්සු ද ඒ අසා බුද්ධ ප්‍රමුඛ සංඝයාට ලාභ සත්කාර පමුණුවති. මේ මුගලන් තෙරුන් ඝාතනය කර ලන්නට අපට හැකි වුව හොත් සියළු ලාභ ප්‍රයෝජන අපටම ලබා ගත හැකි වෙයි"

ඒ ඇසූ අන්‍ය තීර්ථකයෝ "කදිම යෝජනාවකි" යි ඒකමතිකව "කොහොම හරි අපි මුගලන් හිමි මරා දමමු" යි සිතා දායක දායිකාවන් ගෙන් මුදල් සම්මාදම් කර කහවණු දහසක් එකතු කර ගත් හ. මැර පිරිසක් කැඳවා ඒ මුදල් දී "මුගලන් තෙරණුවෝ කාලසිලාවෙහි වෙසෙති. එහි ගොස් උන් වහන්සේ මරා දමන්න" යි ඉල්ලා සිටිය හ. මිනීමරු මැරයෝ ද යහපතැයි ගිවිස ගත් හ. ඔවුහු කාලසිලා ප්‍රදේශයට ගොස් මුගලන් තෙරුන්ගේ කුටිය වටලා ගත් හ.

සිය කුටිය මිනීමරුවන් විසින් වට කළ බව දැනගත් මුගලන් මහ රහතන් වහන්සේ ඍද්ධි බලයෙන් යතුරු සිදුරෙන් නික්ම දිවි ගලවා ගත් හ. තෙරුන් නුදුටු මැරයෝ ඊළඟ දිනයේ ද අවුත් කුටිය වට කළ හ. ඒදින ද තෙරුන් වහන්සේ කැණි මඬලින් නික්ම දිවි රැක ගත් හ. මෙසේ මාස දෙකක් තිස්සේම මැරයන් ගේ වෑයම අසාර්ථක විය. එහෙත් ඔවුහු තුන් වන මාසයේ ද තෙරුන් අල්ලා ගන්නා අධිෂ්ඨානයෙන්ම ක්‍රියා කළ හ.

තමන් වහන්සේ පූර්ව ජන්මයක කළ අකුසලයක විපාක වශයෙන් මෙසේ මිනීමරුවන් තමන් පසු පස එන බව දත් තෙරුන් වහන්සේ ගැලවීමේ උත්සාහය අත හරින්නට තීරණය කළ හ. අන්තිමේ තෙරුන් අල්ලා ගැනීමට සමත් වූ සොරු උන්වහන්සේ ගේ සිරුරෙහි ඇට කටු කුඩුවන සේ තැලූ හ. උන්වහන්සේ මිය ගිය බව සිතූ ඔවුහු සිරුර පඳුරක් යටට වීසිකොට යන්නට ගිය හ.

පිරිනිවන් පාන්නට පෙර බුදුරදුන් දැක සමුගන්නට සිතූ තෙරණුවෝ ඍද්ධි බලයෙන් සිරුර ඍජු කරගෙන බුදුරදුන් දක්නට ගොස් තමන් පිරිනිවන් පානා බව සැළ කර සිටිය හ.

"ඔබ පිරිනිවන් පානවාද මොග්ගල්ලාන?" බුදු රජාණන් වහන්සේ විමසා සිටිය හ.

"එහෙමයි ස්වාමීනි, මම පිරිනිවන් පාන්නෙමි"

"කවර තැනකට ද ඔබ පිරිනිවන් පාන්නට යන්නේ ?"
"කාලසිලාවට යි ස්වාමීනි,"

"එසේ නම්, පිරිනිවන් පාන්නට පෙර මට බණ ටිකක් කියන්න. අදින් පසු මට ඔබ වැනි ශ්‍රාවකයෙක් නැති වෙයි."
"මම එසේ කරන්නෙමි ස්වාමීනි," යි පැවසූ මොග්ගල්ලාන මහ රහතන් වහන්සේ අහසට නැඟී ප්‍රාතිහාර්යය දක්වා භාග්‍යවතුන් වහන්සේට ගෞරව කොට ධම් දේශනයක් ද පවත්වා කාලසිලාවට ම වැඩි සේක.

### විවරණාත්මක අනුවාදය (137 ගාථාව)

**යො අදණ්ඩෙසු අප්පදුට්ඨෙසු දණ්ඩෙන දුස්සති දසන්නං අඤ්ඤතරං ඨානං ඛිප්පං එව නිගච්ඡති**

**යො**: යමෙක්; **අදණ්ඩෙසු**: අහිසංක වූ (දණ්ඩනයට නො නිසි වූ); **අප්පදුට්ඨෙසු**: (කිසිවෙකුට) ද්වේෂ නො කරන,(රහතුන් විෂයෙහි); **දණ්ඩෙන**: දඬුවමින්; **දුස්සති**: අපරාධ හා ද්‍රෝහිකම් කරයි ද (හෙතෙම); **දසන්නං**: දශවිධ දුක්ඛ වේදනාවන් ගෙන්; **අඤ්ඤතරං ඨානං**: එක්තරා වේදනාවකට; **ඛිප්පං එව**: වහාම; **නිගච්ඡති**: පැමිණෙන්නේය.

යම්කිසි තැනැත්තෙක් අනුන්ට හිරිහැර නො කරන දුෂ්ට ගති නැති අයකුට හිරිහැර කරයි නම් ඔහුට විපාක දහයකින් එක්තරා දඬුවමක් අත්වන්නේ ය.





*නිදොස් උතුමනට අවැඩ කරන තැනැත්තා මේ ලොවැ මේ දස වැදෑරුම් විපත් කරුණින් එකකට පැමිණේ.*

138. වෙදනං ඵරුසං ජානිං
සරීරස්ස ච භෙදනං
ගරුකං වාපි ආබාධං
චිත්තක්ඛෙපං ච පාපුනෙ (10:10)

ඇඟ පතට වේදනා - ධන හානි ඇති වෙමින්
ලැබෙයි අත පය කැඩෙයි - වේදනා ලැබ දෙමින්
භයානක ලෙඩ රෝග - හැදෙයි දුක් දී නොමින්
කල්පනා අවුල් වෙයි - සිත විකල් වී ගොසින්

# දුන්නොත් වද රහතුන් හට - දැඩි දුක් වෙයි උහුලන්නට
## 10 (7) මුගලන් මහ තෙර වත (137 සිට 140 දක්වා ගාථා)

මුගලන් මහ රහතන් වහන්සේ පිරිනිවන් පෑ වහාම "මැරයෝ මුගලන් තෙරුන් ඝාතනය කළ හ"යන පුවත රට පුරාම පැතිර ගියේ ය. මිනීමරුවන් අල්ලා ගැනීම පිණිස අජාසත් රජ තෙම චර පුරුෂයන් යෙදැවී ය. මැර පිරිස දිනක් සුරාපානය කරමින් අවන්හලෙක කල් යවන අතර එක් මැරයකු ගේ සුරා විත තවෙකකු ගේ අත වැදී ඉහිරිණි. කුපිත වූ මැරයා "තක්කඩියා! මගේ රා කට්ට ඉහිරෙව්වා" යි ඔහුට බැණ වැදිණ. ඒ අසා අනෙකාද කිපී "උඹ තමයි තක්කඩි මිනී මරුවා. උඹ තමයි මුගලන් හාමුදුරුවන්ට මුලින් ම ගැහුවේ" යි බැණ වැදුණෝ ය. චර පුරුෂයන් වහා රජතුමාට දන්වා ඔවුන් අත් අඩංගුවට ගෙන සම්පූර්ණ තොරතුරු අසා දැන ගත්තේ ය. "කවුද නුඹලාට මුගලන් හිමි මරන්න මුදල් ගෙව්වේ?" යි රජතුමා ප්‍රශ්න කළ විට තීර්ථකයන් බව ඔවුහු හෙළි කළ හ.

තීර්ථකයන් ගේ පහත් කුමන්ත්‍රණය ගැන ඇසීමෙන් බලවත් සංවේගයට හා කෝපයට පත් රජ තෙම ඔවුන් අත් අඩංගුවට ගෙන මැරයන් ද සමග එකට ඉණ මට්ටමට බිම වළලා පිදුරු වලින් වසා ගිනි තබා මැරවී ය. ඔවුන් මිය ගිය බව දත් විට අජාසත් රජ තෙම යකඩ නගුලෙන් සී සා සිරුරු වනසා දැම්මේ ය.

මුගලන් මහ රහතන් වහන්සේට අත් වූ ශෝක ජනක ඉරණම ගැන භික්ෂුන් වහන්සේ දම් සභාවෙහි කතිකා කළ හ. උන් වහන්සේලා ගේ අදහස වූයේ මුගලන් හිමියන් ගේ ශ්‍රේෂ්ඨත්වයේ තරමට උන් වහන්සේට ලැබුණු මරණය කිසිසේත් නො ගැලපෙන බවය. එවන් උත්තමයකු මිය යා යුත්තේ මීට වඩා උතුම් ගෞරවාන්විත විලාසයෙන් නො වේ ද? උන් වහන්සේලා ගේ සාකච්ඡාව පැවැත්වෙන අතරේ භාග්‍යවතුන් වහන්සේ එහි වැඩම කළ හ.

"මහණෙනි, මොග්ගල්ලාන මේ ආත්මයෙහි පත්වූ විශිෂ්ට තත්වයට ඒ මිය ගිය විලාසය නො ගැලපෙන බව සැබෑය. එහෙත් උන් වහන්සේ ඉකුත් භවයෙක කළ මහා අකුසලයේ තත්වයට ගැලපෙන්නේ ය"යි උන්වහන්සේ වදාළ හ. ඒ ඇසූ භික්ෂූහු "එහෙත් ස්වාමීනි, මෙසේ මිය යන්නට මුගලන් තෙරුන් ඒ අතීත භවයක කළ අකුසල කර්මයෙහි තොරතුරු අපි නො දනිමු. භාග්‍යවතුන් වහන්සේ එය අපට පැහැදිලි කර දෙන්නේ නම් යෙහෙකි." යි ආරාධනය කර සිටියහ. භාග්‍යවතුන් වහන්සේ එය හෙළි කොට වදාළ හ.

පෙර එක් යස ඉසුරෙන් ආඪ්‍ය වූ පවුලක තරුණ පුත්‍රයෙක් තම දෙමාපියන්ට සියතින් ම උපස්ථාන කරමින් ගෙදර හැම කටයුත්තක් ම තමා ම කරමින් ඉතා යහපත් ජීවිතයක් ගත කළේ ය. දිනක් ඔහු ගේ දෙමාපියෝ ඔහු අමතා "පුතුනි, මේ ගෙදර හැම වැඩම තනියම කිරීමෙන් ඔබ උවමනාවට වඩා මහන්සි වෙනවා. මේ සේරම පුතාට තනියම කරන්න බෑ. අපි පුතාට විවාහයක් කර දෙන්නම්" යි පැවසූ හ. එහෙත් ඊට අකැමැති වූ පුත්‍රයා "අම්මත්, තාත්තත් ජීවතුන් අතර ඉන්න තුරු මට මේ සේරම කරන්න පුළුවන්. ඔබ මට විවාහයක් කිරීම ගැන හිතන්නවත් උවමනා නෑ." එහෙත් ඔහු දිගින් දිගට ම එපා කීවත් බලයෙන් මෙන් දෙමාපියෝ ඔහුට තරුණ ලඳක් විවාහ කර දුන් හ. එහෙත් ඇය දෙමාපියන්ට ගරු කර ගෙන සිටියේ ඉතා ටික කලක් පමණි. ඇයට මේ මහළු යුවල ගේ දර්ශනය පවා අමිහිරි වූයේ ය. "ඔබේ දෙමාපියන් සමග මේ ගෙදර එකට වසන්නට මම අකැමැත්තෙමි" යි ඕ නිතර කියන්නට වූවාය. එහෙත් සැමියා ඒ ගණනකට නො ගන්නා හෙයින් ඕ ගේ හැම තැනම සෙම් සොටු, කෙළ, හිසකේ වැනි සේ පෙනෙන්නට යම් යම් දේ විසුරුවමින් බඩු මුට්ටු එහි මෙහි විසුරුවමින් මවුපියන් ගේ වැරදි බව කියමින් ඉතා අප්‍රසන්න තත්ත්වයක් නිවසෙහි ඇති කළා ය. අන්තිමේ තරුණයා ද ඇය ගේ බස් පිළිගෙන තම දෙමාපියන් කෙරේ කළකිරුණෝ ය.

"දුක් නොවන්න. මම ඉක්මණින් ම ඔවුන් ගෙන් බේරුමක් කර ගන්නම්" යි පැවසූ හේ දෙමාපියන් අමතා "අම්මේ, තාත්තේ, ඔබට හුගක් නෑදෑයින් ඉන්නවා නේ ද? හුගක් කාලෙකින් ඒ අය බලන්නට ගියේත් නැහැ නේ ද?" යි පවසා ඔවුන් නෑදෑ ගෙවල්වල ගෙන යන ව්‍යාජයෙන් කරත්තයකට නංවා ගත්තේ ය.

**විවරණාත්මක අනුවාදය (138 ගාථාව)**

**ඵරුසං වේදනං ජානිං සරීරස්ස භේදනං වා අපි**
**ගරුකං ආබාධං වා චිත්තක්ඛෙපං වා පාපුනෙ**

**ඵරුසං**: රළු වූ; **වේදනං**:(ශාරීරික)වේදනාවකට; **ජානිං**: ධන හානියට; **සරීරස්ස භේදනං වා**: ශරීරාංග කැඩී බිඳී යාමට හෝ; **අපි**: එමෙන්ම; **ගරුකං ආබාධං වා**: බරපතල ලෙඩ රෝගයකට හෝ; **චිත්තක්ඛෙපං වා**: මානසික ව්‍යාකූල භාවය හෝ; **පාපුනෙ**: පැමිණෙන්නේය.

උසුලන්නට අපහසු වේදනා, ධන හානිය, අතපය කැඩීම, බරපතල ලෙඩ රෝග හෝ මානසික ව්‍යාකූල භාවය යන විපාක ඔහුට ලැබෙන්නට පුළුවන.





*නැණවතා කාමයන්හි සැප නැති බව හා බොහෝ දුක් ඇති බව දැනගනී.*

139. රාජතො වා උපස්සග්ගං
අබ්භක්ඛානං ච දාරුණං
පරික්ඛයං ච ඤාතිනං
භොගානං ච පභංගුරං (10:11)

රජවරුන් උදහස්ව - නොයෙක් හිරිහැර ඒවි
චෝදනා වලට බර - මුහුණ දෙන්නට වේවි
නෑ පිරිස ටිකින් ටික - දුරින් දුරටම යාවි
වස්තු සම්පත් හැමත් - ටිකින් ටික දිය වේවි.

# උතුමන්හට වද හිරිහැර - කළහොත් සිදු වේය නපුර

## 10 (7) මුගලන් මහ තෙර වත (ගාථා 137 සිට 140 දක්වා)

මහ වන මැදදී හේ මා පියන් අමතා "පල් හොරු ගැවසෙන පලාතකයි දැන් අපි යන්නේ. ඒ නිසා මම කරත්තෙන් බැහැලා ටිකක් සෝදිසි කරන්නම්. මේ තෝන් ලණුව අතට ගන්න. ගොන්නු පාර දන්නවා. ඉඳ හිටලා පොඩ්ඩක් ඇගට පයින් පොඩි තට්ටුවක් කළා ම ඇති"යි පවසා කරත්තයෙන් බැස වනයේ මඳක් ඈතට ගොස් හඬ වෙනස් කර කෑගසමින් හොරු කණ්ඩායමක් කරත්තය වෙත ළං වන විලාසයක් දැක්වී ය. මා-පිය දෙපළ ම නෙත් අඳ හෙයින් කිසිවක් නො දකිති. හොරුන් තමන් වට කළායයි සිතූ ඔවුහු "පුතේ, අපි නම් හිටියත් එකයි මළත් එකයි. අපි දැන් වයසක මිනිස්සුනේ. පුතා පණ බේරා ගෙන දුවන්න. පණ බේරා ගන්න පුතේ" යි කියන්නට වූ හ. එහෙත් හොරුන් පැමිණි බව හැඟවූ පුත්‍රයා ලොකු පොල්ලක් ගෙන තම දෙමාපියන් තළා මරා දැම්මේ ය. මළ සිරුරු වනයේ විසි කර දමා හේ ගෙදර ගියේ ය.

මහ මුගලන් තෙරුන් පූර්වාත්මභාවයෙක මෙසේ තරුණ සැමියකු ලෙස බිරිඳ ගේ වචන වලින් අන්ධව, අන්ධ දෙමාපියන් තලා මරා දැමූ අකුශලය විස්තර කළ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, මෙබඳු කෲරතර පහත් ක්‍රියාවක් කිරීමෙන් රැස් වූ අකුසලය හේතුවෙන් මොග්ගල්ලාන වසර අසංඛ ප්‍රමාණයක් අපාගතව දුක් විඳ ඒත් පව් ගෙවී නිම නො වූයෙන් ආත්ම සියයක් ම මෙසේ මැරයන් විසින් ඇට කටු කුඩු කරනු ලැබ මිය පරලොව ගියේ ය. එහෙයින් මොග්ගල්ලාන මිය ගිය විලාසය ඔහු ගේ සම්භාවනීය ශාසනික තත්ත්වයට අනුරූප නො වුණ ද ඔහු ගේ කර්මයෙහි තත්ත්වයට අනුරූප වූයේයැ"යි දේශනා කළ හ.

මුගලන් හිමියන් තළා පෙළා මරා දැමීමේ කාර්‍යය භාරගත් මැරවරයන් ගැන කරුණු දැක්වූ උන් වහන්සේ තමන්ට වරදක් නො කළ අයට හිරිහැර කරන්නහු විඳින බරපතල දඬුවම් විස්තර වන පරිදි මේ ගාථා චතුෂ්කය වදාළ සේක.

**විවරණාත්මක අනුවාදය (139 ගාථාව)**

**රාජතො උපස්සග්ගං වා දාරුණං අබ්භක්ඛානං වා**
**ඤාතිනං පරික්ඛයං වා භොගානං පභංගුරං වා**

**රාජතො**: රජුන් ගෙන් (වන); **උපස්සග්ගං වා**: උවදුරකට හෝ; **දාරුණං**: දරුණු; **අබ්භක්ඛානං වා**: චෝදනාවන්ට ලක්වීම හෝ; **ඤාතීනං**: නෑයන් ගේ; **පරිකඛයං වා**: ක්ෂය වීමට හෝ; **භොගානං**: භෝගයන් ගේ; **පභංගුරං**: විනාශයට හෝ; (පැමිණෙන්නේ ය.)

රජවරුන් ගෙන් හිරිහැර වීම, දරුණු චෝදනා වලට ලක් වන්නට වීම, නෑදෑ පිරිස අඩු වීම හෝ භෝග සම්පත් විනාශ වීම සිදුවිය හැක.

**විවරණය**

**මුගලන් මහ රහතන් වහන්සේ**: මේ ගාථා හතරම දේශනා කර ඇත්තේ මුගලන් මහ රහතන් වහන්සේ ගේ පරිනිර්වාණය සිදු වූ ආකාරය මුල් කර ගනිමිනි. මුගලන් මහ රහතන් වහන්සේ සම්ප්‍රදායෙහි හඳුන්වනු ලබන් නේ වමත් සව්වන් වහන්සේ වශයෙනි. (දකුණත් සව් වූයේ සාරිපුත්ත මහ රහතන් වහන්සේ ය.) සාරිපුත්ත - මොග්ගල්ලාන දෙනම පෙර ජන්ම රාශියක පටන් එකට ම බෝධි සම්භාර පුරා ගෙන අවුත් මේ ජන්මයෙහි දී එකම දිනයෙහි උපන් බව සඳහන් වෙයි. මෙය මිත්‍රත්වයෙහි ගැඹුරු බව දැක්වීම සඳහා ලොව ඇති පැරණිතම නිදසුන් වලින් එකකි.

මුගලන් මහ තෙරුන් වහන්සේ බුද්ධ ශ්‍රාවකයන් අතර ඍද්ධිමතුන්ට අග්‍ර වූ බව ප්‍රකාශ කර තිබේ. ඍද්ධි ප්‍රාතිහාර්ය පෑම විෂයෙහි දක්ෂතා තිබුණු එක් නන්දෝපනන්ද නම් නාග රාජයෙක් බුදු රදුන්ට හා මහා ශ්‍රාවකයන් වහන්සේලාට තර්ජනය කළ අවස්ථාවෙහි ඔහු දමනය කිරීමට බොහෝ ශ්‍රාවකයන් වහන්සේ පෙරමුණ ගත් හ. එහෙත් ඒ කිසි ම හිමිනමකට ඉඩ නුදුන් භාග්‍යවතුන් වහන්සේ ඒ සඳහා මොග්ගල්ලාන හිමියනට පමණක් ඉඩ දුන් හ. අන්තිමේ නාග රාජයා දමනය වූ අතර මුගලන් හිමියන් ගේ කීර්තිය දසත පැතිර ගියේ ය. මහා ජයමංගල ගාථාවන්හි අට වැන්නෙන් කීර්තනය කරනු ලබන්නේ එම ජයයි. මුගලන් මහ රහතන් වහන්සේට තම ඍද්ධි බලයෙන් පයෙහි මහපටැඟිල්ලෙන් ශක්‍රයා ගේ විමානය කම්පනය කිරීමට හෝ අපායෙහි සංචාරයක යෙදීමට වුව ද හැකි විය.

දෙව් ලොවට හා අපායට ගමන් බිමන් කිරීමේදි තොරතුරු හුවමාරු කටයුතු ද උන්වහන්සේ අතින් සිදු වූ බව පෙනෙයි. මිහි කත මත වසන්නවුනට අපාගත වූවන් කළ පාප කර්ම ගැනත්, දෙව් ලොව වාසීන් කුසල විපාක අනුභව කරන අකාරය ගැනත් තොරතුරු ගෙන ආවේ උන්වහන්සේ ය. මේ කාර්‍යය නිසා බුදු සසුනෙහි ගෞරවය වර්ධනය වූ නමුත් තීර්ථකයනට අලාභ සිදු විය.

මුගලන් හිමියන් ගේ ජීවිත කථාව අපට ආදර්ශ සපයන අතර ම අනතුරු ඇඟවීම් ද කරයි. ඍද්ධි ප්‍රාතිහාර්යය පෑමේ ශක්තිය අතින් අතිශය උත්කෘෂ්ට මට්ටමේ සිටි මහ රහතන් වහන්සේ නමකට වුව ද කර්මයේ අයෝමය හස්තයෙන් ගැලවී ගන්නට බැරි වූ ආකාරය එයින් මනාව නිරූපිත ය. ඈත අතීත භවයක පිතෘ ඝාතන හා මාතෘ ඝාතන යන පාප කර්මයන් උන්වහන්සේ විසින් කර තිබුණේ අතිශය ජුගුප්සා ජනක අන්දමිනි. ආත්ම  විශාල සංඛ්‍යාවක් නරකාදියෙහි පැසීමෙන් පවා පාපය ගෙවී නිම වී නො තිබිණි. කෙසේ වූව ද සාමාන්‍ය ධර්මතාව වන්නේ අග්‍ර ශ්‍රාවක දෙනම භාග්‍යවතුන් වහන්සේට පෙර පිරිනිවන් පෑම බව කියති. පරිනිර්වාණ ප්‍රාප්ත අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා ගේ ගුණ කථනය භාග්‍යවතුන් වහන්සේ විසින් ම කරනු ලැබීම ධර්මතාවකි.

ඊළඟ පිටුව හා බැඳේ





*නිදොස් උතුමනට අවැඩ කරන තැනැත්තා මේ ලොවැ මේ දස වැදැරුම් විපත් කරුණින් එකකට පැමිණේ.*

140. අථව'ස්ස අගාරානි
අග්ගි ඩහති පාවකො
කායස්ස භෙදා දුප්පඤ්ඤො
නිරයං සො'පපජ්ජති (10:12)

දැවෙයි ගිනි ගෙන ඔහු ගේ - ගෙවල් දොරවල් හැමත්
නැඟී ගිනි දැල් උඩට - දැවී යයි දේපලත්
අමන දද තැනැත්තා - කය බිඳී මරණ පත්
දුක් විඳියි ඉපදිලා - නියතයෙන් අපායෙත්

# කළෝතින් පාපය - අපා දුක මය උරුමය

## 10 (7) මුගලන් මහ තෙර වත (ගාථා 137 සිට 140 දක්වා)

**විවරණය**

පෙර පිටුව හා බැඳේ

මුගලන් මහ තෙරුන් වහන්සේ පැවිද්දට පෙර හඳුන්වන ලද්දේ කෝලිත නමිනි. කෝලිත ගිහි අවදියෙහි දී ඉතා කුළුපගව ඇසුරු කළේ උපතිස්ස නම් තමා බඳුම පින් මේරූ නුවණැති තරුණයෙකි. මේ දෙදෙනා සසර ඉතා දිගු කලෙක පටන් අතිශය කුළුපග මිත්‍රයෝ වූහ. ලොව අව්‍යාජ ස්නේහාර්ද්‍ර මිත්‍රත්වය පිළිබඳව මෙතරම් රම්‍ය වූ නිදර්ශනයක් තවත් සිතිය නො හැක. ඔවුහු එකට පෙරුම් දම් පුරමින් සසර සැරිසරා අප බුදුන් සමයෙහි ද එක් ම රුචි - අරුචිකම් ඇතිව ඉපිද එකට ම පැවිදිව රහත්ව පිරිනිවන් පෑහ. ලෞකික අරමුණු විෂයෙහි පමණක් නොව ආධ්‍යාත්මික අරමුණු විෂයෙහි ද සමාන මානසිකත්වයන් ඇතිව සිටි මේ දෙදෙනා එක්ව ම සත්‍ය ගවේෂණය කර එක්ව ම එය අවබෝධ කර ගත් හ.

මේ දෙදෙනා වහන්සේ මෙසේ අගසවු තනතුරු ලබන්නට ප්‍රාර්ථනා කළේ අනෝමදස්සී නම් බුදු රජාණන් වහන්සේ සමයෙහි ය. එසමයෙහි මුගලන් තෙරුන් උපන්නේ සිරිවඩ්ඪන නමිනි. සැරියුත් හිමියෝ සරද නම් වූ හ. සිරිවඩ්ඪන ගොවි මහසල් කුලයෙහි ද සරද බමුණු මහසල් කුලයෙහි ද ඉපිද සිටිය හ. එ සමයෙහි ද මේ දෙදෙනා ඉතා දැඩි මිත්‍රත්වයෙන් බැඳී සිටිය හ. දිනක් ජීවිතය හා මරණය ගැන ගැඹුරින් විමසූ සරද තරුණයා ඒ පිළිබඳව කළකිරී පැවිදි වන්නට තීරණය කළේ ය. තමන් තනිව මහණ වනවාට වඩා මිතුරා ද කැටිව පැවිදි වනු රිසි වූ හෙතෙම සිරිවඩ්ඪන සොයා ගොස් "මිත්‍රය, මම පැවිදි වනු, කැමැත්තම්. ඔබත් මා හා එක්වනු කැමති දැ" යි විමසී ය.

එහෙත් ඔහු එයට කැමති නොවූ හෙයින් හෙතෙම තනිව ම පැවිදි විය. එතුමා පැවිදි වූ පුවත අසා තවත් විශාල තරුණ පිරිසක් ගිහි සුව හැර පියා පැවිදි වූහ. කවුරුත් භාවනා වඩා පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති උපදවා ගත් හ. මෙ සමයෙහි අනෝමදස්සී බුදු රජාණන් වහන්සේ උදෑසන මහා කරුණාවෙන් ලෝ බලන සේක් සරද තවුසාණන් හමුව දහම් දෙසුව හොත් ඔහු මතු අගසවු කෙනෙකුන් වන්නට පතා ගන්නා බවත් ඔහු ගේ මිතුරා ද අගසවු තනතුරු පතන්නට පෙළඹෙන බවත් සිතා ගෙන ඍද්ධි බලයෙන් එහි වැඩම කළ සේක. බුදුරදුන් අහසින් වැඩම කරනු දුටු සරද තවුසා පෙර ගමන් කොට පසග පිහිටුවා වැඳ පිළිගෙන අසුනක් පණවා වැඩහිඳවීය. සබ්‍රහ්මචාරීන් ගෙනා ඵලා'පල බුදුරදුන්ට පිළිගැන්වූ ඔහු තම ශ්‍රාවකයන් සමඟ එකත් පසෙක හුන් අතරතුර "මගේ අගසවු දෙනම පිරිවර සංඝයා ද කැටුව මෙහි පැමිණෙත්වා" යි අනෝමදස්සී බුදුරජාණන් වහන්සේ අධිෂ්ඨාන කළ හ. උන්වහන්සේලා ද අහසින් එහි වැඩම කළ හ.

මේ සියළු පිරිසට සරද තවුසා තම පිරිවර තවුසන් ගේ උදව් ඇතිව මහා මල් පූජාවක් කළ පසු බුදුහු මල් පූජාවේ අනුහස් වදාරන්නැයි දකුණත් සවු හිමියනට ඇරයුම් කළ හ. ඒ ධර්ම දේශනාව අසා සිටි සරද හිමියෝ තමාත් බුදු කෙනෙකුන් ගේ දකුණත් සව් විය යුතුයයි සිතා ගත් හ. භාග්‍යවතුන් වහන්සේ ද දිවැසින් බලා වදාරා "මතු සිද්ධාර්ථ ගෞතම නම් බුදුන් දවස ඔබ දකුණත් සව් වෙතැ" යි ප්‍රකාශ කළ හ. ඒ ඇසූ සරද තවුසා සිරිවඩ්ඪන කෙළඹියානෝ සොයා ගොස් තමන් කළ පින්කම හා අගසවු පදවි පැතීම ගැන කියා සිටි හෙයින් හෙතෙම තම නිවසෙහි බුද්ධ ප්‍රමුඛ සංඝයාට දනට ඇරයුම් කළේ ය. සිරිවඩ්ඪන කෙතරම් පැහැදුණා ද යත් සතියක් ම මහ දන් පවත්වා බුදුරදුන් අමතා "ස්වාමීනි, මගේ මිත්‍ර සරද තවුසාණන් සිද්ධාර්ථ ගෞතම බුදුන් ගේ දකුණත් සවු වන දා මම වමත් සවු වන්නට ප්‍රාර්ථනා කරමි" යි පැවසී ය.

අනෝමදස්සී බුදුරජාණන් වහන්සේ ද ඔබ ගේ ප්‍රාර්ථනය එසේ ම ඉටු වෙති යි අනාවැකි පළ කළ සේක. වත්මන් භවයෙහි මුගලන් තෙරුන් වහන්සේ සාරිපුත්ත තෙරුන් සමග වමත් සවු පදවිය ලද්දේ මේ ප්‍රාර්ථනය සමෘද්ධ වීම හේතුවෙනි. දෙදෙනාම සංජය පරිබ්‍රාජකයා ලඟ ධර්මය හදාරා එය නිෂ්ඵල බව දැන සත්‍ය ගවේෂණයෙහි යෙදෙමින් සිටි අතර සාරිපුත්ත හිමියන් හා අස්සජි හිමියන් ගෙන් ලද දහම අනුව බුදුරදුන් වෙත අවුත් පැවිදිව ප්‍රාර්ථනා පරිදි අගසවු තනතුරු ලද හ. පස්වග මහණුන්, යස තෙරුන්, භද්‍රවර්ගිය තෙරවරුන්, තුන් බෑ කාශ්‍යපයන් සිටිය දී බුදුරදුන් සැරියුත්, මුගලන් දෙනම අගසවු තනතුරු වලට පත් කර ගැනීම ගැන ඇතැම් භික්ෂූන් නොමනාපකම් පළ කළ හෙයින් මේ අතීත කතාව පැහැදිලි කරන්නට බුදු රදුන්ට සිදුවිය.

**දසන්නං අඤ්ඤතරං ඨානං**: මේ ගාථා හතරින් අහිංසකයනට හිරිහැර කරන අයට සිදුවන විපාක දහයක් දක්වා ඇත. එනම්,

1. උසුලන්නට බැරි දරුණු වේදනා ඇති වීම
2. මිල මුදල් නාස්ති වී යාම
3. අතපය ඇටකටු ආදිය කැඩී බිඳී යාම
4. දරුණු රෝග ඇති වීම
5. උමතු වීම
6. රාජ උදහස
7. බොරු චෝදනා වලට ලක් වීම
8. නෑදෑයින් නැති වී යාම
9. වස්තු හානිය
10. ගෙවල් ගිනි ගැනීම යන මේවා යි .

**විවරණාත්මක අනුවාදය (140 ගාථාව)**

**අථ ඉව අස්ස අගාරානි පාවකො අග්ගි ඩහති සො
දුප්පඤ්ඤෙදා් කායස්ස භෙදා නිරයං උප්පජ්ජති.**

**අථ ඉව**: නැත හොත්; **අස්ස**: ඔහු ගේ; **අගාරානි**: ගෙවල්; **පාවකො අග්ගි**: පාවක නම් වූ ගින්න; **ඩහති**: දවයි; **සො දුප්පඤ්ඤෙදා**: ඒ අඥාන තෙම; **කායස්ස භෙදා**: කය බිඳී ගිය පසු (මරණින් පසු); **නිරයං**: අපායෙහි; **උප්පජ්ජති**: උපදියි.

නැත හොත් ඔහු ගේ ගෙවල් ගිනි ගනියි. ඒ අනුවණ තෙම (මේ දස විධ උවදුරෙන් එකක් ලබා) අනතුරුව අපායෙහි උපදියි.





*සැක දුරු නොකළ තැනැත්තා විලි නො වසා හැසිරීම් ඈ කිසි ලෙසකින් පිරිසිදු නො වේ.*

141. න නග්ගචරියා න ජටා න පඞ්කා
නානාසකා ථණ්ඩිලසායිකා වා
රජො ච ජල්ලං උක්කුටිකප්පධානං
සොධෙන්ති මච්චං අවිතිණ්ණකඞ්ඛං (10:13)

නිරුවත් තාපස පිළිවෙත් - ජටා මඩුළු මඩ නෑමත්
නො කා නො බී උපවාසය
ඇතිරිලි නැති බිම නිදුමත්
කුණු දූවිලි ඇඟ නා ගෙන
උක්කුටිකෙන් හිඳ ගැනුමත්
කවුරු කළත්, නැත නිවණක්
සැක සංකා දුරු නො කළොත්

# නිසරු පිළිවෙත් - සැපක් නො ගෙනෙත්

## 10 (8) බහුභාණ්ඩික තෙරුන් ගේ වස්තුව (141 ගාථාව)

දෙව්රම් වෙහෙරෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ එක්තරා බහුභාණ්ඩික භික්ෂු නමක් අරබයා මේ ගාථාව වදාළ සේක.

සැවැත් නුවර එක් ධනවත් තැනැත්තෙක් තම බිරිඳ මිය ගිය පසු පැවිදි වන්නට සිතී ය. පැවිදි වන්නට පෙර හේ තමන්ට වාසය කිරීම පිණිස ආරාමයක් ඉදිකර ගත්තේ ය. එහි කුස්සියක්, ගබඩා කාමරයක් ආදී ගෘහාංග සම්පූර්ණව තිබුණු අතර ඇඳ, පුටු, මේස ආදී ගෘහ භාණ්ඩ සියල්ල ද සම්පාදනය කරන ලදී. අවශ්‍ය තරම් සහල්, ගිතෙල්, වෙඬරු, ආදී ආහාර ද්‍රව්‍ය ද ගබඩා කර ගත් හෙතෙම පැවිදි වූ පසු ද තමන්ට රුචි වර්ග වල ආහාර පාන තම සේවකයා ලවා සූදානම් කර ගත්තේ ය. පැවිදි වූ පසු ද හේ මනා සැප සම්පතින් ආඪ්‍යව සුවසේ විසී ය. බොහෝ බඩු භාණ්ඩ ඇතිව වාසය කළ හෙයින් උන්වහන්සේ බහුභාණ්ඩික තෙරුන් වහන්සේ යි පතළ වූහ.

දිනක් භාග්‍යවතුන් වහන්සේ වෙත මේ භික්ෂුව කැඳවාගෙන ගිය භික්ෂූහු ඔහු පැවිදි වන විට ගෙන ආ බඩු භාණ්ඩ සමූහය ගැන ද ගත කරන සුඛෝපභෝගී ජීවිතය ගැන ද භාග්‍යවතුන් වහන්සේට විස්තර කළ හ. භාග්‍යවතුන් වහන්සේ බහුභාණ්ඩික තෙරුන් අමතා “මහණ, අල්පෙච්ඡතාව වර්ණනා කරමින් මා ධර්ම දේශනා කරත්දීත් ඔබ බහුභාණ්ඩික වන්නට හේතුව කුමක්දැ” යි විචාළ හ. බුදුරදුන් වදාළේ ඒ සුළු එක් ම වැකිය වුවද ඉන් කෝපයට පත් භික්ෂු නම උඩු සිවුර ගළවා පසෙකට දමා අඳනය පමණක් ඉතිරි කර ගෙන “ඇත්තමයි බුදුරජාණන් වහන්ස, එසේ නම්, මම මෙහෙම ඉන්නද?” යි විචාළ හ. ඔහු ගේ ඒ විළිබිය නැති හැසිරීම දුටු භාග්‍යවතුන් වහන්සේ, “මහණ, පෙර ආත්මභාවයක ඔබ දිය රකුසකුව ඉපිද පවා දොළොස් අවුරුද්දක් හිරි ඔතප් රැකගෙන විසී ය. දැන් මේ බුදු සස්නෙහි පැවිදිව සිට ගෙන සිව් පිරිස් මැද සිවුරු ගලවා දමන්නට තරම් විළි බිය හළේ කවර හෙයින් දැයි ප්‍රශ්න කළ හ. ඒ වචන ඇසීමෙන් තම බොළඳ ක්‍රියාවෙහි තරම වටහා ගත් බහුභාණ්ඩික භික්ෂුව සිවුර ගෙන පොරවා ගරු සරු ඇතිව පසෙකට වී හිඳ ගත්තේ ය. පෙර අත්බවක ඔහු දිය රකුසුව සිට විළි බිය ගරු කළ ආකාරය දැන ගන්නට කැමති වූ භික්ෂූහු ඒ පිළිබඳව භාග්‍යවතුන් වහන්සේ ගෙන් විමසූ හ. එවිට උන්වහන්සේ දේවධර්ම ජාතකය දේශනා කර වදාළ හ. අනතුරුව උන්වහන්සේ නිරුවත ඇතුළු විවිධ බාහිර ස්වරූප කවර දිවිපෙත වුවද සිත සැක දුරු නො කළොත් නිවන් සුව නො ලබන බව පැහැදිලි කරමින් ගාථා ධර්මයක් ද වදාළ සේක.

### විවරණාත්මක අනුවාදය (141 ගාථාව)

**නග්ගචරියා න සොධෙන්ති ජටා න සොධෙන්ති පඞ්කා**
**න සොධෙන්ති අනාසකා න සොධෙන්ති ථණ්ඩිලසායිකා**
**වා න සොධෙන්ති රජොජල්ලං ච උක්කුටිකප්පධානං**
**අවිතිණ්ණකඞ්ඛං මච්චං න සොධෙන්ති**

**නග්ගචරියා**: නිරුවත්ව සිටීම; **ජටා**: ජටා මඬුළු ඇතිකර ගැනීම; **පඞ්කා**: මඩ තවරා ගැනීම; **ආනාසකා**: කෑම බීම නො ගෙන සිටීම; **ථණ්ඩිල සායිකා**: බිම නිදීම; **රජොජල්ලං**: ඇඟෙහි කුණු දූවිලි බැඳෙන්නට ඉඩ දීම; **වා**: හෝ; **උක්කුටිකප්පධානං**: ඇණ තියා ගෙන තවුස් දම් පිරීම; **අවිතිණ්ණකඞ්ඛං**: එතෙර නො වූ හෙවත් සැක දුරු නො කළ; **මච්චං**: සත්වයා; **න සොධෙන්ති**: පිරිසිදු නො කරයි.

නිරුවත්ව සිටීම, හිස්කේ නො පීරා ජටා මඬුළු වන්නට හැරීම, ශරීරය පුරා මඩ තවරා ගැනීම, ආහාර පාන නො ගෙන උපවාස කිරීම, බිම නිදා ගැනීම, ඇඟෙ හි කුණු දූවිලි බැඳෙන්නට හරිමින් නො නා සිටීම, උක්කුටුකයෙන් හිඳගෙන තවුස් දම් රැකීම යන මේ එකකින් වත් සැක දුරු නො කළ තැනැත්තාට විශුද්ධිය නො ලැබේ.

### විවරණය

**නග්ගචරියා**: හෙවත් නිරුවතින් හැසිරීම වැනි මේ ගාථාවේ දක්වන ලද තවුස් දම් ක්‍රම බුද්ධ කාලීන භාරතය පුරා පැතිර පැවතිණ. මේ සියළු තවුස් ක්‍රම පදනම් වූයේ ශරීරයට කවර ක්‍රමයෙන් හෝ දුක් වේදනා පැමිණ වීම මඟින් විමුක්තිය ලද හැකි බව මතය. (දුක්ඛෙන සුඛං අධිගන්තබ්බං) මෙය අත්තකිලමථානු යෝගයට සම්බන්ධ ය. භාග්‍යවතුන් වහන්සේ කාමසුඛල්ලිකානු යෝගය මෙන්ම මෙම අත්තකිලමථානු යෝගය ද ප්‍රතික්ෂෙප කළ හ. බුද්ධ ශ්‍රාවකයන් අනුගමනය කරන්නේ මධ්‍යම ප්‍රතිපදාව ය. එය අන්තවාදයන් ගේ මිශ්‍රණයක් නොව අන්තවාද ප්‍රතික්ෂෙප කිරීමෙන් මතුවන නිරවද්‍ය ප්‍රතිපදාව ය. එය අනුගමනය කරන බෞද්ධ භික්ෂූහු අපිරිසිදුකම, කයට වධ දීම ආදිය වෙනුවට සරල, අල්පේච්ඡ, පවිත්‍ර ජීවිත ගත කරති. බාහිර වත් පිළිවෙත් මඟින් අධ්‍යාත්මික පාරිශුද්ධිය ලද නොහැකි බව බුදුසමය උගන්වයි.



*ඇඳුම් පැළඳුම් වලින් සැරසුණත් සන්සුන් ගති හා මෙත් සිතැතිවැ වෙසේ නම් හේ උතුම් පුගුලෙකි.*

142. අලඞ්කතො චෙ’පි සමං චරෙය්‍ය
සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරී
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
සො බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛු (10:14)

අලංකාරයට ඇන්දත් - සමබර දිවියක් ගෙවන්න
පැවතුම් සමිතව දමිතව
දිගට ම බඹසර රකින්න
කිසිම සතකු නො මරනු වස්
අවි ආයුධ බිම තබන්න - එසේ කළොත් මහණ
බමුණු භික්ෂු කෙනෙක් වෙයි සිතන්න

# හැඩ වැඩ ඇඳුමෙන - නො මැකෙයි යහගුණ

## 10 (9) සන්තති ඇමති තුමා ගේ කතාව (142 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **සන්තති අමාත්‍යයා** නිමිති කොට මේ ගාථාව වදාළ සේක.

සන්තති ඇමති තුමාට වරක් ප්‍රත්‍යන්ත ප්‍රදේශයක කැරැල්ලක් මර්දනය කිරීමට සිදු විය. ඔහු ඒ කාර්‍යය සාර්ථකව නිමවා පැමිණි විට පසේනදී කොසොල් රජ තෙම බලවත් ප්‍රීතියට පත්ව බොහෝ තෑගි බෝග යස ඉසුරු ධන සම්පත් දී හර සර දක්වා ඔහු සත් දිනක් විනෝදාස්වාදයෙන් තබන්නැයි උපදෙස් දී නාටිකාංගනාවක් ද යැවී ය. සත්වන දින රාජ හස්තියා මත නැඟුණු ඇමති තුමා ස්නානය කිරීම පිණිස ගං තෙරට යමින් සිටියේ ය. ඒ අවස්ථාවේ භාග්‍යවතුන් වහන්සේ අනඳ මහා තෙරුන් ද කැටුව මඟ වැඩම කරනු දුටු අමාත්‍යවරයා සුරා පානය කොට හුන් හෙයින් ඇතු පිටින් නො බැස ඇතු පිටම හිඳ නමස්කාර කොට හිස සළා ගියේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ සිනා පහළ කළ හ. "භාග්‍යවතුන් වහන්ස, සිනා පහළ කළේ කවර හෙයින් ද?" යි අනඳ හිමියන් විචාළ විට "ආනන්ද, ඇමතිතුමා අදම මා දකින්නට පැමිණෙනු ඇත. මා කරන කෙටි දෙසුමක් අසා රහත් වන්නේ ය. රහත් වී වැඩි වෙලා යන්නට පෙර පිරිනිවන් පාන්නේ ය. එහෙයින් සිනා පහළ කළෙමි" යි වදාළ හ.

ඇමති තුමා ද ගං ඉවුරට ගොස් තවත් සුරා පානය කර, පැන් පහසුව මුළු දිනයම කමින්, බොමින්, නටමින්, ගී ගයමින් ගත කළේ ය. හවස් වන විට ඇමති තුමා නැවත ද සුරා පානය කර නාටිකාංගනාව සමඟ විනෝද වනු වස් උයනට ගියේ ය. නිළිය ද ඇමති තුමා විනෝදවත් කරනු පිණිස ඉතා චමත්කාර ජනක රංගනයක් ඉදිරිපත් කළා ය. එහෙත් රඟන අතරම හෘදයාබාධයක් වැළඳුනු ඕ මැරී වැටුණා  ය. ඇය ගේ පණ නල සිරුරින් ඉවත්ව ගොස් බව දැනගත් මොහොතේ පටන් දැඩි සංවේගයට පත් ඇමති තුමා භාග්‍යවතුන් වහන්සේ බැහැ දැකීමට කල්පනා කොට එහි ගොස් "භාග්‍යවතුන් වහන්ස, මට පිහිට වුව මැනැවි. මට මහත් ශෝකයක් ඇති විය. ඔබ වහන්සේ ගේ පිහිට පතා ආවේ එහෙයිනි" යි. පවසා නිළිය මිය ගිය දුක්ඛජනක ආකාරය ගැන සැළ කළේ ය. "ඇමතිවරය, දුක් නොවන්න ඔබ ආවේ සහනයක් ලබන හැකි තැනකට ම ය. ඔය නිළිය ගේ මරණය ගැන සසර පුරා ඔබ හැඬූ කඳුළු සියළු මහ සමුදුර ජලයටත් වැඩි ය"  යි පැහැදිළි කර "දුක ශෝකය ඇති වන්නේ රාගය නිසා ය. සිත තුළ පවත්නා රාගාදී කෙලෙස් කුණු ඉවත් කර ගන්න. අළුතින් කෙළෙස් කුණු ඇති කර නො ගන්න. සිත පිරිසිදු කර ගෙන උප ශාන්තව වසන්න"යි අනුශාසනා කළ හ.

භාග්‍යවතුන් වහන්සේ ගේ අනුශාසනය අවසන රහත් වූ සන්තති ඇමති තෙම තමන් ගේ ආයු කාලය නිම වූ බව දිවැසින් දුටුවේ ය. "ස්වාමීනි, මාගේ ආයු කාලය නිම ය. දැන් මම පිරිනිවන් පාන්නෙමි" යි ඔහු පැවසූ විට බුදුරජාණන් වහන්සේ "එසේ නම් අහසට නැඟී ඔබ කළ පින් කම් කියා පිරිනිවන් පෑම යෝග්‍යයැ"යි වදාළ හ. ඇමති තුමා ද එසේ කොට තේජෝ කසිණයට සම වැදී පිරිනිවන් පෑවේ ය. සිරුරෙහි ලේ මස දැවී යත්දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේ ලවා සුදු රෙදි කඩක් ගෙන්වා ඇමති තුමා ගේ ධාතු එහි පතිත වන්නට සැලැස්වී ය.

"ඇමතිතුමා පිරිනිවන් පෑවේ සවාභරණයෙන් ම සැරසී සිටිමිනි. එහෙයින් ඔහු ශ්‍රමණයෙක් ද, බ්‍රාහ්මණයෙක් ද?" යි රැස්ව සිටි භික්ෂූන් විමසූයෙන් "මාගේ පුත්‍රයාට ශ්‍රමණයකු කීවත්, බ්‍රාහ්මණයකු කීවත් වරදක් නැත" යි භාග්‍යවතුන් වහන්සේ පිළිවදන් දුන් හ.

### විවරණාත්මක අනුවාදය (142 ගාථාව)

**අලඞ්කතො අපි චෙ සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරී**
**සබ්බේසු භූතෙසු දණ්ඩං නිධාය සමං චරෙය්‍ය සො**
**බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛු**

**අලඞ්කතො අපි**: ප්‍රියංකර ලෙස හැඳ පැළැඳ ගත්තේ වුව ද; **චෙ**: ඉදින්, **සන්තො**: ශාන්ත වූයේ; **දන්තො**: ඉඳුරන් දමනය කර ගත්තේ; **නියතො**: ඒකාන්ත අරමුණු ඇතිව; **බ්‍රහ්මචාරී**: බඹසර හැසිරෙමින්; **සබ්බේසු භූතෙසු**: සියළු සත්‍වයන් කෙරෙහි; **දණ්ඩං නිධාය**: අවි ආයුධ අත හැර දමා; **සමං චරෙය්‍ය**: සමබර ලෙස ජීවත්වන්නේ ද; **සො**: හෙතෙම; **බ්‍රාහ්මණො**: බ්‍රාහ්මණයෙක්; **සො**: හෙතෙම; **සමණො**: ශ්‍රමණයෙකි; **ස**: හෙතෙම; **භික්ඛු**: භික්ෂුවකි.

පියකරු ලෙස හැඳ පැළඳ ගත්තේ වුව ද යමෙක් ශාන්තව දාන්තව ඒකාන්ත යහපත් අරමුණු ඇතිව බ්‍රහ්මචර්යාව හැසිරෙයි නම්, කිසිම සත්ත්වයෙකුට හිරිහැර නො කරයි නම් සමබර ජීවිතයක් ගත කරයි නම් හෙතෙම ශ්‍රමණයෙකි, බ්‍රාහ්මණයෙකි, භික්ෂුවකි.

### විවරණය

**බ්‍රහ්මචර්‍යාව**: යන්න බොහෝ විට යෙදෙන්නේ පැවිදිව ගත කරන ජීවිත රටාවට ය. පොහෝ දින සිල් සමාදන් වන ගිහි උපාසක උපාසිකාවෝ ද බ්‍රහ්මචර්‍යාව රකිති. මෙහි අරමුණ ලිංගික හැසිරීම් වලින් වෙන්ව සිටීම යි. බඹසර රැකීමෙහි අරමුණ සියළු සරාගී සිතිවිලි මුලිනුපුටා දමා විමුක්තිය ලබා ගැනීමයි.





*විලියෙන් අකුසල් දුරු කරන තැනැත්තෙක් ලොවැ ඇති නම් ඒ සුලබ නො වන්නේ ය.*

143. හිරී නිසෙධො පුරිසො
කොචි ලොකස්මිං විජ්ජති
යො නින්දං අප්පබොධති
අස්සො භද්‍රො කසාමිව (10:15)

ලජ්ජාවෙන් පවු දුරලන
අය ඉඳහිට ලොව හමුවෙත්
හොඳ අසු මෙන් කස වලකන
ඔහු නින්දාවක් නො ලබත්

# ඇතිව ලජ්ජා බය - දුරු කර ලන්න පාපය
## 10 (10) පිලෝතික තිස්ස තෙරුන්ගේ වත (143 සහ 144 ගාථා)

**පිලෝතික තිස්ස තෙරුන්** නිමිති කොට භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දෙව්රම් වෙහෙරදී දේශනා කළ සේක.

දිරාපත් වැරහැලි හැඳ සිඟමනේ ගිය තරුණයකු දුටු ආනන්ද මහ තෙරුන් ගේ සිත උණු වී ගියෙන් උන්වහන්සේ ඔහු සාමණේර පැවිද්දෙන් පැවිදි කරලූ හ. පැවිදි වන දා මුදා ලූ ගිහි වැරහැලි හා සිඟමන් යැදි කබල ද ගස් බිලයක රඳවන ලදී. පිරිසිදු සිවුරු හැඳ සුවසේ වළඳමින් සිටින තිස්ස සාමණේරයනට ටික කලකින් උදාසීන බවක් දැනෙන්නට විය. නැවත කබලත් රැගෙන සිඟමනේ යන්නට ආශාවක් ද හට ගති.

එහෙයින් කඩමලු හා කබල තිබූ තැනට ගොස් එය අතට ගෙන තමන්ට ම තමන් කරන්නට යන බොළඳ කමෙහි තරම වැටහී ගියෙන් "අඥානය, ඉතා හොඳ සිවුරු පිළි, ප්‍රණීත භෝජන ලැබෙන මේ පහන් දිවිය හැර නැවත වැරහැලි හැඳ හිඟමනේ යන්නට තරම් ඔබ අමනයෙක්දැ'' යි තමන්ට ම නිග්‍රහ කර ගත්තේ ය. ඒ වැරහැලි නැවත එහි දමා අවුත් මහණ දම් පිරිය. යළිත් ටික දිනකින් පැවිද්ද එපා වූ හෙයින් වැරහැලි අතට ගෙන පෙර මෙන්ම තමාට අවවාද කර ගත්තේ ය. මේ ක්‍රමයට තමන්ට පැවිදි ජීවිතය ගැන කළ කිරීමක් එන හැම විට ම හේ එහි ගොස් වැරහැලි අතට ගෙන තමා ම අවවාද කර ගනියි.

නිතර නිතර තිස්ස තෙරුන් එම ගස ලඟට යන්නේ කුමටදැයි සබ්‍රහ්මචාරී හිමිවරු විමසූ හ. "මගේ ගුරුවරයා ගෙන් උපදෙස් ලබන්නට යමි" යි යන්න පිළිතුර විය. මෙසේ නිතර දක්නා දිරා ගිය වැරහැලි ම භාවනා අරමුණක් කර ගත් තිස්ස සාමණේරයෝ ටික දිනකින් භාවනා වඩා රහත් වූ හ. ඉන්පසු ගස වෙත යාමක් නො වීය. "දැන් තිස්ස ගුරුන් දකින්නට යන ගමන කරන්නේ නැහැ නො වේද?" යි හිතවත් හිමිවරුන් ප්‍රශ්න කළ විට "ප්‍රයෝජනයක් තිබුණු දවස්වල ගියාට දැන් අවශ්‍යතාවක් නැහැ" යි උන්වහන්සේ පිළිතුරු දුන් හ."ඒ කතාවේ තේරුම තිස්ස දැන් රහත්වෙලා කියන එකයි. ඒක නම් වෙන්න බෑ. එයා ගෙ බොරුවක්" යි කතිකා කරගත් විහාරවාසී හිමිවරු ඒ පිළිබඳව භාග්‍යවතුන් වහන්සේට දැනුම් දෙන්නට තීරණය කළ හ. "ස්වාමීනි, තිස්ස තමන් රහත් වූ බවක් අඟවන්නට වෑයම් කරයි. ඔහු කියන්නේ බොරුවක් විය යුතුය" යි ඔවුහු බුදුන් හමුවේ කියා සිටිය හ.

"මහණෙනි, තිස්ස භික්ෂුව බොරුවක් කියනවා නො වේ. එය සැබෑවකි. ඔහු ගේ ආචාර්‍යවරයා වූ පිලෝතිකය (වැරහැලි ඇඳුම) සමග තිබුණු සම්බන්ධය අවසන් වූයේ යථාභූතඥාන දර්ශන පහළ වීමත් සමග ය. ඔහු දැන් රහත් නමක් හෙයින් ගුරුවරයා ගේ අවවාද තව දුරටත් අනවශ්‍යය'' යි වදාළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා යුග්මය දේශනා කළ හ.

**විවරණාත්මක අනුවාදය (143 ගාථාව)**

**කසා භද්‍රෝ අස්සෝ ඉව යො නින්දං අප්පබොධති, හිරි නිසෙධො පුරිසො ලොකස්මිං කොචි විජ්ජති.**

**කසා**: කස පහරින් (වැළකෙන); **භද්‍රෝ අස්සෝ ඉව**: උතුම් අසෙකු මෙන්; **යො**: යමෙක්; **නින්දං**: නින්දාව, හෙවත් අකුශල චිත්තය; **අප්පබොධති**: සිය සිතින් පහකෙරේ ද; **හිරි නිසෙධො පුරිසො**: (එබඳු සේ) ලජ්ජාවෙන් පාපය වළකා ගන්නා පුරුෂයෝ; **ලොකස්මිං**: මේ ලෝකයෙහි; **කොචි**: කිසිවෙක්; **විජ්ජති**: ඇත්තේ ය; (දුර්ලභ ය)

හොඳ අශ්වයෝ කස පහරට අකැමැත්තෙන් තම කායඝීය මැනවින් කරති. එසේම ලොව නින්දා විඳින්නට අකැමැති ඇතැම් පුද්ගලයෝ පාපයට ඇති ලජ්ජාව නිසා යහ මගෙහි ගමන් කරති.





කෙළෙස් තවන වැරැ හා සසරට කලකිරුම් ඇතිවැ පිළිවෙත් පිරුමෙන් සසර දුක් දුරැලිය යුතු.

144. අස්සො යථා භද්‍රො කසානිවිට්ඨො
ආතාපිනො සංවෙගිනො භවාථ
සද්ධාය සීලෙන ච විරියෙන ච
සමාධිනා ධම්ම විනිච්ඡයෙන ච
සම්පන්න විජ්ජාචරණා පතිස්සතා
පහස්සථ දුක්ඛමිදං අනප්පකං (10:16)

හොඳ අශ්වයකු මෙන් රඟ දත් කස පහරේ
තවමින් කෙළෙස් සංවේදී වී සසරේ
ඇති කර සැදැහැ සිත්, සිල්, වීරිය පුරලා
වඩමින් සමාදිය දැක ඇතිතතු ලෝකේ
විජ්ජාචරණ සමගින් සිහි නුවණ වඩා
වනසා ලන්න මේ දුක් කඳ සංසාරේ

# උත්සාහය ඇවැසිවේ ය - වනසන්නට මේ දුක් කඳ
## 10 (10) පිලෝතික තිස්ස තෙරුන්ගේ වත (143 සහ 144 ගාථා)

**විවරණාත්මක අනුවාදය (144 ගාථාව)**

**කසා නිවිට්ඨො භද්‍රො අස්සො යථා ආතාපිනො**
**සංවෙගිනො භවාථ සද්ධාය ච සීලේන ච විරියේන ච**
**සමාධිනා ධම්ම විනිච්ඡයෙන ච සම්පන්නවිජ්ජාචරණා**
**පතිස්සතා අනප්පකං ඉදං දුක්ඛං පහස්සථ**

**කසා**: කසයෙන්; **නිවිට්ඨො**: මෙහෙයනු ලබන; **භද්‍රො අස්සො**: උසස් අශ්වයා; **යථා**: යම්සේ ද; (එසේ), **ආතාපිනො**: කෙළෙස් තවන වීර්ය ඇත්තාහු ද; **සංවෙගිනො**: සසර කලකිරුම් ඇත්තාහු ද; **භවාථ**: වන්න; **සද්ධාය ච**: ශ්‍රද්ධාවෙන් ද; **සීලේන ච**: ශීලයෙන් ද; **විරියේන ච**: වීර්යයෙන් ද; **සමාධිනා**: සමාධියෙන් ද; **ධම්ම විනිච්ඡයෙන ච**: ධර්ම විනිශ්චය නම් වූ විදසුන් නුවණින් ද (යුක්තව); **සම්පන්නවිජ්ජාචරණා**: සම්පූර්ණ වූ විද්‍යාවෙන් හා චරණයෙන් යුක්ත ව; **පතිස්සතා**: සිහියෙන් යුතුව; **අනප්පකං**: අනල්ප වූ; **ඉදං දුක්ඛං**: මේ සසර දුක; **පහස්සථ**: දුරු කරව්.

කසය මගින් හික්මෙන (කස පහර නො කනු පිණිස හොඳින් හැසිරෙන) යහපත් අශ්වයකු මෙන් කෙළෙස් තැවීම කළ යුතු ය. සංවේදී විය යුතු ය. ශ්‍රද්ධාව, ශීලය, වියර්‍ය, සමාධිය හා ධර්‍ම විනිශ්චයෙන් (යථා තත්ත්ව නිරීක්‍ෂණයෙන්) යුතුව විද්‍යාව හා චරණය ප්‍රගුණ කර සිහි නුවණින් යුතුව මේ අනල්ප වූ දුක් කඳ දුරු කළ යුතු ය.

**විවරණය**

**සීල**: සීල යන්නෙන් හික්මීම, ශික්‍ෂණය යන අරුත දෙයි. සීලය සියළු ආධ්‍යාත්මික ක්‍රියාවලින් හි ආරම්භය වෙයි. සීල - සමාධි - පඤ්ඤා යන ත්‍රිවිධ ශික්‍ෂා මාර්ගයෙහි දී සීලය පරිපූර්ණ නො කළ හොත් සමාධිය මහානිශංස නො වන බව කියැවෙයි. එහෙයින් භාවනා මාර්ගයට ප්‍රවේශ වන්නට පෙර සීලයෙන් සමන්විත විය යුතු වෙයි. සීලය ශාසනයෙහි ආදි චරණය හා ප්‍රතිෂ්ඨාව වශයෙන් හඳුන්වන්නේ ද එහෙයිනි. එහෙත් සීලය යනු මාධ්‍යයක් මිස නිෂ්ඨාවක් නොවන බව තේරුම් ගත යුතුය. වෙන විදියකින් කිවහොත් සිල් පිරූ පමණින් සියල්ල සම්පූර්ණ නො වේ. සීලය පුරා සිත කය හික්මවා ගන්නේ සමථ - විදර්ශනා භාවනා සාර්ථක කරගනු පිණිස ය. විමුක්තිය සාධනය කර ගත හැක්කේ එවිට ය. සීලය මෙසේ විමුක්ති මාර්ගයේ ප්‍රථම අංගය වශයෙන් ප්‍රායෝගික වටිනාකමක් ඇත්තක් බව තේරුම් නො ගෙන තමා සීලය ආරක්‍ෂා කර ගත් පමණින් "මම නිර්මල සීලය ඇත්තෙමි. එහෙයින් මට වෙන කළ යුත්තක් නැත. මෙ පමණකින් ම මට විමුක්තිය ලද හැක" වැනි බොළඳ කල්පනා ඇති වුවහොත් තමන් 'සීලබ්බත පරාමාස' තත්ත්වයට ම ඇද වැටෙන්නට හැකි බව මෙනෙහි කර සීලය අත්‍යවශ්‍ය වුවත් එය පුරන්නේ ඉතිරි ශික්‍ෂාවන් සඳහා පදනම සැකසීමට බව තරයේ වටහා ගත යුතුය. සීල මදය මුළුමනින්ම දුර ලමින් අනතිමානීව හික්මිය යුතු ය.

**01) දරුවකු විසින් දෙමාපියනට**
1) පෝෂණයෙන් 2) කුඩා මහත් කටයුතු කර දීමෙන් 3) කුල වංශය ස්ථාපනය කිරීමෙන් 4) දායාදයට යෝග්‍ය පරිදි හැසිරීමෙන් 5) මිය ගිය පසු පින් දීමෙන් යුතුකම් ඉටු කළ යුතු ය.

**02) දෙමාපියන් දරුවනට**
1) පාපයෙන් වැළැකීමෙන් 2) හොඳ වැඩෙහි නිරත කර වීමෙන් 3) ශිල්ප ඉගැන්වීමෙන් 4) නිසි කල ආවාහ - විවාහ කර දීමෙන් 5) සුදුසු කල දායාද පවරා දීමෙන් සංග්‍රහ කරති.

**03) ශිෂ්‍යයකු ආචාර්‍යවරයාට**
1) අසුනෙන් නැගී සිටීමෙන් 2) උවටැන් කිරීමෙන් 3) මනාව සවන් දීමෙන් 4) කුඩු - මහත් කටයුතු කර දීමෙන් 5) ගරු සරු ඇතිව ඉගෙනුමෙන් මනාව පවතිති.

**04) ආචාර්‍යවරු ශිෂ්‍යයන් ට**
1) මනාව ශික්‍ෂණය කරති. 2) හොඳම දේ කියා දෙති. 3) සියළු විද්‍යා - ශාස්ත්‍ර නො මසුරුව උගන්වති 4) මිතුරන්ට හා සම්භාවනීයයනට හඳුන්වා දෙති. 5) ආරක්‍ෂාව සලසති.

**05) ස්වාමිපුරුෂයන් බිරිඳට**
1) සම්මානනයෙන්, 2) අනවමානනයෙන් 3) විශ්වාසය කඩ නො කිරීමෙන් 4) අධිකාරය පවරා දීමෙන් 5) ආභරණ ආදිය ලබා දීමෙන් සංග්‍රහ කළ යුතු ය.

**6) බිරිඳ**
1) කුඩු මහත් කටයුතු සකසා ඉටු කිරීමෙන් 2) ආගන්තුක හා පරිජන සංග්‍රහ කිරීමෙන් 3) විශ්වාසය කඩ නො කිරීමෙන් 4) උපයන දෑ ප්‍රවේසමෙන් පරිහරණය කිරීමෙන් 5) අලස නො වී කඩිසරව ක්‍රියා කිරීමෙන් චාරිත්‍ර ඉටු කරයි.

**(7)ගෘහපතියකු තම මිතුරන්ට**
1)තෑගි බෝග දීමෙන් 2) මිහිරි වචන කථා කිරීමෙන් 3) අර්ථ සිද්ධියට ක්‍රියා කිරීමෙන්, 4) සමානාත්මතාවෙන් 5) සත්‍යවාදිත්වයෙන් සංග්‍රහ කරයි.

**(8) මිතුරෝ ඔහුට**
1) පමා වූ විටෙක ආරක්‍ෂාව සැපයීමෙන් 2) දේපල රැක දීමෙන් 3) බියපත් වූ විට ආරක්‍ෂාව සැලසීමෙන් 4) අනතුරේ දී අත නො හැරීමෙන් 5) දූ දරුවන්ට කාරුනික වීමෙන් ප්‍රති සංග්‍රහ කරති.

**(9) ස්වාමියා සේවකයාට**
1) ශක්තියට අනුව වැඩ පවරයි. 2) ආහාර පාන හා වැටුප් දෙයි 3) සෞඛ්‍ය පහසුකම් සපයයි. 4) විශේෂ දේ බෙදා හදා ගනියි. 5) නිසි කළ විවේක පහසුව ලබා දෙයි.

**(10) සේවකයෝ ස්වාමීන්ට**
1) ඔහුට පෙර අවදි වීමෙන් 2) ඔහුට පසුව නින්දට යාමෙන් 3) දුන් දේ පමණක් ගැනීමෙන් 4) ස්වකීය සේවය මනාව ඉටු කිරීමෙන් 5) ස්වාමියා ගේ කීර්තිය පතුරුවා හැරීමෙන් කෘතවේදී වෙති.

**(11) ගෘහපතියකු ශ්‍රමණ බ්‍රාහ්මණයනට**
1) මෛත්‍රී සහගත කාය කර්මයෙන් 2) මෛත්‍රී සහගත වාක් කර්මයෙන් 3) මෛත්‍රී සහගත මනෝ කර්මයෙන් 4) දොර විවෘත කිරීමෙන් 5) පෝෂණය සැපයීමෙන් සත්කාර කරයි.

**(12) ශ්‍රමණ බ්‍රාහ්මණයෝ**
1) පාපයෙන් වැළැකීමෙන් 2) යහපතෙහි යෙදැවීමෙන් 3) කුළුණු සිත් ඇති කිරීමෙන් 4) නො දත් දේ කියා දීමෙන් හා දත් දේ වඩාත් පැහැදිලි කර දීමෙන් 5) දෙව් ලොවට මග කියා දීමෙන් සංග්‍රහ කරති.

ගෘහස්ථයා ගේ චාරිත්ත සීලය වන්නේ ප්‍රධාන වශයෙන් පංච ශීලයයි. අන්‍යයන් ගේ ජීවිත විනාශ කිරීමෙන් වළකින හේ නුදුන් දේ ගැනීමෙන් ද වළකියි. කාම මිථ්‍යාචාරයෙහි නො යෙදෙයි. සුරාපානයෙන් වළකියි. මේ විරතීන් මගින් තම චරිතය පවිත්‍ර කර ගන්නා හෙතෙම සමාජයට ද මානව අයිතිවාසිකම් නිරුපද්‍රැත ලෙස භුක්ති විඳීමේ හැකියාව සහතික කරයි. මේ මූලික පංච ශීල ශික්‍ෂණය අතිරේකව උපෝසථ දිනයන් හි අෂ්ඨාංග, ආජිවාෂ්ටමක හෝ දශ ශික්‍ෂා ආරක්‍ෂා කිරීමට ගෘහස්ථයනට හැකි ය.



*මොනවට කීකරු අය තමන් ගේ සිත (කෙලෙස් වසඟයෙන් මුදා) හික්මවා ගනිත්.*

145. උදකං හි නයන්ති නෙත්තිකා
උසුකාරා නමයන්ති තෙජනං
දාරුං නමයන්ති තච්ඡකා
අත්තානං දමයන්ති සුබ්බතා (10.17)

දියාළුවෝ දිය ගෙන යත්
හී වඩුවෝ ඊය නමත්
වඩුවෝ ලී ඇදය හරිත්
සිල්වත් අය තමන් නමත්

# දමනය කර ගන්න තමන්

## 10 (11) සුඛ සාමණේරයන් ගේ වස්තුව (145 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **සුඛ** නම් සාමණේරයන් වහන්සේ මුල් කර ගෙන මේගාථාව දේශනා කර වදාළ සේක.

සුඛ සාමණේරයන් පැවිදි වූයේ හත් හැවිරිදි වියේ දී ය. උන්වහන්සේ ගේ ආචාර්ය වූයේ සැරියුත් මහ රහතන් වහන්සේ ය. පැවිදිව අටවන දින සැරියුත් මහ තෙරුන් සමග පිඩු සිගා ගිය සාමණේරයන් වහන්සේ කුඹුරකට ජලය ගෙන යන ගොවියන් දුට හ. සිත් පිත් නැති දිය තමන් රිසි පරිදි රිසි තැනට ගෙන ගොස් වැඩ ගන්නා අයුරු සිතට ගත් හ. ඉන් අනතුරුව හී වඩුවන් ඊතල සඳහා දඬු නමනු දැක එයත් පාඩමකට ගත් හ. අවසන දැක්කේ වඩු මඩුවකි. එහි වඩු කාර්මිකයෝ දැවදඬු කපමින්, මදිමින් විවිධ භාණ්ඩ නිෂ්පාදනය කරනු දක්නට ලැබිණ. තමන් කැමති පරිදි මේ පණ නැති භාණ්ඩ හික්මවා ගන්නට මිනිසුන්ට හැකි නම් අපට අපේ ම සිත් හික්මවා ගන්නට බැරි මන්ද?

එසේ සිතූ සුඛ සාමණේරයෝ පිඬු සිඟා යාම නවතා ආපසු විහාරස්ථානයට යාමට ගුරු හිමියන් ගෙන් අවසර පැතූ හ. අවසරය ලැබුණෙන් රහත් වී මිස නො නවතිමියි අදිටන් කර ගත් උන්වහන්සේ භාවනාවට පටන් ගත් හ. මේ අතර ගඳකිළියෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ "සුඛ සාමණේරයෝ පිඬු සිඟා යාම නවතා භාවනා කරනු පිණිස ආරාමයට ආපසු ආ හ. උන්වහන්සේ ගේ කාරිය ඉටු වීදෝ" යි දිවැසින් බලා වදාළ හ. සාමණේරයන් අනාගාමි ඵලය දක්වා පිළිවෙළින් පත්ව සිටි අයුරු දුටු භාග්‍යවතුන් වහන්සේ ඒදිනම රහත් ඵලය ලබා ගැනීමේ ශක්තිය ද එම සාමණේර නම සතුව පවත්නා බව ද දැක ගත් හ. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ ගන්ධකුටියෙන් නික්ම විහාරස්ථානයට පිවිසෙන දොරටුව අසල රැඳී සිටිය හ.

සාරිපුත්ත මහ රහතන් වහන්සේ පිඬු සිඟා ගෙන ආපසු පැමිණිය හ. බුදු පියාණන් වහන්සේ සුඛ සාමණේරයන් රහත් වන තුරු සැරියුත් මහ තෙරුන් කුටියට නො පිවිසවනු පිණිස උන්වහන්සේ ගෙන් ප්‍රශ්න හතරක් විමසූහ. ඒ ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් සැරියුත් හිමියන් පමා වූ අතර සාමණේර හිමියෝ රහත් වූ හ. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ "සාරිපුත්ත, සාමණේර නමට ආහාර දෙන්න" යි වදාළ හ. සැරියුත් හිමියෝ ද සාමණේර නමට පිණ්ඩපාතය පිරිනැමූ හ. සාමණේර නම වළඳා නිම වන විට ඉරු මඳක් අවරට ගොස් තිබිණි. ඒ ගැන භික්ෂූන් වහන්සේ දම් සභාවෙහි කතා කරමින් සිටියහ.

භාග්‍යවතුන් වහන්සේ එහි වැඩම කර "මහණෙනි, මෙතෙක් වේලා කවර කතාවක යෙදී සිටියහු ද?" යි විමසූ විට ඔවුහු "ස්වාමීනි, අද උදේ වරුව ටිකක් දිග වූවා වැනිය. සාමණේරයන් දන් වළඳා අවසන් වූ විට එක්වර ම හවස් වූවා වැනි විය. අපි ඒ ගැන කතා කළෙමු" යි පැවසූ හ. "මහණෙනි, උදාර අභිමතාර්ථ ඇත්තන් පධන් වීර්යයෙහි යෙදෙන විට එබඳු ප්‍රාතිහාර්ය සිදු වන්නේ ය. අද සුඛ සාමණේරයෝ දියඇළිවන් දිය ගෙන යන හැටි, ඊ වඩුවන් ඊ දඬු සකසන හැටි, වඩු කාර්මිකයන් ලී කපා මැද සකසන හැටි බලා සිට එයින් පාඩමක් ඉගෙන තමා ඔපවත් කර ගත් හ. උන් වහන්සේ දවල් දානය වැළඳුයේ රහතන් වහන්සේ නමක් වශයෙනි'' යි වදාළ හ.

#### විවරණාත්මක අනුවාදය (145 ගාථාව)

**නෙත්තිකා හි උදකං නයන්ති උසුකාරා තෙජනං**
**නමයන්ති තච්ඡකා දාරුං නමයන්ති සුබ්බතා අත්තානං**
**දමයන්ති**

**නෙත්තිකා**: කුඹුරු වලට දිය ගෙන යන්නෝ; **උදකං**: ජලය; **නයන්ති**: ගෙන යති; **උසුකාරා**: ඊතල සාදන කාර්මිකයෝ; **තෙජනං**: ඊ දඬු; **නමයන්ති**: හැඩ ගන්වති; **තච්ඡකා**: වඩු කාර්මිකයෝ; **දාරුං**: ලී; **නමයන්ති**: නවති; **සුබ්බතා**: සිල් රකින්නෝ; **අත්තානං**: තමා; **දමයන්ති**: දමනය කර ගනිති.

කුඹුරු වලට අවශ්‍ය ජලය ගොවියෝ ඇල මාර්ග වලින් කැමති පරිදි ගෙන ගොස් හසුරුවා ගනිති. ඊතල සාදන්නෝ ඊ දඬු ගින්නෙන් රත්කර දිග හැර සාදා ගනිති. වඩු කාර්මිකයෝ ලී කපා මැද තමාට රිසි පරිදි වැඩට යොදවා ගනිති. සිල් රකින්නෝ තමා දමනය කරගනී.

#### විවරණය

**සුබ්බතං**: මනා පැවතුම් ඇත්තා සුබ්බත නමින් හැඳින් වේ. යහපත් සීල ගුණය හා විනීතාචාරවත් බව මෙයින් අදහස් වෙයි. එවැන්නන් පහසුවෙන් ශික්ෂණය කළ හැකි වෙයි.



# කෘතීඥ ස්වාමීන්ද්‍රයන් වහන්සේ



සනාතන බුද්ධ භාෂිතය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ අසහාය සාමයික මෙහෙය උදෙසා, සිය කාලය හා ශ්‍රමය සපුරා වැය කරමින්, මානව වංශයට දහම් මග හෙළි පෙහෙළි කිරීමේ මහා මෙහෙවරට කැප වී සිටින සිංගප්පූරුවේ ප්‍රධාන සංඝ නායක වේරගොඩ සාරද, ස්ථවිරයන් වහන්සේ අද ලොව වෙසෙන ප්‍රශස්ථතම ධර්‍ම දූත යතිනායක වරයාණන් වහන්සේ නමකි.

1941 නොවැම්බර් මස 27 වනදා දකුණු ලක වේරගොඩ දී උපත ලද මේ යති ප්‍රභූවරයානෝ, උපාධි ලාභීව, ධර්‍මදූත මෙහෙය ආරම්භ කළේ ඉතා යොවුන් අවධියේ දීමය. දැනට ශතක 6 ක් පුරා ධර්‍මදූත මෙහෙයෙහි යෙදී සිටින ගරුතර වේරගොඩ සාරද යතිනායකයානන් වහන්සේ මුද්‍රිත මාධ්‍යයෙන් සහ විද්‍යුත් මාධ්‍යයෙන් මෙන්ම දුරකථන තාක්ෂණයෙන් පවා අද ලොවට ධර්‍මදානය සපයන්නේ නවීනයන්ගේ මනස හා ආධ්‍යාත්මික ගති-පැවතුම් පිළිබඳ පැහැදිලි අවබෝධයකිනි.

වර්තමානික ග්‍රාහක පිරිස, ශ්‍රව්‍ය-දෘෂ්‍ය මාධ්‍ය මගින් දැනුමත් විනෝදාස්වාදයත් ලබන්නට පුරුදු වී සිටින පරපුරක් හෙයින්, ගරුතර වේරගොඩ සාරද හිමිපාණෝ, ඔවුනගේ මනසට සරිලන පරිද්දෙන් බුද්ධ භාෂිතය, ඔවුන් අතට පත් කරන සේක. මුද්‍රිත හා විද්‍යුත් ප්‍රකාශන 700 ක් පමණ ලොවට පිරිනමා සිටින මේ යතිනායකයන් වහන්සේ විසින් සම්පාදිත ධර්ම භාණ්ඩාගාරය නම් ඉංග්‍රීසි කෘතිය දොරට වැඩීමේ උළෙලේ දී, ඒ පිළිබඳ ව එක් දිනක් තුළ පමණක් ලැබුණු දුරකථන ඇමතුම් සංඛ්‍යාව 2000 කටත් අධික විය. ඒ නිසා එය සිංගප්පූරු රාජ්‍යයේ ග්‍රන්ථ ප්‍රකාශන ඉතිහාසයේ සුවිශිෂ්ට වාර්තාවකට හිමිකම් කියන්නේය.

දැනට, සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය භාරව වැඩ සිටින ගරු වේරගොඩ සාරද නායක ස්ථවිර පාදයන් වහන්සේ ලෝකයේ බොහෝ දේශයන් හී බුද්ධ ශාසනයේ ප්‍රගතියට හිතකාමී ධර්ම දූත මෙහෙවරක යෙදී සිටින සේක.

එතුමන් ගේ ප්‍රධාන ප්‍රකාශ අතර, සිංහල හා ඉංගිරිසි ධම්මපදයත්, ජාතක කථා පිළිබඳ විද්‍යුත් ප්‍රකාශනයත් ප්‍රධාන තැන් ගනී. එතුමන් විසින්, ඉටු කෙරෙන මහා සාමයික මෙහෙය අඛන්ඩව පවත්වා ගෙන යනු පිණිස, ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් නිදුක් නිරෝගී සුව පැතීම, බෞද්ධ ජනතාවගෙන් ඉටු විය යුතු කෘතඥතා පූර්වක චාරිත්‍රයකි.

කලා කීර්ති එඩ්වින් ආරියදාස

ISBN: 981-00-4938-2

# ධර්ම භාණ්ඩාගාරය

සිතුවම් සහිත ධම්මපදය

එකොළොස්වන පරිච්ඡේදය

## ජරා වග්ග



ගරු වේරගොඩ සාරද නාහිමිපාණන් වහන්සේ

සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක

"සබ්බදානං ධම්මදානං ජිනාති"

(ධර්ම දානය, සෙසු දාන සියල්ලටම වඩා අගනේය.)



''ධර්ම භාණ්ඩාගාරය'' නැමැති

මෙම වටිනා ධර්ම පුස්තකය

**සාමවිනිසුරු බී.ධර්මදාස පියාණන්ට**

නිවන් සුව පතා ප්‍රකාශනය කරන ලදි.

පූර්ණ අනුග්‍රහකත්වය

**වේරගොඩ සුනන්දා භික්ෂුණිය විසිනි**

# ධර්ම භාණ්ඩාගාරය

සිතුවම් සහිත
## ධම්මපදය


කතෘ:
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය



**සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය**
නො: 1, ජලන් මස් පුටේ, සිංගප්පූරුව 128607
ටෙලි: 65 67783330 65 94656570
94 770589498 / 94 755218421
වේරගොඩ ජයන්ති විහාරය, වේරගොඩ, මීටියාගොඩ
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

**කර්තෘ**
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**චිත්‍ර ශිල්පි**
පී. වික්‍රමනායක

**සැකසුම**
පියරත්න හේවාබට්ටගේ

**පරිගණක රූපාවලි සහ පූර්ව ප්‍රකාශන මෙහෙය**
පූජ්‍ය වේරගොඩ සුනන්දා භික්ඛුණී
බී. දයා සමරසිංහ
බී. රෝහණ ජයතිස්ස

**පරිගණක සහාය**
ශ්‍යාමනී ප්‍රියලක්‍ෂණා ලේකම්වසම්
ඩබ්ලිව්. මාලා කාන්ති
ප්‍රියංකා බෝධිපක්‍ෂ

**සහාය**
බී. පුෂ්පානී ධම්ලතා
බී. ජේ. ධම්ලතා
ඊ. එම්. ලයනල් මොහොට්ටි
ඊ. එම්. යුගාන් සසංක
ශ්‍රියාලතා කග්ගොඩ ආරච්චි

**පරිගණක ප්‍රකාශන**
සමනල ප්‍රින්ටර්ස්, බටපොල
ටෙලි: +94 777557127

**පිටකවරයේ පින්තූරය**
බර්ටි ගුණසේකර

**මුද්‍රණය**
2013 නොවැම්බර් මස 27 දින, සිංගප්පූරුව

**පිටකවරයේ චිත්‍රය**

*පිටකවරයේ බුදු පිළිමය වේරගොඩ ජයන්ති විහාරයේ බුදුමැදුරෙනි.*
*වර්ෂ 1953 ජුනි 3 වෙනිදා අඹන ලද මෙම බුදු පිළිමය දැනට ශ්‍රී ලංකාවේ තිබෙන*
*දර්ශණීයතම බුදු පිළිමය වශයෙන් සැලකේ. මෙම බුදු පිළිමය ඉදිකිරීමේ පුරෝගාමී වූ අපවත් වී වදාළ*
*ගෞරවාහී පණ්ඩිත යටලමත්තේ වජිරඥාණ නායක මාහිමිපාණන් වහන්සේට නිවන්සුව අත්වේවායි අපි ප්‍රාර්ථනා කරමු.*

මේ ග්‍රන්ථයෙහි ආගත කරුණු පිළිබඳ පූර්ණ හා සදාකාලික අයිතිය හිමි වන්නේ බුදුරජාණන් වහන්සේටයි.
බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් පහල වූ සනාතනික සත්‍යයෝ පුහුදුන් මිනිසුන් විසින් පනවන ලද
තාවකාලික වූත්, අසත්‍ය වූත්, අයිතිවාසිකම් පිළිබඳ නීති රීති පිළිගනු නොලබති.

**පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ටෙලි: 65 67783330 65 94656570
+94 770589498 +94 755218421
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

ISBN: 981-00-4938-2

11 වන පරිච්ඡේදය

# ජරා වග්ග





*ගිනි (එකොළොසකින්) ඇවිල ගෙන නිතොරැ දැවෙද්දී කුමන සිනාවෙක් ද? කුමන සතුටෙක් ද?*

146. කොනු හාසෝ කිමානන්දෝ
නිච්චං පජ්ජලිතේ සති
අන්ධකාරෙන ඔනද්ධා
පදීපං න ගවෙස්සථ (11:1)

මොන සිනා දෝ
මොන සතුට දෝ
නිතර ගිනි ගෙන දැවෙද්දී
දිලෙන පහනක්
සොයනු නැත්දෝ
අන්ධකාරේ සිටිද්දී

# එක වදනක් - දුන් එළියක්

## 11 (1) විසාකාවන් ගේ පිරිවර ලඳුන් (146 ගාථාව)

විසාකා උපාසිකාවගේ **පිරිවර ලඳුන්** ඇරබ මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ දෙව්රම් වෙහෙරදී ය.

විසාකාවන් දනට පිනට හිතැති කාරුණික ගුණවත් කුලකතක් සේ පතලව සිටි හෙයින් තම බිරින්දන් ද එබඳු ගුණ යහපත් අය බවට පත් වෙනවා නම් ජීවිතය කෙතරම් ප්‍රසන්න වන්නේ දැයි සැවැත් නුවර බොහෝ අය සිතූ හ. එසේ සිතූ පන්සියය දෙනෙක් වරක් තම බිරින්දන් එසේ ගුණ යහපත් කර ගනු පිණිස ඔවුහු විසාකා උවැසිය ගේ ඇසුරට පත් කළ හ. විසාකාවෝද විහාරස්ථානයට යන ගමන් බිමන් වලදී ඔවුන් කැටුව යමින් සදුපදේශ දානයෙන් ඔවුනට සංග්‍රහ කළ හ.

මේ අතර රජතුමා ගේ ද අවසර ඇතිව පැවැත්වෙන එක් සැණකෙළි සමයෙක ඔවුහු සිය ස්වාමිවරුනට තැනූ සුරාවෙන් ඉතිරිය විසාකාවන් මඟහැර උයනට සඟවා ගෙන ගොස් බී  කලබල කළෙන් ස්වාමිපුරුෂයන් ගෙන් ගුටි බැට කෑ හ.

තවත් වතාවක ඔවුහු  විසාකාවන් සමඟ ආරාමයට යන අතර සුරා බඳුන් ද සඟවා ගෙන ගොස් ආරාමයේදී හොර රහසේ ම බී ධම් ශාලාවේ වාඩි වූ හ. බුදුරදුන් ධර්ම දේශනා කරන අතරතුර ඔවුන් ගේ සුරා මත වැඩි විය. සමහරු මහ හඬින් සිනාසෙන්නටත්, සමහරුන් ගී ගයන්නටත්, සමහරුන් නටන්නටත් පටන් ගත්තෙන් ඒ කවර හෙයින් දැයි දිවැසින් බැලූ භාග්‍යවතුන් වහන්සේට කරුණු වැටහිණ. ඔවුන්ට සුරා මත මැද්දේ මාර පාක්ෂික මිථ්‍යා දෘෂ්ටික භූතාත්මයන් ද ආවිෂ්ටව තිබින. මාරයාට අවස්ථාව නො දිය යුතු යැයි සිතූ භාග්‍යවතුන් වහන්සේ සිය දෙබැමෙන් තද නීලවණී රශ්මියක් නිකුත් කර සමස්ත දම් සභාවම අඳුරේ ගිල්වූ හ. භීතියට පත් කාන්තාවන් ගේ සුරාමත නැතිවිණ. ඒ වෙනුවට ඔවුහු බියෙන් තැති ගත්හ.

අනතුරුව සුදු බුදුරැසින් දම් සභාව ඒකාලෝක කළ භාග්‍යවතුන් වහන්සේ ඔවුන් අමතා "උපාසිකාවෙනි, ඔබ මේ දම් සභාවට මෙබඳු ස්වරූපයකින් නො පැමිණිය යුතුව තිබිණි. ඔබ එසේ ප්‍රමාදීව හැසුරුණු හෙයින් මාරයාට අවස්ථාව සැලසිණ. මාරාවේශය නිසා ඔබ ක්‍රියා කළේ විලි බිය නැතිව ය. ඔබ හාත්පසින් ම එකොලොස් ගින්නකින් දැවෙත්දී තමන් තුළ ඇති කෙළෙසුන් ගෙන් මිදෙන්නට තැත් නො දරන්නේ ඇයි? ඔබ අඳුරෙහි ගිලී සිටින හෙයින් ආලෝකයක් සොයා ගන්නට නො වෙහෙසෙන්නේ ඇයි?" යනාදී වශයෙන් අනුශාසනා කළ හ. ධම් ශ්‍රවණය කළ උපාසිකාවෝ සියළු දෙන අවසන සෝවාන් ඵලයෙහි පිහිටිය හ.

### විවරණාත්මක අනුවාදය (146 ගාථාව)

**නිච්චං පජ්ජලිතේ සති කොනුහාසො කිං ආනන්දෝ**
**අන්ධකාරෙන ඔනද්ධා පදීපං න ගවෙස්සථ?**

**නිච්චං**: නිතරම; **පජ්ජලිතේ සති**: (එකොලොස් ගින්නෙකින්) ගිනි ගෙන දැවෙත්දී; **කො නු හාසො**: කවර නම් හිනාවක් ද?; **කිං ආනන්දෝ**?: කුමන සතුටක් ද?; **අන්ධකාරේන**: (අවිද්‍යා)අන්ධකාරයෙන්; **ඔනද්ධා**: වැසී සිටිමිනුත්,(ඔබ); **පදීපං**: ආලෝකයක්; **න ගවෙස්සථ?**: නො සොයන්නහු ද?

නිතරම කෙළෙස් ගින්නෙන් දැවෙමින් සිටිය දී කවර හිනාවක් ද, කවර ආනන්දයක් ද?, අඳුරෙහි ගිලී සිටිමිනුත් ආලෝකය පිණිස පහනක් නො සොයවු ද?

### විවරණය

**පජ්ජලිතෙ සති**: සත්ත්වයා නිරන්තරයෙන් ගිනි එකොළසකින් දැවෙන බව දහම් පොත්වල දැක්වෙයි. ඒ ගිනි නම්,

1) රාගය 2) ද්වේෂය 3) මෝහය 4) ව්‍යාධිය  5) ජරාව 6) මරණය 7) සෝකය 8) පරිදෙව 9) දුක්ඛ (කායික දුකය) 10) දෝමනස්ස (නො සතුට හෙවත් සිතේ දුකය) 11) උපායාස (දැඩි ආයාසය)

යන එකොළසයි. සෑම සත්ත්වයෙක්ම නිවන් දැක සසරින් එතෙර වන තුරු මේවායින් දැවෙයි.

**අන්ධකාරෙන**: අඳුර ලෙස මෙහි හඳුන්වන්නේ සියළු පෘථග්ජන සත්ත්වයන් ගිලී සිටිනා අවිද්‍යා අන්ධකාරයයි.

**පදීපං**: ප්‍රදීපය නම් ප්‍රඥා ප්‍රදීපයයි.

ගාථාවසානයෙහි විසාකාවගේ පිරිවර කාන්තාවෝ සෝවාන් වූහ. සෝවාන් වූ අය ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදෙති. එනම්,

1. **සත්තක්ඛත්තු පරම**: පහත් ජන්මවල නො ඉපිද දිව්‍ය-මනුෂ්‍ය ලෝකවල සත් වරක්  පමණක් උපදිති.

2. **කෝලං කොල**: දෙතුන් වරක් පමණක් ඉපිද සසර දුක් කෙළවර කරයි.

3. **ඒක බීජෙ**: තව එක් වරක් පමණක් මනු ලොව උපතක් ලබයි.

සෝතාපත්ති ඵලය ලබන්නේ සක්කාය දිට්ඨි විචිකිච්ඡා සහ සීලබ්බත පරාමාස යන සංයෝජන නැති කිරීමෙනි.





*බොහෝ දෙන සුවය යි සලකා විසිතුරු කොට සරසන සිරුර ගති සලකා බලන්න.*

| | |
|---|---|
| 147. පස්ස චිත්තකතං බිම්බං<br>අරුකායං සමුස්සිතං<br>ආතුරං බහු සඞ්කප්පං<br>යස්ස නත්ථි ධුවං ඨිති (11:2) | බලන්න හැඩ වැඩ කළ කය<br>තුවාලයකි ඇට කටු පිරි<br>ලෙඩකි කවුරු ලොබ සිතුවත්<br>තිර පැවතුම් බිඳකුත් නැති |

# බලන්න ඇති තතු සිරුරේ
## 11 (2) සිරිමා පුරඟන පුවත (147 ගාථාව)

සැවැත්නුවර ජේතවන විහාරස්ථානයෙහි වැඩ වාසය කළ භාග්‍යවතුන් වහන්සේ සිරිමා නම් ගණිකාව ඇරබ මේ ගාථාව වදාළ සේක.

සැවැත් නුවර ඉතා ප්‍රියංකර රූප ශෝභාවෙන් යුක්ත සිරිමා නම් අබිසරුලියක් විසුවා ය. ඕ දිනපතා භික්ෂූන් වහන්සේලා අටනමකට දන් පිරිනැමුවා ය. වරක් එහි දන් වැළඳූ භික්ෂූහු ඇය ගේ අසමාන රූප සෞන්දර්යය ගැනත් ඇය පිළිගැන්වූ ආහාර වල ප්‍රණීතත්වය ගැනත් ආරාමයේදී කථා කළ හ. ඒ අසා සිටි එක් තරුණ හිමි නමක ගේ සිත තුළ ඇය නොදැකම පවා ඇය පිළිබඳ සරාගී සිතක් ඇති විය. පසු දින හෙතෙම අනිත් භික්ෂූන් ද කැටුව සිරිමාවන් ගේ නිවසෙහි දානය වැළඳීම පිණිස පිටත් විය. එදා සිරිමා රෝගාතුරව සිටි දිනකි. එසේ වුව ද ඇය භික්ෂූන් වහන්සේලාට ගෞරව කරන්නට අවශ්‍යයැයි කියා සිටි හෙයින් ඇය වත්තම් කර ගෙන සඟ මැදට ගෙන එන ලදී. "ඇය අසනීපව සිටිය දී පවා අතිශයින් රූප සම්පන්නය" යි සිතූ භික්ෂුව ඇය කෙරේ තදින් ම ඇළුම් කළේ ය.

එදා රැයෙහි අසනීපය වැඩි වීමෙන් සිරිමා කළුරිය කළා ය. බිම්බිසාර රජ තෙම සිරිමා මිය ගිය බව බුදුරජාණන් වහන්සේට දැනුම් දුන්නේ ය. සිරිමා ගේ මළ සිරුර සුසාන භූමියට ගෙන ගොස් වළ නො දමා දින තුනක් එහි සුරක්ෂිතව තබන සේ භාග්‍යවතුන් වහන්සේ රජුට උපදෙස් දුන් හ. කපුටන් හා ගිජු ලිහිණියන්ගෙන් රැක ගනිමින් එය දින තුනක් එසේ තබන ලදී. සිරිමා ගේ රූබර සිරුර තව දුරටත් රූබර නො විය. එය ඉදිමී කුණු වී පණුවෝ පවා ඇති වූහ. නව දොරින් ම ඕජාව ගලන්නට විය.

සිවුවන දින බුදුරජාණන් වහන්සේ මහ සඟන පිරිවරා සුසාන භූමියට වැඩම කළ හ. රජතුමා ද සහ පිරිවරින් පැමිණියේ ය. සිරිමා කෙරේ දැඩි ප්‍රේමයක් ඇති කර ගෙන සිටි තරුණ භික්ෂුව ඇය මියගිය බව දැන සිටියේ නැත. බුදුරදුන් සිරිමාව ගේ සිරුර බලන්නට යතියි ඇසූ උන්වහන්සේ ද ගමනට එක් විය. සුසාන භූමියෙහි දී සිරිමාවන් ගේ සිරුර වට කර සඟරුවන හා බුදුරජාණන් වහන්සේ වැඩ සිටි අතර රජතුමා සහ පිරිස ද වටව සිටියහ. බොහෝ ගිහි පැවිදි, ස්ත්‍රී පුරුෂ සෙනඟ ද එහි රැස් වූහ.

භාග්‍යවතුන් වහන්සේ රජතුමාගෙන් මෙසේ විමසූ හ. "මහරජ, මේ කාන්තාව කවුද?" රජතුමා පිළිතුරු දුන්නේ "ස්වාමීනි, මේ ජීවක වෛද්‍යවරයා ගේ සහෝදරිය වූ සිරිමා ය." "මේ සිරිමා ද, මහරජ?" "එහෙමයි ස්වාමීනි," "එසේ නම් මහරජ කහවුණු දහසක් දෙන්නකුට සිරිමා ලද හැකි යැයි අණ බෙර ලවන්න" කිසිවෙක් 'හූම්' හඬකුදු නො නැගූ හ. රජතුමා මිල සතයක් දක්වා අඩු කළේ ය. කිසිවෙක් මිලට නො ගත් හ. "බුදුරජාණන් වහන්ස මේ සිරුර කිසිවෙක් නොමිලයේවත් නො ගනිති" යි රජතුමා දැනුම් දුන්නේය.

භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා අමතමින්, "මහණෙනි, වනිතාවක ගේ අගයට වූ දේ බලන්න. මැය සමග එක් රැයක් ගත කරන්නට මිනිස්සු කහවුණු දහසක් ගෙවූ හ. අද කිසිවෙක් නොමිලයේ ද නො ගනිති. ඇය ගේ රූසපුව දිරාපත්ව ගියේ ය. මහණෙනි, සිරුරේ හැටි තේරුම් ගන්න" යි ධර්ම දේශනා කළ හ. සිරිමාවන් කෙරේ ඇළුම් කළ භික්ෂු නම ද සෝවාන් ඵලය ලද්දේ ය.

**විවරණාත්මක අනුවාදය (147 ගාථාව)**

**යස්ස ධුවං ඨිති නත්ථි අරුකායං සමුස්සිතං ආතුරං බහු සඞ්කප්පං චිත්තකතං බිම්බං පස්ස**

**යස්ස**: යමකට; **ධුවං ඨිති**: තිර පැවැත්මක්; **නත්ථි**: නැත්ද; **අරුකායං**: තුවාලයක් ව; **සමුස්සිතං**: ඇටකටු සමූහයක් වූ; **ආතුරං**: රෝගී වූ; **බහු සඞ්කප්පං**: බොහෝ දෙනා විසින් විවිධ ලෙස කල්පනා කරනු ලබන්නා වූ; **චිත්තකතං**: විචිත්‍ර කරන ලද; **බිම්බං**: මේ ශරීරය; **පස්ස**: බලන්න.

ස්ථාවර පැවැත්මක් නැති, මුළුමනින් ම තුවාලයක් වැනි, ඇට එක්වී රොක්වී පෙනෙන, රෝගී වූ,විවිධ ජනයා විසින් විවිධාකාරයෙන් උපකල්පනය කරනු ලබන, මේ විසිතුරු කරන ලද ශරීරයේ යථා තත්ත්වය බලන්න.

**විවරණය**

ශරීරයට නිත්‍ය පැවැත්මක් නැත. එය නිරතුරුවම වෙනස් වෙමින් දිරා පත් වෙමින් විනාශය කරා ගමන් කරයි. එහෙත් එය විවිධාකාරයෙන් විසිතුරු කොට විවිධ කල්පනා ජනිත කරවයි.






*සියලු සතුන් ගේ ජීවිතය මරණය කෙළවර කොට ඇත්තේ ය.*

148. පරිජිණ්ණමිදං රූපං
රොගනිඩ්ඪං පභඞ්ගුරං
භිජ්ජති පූතිසන්දෙහො
මරණන්තං හි ජීවිතං (11:3)

දිරා යන මේ සිරුර
ලෙඩින් වැටෙනා නිතර
බිඳෙයි සැරව ද වැගිර
දිවියේ කෙළවරයි මරණය

# දිවිය නිමවෙයි මරණයෙන්

## 11 (3) උත්තරා මෙහෙණිය ගේ කතාව (148 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව **උත්තරා මෙහෙණිය** නිමිති කොට දේශනා කළ සේක.

එකසිය විසිවස්ව වැඩ විසූ උත්තරා මෙහෙණිය දිනක් පිඩු සිඟා ගොස් එන අතර මඟ භික්ෂු නමක් දැක තම පිණ්ඩපාත භෝජනය උන්වහන්සේට පිළිගැන්වූවා ය. එහෙයින් ඇයට එදින නිරාහාරව සිටින්නට සිදු විය. දෙවන දින ද එය ම සිදු විය. තුන්වන දින ද ඕ තොමෝ තම පිණ්ඩපාත භෝජනය භික්ෂුනමක් දැක පූජා කර තුමූ නිරාහාරවම ගත කළා ය. තුන් දිනක් ම නිරාහාරව සිටීමෙන් මෙහෙණිය ඉතා දුර්වල වූවා ය.

සිවුවන දින උත්තරා භික්ෂුණිය පිඩුසිඟා වඩිනා අතර මඟ ඇයට පටුමඟක දී භාග්‍යවතුන් වහන්සේ මුණ ගැසිණි. භාග්‍යවතුන් වහන්සේට ගෞරවයෙන් වැඳ නමස්කාර කළ ඕ තොමෝ පස්සට වූවා ය. එහෙත් අවාසනාවට තමන් ගේ ම චීවරය පෑගී පැටලී බිම ඇද වැටුණා ය. එයින් ඇය ගේ හිස තුවාල විණි. ඇය වෙත ගිය භාග්‍යවතුන් වහන්සේ "ඔබේ සිරුර බෙහෙවින් දුබලව ගියේ ය. දැන් බිඳ වැටෙන්නට ආසන්න ය. ලඟදීම එහි අවසානය සිදුවනු ඇත" යි වදාළ සේක. ඒ අසා සිටි මෙහෙණිය සෝවාන් ඵලයෙහි පිහිටියා ය.

### විවරණාත්මක අනුවාදය (148 ගාථාව)

**ඉදං රූපං පරිජිණ්ණං රොගනිඩ්ඩං පභඞ්ගුරං**
**පූතිසන්දෙහො භිජ්ජති හි ජීවිතං මරණන්තං**

**ඉදං රූපං**: මේ රූපය; **පරිජිණ්ණං**: අතිශයින් දිරා ගියේ; **රොගනිඩ්ඩං**: රෝගයට කැදැල්ලක් බඳුය; **පභඞ්ගුරං**: (වහා) බිඳෙන සුලුය; **පූතිසන්දෙහො**: (නව දොරින්) කුණු සැරව ගලා යයි; **භිජ්ජති**: (මේ සිරුර) පහසුවෙන් බිඳී යයි; **හි**: යම් හෙයකින්; **ජීවිතං**: ජීවිතය; **මරණන්තං**: මරණය කෙළවර කොට ඇත්තේ වේ ද (එහෙයිනි).

වයසට යන විට ශරීරය දිරාපත් වෙයි. රෝග වලට ආකරයකි. පහසුවෙන් බිඳී යයි. කුණු වී සැරව ගලා යයි. පහසුවෙන් බිඳෙයි. ජීවිතය මරණයෙන් කෙළවර වෙයි.

### විවරණය

**මරණන්තං හි ජීවිතං**: ජීවිතයේ අවසානය මරණයයි. මේ ගාථාවේ අරමුණ ජීවිතයේ අනිත්‍යය පැහැදිලි කිරීමයි. ත්‍රි ලක්‍ෂණයන් ගේ ප්‍රථම ලක්‍ෂණය අනිත්‍යය යි. අනිත්‍යය පැහැදිලි කිරීමේ දී ලක්‍ෂණ තුනක් ගැන මෙනෙහි කිරීම දැක්වෙයි. එනම්, උප්පාද (හට ගැනීම) ඨිති (පැවැත්ම) භංග (විනාශය) යන ලක්‍ෂණ තුනයි. පැවැත්ම වුව ද මොහොතක් එකවිට එක ලෙස පැවැත්මක් නැත.

සියලුම සංස්කෘතක ධර්මයන් ගේ ස්වභාවය නිබඳව නිරන්තරව වෙනස් වීම යි. භෞතික වේවා, මානසික වේවා, ආධ්‍යාත්මික වේවා, බාහිර වේවා සියල්ලම අනිත්‍ය ය. පංචස්කන්ධ විභාගය, ආයතන විභාගය හා ධාතු විභාගය මගින්ද මෙම අනිත්‍යතාව ප්‍රකට කරනු ලැබේ. අනිත්‍යතාවෙන් මිදුණු එකම දෙය අසංස්කෘත ධර්මය වූ නිර්වාණය පමණි.

සෝවාන් වීම විග්‍රහ කරන සුප්‍රකට පාඨය තුළ එන "**යංකිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං**" හටගන්නා යමක් ඇත්නම්, ඒ සියල්ල නැසෙන සුළුය." යන්නෙහි හරය වන්නේ අනිත්‍යය පිළිබඳ පරිඥානයක් ඇති කර ගැනීමයි. විමුක්ති මාර්ගයේ ප්‍රථම පියවර වන්නේ අනිත්‍යය පිළිබඳ යථාවබෝධය බව මෙයින් හැඟවෙයි. අනිත්‍යය අවබෝධ කර ගැනීමේ ආගමික වැදගත්කම මෙයින් තේරුම් ගත හැකි ය. එමෙන් ම පිරිනිවන් පාන්නට මඳකට පෙර තථාගතයන් වහන්සේ විසින් වදාළ අවසාන බුද්ධ වචනය වූයේ ද "මහණෙනි, සියළු සංස්කාර ධර්මයෝ අනිත්‍යය හ. අප්‍රමාදව සම්පාදනය කර ගනිවු" යන්නයි.

සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය බව හා අනාත්ම බව ප්‍රත්‍යක්‍ෂ කර නො ගෙන විමුක්තිය ලබා ගත නො හැක. එහෙයින් එය භාවනා මාර්ගයෙන් සෘජුව හා සූක්‍ෂම ලෙස ප්‍රත්‍යක්‍ෂ කර ගත යුතුව තිබේ. එම අවබෝධය අස්වාදය විදර්ශනාවන් අතර ප්‍රථමය ලෙස දැක්වෙයි. ඤාණ දස්සන විසුද්ධිය හා මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය ලබා දෙන නව විධ අනුස්සතීන් අතර ප්‍රථමාංකයට ද උදයව්‍යය විෂයෙහි අවධානය යොමු කිරීම දක්වා ඇත.

**පභඞ්ගුරං**: ශරීරය ඉතා පහසුවෙන් බිඳී විසිර යන්නක් බව මෙයින් හැඟෙයි.

**පූතිසන්දෙහො**: ශරීරයේ නව දොරින්ම සැරව (අපවිත්‍ර දේ) වැගිරෙයි.

**අනිත්‍යය**: ගස් වල දළු, මේරූ කොළ, ඉදී කහ ගැහුණු කොළ හා බිම වැටී වියලී යන කොළ අප නෙත ගැටෙන මුත් අපි ඒ මගින් ඉගැන්වෙන පාඩම සිතට නො ගනිමු. හිසෙහි කළු කෙස් සුදු වන විට එමගින් දෙන දාර්ශනික පණිවිඩය අපි තේරුම් නො ගනිමු. මේ සියල්ලෙන් අපට දෙන පණිවුඩය කුමක් ද? අනිත්‍යයයි. ඉඳ හිට අනිත්‍යය පිළිබඳ සුළු අවදිකමක් ජනිත වීම හා එය ගැඹුරින් ප්‍රත්‍යක්‍ෂ කිරීම අතර බලගතු වෙනසක් පවතියි. බුද්ධිමය වශයෙන් යමක් පිළිගැනීම හා ප්‍රත්‍යක්‍ෂ කර ගැනීම අතර වෙනසක් පවතියි. බොහෝ විට අප එය තේරුම් ගත්තත් අපට සම්බන්ධ කර වටහා ගන්නට වෑයම් නො කරමු.





*ලබු කබල් වැනි කොබෝවන් පැහැ (-අලුපාට) ඇති මිනී ඇට සැකිලි කවර ඇල්මෙක් ද?*

| | |
|---|---|
| 149. යානිමානි අපත්ථානි<br>අලාපූනෙ'ව සාරදෙ<br>කාපොතකානි අට්ඨීනි<br>තානි දිස්වාන කා රති? (11:4) | සරත් කාලෙ එතන මෙතන<br>වැටී තිබෙන ලබු ඇට මෙන<br>අළු පැහැ ඇට කටු දැකුමෙන<br>කවුරුත් පෙළඹෙති ඇල්මෙන |

# මේ දේ දැකුමෙන් - ආසා දුරලත්

## 11 (4) අධිමානික හිමිවරුන් ගේ කථා පුවත (149 ගාථාව)

තමන් ගැන පමණට වඩා සිතට ගත් එක් **භික්ෂු පිරිසක්** අරබයා බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් මේ ගාථාව වදාළ සේක.

එක්තරා භික්ෂු පිරිසක් භාග්‍යවතුන් වහන්සේ වෙතින් කමටහන් ලබා ගෙන බවුන් වඩනු පිණිස වනගත වූහ. බොහෝ උනන්දුවෙන් අප්‍රමාදී ව භාවනා කළ ඒ හිමිවරු ඉක්මණින් ම ධ්‍යාන උපදවා ගත් හ. එහෙත් එම අධිගමය වරදවා තේරුම් ගත් උන්වහන්සේලා දැන් තමන් සියළු කෙළෙසුන් නසා රහත්ව ඇතැයි සිතූහ. එහෙත් ඔවුන් ලබා තිබුණේ ධ්‍යානයක් පමණි.

තමන් රහත් ඵල ලබා ඇතැයි සතුටට පත් ඒ හිමිවරු භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස, දෙව්රම් වෙහෙර බලා ආපසු ගමනට පිටත් වූහ. උන් වහන්සේලා දෙව්රම් වෙහෙරට ඇතුල් වන්නට පෙර පවුරු දොරටුව ට සම්පවත් ම සිය බුදු නෙතින් ඔවුන් දැක වදාළ භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමියන් අමතා "ආනන්ද, ඔය භික්ෂූන් වහන්සේලාට දැනට මා හමුවීමෙන් ප්‍රයෝජනයක් නො වෙයි. ඒ අයට මුලින් ම සුසාන භූමියට ගොස් අනතුරුව මා හමුවට එන්නැයි උපදෙස් දෙන්න" යි වදාළ හ.

ආනන්ද හිමියෝ ඒ භික්ෂූන්ට බුදුරදුන් ගේ පණිවුඩය දැන්වූ හ. ඒ භික්ෂූහු ද මෙසේ සිතූ හ.

"භාග්‍යවතුන් වහන්සේ සියල්ල මැනවින් දන්නා සේක. නිකරුණේ මෙසේ නො කරති. කිසියම් වැදගත් හේතුවක් ඇතිව ම මෙසේ කරති." එසේ සිතූ ඔවුහු සොහොන් බිමට ගිය හ.

සුසාන භූමිය පුරා විවිධ මිනී විසිරී තිබිණ. සමහර ඒවා ඇටකටු බවට පත්ව තැන තැන විසිර තිබිණ. සමහරක් කුණු වී යමිනි. පණුවෝ නලියති. ඕජාව ගලති. ඇතැම් මිනියක් පැයකට දෙකකට පෙර ගෙනා පරිද්දෙනි. තම සිත්වල විවිධ සංකීර්ණ හැඟීම් ඇතිව නැතිව යන හැටි පසක් කළ ඔවුහු තමන් කෙළෙසුන් නසා නැති බව තේරුම් ගත් හ.

ගඳ කිළියෙහි සිට දිව නෙතින් මේ සියල්ල නිරීක්ෂණය කරමින් සිටි භාග්‍යවතුන් වහන්සේ රශ්මි ධාරාවක් එහි යවා උන්වහන්සේලා ඇමතූ හ. "මහණෙනි, වට පිට විහිදී ඇති අළු පැහැති ඇටකටු බලන්න. මේ තත්ත්වය දැක දැකත් ඔබට කම් සුව ගැන සිතිය හැකි ද?"

අනතුරුව උන් වහන්සේ මේ ගාථාව වදාළ සේක.

**විවරණාත්මක අනුවාදය (149 ගාථාව)**

**සාරදෙ අපත්ථානි අලාපූනි ඉව කාපොතකානි යානි**
**ඉමානි අට්ඨීනි තානි දිස්වාන කා රති?**

**සාරදෙ**: සරත් ඍතුවෙහි; **අපත්ථානි**: (තැන තැන) විසුරුණු; **අලාපූනි ඉව**: ලබුකබල් වැනි වූ; **කාපොතකානි**: (පරෙවියන් ගේ පාට) අළු පැහැය ඇති; **යානි ඉමානි**: යම් මේ; , **අට්ඨීනි**: මිනී ඇට (වේද); **තානි**: ඒ මිනී ඇට; **දිස්වාන**: දැකීමෙන්; **කා රති**: කවර ඇල්මක් ද?.

පරෙවියන් ගේ පාට ගත් මිනී ඇට කටු සරත් කාලයෙහි වියළී තැන තැන විසිර ගිය ලබු කබල් මෙන් දිස් වෙයි. ඒ මිනී ඇට දැක්මෙන් කවර නම් ඇල්මක් උපදී ද?

**විවරණය**

**අට්ඨීනි**: ඇට කටු මේ අමු සොහොනෙහි මිනී දිරා ගොස් තැන තැන විසිර ඇති ඇට කැබලි පිරී පැවතිණ. හිස් කබල් පෙනී යන්නේ වියළී ගිය ලබු කබල් මෙනි. ප්‍රියංකර මනුෂ්‍ය ශරීරයට අවසානයේ අත්වන ඉරණම ඒ හිස් කබල් දෙස බැලීමෙන් වටහා ගත හැක.

**ජරා**: මහළු විය උදාවන විට ශරීරයේ පහළ වන ජරා ලකුණු කාටත් ප්‍රකට දේ ය. මහළු විය මිනිසුනට සසර කළකිරී පැවිදි වන්නට සිත් පොළඹවන එක් පෙර නිමිත්තක් වෙයි. සිදුහත් බෝසතුන් පැවිදි වූයේ මහල්ලෙක්, ලෙඩෙක් හා මළ කඳක් දැකීමෙනි. මේ නිමිති තුන දෙවියන් විසින් උන්වහන්සේ හමුවට පැමිණ වූ බව සම්ප්‍රදායෙහි කියැවෙයි.

යම රජු මිනිසුන් ගෙන් මෙසේ විමසතැයි කතාවක් ඇත. "එම්බා නරය, අවුරුදු අසූවක්, අනූවක්, සියයක් වයස් වූ මහළු, දුබල, කුදුව ගිය, ගෙල නැමුණු, හැරමිටි වාරුවෙන් යන, පා පැකිලෙන, රෝගී, තුරුණු බව ඉකුත්ව ගිය, දත් හැළුණු, හිසකේ පැසුණු, තට්ටය පෑදුණු, හම රැලි වැටුණු වෙවුලන අත් පා ඇති අයකු දැක්කේ නැත් ද? ඔබත් යම්කිසි දවසක මහළුව දුබලව යන බවත් එය මග හරින්නට ක්‍රමයක් නැති බවත් වැටහුණේ නැත් ද? රෝගීව, ගිලන්ව, වේදනාවෙන් පීඩිතව, තම අසූචියෙහිම ගිලී වෙනත් අය විසින් ඔසවා ගෙන ගොස් ඒ ඒ තැන තබනු ලැබිය යුතු අයකු දුටුවේ නැත් ද? මටත් මේ දේ වෙයි, මෙයින් ගැලවුමක් නැති වෙයි කියා කිසි කලෙක වැටහුණේ නැත් ද? තමාත් කවදා හෝ මියයන බව තේරුම් ගත්තේ නැත් ද? මරණයෙන් ගැලවීමක් නැති බව නො වැටහුණේ ද? කිසිදාක ගැහැණියක ගේ හෝ පිරිමියකු ගේ හෝ දිනක්, දෙකක් තුන හතරක් පැරණි වී ගිය ඉදිමුණු, දුර්වර්ණ වුණු කුණු වුණු මළ සිරුරක් දැක්කේ නැත් ද?"

සියල්ල නැසෙන සුළු බව, අනිත්‍ය බව තේරුම් ගත් විට ලොව දෙස බලන දෘෂ්ටිය වෙනස් කර ගන්නට හැකි වනු ඇත. කිසිවක් අපේ නොවන බව, අපට අවශ්‍ය ලෙස පාලනය කර ගත නො හැකි බව තේරුම් ගත් විට යථාර්ථය දැකීමේ නව උද්‍යෝගයක් අප තුළ ඇති වෙයි.






*මේ සිරුර මස් ලේ ගල්වා ඇටවලින් සැදුණු නුවරක් (කොටුගෙයක්) වැනි ය.*

150. අට්ඨීනං නගරං කතං
මංසලොහිතලෙපනං
යත්ථ ජරා ච මච්චූ ච
මානො මක්ඛො ච ඔහිතො (11:5)

නගරය ඇට වලින් කළේ
පුරවා ඇත්තේ මස් ලේ
ජරාව මරණය සමගින්
මානය මකු බව ඇතුළේ

# සිරුර නුවරකි - ඇට සැකිල්ලකි

## 11 (5) රූප නන්දා භික්ෂුණිය ගේ වත (ජනපද කල්‍යාණි) (150 ගාථාව)

**ජනපද කල්‍යාණිය** හෙවත් රූප නන්දාව ඇරබ බුදුරදුන් මේ ගාථාව දේශනා කළේ දෙව්රම් වෙහෙර වැඩ වසමිනි.

ජනපද කල්‍යාණිය ගෝතමිය ගේ ලේලිය වූවා ය. ඇය ඉතාමත් රූමත් වූ හෙයින් රූප නන්දා නමින් ද පතළ වූවා ය. නන්ද කුමරු පැවිදි වූ දින පටන් ඕ මෙසේ සිතුවා ය. "වැඩිමල් සොහොයුරු සිදුහත් පැවිදි වී සම්මා සම්බුදු පදවි ලද්දේ ය. ඔහු ගේ පුත් රාහුල ද පැවිදි වූයේ ය. මගේ සැමියා වූ නන්ද ද පැවිදිව සිටියි. මගේ මව වූ ප්‍රජාපති ගෝතමිය ද පැවිදි වූවා ය. මම පමණක් ගිහිගෙහි තනි වූයෙමි." එසේ සිතමින් සිට ඕ තොමෝ ද පැවිදි වූවා ය.

පැවිදි වුවද තමන් ඉතා රූමත් බව ඇයට අමතක කළ නො හැකි විය. කිසි ම භික්ෂුණියක් ඇය තරම් රූමත් නො විය. තමන් රූමත් වීම ගැන ඇය තුළ එක්තරා අභිමානයක් ද තිබිණ. බුදුරදුන් රූපයෙහි ආදීනව දේශනා කරන බව අසා සිටි ඕ "මා බණ අසන්නට ගිය හොත් මා ද මහළුව රූපශ්‍රීය නැසී ගොස් ජරපත්වන බව උන්වහන්සේ වදාරන්නට ඉඩ තිබේ. එවිට අනිකුත් භික්ෂුණීන් මා දෙස බලමින් සිනාසෙන්නටත් ඉඩ ඇත"යි සිතමින් කිසි දිනක ධර්ම ශ්‍රවණයට නො ගියා ය.

එහෙත් දිනපතා බණ අසන්නට යන අනිකුත් භික්ෂුණීහු දහම් අසා අවුත් දම් දෙසුම්වල වූ කරුණු ගැන කතා කරති. ඒ අසත් අසත් ම බණ අසන්නට ඇය තුළ ද ආශාවක් වර්ධනය විය. එහෙයින් දිනක් රූප නන්දා "මමත් බණ අසන්නට එමි" යි කියා පිරිස සමඟ යන්නට කැමති වූවා ය.

කෙසේ වුව ද තමා නෙතට ලක් වුව හොත් බුදුන් වහන්සේ තමා ම ඉලක්ක කොට රූපයෙහි ආදීනව ඇතුළත් බණක් කියන්නටත් ඉඩ ඇතැයි සිතූ රූප නන්දා අනිකුත් භික්ෂුණීන්ට මුවා වී පසු පෙළක හිඳ ගත්තා ය. එහෙත් බුදු රජාණන් වහන්සේ ඇය ගේ පැමිණීම කල් තබා ම දිවැසින් දැක තිබිණි. එහෙයින් කටුවක් ගලවන්නට කටුවක් ම යොදා ගන්නා පරිද්දෙන් රූප නන්දාට ගැලපෙන උපක්‍රමයක් යොදා ඇය ගේ රූප මදය දුරලන්නට සිතූ හ. සොළොස් හැවිරිදි රූමතියක් තම ඍද්ධි බලයෙන් මවා ඇය තමන්ට පවන් සලමින් සිටින සේ පෙනෙන්නට සැලැස් වූ උන්වහන්සේ එම දර්ශනය නන්දාට මිස අන් අයට නො පෙනෙන පරිදි අධිෂ්ඨාන කළ හ.

ඒ දුටු රූප නන්දා "මේ රන්වන් සුරූපී යුවතිය හා සසඳා බලන විට මම කුමන විධියකටවත් ඇය තරම් ප්‍රියංකර නො වන්නෙමි" යි මානය හැර ඒ රුව දෙස ම ආශාවෙන් බලා සිටියා ය. ඇය ඒ රුවෙහි බැඳුණු බව දත් තථාගතයන් වහන්සේ ඒ රුව ක්‍රමයෙන් යෞවන වියෙන් මැදි වියට ද එයින් මහළු වියට ද මාරුවන සේ ඍද්ධිමය අධිෂ්ඨානයක් කළ හ. අනුක්‍රමයෙන් මහළු වියට පත් රුව අවසන ගිලන්ව දුබලව හැරමිටි වාරුවට ද පත්ව ඉතා විරූපව අන්තිමේ මැරී වැටුණා ය. මළ සිරුර ද කුණු වී සැරව ගලමින් පිළිකුල් තත්ත්වයට පත්වනු රූප නන්දාට දක්නට ලැබිණ.

මේ සියල්ල බලා සිටි රූප නන්දා "ඒ අතිශය සුන්දර වූ රම්‍ය යෞවනිය ක්‍රමයෙන් වියපත්ව රෝගාතුරව ජරපත්ව මිය ගියා සේ යම් දිනක මට ද ඒ සියල්ලට යටත් වන්නට වෙයි. මා ඇස් ඉදිරිපිට සිදු වූ එම පරිවර්තනය ලොව කාටත් අත්වන ඉරණමයි. මම ද එයින් නො මිදුණෙමි"යි ආවර්ජනය කළා ය. ඇය සිතන සිතුවිලි වලට ගැලපෙන පරිදි බුදුරජාණන් වහන්සේ අනිත්‍යය, දුක හා අනාත්මය පිළිබඳව තම දම් දෙසුම යොමු කළ හ. දහම් අසා සිටි රූප නන්දා සෝවාන් ඵලයට පත් වූවා ය.

### විවරණාත්මක අනුවාදය (150 ගාථාව)

**මංසලොහිතලෙපනං නගරං අට්ඨීනං කතං යත්ථ ජරාච**
**මච්චූ ච මානෝ ච මක්ඛෝ ච ඔහිතෝ අට්ඨීනං**

**මංසලොහිතලෙපනං**: මස් හා ලේ ගල්වන ලද; **නගරං**: නගරයක් (කොටු ගෙයක්); **අට්ඨීනං**: ඇට වලින්; **කතං**: කරන ලදී; කෙබඳු වූ ද යත්; **යත්ථ**: යම් තැනක; **ජරාච**: මහළු බව ද; **මච්චූ ච**: මරණය ද; **මානෝ ච**: මානය ද; **මක්ඛෝ ච**: ගුණමකු බවද; **ඔහිතො**: තැන්පත් කරන ලද ද. (එබඳු කොටු ගෙයක් ය)

මේ ශරීරය ඇට සැකිල්ලක් ලෙස තනා මස් ලේ පුරවා සකස් කරන ලද නගරයකි. එහි ජරාව, මරණය මෙන් ම මානය සහ ගුණමකු කමද නිදන් කර තිබේ.

### විවරණය

**මක්ඛො**: නම් ගුණමකු බවය. තමාට කරන ලද උදව් උපකාර ආදිය අමතක කර අන්‍යයන් ගේ ගුණ සඟවා ඔවුන් ගේ අගුණ කතා කිරීම මෙහි ස්වභාවයයි. අනුන් ගේ කවර තරම් උසස් ගුණයක් ඇතත් එය සඟවා කතා කිරීම 'ගුණ-මකු' බවයි. බොහෝ ගිහි-පැවිද්දෝ මේ දුර්ගුණයෙන් සමන්විත වෙති. එහෙයින් මෙය පොදු මානුෂික දුර්වලතාවයක් ලෙස ද හැඳින්විය හැක.





*ඉතා විසිතුරු වැ සැදුන රජුන් ගේ මගුල් රථය ද සිරුර දිර ද යි එහෙත් (නව ලොවුතුරු) දහම නො දිර යි.*

151. ජීරන්ති වෙ රාජරථා සුචිත්තා
අථො සරීරම්පි ජරං උපෙති
සතඤ්ච ධම්මො න ජරං උපෙති
සන්තො හවේ සබ්භි පවෙදයන්ති (11:6)

හැඩ වැඩ කළ රාජ රථත් යම් දවසක දිරා යතී
දිරා යාම ඒ විලසට වෙයි කාගෙත් ගතේ ගතී
සදහම් උතුමන් වදහළ කිසිකල ජරපත් නො වෙතී
ශාන්ත උතුමෝ යහපත් අය වෙත සදහම් දෙසතී

# කිසි කල නො දිරන - සුමිහිරි බුදු බණ

## 11 (6) මල්ලිකා දේවිය ගේ පුවත (151 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **මල්ලිකා දේවිය** ඇරබ පසේනදී කොසොල් රජතුමාට මේ ගාථාව දේශනා කළ සේක.

දිනක් මල්ලිකා දේවිය මුව සෝදනු පිණිස නාන කොටුවට ගොස් පිරිසිදු වන අතර තුර රජ ගෙදර සුරතලයට හැදෙන බල්ලෙක් එහි පිවිසියේ ය. දේවිය පා පිරිසිදු කරන විට එම සුනඛයා ඇය හා අස්වාභාවික හැසිරීමක යෙදෙන්නට තැත් කළේය. දේවිය ද එය එතරම් වරදක් සේ නො සිතා ඊට ඉඩදී සිටියා ය. එහෙත් රජතුමා උඩු මහලේ සිට බිම බලන විට නාන කොටුවෙහි සිදු වූ මේ සිද්ධිය දැක විස්මයට පත්ව දේවිය උඩු මහලට ආ පසු ඒ ගැන ප්‍රශ්න කළේය. දේවිය ලජ්ජාව නිසා එවැන්නක් සිදු නො වූ බව කීවද රජතුමා මා සියැසින් දුටු දේ ප්‍රතික්ෂෙප කරතියි අමනාපයට පත් විය. දේවිය ද තම බසම සැබෑ කරනු රිසිව "මේ කාමරයේ පිහිටීම කිසියම් අද්භූත පිහිටීමකි. මෙහි සිට නාන කොටුව දෙස බලන විට එබඳු අරුම පුදුම දර්ශන පෙනේ. ඔබතුමා දැන් නාන කොටුවට ගිය හොත් මටත් එබඳු දේ පෙනේ" යි පැවසුවා ය. රජතුමා ඒ අනුව නාන කොටුවට ගියේ ය. ඔහු නැවත ආ පසු "දේවයන් වහන්ස ඔබ තුමා එළු දෙනක සමග අස්වාභාවික හැසිරීමක යෙදෙනු මම මෙහි සිට දුටුවෙමි" යි කීවා ය. රජතුමා ඒ අනුව දේවිය කී දේ සැබෑයයි පිළි ගෙන ඇය එබන්දක් නො කළ බව පිළිගත්තා ය.

රජතුමා සංසුන් කළ ද තමා විසින් කරන ලද්දේ බරපතල වරදක් බව සිතමින් මල්ලිකා දේවිය තැවුණාය. එම පාපය මැකී යනු වස් ඕ තොමෝ රජතුමා ගේ අසදෘශ දානමය පුණ්‍ය කර්‍මයේ දී බෙහෙවින් වෙහෙසව ක්‍රියා කළා ය. ඇය ඉන් මහා පුණ්‍යානුභාවයක් රැස් කර ගත්තාය. එතකුදු වුවත් ඇයට මරණ මොහොත් දී තම පුණ්‍ය කර්‍ම වෙනුවට සිහියට නැගුණේ මේ කුඩා අකුශල කර්‍මයය. එහෙයින් ඕ තොමෝ මිය ගොස් නිරයෙහි උපන්නා ය.

රජතුමා මල්ලිකා දේවියට ඉතා දැඩි සෙනෙහසින් සිටි හෙයින් ඇය උපන් තැන දැන ගැනීමේ කුතුහලයක් ඔහු තුළ තිබිණ. එය බුදු රජාණන් වහන්සේ ගෙන් අසා දැන ගැනීම පිණිස හෙතෙම විහාරස්ථානයට පැමිණියේ ය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ සිතූ හ. "මල්ලිකා නිරයෙහි උපන් බව දැනගතහොත් රජතුමා බලවත් සංවේගයට පැමිණ එතරම් පින් කළ මල්ලිකාත් නිරයෙහි උපන්නේ නම් පුණ්‍ය කර්ම කිරීමෙහි කිසි ප්‍රයෝජනයක් නැතැයි සිතා මිථ්‍යාදෘෂ්ටි ගෙන බොහෝ පව් කර ගනියි. එය ඔහුට මහා අලාභයක් වනු ඇත. එහෙයින් ඒ ගැන අසන්නට ඔහුට අමතක වන්නේ නම් යහපති" බුදුරදුන්ගේ අධිෂ්ඨානය අනුවම රජතුමාට ඒ ගැන විමසීමට අමතක විය. රජතුමා දින ගණනාවක් ම ඒ ගැනම විමසන්නට පැමිණිය ද බුදුරදුන්ගේ අධිෂ්ඨානය පරිදි එය දිගට ම අමතක විය.

සත් දිනකට පසු මල්ලිකා දේවියගේ අකුශලය ඉතා සුළු හෙයින් ඕ තොමෝ නිරයෙන් මිදී තුසිත දෙව් ලොව උපන්නා ය. ඒ අනුව භාග්‍යවතුන් වහන්සේ තම අධිෂ්ඨානය ලිහිල් කළෙන් එදින රජතුමා දන් පිළි ගැන්වීමෙන් අනතුරුව මල්ලිකා දේවිය ගේ පුනර්ජන්මය ගැන විමසා සිටියේ ය. "මහරජ, ඔබ ගේ දේවිය තුසිත දිව්‍ය ලෝකයෙහි ඉපිද සිටින්නීය" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ හ. "මල්ලිකාත් දෙව් ලොව නූපදින්නේ නම් කවුරු එහි උපදිත් ද? " රජතුමා  සතුටෙන් ප්‍රකාශ කළේ ය. එහෙත් "මල්ලිකා ඉතා සෙනෙහැති බිරිඳක් වූවා ය. මට ඇය ගේ වියෝගය ඉවසා දරා ගත නො හැකිය" යි හෙතෙම බලවත් ශෝකය ද ප්‍රකාශ කළේ ය. එදින භාග්‍යවතුන් වහන්සේ රජතුමා ගේ දානය පිළිගත්තේ මාලිගයෙහි පා මුල රාජ රථ නවතා තබන ස්ථානයේ ය. එහි රජ පරපුරේ ආදි පුරුෂයන් ගේ රාජ රථ කෞතුක වස්තු වශයෙන් තැන්පත් කර තිබින. භාග්‍යවතුන් වහන්සේ ඒවා එකින් එක ගැන ප්‍රශ්න කරමින් "මහරජ, ඔබ ගේ මුතුන් මිත්තෝ මේ රථ රැගෙන නො ගිය හ. දැන් ඒවා දෙස බලන්න. එකින් එක ටික ටික දිරා පත් වෙනවා නො වේ ද? අතිශයින් විසිතුරුව සාදන ලද මේ අනර්ඝ රථ දිරා පත්වන පරිද්දෙන් සියළු දේ දිරාපත් වේ. අප ගේ ශරීරද දිරා පත් වේ. දිරාපත් නොවන එකම දේ නම් ධර්‍මය පමණි"යි ධර්ම දේශනා කළ සේක.

### විවරණාත්මක අනුවාදය (151 ගාථාව)

**සුචිත්තා රාජරථා වෙ ජීරන්ති අථො සරීරං අපි ජරං උපෙති සතං ධම්මො ච ජරං න උපෙති සන්තො සබ්භි හවෙ පවෙදයන්ති**

**සුචිත්තා**ඃ විචිත්‍ර වූ; **රාජරථා**ඃ රාජකීය වාහන; **වෙ**ඃ ඒකාන්තයෙන්; **ජීරන්ති**ඃ දිරායති; **අථො**ඃ එසේ ම; **සරීරං අපි**ඃ ශරීරය ද; **ජරං උපෙති**ඃ ජරාවට යයි; **සතං ධම්මො**ඃ සත් පුරුෂයන් ගේ ධර්මය; **ච**ඃ වනාහි; **ජරං න උපෙති**ඃ දිරාපත් නො වන්නේ ය; **සන්තො**ඃ ශාන්ත වූවෝ; **සබ්භි**ඃ සත් පුරුෂයන් සමග; **හවෙ**ඃ ඒකාන්තයෙන්; **පවෙදයන්ති**ඃ මෙසේ ප්‍රකාශ කෙරෙති.

ඉතා විසිතුරු ලෙස නිර්මාණය කළ රාජකීය රථ වුව ද දිරා යයි. අප විසින් මනාව රැක ගනු ලබන ශරීරය ද එසේම දිරා යයි. එහෙත් සත් පුරුෂයන් ගේ ධර්‍මය එසේ දිරා නොයයි. සත් පුරුෂයෝ සත් පුරුෂයන් සමග ධර්‍ම සංවාදයෙහි යෙදෙති.

### විවරණය

කවර දේ දිරාපත්ව ගිය ද බුද්ධාදී ආර්‍යයන් වහන්සේලා ගේ ධර්මය දිරාපත් නො වන්නේ ය. උන් වහන්සේලා උපන්නත් නැතත් ලෝක ස්වභාවය පිළිබඳ සත්‍යය ලොව කවදත් පවතියි. එය බුද්ධාදී උත්තමයෝ ප්‍රත්‍යක්‍ෂ කර ගෙන දේශනා කරති. ලොව ඇති තත්ත්වය එසේ ප්‍රත්‍යක්‍ෂ කර ගෙන දේශනා කරනු මිස අළුතෙන් ප්‍රබන්ධ කර ගොතා දේශනා කරන්නක් නොවන හෙයින් එම ධර්මය දිරාපත් වීමක්, යල් පැනීමක්, බොරු වීමක් නැත.



*ඇසූ පිරූ තැන් නැත්තා ගොනකු මෙන් මසින් තරවැ වැඩුණත් නුවණින් නම් නො වැඩේ.*

152. අප්පස්සුතා'යං පුරිසො
බලිවද්දෝ'ව ජීරති
මංසානි තස්ස වඩ්ඪන්ති
පඤ්ඤා තස්ස න වඩ්ඪති (11:7)

උගත් දෙයක් නැති මිනිසා
ගොනෙක් වගේ යයි වයසට
සිරුරේ මස් වැඩෙන නමුත්
නුවණ ඔහු ගෙ වැඩී නොයත්

# මසින් වැඩේ - නැණ නො වැඩේ.

## 11 (7) ලාලුදායි තෙරුන් ගේ වස්තුව (152 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **ලාලුදායි** නම් වූ නුවණ මඳ තෙර නමක් ඇරබ මේ ගාථාව දේශනා කළ සේක.

මේ ලාලුදායි තෙරුන් වහන්සේ ස්ථානෝචිත ප්‍රඥාවෙන් තොර වූ හෙයින් තැනට ගැලපෙන ලෙස බණ කියන්නට නො දත් හ. මිනිසුන් මංගල උත්සව පවත්වන තැන බණ කියන්නට අවමංගල අවස්ථාවල කිවයුතු ගාථා තෝරා ගනියි. අවමංගල අවස්ථාවලට ගොස් මංගල උත්සව වල කිව යුතු බණක් කියයි. ඒ තැන් වලදී උන්වහන්සේ ගේ මේ අඥාන කථා නිසා ඒ හා වඩින අනිකුත් හිමිවරු මහත් අපහසුවකට පත් වෙති. මේ නිසා භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ හමුවට ගොස් "ස්වාමීනි, මේ ලාලුදායි භික්ෂුව මංගල්‍ය අවස්ථාවලට ගොස් අවමංගල්‍යයට උචිත දේශනයක් කරයි. අවමංගල්‍ය අවස්ථාවලට ගොස් මංගල්‍ය අවස්ථාවකට උචිත බණක් කියයි. තැනට ගැලපෙන දේශනයක් කරන්නට නො දනී නම් ඒ තැන්වලට නො ගොස් සිටීම වඩා උචිත නො වේ ද?" යි කියා සිටිය හ.

භාග්‍යවතුන් වහන්සේ ඒ අසා "මහණෙනි, මේ ලාලුදායි දැන් පමණක් නොව පෙර ජන්මයක පවා වැරදි තැන වැරදි දේ කතා කළේ ය"යි වදාරා පෙර ජන්මයක වූ සිද්ධියක් හෙළි කර වදාළ හ. පෙර ජන්මයෙක අග්ගිදත්ත නමින් ඉපිද සිටි මොහුට හේමදත්ත නම් පුතෙක් සිටියේ ය. පියා දුප්පත් වුව ද, තම උගත්කම අනුව හෙතෙම රාජ කුළුපගව සිටියේ ය. වරක් අග්ගිදත්ත ගේ ගොන් බානෙන් එක් ගොනෙක් මිය ගියේය. "පුත ඔබ රාජ කුළුපග හෙයින් මට රජතුමාගෙන් ගොනෙක් ඉල්වා දෙනු මැනව" යි හේ පුතා ගෙන් ඉල්ලා සිටියේ ය. රජතුමා ගෙන් තමා ඉල්ලා සිටිය හොත් එය තමාට ලජ්ජාවක් වෙතියි සිතා පියාට කවියක් ඉතා අමාරුවෙන් උගන්වා ගෙන රජ වාසලදී කියන්නට සැලසුම් කළේය

කුඹුරු වැඩට ගන්න නිතින්
සිටියා මට බානක් ගොන්
එකෙක් මලා නිරිඳුනි ඉන්
දෙන්න එකෙක් කරුණා වෙන්

එහෙත් නුගත් ගැමියකු වූ පියාට රාජ සභාවේ දී කියන්නට ගිය කවිය වැරදුණේ ය. "දෙන්න එකෙක් කරුණාවෙන්" වෙනුවට "ගන්න එකෙක් කරුණාවෙන්" යි කියවුණේ ය. ඔහු ලවා එය දෙතුන් වතාවක් කියවූව ද හැම වතාවේ ම වැරැද්දුවේ ය.

කරුණු තේරුම්ගත් රජතුමා "හේමදත්තලාට හුගක් හරක් ඉන්නවා වගෙයි" කියා ඔහුට ගවයෙක් ලබා දුන්නේ ය. මේ කතාව වදාළ භාග්‍යවතුන් වහන්සේ "ලාලුදායි එදත් අනුවණයෙකි. අදක්ෂයෙකි. අදත් එසේම ය" යි මේ ගාථාව ද වදාළ සේක.

### විවරණාත්මක අනුවාදය (152 ගාථාව)

**අයං අප්පස්සුතො පුරිසො බලිවද්දෝ ඉව ජීරති තස්ස මංසානි වඩ්ඪන්ති තස්ස පඤ්ඤා න වඩ්ඪති.**

**අප්පස්සුතො**: අල්පශ්‍රැත; **අයං පුරිසො**: මේ පුරුෂ තෙම; **බලිවද්දෝ ඉව**: ගොනකු මෙන්; **ජීරති**: වැඩෙයි; **තස්ස**: ඔහු ගේ; **මංසානි**: මස්; **වඩ්ඪන්ති**: වැඩෙයි; **තස්ස**: ඔහු ගේ; **පඤ්ඤා**: ප්‍රඥාව; **න වඩ්ඪති**: නො වැඩෙයි.

අල්පශ්‍රැත වූ මේ පුරුෂ තෙම ගොනෙකු මෙන් වැඩෙන්නේ ය. ඔහු ගේ ශරීරමාංශයෝ වැඩෙන්නා හ. ලෞකික ලෝකොත්තර ප්‍රඥාව නම් නො වැඩෙයි.

### විවරණය

**අප්පස්සුතො**: වැඩි ඉගෙනුමක් නැති, සුත යන්නේ නියම අර්ථය 'අසා ඇති' යන්නයි. පැරණි යුගයේ අධ්‍යාපනය මුළුමනින් ම රඳා පැවැත්තේ ශ්‍රව්‍ය මාධ්‍යය මත හෙයින් උගතා බහුශ්‍රැත සේ ද නූගතා අල්පශ්‍රැත සේ ද හඳුන්වන ලදී.

**පඤ්ඤා**: නුවණ, ප්‍රඥාව. බුදු සමයෙහි දී පඤ්ඤා යන්න හුදෙක් විෂය කරුණු දැනුමට වඩා ගැඹුරු සංකල්පයක් ලෙස ඉදිරිපත් වෙයි. යමකු පත පොතින් හා ගුරු මුවින් කරුණු අසා ගෙන කට පාඩම් කළ පමණින් ප්‍රඥාවන්තයකු බවට පත් නො වේ. 'පරතොඝොප' හෙවත් අනුන්ගෙන් ඉගැන්ම ප්‍රඥාවන්ත වීමේ එක් මාවතක් පමණි. ඒ හා සම 'යොනිසො මනසිකාර' හෙවත් තර්කානුකූල චින්තනය ද එක් විය යුතුය. මේ දෙක්හි ක්‍රියාකාරිත්වය මගින් අපට යථා භූත ඥානය ලබා ගත හැකිය.

අප ලබන ඥානය ත්‍රිවිධ බව බෞද්ධ ඉගැන්වීම් වල දක්වා තිබේ. එනම්;

1. **සුතමය ඥානය**: සුතමය ඥාන නම් ඉගෙනුම මගින් ලබන දැනුමයි.

2. **චින්තාමය ඥානය**: චින්තාමය ඥානය නම්, ස්වාධීන චින්තා ක්‍රියාකාරිත්වය මගින් ලබන දැනුමයි.

3. **භාවනාමය ඥානය**: භාවනාමය ඥානය නම් භාවනා මගින් ලබන උසස් හා ගැඹුරු අත්දැකීම් පදනම් කරගෙන ලබන දර්ශනයයි.

තුන් වැන්න වූ භාවනාමය ඥානය මුල් ඥාන දෙකට වඩා වැදගත් බව දැක්වෙයි. එය අප තුළින් ම ගැඹුරු ස්ව - ප්‍රත්‍යක්ෂතාවක් වශයෙන් උද්ගත වන්නක් හෙයිනි. ත්‍රිවිධ ශික්ෂාවෙහි එක් ශික්ෂාවක් වන ප්‍රඥාව එහි උපරිම සාධන හා බැඳේ. පාරමිතාවක් ද වන ප්‍රඥාව බුදු සමයෙහි විමුක්තිය ලැබීම සමග සම්බන්ධ වෙයි.





*ගෙවල් හදන්නා සොයමින් - සංසාරේ සැරි සරමින්*

153. අනෙකජාති සංසාරං
සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවේසන්තෝ
දුක්ඛා ජාති පුනප්පුනං (11:8)

ඉපදි ඉපදි සංසාරේ
සෙවූ නමුත් නෙකවාරේ
නැත වඩුවා හමු වූයේ
දුකයි උපත සංසාරේ

# ගෙවල් හදන්නා - කවුද සොයන්නා

## 11 (8) බුදුරදුන් ගේ ප්‍රථම උදානය (153 - 154 ගාථා)

සය අවුරුදු දුෂ්කර ක්‍රියාවෙන් පසු අත්තකිලමථානු යෝගය නිෂ්ඵල බව වටහාගත් **බෝසතාණන් වහන්සේ** මැදුම් පිළිවෙත ප්‍රගුණ කළ හ. සුජාතාවන් ගේ කිරි පිඩු දානය වළඳ සොත්ථිය බමුණා දුන් කුස තණ මිටි අට ද රැගෙන ජයසිරි මහ බෝ මැඩට වැඩම කළ උන් වහන්සේ තණ මිටි මත පළක් බැඳ වැඩ හුන් හ. එය උන්වහන්සේ ගේ කුසල මහිමයෙන් අපරාජිත වජ්‍රාසනය බවට පත් විය.

"මගේ ශරීරයෙහි සියළු ලේ මස් වියැලී ගොස් සමෙන් වැසුණු ඇටසැකිල්ලක් පමණක් ඉතිරි වුවත් බුදු වී මිස මෙතැනින් නො නැගිටිමි" යි වැඩ හුන් උන් වහන්සේ මාර යුද්ධයෙන් ජය ලබා සව් කෙළෙසුන් නසා සම්මා සම්බෝධිය ලබා ගත් සේක.

රැයෙහි ප්‍රථම යාමයේ දී පෙර විසූ කඳ පිළිවෙල දක්නා නුවණ ද මධ්‍යම යාමයේ දී දිබ්බ චක්ඛු හෙවත් දිවැස් නුවණ ද, අළුයම් වේලෙහි ආසවක්ඛය ඥාණය ද ලබා ගත් සේක.

අනතුරුව සම්මා සම්බෝධිය ලැබීමෙන් තමන් වහන්සේ තුළ ඇති වූ ප්‍රීතිය හේතුවෙන් මෙම ගාථා ද්වය උදාන වශයෙන් ප්‍රකාශ කළ සේක.

**විවරණාත්මක අනුවාදය (153 ගාථාව)**

**පුනප්පුනං ජාති දුක්ඛා ගහකාරකං ගවේසන්තෝ**
**අනෙකජාතිසංසාරං අනිබ්බිසං සන්ධාවිස්සං**

**පුනප්පුනං**: නැවත නැවත; **ජාති**: ඉපදීම; **දුක්ඛා**: (යම් හෙයකින්) දුක් ද; (එහෙයින්) **ගහකාරකං**: (ආත්ම නැමැති) ගෙය සාදන වඩුවා; **ගවේසන්තෝ**: සොයමින්,(මම); **අනෙකජාතිසංසාරං**: නොයෙක් ජාතියයි කියූ සසරෙහි; **අනිබ්බිසං**: (ගෘහකාරකයා දන්නා මාර්ගඥානය) සොයාගත නො හැකිව; **සන්ධාවිස්සං**: සැරිසරා ඇවිද්දෙමි.

ශරීරය නමැති ගෙය නිර්මාණය කරන කාර්මිකයා සොයමින්, ඔහු සොයාගත නො හැකිව මේ සසරෙහි විවිධ ජාතිවල උපදිමින් සංචාරය කළෙමි. නැවත නැවත ඉපදීම දුකකි.

**විවරණය**

භාග්‍යවතුන් වහන්සේ විසින් සම්බුද්ධත්වය ලත් ප්‍රථම උදෑසන කළ මෙම උදානය බුද්ධත්වය පිළිබඳ යථාතත්වය මනරම් උපමාවක් ද සහිතව කදිමට හකුළුවා දක්වයි. උන්වහන්සේ ලද ආධ්‍යාත්මික ශාන්තිය ඉන් ලද ප්‍රබෝධජනක ආස්වාදය මෙහි මනාව ධ්වනිත ය. දිගු කාලීන සංසාර සංචරණයකින් පසු මේ අන්තිම භවයේ දී උන්වහන්සේ විසින් මෙතෙක් සොයාගත නො හැකි වූ සංසාර කාරකයා සොයා ගන්නා ලදී, බැහැර සිට නොව තමා තුළම සිට එම තෘෂ්ණා නැමැති මැවුම්කරු උන්වහන්සේට හමු විය. තමන් තුළම පවත්නා පැවැත්ම කෙරේ වන ආශාව - භව තෘෂ්ණාව මෙම නිර්මාතෘ වරයාය. තමන් විසින් ම නිර්මාණය කරන ලද දේ අවසන් කළ හැක්කේ ද තමන්ට ම ය.

ගෘහ කාරකයා ගේ උපකරණ සියල්ල බිඳ දැමූ හෙයින් යළි ගෙයක් හදන්නට බැරි බව කියා ඇත්තේ නිවන් සුව ලද බව විස්තර කරනු පිණිස ය. නිවන් සුව ලබන්නට බෝසතුන් පෙළැඹුණේ නැවත නැවත සසර ඉපැදීම දුකක් හෙයිනි. බුදු සමය විෂයෙහි පුනර්භව සංකල්පය කේන්ද්‍රියයැයි පැවසිය හැක්කේ මේ නිසාය. පුනර්භවයක් නො මැති නම් සංසාරයක් ද නැත. සංසාරයක් නොමැති නම් කළකිරෙන්නට, අතහරින්නට හෝ නිවාලන්නට දෙයක් නො මැති හෙයින් නිර්වාණයක අවශ්‍යතාවක් නො මැත.

එවිට බෞද්ධ චින්තනයේ ස්ථාවරය මුළුමනින් ම බිඳ වැටෙයි. එහෙයින් පුනර්භවය බෞද්ධ චින්තනයේ අතිශයින් ම වැදගත් මූලික පිළිගැනීමක් වෙයි. එය පවත්නා බව පිළිගත් පසු ප්‍රායෝගික අභියෝගය වන්නේ එය නැති කර දැමීම ය.





*නැවත අත්බැව් නමැති ගෙය නො කරන සේ සියලු උපකරණ (කෙළෙස්) බිඳ දමා නිවන් පසක් කිරීම.*

154. ගහකාරක දිට්ඨො'සි
පුන ගෙහං න කාහසි
සබ්බා තේ ඵාසුකා භග්ගා
ගහකූටං විසඞ්ඛිතං
විසඞ්ඛාරගතං චිත්තං
තණ්හානං ඛයමජ්ඣගා (11:9)

වඩුවාණෙනි, ඔබ පෙනුණා
නැවත ගෙයක් නො හදන්නා
පරාල ටික බිඳ දැම්මා
කැණි මඬලත් බිම දැම්මා
සිත නිදහස් කර ගත්තා
තණ්හාවත් ඉවර කළා

# ගෙවල් හදන බඩු - සේරම කුඩු කුඩු
## 11 (8) බුදුරදුන් ගේ ප්‍රථම උදානය (153 සහ 154 ගාථා)

**විවරණාත්මක අනුවාදය (154 ගාථාව)**

**ගහකාරක දිට්ඨෝ අසි පුන ගෙහං න කාහසි තෙ**
**සබ්බා ඵාසුකා භග්ගා ගහකූටං විසඞ්ඛිතං චිත්තං**
**විසඞ්ඛාරගතං තණ්හානං ඛයං අජ්ඣගා**

**ගහකාරක**: (ආත්ම නැමැති) ගෙය සාදන වඩුව; **දිට්ඨෝ අසි**: (මවිසින් ඔබ) දක්නා ලද්දෙහි; **පුන** : නැවත,(මට); **ගෙහං**: (ආත්ම නැමැති) ගෙයක්; **න කාහසි**: නො සාදන්නෙහි ය; **තෙ**: ඔබ ගේ; **සබ්බා**: සියලු; **ඵාසුකා**: (කෙලෙස් නමැති) පරාල; **භග්ගා**: බිඳ දමන ලදි; **ගහකූටං**: ගෘහකූටය (කැණි මඬල); **විසඞ්ඛිතං**: (පළා) විසුරුවන ලදි; **චිත්තං**: (මාගේ) සිත; **විසඞ්ඛාරගතං**: නිවණට වන; **තණ්හානං ඛයං**: තෘෂ්ණාක්ෂයට හෙවත් අර්හත්ඵලයට; **අජ්ඣගා**: පැමිණියෙමි.

ආත්ම නැමැති ගෙය සාදන වඩුව, මවිසින් ඔබ දක්නා ලදි. ඔබ නැවත මට ගෙයක් නො සාදන්නෙහි ය. මම කෙලෙස් නමැති සියලු පරාල බිඳ දැමුවෙමි. කැණි මඬල විනාශ කළෙමි. මාගේ සිත නිවණට වැටහිණි. තෘෂ්ණාක්ෂයට හෙවත් අර්හත්ඵලයට මම පැමිණියේ වෙමි.

**විවරණය**

**තණ්හානං ඛය මජ්ඣගා**: නිර්වාණය ගැන නිර්වචන දක්වන විට තෘෂ්ණාව ක්‍ෂය කිරීම නිර්වාණය බව පැවසීම සුලබ ය. සසර නැවත නැවත ඉපදීමේ හේතුව තෘෂ්ණාව හෙයින් එය ක්‍ෂය කිරීම නිර්වාණය වෙයි.

සුමේධ තාපසව උපන් සමයෙහි බෝසතුන් මෙසේ සිතූ බව ජාතකට්ඨකථාවෙහි සඳහන් කර ඇත.

"දුකක් තිබේ නම් - සැපත් තිබිය යුතු
සසරක් ඇත්නම් - මිදුමක් විය යුතු

උණුසුම ඇත්නම් - සිසිලක් විය යුතු
තුන් ගිනි ඇති ලෙස - නිවණ තිබිය යුතු

නරක තිබෙන විට - හොඳත් තිබිය යුතු
තිබුණට සසරක් - එය නොපැතිය යුතු"

'**නිබ්බාණ**' යන පාලි වචනය (සිංහල හා සංස්කෘත භාෂා වලින් නිර්වාණ) නිර්මාණය වී ඇත්තේ 'නි' පූර්ව 'වාණ' යන්නෙනි. 'නි' යන නිෂේධනාර්ථයේ උපසර්ගයකි. 'වාණ' යන්නෙහි අරුත ගෙතීම හෙවත් තෘෂ්ණාව යන්නයි. මෙම තෘෂ්ණාව එක් ජන්මයක් හා තවත් ජන්මයක් අතර බන්ධනයක් සේ ක්‍රියා කරයි. 'වාණ' නම වූ තෘෂ්ණාවෙන් වෙන් වීම - ඉවත් වීම යන අරුතින් එයට 'නිබ්බාණ' යැයි කියනු ලැබේ.

යමකු තුළ තෘෂ්ණාව ඇති තාක් කල් ඔහු කර්ම රැස් කරයි. පුණ්‍ය හා පාප යන දෙවර්ගීය ම කර්ම ගණයට වැටෙයි. පැවැත්ම කෙරේ ආශාවක් ඇත්තෝ මතු ජන්මයන් සඳහා කර්ම එක් රැස් කරති. තෘෂ්ණාව ක්‍ෂය කළ උතුමන් කර්ම රැස් නො කරන හෙයින් නිර්වාණයට 'කම්මක්ඛය' යන වචනය ද යෙදිය හැක.

නිර්වාණය ලෝභ, දෝස හා මෝහ යන ත්‍රිවිධ ක්ලේශයන් මූලෝත්පාටනය වශයෙන් ද හඳුන්වනු ලැබේ. මේ ලෝභ, දෝස හා මෝහ ගිනි වශයෙන් හඳුන්වා ඇත. වරක් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ හ. "මහණෙනි, ලෝකය ගින්නෙන් දැවෙයි. කවර ගිනි වලින් ද මහණෙනි, රාග ගින්නෙන් දැවෙයි, ද්වේෂ ගින්නෙන් දැවෙයි, මෝහ ගින්නෙන් දැවෙයි. ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දොමනස්ස, උපායාස, ගිනි වලින් දැවෙයි. මේ ගිනි නිවීම 'නිබ්බාන' වශයෙන් දැක්වේ. මේ ගිනි නිවීම ම නිවනයි."

නිර්වාණය ශූන්‍ය ධර්මයක් ද නැද්ද යන්න බොහෝ උගතුන් වාද විවාද කරන ගැටළුවකි. පැරණි බෞද්ධ පොත්වල නිර්වාණය 'සුඤ්ඤතා' වශයෙන් හඳුන්වා තිබෙන බව මෙහි දී සැලකිල්ලට ගත මනාය. පොදු ජන වහරෙහි 'ශූන්‍ය' යන වචනයෙන් කිසිවක් නැත යන්න අරුත ගැනෙයි. එහෙත් දාර්ශනික ව්‍යවහාරයෙහි ශූන්‍ය යන වචනය ඊට වඩා සියුම් අරුතකින් භාවිත වෙයි. දාර්ශනික වහරෙහි දී ආකාශය ද ශූන්‍ය ලෙස හැඳින් වේ. ආකාශ නම් කිසිම වස්තුවකින් තොර 'ඉඩකඩ' ය. එය නැතැයි කීම වැරදි ය. එය ශූන්‍ය වන්නේ වෙනත් වස්තූන් ගෙන් තොර නිසාය. නිර්වාණය ද ජාති, ජරා, මරණ, සංඛ්‍යාත සකල විධ දුක්ඛයන්ගෙන් ම තොර නිසා ශූන්‍ය ය. එහෙත් "නිවණක් නැත" යන වාක්‍යය වැරදි ය. නිවණ ඇත. ශූන්‍ය යන්නෙන් නැති දෙයක් යන අරුත නො ලැබේ.

මේ ගාථා දෙක අයත් වන්නේ බෞද්ධ සාහිත්‍යාංගයක් වූ උදාන ගණයට ය. නවංග සත්ථුසාසනයෙහි උදාන ගණයට ඇතුළත් ගාථා එක් රැස් කර ඇත්තේ ඛුද්දක නිකායට අයත් උදාන නම් ග්‍රන්ථයේ ය. එහි ද ඇතුළත් මේ ගාථා යුග්මය ධම්මපදයට ඇතුළත් වූයේ පසු කලෙක ආනන්ද ස්ථවිරයන් වහන්සේ ගේ විමසුමක් පරිදි උන්වහන්සේට කළ දේශනයක් හෙයිනි.



*යොවුන් වියැ කළයුතු දෑ නිසි සේ නො කළහු මහලු වයසට පැමිණ පසු තැවෙත්.*

155. අචරිත්වා බ්‍රහ්ම චරියං
අලද්ධා යොබ්බනෙ ධනං
ජිණ්ණකොඤ්චා ව ඣායන්ති
ඛීණ මච්ඡේ’ව පල්ලලෙ (11:10)

බඹසර හැසිරෙන්නේවත් - සම්පත් උපයන්නේ වත්
නැතිව නිකරුණේම වගේ
යොවුන් විය ගෙවා දැම්මොත්
නියං කලට මසුන් නැතිව
වේලුණු විල් තෙරකට පත්
කොස්වා ලිහිණියන් වගේ
අසරණයන් වී වැල පෙත්.

# මහළු වයස - ලබන අයස

## 11 (9) මහධන සිටු පුත්‍රයා ගේ කථාව (155 සහ 156 ගාථා)

ඉසිපතනයෙහි වැඩ සිටි සමයෙහි භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා දේශනා කර වදාළේ **මහධන සිටු පුතු** නිමිති කර ගෙන ය.

මහධන උපන්නේ බරණැස් නුවර අසූ කෝටියක් ධනය තිබුණු සිටු පවුලක ය. ඔහු ගේ මව සහ පියා මෙසේ කතා කර ගත් හ. "අපිට අසූ කෙළක් ධනය තියෙනවා. ඉතින් අපේ පුතාට තවත් සල්ලි හොයන්න ඕන වෙන්නේ නෑ. තියෙන දේ කාලා ඇඳලා සතුටෙන් ඉන්න පුළුවන්." ඒ නිසා ඔවුන් ඔහුට වෘත්තියක් සඳහා අදාළ කිසිවක් නුගන්වා සංගීතය හා ගායනය පමණක් ප්‍රගුණ කරවූ හ.

මේ නගරයේ ම අසූ කෙළක් ධනය තිබුණු තවත් සිටු පවුලක් විය. ඒ පවුලට සිටියේ දියණියක් පමණි. ඒ පවුලේ දෙමාපියෝ ද තමන්ට යස ඉසුරෙන් අඩුවක් නොවූ හෙයින් දියණියට අධ්‍යාපනයක් ලබා නොදුන් හ. ඇයට ගායනය හා රංගනය ප්‍රගුණ කරවූ හ. මේ පවුල් දෙක උනුනුන් දන්නා හෙයින් දරුවන් වැඩි විය පත් පසු ඔවුහු ඔවුන් විවාහ කරවූ හ.

දෙමාපියන් මිය ගිය පසු මේ යුවලට අසූ කෝටිය බැගින් වූ ධන සම්භාර දෙකකට හිමිකම් කීමේ භාග්‍යය උදා විය. ඔහු ගේ යස ඉසුරු දුටු නගරයේ සුරා ලෝලයෝ මෙතුමා බීමට පුරුදු කර ගත හොත් අපට ජය මඟුල් යැයි කතා කර ගෙන ඔහු ඊට නමා ගන්නට කුමන්ත්‍රණය කළ හ. ඒ අනුව දිනක් ඔවුහු මස් බැද, අල තම්බා ගෙන සුරා විත ඇතිව සිටුතුමා එන මඟ රැක සිට ඔහු එන විට ම මස් හා අල කමින් රා බොමින් "දීඝායු වේවා සිටුතුමනි, ඔබ තුමාට පින් සිදු වන්නට අපිත් කාලා බීලා විනෝදෙන් ඉන්නවා" යි හඬනඟා කී හ. "ඔවුන් මහත් විනෝදයෙන් බොන්නේ මොනවාදැ" යි සිටුතුමා තම සේවකයා ගෙන් විමසී ය. "සුරා වර්ගයකි" යි පිළිතුරු ලද හේ "එය මොන වගේ බීමක් දැ" යි විමසීය. "සිටුතුමනි, එය ඉතා කදිම බීමකි. බොනවා නම් බොන්න හොඳ රසවත් බීමකි" යි සේවක තෙම එය වර්ණනා කළේ ය. එසේ නම් මාත් එය පානය කළ යුතුයැයි කී හෙතෙම සුරා ගෙන්වා ගෙන පානය කළේ ය.

සුළුවෙන් පටන් ගත්තද හෙතෙම ක්‍රමයෙන් ඊට ඇබ්බැහි වී දිනපතා මහා පරිමාණයෙන් බීමට පුරුදු විය. ඒ දැනගත් නගරයේ සුරාධූර්තයෝ ක්‍රමයෙන් ඔහු හා මිතුරු වූ හ. සිටු වරයා ද ඔවුන් ගෙදරට ගෙන්වා ගෙන දිනපතා විශාල මුදලක් වැය කරමින් තමනුත් බී අනුන්ටත් සුරාවෙන් සංග්‍රහ කරන්නට පටන් ගත්තේය. දිනපතා ඔහුට අළුතෙන් සුරා ධූර්තයෝ එකතු වූහ.

සුරාපානයට පමණක් නොව මිළ මුදල් නාස්ති කිරීමට ද හෙතෙම පුරුදු විය. බීමත් වූ විට රන් කාසි ගොඩවල් දෙමින් සුවඳ විලවුන් ගෙනෙව, මල් ගෙනෙව, ආදී වශයෙන් මුදල් දෙයි. "මෙයා සූදුවට දක්ෂයි මෙයාට දාහක් දෙනවා. මෙයා නටන්න හපනා. මෙයාට දාහක් දෙනවා. මෙයා දක්ෂ වාදකයා. මෙයාට දෙදාහක් දෙනවා" ආදිය කියමින් මුදල් නාස්ති කිරීමට පුරුදු විය. අසූ කෙළක් ධනය ඉක්මනින් ම නාස්ති වී ගියේ ය. අනතුරුව බිරිඳ ගේ ධනය ද නාස්ති කර නිම කළේ ය. වියදමට මුදල් නැති තැන නිවසෙහි සියළු භාණ්ඩ විකුණමින් විනෝද වූ හේ අන්තිමේ සිටු මැදුර ද විකුණා දැම්මේ ය. එය මිළදී ගත්තෝ ඔහු මහ මඟට ඇද දැමූ හ. සුරා පානය සඳහාම එක් වූ හිත මිතුරෝ දැන් මොහුගෙන් පලක් නැතැයි ඔහු අමතක කර දැමූ හ.

**විවරණාත්මක අනුවාදය (155 ගාථාව)**

**යොබ්බනේ බ්‍රහ්මචරියං අචරිත්වා ධනං අලද්ධා ඛීන මච්ඡේ පල්ලලෙ ජිණ්ණකොඤ්චා ඉව ඣායන්ති**

**යොබ්බනේ**: යොවුන් වියේ දී; **බ්‍රහ්මචරියං**: බඹසර; **අචරිත්වා**: නො හැසිරී; **ධනං**: ධනය; **අලද්ධා**: නො උපයා; **ඛීන මච්ඡේ**: මසුන් නැති; **පල්ලලෙ**: විලක (මඩපිට හිඳ තැවෙන); **ජිණ්ණකොඤ්චා ඉව**: මහලු කොස්වා ලිහිණියන් මෙන්; **ඣායන්ති**: ශෝක කරති.

තරුණ වයසේ දී පැවිදිව බඹසරත් නො රැක, නූපන් භෝග උපදවන්නටත්, උපන් භෝග රක්නටත්, නිසි යොවුන් වියේදී ගොවිකම් වෙළඳකම් ආදිය කොට ධනයත් ලැබ නො ගෙන, ප්‍රමාදී වූ අඥානයෝ මසුන් නිම වූ දිය හිඳුනු පොකුණක බලා සිටින මහලු කොස්වා ලිහිණියකු මෙන් ශෝක කරයි.





*තරුණ කල පින් නොකළ අය කළ දෑ සිහිකොට මහලු කල සුසුම්ලමින් සොවින් හොවිත.*

156. අචරිත්වා බ්‍රහ්මචරියං
අලද්ධා යොබ්බනෙ ධනං
සෙන්ති චාපාතිඛීනා'ව
පුරාණානි අනුත්ථුනං (11:11)

බඹසර හැසිරෙන්නේවත් - සම්පත් උපයන්නේ වත්
නැතිව නිකරුණේම වගේ
යොවුන් විය ගෙවා දැම්මොත්
වැඩකට ගත නො හැකි පරණ
ඊතලයක් වගේ වෙමින්
වැළපෙති දුක් වෙති මහළුව
පෙර සම්පත් සිහි කරමින්

# අතීත සම්පත් - සිහිකර වැලපෙත්

## 11 (9) මහධන සිටු පත්‍රයා ගේ කථාව (155 සහ 156 ගාථා)

ජීවත් වන්නට ක්‍රමයක් නැති තැන සිටුවරයා සහ බිරිඳ කබලක් ද අතට ගෙන සිඟා කන්නට පටන් ගත් හ. අනුන් ගේ අගු පිල්වල නිදා ගන්නට සිදු විය. කුණු කූඩ වලට දමන ඉඳුල් බත් පවා කන්නට පුරුදු විය. ඉඳහිට හෙතෙම ආරාමයට ද ගොස් පාත්‍රවල ඉතිරිව ඉවත දමන ඉඳුල් බත් ඉල්ලා ගෙන අනුභව කරයි. දිනක් සාමණේර හිමිවරුන් විසින් ඉවත දමනු ලබන ඉතිරි බත් ඉල්ලා එකතු කර ගත්තා ඔහු දුටු භාග්‍යවතුන් වහන්සේට සිනා පහළ විය. ඒ දුටු ආනන්ද තෙරණුවෝ "භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ සිනා පහළ කළේ කවර හෙයින් දැ"යි විමසුයෙන් භාග්‍යවතුන් වහන්සේ මේ සිටුතුමා ගේ පූර්ව චර්යාව හා වර්තමාන චර්යාව ගැන ආනන්ද හිමියනට විස්තර කර වදාළ හ.

"ආනන්ද, මහධන සිටුවරයකු ගේ පුත්‍රයෙකි. ඔහු නාස්ති කළ ප්‍රමාණය එකසිය හැට කෝටියකි. දැන් තම බිරිඳ සමඟ මහ මග සිඟා යයි. මේ පුද්ගලයා තම තුරුණු වියේ දී නුවණින් වැඩ කොට ව්‍යාපාරික කටයුතු වල යෙදුණේ නම් ඔහුට මේ නගරයේ ප්‍රධාන සිටුවරයා වන්නට හැකියාව තිබිණ.

එසමයෙහි ඔහු පැවිදි වූයේ නම් රහත් වන්නට භාග්‍යය තිබිණි. ඔහු ගේ බිරිඳට ද අනාගාමී වන්නට හැකියාව තිබිණි. මැදි වියේ දී ඔහු ධනය නාස්ති නො කර ව්‍යාපාරික කටයුතු වල යෙදුනේ නම්, මේ නගරයේ දෙවන සිටාණන් වන්නට හැකියාව තිබුණේ ය. පැවිදි වූයේ නම් ඔහුට අනාගාමී ඵලයත් බිරිඳට සකෘදාගාමී ඵලයත් ලබන්නට හැකියාව තිබුණේය. ජීවිතයේ තුන්වන යාමයෙහි ඔහු ව්‍යාපාරික කටයුතු ගැන උනන්දු වී, නාස්තිකාර භාවයෙන් ඉවත්ව නුවණින් ක්‍රියා කළානම් නගරයේ තුන්වන සිටාණන් වන්නේ ඔහු ය. නො එසේව ඔහු පැවිදි වූවා නම්, ඔහුට සකෘදාගාමී ඵලයත් බිරිඳට සෝවාන් ඵලයත් හිමිවන්නේ ය. එහෙත් දැන් ඒ සියල්ල වරදවා ගෙන මහ මග හිඟා කන්නේ ය. අගාරික සම්පතින් මෙන්ම අනගාරික සම්පතින් ද පිරිහුනු ඔහු වියළී ගිය මසුන් නැති පොකුණක් අසළ සිටින කොස්වා ලිහිණියකු වැනිය. භාවිතයට ගත නොහැකිව ඉවත දැමූ ඊතලයක් වැනිය" යි වදාළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා යුග්මය ද වදාළහ.

### විවරණාත්මක අනුවාදය (156 ගාථාව)

**යොබ්බනෙ බ්‍රහ්මචරියං අචරිත්වා, ධනං අලද්ධා චාපා**
**අතිඛීණා ඉව පුරාණානි අනුත්ථුනං සෙන්ති**

**යොබ්බනෙ**: යොවුන් වියෙහි දී; **බ්‍රහ්මචරියං**: බඹසර; **අචරිත්වා**: නො හැසිර; **ධනං අලද්ධා**: ධනය උපයා නො ගෙන; **චාපා**: දුන්නෙන්; **අතිඛීණා ඉව**: විදිනා ලද ඊතල මෙන්; **පුරාණානි**: පෙර කළ දේවල්; (පෙර කළ කෑම බීම නැටුම් ගැයුම් ආදියට) **අනුත්ථුනං**: මතක් කරමින්; **සෙන්ති**: වැලපෙති.

යොවුන් වියේදී පැවිදි ජීවිතයකුත් ගත නො කර, මිල මුදල් ඉපැයීමකුත් නො කරන අය දුන්නෙන් ඉවතට විසි කරන ලද ඊතල මෙන් පැරණි දේ ගැන මතක් කරමින් වැලපෙති.

### විවරණය

මේ ගාථාවන් ගෙන් තම ජීවිතයේ වටිනා සමය අපතේ යවා පසුව දුකට පත්වන්නවුන් ගේ තත්ත්වය මනාව විග්‍රහ කරනු ලැබේ. මෙහි දක්වා ඇති කොස්වා ලිහිණියා ගේ උපමාව කදිමට සිත් ගනියි. ආහාර ලබා ගන්නට ඇති පොකුණේ මත්ස්‍යයන් නිම ව ගොසිනි. එහෙත් මහළු කොස්වා ලිහිණියාට වෙනත් මසුන් පිරි පොකුණකට පියඹා යන්නට ද නො හැක. පාවිච්චියට ගත නොහැකි කබල් ඊතල ද එබඳුම ය.

ලෝකයේ බොහෝ මිනිස්සු මෙසේ තම යෞවන ජීවිත අර්ථසම්පන්න යමක් නොකර නාස්ති කරන්නෝ ය. අනිවාර්යයෙන් තමා වෙත හඹා එන මහළු දිවිය ගැන මඳකුදු නො සිතා සියලු ධන සම්පත් නාස්ති කර දමන්නෝ ය.

මේ ගාථා දෙකින් බුදුරදුන් මනුෂ්‍ය වර්ගයාට දෙන පණිවුඩය නම්, නිතර ම අනාගතය ගැන සිතමින් වත්මන් මොහොතෙන් උපරිම ඵල නෙලා ගත යුතු බව ය. යෞවනය ඉතා ඉක්මනින් ගෙවී යයි. තිබ්බතීය බෞද්ධ කවීන්ද්‍ර මිලරේසා ලියූ පහත දැක්වෙන ගීතය මේ ගාථාවලට අටුවාවක් වැන්න.

"පිපි කුසුමකි යොවුන් විය ගිම්හානයක
පරවී වැටෙනු ඇත ඕනෑම මොහොතක
ලැව් ගින්නකි මහළු විය - දැවෙන හේනක
එයි ඔබ පාමුලට ගිනිදැළු යම් සැණක"

භාග්‍යවතුන් වහන්සේ වරක් මෙසේ වදාළහ.

"උපත හා විපත
හිරු උදාවයි හිරු බැස්මයි වගෙයි
මේ එනවා - මේ යනවා

තුවාල වුනු පුංචි කුරුල්ලෙක්
වගෙයි නේ ද ලෙඩ දුක්!
ඔබෙත් ශක්තිය - ආරෝග්‍යය
නැතිව යා හැක - ළඟම මොහොතක



# කෘතීෘ ස්වාමීන්ද්‍රයන් වහන්සේ



සනාතන බුද්ධ භාෂිතය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ අසහාය සාමයික මෙහෙය උදෙසා, සිය කාලය හා ශ්‍රමය සපුරා වැය කරමින්, මානව වංශයට දහම් මග හෙළි පෙහෙළි කිරීමේ මහා මෙහෙවරට කැප වී සිටින සිංගප්පූරුවේ ප්‍රධාන සංඝ නායක වේරගොඩ සාරද, ස්ථවිරයන් වහන්සේ අද ලොව වෙසෙන ප්‍රශස්ථතම ධර්ම දූත යතිනායක වරයාණන් වහන්සේ නමකි.

1941 නොවැම්බර් මස 27 වනදා දකුණු ලක වේරගොඩ දී උපත ලද මේ යති ප්‍රභූවරයානෝ, උපාධි ලාභීව, ධර්මදූත මෙහෙය ආරම්භ කළේ ඉතා යොවුන් අවධියේ දීමය. දැනට ශතක 6 ක් පුරා ධර්මදූත මෙහෙයෙහි යෙදී සිටින ගරුතර වේරගොඩ සාරද යතිනායකයානන් වහන්සේ මුද්‍රිත මාධ්‍යයෙන් සහ විද්‍යුත් මාධ්‍යයෙන් මෙන්ම දුරකථන තාක්ෂණයෙන් පවා අද ලොවට ධර්මදානය සපයන්නේ නවීනයන්ගේ මනස හා ආධ්‍යාත්මික ගති-පැවතුම් පිළිබඳ පැහැදිලි අවබෝධයකිනි.

වර්තමානික ග්‍රාහක පිරිස, ශ්‍රව්‍ය-දෘෂ්‍ය මාධ්‍ය මගින් දැනුමත් විනෝදාස්වාදයත් ලබන්නට පුරුදු වී සිටින පරපුරක් හෙයින්, ගරුතර වේරගොඩ සාරද හිමිපාණෝ, ඔවුනගේ මනසට සරිලන පරිද්දෙන් බුද්ධ භාෂිතය, ඔවුන් අතට පත් කරන සේක. මුද්‍රිත හා විද්‍යුත් ප්‍රකාශන 700 ක් පමණ ලොවට පිරිනමා සිටින මේ යතිනායකයන් වහන්සේ විසින් සම්පාදිත ධර්ම භාණ්ඩාගාරය නම් ඉංග්‍රීසි කෘතිය දොරට වැඩීමේ උළෙලේ දී, ඒ පිළිබඳ ව එක් දිනක් තුල පමණක් ලැබුණු දුරකථන ඇමතුම් සංඛ්‍යාව 2000 කටත් අධික විය. ඒ නිසා එය සිංගප්පූරු රාජ්‍යයේ ග්‍රන්ථ ප්‍රකාශන ඉතිහාසයේ සුවිශිෂ්ට වාර්තාවකට හිමිකම් කියන්නේය.

දැනට, සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය භාරව වැඩ සිටින ගරු වේරගොඩ සාරද නායක ස්ථවිර පාදයන් වහන්සේ ලෝකයේ බොහෝ දේශයන් හී බුද්ධ ශාසනයේ ප්‍රගතියට හිතකාමී ධර්ම දූත මෙහෙවරක යෙදී සිටින සේක.

එතුමන් ගේ ප්‍රධාන ප්‍රකාශ අතර, සිංහල හා ඉංගිරිසි ධම්මපදයත්, ජාතක කථා පිළිබඳ විද්‍යුත් ප්‍රකාශනයත් ප්‍රධාන තැන් ගනී. එතුමන් විසින්, ඉටු කෙරෙන මහා සාමයික මෙහෙය අඛන්ඩව පවත්වා ගෙන යනු පිණිස, ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් නිදුක් නිරෝගී සුව පැතීම, බෞද්ධ ජනතාවගෙන් ඉටු විය යුතු කෘතඥතා පූර්වක චාරිත්‍රයකි.

කලා කීර්ති එඩ්වින් ආරියදාස

ISBN: 981-00-4938-2

# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත ධම්මපදය
### දොළොස්වන පරිච්ඡේදය

# අතත වග්ග



ගරු වේරගොඩ සාරද නාහිමිපාණන් වහන්සේ
සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක

"සබ්බදානං ධම්මදානං ජිනාති"

(ධර්ම දානය, සෙසු දාන සියල්ලටම වඩා අගනේය.)



''**ධර්ම භාණ්ඩාගාරය**'' නැමැති

මෙම වටිනා ධර්ම පුස්තකය

**සාමවිනිසුරු බී.ධර්මදාස පියාණන්ට**

නිවන් සුව පතා ප්‍රකාශනය කරන ලදි.

පූර්ණ අනුග්‍රහකත්වය

**වේරගොඩ සුනන්දා භික්ෂුණිය විසිනි**

# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත ධම්මපදය

කතෘ:
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය**
නො: 1, ජලන් මස් පුටේ, සිංගප්පූරුව 128607
ටෙලි: 65 67783330 65 94656570
94 770589498 / 94 755218421
වේරගොඩ ජයන්ති විහාරය, වේරගොඩ, මීටියාගොඩ
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

**කර්තෘ**
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**චිත්‍ර ශිල්පි**
පී. වික්‍රමනායක

**සැකසුම**
පියරත්න හේවාබට්ටගේ

**පරිගණක රූපාවලි සහ පූර්ව ප්‍රකාශන මෙහෙය**
පූජ්‍ය වේරගොඩ සුනන්දා භික්ඛුණී
බී. දයා සමරසිංහ
බී. රෝහණ ජයතිස්ස

**පරිගණක සහාය**
ශ්‍යාමනී ප්‍රියලක්‍ෂණා ලේකම්වසම්
ඩබ්ලිව්. මාලා කාන්ති
ප්‍රියංකා බෝධිපක්‍ෂ

**සහාය**
බී. පුෂ්පානී ධම්ලතා
බී. ජේ. ධම්ලතා
ඊ. එම්. ලයනල් මොහොට්ටි
ඊ. එම්. යුගාන් සසංක
ශ්‍රියාලතා කග්ගොඩ ආරච්චි

**පරිගණක ප්‍රකාශන**
සමනල ප්‍රින්ටර්ස්, බටපොල
ටෙලි: +94 777557127

**පිටකවරයේ පින්තූරය**
බර්ටි ගුණසේකර

**මුද්‍රණය**
2013 නොවැම්බර් මස 27 දින, සිංගප්පූරුව

**පිටකවරයේ චිත්‍රය**
*පිටකවරයේ බුදු පිළිමය වේරගොඩ ජයන්ති විහාරයේ බුදුමැදුරෙනි.*
*වර්ෂ 1953 ජුනි 3 වෙනිදා අඹන ලද මෙම බුදු පිළිමය දැනට ශ්‍රී ලංකාවේ තිබෙන*
*දර්ශණීයතම බුදු පිළිමය වශයෙන් සැලකේ. මෙම බුදු පිළිමය ඉදිකිරීමේ පුරෝගාමී වූ අපවත් වී වදාළ*
*ගෞරවාහී පණ්ඩිත යටලමත්තේ වජිරඤාණ නායක මාහිමිපාණන් වහන්සේට නිවන්සුව අත්වේවායි අපි ප්‍රාර්ථනා කරමු.*

මේ ග්‍රන්ථයෙහි ආගත කරුණු පිළිබඳ පූර්ණ හා සදාකාලික අයිතිය හිමි වන්නේ බුදුරජාණන් වහන්සේටයි.
බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් පහල වූ සනාතනික සත්‍යයෝ පුහුදුන් මිනිසුන් විසින් පනවන ලද
තාවකාලික වූත්, අසත්‍ය වූත්, අයිතිවාසිකම් පිළිබඳ නීති රීති පිළිගනු නොලබති.

**පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ටෙලි: 65 67783330 65 94656570
+94 770589498 +94 755218421
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

ISBN: 981-00-4938-2

12 වන පරිච්ඡේදය

# අත්ත වග්ග





*සිය අත් බැව තමාට රිසි නම් ඒ අත්බැව් තුන් වයස්හි ම බැරී නම් එක වයසකදී වත් සුරැකි කළයුතු.*

157. අත්තානං චෙ පියං ජඤ්ඤා
රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං
තිණ්ණං අඤ්ඤතරං යාමං
පටිජග්ගෙය්‍ය පණ්ඩිතො (12:1)

තමන්ව ප්‍රිය නම් තමන්ට
හිතන්න හොඳ හැටි රකින්ට
තුන් යාමෙන් එක් යමකට
වත් යම් ගුණයක් පුරන්ට

# රකිත් තමන් - නිති මැනවින්

## 12 (1) බෝධිරාජ කුමාරයා ගේ කතාව (157 ගාථාව)

භේසකලා වනයෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **බෝධිරාජ කුමාරයා** ඇරබ මේ ගාථාව දේශනා කළ සේක.

වරක් බෝධිරාජ කුමාර තෙම අතිශයින් මනෝරම්‍ය විසිතුරු ප්‍රාසාදයක් තමන් සඳහා ඉදිකරවා ගත්තේ ය. එය ගෙවදින දින භාග්‍යවතුන් වහන්සේට හා සංඝරත්නයට දන් පිණිස ආරාධනය කළේ ය. නිවස සුවඳවත් කර සරසා, භාග්‍යවතුන් වහන්සේට නිවසෙහි උඩුමහලට වැඩම කරනු පිණිස දිගු පලසක් පාවාඩ වශයෙන් එළා, අපට දාරක සම්පත්තියක් ලැබේ නම් භාග්‍යවතුන් වහන්සේ මේ පාවාඩය මත වැඩම කරත්වා යි අධිෂ්ඨානයක් කළේ ය. එහෙත් භාග්‍යවතුන් වහන්සේ එතැනට පැමිණ පාවාඩ මත නො වැඩ බලා සිට එය ඉවත් කරවා උඩු මහලට නැගුණු සේක.

දන් පිළිගැන්වූ බෝධිරාජ කුමාර තෙම "ස්වාමීනි, මම මවුකුසයෙහි දී මා වෙනුවෙන් මව විසින් තෙරුවන් සරණ යන ලද්දෙමි. කිරි බොන අවදියේ ද සරණ ගියෙමි. වැඩිවිය පත් පසුත් සරණ ගියෙමි. එතරම් හිතවත් මගේ පා පිස්නා පියවිලි මත නො වඩින්නට හේතු කවරේදැ"යි විමසීය. කුමාරයා හා ඔහු ගේ බිරිඳ පෙර ජන්මයක මුහුදේ යද්දී නැව කැඩී එක් පාළු දිවයිනකට පාවී තනි වූ අවස්ථාවේ කෑමට දෙයක් නැති තැන කුරුළු බිත්තර කමින් සිට, එය අවසන් වූ පසු කුරුළු පැටවුන් කා නිම කර, ලොකු කුරුල්ලන් ද පුළුස්සා ගෙන කෑ අකුසලය නිසා දරුවන් ලබන්නට භාග්‍යය නැති හෙයින් බව උන්වහන්සේ පැහැදිලි කළ හ. එසේ ඔවුන් ගේ පූර්ව ජන්මයෙහි කරන ලද අකුශල කර්මය හෙළි කොට වදාළ භාග්‍යවතුන් වහන්සේ තමන්ට තම ජීවිතය ප්‍රිය මෙන්ම හැම දෙනටම එය ප්‍රිය බව වදාරා, තමා ගේ ජීවිතය තමාට ප්‍රිය නම්, එය පාපයෙහි නො යොදවා රැක ගත යුතු බව දක්වමින් අනුශාසනා කර මේ ගාථාව ද වදාළ සේක.

### විවරණාත්මක අනුවාදය (157 ගාථාව)

**අත්තානං චෙ පියං ජඤ්ඤා නං සුරක්ඛිතං රක්ඛෙය්‍ය**
**තිණ්ණං අඤ්ඤතරං යාමං පටිජග්ගෙය්‍ය පණ්ඩිතො**

**චෙ**: ඉදින්; **අත්තානං**: තමා; **පියං**: (තම හට)ප්‍රිය යයි; **ජඤ්ඤා**: දන්නේ නම්; **තං**: ඒ තමා; **සුරක්ඛිතං**: සුරක්ෂිත කොට; **රක්ඛෙය්‍ය**: රක්නේය; **පණ්ඩිතො**: නුවණැත්තා; **තිණ්ණං අඤ්ඤතරං යාමං**: ජීවිතයේ තුන් වයසින් එක්තරා වයසකවත්; **පටිජග්ගෙය්‍ය**: ගුණ දම් වඩන්නේ ය.

තමන්ට තම ආත්මය ප්‍රිය නම් එය මනාව රැක ගත යුතු ය. නුවණැත්තහු විසින් ජීවිතයේ මුල, මැද හා අග යන එක් යාමයකදීවත් අකුසල් දුරු කර යහපත් ක්‍රියා කළ යුතු ය.

### විවරණය

'තමා ගේ ආත්මය තමා ම රැක ගන්න' යන අවවාදය බුදු දහමෙහි ආචාර විද්‍යාත්මක ස්ථාවරය මනාව පැහැදිලි කරන්නකි. මෙහි 'ආත්ම' යන්න බ්‍රාහ්මණික හින්දු චින්තනයේ දැක්වෙන්නක් මෙන් අධි භෞතික සංකල්පයක් නොව තමා ගේ ස්වභාවය විෂයෙහි යෙදෙන සම්මුති සංකල්පයක් බව මුලින්ම සටහන් කළ යුතුව පවතියි.

බුදු දහමේ වෙනත් ආගම් වල මෙන් බාහිර බලවේගයක් මගින් ආත්මය ගැලවීමක් ගැන ඉගැන්වීමක් නො මැත. තමා ගේ ගැලවීම තමා අතම යැයි පවසන වෙනත් ආගමක් නැති තරම් ය. ආගම හඟවන ඉංග්‍රීසි වචනය වූ Religion යන්නෙහි නිරුක්තිය සොයන්නෝ ඒකමතික නො වෙති. සිසරෝ එය re හා lego යන වචන වලින් ඇති වූ බව දක්වමින් යාඥා කිරීම, නිතර සජ්ඣායනා කිරීම යන අරුත් එයින් මතු කරයි. තව සමහරු re+ logo යන ක්‍රමයට මෙය ඇති වූ බව දක්වමින් භක්තිය, එක දිගට බැඳී සිටීම යන අරුත් ගනිති. Lex යන වචනයෙන් Religion යන්න බිඳ ගන්නා සමහරු නීති ගරුකත්වය, ප්‍රවේසමෙන් හිතා මතා ක්‍රියා කරන සුළු මනසක් ඇති කර ගැනීම වැනි අරුත් දක්වති.

මේ දැක්වූ අරුත් වලින් ගතහොත් බුදු දහම ආගමක් නො වේ. බොහෝ ආගම් වල දැක්වෙන විමුක්ති දායක ඊශ්වරයකු පිළිබඳ සංකල්පය බුදු දහමට මුළුමනින්ම බාහිර ය. භාග්‍යවතුන් වහන්සේ විමුක්ති දායකයෙක් නො වේ. උන්වහන්සේ විමුක්ති මාර්ගය පහදා දෙන ගුරුවරයෙක් පමණි. බෞද්ධයන් තම ශාස්තෲන් වහන්සේ කෙරේ පවත්වන ශ්‍රද්ධාව රෝගියකු වෛද්‍යවරයකු කෙරේ ඇති කරගන්නා විශ්වාසය වැනි ය. නැතහොත් ශිෂ්‍යයකු තම ගුරුවරයා ගැන පවත්වන හැඟීම වැනි ය. බෞද්ධයන් ගේ පව් සෝදා දැමීමක් හෝ ඔවුන් විමුක්තියට පත් කරලීමක් බුදුරදුන් ගේ කාර්යභාරයට අයත් නැත. අනිත් අතට කිසිවකු කෙළෙසීමට හෝ අපායට යැවීමට ද බුදුරදුනට හැකියාවක් නැත. බුදු සමයෙහි උගන්වන්නේ තමාට පිහිට තමා බව ය.



*පළමු වැ තමා සුදුසු ගුණ දහම්හි පිහිටා අනුන් සදන්න වඩන්න අනුසස්නා කළයුතු.*

158. අත්තානමෙව පඨමං
පතිරූපෙ නිවෙසයෙ
අථඤ්ඤමනුසාසෙය්‍ය
න කිලිස්සෙය්‍ය පණ්ඩිතෝ (12:2)

මුලින් තමා හැදී පසුව
අනුන්ට දෙන හොත් ඔවදන්
නුවණැත්තා කිලිටි නො වෙයි
නො ලබයි කිසි ලෙස අවමන්

# මුලින් තමන් හැදී හොඳට - අනුන්ට ඔවදන් පසුවට
## 12 (2) උපනන්ද ශාක්‍යපුත්ත තෙරණුවන් ගේ වත (158 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය වංශයෙන් පැවිදි වූ **උපනන්ද** නම් හිමිනම ඇරබ මේ ගාථාව වදාළ සේක.

උපනන්ද හිමියෝ විචිත්‍ර ධර්ම කථිකයෙක් වූ හ. උන්වහන්සේ තෘෂ්ණාවෙහි ආදීනව මනාව පැහැදිලි කරති. අල්පෙච්ඡතාවෙහි අනුහස් වදාරති. ධූතංග පිරීමෙහි අගය වියත් ලෙස හුවා දක්වති. පරිත්‍යාගශීලය අගයති. එසේ මේවා අන්‍යයනට විසිතුරු ලෙස පැහැදිලි කළත් උන්වහන්සේ ධර්මදේශනාදියෙන් තමන්ට ලැබෙන පිරිකර ආදිය විෂයෙහි තමන් දේශනා කරන ධර්මයට අනුව ක්‍රියා නො කරති. ඒවා දැඩි තෘෂ්ණාවෙන් එක් රැස් කර තබා ගනිති.

වරක් වස් සමාදන් වන දිනයට කිට්ටුව උපනන්ද හිමියෝ ගම්බද ආරාමයකට ගිය හ. උන්වහන්සේ ගේ ධර්මදේශනා චාතුර්යයෙන් ප්‍රසන්න වූ තරුණ හිමි නමක් එම විහාරස්ථානයෙහි වස් වසන්නට එතුමන්ට ආරාධනය කළ හ. වස් වසන භික්ෂූන් වහන්සේලාට සාමාන්‍යයෙන් දායකයන් සිවුරු කීය බැගින් දෙනවාදැයි උන්වහන්සේ විමසූ හ. "එක නමකට එක සිවුර බැගින්" යි පිළිතුරු ලැබිණ. ඒ ඇසූ උන්වහන්සේ තම පාවහන් සඟල එහි තබා වෙනත් ආරාමයකට ගිය හ. එහිදී ද වස් ආරාධනයක් ලැබුණොත් එක නමකට සිවුරු කීයක් ලැබේදැයි අසා දෙකක් ලැබෙතැයි පැවසූයෙන් තම හැරමිටිය එහි තබා වෙනත් ආරාමයකට ගියේ ය. එය එක් නමකට සිවුරු තුන බැගින් ලැබෙන තැනකි. එහි හේ තම දිය බඳුන (ඩබරාව) තැබී ය. අනතුරුව තවත් ආරාමයකට ගිය විට එහි එක නමකට සිවුරු හතර බැගින් ලැබෙන බව අසා එහි වස් විසී ය.

වස් කාලය අවසානයේ තමන්ට හිමි සිවුරු හතර ලබාගත් උපනන්ද හිමියෝ අනිත් ආරාම තුනට ගොස් තමන් ඒවායේ තම පාවහන්, සැරයටිය හා ඩබරාව තැබූ බව පවසා සිවුරු කොටස ඉල්ලා ගත්තේ ය. ඒ සිවුරු කරත්තයක පටවා ගෙන තම ආරාමය බලා එන අතරමග තරුණ හිමි දෙනමක් සිවුරු දෙකක් හා විල්ලුද පොරෝනයක් බෙදා ගන්නට බැරිව විවාද කරනු දුටුවේ ය. ඔවුහු තම අර්බුදය විසඳා දෙන ලෙස උපනන්ද හිමියන්ගෙන් ඉල්ලා සිටියහ. සිවුරු දෙක ඒ දෙනම අතර බෙදා දී, බෙදුම් ගාස්තුව වශයෙන් විල්ලුද පොරෝනය තමන් හිමි කරගත්තේ ය.

තරුණ හිමි දෙනම විනිශ්චය ගැන සතුටු නො වූ නමුත් කළ හැකිදෙයක් නො විය. එහෙයින් ඔවුහු භාග්‍යවතුන් වහන්සේ හමු වී තම පැමිණිල්ල ඉදිරිපත් කළ හ. භාග්‍යවතුන් වහන්සේ අනුන්ට අවවාද කරන්නට පෙර තමන් ශික්ෂණය වී එසේ කළ යුතු බව දේශනා කර මේ ගාථාව වදාළ හ.

**විවරණාත්මක අනුවාදය (158 ගාථාව)**

**පඨමං අත්තානං එව පතිරූපෙ නිවෙසයෙ අථ අඤ්ඤං අනුසාසෙය්‍ය පණ්ඩිතො න කිලිස්සෙය්‍ය**

**පඨමං**: ප්‍රථමයෙන්; **අත්තානං ඒව**: තමා ම; **පතිරූපෙ**: උතුම් ගුණ ධර්මයන් හි; **නිවෙසයේ**: පිහිටුවන්නේය; **අථ**: ඉක්බිති; **අඤ්ඤං අනුසාසෙය්‍ය**: අන්‍යයන්ට අනුශාසනා කරන්නේ ය; **පණ්ඩිතො**: (මෙසේ කරන) නුවණැත්තා; **න කිලිස්සෙය්‍ය**: නො කෙලෙසෙන්නේ ය.

අන්‍යන්ට අවවාදානුශාසනා කරන්නහු විසින් පළමු කොට මනා ගුණයෙන් තමා ම ගුණවත් විය යුතුයි. ඉන් පසු අනුන්ට අනුශාසනා කළ යුතුයි. එසේ කරන නුවණැත්තා අනුන්ගෙන් ප්‍රශංසා ලබයි. නින්දා නොලබයි.

**විවරණය**

**පඨමං අත්තානං එව**: 'මුලින් තමා හික්මෙන්න, අනතුරුව අනුන්ට අනුශාසනා කරන්න' යන්නෙන් දේශකයා ගේ විශ්වාසනීයත්වය තහවුරු කරන්නට මගක් පහදයි. යම්කිසි පුද්ගලයකු තමා අනුන්ට දේශනා කරන ධර්මය තමන් අනුගමනය නො කරන්නේ නම් ශ්‍රාවකයෝ ඔහු විශ්වාස නො කරති. එබඳු ආදර්ශයන් නොදී අවවාදයන් පමණක් දෙන්නන්ට ජන සමාජය 'වැදිබණ දෙසන්නෝ' යි අවමන් කරති. තවත් උපමාවක් ලෙස කකුළු මව ද දක්වති. තමා හරහට ගමන් කරමින් කෙළින් ගමන් කරන්නැයි දරුවනට අවවාද කරන මවක් සේ කකුළු මව දක්වමින් තමා අනුගමනය නො කරන බණ අනුන්ට දේශනා කරන්නන්ට අවමන් කරති.

තමා මඩෙහි ගිලී සිටිමින් අනුන් මඩෙන් ගොඩ ගන්නට සිතීම මුලාවක් බව දක්වන භාග්‍යවතුන් වහන්සේ පළමුව තමා ගොඩට අවුත් ඒ අත්දැකීම් මත පිහිටා අනුන්ට උදවු කළ යුතු බව දක්වති. එසේ ම යම්කිසි භික්ෂුනමක් තමන් පිළි නො පදින ධර්මය හුදෙක් පිරිකර ආදී යමක් බලාපොරොත්තුවෙන් අන්‍යයනට දේශනා කරමින් ඇවිදින්නේ නම් නිග්‍රහයට ලක් වෙයි.

**පතිරූපෙ නිවෙසයෙ**: සුදුසු ගුණයෙහි පිහිටුවීමය. පස් පවින් හා දස අකුසලින් වැළකීම, ලාභයට ගිජු නොවීම, අගතියට නො බැඳීම, සන්සුන් පැවතුම්, යහපත් වචන භාවිතය, යන ගුණයන් පිහිටුවීමයි.





*තමා මනා ව දමනය වී අනුන් දමනය කළයුතු. තමා (-සිත) දමනය කිරීම ඉතා අමාරු ය.*

159. අත්තානං චෙ තථා කයිරා
යථඤ්ඤමනුසාසති
සුදන්තො වත දම්මෙථ
අත්තාහි කිර දුද්දමො (12:3)

අනුන්ට යම් ලෙස උපදෙස් දෙන්නේ
නම් ඒ ලෙස තමනුදු හැසිරෙන්නේ
තමන් හැදී අන් අයද හදන්නේ
තමන් හැදීමය අපහසු වන්නේ

# අනුශාසනයට පෙර ආදර්ශය
## 12 (3) පධානිකතිස්ස තෙරුන්ගේ වත (ගාථා 159)

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ වසමින් මේ ගාථා ධර්මය **පධානික තිස්ස තෙරුන්** අරබයා දෙසූ සේක.

පධානික තිස්ස තෙරුන් වහන්සේ බුදුරදුන් හමුවී භාවනාවට සුදුසු කමටහන් ගෙන මහත් භික්ෂු පිරිසක් ද සමග භාවනා කටයුතු සඳහා ආරණ්‍ය ගත වූහ. එහිදී මෙම තෙරුන් වහන්සේ අනෙක් භික්ෂූන්ට භාවනා කටයුතු විෂයෙහි සිහියෙන් යුක්තව අප්‍රමාදීව කටයුතු කරන්නැයි අවවාද දුන්හ. එහෙත් තෙමේ පසකට වී කිසිත් භාවනාවක් නොකොට නිදා ගත්හ. අනෙක් තරුණ භික්ෂූහු ලැබුණු අනුශාසනා අනුව භාවනාවෙහි සිත යොමා රාත්‍රියෙහි ප්‍රථම යාමය ගත වූ විට යහන් ගත වීමට සැරසුනහ. එවිට පධානිකතිස්ස භික්ෂුව අවදිව අනෙක් භික්ෂූන්ට යළිත් භාවනා ප්‍රගුණ කිරීම සඳහා පිටත්ව යාමට අවවාද කළහ. රාත්‍රියෙහි දෙවැනි තෙවැනි යාමයන්හි එම භික්ෂූන් නිදා ගැනීම සඳහා පැමිණි විට ද පධානික තිස්ස තෙරුන් වහන්සේ එම භික්ෂූන්ට එලෙසින් ම පැවසූහ.

පධානික තිස්ස තෙරුන් නිතරම මෙසේ ක්‍රියා කරන විට සෙසු තරුණ භික්ෂූන් වහන්සේලා ගේ මනසට අස්වැසිල්ලක් නොවීය. මේ නිසාම ඔවුනට මනස එකඟ කොට භාවනා කටයුතුවල යෙදීමට නොහැකි විය. දිනක් ඔවුන්ට තම ඇදුරුවරයා, ඔහු අනුන්ට කියන ලෙසම අනලස්ව භාවනාවෙහි යෙදේදැයි විමසා බැලීමට අදහස් විය. එසේ විමසීමේ දී ඔවුන්ට දක්නට ලැබුනේ තම ආචාර්ය පධානික තිස්ස තෙරුන් තමන්ට අවවාද කළ ද, ඔහු එම අවවාදයෙහි පිහිටා ක්‍රියා නොකරන බවත්, භාවනාවෙහි නොයෙදී බොහෝ විට නින්දෙහි යෙදෙමින් කුසීතව සිටින බවත් ය. පධානික තිස්ස තෙරුන්ගේ අවවාද අනුශාසනා මත බොහෝ කලක් නිදිවර්ජිතව සිටි එම තරුණ භික්ෂූන් බොහෝ දෙනෙක් රෝගාතුර වූහ. එහෙයින් ම භාවනාවෙන් කිසිදු ප්‍රයෝජනයක් ගැනීමට ද නො හැකි විය.

වස්සාන කාලය අවසන් වෙත් ම භික්ෂූහු නැවත බුදුන් හමුවට පැමිණියහ. පිළිසඳර කථාවලින් පසු බුදුන් වහන්සේ, "මහණෙනි, කෙසේ ද භාවනා කටයුතු අප්‍රමාදීව කළාහුදැ"යි විමසූ සේක. එවිට භික්ෂූහු සියලු කතා පුවත සැළ කළාහුය.

එවිට බුදුරජාණන් වහන්සේ "මහණෙනි, යමෙක් අනුනට අනුශාසනය කරන්නේ නම් ඒ අනුශාසනය පරිද්දෙන් ක්‍රියා කළ යුතුය. තමා පළමුව සුදුසු ස්ථානයෙහි පිහිටා අනුනට ඔවා දිය යුතු"යි ප්‍රකාශ කළ සේක.

**විවරණාත්මක අනුවාදය (159 ගාථාව)**

**(යථඤ්ඤමනුසාසති) යථා අඤ්ඤං අනුසාසති චෙ අත්තානං තථා කයිරා වත සුදන්තො දම්මෙථ අත්තා හි කිර දුද්දමො**

**යථා**: යම් සේ; **අඤ්ඤං**: අන්‍යයාට; **අනුසාසති**: අනුශාසනා කෙරේ ද; **චෙ**: ඉදින්; **අත්තානං**: තමා; **තථා**: එසේ; **කයිරා**: (පිළිවෙත් සරු) කරන්නේ නම්; **වත**: ඒකාන්තයෙන්; **සුදන්තො**: මනාව දැමුනු තැනැත්තේ; (අනුන්) **දම්මෙථ**: දමනය කරන්නේ ය; **අත්තා හි කිර**: තමා වනාහි; **දුද්දමො**: දමනය කිරීම දුෂ්කර යි; (එහෙයින් එය මනා සේ දැමිය යුතුයි.)

අනුන්ට අවවාද අනුශාසනා දෙන පරිද්දෙන් ම තමා ද එම අවවාදයෙහි පිහිටා ක්‍රියා කළ යුතුය. මනාව දැමුනු තැනැත්තේම අනුන් දමනය කරන්නේ ය. තමා දමනය කිරීම ඇත්තෙන් ම බෙහෙවින් දුෂ්කරය.

**විවරණය**

**අත්තානං තථා කයිරා**: අනුන්ට මේ මේ ලෙස හැසිරිය යුතුයයි අවවාද අනුශාසනා කිරීම. තමන් අවවාද අනුශාසනයන් හි නොපිහිටා අනුන්ට අවවාද කරන්නන්ට බුදුන් වහන්සේ දෙන උපදේශය නම් "තමා පළමුව ආදර්ශයෙහි පිහිටන්න. ඉන් පසුව එසේ ක්‍රියා කිරීමට අනුන්ට අවවාද උපදෙස් දෙන්න."

බුදුරජාණන් වහන්සේ යථෝක්ත ආකල්පය අවධාරණය කිරීමට ලෝකයේ සිටි උසස්ම යෝග්‍යතම පුද්ගලයායි. බුදුරජාණන් වහන්සේ නිබඳවම සෑම උතුම් ගුණ ධර්මයකම ශ්‍රේෂ්ඨතම ආදර්ශය වූහ. බුදුන් වහන්සේ බුද්ධත්වයට පත් වීමේ සිට පරිනිර්වාණය තෙක් වූ අවුරුදු සතලිස් පහ පුරා කාලය ගත කළේ අනුන්ගේ ම යහපත සඳහාය. තමන් වහන්සේ සියලු ගුණ ධර්මයන්ගේ මුහුකුරා යාමක් වූ බැවින් අනුන්ට අනුශාසනා කිරීමෙහි යෝග්‍යත්වයට පත්ව සිටියහ. බුදුරජාණන් වහන්සේ ඇතැම් විට තනිවම ද ඇතැම් විට ශ්‍රාවක පිරිස් සමග ද තැනින් තැනට යමින් ලොකු, කුඩා, උසස්, පහත්, ධනවත්, දුප්පත්, නුවණැති, නුවණමඳ වශයෙන් කිසිදු භේදයක් නොතකා සමස්ත මානව වර්ගයාටම තම ධර්මානුශාසනයන්ගෙන් උදාර මෙහෙයක් සිදු කළ සේක.

සුදුසු දෙය තමාම කළ යුතු බව බුදුරජාණන් වහන්සේ අවධාරනය කළ සේක. උන් වහන්සේ කිසි විටෙක තම දේශනයන්ට පමණක් සීමා නොවූහ. උන් වහන්සේ ප්‍රායෝගිකත්වයට ආදර්ශයක් වූහ. තමන් වහන්සේ පත් වූ බුද්ධත්වය ඒ සඳහා අදාළ ක්‍රියා මාර්ගය සපුරන්නේ නම් ඕනෑම කෙනෙකුට විවෘත බව වදාළ එකම ශාස්තෘවරයා බුදුන් වහන්සේය. උන් වහන්සේ හැම විටකම ශ්‍රාවකයන් උනන්දු කළේ පත් විය හැකි උසස්ම ආධ්‍යාත්මික තත්වයට පත්ව ජීවිතයක උත්තමාර්ථය අත්පත් කර ගන්නා ලෙසය. මහා කරුණාවෙන් හා මහා ප්‍රඥාවෙන් පරිපූර්ණ වූ උන් වහන්සේ සමස්ත මානව වර්ගයා සංසාර දුක්ඛයෙන් ඉවත් කොට අමා මහ නිවන් සුවයට පැමිණිවීමට ස්වකීය කාලය හා ශ්‍රමය වචනයේ පරිපූර්ණ අර්ථයෙන්ම කැපව ක්‍රියා කළ සේක.





*මනා සේ තමා දමනය කළ තැනැත්තා දුක සේ ලැබිය යුතු පිහිට (ලොව්තුරා සැප) ලබයි*

160. අත්තාහි අත්තනො නාථො
කොහි නාථො පරො සියා
අත්තනාව සුදන්තේන
නාථං ලභති දුල්ලභං (12:4)

තමන්ට තමාමයි පිහිටට සිටින්නේ
වෙන කවුරුද තමන් පිහිටට සිටින්නේ
තමන් මනා ලෙස දමනය කරන්නේ
එවිටයි උතුම් වූ පිහිටක් ලැබෙන්නේ

# තමන් හිසට තම අතමය

## 12 (4) කුමාර කස්සප මාතාවගේ ප්‍රවෘත්තිය (160 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **කුමාරකස්සප** තෙරුන් ගේ මෑණියන් අරබයා මේ ගාථාව දේශනා කර වදාළ සේක.

වරක් එක් විවාහක යොවුන් කතක් පැවිදි වන්නට සැමියා ගෙන් අවසර ඉල්ලා සිටියා ය. අවසර ලත් ඕ දේවදත්ත පාක්ෂික භික්ෂුණීන් ගේ ආරාමයට ගොස් පැවිද්ද ලබා ගත්තා ය.

මේ තරුණිය පැවිදි වන්නට පෙර ගැබ් ගෙන සිටියා ය. ඇය පැවිදි වූයේ එය නො දැනය. එහෙත් මාස කීපයක් යන විට ගැබ මෝරමින් පිටතට පෙනෙන්නට පටන් ගති. භික්ෂුණීහු ඒ බව දෙව්දත් තෙරුනට දැනුම් දුන් හ. ඇය වහාම සිවුරු ගලවා ගිහි ගෙදරට නෙරපා හරින සේ අණ කළේ ය. එහෙත් ඊට අකැමැති වූ ඕ "මට දෙව්දත් ලඟ පැවිදි වන්නට උවමනාවක් නො විය. මා පැවිදි වූයේ බුදුරදුන් වෙනුවෙනි. ඔබ මා දේවදත්තගේ ශ්‍රාවිකාවක් කර ඇත්තේ වැරදීමකිනි. මම සිවුරු හැර නො යමි. මා භාග්‍යවතුන් වහන්සේ වෙත ගෙන යන්න" යි ඕ පැවසුවා ය. මෙසේ පැවසූ ඕ ජේතවනාරාමයට ගොස් භාග්‍යවතුන් වහන්සේ හමු විය.

ඇය ගැබ් ගත්තේ පැවිදිවන්නට පෙර බව බුදු ඇසින් දත් බුදුරජාණන් වහන්සේ ඇය ගේ අහිංසකත්වය තමන් විසින්  පෙන්වා දෙනු වෙනුවට විධිමත් කමිටුවක් ලවා එය කරවන්නට සිතූ හ. බුදුන් වහන්සේ පසේනදී කොසොල් රජ, අනේපිඬු සිටුතුමා, විසාකා උපාසිකාව, ඇතුළු පිරිසක් කැඳවූ හ. උපාලි මහ රහතන් වහන්සේට මෙම කාර්‍ය්‍යය මෙහෙයවීම පැවරූ හ.

කමිටුවේ මෙහෙයුම පරිදි විසාකාව ඇය තිරයකින් ආවරණය වූ තැනකට ගෙන ගොස් පරීක්ෂා කළා ය. මැනවින් කරුණු විග්‍රහ කළ ඕ තොමෝ භික්ෂුණිය ගැබ් ගත්තේ පැවිදි වන්නට පෙර බව උපාලි තෙරුනට වාර්තා කළ හ. උන්වහන්සේ පැමිණ සිටි පිරිසට ඒ බව දැනුම් දී, ඒ අනුව ඇය ගේ ශීලයට හානියක් වී නැති බව ප්‍රකාශයට පත් කළ හ.

නිසි කලට තෙරණිය පුත් කුමරකු බිහි කළා ය. දරුවා හදා වඩා ගැනීම බාර ගත් පසේනදී රජතෙම ඔහුට කුමාරකස්සප යන නම යෙදී ය. හත් වස් වූ පසු තම මව භික්ෂුණියක  බව ඇසූ දරුවා තමන් ද පැවිදි වීමට කැමති බව කියා සිටියේ ය. පැවිදි වී කලකට පසු බුදුරදුන්ගෙන් කම්ස්ථාන ලබා වනගත වූ කුමාරකස්සප තෙරණුවෝ භාවනා කොට රහත් බව ලැබූ හ. රහත් වූ පසුව ද තවත් දොළොස් වසරක් වනගතව විසූ හ. උන්වහන්සේ ගේ මව ඒ දොළොස් වසර පුරාම පුතණුවන් දැක ගැනීමේ ආශාවෙන් විසූ හ.

දොළොස් වසරකට පසු නගරයට පැමිණි කුමාරකස්සප තෙරුන් දුටු මව "පුතනුවනි, කුමාරකස්සප මා පුත් තෙරණුවනි" යි හඬ ගසමින් කඳුළු පිරි නෙතින් උන්වහන්සේ වෙත දිව ආහ. තෙරණුවෝ ද ඇය දැක "මා දැන් කාරුණික ලෙස කතා කළහොත් තෙරණියගේ අනාගතයට එය යහපතක් නො වේ. ඇය තුළ දාරකස්නේහය රජ කරන්නට ගියහොත් මාර්ග ඵලාධිගමයට එය බාධාවෙයි. එහෙයින් නෙතමනයක් නො දක්වමි"යි සිතා තදින් කතා කළ හ.

"තෙරණිය බුදු සස්නෙහි පැවිදිව සිටත් දරු සෙනෙහයවත් දුර ලන්නට අසමත් ද?" යි විමසූ හ. "මගේ පුතා මට නපුරුකම් නො කරනු ඇත" යි සිතූ භික්ෂුණිය "පුතණුවනි, ඔබ කුමක් ද කීවේ?" යි යළි ප්‍රශ්න කළා ය. තෙරහු ද පෙර සේම තදින් කතා කළ හ. ඒ ඇසූ තෙරණිය "මොහු වෙනුවෙන් මම දොළොස් අවුරුද්දක් කඳුළු බීවෙමි. නමුත් හේ මට නපුරු බසින් කතා කරයි. දරුවන් කෙරේ ඇළුම් කිරීමෙන් ඇති ඵලය කුමක් ද?" යි සිතා දරුවා කෙරේ වූ ඇල්ම හැර බවුන් වඩා එදිනම රහත් වූ වාය.

එපවත් ඇසූ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, කවර අධිගමයක් ලබන්නට වුවද තමාට තමා පමණක් ම සරණ බව තෙරුම් ගත මනාය" යි මේ දේශනාව කර වදාළ සේක.

**විවරණාත්මක අනුවාදය (160 ගාථාව)**

**අත්තනො අත්තා හි නාථො පරො කො හි නාථො සියා**
**සුදන්තෙන අත්තනා එව දුල්ලභං නාථං ලභති**

**අත්තනො**: තමා හට; **අත්තා හි**: තමා ම; **නාථො**: පිහිට; (වෙයි) **පරො**: අන්‍ය වූ; **කො හි**: කවරෙක් නම්; **නාථො**: (තම හට) පිහිටක්; **සියා**: වන්නේ ද?; **සුදන්තෙන**: මනාව දැමුනා වූ; **අත්තනා එව**: තමා විසින් ම; **දුල්ලභං**: ලැබීමට දුෂ්කර; **නාථං ලභති**: (අර්හත්ඵල නමැති) පිහිට ලබයි.

තමාට පිහිට තමාමය. තමාට වෙන කවරෙක් පිහිට වේ ද? තමා මනාව හික්මවා ගත් විට දුර්ලභ වූ අර්හත්ඵල නමැති පිහිට ලැබිය හැක.

**විවරණය**

කුමාරකස්සප තෙරණුවෝ දුර්ලභගනයේ උතුමෙක් වූ හ. බුදු සස්නේ විචිත්‍ර ධර්ම කථිකයන් අතර අග්‍රස්ථානය ලද්දේ උන්වහන්සේ ය.

වයස අවුරුදු හතේ දී කුමාරකස්සප පැවිදි වූයේ රජතුමාගේ අනුමැතිය ලබා ගනිමිනි. උන්වහන්සේ පැවිදිව ගියේ අන්ධ වනයටය. එහිදී තුඹසක් උපමා කර දෙසූ සූත්‍රයට සවන් දීමෙන් නිවන් සුව ලත් හ.

පදුමුත්තර බුදුරදුන් ගේ කාලයෙහි කළ ප්‍රාර්ථනාවක් සමෘද්ධ වීමෙන් උන්වහන්සේ විචිත්‍ර කථිකයන් අතර අගතැන් පත් වූ හ.



*තමා ම කළ තමා කෙරෙන් උපන් තමාගෙන් ම හට ගත්තා වූ පව ඒ අනුවණයා දරුණු සේ මඩී.*

161. අත්තනා'ව කතං පාපං
අත්තජං අත්තසම්භවං
අභිමන්ථති දුම්මෙධං
වජිරං'වස්මමයං මණිං (12:5)

තමන් කළ පාපෙන්
තමන් තුළින් ම බිහි වූ
කැපෙති අනුවණ දන
දියමන්තියෙන් මිණි මෙන්.

# විහින් නැසෙන - පවු කළ දන

## 12 (5) මහාකාල උපාසක වත (161 ගාථාව)

**ම**හාකාල නම් ගිහි උපාසකයකු ඇරබ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කර වදාළ සේක.

මහාකාල උපාසක තැන එක් පොහෝ දිනක දෙව්රම් වෙහෙර බලා ගියේ ය. එදින අටසිල් සමාදන්ව සිටි හෙතෙම පසු දින අළුයම් වනතුරුම ධර්ම ශ්‍රවණය කළේ ය.

එදා රෑ හොරු නගරයේ එක් ගෙයක් බිඳ බඩු රැගෙන පලා යන්නට සැරසෙන විට ගෙහිමියෝ අවදිව ඔවුන් පසුපස එළවා ගෙන ආහ. ඒ මේ අත දිවූ සොරුන් ගෙන් සමහරු විහාර බිම හරහා ද දුවන්නෝ මහා කාල මුහුණ සෝදමින් සිටි තැනින් ද දිවූ හ. එක් හොරෙක් තම බඩු මහා කාල සිටි තැන දමා පලා ගියේ ය. ගෙහිමියෝ මහාකාල සිටි තැන තිබූ සොරබඩු දැක ඔහු හොරකු සේ සිතා ඔහුට පහර දුන් හ. ඔවුන් ගෙන් පහර කෑ උපාසක තැන එතැනම මිය ගියේ ය.

උදෑසන පොකුණ වෙත ගිය සාමණේර හිමිවරු ඔහු ගේ මළසිරුරු දැක බුදුරජාණන් වහන්සේට දැනුම් දුන් හ. "උපාසක මහතා මිය ගියේ ඔහුට කිසිසේත් නො ගැලපෙන විලාසයෙනි" යි ඔවුහු දුක් වූ හ.

භාග්‍යවතුන් වහන්සේ එවිට, "මේ ජීවිතයේ දී මහාකාල උපාසක තැන කළ පුණ්‍ය කටයුතු අනුව බලන විට නම් මේ මරණය ඔහුට සරිලන මරණයක් නො වේ. එහෙත් ඔහු ගේ පෙර කල කර්ම දෙස බලන විට නම් එසේ නො සිතෙයි. පෙර ආත්මයක මොහු එක්තරා අහිංසක පුද්ගලයෙකු ගේ බිරිඳ කෙරේ කාම රාගය ඉපදී, ඔහු මරා දමනු පිණිස තමා සතු වටිනා මැණිකක් ඔහු ගේ වාහනයට දමා සොරකු බවට නම් කර තලා මරා දැම්ම වූ පාපය නිසා මේ විපාකය ඔහුට විඳින්නට වූ බැව්" වදාළ සේක. "තමා ම කළ පවින් පව්කාරයෝ අපා දුක් විඳිති. දියමන්තිය තමාත් මැණිකක් නමුත් අනිත් මැණික් කපන්නාක් මෙනි" යි වදාළ බුදුරජාණන් වහන්සේ මේ ගාථාව ද දේශනා කළ හ.

**විවරණාත්මක අනුවාදය (161 ගාථාව)**

**අත්තනා එව කතං අත්තජං අත්තසම්භවං පාපං**
**අස්මමයං මණිං වජිරං ඉව දුම්මෙධං අභිමන්ථති**

**අත්තනා එව**: තමා විසින් ම; **කතං**: කරන ලද; **අත්තජං**: තමා තුළින් ම උපන්; **අත්තසම්භවං**: තමා කෙරෙන් ම හටගත්තා වූ; **පාපං**: පාපය; **අස්මමයං**: පාෂාණමය වූ; **මණිං**: මැණික;(කා දමන) **වජිරං ඉව**: දියමන්තිය මෙන්; **දුම්මෙධං**: අඥානයා; **අභිමන්ථති**: අතිශයින් පෙළයි.

තමා විසින්ම කළ, තමාගෙන්ම ජනිත, තමා ගෙන්ම හට ගත්, පාපය තමාව ම පීඩාවට පත් කරයි. ගලෙන්ම උපන් දියමන්තිය ගලම නසන්නාක් මෙනි.

**විවරණය**

දියමන්තියක් ඉතාමත් ම ශක්තිමත් ගල් විශේෂයක් ලෙස හැඳින්වෙයි. එයින් සියළුම මැණික් ගල් කැපිය හැකි ය. දියමන්තියට පාලියෙන් යෙදෙන 'වජිර' යන වචනයෙහි නිරුක්ති දක්වන අටුවාචාරීහු ''**වජතේව න පටිහඤ්ඤතේ යස්ස ගමනං කේනචීති වජිරං**'' යි කැපී ගෙන යන විට නවත්වන්නට බැරි ලෙස කපන්නේ වජිර නම්'' යි ඒ බව දැක්වූ හ. දියමන්ති ගැන කියවෙන ශ්ලෝකයක් මෙසේ ය.

**පෘථිව්‍යං යානි රත්තානි**
**යෙ චාන්‍යෙ ලෝහ ධාතව**
**සර්වානි විලිඛේද් වජ්‍රං**
**තච්ච තෙර් න විලිඛ්‍යතෙ**

මහ පොළොවේ කොයි මැණිකත්
වෙන කොයි විදියේ ලෝහත්
සේරම වජ්‍රයෙන් කපත්
එකකින් වත් එය නොකපත්

දියමන්තිය ඉතා මිල අධික ගල් විශේෂයක් වුව ද එය පැළඳීම ආයුරාරෝග්‍ය භාග්‍යාදිය ලබා දෙන බව පැරණියෝ විශ්වාස කළ හ. වර්තමානයේ එය ධනවතුන් ගේ ආභරණයක් මෙන් ම ආයෝජනයක් ලෙස ද සැලකේ. මේ ගාථාවේ දී උපමාවට ගත්තේ එහි ඇති තීක්ෂණ කැපෙන සුළු ගුණයයි.





*සතුරෙක් (තමා ගේ) සතුරාට විපත් කරනු කැමති වේ ද, දුසිල් තැනැත්තා ද තමාට එසේ ම විපත් කරන්නේ ය.*

162. යස්ස අච්චන්ත දුස්සීලයං
මාලුවා සාලම්'වොතතං
කරොති සො තථත්තානං
යථා නං ඉච්ඡතී දිසො (12:6)

හැසුරුණොත් දුසිල් ලෙස - පහත් දුසිරිත යෙදී
සල් ගහක් වනසන්න - වැලක් එතුණා වගේ
ඔහු ගෙ හතුරන් ඔහුට - කරන්නට කැමති වන
මහ විපත් තමාටම - උදාකර ගනී ඔහු

# පවෙන් වැනසෙයි - පවු කරන්නා.

## 12 (6) දේවදත්ත තෙරුන් ගේ පුවත (162 ගාථාව)

**දෙවිදත් තෙරුන්** ඇරබ බුදුරජාණන් වහන්සේ මේ ගාථාව දේශනා කර වදාළේ දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයේ ය.

දිනක් දම් සභාවෙහි රැස් වූ භික්ෂූන් වහන්සේ දෙව්දත් තෙරුන් ගැන කතා බහ කරමින් විසූ හ. එහි වැඩම කළ භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, කවර කතාවක් සාකච්ඡා කළහු ද?" යි ප්‍රශ්න කළෙන් තමන් දෙව්දත් තෙරුන් ගැන කතා කරමින් සිටි බව ඔවුහු පිළිවදන් සේ පැවසූ හ. "ස්වාමීනි, දේවදත්ත සීලයක් ගුණයක් නැති පාපතරයෙකි. ඔහු අතිශයින් ම දුෂ්ට ය. නුසුදුසු ක්‍රම වලින් අජාසත් පහදවා ගෙන කීර්තිය හා ලාභ ලබන්නට හෙතෙම වෑයම් කළේ ය. ඔහු ගේ බසින් නො මග ගිය අජාසත් තම පියා ඝාතනය කළේ ය. ඔබ වහන්සේ ඝාතනයට දෙව්දත් තෙවරක් වෑයම් කළේ ය. ඔහු නම් නියම පාපිෂ්ඨයෙකි" යි ඔවුහු පැවසූ හ.

උන්වහන්සේලාට සවන් දී සිටි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, දේවදත්ත මා ඝාතනයට සැරසුණේ දැන් පමණක් නො වෙයි. පෙරත් වෑයම් කළේ ය" යි පවසා පැරණි වෘත්තාන්තය වශයෙන් මුව වැද්දාගේ කතාව වදාළ සේක.

එක් සමයක බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රජ කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ මුවකු වී උපන් සේක. ඒ ආත්මයෙහි දෙව්දත් උපන්නේ මුව වැද්දකු වශයෙනි. දිනක් දඩයමේ ගිය මුව වැද්දා මුවකු ගේ පිය සටහන් දැක ගහකට නැග උණ පතුරු වලින් මැස්සක් තනා ගෙන රැක සිටියේ ය. දුනු ඊතල සූදානම් කර ගෙන ඔහු සැරසී සිටියේ මුවා දඩයම් කර ගැනීමටයි. මුවා ඉතා ප්‍රවේසමෙන් වටපිට බලමින් ආවේ ය. මුවා පරිස්සමෙන් හෙමින් එනු දුටු මුව වැද්දා ඔහු ලගට කැඳවා ගැනීමට පෙළඹුමක් වශයෙන් පලතුරු ටිකක් මුවා වෙත වීසි කළේ ය.

එයින් වඩාත් සැක ඇති කරගත් මුවා විමසිලිමත් වී ගසේ රැක සිටි මුව වැද්දා දුටුවේ ය. වැද්දා නුදුටු බවක් හඟවා ආපසු හැරුණු මුවා මෙසේ පැවසී ය. "ගස, මේ වනතුරු ඔබේ පලතුරු වැටුණේ සිරස් අතට ය. අද අමුතු විදියකට හරස් අතට වැටෙයි. සොබා දම් නීතිය ඔබ කඩ කර ඇත. ඔබ ස්වභාව ධර්මයට එරෙහිව යන නිසා මම ඔබ අතහැර වෙන ගසක් සොයා යමි." ඒ ඇසූ මුව වැද්දා දුනු ඊතල බිම හෙලා "ඔව් අදට ගැලවුණා. මම හිතූ හැටි වැරදුණා. ඊත් හැමදාම ගැලවෙන්න හිතන්න එපා" යි පැවසී ය. එදා මුවකුව සිටි බෝසත්හු මෙසේ පිළිතුරු දුන් හ.

"වැද්දාණනි, ඇත්තටම ඔබට අද වැරදුණා. හැබැයි ඔබේ කර්මයට නම් කවදාවත් වරදින්නේ නෑ. නොවරදවාම ඔබ පස්සේ කර්මය එනවා ඇති."

"මහණෙනි, දේවදත්ත මෙසේ එදත් මා ඝාතනය කරන්න වෑයම් කළේ" යි වදාළ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, 'මාලුවා' නම් වැල් වර්ගය සල් ගසේ එතී එය මරා දමයි. පාපයත් ඒ වගෙයි. මිනිසා වටා එතෙන පාපය හා දුරාචාරය ඔහු අපාදුකට හෙළයි"යයි වදාරා මේ ගාථාව ද දේශනා කළ සේක.

**විවරණාත්මක අනුවාදය (162 ගාථාව)**

**යස්ස අච්චන්ත දුස්සීල්‍යං සාලං මාලුවා ඉව ඔතතං**
**දිසො නං යථා ඉච්ඡති සො අත්තානං තථා කරොති**

**යස්සඃ** යමෙකුගේ; **අච්චන්ත දුස්සීල්‍යංඃ** ඒකාන්ත දුශ්ශීලභාවය; **සාලංඃ** සල් ගසක්; (වැළඳගෙණ සිටි) **මාලුවා ඉවඃ** මාලුවා (නම් වූ) වැලක් මෙන්; **ඔතතංඃ** (ඔහු) වැළඳගෙණ සිටියේ; **දිසොඃ** සතුරෙක්; **නංඃ** ඒ (තමා ගේ) සතුරාට; **යථාඃ** යම් සේ; **ඉච්ඡතිඃ** (අනර්ථ කරනු) කැමති වේ ද; **සොඃ** ඒ දුශ්ශීල තෙමේ; **අත්තානංඃ** තමහට; **තථාඃ** එසේ; **කරොතිඃ** (අනර්ථ) කරයි.

යමෙක් පරම දුස්සීලතාවයෙන් වෙලී ජීවත් වෙයි නම් සල් ගසක එතුණු මාලුවා වැලක් මෙන් හෙතෙම එයින් ම විනාශයට පැමිණෙයි. ඔහු ගේ හතුරන් ඔහුට යම් අනර්ථයක් වේවා යි බලාපොරොත්තු වෙයි නම් ඒ අනර්ථය හෙතෙම තමාට කර ගනියි.

**විවරණය**

**අච්චන්තදුස්සීල්‍යංඃ** ඉතා දුසිල් බවය. සුසරිත පිරුමෙන් ගිහි පිළිවෙත නිදොස්ව නොරැක අකුසල් කරන ගිහියා තුළ පවත්නා තද දුසිල්කමය. මහණ පිළිවෙත සුරැකි කොට නොවඩනා පැවිද්දා තුළ පවත්නා තද දුසිල්කමය. මෙය යෙදුනේ දෙව්දත් තෙරුන් ගේ චර්‍යාව අරබයා හෙයින් වඩාත් ගැලපෙන්නේ භික්ෂු ජීවිතයේ දුශ්ශීලතාව අරබයා ය. භික්ෂු නමක ගේ බරපතල ම සීල භේද වශයෙන් හඳුන්වන්නේ පාරාජික හතර හා සංඝාදිසේස දහ තුනය.

**සාලං මාලුවා ඉවඃ** සල් ගසක එතුණු මාලුවා වැලක් මෙන්ය. මාලුවා වැලේ පත් ගොටු සේ උඩුකුරුව සිටි. වැසිවැස ඒ පත් ගොටු වල වතුර පිරුණු කල ඒ වැල වැළඳ ගෙන සිටි සල් රුක බිඳ සුණුවිසුණු කරන්නේය.





*තමාට අවැඩ පිණිස පවත්නා දේ කරන්නට ඉතා පහසු ය. හිත පිණිස පවත්නා දේ කරන්නට ඉතා අපහසු ය.*

163. සුකරානි අසාධූනි
අත්තනො අහිතානි ච
යං වෙ හිතඤ්ච සාධුඤ්ච
තං වෙ පරමදුක්කරං (12:7)

පව් වැඩ නරක වැඩ - කරන එක නම් පහසුයි
පහසුයි අහිත වැඩ - තමන්ට විපත් ගෙන එන
තමන්ට යහපතක් - සිදුවන සත් ක්‍රියාවන්
කරන එක හොඳට ම - අමාරුයි අපහසු වෙයි.

# තමන්ට හිත වැඩ - නොවේ පහසු වැඩ

## 12 (7) සංඝභේදයට උත්සාහ කිරීම පිළිබඳ කතා වස්තුව (163 ගාථාව)

සංඝයා භේද කිරීමේ ආනන්තරිය මහා පාප කර්මය කරගත් **දේවදත්ත ස්ථවිරයන්** අරබයා මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ විසින් වේළුවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි දේශනා කරන ලදී.

වරක් බුදුරදුන් වේළුවනාරාමයෙහි දහම් දෙසමින් වැඩහුන් කල දෙව්දත් තෙරණුවෝ උන්වහන්සේ වෙත පැමිණ යෝජනාවක් ඉදිරිපත් කළ හ."සමිඳුනි, දැන් ඔබ මහළුයි. එහෙයින් ඔබ වහන්සේ විවේක ගන්න. සංඝයා පාලනය කිරීම මට බාර දෙන්න" භාග්‍යවතුන් වහන්සේ "ඔබ වැනි අයෙක් මෙයට නුසුදුසුයි. ඔබට එය කළ නො හැකියැ"යි පවසා එය ප්‍රතික්ෂේප කළ හ.

එදා පටන් බුදුන් කෙරේ වෛර බැඳගත් දෙව්දත් බුදුන් මැරීමට තුන් වරක් ම වෑයම් කළේ ය. සියළු උපක්‍රම නිරර්ථක වූ තැන හේ අළුත් උපක්‍රමයක් අත්හදා බලන්නට සිතා බුදුරදුන් හමුව සංඝයාට යාවජීව වශයෙන්

1. වනගතව විසිය යුතු ය.
2. පිණ්ඩපාත භෝජනයෙන් පමණක් ජීවත් විය යුතු ය.
3. පාංසුකූල චීවරය පමණක් පරිහරණය කළ යුතු ය.
4. රුක් මුල් වලම වාසය කළ යුතු ය.
5. මස් මාංශ අනුභවයෙන් වැළකිය යුතු ය.

යන ශික්ෂා පණවන සේ ඉල්ලා සිටියේ ය. එහෙත් භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කර සිටියේ ඒවා භුදෙක් ස්වේච්ඡාවෙන් අනුගමනය කළ හැකි දේ මිස දිවිහිමියෙන් අනිවාර්‍යයෙන් පිළිපැදිය යුතු දේ ලෙස පැනවීම අපහසු බව ය.

මෙය දෙව්දත්ට කදිම අවස්ථාවක් විය. "මේ නීති දැනට පවත්නා විනය නීති වලට වඩා හොඳය. එහෙත් මෙබඳු අගනා දේ සංඝයාට අනිවාර්ය කරන්නට බුදුහු අකැමැති වෙති" යි හේ පතුරුවා හැරියේ ය. ඇතැම් අනුවණ භික්ෂූහු ස්වල්ප දෙනෙක් දෙව්දත් නිවැරදි යැයි සිතූ හ. එහෙයින් ඔහුට යම් පිරිස් බලයක් ගොඩ නැගෙමින් තිබිණ. මේ අතර දිනක් දෙව්දත් කැඳවූ භාග්‍යවතුන් වහන්සේ "ඔබ සංඝයා අතර භේදයක් ඇති කිරීමට සැලසුම් කරන බව සැබෑ ද?"යි විමසූ හ.

"සැබෑය" යි ඔහු කී විට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ හ. "දේවදත්ත, එය බලගතු අපරාධයකි. ඔබ එයින් ම විනාශයට පත් වනු ඇත." එහෙත් ඒ අවවාදය ගණනකට නො ගත් දෙව්දත් තෙරණුවෝ ආනන්ද හිමියන් රජගහ නුවර පිඬු සිඟා වඩිනා අතර හමු වී "ආනන්ද, මම අද සිට වෙනම උපෝසථය කරමි. බුදුරදුන්ට පක්ෂපාත භික්ෂූන් සමඟ නොව මට පක්ෂපාත පිරිස සමඟ වෙනම පොහොය කරමි. සෙසු විනය කම් ද කරමි' යි පැවසී ය. ආනන්ද මහ තෙරණුවෝ ද ඒ බව බුදුරදුන්ට දැනුම් දුන් හ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "දෙව්දත් කරන්නට යන්නේ බලගතු අපරාධයකි. එහි විපාකය වන්නේ ඔහු අවීචිමහා නරකාදියෙහි ඉපදීමයි. පව්කම් කිරීම පහසු ය. අපහසු වන්නේ හොඳ වැඩ කිරීම ය. තමන්ට යහපතක් වන හොඳ වැඩ ඉතා දුෂ්කර ය." යනුවෙන් වදාළ හ.

කෙසේ වුවද පන්සියයක් පමණ භික්ෂූන් තම පක්ෂයට හරවා ගෙන ගයා ශීර්ෂයට ගිය දේවදත්ත ස්ථවිරයෝ එහි තම නව සසුන ඇරඹූ හ. එහෙත් සැරියුත්-මුගලන් අගසවු තෙරවරු එහි ගොස් ධර්මදේශනා කර සඟ පිරිස යළි බුදුරදුන් වෙත ම කැඳවා ගෙන ආ හ.

**විවරණාත්මක අනුවාදය (163 ගාථාව)**

**අසාධූනි අත්තනො අහිතානි ච සුකරානි යං හිතඤ්ච**
**සාධුඤ්ච තං වෙ පරමදුක්කරං**

**අසාධූනි ච**: අයහපත් වූ ද; **අත්තනො**: තමා හට; **අහිතානි**: අහිත පිණිස පවතින්නා වූ ද දේ; **සුකරානි**: (කිරීම) පහසු ය; **යං**: යමක්; **හිතඤ්ච**: හිතකර ද; **සාධුඤ්ච**: නිරවද්‍ය ද; **තං**: ඒවා (කිරීම); **වෙ**: ඒකාන්තයෙන් ම; **පරමදුක්කරං**: අතිශයින් දුෂ්කරය.

අයහපත් වූත් තමන්ට විපත් පිණිස පවතින්නා වූත් දේ කිරීම පහසු ය. යමක් හිතකර නම්, නිවැරදි නම් ඒ දේ කිරීම අතිශයින් දුෂ්කර ය.

**විවරණය**

**දේවදත්ත**: පරම මානව දයාවෙන්, ආත්මාර්ථාභිලාෂයෙන් තොරව ජන හිත වැඩ වඩන්නට ධර්මදූත සේවය ඇරඹූව ද භාග්‍යවතුන් වහන්සේට එහිලා අනන්ත සම්බාධ එළැඹුණෝ ය. උන්වහන්සේට දරුණු නින්දා-ප්‍රලාප, බොරු චෝදනා, නිග්‍රහ ලැබුණෝ ය. බොහෝ විට මේ නින්දා කළෝ තරඟකාරී, ශාස්තෘවරු ය. එහෙත් ඒ කිසිවෙක් දෙව්දත් තරම්, ලොකු හානියක් නො කළ හ. ඒ ශාස්තෘවරුන් ගේ මූලික දාර්ශනික සංකල්ප, ආගමික චාරිත්‍ර වාරිත්‍ර, යාග හෝම විධි, පෞද්ගලික පැවතුම් ආදී බොහෝ දේ බුදුරදුන් අතින් විවේචනයට ලක් වුව ද ඔවුහු චරිත ඝාතනයට වෑයම් කලත් බුදුරදුන් මරා දැමීමට උත්සාහ නො කළ හ. එහෙත් දෙව්දත්, තුන් වරක් ම උන්වහන්සේ මරන්නට වෑයම් කළේ ය. ඇඟෙහි ලේ ද සෙලැවී ය. නෑ කමින් මස්සිනා වුව ද හේ සසර පටන් බැඳගත් වෛරයක් නිසා මෙ බඳු දුෂ්ට ක්‍රියා කළේ ය. දෙව්දත් මේ දෑ කළේ බුදුරදුන් ගේ ඉවසීමේ ගුණය ලොව පතළ කිරීමට යැයි පවසන මහායානිකයෝ ඔහු අනාගතයේ 'දේවරාජ' නමින් බුදුවෙතැයි ද කියති.





*යම් අනුවණයෙක් ලාමක අදහසින් අරියයන්ගේ අනුසස්න වළකා ද එය ඔහු ගේ නැස්ම පිණිස නිපදනේ ය.*

164. යො සාසනං අරහතං
අරියානං ධම්ම ජීවිනං
පටික්කොසති දුම්මෙධො
දිට්ඨිං නිස්සාය පාපිකං
ඵලානි කට්ඨකස්සෙව
අත්තඝඤ්ඤාය ඵල්ලති (12:8)

දැහැමින් දිවි ගෙවන - උතුම් මහ රහතුන් ගේ
සසුනට අමනයෙක් - මිසදිටුගත් හේතුවෙන්
කළෝතින් බාධා - එයම ආපසු කැරකී
විපත් දෙයි ඔහුටම - උණ ගහක් පල ගත් මෙන්

# වැනසෙති නපුරෝ විහින්

## 12 (8) කාල තෙරුන් ගේ වත (164 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි මේ ගාථාව උන්වහන්සේ විසින් වදාරන ලද්දේ **කාල** නම් තෙරුන්ගේ පැවතුම් මුල් කර ගෙන ය.

සැවැත් නුවර එක් උපාසිකාවක් කාල නම් තෙර කෙනෙකුන්ට පැහැදී දිනපතා සිය නිවසට වැඩම කරවා දන් දෙන්නී ය. එහෙත් ඇය කිසි කලෙක බුදුරදුන්ගෙන් බණක් අසා නො තිබිණි. අසල්වැසි ජනයා නිතර බුදුන් දක්නට ගොස් දන් දී බණ අසා අවුත් බුදුරදුන් ගැන හා ධර්‍මය ගැන කරන කතා ඇසූ ඇයට ද බුදුන් දැක ගැනීමේ බලවත් ආශාවක් ඇති විය. ඒ පිළිබඳව කාල තෙරුනට දැනුම් දුන් විට "මැය බුදුන් හමුවට ගොස් බණ ඇසුවහොත් මා කෙරේ ඇති ප්‍රසාදය අඩු විය හැක. එවිට අලාභය වන්නේ මට ය"යි සිතා එය වැළකූ හ. තුන් වතාවක් ම ඇයගේ ගමන තෙරුන් ගේ කතා නිසා වැළකින. අන්තිමේ ඕ තනිවම තීරණයක් ගෙන හිමිනමට දානය පිස තබා සංග්‍රහ කටයුතු දියණියට පවරා තමා දෙව්රමට ගියා ය.

වෙනදා මෙන් කාල තෙරුන් නිවසට පැමිණි විට උපාසිකාව වෙනුවට ඇයගේ දියණිය උවටැන් කරන්නට සැරසුණෙන් උපාසිකාව කොහිදැයි විමසුවේය. උපාසිකාව බුදුරදුන් දක්නට ගිය බව අසා දැන ගත් තෙරණුවෝ "බුදුරදුන් ගැඹුරු බණ වදාරා උපාසිකාව දැනුවත් කළහොත් එයින් මට හානි වෙති"යි සිතා දන් වැළඳීම පසෙක ලා වහා දෙව්රමට දිව ගොස් "සමිඳුනි, මගේ උපාසිකාවට නුවණ මඳය. ගැඹුරින් බණ නොකියා දානානිශංස ටිකක් පමණක් කියනු මැනැවි" යි පැවසී ය. එහෙත් බුදුහු "අනුවණ මහණ, ඔබ ගේ අඥානකම හා මිසදිටු හේතුවෙන් මගේ දහමට නිග්‍රහ නොකරව. ඔබ ඔබේ ම විනාශය ළඟා කර ගන්නෙහි ය." නිග්‍රහ කොට කළ දහම් දෙසුමෙන් උපාසිකාව සෝවාන් වූවා ය.

### විවරණාත්මක අනුවාදය (164 ගාථාව)

**යො දුම්මෙධො පාපිකං දිට්ඨිං නිස්සාය, අරහතං ධම්ම ජීවිනං අරියානං සාසනං පටික්කොසති කට්ඨකස්ස ඵලානි ඉව අත්තඝඤ්ඤාය ඵල්ලති**

**යො**: යම්; දුම්මෙධො: අනුවණයෙක්; **පාපිකං**: පාපී (ලාමක); **දිට්ඨිං**: දෘෂ්ටිය; **නිස්සාය**: හේතුවෙන්; **අරහතං**: රහත් වූ; **ධම්ම ජීවිනං**: දැහැමින් ජීවත් වන; **අරියානං**: ආර්යයන්ගේ; **සාසනං**: අනුශාසනාව; **පටික්කොසති**: වළකයි නම් (එය ඔහුගේ); **කට්ඨකස්ස**: උණ ගසේ; **ඵලානි ඉව**: ගෙඩි මෙන්; **අත්තඝඤ්ඤාය**: තමා ගේම විනාශය පිණිස; **ඵල්ලති**: පල ගන්නේය. හැදෙන්නේය.

යම් අනුවණ තැනැත්තෙක් තමා ගේ වැරදි අදහස් නිසා ධර්මානුකූලව ජීවත් වන ආර්‍ය වූ රහත් උතුමන් ගේ ධර්මයට බාධා කරන්නේ නම්, උණ ගහේ හට ගත් ගෙඩි උණගහේ විනාශයට ම හේතුවන්නා සේ ඔහු ගේ එම ක්‍රියාවෙන් ඔහුම විනාශයට පත් වෙයි.

### විවරණය

**දිට්ඨි**: හෙවත් දෘෂ්ටි නම්, පිරිසිදු අවබෝධය හෝ අත් දැකීමකින් තොරව යම් යම් දේ පිළිබඳව ඇති කරගන්නා කාල්පනික අදහස් ය. අනුන් ගැන අසා දැන ගැනීමෙන් හෝ තාර්කිකව සිතා බැලීමෙන් මෙබඳු කාල්පනික දෘෂ්ටි හෙවත් දැඩිව එල්බ ගන්නා චින්තන ඇති විය හැක. ඇතැම් දෘෂ්ටි හිතකර හෙයින් ඒවා සම්මා දිට්ඨි වශයෙන් ද හානි කර දෘෂ්ටි මිච්ඡා දිට්ඨි වශයෙන් ද හඳුන්වනු ලැබේ. 'දිට්ඨි' යන්න වැඩි වශයෙන් යෙදෙන්නේ මිච්ඡා දිට්ඨි සම්බන්ධයෙනි. සම්මා දිට්ඨි වුව ද ප්‍රායෝගික අර්ථසාධනය පිණිස උපයෝගි කර ගත්ත ද විමුක්තිය ලැබීමේ දී හැර දමනු ලැබේ. යථා තත්ව දර්ශනය හඳුන්වනු ලබන්නේ දිට්ඨි වශයෙන් නොව දර්ශන වශයෙනි. '**දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා - දස්සනේන සම්පන්නො**' යි දක්වන්නේ එහෙයිනි.

මිථ්‍යා දෘෂ්ටි, පාපී හා දුෂ්ට අපේක්ෂාවනට හා චර්‍යාවනට පාදකව සිටින හෙයින් සහමුලින්ම ප්‍රතික්ෂේප කළ යුතු බව දැක්වෙයි. ''මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිය තරම් නූපන් අකුශල ධර්මයන් ගේ උත්පාදයටත්, උපන් අකුශල ධර්මයන්ගේ වෘද්ධියටත් හේතුවන වෙන දෙයක් නැත. මිථ්‍යා දෘෂ්ටිය තරම් නූපන් කුසල ධර්මයන් ගේ උත්පත්තියට බාධා කරන, උපන් කුශලයා ගේ විනාශයට හේතු වෙන වෙනත් දෙයක් නැත. මරණ මොහොතෙහි දී සත්වයන් ඒ අපායට, නිරයට, දුගතියට ඇදගෙන යන තවත් අන් ධර්මයක් මිථ්‍යා දෘෂ්ටිය තරම් ලොව කොහිවත් නැත. මිථ්‍යා දෘෂ්ටියෙන් පිරුණු පුද්ගලයා කවර දෙයක් කළත්, කවර දෙයක් උරුම කර ගත්තත්, කවර ආශා, ප්‍රාර්ථනා තිබුණත් ඒ සියල්ල ඔහු අප්‍රිය, අමනාප, අප්‍රසන්න දුක්ඛස්කන්ධයක් කරා යොමු කරයි.





*තම තමා ගේ පිරිසිදු බව හා අපිරිසිදු බව තම තමා පිළිබඳව ය. අනිකෙක් අනිකෙකු පිරිසිදු නො කෙරේ.*

165. අත්තනා'ව කතං පාපං
අත්තනා සඞ්කිලිස්සති
අත්තනා අකතං පාපං
අත්තනා'ව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං
නාඤ්ඤො අඤ්ඤං විසොධයෙ (12:9)

තමන් කෙලෙසෙන්නේ - තමන් කළ පාපෙන්ම ය
නො කළහොත් පාපය - තමා පිරිසිදු වේම ය
පිරිසිදු - අපිරිසිදු - වීම කළ දේ අනුව ය
කෙනෙකු තව කෙනකුන් - පිරිසිදු කළ නොහේම ය.

# පිරිසිදු බව හා අපිරිසිදු බව - දෙකම තමන් අතමය
## 12 (9) චූලකාල උපාසකයා ගේ කතාව (165 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසමින් **චූලකාල** නම් ගෘහස්ථ ශ්‍රාවකයකු මුල් කරගෙන මේ ගාථා ධර්මය දේශනා කර වදාළ සේක.

චූලකාල උපාසක තැන එක් පුන් පොහෝදාක අටසිල් සමාදන්ව රැය විහාරස්ථානයේ ම ගත කළේ ය. අළුයම නැඟිට මුහුණ සෝදාගනු පිණිස ලිඳ ලඟට ගිය ඔහුට බලවත් අතවරයකට ලක් වන්නට සිදු විය. ඔහු මුහුණ සෝදන අතරෙහි අළුයම ගෙයකින් බඩු පැහැර ගනිමින් සිටි සොර මුලක් ගෙහිමියන් විසින් ලුහුබඳිනු ලැබිණ. එක් සොරෙක් දෙව්රම් වෙහෙර මැදින් පලා යන්නේ තම අතේ තිබුනු බඩු පොදියක් චූලකාල ඉදිරියට දමා පැන දිව්වේ පසු පස එන්නන්ගේ අවධානය වෙන'තක යවා ගැලවී ගනු පිණිස ය. සොර දිව ආ දිශාවටම දිව ආ මිනිස්සු මුහුණ සෝදන චූලකාල ලඟ නැවතී ඔහු ලඟ තිබූ බඩු ද දැක "මේ හොරා රෑ තිස්සේ ගෙවල් බිඳ දැන් රැය පන්සලේ භාවනා කළ බවක් හඟවන්නට තැත් දරයි. එයින් අප රැවටිය නො හැක. මේ තිබෙන්නේ හොර බඩුය"යි ඔහු අල්ලා ගෙන පහර දෙන්නට පටන් ගත් හ. "මම සොරකම් නො කළෙමි" යි ඔහු කෑ ගසද්දී උදෙන් ම දිය ගෙන යනු පිණිස ආ කාන්තාවෝ "මේ චූලකාල උපාසක මහතා නො වේද? මෙතුමන් සොරකම් කරන කෙනෙක් ද? මේ නම් බරපතල වැරදීමකි. ඔහුට පහර නො දෙන්නැ"යි නන් විධියෙන් පවසා ඔහු බේරා ගත් හ.

අනතුරුව භාග්‍යවතුන් වහන්සේ හමුවට ගිය චූලකාල " ස්වාමීනි, දිය ගෙන යන්නට ආ කතුන් නිසා යන්තම් පණ ගලවා ගතිමි" යි පැවසී ය. සම්පූර්ණ සිද්ධිය අසා දැනගත් භාග්‍යවතුන් වහන්සේ "උපාසකය, දිය ගෙනයන්නට ආ කතුන්ගේ වචනය පමණක් නොව ඔබ ගේ ගැලවීම සඳහා මෙතුවක් දුසිරිතයෙහි නො යෙදී ගත කළ දැහැමි ජීවිතය ද හේතු විය"යි පවසා "ඔබ මෙතෙක් කිසිදා සොරකම් කළේ නැත. කිසිදා පව්කම් ද නො කළ හෙයින් ඔබ රැකිනි. පව්කම් නො කරන අය නිරයෙහි දුක් නො විඳිති. දෙව් ලොව සැප විඳිති" යි දේශනා කළ හ.

**විවරණාත්මක අනුවාදය (165 ගාථාව)**

**අත්තනා එව පාපං කතං අත්තනා එව සඞ්කිලිස්සති**
**අත්තනා පාපං අකතං අත්තනා එව විසුජ්ඣති සුද්ධි**
**අසුද්ධි පච්චත්තං අඤ්ඤො අඤ්ඤං න විසෝධයෙ**

**අත්තනා එව**: තමා විසින් ම; **පාපං**: පව්; **කතං**: කළේ නම්; **අත්තනා එව**: තමාම; **සඞ්කිලිස්සති**: ඉන් කෙලෙසෙන්නේ ය; **අත්තනා**: තමා විසින්; **පාපං**: පව්; **අකතං**: නො කරණ ලද නම්; **අත්තනා එව**: තමා විසින් ම; **විසුජ්ඣති**: විශුද්ධියට පත් වෙයි; **සුද්ධි අසුද්ධි**: පිරිසිදු බව හා අපිරිසිදු බව; **පච්චත්තං**: තමන් විසින් කර ගන්නා දෙයකි; **අඤ්ඤො**: අනෙකෙක්; **අඤ්ඤං**: අනෙකෙකු; **න විසෝධයෙ**: පිරිසිදු නො කරන්නේ ය.

තමා කළ පාපයෙන් තමා ම කෙළෙසෙයි. තමා පව් නොකර සිටීමෙන් තමා පිරිසිදු වෙයි. පිරිසිදු බව හා අපිරිසිදු බව පෞද්ගලිකව තමා කරගන්නා දෙයකි. එක් අයකු විසින් තවත් අයකු පිරිසිදු කිරීමක් කළ නො හැක.

**විවරණය**

**අඤ්ඤො අඤ්ඤං න විසෝධයෙ**: බෞද්ධයෝ තම විශුද්ධිය හෙවත් විමුක්තිය කිසිවකු වෙතින් අපේක්ෂා නො කරති. භාග්‍යවතුන් වහන්සේ විසින් උගන්වා ඇත්තේ තම තමා ගේ වයර්යාව අනුව තමන් පිරිසිදු වන බව ය.

**විසුද්ධි**: යන්නෙන් සාමාන්‍යයෙන් විමුක්තිය හෙවත් නිර්වාණය අදහස් වෙයි. එහෙයින් බෞද්ධ ආගමික ප්‍රතිපදාව විසුද්ධි මග්ග වශයෙන් හැඳින් වේ. භාග්‍යවතුන් වහන්සේ විසින් රථ විනීත සූත්‍රයේ දී සප්ත විසුද්ධියක් ගැන සඳහන් කර ඇත. උපතිස්ස හිමියන් විසින් ලියන ලදුව දැනට චීන බසින් පමණක් අවශිෂ්ටව පවත්නා විමුක්ති මග්ග නම් ග්‍රන්ථය හා බුද්ධඝෝෂ හිමියන් විසින් ලියන ලදුව ථෙරවාදී ලෝකයා විසින් ආදරයෙන් පරිශීලනය කරනු ලබන විසුද්ධි මග්ගයේ ද තේමාව වී ඇත්තේ සත්ත විසුද්ධියයි. රථ විනීත සූත්‍රයෙහි දක්වා ඇත්තේ යමෙකු රථයෙන් රථයට මාරු වෙමින් දිග ගමනක් යන පරිද්දෙන් සීල විසුද්ධිය ලත් තැනැත්තා අනතුරුව චිත්ත විසුද්ධියට මාරුවෙමින් ක්‍රමානුකූලව සත්ත විසුද්ධියම ලබන බවයි. සප්ත විශුද්ධිය නම්,

1. සීල විසුද්ධි
2. චිත්ත විසුද්ධි
3. දිට්ඨි විසුද්ධි
4. කංඛා විතරණ විසුද්ධි
5. මග්ගා'මග්ග ඤාණ දස්සන විසුද්ධි
6. පටිපදාඤාණ දස්සන විසුද්ධි
7. ඤාණ දස්සන විසුද්ධි යන හතය.

මේ සත්ත විසුද්ධීන් අතුරින් සත් වැන්න වූ ඤාණ දස්සන විසුද්ධිය චතුර්විධ ඵල චිත්තයන් ගෙන් ඕනෑම එකක් ආශ්‍රිත ය. සෑම ඵල චිත්තයක් ම එකම මොහොතේ කාර්ය හතරක් ඉටු කරයි. එනම්, පරිඤ්ඤා (තේරුම් ගැනීම) පහාණ (ප්‍රහාණ කිරීම) සච්ඡිකිරියා (සාක්ෂාත් කරණය) භාවනා (ආර්ය අෂ්ටාංගික මාර්ගය වර්ධනය කිරීම) යන හතරයි.





*පරවැඩ නිසා අත්වැඩ නො පිරිහෙළිය යුතු අත්වැඩ මේ මේ ය යි මනාව දැන එහි නියැලිය යුතු.*

166. අත්තදත්ථං පරත්ථෙන
බහුනා'පි න හාපයෙ
අත්තදත්ථං අභිඤ්ඤාය
සදත්ථ පසුතො සියා (12:10)

වැඩියෙන් කළමුත් පර වැඩ
නො හෙළන් කිසිවිට අත් වැඩ
නිසි සේ දැන ගෙන අත් වැඩ
කළ යුතු වන්නේ හිත වැඩ

# අනුන්ට හිත වැඩ කරන්න - සිය වැඩ අමතක නො වෙන්න.
## 12 (10) අත්තදත්ථ තෙරුන් ගේ කතා වස්තුව (166 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වසමින් **අත්තදත්ථ තෙරුන්** ඇරබ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා ධර්මය දේශනා කර වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ තමන් සිවු මසකින් පිරිනිවන් පානා බව දේශනා කළ විට බොහෝ පෘථග්ජන භික්ෂූහු කළ යුතු නො කළ යුතු දේ ගැන හිතා ගන්නට බැරි තත්ත්වයට පත් වූ හ. එහෙයින් ඔවුහු කළ යුතු නො කළ යුතු දේ ගැන කතා කරති. ඇතැම් විට බුදුරදුන් සමීපයේ ම හැසිරෙති.

එහෙත් අත්තදත්ථ නම් තෙරුන් "භාග්‍යවතුන් වහන්සේ අප අතර වැඩ වසන්නේ තව මාස හතරක් නම්, අපතේ යවන්නට කාලයක් නැත්තේ ය. වහ වහා උත්සාහ කොට පෘථග්ජන භාවයෙන් මිදිය යුත්තේය" සිතා භික්ෂු සංඝයා ගේ ආශ්‍රයෙන් ඈත්ව සිට භාවනා වඩන්නේ ය. පෙර මෙන් ඒ තෙරුන් තමන් ඇසුරට නො පැමිණ නිලීනව හිඳීම ගැන නො පහන් තෙරවරු භාග්‍යවතුන් වහන්සේට ඒ බව දැන් වූහ.

භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුනම ගේ අර්ථවත් හැසිරීම ගැන කාටත් පැහැදිලි කරනු පිණිස උන් වහන්සේ සඟ මැදට කැඳවා "මහණ, ඔබ මේ දිනවල පිරිසෙන් බැහැරව එකලාව කල් ගෙවන්නේ මක්නිසාදැයි පහදන්න" යි පැවසූ හ. අත්තදත්ථ තෙරණුවෝ "ස්වාමීනි, ඔබ වහන්සේ තව මාස හතරකින් පිරිනිවන් පානා බව දැනගත් දා සිට මාගේ අධිෂ්ඨානය නම්, ඔබ වහන්සේ පිරිනිවන් පාන්නට පෙර පෘථග්ජන භූමියෙන් ඉවත් වීමට ය. එහෙයින් සඟ මැදට නො ආවෙමි"යි පැවසී ය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, මා ගරුකරන මට හිතවත් ශ්‍රාවකයෙකු විසින් කළ යුත්තේ වැඳුම් පිදුම් කිරීම නො ව, මා උගන්වා ඇති ධර්මය ක්‍රියාත්මක කිරීමයි. අන්‍යයනට වැඩ කිරීම සඳහා තමන් ගේ වැඩ අතපසු නො කළ යුතුය'' යි අත්තදත්ථ තෙරුන්ගේ පිළිවෙත වර්ණනා කර මේ ගාථාව දේශනා කළ හ.

### විවරණාත්මක අනුවාදය (166 ගාථාව)

**බහුනා අපි පරත්ථේන අත්තදත්ථං න හාපයෙ**
**අත්තදත්ථං අභිඤ්ඤාය සදත්ථපසුතො සියා**

**බහුනා අපි**: බොහෝ වූ; **පරත්ථේන**: පරාර්ථය නිසා; **අත්තදත්ථං**: ආත්මාර්ථය; **න හාපයෙ**: නො පිරිහෙලන්නේ ය; **අත්තදත්ථං**: ආත්මාර්ථය; **අභිඤ්ඤාය**: මනාව දැන; **සදත්ථපසුතො සියා**: තම අභිවෘද්ධිය සලසා ගන්න.

පරාර්ථයෙහි වැඩි වැඩියෙන් යෙදෙමැයි තමන් ගේ වැඩ අතපසු නොකළ යුතු ය. තමාට කරගත යුතු වැඩ මැනවින් දැන තමන්ට හිත වැඩ කර ගැනීම මැනවි.

### විවරණය

**සදත්ථ පසුතො සියා**: යන අවවාදය අතිශය වැදගත් ය. පුද්ගලයකු විසින් සාධනය කර ගත යුතු උත්තරීතර අධිගමය නම් නිර්වාණය යි. එම සදර්ථය ලබා ගැනීම පසෙක ලා පුදපූජා ආදියෙහි නිරත වීම හෝ ගණසංගණිකාව හෙවත් පිරිස් මැද කතා බහෙන් කල් යැවීම ප්‍රිය නො කළ අත්තදත්ථ තෙරහු බුදුරදුන් ගේ ප්‍රශංසාවට ලක් වූ හ.

නිර්වාණය නම් කවර විදියේ සදර්ථයක් ද? මානව සන්නිවේදනයේ ප්‍රධාන තම මාධ්‍යය වූ භාෂාව, නිර්වාණය පිළිබඳ ප්‍රමාණවත් නිර්වචනයක් ඉදිරිපත් කිරීමෙහි ලා පොහොසත් නො වේ. එහෙයින් භාෂා මාධ්‍යයෙන් නිර්වාණය විවරණය කිරීමට ගත් බොහෝ ප්‍රයත්න අසාර්ථක වී ඇත. විශේෂයෙන් බොහෝ නූතන විචාරකයන් ගේ පරස්පර විරෝධි අදහස් විවරණය දෙස බලන විට ඔවුන් ගැටළුවක් නිරාකරණය කරනවා නොව එය අවුල්ජාලයක් බවට පත් කරන බව හැඟේ. භාෂාව නිර්මාණය කර ඇත්තේ ඉන්ද්‍රියානුසාරයෙන් ලබන අනුභූතීන් ප්‍රකාශ කරනු පිණිසය.

නිර්වාණය වැනි අතීන්ද්‍රිය උත්තරීතර යමක් ගැන ප්‍රකාශ කරන්නට වචන භාෂාවෙහි නො මැත. නිර්වාණය ඉන්ද්‍රියානුසාරී අනුභූතියක් නොව ලෝකෝත්තර යථාර්ථයකි. එහෙයින් එය වාග් විෂයාතික්‍රාන්ත ය. ගොඩ බිම සංචාරයක ගොස් පැමිණි ඉදිබුවා සහ දිගටම ජලයේ වසන මත්ස්‍යයා අතර සිදු වූයේ යැයි කියන සංවාදය මීට කදිම නිදසුනකි. "ඔබ කියන්නේ ඔබ පීනුවා කියන එක නේ?" මාළුවා ඇසී ය. "නැහැ. එහේ පීනන්න බෑ. එහේ ඝණයි. ඒ ඝණ පොළොව උඩ ඇවිදින්න ඕන." ඉදිබුවා එසේ කීව ද මාළුවාට ඒ කිසිවක් තේරුම් ගන්නට බැරි විය. දියර ගතිය නැත්නම්, රැලි නැඟෙන්නේ නැත්නම්, කිමිදීමට හා පිහිනීමට බැරිනම්, එබඳු තැනක් තිබෙන්නට ඉඩක් නැත. මාළුවා එසේ තීරණය කළේ තමන් සතු සංකල්ප ලෝකයෙන් එහා යමක් සිතා ගන්නට අසමත් හෙයිනි. පාලි පොත්වල දක්නා ලැබෙන නිර්වචන කිහිපයක් මෙහි දක්වමු.

"නිර්වාණය නම් තෘෂ්ණාවගේ ම නිරෝධයයි, අතහැරීමයි, එයින් මිදීම යි."

"සියළු සංස්කාර ධර්මයන් ගේ සමථය, සකල ක්ලේෂයන් ගේ ප්‍රහාණය, තෘෂ්ණාව ගේ නිරෝධය විරාගය, සංසිඳීම නිර්වාණ යයි.

"මහණෙනි, අසංඛතය නම් කුමක් ද? රාගය ක්‍ෂය කිරීම, ද්වේෂය ක්‍ෂය කිරීම, මෝහය ක්‍ෂය කිරීම අසංඛතයයි."

"රාධ, තණ්හක්ඛය නම් නිර්වාණයයි"

"මහණෙනි, සියළුම සංඛත හා අසංඛත වස්තූන් විෂයෙහි නො ඇල්ම (විරාගය) නිර්වාණයයි."

"මානය, තෘෂ්ණාව, ආලය, යන මේ සියල්ල උදුරා දමා සංසාර ප්‍රවෘත්තිය ඡෙදනය කර දමා තෘෂ්ණාව ක්‍ෂය කිරීම, අනාලය, සමථය නිර්වාණයයි."

"පඨවි, ආපො, තෙජෝ, වායො යන සතර මහා භූතයන් යම් තැනෙක ප්‍රතිෂ්ඨාවක් නො ලබත් ද, දිග-පළල, සූක්ෂ්ම හා දළ, පුණ්‍ය හා පාප, නාම හා රූප යන මේ සියල්ල සිඳීද යේද, එලොව හා මෙලොව, යාම හා ඊම, ජීවිතය හා මරණය යන සංකල්ප නැත්ද, ඉන්ද්‍රිය ගෝචර වස්තු විද්‍යමාන නො වෙත් ද එබඳු තැනකි නිර්වාණය" නිර්වාණය තෘෂ්ණාව ක්‍ෂය කිරීමෙහි ප්‍රතිඵලය ලෙස සිතීම වැරදිය. නිර්වාණය කිසිවක ප්‍රතිඵලයක් නො වේ. එය ප්‍රතිඵලයක් නම්, එය පටිච්ච සමුප්පන්න ය. එහෙත් නිර්වාණය පටිච්ච සමුප්පන්න වස්තුවක් නො වේ. සත්‍යය හේතුවක් වත් ඵලයක් වත් නො වේ. එය ධ්‍යාන හෝ සමාධි මෙන් යෝගාවචරයකු විසින් උපදවා ගන්නා ආධ්‍යාත්මික තත්ත්වයක් නො වේ.



සනාතන බුද්ධ භාෂිතය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ අසහාය සාමයික මෙහෙය උදෙසා, සිය කාලය හා ශ්‍රමය සපුරා වැය කරමින්, මානව වංශයට දහම් මග හෙළි පෙහෙළි කිරීමේ මහා මෙහෙවරට කැප වී සිටින සිංගප්පූරුවේ ප්‍රධාන සංඝ නායක වේරගොඩ සාරද, ස්ථවිරයන් වහන්සේ අද ලොව වෙසෙන ප්‍රශස්ථතම ධර්‍ම දූත යතිනායක වරයාණන් වහන්සේ නමකි.

1941 නොවැම්බර් මස 27 වනදා දකුණු ලක වේරගොඩ දී උපත ලද මේ යති ප්‍රභූවරයාණෝ, උපාධි ලාභීව, ධර්‍මදූත මෙහෙය ආරම්භ කළේ ඉතා යොවුන් අවධියේ දීමය. දැනට ශතක 6 ක් පුරා ධර්‍මදූත මෙහෙයෙහි යෙදී සිටින ගරුතර වේරගොඩ සාරද යතිනායකයානන් වහන්සේ මුද්‍රිත මාධ්‍යයෙන් සහ විද්‍යුත් මාධ්‍යයෙන් මෙන්ම දුරකථන තාක්ෂණයෙන් පවා අද ලොවට ධර්‍මදානය සපයන්නේ නවීනයන්ගේ මනස හා ආධ්‍යාත්මික ගති-පැවතුම් පිළිබඳ පැහැදිලි අවබෝධයකිනි.

## කතෘ ස්වාමීන්ද්‍රයන් වහන්සේ

වර්තමානික ග්‍රාහක පිරිස, ශ්‍රව්‍ය-දෘෂ්‍ය මාධ්‍ය මගින් දැනුමත් විනෝදාස්වාදයත් ලබන්නට පුරුදු වී සිටින පරපුරක් හෙයින්, ගරුතර වේරගොඩ සාරද හිමිපාණෝ, ඔවුනගේ මනසට සරිලන පරිද්දෙන් බුද්ධ භාෂිතය, ඔවුන් අතට පත් කරන සේක. මුද්‍රිත හා විද්‍යුත් ප්‍රකාශන 700 ක් පමණ ලොවට පිරිනමා සිටින මේ යතිනායකයන් වහන්සේ විසින් සම්පාදිත ධර්ම භාණ්ඩාගාරය නම් ඉංග්‍රීසි කෘතිය දොරට වැඩීමේ උළෙලේ දී, ඒ පිළිබඳ ව එක් දිනක් තුල පමණක් ලැබුණු දුරකථන ඇමතුම් සංඛ්‍යාව 2000 කටත් අධික විය. ඒ නිසා එය සිංගප්පූරු රාජ්‍යයේ ග්‍රන්ථ ප්‍රකාශන ඉතිහාසයේ සුවිශිෂ්ට වාර්තාවකට හිමිකම් කියන්නේය.

දැනට, සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය භාරව වැඩ සිටින ගරු වේරගොඩ සාරද නායක ස්ථවිර පාදයන් වහන්සේ ලෝකයේ බොහෝ දේශයන් හී බුද්ධ ශාසනයේ ප්‍රගතියට හිතකාමී ධර්ම දූත මෙහෙවරක යෙදී සිටින සේක.

එතුමන් ගේ ප්‍රධාන ප්‍රකාශ අතර, සිංහල හා ඉංගිරිසි ධම්මපදයත්, ජාතක කථා පිළිබඳ විද්‍යුත් ප්‍රකාශනයත් ප්‍රධාන තැන් ගනී. එතුමන් විසින්, ඉටු කෙරෙන මහා සාමයික මෙහෙය අඛන්ඩව පවත්වා ගෙන යනු පිණිස, ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් නිදුක් නිරෝගී සුව පැතීම, බෞද්ධ ජනතාවගෙන් ඉටු විය යුතු කෘතඥතා පූර්වක චාරිත්‍රයකි.

කලා කීර්ති එඩ්වින් ආරියදාස

ISBN: 981-00-4938-2

# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත ධම්මපදය
## දහතුන්වන පරිච්ඡේදය

# ලෝක වග්ග



ගරු වේරගොඩ සාරද නාහිමිපාණන් වහන්සේ
සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

(ධර්ම දානය, සෙසු දාන සියල්ලටම වඩා අගනේය.)



**''ධර්ම භාණ්ඩාගාරය''** නැමැති

මෙම වටිනා ධර්ම පුස්තකය

**සාමවිනිසුරු බී.ධර්මදාස පියාණන්ට**

නිවන් සුව පතා ප්‍රකාශනය කරන ලදි.

පූර්ණ අනුග්‍රහකත්වය

**වේරගොඩ සුනන්දා භික්ෂුණිය විසිනි**

# ධර්ම භාණ්ඩාගාරය

## සිතුවම් සහිත
## ධම්මපදය


**කතෘ:**

**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**

ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව

විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය



**සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය**

නො: 1, ජලන් මස් පුටේ, සිංගප්පූරුව 128607

ටෙලි: 65 67783330 65 94656570

94 770589498 / 94 755218421

වේරගොඩ ජයන්ති විහාරය, වේරගොඩ, මීටියාගොඩ

විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

**කර්තෘ**
**ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

**චිත්‍ර ශිල්පි**
පී. වික්‍රමනායක

**සැකසුම**
පියරත්න හේවාබට්ටගේ

**පරිගණක රූපාවලි සහ පූර්ව ප්‍රකාශන මෙහෙය**
පූජ්‍ය වේරගොඩ සුනන්දා භික්ඛුණී
බී. දයා සමරසිංහ
බී. රෝහණ ජයතිස්ස

**පරිගණක සහාය**
ශ්‍යාමනී ප්‍රියලක්‍ෂණා ලේකම්වසම්
ඩබ්ලිව්. මාලා කාන්ති
ප්‍රියංකා බෝධිපක්‍ෂ

**සහාය**
බී. පුෂ්පානී ධම්මලතා
බී. ජේ. ධම්මලතා
ඊ. එම්. ලයනල් මොහොට්ටි
ඊ. එම්. යුගාන් සසංක
ශ්‍රියාලතා කග්ගොඩ ආරච්චි

**පරිගණක ප්‍රකාශන**
සමනල ප්‍රින්ටර්ස්, බටපොල
ටෙලි: +94 777557127

**පිටකවරයේ පින්තූරය**
බර්ටි ගුණසේකර

**මුද්‍රණය**
2013 නොවැම්බර් මස 27 දින, සිංගප්පූරුව

**පිටකවරයේ චිත්‍රය**
*පිටකවරයේ බුදු පිළිමය වේරගොඩ ජයන්ති විහාරයේ බුදුමැදුරෙනි.*
*වර්ෂ 1953 ජුනි 3 වෙනිදා අඹන ලද මෙම බුදු පිළිමය දැනට ශ්‍රී ලංකාවේ තිබෙන*
*දර්ශණීයතම බුදු පිළිමය වශයෙන් සැලකේ. මෙම බුදු පිළිමය ඉදිකිරීමේ පුරෝගාමී වූ අපවත් වී වදාළ*
*ගෞරවාහී පණ්ඩිත යටලමත්තේ වජිරඤාණ නායක මාහිමිපාණන් වහන්සේට නිවන්සුව අත්වේවායි අපි ප්‍රාර්ථනා කරමු.*

මේ ග්‍රන්ථයෙහි ආගත කරුණු පිළිබඳ පූර්ණ හා සදාකාලික අයිතිය හිමි වන්නේ බුදුරජාණන් වහන්සේටයි.
බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් පහල වූ සනාතනික සත්‍යයෝ පුහුදුන් මිනිසුන් විසින් පනවන ලද
තාවකාලික වූත්, අසත්‍ය වූත්, අයිතිවාසිකම් පිළිබඳ නීති රීති පිළිගනු නොලබති.

**පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ**
ටෙලි: 65 67783330 65 94656570
+94 770589498 +94 755218421
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

ISBN: 981-00-4938-2

# ලොක වග්ග






*ලාමක දහම් (පස්කම්) ද, පමා බව ද, මිසදිටු බව ද නො සෙවිය යුතු. සසර නො වැඩිය යුතුය.*

167. හීනං ධම්මං න සෙවෙය්‍ය
පමාදෙන න සංවසෙ
මිච්ඡාදිට්ඨිං න සෙවෙය්‍ය
න සියා ලොකවද්ධනො (13:1)

පහත් වැඩ නො කරනු
පමාවෙන් කල් නො යවනු
මිසදිටුව නො වසනු
ලෞකිකත්වය නො වඩනු

# වඩනු නො යෙදේ ලෞකිකත්වය
## 13 (1) ලාබාල හිමිනමක ගේ පුවතක් (167 ගාථාව)

සාමණේර නමක් නිමිති කර ගෙන භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කර වදාළේ දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයේ ය.

වරක් එක් තෙර නමක් තම ශිෂ්‍ය සාමණේර නමක් ද කැටුව විසාකා උවැසිය ගේ නිවසෙහි දන් පිළිගනු පිණිස වැඩම කළ හ. දානය පිළිගත් උන්වහන්සේ සාමණේර නම එහි ම නවතා කිසියම් කාර්‍ය්‍යයකට පිටත්ව ගිය හ. මේ අතරතුර විසාකාව ගේ මිණිබිරියක් වූ ලාබාල දැරියක් සංඝයාට පිරිනමනු පිණිස පැන් පෙරන අතරතුර තම මුහුණෙහි පිළිබිඹුව දියෙහි දුටුවා ය. එයින් ප්‍රමෝදයට පත් දැරිය පිළිබිඹුව දෙස බලාගෙන මඳ සිනා පහළ කළා ය. සාමණේරයන් වහන්සේ ද ඒ දුටහ. උන්වහන්සේත් ඇය දෙස බලා සිනාසුණා හ. එහෙත් ඒ දුටු දැරිය නො මනාපයට පත්ව "හිස මුඩු කළ සාමණේර නමක් හිනා වෙනවා" යි තරහෙන් පැවසුවා ය. සාමණේර නම ද කෝපයට පත්ව "මම විතරද හිස මුඩු කළේ! ඔබත් ඔබත් හිස මුඩු කළා. අම්මත් හිස මුඩු කළා. තාත්තාත් හිස මුඩු කලා. ඔය ගොල්ල සේරම හිස මුඩු කරපු අය තමයි" යි පැවසී ය.

දෙදෙනාම එකිනෙකාට ඇණුම් බැණුම් කියා ගැනීම නිසා මහා අරගලයක් ඇතිවිණි. ඒ කෝලහල හඬ ඇසුණු විසාකාවෝ දිව අවුත් "මේ කවර නම් අර්බුදයක්දැ" යි ඇසූ විට දැරිය හඬා ගෙන ගොස් සිදු වූ දේ විස්තර කළා ය. ඇය සැනසූ විසාකාවෝ "ස්වාමීනි, මේ පොඩි දැරිය ගේ කතාවට ඔච්චර තරහ ගන්න එපා. කොහොමත් ඉතින් හාමුදුරුවරු හිස මුඩු කරනවනෙ. ඔබ වහන්සේලා හිස මුඩු කරලා නියපොතු කොටට කපලා කෑලි එකතු කරලා මහපු සිවුරක් ඇඳලා පිණ්ඩපාතෙන් ජීවත් වෙන අයනේ. පොඩි එකී කියාපු දේ බොරු නෙමෙයි නේ. ඇයි තරහ ගන්නේ?" යි පැවසුවා හ. "බොරු නෙමෙයි තමයි. ඒ වුණාට ඒක අල්ල ගෙන ඒ දැරිව් මට බැන්නා. එහෙම බනින්න යුක්තියක් නෑ" යි සාමණේර නම කියා සිටියේ ය. මේ මොහොතේ සාමණේර නම ගේ උපාධ්‍යාය තෙරණුවෝ එහි වැඩම කළ හ. තෙරණුවන් සාමණේර නමට අවවාද කරන්නට යාමෙන් තත්ත්වය බරපතල විය. සාමණේර නම බලවත් අමනාපයෙන් සියළු දෙනාට ම එරෙහිව සිටියේ ය. මේ අරගලය මැදට වාසනාවට මෙන් භාග්‍යවතුන් වහන්සේ සම්ප්‍රාප්ත වූ හ. සාමණේර නමට සෝවාන් වීමට පින් මෝරා ඇති බව දිවැසින් දුටු භාග්‍යවතුන් වහන්සේ ඔහු අස්වසාලනු පිණිස සාමණේර නම වෙනුවෙන් කතා කළ හ. "විසාකාවෙනි, සාමණේර නම කියන දේත් අහන්න. මේ පුංචි සාමණේර නම හිස මුඩුකර ඇති බව බොරු නොවෙයි. ඒ වුනත් ඇයි ඒකට කවුරුත් නින්දා කරන්නේ? හිස මුඩු කළේ පැවිදි වෙන්න එහෙම කරන්න අවශ්‍ය නිසා නේ. කෑලි කපා මැසූ සිවුරක් නො ඇඳ, පිඬු සිඟා වළඳන්නේ නැතිව මහණ කම් කරන්නේ කොහොම ද? ඇයි ඒකට කවුරුත් බනින්නේ?" යි වදාළ හ. ඒ ඇසූ සාමණේර නම "හරියට හරි. අපේ ලොකු හාමුදුරුවන්ට වත් විසාකා උපාසිකාවටවත් හරි වැරදි තේරෙන්නේ නැහැ. බුදු හාමුදුරුවෝ විතරයි යුක්ති - අයුක්ති දන්නේ" යි සතුටට පත්ව ප්‍රකාශ කළ හ. සාමණේර නම තමන්ට නැමුණු බව දත් භාග්‍යවතුන් වහන්සේ සාමණේර නමට ලෞකික සිනාවේ ආදීනව දක්වා ධර්ම දේශනා කරමින් මේ ගාථාව ද දේශනා කළ හ.

**විවරණාත්මක අනුවාදය (167 ගාථාව)**

**හීනං ධම්මං න සෙවෙය්‍ය පමාදෙන න සංවසෙ**
**මිච්ඡාදිට්ඨිං න සෙවෙය්‍ය ලොකවඩ්ඪනෝ න සියා.**

**හීනං ධම්මං**: (නරකාදී සතර අපායෙහි උපදනා බැවින්) පඤ්ච කාමගුණ ධර්මයන්; **න සෙවෙය්‍ය**: සේවනය නො කරන්නේය; **පමාදෙන**: කුශල ධර්ම විෂයෙහි පමා බැවින් හෝ මුළා වූ සිහියෙන් යුක්තව; **න සංවසෙ**: එක්ව නොවසන්නේය; **මිච්ඡාදිට්ඨිං**: මිසදිටු; **න සෙවෙය්‍ය**: සේවනය නොකරන්න; **ලොකවඩ්ඪනො න සියා**: චුති පටිසන්ධි වශයෙන් පංචස්කන්ධ ලෝකය වැඩීම නොකළ යුතුය.

ලාමක වූ පස්කම් ගුණය ද, පමා බැවින් කල් යැවුම ද, මිසදිටු බව ද, සේවනය කිරීමෙන් සසර වඩන්නකු නොවන්න.

**විවරණය**

**හීනං ධම්මං**: ලාමක වූ දහම් ය. පස්කම් ය.
හීනං : සසර බැඳුමට හා දුකට හේතුවන හෙයින් ද තිරිසන් ආදී සතුන් විසින් පවා සෙවිය යුතු හෙයින් ද ලාමක බවය. පස්කම් ඇස, කන, නාසය, දිව, කය යන මොවුනට ගොදුරු වූ **රාග**, **ද්වේෂ**, **මෝහ** යන මොවුන් ගේ දැඩිකම් පානා **රූප**, **ශබ්ද**, **ගන්ධ**, රස හා පහස යන පහයි. මේ පහ, පහත් ගති ඇති සතුන් විසින් පවා ඇලීම්-සෙවීම් කටයුතු හෙයින් ද පහත් ගතිවල ඉපැදීම් ඇති කරන හෙයින් ද නො සෙවිය යුතු හීන දහම් වශයෙන් සලකනු ලැබේ.

**මිච්ඡාදිට්ඨිං**: මිථ්‍යා දෘෂ්ටි නම්, දශ විධ නාස්තික සංකල්ප ය. කවර ආගමක් අදහන්නකු වුවද එබඳු අදහස් දරන්නේ නම්, හේ මිථ්‍යා දෘෂ්ටිකයෙකි. දශ විධ මිථ්‍යා දෘෂ්ටි නම්; 1. දන් දීමේ විපාකයක් නැත, 2. ආගමික වත් පිළිවෙත් වලින් පලක් නැත, 3. ආරාධනා කර සංග්‍රහ කිරීමෙන් (හෝම) හෝ ආගමික පූජා වලින් පළක් නැත, 4. කුශලා'කුශල කර්මවල ඵල විපාක නැත, 5. මව නැත, 6. පියා නැත, 7. මෙලොව නැත, 8. පරලොව නැත, 9. ඕපපාතික සත්ත්වයෝ (=දිව්‍ය, බ්‍රහ්මාදීන්) නැත. 10. යහ මගට පිළිපන්, රහත් බව ලද උතුමන් නැත යන අදහස් ය. මිසදිටුවෝ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කරනු වෙනුවට, අෂ්ටාංගික මිථ්‍යා මාර්ගය අනුගමනය කරති. (මිච්ඡා දිට්ඨි, මිච්ඡා සංකප්ප ආදී වශයෙනි.)

බුද්ධ කාලීනව සුප්‍රකට මිසදිටු ශාස්තෘවරු හය දෙනෙක් සිටියහ. එනම්;

1. **පූරණ කස්සප** (අකිරිය වාදිය හෙවත් පින් පව් නැත යන අදහස දේශනා කළේ ය.), 2. **අජිත කේසකම්බලී** (උච්ඡේද වාදය හා ලෝකායත වාදය දේශනා කළේ ය.), 3. **පකුධ කච්චායන** (අකෘත්‍යක වාදය හෙවත් නාස්තික වාදය), 4. **මක්ඛලී ගොසාල** (සියල්ල නියත රටාවකට සිදු වී විශුද්ධි ඉබේ ලැබෙති යන නියති සංගති භාව පරිණාම වාදය) 5. **සංජය බෙල්ලට්ඨි පුත්ත** (අමරා වික්ඛෙප වාදය හෙවත් අනිශ්චිත වාදය), 6. **නිගණ්ඨනාථ පුත්ත** (පුබ්බේකත හේතු වාදය හා චාතුයාම සංවරය) යන හය දෙන ය.



*වැරදි රහිත වැ නො පමා ව, දහම්හි මනා කොට හැසිර මෙ ලොවැ හා පරලොවැ සුව සේ වෙසෙන්න.*

168. උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය
ධම්මං සුචරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති
අස්මිං ලොකෙ පරම්හි ච (13:2)

නැඟී සිටින්නේ පමා නොවන්නේ
දහමෙහි සුචරිතයෙහි හැසිරෙන්නේ
ධර්මචාරිය සුවෙන් වසන්නේ
එලෝ - මෙලෝ දෙලොවම සැනසෙන්නේ

# දහම් මග යතොත් - දෙලෝ සුව ලබත්
## 13 (2) සුදොවුන් සිරිතින් බිඳක් (168 සහ 169 ගාථා)

කපිල වස්තුවෙහි නිග්‍රෝධාරාමයෙහි විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **සිය පියාණන්ට** මේ ගාථා යුග්මය දේශනා කළ සේක.

බුද්ධත්වයෙන් පසු ප්‍රථම වරට භාග්‍යවතුන් වහන්සේ කපිල වස්තු නගරයට වැඩම කළ අවස්ථාවෙහි බුදුරදුන්ට වැඩිමහල් ශාක්‍යයෝ අපට වඩා වයසින් බාල හෙයින් වැඳීම යෝග්‍ය නො වේ යැයි උන්වහන්සේට නො වැඳ සිටිය හ. ඔවුන් ගේ මානය මඩිනු පිණිස බුදුහු යමා මහ පෙළහර පා වදාළ හ.

තම පරපුරෙහි පහළ වූ මහා ශාස්තෘවරයාණන් ගේ විශිෂ්ඨත්වය වටහාගත් සුද්ධෝන රජතුමා ප්‍රමුඛ ශාක්‍යයෝ උන්වහන්සේට නමස්කාර කළ හ.
ඒ අවස්ථාවෙහි පොකුරු වැස්සක් ද වැස්සේ ය. පොකුරු වැස්සක් නම් තෙමෙන්නට කැමති අය පමණක් තෙමෙන, අකමැති අය නොතෙමන වැස්ස ය.

භික්ෂූන් වහන්සේලා ඒ ගැන සාකච්ඡා කරන විට භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, මේ මෙවැන්නක් වූ ප්‍රථම වතාව නො වේ. වෙස්සන්තර රජු දවසත් මෙසේ පොකුරු වැසි වැස්සේය"යි එම පුවත ද වදාළ හ. ධර්ම දේශනාවසානයෙහි බුදුරදුන් ගේ ඥාතීන්ට පසුදින දානය ගැන සිහිපත් නො වූයෙන් කිසිවෙක් ඇරයුමක් නො කළ හ. සුද්ධෝදන රජතුමා සිතුයේ මා ගේ පුත්‍රයා අනිවාර්යයෙන් ම දිවා ආහාරය මගේ මාලිගයෙන් ම ලබනු ඇත කියා ය. එහෙයින් ඇරයුමක් නො වී ය.

පසුදින දිවා භෝජන සමය උදාවත් ම භාග්‍යවතුන් වහන්සේ "පෙර බුදුවරුන් ගේ සිරිත වූයේ තම පියාණන් ගේ මාලිගයට අනාරාධිතව වුවත් යාම ද? නැතහොත් පිඬු සිඟා දන් වැළඳීමද?" යි ආවර්ජනය කොට පෙර සිරිත පරිදි ගෙපිළිවෙළින් පිඬු සිඟා වැඩි සේක.

මේ දුටු රාජ පුරුෂයෝ ඒ බව රජතුමාට දැනුම් දුන් හ. තම පුත්‍රයා ආහාර පිණිස ගෙයක් ගානේ සිඟා යාම නිග්‍රහයක් යැයි සිතූ රජ තෙම ඇඳි වත ද එකතකින් ගෙන වහා වීදියට දිව අවුත් "මා ගේ පුත්‍රය, අපගේ ශාක්‍ය වංශයේ කිසිවෙක් සිඟා නො කෑහ. මට මෙසේ නින්දා කරන්නේ මන්ද?" යි විමසී ය.

"මහරජ, ඒ ඔබ ගේ වංශයේ චාරිත්‍රය විය හැක. එහෙත් මා ගේ වංශය වූ බුද්ධ වංශයේ කවුරුත් පිඬු සිඟා ගෙනම වළඳති" යි වදාරා මේ ගාථා දෙකද වදාළ හ.

**විවරණාත්මක අනුවාදය (168 ගාථාව)**

**උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය ධම්මං සුචරිතං චරේ**
**ධම්මචාරී අස්මිං ලොකෙ පරම්හිච සුඛං සේති.**

**උත්තිට්ඨෙ**: පිබිදෙන්න, **නප්පමජ්ජෙය්‍ය**: ප්‍රමාද නො වන්න, **ධම්මං**: ධර්මයෙහි. **සුචරිතං**: සුසිරිතෙහි, **චරෙ**: හැසිරෙන්න, **ධම්මචාරී**: ධර්මයෙහි හැසිරෙන්නා, **අස්මිං ලොකෙ**: මේ ලෝකයෙහි ද, **පරම්හි ච**: පරලෝකයෙහි ද, **සුඛං සේති**: සුවසේ වසයි.

පිබිදෙන්න (අලස නොව නැගී සිටින්න). පමා නොවන්න. ධර්මයෙහි හා සදාචාරයෙහි හැසිරෙන්න. ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා මෙලොව මෙන්ම පරලොව ද සුවසේ වසයි.





*දහම් හි හැසිර දුසිරිතින් වැළක මෙ ලෝ පර ලෝ දෙ ලොවැ මැ සුව සේ වෙසෙන්න.*

169. ධම්මං චරෙ සුචරිතං
න නං දුච්චරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති
අස්මිං ලොකෙ පරම්හි ච (13:3)

හැසිරිය යුතු වෙයි දහමෙහි මැනවින්
නොමඟට නො වැටී අන් කිසි ලෙසකින්
දහමෙ යෙදන්නා සැනසෙයි සුවයෙන්
එලෝ මෙලෝ දෙලොවම සැනසිල්ලෙන්

# හැසිරෙන් දහමින් - වදහළ විලසින්
## 13 (2) සුදොවුන් සිරිතින් බිඳක් (168 සහ 169 ගාථා)

**විවරණාත්මක අනුවාදය (169 ගාථාව)**

**ධම්මං සුචරිතං චරෙ නං දුච්චරිතං න චරෙ ධම්මචාරී අස්මිං ලොකෙ පරම්හි ච සුඛං සෙති.**

**ධම්මං**: පිඬු සිඟීම නම් වූ ධර්‍මයෙහි; **සුචරිතං**: මනාව ලෙස; **චරෙ**: හැසිරෙන්න; **නං**: එහි; **දුච්චරිතං න චරෙ**: (අගෝචර ස්ථානයන්හි හැසිරීමෙන්) නොසුදුසු ලෙස නොකරන්නේය.; **ධම්මචාරී**: පිඬු සිඟන මහණ තෙමේ ධර්‍මයෙහි හැසිරෙන්නා; **අස්මිං ලොකෙ**: මෙලොව ද; **පරම්හි ච**: පරලොව ද; **සුඛං**: සුවසේ; **සෙති**: වාසය කරයි.

ධර්මයෙහි ඉතා නිරවද්‍යලෙස හැසිරෙන්න. එහි සාවද්‍යලෙස නො යෙදෙන්න. ධර්මානුකූලව හැසිරෙන තැනැත්තා මෙලොව හා පරලොව ද සුවපත්ව වාසය කරයි.

**විවරණ**

**සුද්ධෝදන රජතුමා**: බුදුරදුන් සම්මා සම්බුදු පදවි ලබා මගධ රාජධානියෙහි සදහම් පතුරුවමින් වැඩ වෙසෙන බව ඇසූ දා පටන් තම බුදු පුතුන් දැක ගැනීමේ අභිලාෂය සුද්ධෝදන රජතුමා ගේ සිත් තුළ බලවත් ව නැඟිණි. බුදුරදුන් කපිල වස්තුවට වැඩම කරවා ගෙන එන්නැයි නව වරක් ම දූතයන් යැව්ව ද ඒ හැම වෑයමක් ම නිසරු වූයේ ධර්‍මශ්‍රවණය කොට රහත් වූ දූතයන් පැවිදිව තමන්ට පැවරුණු මෙහෙවර අමතක කිරීම නිසා ය. අවසානයේ දී සිදුහත් කුමරුන් හා වැලි කෙළියේ පටන් ම මිතුරුව සිටි කාළුදායි තම මෙහෙවර ඉටු කළේ ය. කාළුදායි පැවිදිව රහත් වූ නමුත් තම යුතුකම අමතක නො කළේ ය.

මේ ගාථාවන් දේශනා කළ අවස්ථාවේ සුද්ධෝදන රජතුමා මහ වීදිය මැදම සෝවාන් ඵලයෙහි පිහිටියේ ය. අනතුරුව බුදුරජාණන් වහන්සේ ගෙන් පාත්‍රය ඉල්ලා ගත් රජතෙම උන්වහන්සේ හා ශ්‍රාවක පිරිස මාලිග යට කැඳවාගෙන ගොස් ප්‍රණීත දාන වස්තුවෙන් උවටැන් කළේ ය. දන් වළඳා අවසානයේ කළ භුක්තානුමෝදනාවෙන් රජතෙම සකෘදාගාමී ඵලයෙහි පිහිටියේ ය. ප්‍රජාපතී ගෝතමිය සෝවාන් වූවා ය. පසු වතාවක බුදුරජාණන් වහන්සේට රජතුමා ගැන තවත් පුවතක් දැනග න්නට ලැබිණ. එනම්, දුෂ්කර ක්‍රියා කරන සමයෙහි තමන් මිය ගිය බව රජතුමාට වාර්තා කරනු ලැබූ අවස්ථාවේදී එය නො ඇදහූ රජතුමා මගේ පුත්‍රයා බුදු වී මිස මිය නො යනු ඇතැයි පැවසූ බවයි. ඒ නිමිතිකොට භාග්‍යවතුන් වහන්සේ ධම්මපාල ජාතකය දේශනා කළහ. ඒ දෙසුම අසා රජතුමා අනාගාමී වූයේ ය.

සුද්ධෝදන රජතුමා මහළු වියට පත්ව මරණාසන්නව වෙසෙතැයි සැල වූ අවස්ථාවේ ද භාග්‍යවතුන් වහන්සේ එතුමන් දකින්නට වැඩම කළ හ. ඒ අවස්ථාවෙහි කළ දෙසුමෙන් රජතෙම අර්හත් ඵලය ලබා ගත්තේ ය. දින හතක් විමුක්ති සුව විඳි රජතෙම සත්වන දින ගෘහස්ථ රහතන් වහන්සේ නමක් ලෙස පිරිනිවන් පෑවේ ය. එවකට භාග්‍යවතුන් වහන්සේ ගේ වයස හතළිහක් විය. තම පුත් සිදුහත් කුමරුන් කෙරේ සුදොවුන් රජතුමා තුළ වූයේ අප්‍රමාණ ස්නේහයකි. සියළු යස ඉසුරෙන් ඔහු සනහා තමන් වෙතම රඳවා ගන්නට වෑයම් කළේ එහෙයිනි. සිදුහත් කුමරුන් සතර පෙර නිමිති දකින්නට මත්තෙන් රජතුමා සිහින හතක් දුටු බව ඇතැම් සම්ප්‍රදායවල එයි. ඒවා මෙසේ ය.

1. ශක්‍රයා ගේ ධජය වැනි ධජයක් රැගත් මහ සෙනඟ එය කපිලවස්තුව පුරා ගෙන ගොස් නුවර නැගෙනහිර වාසලෙන් නික්මී ගිය හ.

2. මංගල හස්තීන් විසින් අදිනු ලැබූ රථයක නැඟුණු සිදුහත් කුමර තෙම නුවර දකුණු වාසලින් පිටත්ව ගියේ ය.

3. අසුන් හතර දෙනකු යෙදූ අති විභූෂිත රථයක නැඟුණු කුමර තෙම නගරයෙහි බටහිර වාසලින් නික්මිනි.

4. අති විචිත්‍ර වූ මාණික්‍යමය චක්‍රයක් ගුවනෙහි පාවී උතුරු වාසලින් පිටව ගියේ ය.

5. කුමාරයා කපිලවස්තු නගරයෙහි සිවුමංසලක හිඳ රාජ යෂ්ටියෙන් යෝධ බෙරයක් වාදනය කළේ ය.

6. කපිලවස්තු නගර මධ්‍යයේ යෝධ කුළුණක් මත නැඟුණු කුමාරයා ගුවන් කුස සිව් දෙසට සෑම වගීයේම අගනා මිණි මුතු විසුරුවා හළේ ය. නන් දෙසින් පැමිණි සත්ත්වයෝ ඒවා එක්රැස්කර ගත් හ.

7. කපිලවස්තුවෙන් බැහැර නුදුරු තැනක මිනිස්සු හය දෙනෙක් මහ හඬින් හඬා වැලපෙමින් සිය දෑතින් ගිය කෙස් උගුළුවා අහුරු පිටින් පොළොව මත දැමූ හ.

රජතුමා ගේ සුපුරුදු ස්වප්න විමර්ශක බ්‍රාහ්මණයෝ මේ සිහින තෝරන්නට අසමත් වූ හ. ආගන්තුක බමුණකු ලෙස වෙස් වලාගෙන පැමිණි දේවතාවෙක් සිහින තෝරා දෙන්නට ඉදිරිපත් විය. ඔහු සිහින තෝරා දුන්නේ මෙසේ ය.

1. ඉතා ලගදීම කුමාරයා ගිහිගෙයින් නික්ම යනු ඇත. දෙව් බඹුන් විසින් පිරිවරනු ලැබ නුවරින් බැහැර ගොස් තවුසකු බවට පත් වන්නේ ය.

2. අභිනික්මණින් නො බෝ දිනකින්ම දශබලධාරීව සම්මා සම්බුදු පදවි ලබනු ඇත.

3. සම්බුදු පදවි ලබත් ම එතුමන් චතුර්වෛශාරද්‍යඥාන ලබා ගනු ඇත.

4. දෙව් මිනිසුන් ගේ යහපත පිණිස උන්වහන්සේ ධර්‍ම චක්‍රය ප්‍රවර්තනය කරති.

5. බුදු බව ලබා ධර්‍මචක්‍ර ප්‍රවර්තනය කළ විට එම රාවය අකනිටා බඹලොව දක්වා පැතිරෙනු ඇත.

6. බුද්ධත්වය ලැබීමෙන් පසු උන්වහන්සේ අට වගෙහිම සත්වයන් ගේ ම යහපත පිණිස සදහම් මිණි මුතු විසුරුවා හරිනු ඇති.

7. බුදු වී ධර්‍ම දේශනා කරන්නට පටන් ගත් විට එතෙක් නම් දරා සිටි ෂඩ් ශාස්තෲවරු පරිහානියට පත්ව බේදනීය තත්වයට ඇද වැටෙනු ඇත.





*ලොව (-අත්බව) දිය බුබුලක් සේ මිරිඟුවක් සේ දක්නා තැනැත්තා මරණින් මිදෙන්නේ ය.*

170. යථා බුබ්බුලකං පස්සේ
යථා පස්සේ මරීචිකං
එවං ලොකං අවෙක්ඛන්තං
මච්චුරාජා න පස්සති. (13:4)

දිය බුබුලක් සේ සිතන්න
මිරිඟුව විලසින් බලන්න
බලමින් ලොව දෙස එලෙසින්
මරුහට නොපෙනී හිඳින්න.

# ජීවිතයක රඟ සොබාව - නිතර වෙනස් වන නියාව

## 13 (3) පන්සිය නමක් රහත් වූ වත (170 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ තමන් වෙත පැමිණි **පන්සියයක් මහණුන්** අරබයා මේ ගාථාව දේශනා කර වදාළ හ.

වරක් භික්ෂූන් වහන්සේ පන්සිය නමක් තථාගතයන් වහන්සේ වෙතින් කමටහන් ලබා ගෙන භාවනා කිරීම පිණිස වනගත වූ හ. එහෙත් අධිගමයක් ලබා ගන්නට අසමත් වූ උන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ බැහැ දකින්නට ආපසු එමින් සිටිය හ. බුදුරදුන් වෙතින් වඩා ප්‍රයෝජනවත් නව කර්මස්ථානයක් ලබා ගැනීම උන්වහන්සේලා ගේ අරමුණ විය. එන අතරමඟ මිරිඟුව දුටු උන්වහන්සේලා එහි මායාව ගැන සිතමින් පැමිණිය හ.

මේ භික්ෂූන් වහන්සේලා එන අතරමග මහ වැස්සක් වැස්සේ ය. ඔවුන් තෙමී ගෙන විහාර භූමියට පිවිසෙන විට වතුර පිරී ඒ මත දිය බුබුළු පිපෙමින් ගලන අයුරු දක්නට හැකි විය. දිය බුබුළු නැගෙමින් පිපිරෙන ඉක්මන බලත්ම අනිත්‍යත්වය පිළිබඳ හැඟුමක් උන්වහන්සේලාට ඇතිවිණි. "හැම දෙයක ම ස්වභාවය මෙය නො වේ ද? අපේ ශරීරයත් මෙසේ දිය බුබුලක් මෙන් බිඳී යනු ඇත." ඔවුන් එසේ සිතත් ම බුදුහු ගඳ කිළියේ සිට රශ්මි ධාරාවක් එවා තමන් වහන්සේ ඔවුන් අබියස සිටින්නාක් මෙන් දක්වා මේ ගාථාව වදාළ සේක.

### විවරණාත්මක අනුවාදය (170 ගාථාව)

**බුබ්බුලකං යථා පස්සේ මරීචිකං යථා පස්සේ එවං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති.**

**බුබ්බුලකං**: දිය බුබුලක්; **යථා**: යම් ස්වභාවය ඇත්තේ ද; **පස්සේ**: එසේ (ලෝකය දෙස) බලන්න; **මරීචිකං**: මිරිඟුවක්; **යථා**: යම් ආකාරය ද; **පස්සේ**: එසේ (ලොව දෙස) බලන්න; **එවං**: මෙසේ; **ලොකං**: ලෝකය; **අවෙක්ඛන්තං**: (නුවණැසින්) බලන්නහු; **මච්චුරාජා**: මාරයා; **න පස්සති**: නො දකියි.

ලෝකය දිය බුබුලක් ලෙස ද මිරිඟුවක් ලෙස ද බලන්නට හැකි නම්, මරුගෙන් බේරෙන්නට හැකි වෙයි.

### විවරණය

**ලෝකං**: ලෝකය ත්‍රිවිධ ය. කාමලෝකය, රූප ලෝකය හා අරූප ලෝකය වශයෙනි. රූප හා අරූප ලෝක වනාහි ධ්‍යාන වලට ගෝචර වන්නා වූ බ්‍රහ්ම ලෝක වෙති. කාම ලෝකයට නරකාදිය, තිරිසන් යෝනිය, අසුර නිකාය හා මනුෂ්‍ය ලෝකය ඇතුළත් ය.

**බුබ්බුලකං මරීචිකං**: දිය බුබුල හා මිරිඟුව ලෝක ස්වභාවයට උපමා කොට දක්වන්නේ නැසී යන ස්වභාවන් හෙවත් අනිත්‍යතාව පැහැදිලි කරන අටියෙනි. මෙම නිදර්ශනා අනිත්‍යය පිළිබඳ භාවනාමය අරමුණකට වැටෙන්නට කර්මස්ථාන වූ බව කථාවෙන් දැක්වෙයි.

වෙනත් තැනක වේදනාව දිය බුබුලකට ද සංඥාව මිරිඟුවකට ද උපමා කර ඇත. ඒවා චිත්ත සංඛාර වෙති. විතක්කය වචී සංඛාරයකි. ලෝකය මෙබඳු තාවකාලික සංස්කාර වලින් නිර්මිතය. ලොව මිරිඟුවක්, දිය බුබුලක් සේ සැලකිය යුත්තේ එබැවිනි. මෙසේ ලොව නිසරු සේ දැකීමෙන් ඇළුම් බැඳුම් සිඳී යයි.





*අත්බැව්හි අනුවණයෝ ගැලෙත්, අත්බැව්හි තතු දන්න නැණවතුනට (එහි) ඇල්මෙක් නැත.*

171. එථ පස්සථි'මං ලෝකං
චිත්තං රාජරථූපමං
යත්ථ බාලා විසීදන්ති
නත්ථි සඞ්ගො විජානතං (13:5)

එන්න බලන්න - ලෝකයේ රඟ
රාජ රථයක් වගෙයි විසිතුරු
මෝඩයෝ නම් ලගිති සුවසේ
නුවණ ඇති අය - නැත ඇලෙන්නේ.

# ගත නො ඇලෙන - හික්මුණු දන
## 13 (4) අභය රාජ කුමාර වස්තුව (171 ගාථාව)

වේළුවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **අභය රාජ කුමාරයා** අරමුණු කොට මේ ගාථාව වදාළ සේක.

අභය රාජ කුමාරයාට පියා වූ බිම්බිසාර රජතුමා විසින් ප්‍රාන්තයෙක ඇති වූ කැරැල්ලක් මැඩ පවත්වන්නට බාර දෙන ලදී. හේ එය ඉතා සාර්ථකව නිමකොට පැමිණියේ ය. ප්‍රීතියට පත් පිය රජ්ජුරුවෝ ඔහුට සත් දිනක් රාජ්‍ය ශ්‍රී විඳින්නට අවකාශ දී නැටුම් ගැයුම් වැයුම් දත් රූමතියක් ද සමඟ මාලිගය බාර දුන් හ.

අභය රාජ කුමාරයා ද මේ සත් දින මාලිගයෙන් බැහැර නො  අවුත් මහත් ප්‍රීතියෙන් ගත කළේ ය. අටවන දින රූමතිය ද කැටුව ගඟෙහි නාන්නට ගිය හෙතෙම එහි දී ද ඇය ගේ නැටුමක් බලමින් ප්‍රීතිවෙමින් සිටියේ ය. එහෙත් අවාසනාවට සන්තති ඇමතියාට වූවාක් මෙන්ම එතුමාට ද මුහුණ පාන්නට වූයේ ඛේදජනක අත්දැකීමකටය. නිළිය හිටි හැටියේම මැරී වැටුණාය. බලවත් සංවේගයට පත් අභයරාජ කුමාර තෙම මගේ සංවේගය නිවන්නට භාග්‍යවතුන් වහන්සේ තරම් සමර්ථ කෙනෙක් තවත් නැතැයි සිතමින් උන්වහන්සේ හමුවට ගියේ ය.

"ස්වාමීනි, මා හද ඇවුළුණු සෝ ගින්න සංසිඳවාලුව මැනවි" යි බුදුරදුන් පා මුල ඇද වැටුණු අභය රාජ කුමරුන් ඇමතූ භාග්‍යවතුන් වහන්සේ "කුමරුනි, මේ එකම නාටිකාංගනාව මළ ශෝකයෙන් ඔබ සසරෙහි හෙළූ කඳුලු මැන නිම කළ නො හැකි තරම්" යි වදාරා "දුක් නොවන්න. තමන් ශෝක සයුරේ ගිලෙන්නට ඉඩ හරින්නේ නුවණ නැති බාලජනයන් පමණි" යි අනුශාසනා කළ සේක. මේ ගාථාව මුල් කර ගෙන භාග්‍යවතුන් වහන්සේ කළ ධර්මදේශනයෙන් කුමාරයා සෝවාන් විය.

**විවරණාත්මක අනුවාදය (171 ගාථාව)**

**යත්ථ බාලා විසීදන්ති, විජානතං සඞ්ගො නත්ථි, චිත්තං රාජරථූපමං ඉමං ලෝකං එථ පස්සථ**

**යත්ථ**: යම් ආත්මභාවයක; **බාලා**: අඥාන පුද්ගලයෝ; **විසීදන්ති**:(තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) ගැලෙත් ද; **විජානතං**: යථාර්ථය දන්නවුන්ට; **සඞ්ගො**: (යම් ආත්මභාවයෙක්හි රාගාදී) ඇලීමක්; **නත්ථි**: නැත් ද; (එම), **චිත්තං රාජරථූපමං**: විසිතුරුව සැරසූ රාජකීය රථයක් බඳු වූ; **ඉමං ලෝකං**: මේ පංචස්කන්ධ ලෝකය; **එථ**: එන්න; **පස්සථ**: බලන්න.

මේ ලෝකය දෙස ඇවිත් බලන්න. මෙය රාජ රථයක් ලෙස විසිතුරුව දිස්වන හෙයින් බාල ජනයෝ එහි ඇලී ගැලී වැනසෙති. එහෙත් නැණවත්හු එහි කිසිම ඇල්මක් නො කරති.

**විවරණය**

**විජානතං**: ලෝක තත්ත්වය යථාර්ථ වශයෙන් අවබෝධ කර ගත් උතුමෝ විජානීන්,තතු දන්නවුන්, නුවණැත්තන් වශයෙන් මෙහි දැක්වෙති.  බුදු දහම ලෝකත්වය පිළිබඳ යථාර්ථ විවරණයකි.

අනිත්‍යය, දුක හා අනාත්මය වශයෙන් ප්‍රකට වන ලෝක තත්ව විචාරයෙහි පාදක සිද්ධාන්තය පටිච්ච සමුප්පාදයයි. ලෝක තත්ත්වය නිරවද්‍ය පරිදි දැන ගැනීම නම් මේ පටිච්ච සමුප්පාදය යථාර්ථ වශයෙන් දැන ගැනීමයි.

**"උප්පාදවා තථාගතානං, අනුප්පාදවා තථාගතානං, ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා, ධම්ම නියාමතා යදිදං පටිච්ච සමුප්පාදො**"යි දක්වා ඇත්තේ එය බුදුවරුන් ලොව පහළ වුවත් නැතත් ලොව සඳහටම පවත්නා යථා තත්ත්වය බව පැහැදිලි කරනු පිණිස ය.

එය බුදුවරු සොයා ගනිති. අනතුරුව ශ්‍රාවකයනට දේශනා කරති. තවත් සූත්‍රයක "තථාගතයන් වහන්සේලා ලොව පහළ වුවත් නැතත් ලොව සියල්ල අනිත්‍යය, දුකය, අනාත්මය. එය තථාගතයන් වහන්සේ තේරුම් ගෙන දේශනා කරති" යි දක්වා තිබේ.

මෙම ධර්මය අවබෝධ කරගන්නා බුදු, පසේ බුදු, මහ රහත් උතුමෝ මෙහි විජානතං යන්නෙන් ගැනෙති. එබඳු උත්තමයෝ ලෝකය රාජ රථයක් මෙන් විසිතුරු කොට සරසා තිබෙන නමුත් මුලා නො වෙති.





*පමා බව දුරලා නො පමා වන තැනැත්තා වළාකුලින් මිදුණු පුරසඳ මෙන් ලොව බබුලුව යි.*

172. යො ච පුබ්බෙ පමජ්ජිත්වා
පච්ඡා සො නප්පමජ්ජති
සො ඉමං ලොකං පභාසෙති
අබ්භා මුත්තෝ ව චන්දිමා (13:6)

කල් යැවූ මුත් පෙර පමාවෙන්
සිටී නම් දැන් අප්පමාදෙන්
බබලවයි නේ අපේ ලෝකය
වළා ගැබකින් මිදුණු සඳ මෙන්.

# දන නුවණ ඇති - ලොව බබුලවති

## 13 (5) සම්මුඤ්ජනී තෙරුන් ගේ වත (172 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **සම්මුඤ්ජනී තෙරුන් වහන්සේ** අරබයා මේ ගාථාව දේශනා කර වදාළ සේක.

සම්මුඤ්ජනී තෙරුන් වහන්සේ ගේ මුළු කාලය ම ගත වූයේ විහාරස්ථානය අතුපතු ගෑමට ය. මෙ සමයෙහි රේවත නම් තෙරුන් වහන්සේ ද එම විහාරස්ථානයේ ම කල් ගත කළ හ. එහෙත් උන් වහන්සේ සම්මුඤ්ජනී තෙරුන් මෙන් නොව භාවනාවෙන් ම කල් යවති.

රේවත තෙරුන් ධ්‍යාන සුවයෙන් කල් යවන අයුරු දක්නා සම්මුඤ්ජනී තෙරුණුවෝ එය උන්වහන්සේ ගේ අලසකම යැයි සිතූ හ. නිකරුණේ කල් යවතැයි වරදවා ගත් හ. එහෙයින් රේවත තෙරුන් කරා ගිය උන්වහන්සේ " ඔබවහන්සේ නම් අලසයෙකි. දායකයන් සැදැහැයෙන් දෙන දේ අනුභව කර එසේ අලසව සිටීම සුදුසු නැත. කාලය නාස්ති කරනවා වෙනුවට මුස්නක් ගෙන මිදුල ටිකක් අතු පතු ගානවා නම් කොච්චර හොඳ ද?" යි ප්‍රශ්න කළ හ.

රේවත හිමියන් ගේ පිළිතුර වූයේ "ආයුෂ්මතුනි, භික්ෂු නමක් මුළු දවස ම අතුපතු ගෑමට ම කාලය වෙන් කිරීම නුසුදුසුයි. උදෑසන අතුපතු ගා, වළඳා, භාවනා වඩා, රෑ වීමට පෙරත්, අතුපතු ගා රෑ කල යළිත් භාවනා වඩා මඟ-ඵල පසක් කිරීමට වෙර වැඩුම මැනවි"යි අවවාද කළේය. ඒ අවවාදය හොඳින් හිතට ගත් සම්මුඤ්ජනී තෙරණුවෝ අකුරටම එය පිළිපැද නොබෝ දිනකින් ම රහත් නමක් බවට පත් වූ හ.

වෙනදා මෙන් දවල් කාලයේ කුණු රොඩු ස්වල්පයක් මිදුලේ එක් වෙත් දීත් සම්මුඤ්ජනී තෙරුන් ඉදල රැගෙන අතුගාන්නට නො පැමිණෙන බව දැන "ආයුෂ්මතුන් දවස තිස්සේ ම අතුගාන්නේ නැත්තේ ඇයි?" යනුවෙන් ප්‍රශ්න කළ හ. "නො පමාවෙන් වෙසෙමි. සුදුසු වේලෙහි හැමදීම් කරමි." උන්වහන්සේ පිළිතුරු දුන් හ.

ඒ පිළිතුර ඇසූ තෙරවරු විමතියට පත්ව භාග්‍යවතුන් වහන්සේ බැහැ දැක. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, සම්මුඤ්ජනී තෙරණුවෝ තමා රහත් වූ බවක් අපට හඟවන්නට තැත් දරති. ඔහු කියන්නේ මුසාවක් විය යුතුය" යි දැන් වූ හ. "නැත මහණෙනි, ඔහු ඇත්තට ම රහත් ඵලය ලබා ඇත. ඔහු කියන්නේ සැබෑවකි'' යි වදාළ බුදුහු මේ ගාථාව දේශනා කළ හ.

### විවරණාත්මක අනුවාදය (172 ගාථාව)

**යො පුබ්බෙ පමජ්ජිත්වා ච සො පච්ඡා නප්පමජ්ජති සො අබ්භාමුත්තො චන්දිමා ඉව ඉමං ලෝකං පභාසෙති.**

**යොː** යමෙක්; **පුබ්බෙː** පෙර; **පමජ්ජිත්වා චː** පමා වූයේ නමුදු; **සොː** හෙතෙම; **පච්ඡාː** පසුව; **නප්පමජ්ජතිː** පමා නොවන්නේ ද; **සොː** හෙතෙම; **අබ්භාමුත්තොː** වළා ගැබින් මිදුනා වූ; **චන්දිමා ඉවː** චන්ද්‍රයා මෙන්; **ඉමං ලෝකංː** මේ ලෝකය; **පභාසෙතිː** ප්‍රභාස්වර කරයි.

යම් කිසි තැනැත්තෙක් මුල් කාලයේ උත්සාහ නො කර කාලය අපතේ යැවූ නමුත් පසුව බණ භාවනා මඟට වැටී අප්‍රමාදව කටයුතු කරන්නේ නම් වළා ගැබින් වැසී තිබුණු චන්ද්‍රයා පසුව ඉන් මිදී ආලෝකය විහිදුවන්නාක් මෙන් මේ ලෝකය ප්‍රභාස්වර කරයි.

### විවරණය

**අබ්භාමුත්තොව චන්දිමාː** වළා ගැබින් වැසුණු මුත් සඳ නැවත ඉන් මිදී ලොව ආලෝකවත් කරනු ඇත. සමහර පුද්ගලයෝ ද එසේ කලක් කුසල් දහම් වැඩීමෙන් තොරව වසන්නා හ. එහෙත් පසුව ඔවුහු දැඩි සේ වීර්‍යය වඩා ඉක්මණින් ප්‍රතිඵල ලබා ගනිති.

මිනිස් සිත වළා ගැබින් මිදීම ක්‍රමානුකූලව සිදුවන්නකි. ධ්‍යාන මගින් තාවකාලිකව කෙළෙස් යටපත් වෙයි. සිත කෙළෙසුන්ගෙන් මිදුනු විට එය ප්‍රභාස්වර වන්නේ සියල්ල මනාව පිළිබිඹුවන කැඩපතක් මෙනි.

බෞද්ධ ශික්ෂා මාර්ගය ක්‍රමික වූවකි. සීලය මගින් කය සහ වචනය හික්මවනු ලැබේ. සමාධිය චිත්තේකාග්‍රතාව ඇති කරයි. එහෙත් පූර්ණ විශුද්ධිය උදාවන්නේ ප්‍රඥාව මගිනි. එමගින් දෘෂ්ටිය පිරිසිදු වෙයි. සංසුන් සිතින් හා පිවිතුරු දැක්මෙන් යුක්තව ධර්මයන් විශ්ලේෂණය කර බැලීම මගින් ආත්ම දෘෂ්ටිය ප්‍රහාණය වෙයි. ත්‍රි ලක්ෂණය අවබෝධ වෙයි. ජීවිතය වූ කලී අවිච්ඡින්න ප්‍රවාහයක් වශයෙන් දිස්වන පටිච්ච සමුප්පන්න - සිද්ධි දාමයක් බව වැටහෙයි.





*පවුකම් කුසල බලයෙන් වසාලන තැනැත්තා පුන් සඳ සේ මෙ ලොව බබුළුව යි.*

| | |
|---|---|
| 173. යස්ස පාපං කතං කම්මං<br>කුසලෙන පිථීයති<br>සො ඉමං ලොකං පභාසෙති<br>අබ්භා මුත්තොව චන්දිමා (13:7) | යම් කෙනකු කළ පාප කර්මය<br>කුසල කර්මෙන් වැසී යානම්<br>බබුලුවයි හේ අපේ ලෝකය<br>වළා ගැබකින් මිදුණු සඳ මෙන්. |

# පාපය නසී - කුසලින් වැසී

## 13 (6) අංගුලිමාල තෙරුන් ගේ වත (173 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි **අංගුලිමාල තෙරුන්** ඇරබ බුදුරජාණන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

අංගුලිමාල පසේනදී කොසොල් මහරජ තුමාගේ පුරෝහිත බ්‍රාහ්මණයා ගේ පුත්‍රයා ය. ඔහු ගේ මුල් නම වූයේ අහිංසක ය. නිසි වයසට පැමිනි කළ ඔහු තක්ෂිලාවේ ඉගෙනුම පිණිස යවන ලදී. බුද්ධිමත් ශිෂ්‍යයකු වූ අහිංසක විනීතව කීකරුව සිප් හදාළේ ය. එහෙයින් හේ ගුරුතුමා ගේ ද එතුමා ගේ බිරිඳ ගේ ද සිත් දිනා ගත්තේ ය. එහෙත් එහි ප්‍රතිඵලය වූයේ අන්‍යයන් ගේ අසතුටට ඔහු ලක් වීම ය. එහෙයින් ඔවුහු අහිංසක ගුරුතුමා ගේ බිරිඳ සමග රහස් සබඳතාවක් පවත්වතැයි ඔවුහු බොරු කේලාම් කී හ. මුලදී ගුරුතුමා එය විශ්වාස නොකළ ද දිගින් දිගටම කේලාම් බස් කීම හේතුවෙන් අන්තිමේ එය විශ්වාස කරන්නට පටන් ගත්තේ ය. තම ශිෂ්‍යයා විනාශ කළ යුතු යැයි සිතා ගත් දිසාපාමොක් ආචාරීහු ඒ සඳහා උපක්‍රමයක් කල්පනා කරමින් සිටිය හ. ශිෂ්‍යයා මැරවුවහොත් එය ගුරුතුමා ගේ අපකීර්තියට හේතු විය හැක. එහෙයින් ඊට වඩා සූක්ෂ්ම ක්‍රමයක් කල්පනා කළ හේ අනුන් ලවා ඔහු මරවනු පිණිස අමුතුම විදියේ ගුරු පඬුරක් ඉල්ලා සිටියේ ය. "මිනිසුන් (හෝ ගැහැණුන්) දහසක් මරා දමන්නේ නම්, සියළු ගුරු මුෂ්ටි දෙන බවට හේ පොරොන්දු විය. අගනා ධනයක් වූ ශිල්ප කෙරේ සිත යොමු කළ අහිංසක, තම ගුරුවරයා ගේ වචනය ඉටු කරන්නට තීරණය කළේ ය. එහෙයින් මිනී මරන්නට පටන් ගත් අහිංසක ගණන් මතක තබා ගනු වස් ඔවුන් ගේ මහපටඟිල්ලක් කපා මාලයක අමුණා ගෙල ලන්නට පටන් ගත්තේ ය. ඇඟිලි මාලයක් තනන හෙයින් අංගුලිමාල යැයි ප්‍රසිද්ධ වූ ඔහු ගේ මිනීමරු ක්‍රියා නිසා මුළු ප්‍රදේශයම බියෙන් ඇලලී ගියේ ය. ඔහු ගේ දරුණු අපරාධ ගැන ඇසූ  රජතුමා අංගුලිමාල අල්ලා මරා දමන්නට අණ දුන්නේ ය. තම පුතා මරා දමන්නට රජතුමා සූදානම් වන බව ඇසූ අංගුලිමාල ගේ මව වූ මන්තානි, පුතා බේරාගනු පිණිස වනයට යාමට පිටත් විය. මේ වන විට අංගුලිමාලට අඩුව පැවතියේ එකම ඇඟිල්ලක් පමණි. ඔහු එය තම මව මරා පුරවා ගනු නියත විය. කෙසේ හෝ එදින භාග්‍යවතුන් වහන්සේ ගේ කරුණා දැලට අංගුලිමාල හසු විය. ඔහුට පිහිට වෙමැයි සිතූ භාග්‍යවතුන් වහන්සේ අංගුලිමාල සැඟවී සිටි වනාන්තරය කරා පිටත් වූ සේක. මුලින් ම නෙතට ගොදුරු වන තැනැත්තා මරන්නට ඉටා ගෙන සිටි ඔහු ගේ නෙතට හිටි හැටියේ ම සම්මා සම්බුදුරජාණන් වහන්සේ රුව ලක් විය. මේ තැනැත්තා මරා ඇඟිලි දහස පුරවා ගනිමියි සිතූ හේ කඩුවක් ද රැගෙන බුදුරදුන් පසු පස දිව ආවේ ය. එහෙත් ඔහුට තමා අල්ලා ගැනීමට බැරිවන පරිදි ඍද්ධියක් කළ භාග්‍යවතුන් වහන්සේ තම පියෙවි ගමනින් ගමන් කළ හ. අංගුලිමාල කොතෙක් දිවුවද ඔහුට බුදුරදුන් අල්ලා ගැනීමට බැරි වූයෙන් "නවතිනු මහණ, නවතිනු" යි හඬ නැඟීය. භාග්‍යවතුන් වහන්සේ "මම නැවතුණෙමි. නවතින්නට ඇත්තේ ඔබට ය" යි වදාළ හ. මේ වචන වලින් විස්මයට පත් හෙතෙම "මේ මහණ ගමන් කරමින් ම මම නැවතුණෙමි" යි පවසයි. මෙ තරම් වේගයෙන් දුවමිනුත් මම ඔහු හසු කර ගන්නට අසමත් වෙමි. ඔහු ගේ වචනයෙහි අරුත විමසා ගත යුතු ය" යි සිතා "මහණ ඔබ නැවතිලා, මම නැවතිලා නැතැයි ඔබ කියන දේ මට නො වැටහේ" යි පැවසී ය. "අංගුලිමාල, මා ප්‍රාණඝාතය නවතා ඇති හෙයින් මම නැවතුණෙමි" යි කියමි. මම කිසිවකුට වධ වේදනා නො දෙමි. හිරිහැර නො කරමි. ඒ මා තුළ සියළු සත්ත්වයන් කෙරේ කරුණාව, දයාව ඇති හෙයිනි. නැවතී නැත්තේ ඔබය. ඔබ දිගින් දිගටම මරයි." යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කළ සේක. "මේ නම් මහා ප්‍රාඥයකු ගේ කියමනකි. මේ භික්ෂුව කිසි ම බියක් සැකක් නැතිව කතා කරයි. මෙබඳු නිර්භීත බවක්, විශාරදත්වයක් බුදුරජාණන් වහන්සේට මිස සාමාන්‍ය පැවිදි කෙනෙකුට තිබිය නො හැක. මේ නම් භාග්‍යවතුන් වහන්සේ ම  විය යුතුය. මා කෙරේ කරුණාවෙන් උන්වහන්සේ අද මෙහි වැඩම කරන්නට ඇතැ"යි සිතූ හෙතෙම සිය කඩුව බිම දමා බුදු පාමුල වැටී සමාව අයැද සිටියේ ය.භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි වූ අංගුලිමාල භාවනා කර රහත් නමක් වූයේ ය. කලක් ලෝක ශාසනාර්ථයෙහි නිරතව "යො ච පුබ්බෙ පමජ්ජිත්වා" යනාදී ගාථාවෙන් උදානයක් ද පළ කළ අංගුලිමාල තෙරණුවෝ පිරිනිවන් පෑහ. එයින් පසු භික්ෂූහු අංගුලිමාල තෙරුන් මරණින් පසු උපන්නේ කොහිදැයි බුදුරදුන්ගෙන් ප්‍රශ්න කළ විට "අංගුලිමාල පිරිනිවන් පෑවේය" යි උන්වහන්සේ වදාළ හ. එතරම් මිනීමරා පිරිනිවන් පෑවේ කෙසේ දැයි විමතියට පත් භික්ෂූන් වහන්සේලාට භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළ හ.

### විවරණාත්මක අනුවාදය (173 ගාථාව)

**යස්ස කතං පාපං කම්මං කුසලේන පිථීයති සො අබ්භා මුත්තෝ චන්දිමා ඉව ඉමං ලෝකං පභාසේති.**

**යස්ස**: යමකු; **කතං**: කළ; **පාපං කම්මං**: පාප කර්මය; **කුසලේන**: කුසලින්; **පිථීයති**: වළකින්නේ ද; **සො**: හෙතෙම; **අබ්භාමුත්තෝ**: කළු වළාවෙන් මිදුණු; **චන්දිමා ඉව**: සඳ මෙන්; **ඉමං ලෝකං**: මේ ලෝකය; **පභාසේති**: ප්‍රභාමත් කරයි.

යමකු තුළ පවුකම් කුසලින් වැළකී සිටි නම් හේ වළාගැබින් මිදුණු සඳ මෙන් ලොව ආලෝකමත් කරයි.

### විවරණය

**කුසලේන පිථීයති**: මෙයින් බෞද්ධ කර්ම නියාමයෙහි තවත් වැදගත් අංශයක් කෙරේ අප සිත් යොමු කරයි. ජෛන ධර්මයෙහි මෙන් අප කරන කර්මයේ අනිවාර්ය වහලුන් බවට අප පවත්වන බවක් බුදු සමය නො දක්වයි. අපට අපගේ කර්මය පරාජය කළ හැක. කර්මය බලපාන්නේ සංස්කෘත ධර්ම ක්ෂෙත්‍රය තුළ පමනි. එයින් බැහැරව ගිය විට කර්මයෙන් මිදෙන්නට හැකි වෙයි. කුසලෙන් පිථීයති යි දැක් වූයේ ඒ බවය. සාමාන්‍ය පාප විපාක යමකුගේ බලවත් කුසල් නිසා විපාක නො දෙන අවස්ථා ඇත.



නුවණ නැති පුහුදුන් පුඟුලා අඳ ය. ඔවුනතුරෙහි ටික දෙනෙක් නිසි දේ දැක සුගතියට පැමිණෙත්.

174. අන්ධභූතෝ අයං ලොකො
තනුකෙත්ථ විපස්සති
සකුන්තෝ ජාල මුත්තො'ව
අප්පො සග්ගාය ගච්ඡති (13:8)

අන්ධයෝ වෙති ලොවෙහි වැඩි දෙන
ඉතා සුළුවෙනි ඇස් පෙනෙන දන
දැලෙන් මිදෙනා කුරුල්ලන් මෙන්
පිරිස සුළු වෙති සුර ලොවට යන

# නුවණින් තොරවී - වැඩි දෙන අඳ වී

## 13 (7) පේෂකාරයා ගේ දියණිය (174 ගාථාව)

අලවි රට අග්ගාලව නම් ආරාමයෙහි වැඩ විසූ සමයෙහි එක්තරා **පේෂකාරයකු ගේ දියණියක්** නිමිති කර ගෙන භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

අලවි නුවර පැවති දානමය පුණ්‍ය මහෝත්සවයකින් අනතුරුව භාග්‍යවතුන් වහන්සේ ස්කන්ධයන් ගේ අනිත්‍යත්වය ගැන ධර්ම දේශනයක් කළ හ. එම දෙසුමෙහි මූලික හරය වූයේ "ජීවිතය අනිත්‍යය. නියත එකම දේ මරණය ය." එහෙයින් සියළු දෙනාම "ජීවිතය අනියතය. මරණය නියතය. මා ද නියතයෙන් ම මිය යා යුතු ය. ජීවිතය මරණයෙන් කෙළවර වේ" යනුවෙන් නිරතුරුව මෙනෙහි කළ යුතු ය. මෙසේ නිරතුරුව පංචස්කන්ධයෙහි යථා ස්වභාවය මෙනෙහි කළ යුතු බව වදාළ භාග්‍යවතුන් වහන්සේ "දණ්ඩක් හෝ මුගුරක් අතින් ගෙන සතුරා කවර මොහොතක තමා හමුවට ඒ දැයි සූදානමින් සිටින්නකු මෙන්, මරණයට මුහුණ දීම පිණිස නිරතුරුව සූදානමින් සිටිය යුතු ය. එසේ සූදානමින් සිටින්නා මෙලොවින් චුතව දෙව්ලොව උපදින්නේ ය" යි ද දේශනා කළ හ. ඇතැමුන් මෙබඳු දෙසුමක් එතරම් වැදගත් කොට ගෙන ක්‍රියාත්මක කරන්නට නො සිතතත් එදින ධර්මශ්‍රවණය කළ සොළොස් හැවිරිදි එක් පේෂකාර දියණියක් එය මනාව තේරුම් ගත්තා ය. නිරතුරුව මරණානුස්සතිය වඩන්නට තීරණය කළා ය. ධර්ම දේශනයෙන් පසු භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙරට වැඩම කළ සේක.

වසර තුනකට පසු දිනක් භාග්‍යවතුන් වහන්සේ අළුයම ලෝ බලන විට පේෂකාර දියණිය උන්වහන්සේ ගේ බුදු ඇසට ලක් වූවා ය. ඇයට සෝවන් වීමට භාග්‍යය ඇති බව දුටු භාග්‍යවතුන් වහන්සේ අලවි නුවරට වැඩම කළ හ. බුදුරදුන් පන්සියයක් සංඝයා වහන්සේ පිරිවරා අලවි නුවරට වැඩම කළ බව ඇසූ තරුණියට බුදුරදුන් බැහැ දැක බණ දේශනාව ඇසීමේ බලවත් අභිරුචියක් උපන. එහෙත් ඇය ගේ පියා නූල් පන්දු රැසක් වහා ඔතා දෙන ලෙස ඇයට අණ කළෙන් ඇය ඒවා කඩිනමින් ඔතා නිම කළා ය. වහාම ඒවා පියාණන්ට දීම සඳහා රැගෙන යන අතර මග මිනිසුන් බුදුරදුන් ගෙන් බණ අසන්නට වට වී සිටිනු දැක ඒ අසලින් ගියා ය.

භාග්‍යවතුන් වහන්සේ ද ඇය ගේ ජීවිතයේ අවසන් දිනයෙහි පිහිට වන්නට වැඩම කළ හෙයින් ඇය දෙස හිස ඔසවා විශේෂයෙන් බැලූ සේක. ඕ අවුත් පැස බිම තබා බුදුන් වැන්දා ය. බුදුරජාණන් වහන්සේ ඇය ගෙන් ප්‍රශ්න හතරක් විචාළහ. ඒවාට ඇය දුන් පිළිතුරු අමුතු වූ හෙයින් බොහෝ දෙනා ඇය කෙරේ නො පහන් වූ හ. එහෙත් ඒ පිළිතුරු තමන් අපේක්ෂා කළ ධර්මානුකූල පිළිතුරු බව භාග්‍යවතුන් වහන්සේ ඇය ලවා පැහැදිලි කළ හ.

පළමුවන ප්‍රශ්නය වූයේ "කොහි සිට ආවේ ද?" යන්නයි. භාග්‍යවතුන් වහන්සේ අදහස් කළේ මේ ජන්මය කවර පූර්වජන්මයක සිට ආවාද යන්න හෙයින් එය මා නො දන්නා නිසා "මම නොදනිමියි" කීමි.

"යන්නේ කොහිද?"යි ඇසුවේ මරණින් මතු යන්නේ කොහි ද යි බව මට හැඟුණු හෙයින් "නො දනිමියි" කීමි.

"නොදන්නෙහි ද?" යි විමසුයේ මැරෙන බව නොදන්නෙහිද යන්න හෙයින් "මම දනිමි"යි පිළිතුරු දුනිමි.

නැවත "දන්නෙහි ද?"යි විමසුයේ මැරෙන දිනය දන්නේහි ද යන්න බව තේරුම් ගෙන මා මැරෙන දිනය නො දත් හෙයින් "නො දනිමි"යි පැවසීමි.

ඒ පිළිතුරු ඇය පැහැදිලි කළ පසු පිරිස ඇමතූ භාග්‍යවතුන් වහන්සේ "ඔබ බොහෝ දෙනකුට ඒ පිළිතුරු නො වැටහුණේ වැඩි දෙන අවිද්‍යා අන්ධකාරයෙහි සිටින හෙයිනි" යි වදාළ හ. අනතුරුව පේෂකාර දුහිතෘව එම ප්‍රශ්න හා පිළිතුරු ගැනම සිතමින් තම පියාට නූල් පන්දු බාර දීම පිණිස ඉක්මන් ගමනින් ගියා ය. ඇය යන විට අඩ නින්දේ පසු වූ පියා හිටි හැටියේ ම පිබිදී අත් දණ්ඩ ගසා ලූයෙන් එය ඇයගේ පපුවෙහි වේගයෙන් වැදී එතනම ඇය ගේ මරණය සිදු විය. මහත් සංවේගයට පත් පියා වහා දිවගොස් භාග්‍යවතුන් වහන්සේට ඒ බව සැළ කර සිටියේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහු අස්වසා පැවිදි කර ගත් හ. හෙතෙම නොබෝ දිනකින් ම බවුන් වඩා රහත් වූයේ ය.

#### විවරණාත්මක අනුවාදය (174 ගාථාව)

**අයං ලොකො අන්ධභූතො එත්ථ තනුකො විපස්සති**
**ජාලමුත්තො සකුන්තො ඉව අප්පො සග්ගාය ගච්ඡති.**

**අයං ලොකො**: මේ ලෝවැසි තෙමේ, **අන්ධභූතො**: අන්ධ වූයේ (වෙයි), **එත්ථ**: මේ ලෝවැසියා අතුරෙහි, **තනුකො**: ඉතා සුළු පිරිසක්, **විපස්සත**: වෙසෙසින් දකිති, **ජාලමුත්තො**: දැලින් මිදී යන, **සකුන්තො ඉව**: කුරුල්ලකු මෙන්, **අප්පො**: ස්වල්ප දෙනෙක්, **සග්ගාය**: දෙව් ලොවට, **ගච්ඡත**: යති.

මෙලොව බොහෝ දෙනා අන්ධයන් වැනි ය. ඔවුහු යථාර්ථය නො දකිති. ඉතා සුළු පිරිසක් පමණක් කුරුළු වැද්දකු ගේ දැලෙන් මිදී යන කුරුල්ලකු මෙන් යහපත අයහපත දැක දෙව් ලොව උපදිති.

#### විවරණය

**අන්ධභූතො**: ලෝක වාසී සාමාන්‍ය පෘථග්ජන පුද්ගලයෝ විමුක්ති මාර්ගය නොදකිති. ඔවුහු ශාස්වත උච්ඡේද ආදී මිථ්‍යා දෘෂ්ටීන් ගෙන් අන්ධ වූවාහු යථා තත්ත්වය නො දැක, කුශලා'කුශල විචක්ෂණයෙන් තොරව අවිචාරවත්ව ක්‍රියා කරති.

**සග්ග**: බුදු සමයෙහි ඉගැන්වෙන ස්වර්ගය ඇතැම් ආගම්වල ඉගැන්වෙන සදාකාලික ස්වර්ගය නොව දිව්‍ය ලෝකයයි.



*නුවණැත්තාහු සෙන් සහිත මරුදිනා මෙ ලොවින් නික්ම යෙත්. (නිවනට පැමිණෙත්)*

175. හංසාදිච්චපථෙ යන්ති
ආකාසෙ යන්ති ඉද්ධියා
නීයන්ති ධීරා ලොකම්හා
ජෙත්වා මාරං සවාහිනිං (13:9)

හංසයන් යන මෙන් පියඹා - නුබ ගැබේ හිරු බබලනා
යති ගුවන් ගැබ රහත් හිමිවරු
තමන් ලත් ඉදු බලයෙන්
අතැර යති ලොව ලොවේ ඇති තතු
දත් උතුම් දන නුවණිනා
පරදවා සහමුලින් මරුවා
ඔහුගේ පිරිවර සමඟිනා

# ලොව හැර යති - දන නුවණැති

## 13 (8) හිමිවරුන් තිස් නමක්ගේ කතා පුවත (175 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **සඟ පිරිසක්** අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

දිනක් ප්‍රත්‍යන්ත දේශවාසී භික්ෂූන් වහන්සේ තිස් නමක් බුදුරදුන් හමුවට පැමිණිය හ. උන්වහන්සේලා එනු ඈත පටන්ම දුටු ආනන්ද තෙරුන් වහන්සේට මෙසේ සිතිණි. "දැන් මා බුදුරදුන්ට වත් පිළිවෙත් කළ යුතු වේලාවයි.

කෙසේ වුවත් මේ පැමිණෙන භික්ෂූන් සමග කතා බහ කරන්නට භාග්‍යවතුන් වහන්සේට ඉඩ හැර පසෙකට වී සිටිමි. ඒ කතා බහ නිම වී ඔවුන් පිටත්ව ගිය පසු වතාවත් කරන්නෙමි." එසේ සිතා උන්වහන්සේ විහාර දොරටුව අසල බලා සිටිය හ.

භාග්‍යවතුන් වහන්සේ ඒ පැමිණි තෙරවරුන් සමග සතුටු සාමීචි කතා නිමකොට උන්වහන්සේලාට ධර්ම දේශනා කළ හ. එම ධර්මය ඇසූ තිස් නම රහත් වූ හ. රහත් ඵල ලත් පසු බුදුරජාණන් වහන්සේ ගෙන් සමුගත් උන්වහන්සේලා දොරටුවෙන් පිටව නො ගොස් අහසින් ගිය හ.

බුද්ධෝපස්ථානයට අවස්ථාව පතමින් දොරටුව ළඟ රැඳී සිටි ආනන්ද හිමියෝ බොහෝ වේලා බලා සිට ඒ හිමිවරුන් පිටව නො යන හෙයින් බුදුරදුන් හමුවට ගොස් එහි දී තෙරවරුන් නො දැක ඔවුන් පිටත්ව ගියා දැයි බුදුරදුන් ගෙන් විමසූ හ.

ඔවුන් පිටත්ව ගිය බව බුදුන් වහන්සේ වදාල විට ඒ කෙසේදැයි විමසූහ. ඒ අවස්ථාවෙහි හංසයෝ රංචුවක් අහසින් ගිය හ. මේ රහත් හිමිවරුන් ඍද්ධියෙන් යාමත් හංසයන් අහසින් යාමත් අලලා භාග්‍යවතුන් වහන්සේ ගාථාවකින් අනඳ හිමියන්ට පැහැදිලි කළ සේක.

### විවරණාත්මක අනුවාදය (175 ගාථාව)

**හංසා ආදිච්චපථෙ යන්ති ඉද්ධියා ආකාසෙ යන්ති ධීරා**
**සවාහිනිං මාරං ජෙත්වා ලොකම්හා නීයන්ති**

**හංසා**: හංසයෝ; **ආදිච්චපථෙ**: ආකාශයෙහි; **යන්ති**: පියඹා යති; **ඉද්ධියා**: ඍද්ධි බලයෙන්; **ආකාසෙ**: අහසින්; යන්ති: (ඍද්ධිය ඇත්තෝ) යති; **ධීරා**: නුවණැත්තෝ; **සවාහිනිං**: පිරිවර සේනා සහිතවූ; **මාරං**: මරු; **ජෙත්වා**: පරදවා; **ලොකම්හා**: ලෝකයෙන්; **නීයන්ති**: නික්ම (නිවනට) යන්නාහුය.

හංසයෝ අහසේ පියඹා යති. ඍද්ධි ඇත්තෝ අහසේ ඍද්ධි බලෙන් යති. නුවණැති රහතුන් වහන්සේලා පිරිවර සේනා සහිතවූ මරු පරදවා මෙලොවින් නිකුත්ව නිවනට යයි.

### විවරණය

**ඍද්ධි**: සමාධියට පැමිණෙන්නේයයි හෙවත් සිද්ධ වෙයි ඍද්ධි නම්. ඍද්ධි විධ ඥාණය ෂඩ්විධ අභිඥාවන් ගෙන් එකකි. ඒ ඍද්ධි තොමෝ **අධිෂ්ඨාන ඍද්ධි**; **විකුර්වණ ඍද්ධි**; **මනොමය ඍද්ධි**; **ඥාණ විෂ්ඵාර ඍද්ධි**; **සමාධි විෂ්ඵාර**; **ආයසී ඍද්ධි** ; **කර්මවිපාකජ ඍද්ධි**; **පුණ්‍ය ඍද්ධි**; **විද්‍යාමය ඍද්ධි**; සහ **සම්‍යක්ප්‍රයෝග ඍද්ධි** යයි දශවිධ වන්නේ ය.

මෙම චිත්ත පාලනය ගැන සූත්‍රධර්මවල නිරතුරුව සඳහන් වේ. මෙහි විස්තරය විශුද්ධි මාර්ගය බලා දැන ගත හැක.

**ඉද්ධි පාද**: ඉද්ධිපාද නම් 'සමෘද්ධි සඳහා ඇති මාවත' යන අරුත් දෙයි. සතර ඍද්ධිපාදයෝ නම්:

1. ඡන්ද සමාධි
2. විරිය සමාධිය,
3. චිත්ත සමාධිය,
4. විමංසා සමාධිය

යන මොහු ඍද්ධි ලැබීමට උපාය වෙත් නුයි ඍද්ධිපාද නම් වේ.

ඍද්ධිපාද මගින් ඍද්ධි උපදවා ගත හැකි වෙයි. ඍද්ධි පාද වඩා ඒවා දිගට පවත්වාගෙන යන භික්ෂුවට දිව්‍ය චක්ෂු, දිව්‍ය ශ්‍රොත, පරචිත්ත විජානන, පුබ්බෙනිවාසානුසමෘති, චුති උත්පත්ති, හා ආශ්‍රවක්‍ෂය යන ඍද්ධි ලැබේ. "මහණෙනි, කවරකුට හෝ සතර ඍද්ධිපාද මග හැරුණෝ නම්, ඔහුට දුක්ඛ නිරෝධයට ඇති මාර්ගය ද මග හැරුණෝ වෙයි" යි සඳහන්ව ඇත.

**ඉද්ධියා ආකාසෙ යන්ති**: ඍද්ධි බල ඇති රහතන් වහන්සේලා අහසින් යති. රහතන් වහන්සේලා වනාහි කළ යුත්ත කළ උතුමෝ වෙති. මේ නිම කළ කාර්යය ඇත ද ශරීරය පවත්නා තුරු මේ ලොව ජීවත්වන උන්වහන්සේලා ලෝ වැඩ වඩමින් වෙසෙති. රහත් බව හෝ අනාගාමී ඵලය රූප හෝ අරූප ධ්‍යාන බල උපදවා ගත් උතුමනට සතියක් දක්වා විමුක්ති සුවයෙන් වාසය කළ හැක. පාලියෙන් එය හඳුන්වන්නේ නිරෝධ සමාපත්ති නමිනි.

**සවාහිනිං මාරං ජෙත්වා**: සේනා සහිත වූ මරු දිනාය.

දස මාර සේනා නම් **කාම**, **අරති**, **ඛුප්පිපාසා**, **තණ්හා**, **ථීනමිද්ධ**, **උත්තාස**, **විචිකිච්ඡා**, **මක්ඛ ථම්භ**, **මිථ්‍යාවෙන් ලත් ලාභ සත්කාරාදි** **අත්තුක්කංසන**, **පරවම්භන** යන මොහුය.





*එක ම දහම (-සස්බස් බිණීම) ඉක්ම වූ බොරු කියන තැනැත්තා විසින් නො කටහැකි පවක් නැත.*

176. එකං ධම්මං අතීතස්ස
මුසාවාදිස්ස ජන්තුනො
විතිණ්ණපරලොකස්ස
නත්ථි පාපං අකාරියං (13:10)

එකම එක සීලයක්
රකිනු බැරි බොරුකාර
පරලොවත් නසාගත්
අයට බැරි පවක් නැත.

# බොරු කියන්නාට කළ හැකිය - ඕනෑම පාපයක්

## 13 (9) චිංචා මානවිකාව ගේ කතාව (176 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ සිටි සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **චිංචාමානවිකාව** අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්ම දේශනා ඇසූ බොහෝ දෙනා උන්වහන්සේ ගේ ශ්‍රාවකයන් බවට පත් වූ හ. වැඩිකල් නොයාම බුද්ධ ශ්‍රාවක පිරිස වැඩි වන්නට පටන් ගත්තෙන් අන්‍ය තීර්ථකයෝ අසහනයට පත් වූහ. බුද්ධ ශ්‍රාවකයන් බවට බොහෝ විට පත් වූයේ ඔවුන්ගේ ශ්‍රාවකයන් හෙයින් ඔවුන් ගේ පිරිස පිරිහිණි. එහෙයින් ඔවුහු බුදුරදුන්ගේ හොඳ නම කෙලෙසන්නට මගක් ගැන කල්පනා කළ හ. එසේ සිතා ඔවුන් ගේ ශ්‍රාවිකාවක් වූ චිංචා නම් එක් රූමත් ළඳක් කැඳවූ පරිබ්‍රාජකයෝ "ඔබ අපට හිතවත් නම්, ශ්‍රමණ ගෞතමයා අපකීර්තියට පත් කිරීමට අපට උදව් කරන්න" යි ඔවුහු ඉල්ලා සිටිය හ. චිංචා ඊට එකඟ වූවා ය.

එදා පටන් ඕ මල් සුවඳ ආදිය රැගෙන සැන්දෑ කාලයේ දෙව්රම් වෙහෙර දෙසට යන්නට පටන් ගත්තා ය. මිනිස්සු "මේ කොහිද ඔබ යන්නේ?" යි ඇසූ විට ඕ අමනාපයෙන් මෙන් "මා කොහි යන්නේදැයි දැන ගැනීමෙන් ඔබට ඇති ඵලය කුමක් ද?" වැනි පිළිතුරු දෙයි. අනතුරුව දෙව්රම් වෙහෙර අසල ම ඇති පරිබ්‍රාජකාරාමයක රාත්‍රි නවාතැන් ගන්නා ඕ හිමිදිරියේ ම දෙව්රම පැත්තේ සිට එන බව හඟවමින් නිවස බලා යයි. මගදී කොහි ගියේ දැයි විමසූ විට "රැය ශ්‍රමණ භවත් ගෞතමයන් සමඟ  සුවඳ ගඳ කිළියේ වාසය කළෙමි" යි කියයි. තුන් හාර මසක් ගිය තැන ඕ කුස මඳින් මඳ වැඩෙන බවක් පෙනෙන සේ රෙදි තබා වෙලාගෙන යන්නීය. මාස අටක් නමයක් වූ කළ ලී කැබලි එකතු කර තනා ගත් බඩක් විදහාපාමින් ඇවිදියි. ගැබ්බර ලියක මෙන් වෙහෙස ගතියක් පාමින් අපහසුවෙන් ඇවිදියි.

මෙසේ පසුබිම සැකසූ චිංචා දිනක් බුදුරදුන් ධර්ම දේශනා කරමින් සිටින අතර දෙව්රම් වෙහෙරට ගියා ය. "අනුන්ට බණ කිය කිය හිටියාම හරියයි ද? මහ ලොකු ශ්‍රමණයා දැන් මගේ බඩට මාස නමයයි. මේවා ඔබගේ වැඩ. ඉතින් උපදින්න ඉන්නා දරුවා ගැන, මා ගැන මොනවද ලෑස්ති කරලා තියෙන වැඩ. ඔබේ ප්‍රීතිය ගැන විතරයි ඔබ හිතුවෙ" යි කියාගෙන කියාගෙන ගියා ය. භාග්‍යවතුන් වහන්සේ කරමින් සිටි දම් දෙසුම නවත්වා "නැගණිය ඔබ කියන්නේ සැබෑද බොරුද යන්න දන්නේ ඔබත් මාත් පමණක් නොවේ ද?" යි පැවසූ හ. "ඇත්ත, කොහොමද අනිත් අය දන්නේ, අපි දෙන්නා විතරක් දන්න දේවල්?" චිංචා කීවා ය.

එකෙණෙහි දෙ දෙව්ලොවට අධිපති ශක්‍රයා මෙ පවත් දැක තම පිරිවර දෙව්වරුන් හතර දෙනකු අමතා මීයන් හතරදෙනකු ගේ වෙස් ගෙන චිංචා මානවිකාව ගේ බොරුව කාටත් දැන ගන්නට සලසන්නැයි පැවසී ය. ඔවුහු මී වෙස් ගෙන චිංචාවගේ ඇඳුම් අතරින් ඇයගේ කුසට බැඳ තිබූ ලී කැබලි කපා දැමූ හ. නූල් ගොඩවල් කැපී ලී කැබලි බිම වැටෙන්නට පටන් ගත්තේ ය. පිරිස ඇයට නින්දා කරන්නට පටන් ගත් හ. කෙනෙක් ඇයට කෙළ ගැසී ය. වහා දෙව්රමින් නික්ම ගිය පරිබ්‍රාජක ආරාමයක් බලා ඕ දිව ගියා ය. එහෙත් ඇය පරිබ්‍රාජක ආරාමයට යත් ම මහ පොළව දෙබෑ වී ඕ අවීචි මහා නිරයට ගෙන යනු ලැබූවා ය.

### විවරණාත්මක අනුවාදය (176 ගාථාව)

**එකං ධම්මං අතීතස්ස මුසාවාදිස්ස විතිණ්ණපරලොකස්ස**
**ජන්තුනො අකාරියං පාපං නත්ථි**

**එකං ධම්මං**: (සත්‍යවාදිත්වය නම් වූ) එකම ගුණ ධර්මයවත්; **අතීතස්ස**: ඉක්මවාලූ; **මුසාවාදිස්ස**: බොරු කියන සුලු වූ; **විතිණ්ණපරලොකස්ස**: පරලොව වරදවා ගත්; **ජන්තුනො**: පුද්ගලයාට; **අකාරියං**: කළ නො හැකි; **පාපං**: **පාපයක**; නත්ථි: නැත.

සත්‍යවාදිත්වය නම් වූ එකම ගුණ ධර්මයවත් නැති පරලොව වනසා ගත් බොරුකාරයාට කරන්න බැරි පාප කර්මයක් නො මැත.

### විවරණය

**මුසාවාදිස්ස**: මුසාවාදියා නම් ඇත්ත සඟවා නැත්ත කතා කරන පුද්ගලයා ය. සත්‍යවාදිත්වය උතුම් ගුණධර්මයක් ලෙස බුදු දහමෙහි ඉගැන්වෙයි.

බෞද්ධ විමුක්ති මාර්ගයෙහි සත්‍යයට හිමිවන වැදගත් ස්ථානය එය පාරමිතාවක් කොට දැක්වීමෙන් ම පෙනී යයි. සත්‍ය පාරමිතාව පිරූ අවස්ථාවක් දක්වන විධුර ජාතකය ජීවිත පරිත්‍යාගයෙන් පවා සත්‍යවාදිත්වය රැකි අයුරු දක්වයි. විධුර පණ්ඩිතයන් යක්ෂයකුට ගොදුරුවන්නට ඔන්න මෙන්න කියා තිබියදී ඔහුට එක් සතියක් තම නගරයට ගොස් එන්නට අවසර ලැබේ. ඒ සතිය ගත කළ පසු වෙනත් අය තමන් ඒ වෙනුවෙන් බිලි වන්නට කැමැත්ත පළ කරත්දී පවා තමන් ගිවිස ගත් පොරොන්දුව ඉටු කරමියි විදුර පඬිතුමා ආපසු යයි. රකුසෝ එයින් විස්මයට පත්ව සත්‍යවාදිත්වයට ගරු කිරීමක් ලෙස එතුමාට අභය දෙති.

**නත්ථි පාපං අකාරියං**: බොරු කාරයාට කළ නො හැකි පවක් නැත. මේ කියුම සත්‍යවාදිත්වයට බුදුදහමෙහි හිමිවන වැදගත් තැන තවත් තහවුරු කරයි. බොරු කියන්නන්ට කිසි කලෙක දිව්‍ය හෝ මානුෂික සැප හිමි නොවන බව අටුවාව කියයි.





*අනුවණයෝ දන්දීමට නො පසසත්, නුවණැත්තා අනුන් දුන් දනෙහි පවා පින් අනුමෝදන් වැ සැප ලබයි.*

177. න වෙ කදරියා දෙවලොකං වජන්ති
බාලා හවෙ නප්පසංසන්ති දානං
ධීරො ච දානං අනුමොදමානො
තෙනෙව සො හොති සුඛී පරත්ථ (13:11)

මසුරෝ කිසි කලෙක දෙව් ලොව නූපදිති
අනුවණ දනෝ නම් දානය නොපසසති
නුවණැති අයම දෙන දන් දැක සතුටු වෙති
එපමණකින් වුවත් පරලොව සැප ලබති.

# හොඳ ම කරත් - සැප ම ලබත්

## 13 (10) අසදිස මහා දානය (177 ගාථාව)

පසේනදි **කොසොල් රජතුමා** විසින් දෙන ලද අසදිස මහා දානය ඇරබ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ගාථාව දේශනා කරන ලදි.

වරක් රජ තෙමේ බුද්ධ ප්‍රමුඛ සංඝයාට මහා දානයක් පිරිනැමී ය. එම මහා දානය දුටු පුරවැසියෝ ද අපිත් ඊට නො දෙවෙනි මහ දනක් දෙමුයි තවත් මහා දානයක් දුන් හ. රජතුමා එය පරදවන්නට තමන් ද මහ දානයක් දුන්නේ ය. මෙසේ රජතුමාත් ජනතාවත් කීපවරක් ම තරඟයට මෙන් මහ දන් පැවැත්වූ හ.

රජතුමාටම ජයග්‍රහණය ලබා දෙනු රිසි වූ මල්ලිකා දේවිය ඒ සඳහා උපායක් සිතුවා ය. ඒ සඳහා එතුමිය රජතුමා ලවා මහා මණ්ඩපයක් ඉදි කරවූවා ය. අනතුරුව පන්සියයක් ශ්වේතඡත්‍ර ද, පන්සියයක් හීලෑ හස්තීන් ද සූදානම් කරවූවා ය. පන්සියයක් හස්තීහු ශ්වේතඡත්‍ර (සුදු කුඩ) එසැවීම සඳහා ය. මණ්ඩපය මැද සුවඳ පිරවූ භාජන 10 ක් තබන ලදී. පන්සියයක් හිමිවරුන් දන් වැළඳීම පිණිස වැඩ හිඳි විට පවන් සලනු වස් රාජ කන්‍යාවන් දෙසිය පණහක් ද සූදානම් කරන ලදි. මෙසේ සැලසුම් කළ දානයෙන් පසු ජනයා තමන්ට රාජ කන්‍යාවන්, ශ්වේතඡත්‍ර, හස්තීන් සොයා ගත නො හැකි හෙයින් පරාජය පිළිගත් හ. දන් දීමෙන් අනතුරුව රජ තෙම මණ්ඩපය පුරා කෝටි දාහතරක් වටිනා පූජා වස්තු පූජා කළේ ය.

මේ අවස්ථාවට සහභාගී වූ රජතුමා ගේ ජුණ්හ නම් අමාත්‍යවරයා රජතුමා විසින් බුද්ධප්‍රමුඛ සංඝයාට දෙන ලද මෙම අසදිස දානය ගැන අතිශයින් ප්‍රසන්න වූයේ ය. රජතුමාට තම ප්‍රසාදය ද පළ කළේ ය. රජතුමා එම පුණ්‍යකර්මයෙන් ජනිත කුසලය සියල්ලන්ටම අනුමෝදන් කිරීම ගැන වඩාත් ප්‍රමෝදයට පත් විය. එසේ කිරීමෙන් රජ කෙනෙකු පමණක් කළ හැකි අසදිස පින්කමක් කොට එම පුණ්‍ය මහිමය තවත් අය සමග බෙදා ගැනීමට ඔහු කාරුණික වීම ගැන ඉතා සතුටට පත් වූ හේ රජතුමා මෙන්ම ප්‍රීතියට පත්ව සිටියේ ය.

එහෙත් කාල නම් වූ අනිත් අමාත්‍ය තෙම රජතුමා විශාල ධනයක් නාස්ති කළේ යැයි සිතී ය. "එක් දිනයක දී කෝටි දාහතරක් වැය කළ නමුත් එහි ඇති ප්‍රයෝජනය කුමක් ද? භික්ෂූන් ආහාර අනුභව කොට විහාරස්ථානයට ගොස් නිදාගනු ඇත" යි හේ සිතී ය. කාල ගේ මේ සිතුවිලි බුදුරජාණන් වහන්සේට පෙනිණි.

තමන් දිග දම් දෙසුමක් කළහොත් කාල තවදුරටත් සිත දූෂණය කර ගනු ඇත. එහි විපාකය වන්නේ ඔහු ගේ මතු ජන්මය අන්ත දුඃඛිත එකක් වීම ය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ කෙටියෙන් ධර්ම දේශනාවක් කර පසුව රජතුමා අමතා මෙසේ පැවසී ය. "රජතුමනි, මේ අසදිස දානය දෙන්නට හැකි වීම ගැන ඔබ අතිශයින් ම ප්‍රීති විය යුතු ය. මෙබඳු අවස්ථාවක් උදාවන්නේ ඉතාමත් ම කලාතුරකිනි. එවැන්නක් එක් බුද්ධාන්තරයක දී එක් වරක් පමණක් උදා වෙයි. එහෙත් ඔබ ගේ කාල ඇමතිවරයා එය මහා ධන නාස්තියක් සේ සිතයි. හේ එය අගය නො කරයි. මා දිග ධර්මදේශනාවක් කළ හොත් ඔහු ගේ සිත තව තවත් දූෂිත වනු ඇත. එසේ පව් රැස් කර ගැනීමේ ප්‍රතිඵලය වන්නේ කාල ඇමති තුමා අපාගත වීමයි. එහෙයින් මගේ ධර්ම දේශනය කෙටි කළෙමි.'' එසේ රජතුමා අස්වැසූ භාග්‍යවතුන් වහන්සේ පූර්වෝක්ත ගාථාව ද වදාළ සේක.

### විවරණාත්මක අනුවාදය (177 ගාථාව)

**කදරියා වෙ දෙවලොකං න වජන්ති. බාලා හවෙ දානං නප්පසංසන්ති ධීරො ච දානං අනුමොදමානො සො තෙන එව පරත්ථ සුඛී හොති**

**කදරියා**ඃ තද මසුරෝ; **වෙ**ඃ ඒකාන්තයෙන්ම; **දෙවලොකං**ඃ දෙව්ලොවට; **න වජන්ති**ඃ නො යති; **බාලා**ඃ අඥාන පුද්ගලයෝ; **හවේ**ඃ ඒකාන්තයෙන්ම; **දානං**ඃ දානයට; **නප්පසංසන්ති**ඃ ප්‍රශංසා නො කරති; **ධීරො ච**ඃ නැණවතා වනාහි; **දානං**ඃ දානය; **අනුමොදමානො**ඃ අනුමෝදන් වන්නේ ය; **සො**ඃ හෙතෙම; **තෙන එව**ඃ (පුණ්‍ය කර්මය අනුමෝදන් වීම) ඒ හේතුවෙන් ම; **පරත්ථ**ඃ මතු ජන්මයෙහි දි; **සුඛී**ඃ සැප ඇත්තෙක්; **හොති**ඃ වෙයි.

### විවරණය

**දාන**ඃ දන්දීම, දානය දස පාරමිතා අතර පළමුවැන්නයි. එමෙන් ම ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන් අතර ප්‍රථම යයි. දන් දෙන තැනැත්තා සිය සිත ආත්මාර්ථකාමී චේතනාවලින් මුදවා පරාර්ථකාමයෙහි යොදවයි. දානපතියා පිවිතුරු සිත නිසා භාග්‍ය සම්පන්න වන අතර ප්‍රතිග්‍රාහකයා යමක් ලැබීම හේතුවෙන් භාග්‍ය සම්පන්න වෙයි. බෝසත්වරුන් දන් දෙන්නේ දානානිශංස වශයෙන් භෞතික සැප සම්පත් ලබන්නට නොව තම තෘෂ්ණාව පරාජය කිරීමට හා ලොව සුවපත් කිරීමට ය. ආයුෂ, වර්ණය, සැපය, බලය හා ප්‍රඥාව ලැබීම දානයෙහි ලෞකික ආනිශංස වශයෙන් දැක්වෙයි.





*සක්විති රජයට වඩා දෙව්ලෝ යාමට වඩා සියල් ලොවැ අධිපතිකමට වඩා සෝවාන් ඵලය ලැබීම උතුම් ය.*

| | |
|---|---|
| 178. පඨව්‍යා ඒක රජ්ජේන | මහ පොළොවේ තනි රජයයි |
| සග්ගස්ස ගමනේන වා | දෙව් ලොව ගොස් සැප විඳුමයි |
| සබ්බලොකාධිපච්චෙන | මුළු ලොව අදිපති වීමයි |
| සොතාපත්තිඵලං වරං (13:12) | සෝවන් ඵලයට පරදියි |

# ලැබීම සෝවන් ඵලය - මසු දහසට වඩා අගය

## 13 (11) කාල සිටු පුත්‍රයා ගේ කතාව (178 ගාථාව)

අනේපිඬු සිටාණන් ගේ පුත්‍රයා වූ **කාල** නිමිති කරගෙන භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙරදී මේ ගාථාව වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ හා ශ්‍රාවක පිරිස නිතර නිතර සිටු මැදුරට වැඩම කළ නමුත් අනේපිඬු සිටාණන් ගේ පුත්‍රයා කිසි විටෙක ගරුසරු දැක්වීමට හෝ දහම් ඇසීමට හෝ පැමිණුනේ නැත. තම පුත්‍රයා ගේ මේ පැවැත්ම ගැන සිටුතුමා දුකින් පසුවිය. දරුවා පිනට ලැදි නොවී මිසදිටුවකු සේ ජීවත් වී මරණින් මතු අපාගත වේදෝ හෝයි හෙතෙම බිය විය. එහෙයින් ඔහු දහමට නමා ගන්නේ කෙසේ දැයි හේ නිතර සිතුවේ ය.

දිනක් තම පුත්‍රයා ඇමතු සිටුතුමා "පුතා පෝයදාට පන්සල් ගිහින් ආවොත් කහවණු සීයක් දෙනවා" යි පැවසී ය. කහවණු වලට ලොබ කළ කාල එදා උදෙන්ම විහාරස්ථානයට ගොස් දිවා භෝජනය සඳහා ආපසු ගෙදර ආවේ ය. තම අතට කහවුණු සියය ලැබෙන තුරු හේ කෑම නො ගත්තේ ය. සිටුතුමා ද ගිවිස ගත් පරිදි ඔහුට කහවණු සියයක් දුන්නේ ය.

පසුදින සිටු කුමාරු ඇමතු පියා "පුත්‍රය අද විහාරස්ථානයට ගොස් ගාථාවක් ඉගෙන ගෙන ආවොත් කහවණු දාහක් දෙනවා" යි පොරොන්දු විය. සිටු පුත්‍රයා ද ඉමහත් සතුටින් ගාථාවක් ඉගෙන ගනු පිණිස බුදුරජාණන් වහන්සේ හමුවට ගොස් තමන්ට ගාථාවක් උගන්වන ලෙස ඉල්ලා සිටියේ ය. බුදුහු ඔහුට කෙටි ගාථාවක් ඉගැන්වූ හ. එහෙත් එය වහා අමතක වන සේ සෘද්ධියක් ද කළ හ. ගාථාව වහා අමතක වන හෙයින් එය කීප වාරයක් තේරුම් සහිතව ඉගෙන ගන්නට ඔහුට සිදු විය.

එහි ප්‍රතිඵලය වූයේ අර්ථය අනුව සිතා කාල සෝවාන් වීමයි.භාග්‍යවතුන් වහන්සේ සිටු නිවසෙහි දවල් දානය පිණිස සපිරිවරින් වැඩම කරන විට සිටු පුත්‍රයා ද ඒ සමගම නිවසට පැමිණියේ ය. එසේ පැමිණෙන අතර තම පියා බුදුරදුන් හමුවේ දීම තමන්ට මුදල් දේදැයි බියක් ද ඔහුට ඇති විය. එසේ නො දෙත්වායි හේ දිගටම ප්‍රාර්ථනා කළේ ය.

භාග්‍යවතුන් වහන්සේට දන් පිළිගන්වා අනතුරුව අනේපිඬු සිටාණෝ පුතාට ද ආහාර දුන් හ. අනතුරුව බුදුපාමොක් සඟරුවන හමුවේ ම හේ තම පුත්‍රයාට "පුත්‍රය මෙන්න ගාථාවක් ඉගෙන ගෙන ආවාට කහවණු දහස" යි ඒ මුදල ඔහුට දුන් නමුත් සිටුපුතා මහත් ලජ්ජාවෙන් එය ප්‍රතික්ෂේප කළේ ය. විස්මයට පත් අනාථපිණ්ඩික සිටුතුමා බුදුරජාණන් වහන්සේ අමතා "ස්වාමීනි, මෙතෙම පෙරදින කහවණු සියය අතට දෙන තුරු ආහාර ගැනීම පවා ප්‍රතික්ෂේප කළේ ය. දැන් කහවණු දහසක් දුන් විට ප්‍රතික්ෂේප කරයි. ඔහු ගේ පැවතුම් ද අද බෙහෙවින් ප්‍රසාද ජනක ය." යි සැලකර සිටියේ ය. එවිට සිටුතුමා ඇමතූ භාග්‍යවතුන් වහන්සේ "සිටුතුමනි, අද ඔහු කහවණු දහසක් නොව මහා පෘථිවියේ සක්විති රජකමටත්, දෙව් සැපතටත් දෙලොව ම ආධිපත්‍යයටත් වඩා වටිනා සෝවාන් ඵලය ලබා සිටියි" යි වදාළ සේක.

**විවරණාත්මක අනුවාදය (178 ගාථාව)**

> **පඨව්‍යා එකරජ්ජේන, සග්ගස්ස ගමනේන වා**
> **සබ්බලොකාධිපච්චෙන  සොතාපත්තිඵලං වරං**

> **පඨව්‍යා**: මුළු පෘථිවියෙහි; **එකරජ්ජේන**: එකම රජ වීමටත්; **සග්ගස්ස**: (සව්සිවැදෑරුම්) දෙව්ලොවට; **ගමනේන**: යාමටත්; **සබ්බලොකාධිපච්චෙන වා**: (නාග සුපර්ණාදීන් සහිත වූ) සමස්ත ලෝකයට ම අධිපති වීමටත් (වඩා); **සොතාපත්ති ඵලං**: සෝවාන් ඵලය; **වරං**: උතුම් ය.

මුළු පොළොවෙහි සක්විති රජකමටත්, සදෙව්ලොවට ගොස් සැපවිඳීමටත් සමස්ත ලෝකයේ ම අධිපතියා වීමටත් වඩා සෝවාන් වීම උතුම් ය.

**විවරණය**

**පඨව්‍යා එක රජ්ජේන**: පෘථිවියෙහි තනි රාජ්‍යය. සාම්ප්‍රදායික විශ්වාසයනට අනුව කලින් කලට මුළු ලෝකයම පාලනය කරන රජවරු පහළ වෙති. මෙය කුසල බලයෙන් ලැබෙන්නකැයි විශ්වාස කෙරේ. එවැන්නකු ගේ පහලවීම දෙවිවරුන් විසින් කල් ඇතිව නිවේදනය කෙරේ. 'චක්‍රවර්ති' නමින් හැඳින්වෙන එබඳු රජකුට සප්තරත්නයක් ද පහළ වෙයි. ආගමික අංශයෙන් බලන විට ලොව පහළ වන ශ්‍රේෂ්ඨතම උත්තමයා බුදුරජාණන් වහන්සේ වන අතර ලෞකික වශයෙන් බලන විට ලොව පහළවන ශ්‍රේෂ්ඨතම ගෘහස්ථ නායකයා සක්විති රජතුමා ය. බුදුවරුන් දෙනමක් එක්වර ලොව පහළ නොවන්නා සේම සක්විති රජවරු දෙදෙනෙක් ද එකවර ලොව පහළ නොවන්නා හ.

**සෝතාපත්ති**: සෝවාන් ඵලය බෞද්ධ විමුක්ති මාර්ගයෙහි සතර ඵලයන් අතර ප්‍රථමය යි. මෙය ලත් පසු දුගතිගාමී නොවන බව කියැවේ.



# කතෘ ස්වාමීන්ද්‍රයන් වහන්සේ



සනාතන බුද්ධ භාෂිතය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ අසහාය සාමයික මෙහෙය උදෙසා, සිය කාලය හා ශ්‍රමය සපුරා වැය කරමින්, මානව වංශයට දහම් මග හෙළි පෙහෙළි කිරීමේ මහා මෙහෙවරට කැප වී සිටින සිංගප්පූරුවේ ප්‍රධාන සංඝ නායක වේරගොඩ සාරද, ස්ථවිරයන් වහන්සේ අද ලොව වෙසෙන ප්‍රශස්ථතම ධර්ම දූත යතිනායක වරයාණන් වහන්සේ නමකි.

1941 නොවැම්බර් මස 27 වනදා දකුණු ලක වේරගොඩ දී උපත ලද මේ යති ප්‍රභූවරයානෝ, උපාධි ලාභීව, ධර්මදූත මෙහෙය ආරම්භ කළේ ඉතා යොවුන් අවධියේ දීමය. දැනට ශතක 6 ක් පුරා ධර්මදූත මෙහෙයෙහි යෙදී සිටින ගරුතර වේරගොඩ සාරද යතිනායකයානන් වහන්සේ මුද්‍රිත මාධ්‍යයෙන් සහ විද්‍යුත් මාධ්‍යයෙන් මෙන්ම දුරකථන තාක්ෂණයෙන් පවා අද ලොවට ධර්මදානය සපයන්නේ නවීනයන්ගේ මනස හා ආධ්‍යාත්මික ගති-පැවතුම් පිළිබඳ පැහැදිලි අවබෝධයකිනි.

වර්තමානික ග්‍රාහක පිරිස, ශ්‍රව්‍ය-දෘෂ්‍ය මාධ්‍ය මගින් දැනුමත් විනෝදාස්වාදයත් ලබන්නට පුරුදු වී සිටින පරපුරක් හෙයින්, ගරුතර වේරගොඩ සාරද හිමිපාණෝ, ඔවුනගේ මනසට සරිලන පරිද්දෙන් බුද්ධ භාෂිතය, ඔවුන් අතට පත් කරන සේක. මුද්‍රිත හා විද්‍යුත් ප්‍රකාශන 700 ක් පමණ ලොවට පිරිනමා සිටින මේ යතිනායකයන් වහන්සේ විසින් සම්පාදිත ධර්ම භාණ්ඩාගාරය නම් ඉංග්‍රීසි කෘතිය දොරට වැඩීමේ උළෙලේ දී, ඒ පිළිබඳ ව එක් දිනක් තුළ පමණක් ලැබුණු දුරකථන ඇමතුම් සංඛ්‍යාව 2000 කටත් අධික විය. ඒ නිසා එය සිංගප්පූරු රාජ්‍යයේ ග්‍රන්ථ ප්‍රකාශන ඉතිහාසයේ සුවිශිෂ්ට වාර්තාවකට හිමිකම් කියන්නේය.

දැනට, සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය භාරව වැඩ සිටින ගරු වේරගොඩ සාරද නායක ස්ථවිර පාදයන් වහන්සේ ලෝකයේ බොහෝ දේශයන් හී බුද්ධ ශාසනයේ ප්‍රගතියට හිතකාමී ධර්ම දූත මෙහෙවරක යෙදී සිටින සේක.

එතුමන් ගේ ප්‍රධාන ප්‍රකාශ අතර, සිංහල හා ඉංගිරිසි ධම්මපදයත්, ජාතක කථා පිළිබඳ විද්‍යුත් ප්‍රකාශනයත් ප්‍රධාන තැන් ගනී. එතුමන් විසින්, ඉටු කෙරෙන මහා සාමයික මෙහෙය අඛණ්ඩව පවත්වා ගෙන යනු පිණිස, ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් නිදුක් නිරෝගී සුව පැතීම, බෞද්ධ ජනතාවගෙන් ඉටු විය යුතු කෘතඥතා පූර්වක චාරිත්‍රයකි.

කලා කීර්ති එඩ්වින් ආරියදාස

ISBN: 981-00-4938-2